SLIC
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
පියෙකු මෙන් මවක මෙන්



ජයග්‍රාහී සංස්කෘතියක්

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වාර්ෂික වාර්තාව 2022

ජයග්‍රාහී සංස්කෘතියක්

ගෙවුණු වසර ව්‍යවසාය සඳහා
උපකාරී නොවූ වසරක් බව පැවසීම සැබෑවකි.
කෙසේ වෙතත් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ජයග්‍රාහී
සංස්කෘතියක් – ජයග්‍රාහී මාවතක සමාගම සහ
පාර්ශවකරුවන් ස්ථානගත කිරීමට මාවත සහ ගතිකත්වට
උත්පාදනය කළහැකි අවකාශයක් ස්ථාපිත කිරීමට දැනුවත්
උත්සාහ දරා ඇත. කාර්යසාධනය පදනම් සංස්කෘතියක්
ප්‍රමාණාත්මකව වැඩි කරමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සිය
සේවකයින් සඳහා අසමසම වෘත්තීය වර්ධනය සහ
පුද්ගලික සංවර්ධන අවස්ථා ලබාදීමට සමත්ව ඇත.
ඔප්පුහිමියන්ට මේ දක්වා ඉහළම ප්‍රසාද දීමනා ගෙවීම
පිරිනමන අතරම ජීවිත සහ සාමාන්‍ය අංශ දෙකෙහිම නව
ව්‍යාපාර පිළිගනිමින් සහ සේවය කරමින් සමාගම සමඟ
කාර්යසාධනයේ සාර්ථකත්වයට
මෙය ඉවහල් වී ඇත.

SLIC
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
පියෙකු මෙන් මවක මෙන්

පටුන

03
අප ගැන

04 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පිළිබඳ තොරතුරු
06 අධ්‍යක්ෂ මණ්ඩලය
10 නායකත්ව කණ්ඩායම
24 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමූහයේ ව්‍යූහය
25 මූල්‍යමය වශයෙන් වැදගත් කරුණු 2022
26 මූල්‍යමය නොවන වැදගත් කරුණු 2022

27
නායකත්ව සමාලෝචනයන්

28 සභාපතිවරයාගේ පණිවිඩය
31 ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය

35
වාර්තාවේ පැතිකඩ

37
උපායමාර්ගය සහ අවධානය

38 ව්‍යාපාර ආකෘතිය
40 ප්‍රමාණාත්මතාවය පිළිබඳ කරුණු
41 පාර්ශවකරුවන්ගේ සම්බන්ධතා
43 උපායමාර්ගික ප්‍රමුඛතාවයන්

44
කළමනාකරණ විස්තර ප්‍රකාශය

45 මෙහෙයුම් පරිසරය
46 මූල්‍ය ප්‍රාග්ධනය
50 නිෂ්පාදිත ප්‍රාග්ධනය
54 බුද්ධිමය ප්‍රාග්ධනය
57 මානව ප්‍රාග්ධනය
64 සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
77 ස්වභාවික ප්‍රාග්ධනය

79
යහපාලනය සහ අවදානම් පාලනය

80 ආයතනික පාලන වාර්තාව
84 විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව
86 ආයෝජන කමිටු වාර්තාව
90 අවදානම් කළමනාකරණ වාර්තාව
98 අනුකූලතා වාර්තාව
106 අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය

107
මූල්‍යමය වාර්තා

108 සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව
111 අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව
112 ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම පිළිබඳ ප්‍රකාශය
113 රක්ෂකයාගේ ආයුගණක සහතිකය
114 වගකීම් ප්‍රමාණාත්මතාවයේ පරීක්ෂණය
115 දරණ ලද එහෙත් ප්‍රමාණවත්ව වාර්තා නොවූ හිමිකම් පිළිබඳ සහතිකය
116 ස්වාධීන විගණකවරයාගේ වාර්තාව
120 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
122 ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය
124 හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
130 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය
132 ඛණ්ඩමය සමාලෝචනය: මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
134 ඛණ්ඩමය සමාලෝචනය: ආදායම් ප්‍රකාශය
136 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

241
අතිරේක තොරතුරු

242 ජීවිත රක්ෂණයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
243 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ජීවිත රක්ෂණ අරමුදල
248 දස වසරක සාරාංශ ආදායම් ප්‍රකාශය
250 දස වසරක සාරාංශ ශේෂ පත්‍රය - සමූහය
252 දස වසරක සාරාංශ ශේෂ පත්‍රය - සමාගම
256 ශාඛා ජාලය
265 ආයතනික තොරතුරු
266 වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැනුම්දීම

පෙරකලාසි පෝරමය ඇතුළත්ය

මෙම වාර්තාව බැලීම සඳහා මෙය ස්කෑන් කරන්න

Online at https://www.srilankainsurance.com/en/about-us/annual-reports

03-26
අප ගැන



> 04 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පිළිබඳ තොරතුරු

> 06 අධ්‍යක්ෂ මණ්ඩලය


> 10 නායකත්ව කණ්ඩායම

> 24 SLIC සමූහයේ ව්‍යූහය

> 25 මූල්‍යමය වැදගත් සිදුවීම් 2022

> 26 මූල්‍යමය නොවන වැදගත් සිදුවීම් 2022


ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පිළිබඳ



ශ්‍රී ලංකාව තුළ අද දක්වා සමනොකලැකි සාරවත් හා සම්පූර්ණ තාක්ෂණික දැනුම් පදනම භාවිතා කරමින් ශ්‍රී ලංකාව පුරා ශාඛා 142ක සහ නියෝජිත ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන (ABDC) 53ක ජාලයක් පවත්වා ගනිමින් රක්ෂණය පිළිබඳ ඉහළම නිපුනතා සහ පළපුරුදු ප්‍රවීන කණ්ඩායමක් මත අපගේ කීර්තිනාමය ගොඩ නැගේ.

දශක කිහිපක් පුරා, බැංකුකරණ සහ මූල්‍ය, සෞඛ්‍යාරක්ෂාව, විදුලි සහ බලශක්තිය සහ සත්කාරක කර්මාන්තය වැනි ප්‍රධාන ක්ෂේත්‍රවල විවිධාකාර බැඳියාවන් සහ ආයෝජන සහිතව ශක්තියෙන් ශක්තියට අපි ප්‍රගතිය ලබා ඇත.

අප සමාගමේ ඉහළම දැක්ම වන ජාතියට විශ්වාසී රක්ෂකයා වීම සාක්ෂාත් කර ගැනීම කරා අපි සාර්ථකව ගමන්කරන බැවින් ශ්‍රී ලංකාව තුළ මූල්‍ය නිදහස පිළිබඳ සංස්කෘතියක් අපි ස්ථාවර කොට ඇත.



අපි ශ්‍රී ලංකාවේ රජයට අයත් විශාලතම රක්ෂකයා වන අතරම දශක හයකට වැඩි ඉතිහාසයන් සහිත පුරෝගාමී රක්ෂණ සමාගම වෙමු. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රජයට අයත් සංස්ථාවක් ලෙස 1962 දී පිහිටුවන ලදී. වර්තමානයේ අපි රු. බිලියන 274ක වත්කම් පදනමක් සහ රු. බිලියන 156.7ක ජීවිත අරමුදලක් පවත්වා ගෙන යන අතර ඒවා රට තුළ විශාලතම අගයන් වේ.

අපගේ දැක්ම


අවදානම් සුරක්ෂිතකරණය සහ ජීවිත ආයෝජන ප්‍රශස්ථකරණය සම්බන්ධයෙන් ජාතියෙහි පළමු තේරීම බවට පත් වීම

අපගේ මෙහෙවර

අපි, අපගේ පාරිභෝගිකයින් වෙත වටිනාකමක් එක් කරන අවදානම් සුරක්ෂිතකරණය සහ ජීවිත ආයෝජන ප්‍රශස්ථකරණය සපයන්නෙමු.

ඒ සඳහා කැපවූ වෘත්තීකයන් කණ්ඩායමක් අප සතු වන අතර ඔවුන්ගේ දායකත්වය අපි හඳුනා ගන්නා අතර එම දායකත්වය අගය කර සිටිමු.

මේ තුළින් වගකීම් සහගත ආයතනික පුරවැසියෙකු ලෙස කොටස් හිමිකරුවන් වෙත ඉහළම වටිනාකමක් ලබා දීමට අප කටයුතු කරමු.



අධ්‍යක්ෂ මණ්ඩලය



රොනල්ඩ් සී පෙරේරා මහතා, ජනාධිපති නීතිඥ
සභාපති

කීර්තිමත් ජනාධිපති නීතිඥ, රොනල්ඩ් පෙරේරා ශ්‍රී ලංකාවේ විශාලතම සහ ශක්තිමත් රක්ෂකයා වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හී සභාපති ලෙස 2022 අගෝස්තු 01 දින රාජකාරි භාර ගත්නා ලදී.

මෙම පත්වීමට පෙර, පෙරේරා මහතා 2015 ජනවාරි සිට 2019 නොවැම්බර් දක්වා ලංකා බැංකුවේ සභාපති තනතුර දරන ලද අතර මූල්‍ය ක්ෂේත්‍රය තුළ ප්‍රධාන තරඟකරුවෙක් ලෙස ලංකා බැංකුව හැඩ ගැස්වීමේදී උපකාරී වී ඇත. පෙරේරා මහතා වර්තමානයේ ද ලංකා බැංකුවේ සභාපති ලෙස සේවය කරයි.

2012 දී ජනාධිපති නීතිඥවරයෙක් ලෙස පත්වූ, පෙරේරා මහතා මුල් අවස්ථා අධිකරණ උසාවි මෙන්ම අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ ද පුළුල් පරිචයක් සහිත පළපුරුදු නීතිඥවරයෙකි. ඔහුට සිවිල් සහ අපරාධ නීතිකරණය, කතිකාව සහ වාණිජමය ගිවිසුම් කෙටුම්පත් කිරීමේ පළපුරුද්ද ඇත. පෙරේරා මහතාට වාණිජ නීතිය, බැංකු නීතිය, කාර්මික නීතිය, තහනම් නියෝග, අපහාස, මැනිවරණ පෙත්සම්, සිවිල් අභියාචනා, ප්‍රතිශෝධිත අයදුම්, පහිණ ඉල්ලා සිටීම්, සහ මූලික අයිතිවාසිකම් නඩු පිළිබඳ විශේෂඥතාව ඇත.

ඊට අමතරව, ඔහු වාණිජමය බේරුම්කරණය සම්බන්ධයෙන්ද පෙනී සිට ඇත. එමෙන්ම ඔහු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පනත් කිහිපයක වලංගුතාව සම්බන්ධව අභියෝග කර ඇත.

පෙරේරා මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ LLB උපාධිධාරියෙක් වන අතර නොතම්බ්‍රියා විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ LLM උපාධිය උසුලයි. ඔහු කොළඹ ශාන්ත ජෝෂප් විද්‍යාලයේ ආදී සිසුවෙක් වන අතර එහිදී ඔහු සිය මූලික සහ ද්විතියික අධ්‍යාපනය නිමකර ඇත.



අනිල් කොස්වත්ත මහතා
අධ්‍යක්ෂ

අනිල් කොස්වත්ත මහතා ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ හා ලිට්රෝ ගෑස් ටර්මිනල් (පුද්ගලික) සමාගමේ හිටපු සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරීවරයා (2020 ජනවාරි 26 සිට 2021 ජූලි 15 දක්වා) වන අතර ඔහු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

කොස්වත්ත මහතා කීර්තිමත් විකුණුම් හා අලෙවිකරණ වෘත්තිකයෙකු හා ප්‍රමුඛ ව්‍යවසායකයෙකු වන අතර LAKARCADE (Pvt) Ltd. හි නිර්මාතෘ, ප්‍රධාන විධායක නිලධාරිවරයා සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා ද වේ.
ප්‍රමුඛ පෙළේ බහුජාතික සමාගමක් වන නෙස්ලේ ලංකා පීඑල්සී හි වසර 25 කට අධික අලෙවිකරණ හා උපායමාර්ගික පළපුරුද්දක් ඔහු සතු අතරම වසර 15කට අධික කාලයක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) ඇතුළු රාජ්‍ය අංශයේ සංස්ථා ගණනාවකට විශිෂ්ඨ ලෙස නායකත්වය සපයා ඇත.

කොස්වත්ත මහතා ආර්ථික සංවර්ධනය, අපනයන සංවර්ධනය සහ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳව ගරු අමාත්‍ය ජී. එල්. පීරිස් මහතාගේ උපදේශකවරයෙකු ලෙස ද කටයුතු කළේය

ඔහු වරලත් කළමනාකරණ ආයතනයේ (FCMI) සහය සාමාජික (Fellow) සහ වරලත් අලෙවිකරණ ආයතනයේ (FCIM) සහය සාමාජික මෙන්ම ලංකා තරුණ ව්‍යවසායකයින්ගේ මණ්ඩලයේ (COYLE) ආරම්භක සාමාජිකයෙකු ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය



එස්.ඒ. නිශාන්ත දයානන්ද
අධ්‍යක්ෂ

නිශාන්ත දයානන්ද මහතා නීති වෘත්තිය තුළ කීර්තිමත් වසර 18ක වෘත්තියක් සහිත විශිෂ්ඨ නීතිඥවරයෙකි. ඔහු මලියදේව මහා විද්‍යාලයේ සහ කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ නිමැවුමක් වන අතර, එහිදී ඔහු 1999 දී ඔහුගේ LLB උපාධිය ලබාගෙන ඇත. තවද ඔහු ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් 2001 දී නීතිඥවරයෙකු ලෙස සුදුසුකම් ලබා ඇත.

ඔහුගේ අධ්‍යාපනික ශූරතාවය ඔහුගේ මුල් වයසේදීම පෙන්වා ඇති අතර ඔහු 5 වසර ශිෂ්‍යත්වය සමත් වී මාවතගම මධ්‍යම මහා විද්‍යාලයේ සිට කුරුණෑගල මලියදේව මහා විද්‍යාලයට පැමිණ ඇති අතර එහිදී ඔහු ඔහුගේ අරමුණ වන විශ්ව විද්‍යාල ප්‍රවේශයට ලඟා විය. ඔහුගේ චරිතය සෑම අවස්ථාවකම "ජීවිතයේ සමබරතාව" පිළිබඳ සංකල්පය මගින් සහ නායකත්වය පිළිබඳ ප්‍රධාන දක්ෂතාවයෙන් හැඩගස්වන අතර එය හර්මන් ලුස් අභියෝගතාව තුළ ඔහුගේ පාසල නියෝජනය කරමින් පාසල් ශිෂ්‍ය බට කණ්ඩායම තුළ පෙන්වා ඇති අතර විවිධ අවස්ථාවලදී ඔහුගේ බණ්ඩය මෙහෙයවන ලදී. තවද, ඔහු ජාතික මට්ටමේ වඩාත් පිළිගත් වොලිබෝල් ක්‍රීඩකයෙකි. නීති පීඨයේ ඔහුගේ වසරවල, සිසුන්ගේ යහ පැවැත්ම සඳහා වැඩසටහන් මෙහෙයවන ලද අතර ශිෂ්‍ය සභා සාමාජිකයෙක් ලෙස ඔහුගේ සාමාජිකයින් සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

ඔහු කීර්තිමත් නීතිඥවරයෙක් ලෙස සහ ඔහුගේ නීති සමාජය තුළ සියලු අංශවල ක්‍රිකට් ක්‍රීඩකයෙක් ලෙස ඔහු අඛණ්ඩව නායකත්වය පෙන්වා ඇති අතර 2017 - 2018 කාලය තුළ ගල්කිස්ස නීතිඥ සංගමයේ උප සභාපතිවරයාද විය. ඔහු Canowin Hotels & Spas (Pvt) Ltd. සභාපතිවරයාද වේ.



ආචාර්ය කිත්සිරි මංචනායක මහතා
අධ්‍යක්ෂ

කීර්තිමත් තොරතුරු තාක්ෂණ වෘත්තිකයෙක් වන, ආචාර්ය කිත්සිරි මංචනායක 2022 අගෝස්තු 22 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී. ඔහුට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ වසර 30ක පළපුරුද්ද ඇති අතර ඔහු AIMS සමූහ සමාගමේ සභාපතිවරයා වේ.

ඔහු ඇමෙරිකාවේ ටෙම්පල් විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර ව්‍යාපාර සඳහා සහ පිලිපීනයේ ඕල්ඩර්ගේට් විද්‍යාලයෙන් දේශපාලන විද්‍යාව සඳහා අචාර්ය උපාධි දෙකක් ලබාගෙන ඇත. එමෙන්ම ඔහු වේල්ස් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියද, ඇමෙරිකාවේ ප්‍රෙස්ටන් විශ්ව විද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියද ලබාගෙන ඇත.

සාකල්‍ය අධ්‍යාපනය සඳහා ශක්තිමත් සංවර්ධනය සමඟ තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන යටිතල පහසුකම් කරා ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර අවස්ථා ප්‍රවර්ධනය කිරීමට ඇමෙරිකාව, යුරෝපය සහ ආසියානු රටවල් සඳහා මෙහෙයවීම තුළ ඔහු කොටස් කරුවෙක් විය. ආචාර්ය මංචනායක මහතා ASOCIO (Asian-Oceanian Computing Industry Organisation) හි උප සභාපති ලෙස ද සේවය කරයි. ASOCIO යනු ආසියා සහ ඔසිනියානු කලාපයේ ආර්ථිකවලින් පැමිණෙන තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සංවිධාන කණ්ඩායමකි.



දුෂ්මන්ත තොටවත්ත මහතා
අධ්‍යක්ෂ

දුෂ්මන්ත තොටවත්ත මහතා 2022 අගෝස්තු 22 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

තොටවත්ත මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජ උපාධියක් (විශේෂ උපාධිය) සහිත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහය සාමාජිකයෙක් වන අතර, කොළඹ විශ්ව විද්‍යාලයේ මූල්‍ය ආර්ථිකයන් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකි.

ඔහු ප්‍රවීන නායකයෙක් වන අතර ඔහුට මූල්‍ය කළමනාකරණය, ආයතනික පාලනය, උපායමාර්ගික කළමනාකරණය සහ මහජන සම්බන්ධතා සමඟ රජයට අයත් ව්‍යවසාය සහ පුද්ගලික ආයතනවල ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී, සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක යන තනතුරුවල සාර්ථක ගමන් වාර්තාවක් සමඟ විස්තීර්ණ පළපුරුද්ද ඇති අතර වසර 38කට වැඩි පළපුරුද්ද ඇත. තොටවත්ත මහතා මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ලෙස කටයුතු කරන අතර කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ සභාපතිවරයාද වේ.



නඕමාල් පැලපොල මහතා
අධ්‍යක්ෂ

නඕමාල් පැල්පොල මහතා 2022 සැප්තැම්බර් 30 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

නඕමාල් මහතා ශ්‍රී ලංකාවේ පිළිගත් නීති වෘත්තිකයෙක් වන අතර 2022 නීති වෘත්තියට පැමිණීමෙන් පසු ඔහුට පළමු උසාවි අවස්ථාව (දිස්ත්‍රික් උසාවි සහ වාණිජ උසාවිය) මෙන්ම අභියාචනා උසාවි (අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය) තුළ බහුශ්‍රැත පරිචයක් ඇත. නඕමාල් මහතා වාණිජ නීතිය, බැංකු නීතිය, ව්‍යාපාර නීතිය, බුද්ධිමය දේපල නීතිය, දේපල නීතිය, කම්කරු නීති සහ පවුල් නීති යන ක්ෂේත්‍රවල විශේෂත්වය දක්වයි. බේරුම්කරුවෙකු මෙන්ම උපදේශකවරයෙක් ලෙස විකල්ප ආරාවුල් විසඳීමේ ක්‍රියාපටිපාටිය (බේරුම්කරණය) පිළිබඳ විස්තීර්ණ පළපුරුද්ද ඔහු සතු වන අතර ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතනය (SLIC) සඳහා අභිචෝදන නීතිඥ ලෙස අවස්ථා ගණනාවකදී ඔහු පත් කරනු ලැබ ඇත. පැල්පොල මහතා ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් නීති උපාධියක් (LLB) සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (LLM) ලබාගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය



රවින්ද්‍ර පත්මප්‍රිය මහතා
අධ්‍යක්ෂ

රවින්ද්‍ර පත්මප්‍රිය මහතා 2022 සැප්තැම්බර් 30 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

රවින්ද්‍ර පත්මප්‍රිය මහතා කීර්තිමත් රාජ්‍ය සේවකයෙන් වන අතර ඔහුට රාජ්‍ය අංශයේ විවිධ තනතුරුවල වසර 23කට වැඩි පළපුරුද්ද ඇත. ඔහු දැනට මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරයි.

ඔහු කැලණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී (භෞතික විද්‍යාව) උපාධිය ලබාගෙන ඇති අතර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත.



රුවනි ධර්මවර්ධන මහත්මිය
සමාගම් ලේකම්

ධර්මවර්ධන මහත්මිය විවිධ අධ්‍යාපනික පසුබිමක් සහිත නිපුණ ආයතනික නීති වෘත්තිකාවකි. ඇය කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීති උපාධිය (LLB) ලබාගෙන ඇති නීතිඥවරියකි. ඊට අමතරව, එක්සත් රාජධානියේ වරලත් සුරැකුම්පත් හා ආයෝජන ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවකි. ඇය තවදුරටත් අධ්‍යාපනය ලබමින් එක්සත් රාජධානියේ කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති ලබාගෙන ඇත. එමෙන්ම ඇය ඉන්දියාවේ ICFAI විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයෙන් ඩිප්ලෝමාවක් සහ එක්සත් රාජධානියේ විගැන් සහ ලේග් පාසලෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ගෙන ඇත.

ධර්මවර්ධන මහත්මිය ආයතනික නීතිය පිළිබඳ විශේෂත්වය දක්වන ප්‍රවීන වෘත්තිකාවියකි. මෙම ක්ෂේත්‍ර කෙරෙහි ඇයගේ බැඳීම 2008 දී නිකුත් කළ "ශ්‍රී ලංකාවේ සමාගම් නීතියේ මූලධර්ම හා ව්‍යවහාරය" යන ඇයගේ ප්‍රකාශනයෙන් පෙන්නුම් කරයි. එමෙන්ම ඇය සමකාලීන ව්‍යාපාර නීතිය සහ ආයතනික පාලනය පිළිබඳ ලියන ලේඛිකාවකි.

වසර 18 කට වැඩි පළපුරුද්ද සමඟ, ධර්මවර්ධන මහත්මිය සමාගම් ලේකම් කටයුතු පිලිබඳ ව්‍යහාරය, අනුකූලතාව සහ අවදානම කෙරෙහි අවධානය යොමු කරමින් රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශය තුළ සේවය කර ඇත. 2007 සිට, ඇය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවය කරමින් සිටින අතර සමාගම් ලේකම් වීම හැර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අනුකූලතා සහ අවදානම් ලෙස කටයුතු කරයි.

නායකත්ව කණ්ඩායම



චන්දන එල් අලුත්ගම මහතා
ප්‍රධාන විධායක නිලධාරි
B.Com (Sp), CMgr FCMI (UK), ANZIIF
(ජ්‍යේෂ්ඨ සාමාජික), MBA

අලුත්ගම මහතාට රක්ෂණ කර්මාන්තය තුළ විවිධ ක්ෂේත්‍රයන් හී වසර 30කට වැඩි පළපුරුද්ද ඇත

ඔහුගේ කීර්තිමත් වෘත්තිය ජීවිතයේදී ඔහු ඊගල් ඉන්ෂුවරන්ස් පීඑල්සී සහ එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී වැනි සමාගම්වල ජ්‍යෙෂ්ඨ නායකත්ව තනතුරු රාශියක් හොබවා ඇත. තවද, ඔහු සිය රක්ෂණ වෘත්තියෙන් බැහැරව දේශීය හා ජාත්‍යන්තර සංගම් කිහිපයකම නායකත්ව තනතුරු දරා ඇත.

එමෙන්ම අළුත්ගම මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පශ්චාත් උපාධි ඒකකයේ බාහිර කථිකාචාර්යවරයකු ලෙස දේශන පවත්වා ඇත. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශාරද උපාධිය සහ කැලණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී උපාධිය ලබා ඇති අතර එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ආයතනයේ වරලත් කළමනාකරුවෙක් (FCMI) ද ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තයේ රක්ෂණය හා මූල්‍ය ආයතනයේ සාමාජිකයෙක් ද වේ.

ඔහු රක්ෂණය සහ බැංකු රක්ෂණය පිළිබඳ දේශීය හා විදේශීය සම්මන්ත්‍රණ සඳහා පර්යේෂණ පත්‍රිකා රැසක් ඉදිරිපත් කර ඇති අතර ඔස්ට්‍රියාවේ වියානා හි Generali Insurance AG සහ සිංගප්පූරුවේ NUS Business School හි ඇතුළුව දේශීය හා විදේශීය ආයතන කිහිපයකින්ම සවිස්තර පුහුණුව ලබා ඇත.

මෙම පත්වීම ලැබීමට පෙර, අළුත්ගම මහතා එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගමේ ප්‍රධාන ව්‍යාපාර නිලධාරියා සහ ප්‍රධාන නිලධාරියා ලෙස කටයුතු කළේය. අලුත්ගම මහතා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන නිලධාරියා ලෙස ද කටයුතු කරන අතර ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සභාපතිවරයා ද වේ.



ආලෝක ජයවර්ධන මහතා
ප්‍රධාන තොරතුරු නිලධාරි
DCSD, HDCBS (NIBM), BSc (MIS), PGDBFA
(ICASL), MBA, PMP, SAP, CISM

ආලෝක ජයවර්ධන මහතා තොරතුරු තාක්ෂණය, ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ සහ ව්‍යාපෘති කලමනාකරණ ක්ෂේත්‍රයන්හි වෘත්තීය විධායකයෙකු වන අතර විදුලි සංදේශන, නිෂ්පාදන, අලෙවිකරණ හා බෙදාහැරීම්, මෘදුකාංග, ප්‍රාග්ධන වෙළඳපොල සහ රක්ෂණය වැනි ව්‍යාපාර අංශ ගණනාවක වසර 23 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත

ඔහු අයර්ලන්තයේ ඩබ්ලින් විශ්ව විද්‍යාලයෙන් කලමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා ගත් අතර ඔස්ට්‍රේලියාවේ සදර්න් ක්වීන්ස්ලන්ඩ් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශාරද උපාධිය ලබා ගත්තේය. තවද ඔහු ව්‍යාපාර කලමනාකරණය පිළිබඳ ජාතික ආයතනයෙන් පරිගණක අධ්‍යයනය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් ද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ව්‍යාපාර හා මූල්‍යකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබා ඇත. ඔහු PMP සහතික ලත් ව්‍යාපෘති කලමනාකරුවෙකු වන අතර CISM සහතික ලත් තොරතුරු ආරක්ෂණ කලමනාකරුවෙකු මෙන්ම අලෙවිකරණය හා බෙදාහැරීම පිළිබඳ SAP සහතික ලත් උපදේශකයෙකු ද වේ. මේ වන විට ඔහු මැලේසියාවේ ඒෂියා ඊ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය හදාරමින් සිටින අතර එක්සත් රාජධානියේ කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් දත්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හදාරමින් සිටී.



ප්‍රියන්ත පෙරේරා මහතා
ප්‍රධාන නිලධාරි – පොදු රක්ෂණය
MBA, ACII, වරලත් රක්ෂක

ප්‍රියන්ත මහතා 2021 සැප්තැම්බර් 01 දින ප්‍රධාන නිලධාරී – පොදු රක්ෂණය ලෙස ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හා එක් විය.ඔහු පොදු රක්ෂණ ව්‍යාපාරය තුළ දිගුකාලීන වෘත්තිකයෙක් වන අතර මෙම ක්ෂේත්‍රය තුළ වසර 35කට වැඩි පළපුරුද්ද ඔහු සතුය. ඔහු 1985 දී මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගමේ රක්ෂණ අංශයේදී සිය වෘත්තිය ආරම්භ කළ අතර මෙම ක්ෂේත්‍රය තුළ විවිධ ආයතනවල වගකීම්සහගත තනතුරු කිහිපයක් ඔහු දරා ඇත. ඔහුගේ මෙම කීර්තිමත් වෘත්තීය කාලය තුළ, ඔහු ප්‍රතිරක්ෂණය, හිමිකම්, ප්‍රාරක්ෂණය සහ කළඹ කළමනාකරණය ආවරණය කරමින් ජ්‍යේෂ්ඨ කළමනාකරණ තනතුරු දරා ඇති අතර, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හා එක්වීමට පෙර ෆෙයාර් ෆස්ට් රක්ෂණ සමාගමේ ප්‍රධාන තාක්ෂණික නිලධාරියා ලෙස ද සේවය කර ඇත.

ඔහු වරලත් රක්ෂකයෙක් වන අතර එක්සත් රාජධානියේ වරලත් රක්ෂණ ආයතනයේ ආශ්‍රිත සමාජිකත්වය ලබාගෙන ඇත. ඔහු එක්සත් රාජධානියේ කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් MBA ලබාගෙන ඇත.

නායකත්ව කණ්ඩායම



මාලක බණ්ඩාර මහතා
ප්‍රධාන මූල්‍ය නිලධාරි
BSc. – ගණකාධිකාරණ (Sp.), FCA, MBA (කොළඹ)

බණ්ඩාර මහතාට විගණනය හා රක්ෂණය යන දෙඅංශයේ වසර 22කට වැඩි පළපුරුද්ද ඇත. ඔහු 2007 දී ගණකාධිකාරිවරයෙක් ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එක් වූ අතර 2012 - 2018 තුළ සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය ලෙස පිළිවෙලින් උසස්වීම් ලබා ඇත. බණ්ඩාර මහතා 2021 නොවැම්බර් සිට ප්‍රධාන මූල්‍ය නිලධාරි ලෙස පත්වන තුරු වැඩබලන මූල්‍ය නිලධාරි ලෙස සේවය කර ඇත.

බණ්ඩාර මහතා 2017-2019 කාලය තුළ සී බැන්ක් ඇසට් මැනේජ්මන්ට් සමාගමේ අධ්‍යක්ෂවරයෙක් වූ අතර 2020 සිට සිලෝන් සී බැන්ක් කළමනාකරණ සමාගමේ සභාපති ලෙස කටයුතු කරමින් සිටී.

බණ්ඩාර මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ගණකාධිකරණය පිළිබඳ BSc උපාධිය සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය - පොදු ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහය සාමාජිකයෙකු වන අතර, පිළිගත් විගණන සමාගමක් වන, අර්නස්ට් ඇන්ඩ් යන්ග් වෙතින් ඔහුගේ මූලික වෘත්තීය නිරාවරණය ලබාගෙන ඇත.



දයාරත්න පෙරේරා මහතා
ප්‍රධාන නිලධාරි – ජීවිත
BSc (Hons), FCII, වරලත් රක්ෂකල MBA (PIM-USJ), ANZIIF (Fellow) CIP, ව්‍යාපාර පරිපාලක ආචාර්ය උපාධිය සඳහා කියවීම (PIM – USJ)

දයාරත්න පෙරේරා මහතා කළමනාකරණ අභ්‍යාසලාභියෙක් වශයෙන් 1998 වසරේදී රක්ෂණ ක්ෂේත්‍රයෙහි සිය වෘත්තිය ආරම්භ කර ඇත. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබාගෙන ඇති අතර භෞතික විද්‍යාව පිළිබඳ දෙවන පෙළ (ඉහළ සමාර්ථය) BSc. (Hons) ගෞරව විශේෂ උපාධියක් ඔහු සතුය. උපාධිය ලබාගැනීමෙන් පසු, සහකාර කතිකාචාර්ය ලෙස එම විශ්ව විද්‍යාලයේම අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කොටස්කරුවෙක් වීමට ඔහුට වරප්‍රසාද ලද නමුත් ඔහුගේ කැමැත්ත මත එම තනතුර හැර දමා ආයතනික අංශය හා එක්විය.

ඔහු වරලත් රක්ෂකයෙක් සහ ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයේ (FCII) සහය සාමාජිකයෙක් ද වේ. ඔහු ඕස්ට්‍රේලියාව සහ නවසීලන්ත රක්ෂණ හා මූල්‍ය ආයතනයේ සහය සාමාජිකයෙක් ද වේ. ANZIIF (Fellow) CIP.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් (PIM) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇති අතර දැනට එම විශ්ව විද්‍යාලයෙන්ම ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය හදාරමින් සිටී.

වර්තමානයේ ඔහු සී බැන්ක් ඇසට් මැනේජ්මන්ට් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර ඔහු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන නිලධාරි – ජීවිත ලෙසද සේවය කරයි.

ඔහු ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ ජීවිත රක්ෂණ සංසදයේ ආසන්නතම හිටපු සභාපති වේ.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්



වෛද්‍ය මෙරිකා ප්‍රනාන්දු මහත්මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී – වෛද්‍ය
MBBS (SL), MSc – Community Medicine (SL), ACII (UK), MRCGP (INT)(UK), Ad. Dip in Insurance-CII, Dip in Life and Disability claims



ලලිත් ද සිල්වා මහතා
බෙදාහැරීම් ප්‍රධානී – සාමාන්‍ය
MBA, PG. in Finance and Bus. Administration, Executive Dip. in Accounting and Finance





නාමලී ඒ සිල්වා මහත්මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී – අලෙවිකරණ හා බෙදාහැරීම් (ජීවිත)
MBA, MCIM (UK), Chartered Marketer, Prof. Dip. in Marketing-CIM, ACIB (UK)

රෝහිත අමරපාල මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – මානව සම්පත් හා සේවක සම්බන්ධතා
CFCIPM (SL), FCMI (UK), MBA (Uni. of Western Sydney Aus.)



චමින්ද ගුණසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – පරිපාලන
B.B.Mgt. (Accountancy) Sp. (Hons), FCA, ACMA, MBA-Finance (Colombo), ACCA, CERT (UK)



සරත් ප්‍රනාන්දු මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – මෝටර් රථ
B.SB.Sc. Engineering – (Mechanical) Sp., AMIE (SL)



ශ්‍රී ලාල් රත්නායක මහතා
අභ්‍යන්තර විගණන ප්‍රධානී
(2023 මාර්තු 01 දින සිට පත්කළ)
BSc. – Accountancy (Sp.), FCA, FCMA, MBA (USJ)

සහකාර සාමාන්‍යාධිකාරිවරු



චමින්ද අතාවුද මහතා
සහකාර සාමාන්‍යාධිකාරී – ජීවිත (නාක්ෂණ)
BSc.(Hons), FCII, AIII, ANZIIF (Fellow) CIP, MBA (Colombo), Chartered Insurer



රොෂාන් කොලස් මහතා
සහකාර සාමාන්‍යාධිකාරී – බැංකු රක්ෂණ, විකල්ප බෙදාහැරීම හා ව්‍යාපාර රඳවා ගැනීම (සාමාන්‍ය රක්ෂණය) MBA, CMA (Aus), Dip. In Marketing (SLIM), MSLIM, FCPM, MIM (SL)



මහේන්ද්‍ර සිල්වා මහතා
සහකාර සාමාන්‍යාධිකාරී – පරිපාලනය
Attorney-at-Law, LLB (SL), MBA in HRM (OUSL), PG. Dip in HRM (OUSL), NDES (IET), MIIE (SL), IENG, AMCIPM (SL)(L)



ප්‍රියවංශ දේශප්‍රිය මහතා
සහකාර සාමාන්‍යාධිකාරී – විශේෂ ව්‍යාපෘති
FCA, B.Com (Spl.), FCMA



ජගත් වෙල්ගම මහතා
ජාතික විකුණුම් ප්‍රධානී (ජීවිත)
MBA, MABE (UK), Graduate Dip in Mgt. (Aus), PG Dip.– Marketing Mgt. (USJ), NDHTD (SLITAD), Ad. Dip in Marketing. Mgt. (USJ), Dip. in Mass Com. (USJ), Dip. in NIT, MSLIM



පීවන්ත වැලිහිඳ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී – ඉංජිනේරු සේවා
B.Sc. Eng. (Mechanical)



මධුභාෂිනී බක්මීදෙනිය මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරිනී – නීති
MBA (PIM), Attorney-at-Law, NDHRM (IPM)



නදීරා ගුණවර්ධන මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරිනී – මෝටර් රථ නොවන රක්ෂණය
BSc (Hon), MBS (Col), MBA (PIM/University of Canberra), FII, Sp. Dip in Marine (III), ACII (UK), Chartered Insurer





මහේෂ් ගමගේ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී – පොදු රක්ෂණ වර්ගය අලෙවිකරණ
MBA (AUS), CMA (AUS), PGD in Marketing (SL), MSLIM, CPM (ASIA)

ශමික රණසිංහ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී – ආයෝජන
CFA, FRM, B.Sc (Eng.), ACMA, AIB

සහකාර සාමාන්‍යාධිකාරිවරු



කසුන් සමීර මහතා
සහකාර සාමාන්‍යාධිකාරී – වර්ගීකරණ අලෙවිකරණ (ජීවිත රක්ෂණය)
වරලත් අලෙවිකරු, Pgd Dip in Marketing (CIM, UK), CPM (Asia Pacific), MCIM, Pgd Dip in Management (UoW UK), MBA (UWTSD, UK)



ශ්‍රියානි කුලසිංහ මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරිනී – මූල්‍ය
FCA, ACMA, MBA – Finance (Colombo), B.Com (Hons.) Spl.



ආමන්ද පෙරේරා
ප්‍රසම්පාදන ප්‍රධානී
HND (ISMM), Dip. in Hardware Eng., Msc in Supply Chain Management, Lean Six Sigma Professional, BCs Fellow Member
(2023 අප්‍රේල් 01 සිට පත්කළ)



චන්දිම සුමනතුංග මහතා
ප්‍රතිරක්ෂණ ප්‍රධානී
(2023 අප්‍රේල් 17 සිට පත්කළ)
FCII, MBA (Wales), AIII, Chartered Insurer

ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්



චන්දන විතානගේ මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ප්‍රධාන කාර්යාලය ව්‍යාපාර සංවර්ධනය



ප්‍රීමාල් රොඩ්රිගෝ මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ආරක්ෂක



දුමින්ද කන්දේගම මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – IT දත්ත මධ්‍යස්ථානය



ජගත් මෛත්‍රිරත්න මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – හදිසි අනතුරු



කපිල බණ්ඩාර මහතා
ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය ඉංජිනේරු
(2023 පෙබරවාරි 04 දින සිට විශ්‍රාම)



අරුණ රාජපක්ෂ මහතා
නියෝජ්‍ය ප්‍රධාන මෝටර් රථ ඉංජිනේරු – කලාපය 2



මිලන්ග චන්දිරම් මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ආයතනික ව්‍යාපාර සංවර්ධන



නලින් පටබැඳිගේ මහතා
ජ්‍යෙෂ්ඨ – සමාජ සාමාජික අලෙවි දෙපාර්තමේන්තුව



දීප්ති නාරංගම්මන මහතා
ජෙෂ්ඨ කළමනාකරු – නියෝජිත බදවාගැනීම



අරුණ සිරිමාන්න මහතා
ජෙෂ්ඨ කළමනාකරු – ව්‍යාපාර රඳවාගැනීම



නිහාල් සේනාධීර මහතා
නියෝජ්‍ය ප්‍රධාන මෝටර් රථ ඉංජිනේරු



දමයන්ති අත්තනායක මහත්මිය
ජෙෂ්ඨ කළමනාකාරිණී – නීති (ජීවිත)
(2023 පෙබරවාරි 24 දින සිට විශ්‍රාම)



මධුර ගුණතිලක මහතා
ජෙෂ්ඨ කළමනාකරු – ජාල සහ සන්නිවේදනය



සුනේත් දබරේරා මහතා
ජෙෂ්ඨ කළමනාකරු – බැංකු රක්ෂණ (ජීවිත)
(2023 අප්‍රේල් 21 දින සිට විශ්‍රාම)



රුවන් ද සිල්වා මහතා
ජෙෂ්ඨ කළමනාකරු – ජීවිත



සුජීවා නානායක්කාර මහත්මිය
ජෙෂ්ඨ කළමනාකාරිණී – ජීවිත

නායකත්ව කණ්ඩායම



දේශානි ජයතිලක මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී – නීති (නීතිකරණ)



දිල්ශානි ඩෙප් මෙනවිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී – SHE සහ PA



ජගත් ජයවර්ධන මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – HR



අංජන ධර්මසේන මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – පිටත



නිශාන්ති පෙරේරා මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී – පිටත



සුමිත් රණතුංග මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ප්‍රතිරක්ෂණ
(2023 මැයි 31 දින සිට ඉල්ලා අස්විය)



අමිල රාජපක්ෂ මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – මූල්‍ය මෙහෙයුම්
(2023 මැයි 27 දින සිට ඉල්ලා අස්විය)



චතුර පෙරේරා මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ගිනි හා ඉංජිනේරු නිමිකම්



චමිර ද ලිවේරා මහතා
ජෙෂ්ඨ අවදානම් ඉංජිනේරු



ලලිත් ජයසිංහ මහතා
ජෙෂ්ඨ කළමනාකරු – මෝටර්රථ හිමිකම්



චරුණි නෝනිස් මෙනවිය
ජෙෂ්ඨ කළමනාකාරිණී – මෝටර්රථ ප්‍රාරක්ෂණ



අනුර අබේගුණවර්ධන මහතා
ජෙෂ්ඨ කළමනාකරු – විශේෂ ව්‍යාපෘති



සුරාජි හෙට්ටිආරච්චි මහත්මිය
ජෙෂ්ඨ කළමනාකාරිණී – මෘදුකාංග සංවර්ධන (ජීවිත)



ඉන්ද්‍රාණි ඔබදමුදලිගේ මෙනවිය
ජෙෂ්ඨ කළමනාකාරිණී – මෘදුකාංග සංවර්ධන (පොදු)



ධම්මික ගුණවර්ධන මහතා
ජෙෂ්ඨ මෝටර් රථ ඉංජිනේරු



මිලන්ත විරක්කොඩි මහතා
ජෙෂ්ඨ කළමනාකරු – බෙදාහැරීම් මෙහෙයුම් (පුද්ගල මාර්ග – සාමාන්‍ය)

නායකත්ව කණ්ඩායම



මනීෂා ගුණසේකර මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී – මුහුදු



ප්‍රියන්ත පීරිස් මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – කොළඹ කවය ආයතනික ඒකකය



ජනක අල්විස් මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ව්‍යාපාර විශ්ලේෂණ හා පරිපාලනය



විඛූෂාන් බුලත්සිංහල මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – සාමාන්‍ය රක්ෂණය අලෙවි පුහුණු



සමින පෙරේරා මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ආයුගණක (ජීවිත)
(2022 මාර්තු 01 සිට පත්කරන ලදී)



එරන්ද රණසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු– ස්කන්ධ ආයෝජන
(2022 ජූනි 01 සිට පත්කරන ලදී)



තිලංක ගිගනගේ මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ස්ථිර ආදායම් ආයෝජන
(2023 පෙබරවාරි 01 සිට පත්කරන ලදී)



නාමල් කාන්චන මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – තොරතුරු ආරක්ෂාව
(2023 පෙබරවාරි 01 සිට පත්කරන ලදී)



දිනුෂ නුවන් මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – බැංකු රක්ෂණය (ජීවිත)
(2023 පෙබරවාරි 07 සිට පත්කරන ලදී)

ප්‍රාදේශීය කළමනාකරුවන්



බණ්ඩාර විරසූරිය මහතා
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(වයඹ 1)



සනත් ප්‍රනාන්දු මහතා
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(බස්නාහිර ඉහළ)



දීපාල් නවගමුව මහතා
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(බස්නාහිර 2)



දුමින්ද පීරිස් මහතා
ප්‍රාදේශීය කළමනාකරු – ජීවිත
(දකුණ 1)



උපුල් ගමගේ මහතා
ප්‍රාදේශීය කළමනාකරු – ජීවිත
(බස්නාහිර 1)



අජිත් කුලසේන මහතා
ප්‍රාදේශීය කළමනාකරු – ජීවිත
(රත්නපුර)



රංජිත් හේවාපතිරණගේ මහතා
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(බස්නාහිර 3)

නායකත්ව කණ්ඩායම



සුදේශ නාරංගල්ල මහතා
ප්‍රාදේශීය කළමනාකරු – පීවිත
(බස්නාහිර 4)



පී සතියාන් මහතා
ප්‍රාදේශීය කළමනාකරු – පීවිත
(උතුර)



ජගත් මෙන්ඩිස් මහතා
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(දකුණ 1)



කැලුම් ජයසිංහ මහතා
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(උතුර)



සමන්ත පිරිස් මහතා
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(බස්නාහිර 1)



හේමකුමාර අදිකාරි මහතා
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(මධ්‍යම)



ගාමිනී සරත්චන්ද්‍ර මහතා
ප්‍රාදේශීය කළමනාකරු – පීවිත
(මධ්‍යම)



ධම්මික බණ්ඩාර මහතා
ප්‍රාදේශීය කළමනාකරු – පීවිත
(උතුර)



අජිත් තිලකරත්න මහතා
ප්‍රාදේශීය කළමනාකරු – ජීවිත
(උතුරු මැද)



මහින්ද දිසානායක මහතා
ප්‍රාදේශීය කළමනාකරු – ජීවිත
(වයඹ 1)



පොන්නයියා
පුවනේන්ද්‍රන් මහතා
ප්‍රාදේශීය කළමනාකරු –
ජීවිත (නැගෙනහිර)



නාමල් ලියනගේ මහතා
ප්‍රාදේශීය කළමනාකරු – ජීවිත
(බස්නාහිර ඉහළ)



ආර් ලිංගේෂ්වරන් මහතා
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(නැගෙනහිර)



එන් එස් එස් ලක්ෂානා මහත්මිය
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(බස්නාහිර 4)



සුසන්ත දිසානායක මහතා
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(රත්නපුර)

නායකත්ව කණ්ඩායම



උත්තරා දිසානායක මහත්මිය
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(දකුණු 2)



අරුණ බස්නායක මහතා
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(වයඹ 2)



සුනිල් සේනාධීර මහතා
ප්‍රාදේශීය කළමනාකරු – ජීවිත
(බස්නාහිර 2)



ප්‍රසන්න කුමාර මහතා
ප්‍රාදේශීය කළමනාකරු – ජීවිත
(වයඹ 2)



ඉන්දික වෙල්ගම මහතා
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(උතුරු මැද)




එස් කාර්තන් මහතා
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
(උතුරු)




සුලතා ආනන්දමානගේ මහත්මිය
ප්‍රාදේශීය කළමනාකරු – ජීවිත
(බස්නාහිර 3)
(2022 නොවැම්බර් 01 සිට පත්කරන ලදී)

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමූහයේ ව්‍යූහය



මූල්‍යමය වැදගත් සිදුවීම් 2022

	2022 රු. මිලියන	2021 රු. මිලියන
වසර සඳහා ප්‍රතිඵල		
මුළු ආදායම	63,685	64,062
දළ ලිඛිත වාරික	41,272	43,231
ශුද්ධ උපයන ලද වාරික	37,024	38,397
ආයෝජන හා වෙනත් අදායම්	26,661	25,665
බදුකරණයට පෙර ලාභය (PBT)	12,476	11,725
බදුකරණයට පසු ලාභය (PAT)	10,546	10,041
ප්‍රතිලාභ/හිමිකම්, මෙහෙයුම්, පරිපාලන සහ වෙනත් වියදම්	40,191	33,487
සාමාන්‍ය රක්ෂණය		
සාමාන්‍ය රක්ෂණ අරමුදල	21,690	20,880
ශුද්ධ හිමිකම් අනුපාතය	63%	60%
වියදම් අනුපාතය	42%	35%
ජීවිත රක්ෂණය		
ජීවිත රක්ෂණ අරමුදල	156,719	152,585
වියදම් අනුපාතය	41%	34%
මුහුණත වටිනාකම මත ප්‍රසාද දීමනා	10,494	9,836




මූල්‍ය නොවන වැදගත් සිදුවීම් 2022




පිළිගැනීම්

- ජීවිත රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය සඳහා අඛණ්ඩව 5ස් වැනි වරටත් වඩාත් ආදරනීය රක්ෂණ සන්නාම ප්‍රදානය
- ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළම සන්නාම වටිනාකම් වර්ධනය සඳහා ඉහළම සමාගම් 5 අතර සිටීම
- අඛණ්ඩව 5ස් වැනි වරටත් වඩාත් වටිනා සාමාන්‍ය රක්ෂණ සන්නාම ප්‍රදානය
- "Great HR Quiz" හිදි රක්ෂණ, මූල්‍ය, සහ ආයෝජන අංශ ප්‍රදානය
- CIMA Satyn කාන්තා හිතකාමී සේවා ස්ථාන සම්මානය
- ISO 9001:2015 තත්ත්ව සහතික නැවත සහතික කිරීම
- ජාතික වාණිජ මණ්ඩලය විසින් ඉදිරිපත් කළ ජාතික ව්‍යාපාර විශිෂ්ඨත්ව සම්මාන - 2021 - දෙවන ස්ථානය - රක්ෂණ අංශය
- ඉහළම සේවා ස්ථානය ලෙස සහතික කිරීම



නව නිෂ්පාදන හා සේවා

- one-click සෞඛ්‍ය රක්ෂණ විසඳුමක් වන"Medi Plus" සෞඛ්‍ය රක්ෂණ සැලැස්ම හඳුන්වාදීම
- වාරික මෝටර් රථ හිමිකාර වෙළෙඳපොල අංශය සඳහා වෙන්කළ විශේෂ මෝටර් රථ රක්ෂණයක් වන "Motor Plus Pinnacle" ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හඳුන්වාදීම
- ශ්‍රී ලංකාවේ පොදු ජනතාවට රක්ෂණ ප්‍රතිලාභ පුළුල් කිරීමට "ජන රැකුම", තනි පුද්ගල අනතුරු ආවරණය හඳුන්වාදීම.
- සෞඛ්‍ය රක්ෂණ අවශ්‍යතා රාශියක් ආවරණය කරමින් ජේෂ්ඨ පුරවැසියන් සඳහා සුවිශේෂ රක්ෂණ ආවරණයක් වන "Medi 60", හඳුන්වාදීම.
- "පාසල් ගාස්තු ආරක්ෂක" අධ්‍යාපනික සැලැස්ම හඳුන්වාදුන් අතර ඉන් දෙමව්පියන් අකාලයේ මියයාම හෝ ආබාධිතවීම වැනි අවස්ථාවකදී ළමුන් සඳහා බාධා රහිත අධ්‍යාපනය සහතික කරයි



පාරිසරිකමය ප්‍රමිති

- SLIC ISO 14064-1:2018 ප්‍රමිතිය සමඟ ඉදිරියට යාම



හවුල්කාරත්වයන්

- ඩ්‍රයිව්ලයින්,

  ලංකා මෝටර් රථ වෙළඳ සංගමය (CMTA), ත්‍රී සිංහ ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සාමගම සහ ග්ලිට්ස් පාර්ක් (පුද්ගලික) සාමගම ආදිය, සමඟ අවබෝධතා ගිවිසුම්වලට ඇතුළත් විම.
- ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ "Smart ATM" ස්ථාපනය කිරීමත් සමඟ විස්තීර්ණ මුදල් කළමනාකරණය සහ අයකිරීමේ විසඳුම් ලබාදීමට NTB බැංකුව සමඟ හවුල්කාරත්වයකට ඇතුළත් විය.



පාලනය, අවදානම සහ අනුකූලතාව

- "පාලනය, අවදානම් සහ අනුකූලතාව" (GRC) රාමුව ඵලදායීව ක්‍රියාත්මක කිරීම
- දත්ත ආරක්ෂක නීතිමය රාමුව ඇතුළුව නවතම අනුකූලතා අවශ්‍යතා ඇතුළත් කරමින් ප්‍රතිපත්ති යාවත් කිරීම
- ඩිජිටල් රැස්වීම් සහ මුදල් විශුද්ධිකරණ රාමුව යනාදිය සම්බන්ධයෙන් ඵලදායිත්වය වර්ධනය කිරීමට තාක්ෂණය දියුණු කිරීම



සිදුවීම්

- 2022 වසර සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි MDRT සාක්ෂාත් කරගත් අය පිළිගැනීම සහ ප්‍රදානය සඳහා MDRT දිනය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින් පවත්වන ලදී.
- 2021 වසර සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි MDRT සාක්ෂාත් කරගත් අය පිළිගැනීම සහ ප්‍රදානය සඳහා MDRT දිනය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින් පවත්වන ලදී.
- **ජීවිත සංගමය** – 2021 හි පළමු මාස 6 තුළ ජීවිත රක්ෂණ වර්ගීකරණයේ ඉහළම කාර්යසාධකයින් පිළිගැනීම සඳහා නේවාසික පුහුණු වැඩසටහන සහ සම්මාන උත්සවය ෙමරටත් කොස්ගොඩ පවත්වන ලදී.
- **තරු සම්මාන** – 2021 වසර තුළ අපේක්ෂාවන් ඉක්මවීමට වෙහෙස නොබලා කටයුතු කළ ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ වර්ගීකරණයන් හී සුවිශේෂී කාර්යසාධකයින් පිළිගනිමින් වාර්ෂික සම්මාන උත්සවය පවත්වන ලදී.


27-34
නායකත්ව සමාලෝචනයන්

> 28 සභාපතිවරයාගේ පණිවිඩය

> 31 ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය



සභාපතිවරයාගේ පණිවිඩය



“අප සමාගම මහත් කැලඹුමෙන් අනතුරට පත් නොවී සිටියා පමණක් නොව මින් පෙර කවරදාටත් වඩා ශක්තිමත්ව මතුවෙමින් ඉහළම ප්‍රතිඵල අත් කර ගනිමින් අපේක්ෂාවන් ඉක්මවා ඇති බව නිවේදනය කිරීමට ලැබීම මට සතුටකි.”

සභාපතිවරයාගේ පණිවිඩය

පෙර නොවූවිරූ අභියෝග හමුවේ අප සමාගමේ ඔරොත්තුදීම සහ අධිෂ්ඨානය පිළිබිඹු කරමින් මෙම වසරේ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම ඉතාමත් සතුටුදායක ඉටු කිරීම පිළිබඳ හැඟීමකි. 2022 වසර අපගේ ව්‍යාපාරයේ ධෛර්ය පරීක්ෂා කිරීමකි. දුෂ්කර කාලසීමා හමුවේ, අප සමාගම මහත් කැලඹුමෙන් අනතුරට පත් නොවී සිටියා පමණක් නොව මින් පෙර කවරදාටත් වඩා ශක්තිමත්ව මතුවෙමින් ඉහළම ප්‍රතිඵල අත් කර ගනිමින් අපේක්ෂාවන් ඉක්මවා ඇති බව නිවේදනය කිරීමට ලැබීම මට සතුටකි. මෙම සාර්ථකත්වය අපගේ සේවකයින්ගේ නොසැලෙන කැපවීම, අපගේ වටිනා ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය සහ සහයෝගය, සහ අපගේ කැපවූ නායකත්ව කණ්ඩායම විසින් සිදුකළ උපායමාර්ගික තීරණ පිළිබඳ සාක්ෂියකි. මෙම දැනුම්දීම තුළ, අපගේ ජයග්‍රහනයේදී සැලකියයුතු කාර්යභාරයක් ඉටු කළ ප්‍රධාන අංග පිළිබඳ අවධානය යොමු කිරීමට සහ අපගේ ඉදිරි වර්ධන ගමන්මඟ පවත්වා ගැනීමට අප යොදාගත් කාර්යයන් පහදා දීමට මම කැමැත්තෙමි.

> “ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අබණ්ඩව වසර කීපයක් සඳහා මෝටර් රථ රක්ෂණයේ වෙළෙඳපොල නායකයා ලෙස සිය තත්ත්වය පවත්වා ගෙන ඇත. 2022 මූල්‍ය වසරේදී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රු. මිලියන 11,673ක් වූ පසුගිය වසරේ දළ ලිඛිත වාරිකය ඉක්මවමින් රු. මිලියන 12,780 ක් වටිනා දළ ලිඛිත වාරිකයක් වාර්තා කළේය.”

අහිතකර සාර්ව ආර්ථික අංග ස්වභාවිකව සමාගම මෙන්ම පොදුවේ ක්ෂේත්‍රය කෙරෙහි බරපතල පීඩනයක් ඇති කළේය. ඉහළ පොළී අනුපාත සහ අඩුකළ විශ්වාසය මූල්‍ය සේවාවල සංකෝචනයට හේතු විය. ආර්ථිකය දැඩි ලෙස පහත වැටීමත් සමඟ, රක්ෂකයින්ට ඔවුන්ගේ සමාජීය අරමුණ සහ අවදානම් භාර ගැනීම නැවත සිතා බැලීමට බලකරන ලදී. මෙම සංවර්ධනයන් සමාගම කෙරෙහි විවිධ බලපෑම් ඇති කරන ලදී. එසේවුවත්, සමාජීය, ආර්ථික, සහ මූල්‍ය පසුබිම සලකා බලමින් සමාගම වැඩදායක කාර්යසාධනයකට මාරු විය.

උද්ධමනීය පීඩනයන් විසින් ඇතිකළ ගනුදෙනුකරුවන්ගේ වියදම්කළ හැකි ආදායම අඩුවීම සහ මෝටර් රථ ආනයනය තහනම් කිරීම මගින් සමාගමේ දළ ලිඛිත වාරිකයට (GWP) අහිතකර ලෙස බලපාන ලදී. ඉහළ යන උද්ධමනය මෙහෙයුම් පිරිවැය වේගයෙන් ඉහළයාමකට හේතු විය.

2022 වසර තුළ, අභියෝගාත්මක ආර්ථික සහ සමාජ තත්ත්වයන් හමුවේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආකර්ශනීය කාර්යසාධනයක් පෙන්වන අතර සැලකියයුතු සන්ධිස්ථාන අත්කර ගන්නා ලදී. 2022 වසර තුළ, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශක්තිමත් මූල්‍ය කාර්යසාධනය පෙන්නුම් කරමින් රු. බිලියන 12.47ක බදු පෙර ලාභයක් වාර්තා කළේය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ඒකාබද්ධ දළ ලිඛිත වාරිකය සමාගමේ සැලකියයුතු වෙළෙඳපොල පැවැත්ම සහ ව්‍යාපාර වර්ධනය පිළිබිඹු කරමින් 2022 දී රු. බිලියන 41.2ක දක්වා ලඟාවිය. මුළු දළ ලිඛිත වාරිකයෙන් ජීවිත රක්ෂණ ව්‍යාපාරය රු. බිලියන 20.9ක් සහ සාමාන්‍ය රක්ෂණය රු. බිලියන 20.3ක් වාර්තා කළේය.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අබණ්ඩව වසර කිහිපයක් සඳහා මෝටර් රථ රක්ෂණය තුළ වෙළෙඳපොල නායකයා ලෙස එහි තත්ත්වය පවත්වා ගන්නා ලදී. 2022 මූල්‍ය වසර තුළ, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පසුගිය වසරේ වාර්තාකළ රු. මිලියන 11,673 ඉක්මවා යමින් රු. මිලියන 12,780ක දළ ලිඛිත වාරිකයන් වාර්තා කළේය. මෝටර් රථ රක්ෂණය තුළ 9.5%ක සැලකියයුතු වර්ධනයන් මින් පෙන්නුම් කරයි. මෝටර් රථ රක්ෂණය තුළ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි වර්ධනය ක්ෂේත්‍රය වාර්තාකළ 7.3%ට වඩා ඉහළ අගයක් වීම සැලකියයුතු කරුණකි. ප්‍රාග්ධන වෙළෙඳපොල ඵලදායීව ග්‍රහනය කිරීමට සහ මෝටර් රථ රක්ෂණ අංශය තුළ සමස්ථ ක්ෂේත්‍රයේ වර්ධනය අත්කර ගැනීමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි හැකියාව මින් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි වත්කම් පදනම රු. බිලියන 274 දක්වා වැඩි වූ අතර ඒ තුළින් රටේ විශාලතම රක්ෂකයා ලෙස මූල්‍ය ස්ථාවරත්වය සහ ශක්තිය පිළිබිඹු කරයි. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ජීවිත අරමුදල 2022 දී රු. බිලියන 156.7ට ලඟා වූ අතර ඒ තුළින් එහි ජීවිත රක්ෂණ කළඹ කාර්යක්ෂමව කළමනාකරණය කර වර්ධනය කර ගැනීමට සමාගමට ඇති හැකියාව පෙන්නුම් කරයි.

සමාගම ගනුදෙනුකාර තෘප්තිය සහ වටිනාකම සඳහා සිය ශක්තිමත් බැඳීම පෙන්නුම් කරමින් පසුගිය වාර්තා ඉක්මවා යමින් එහි ඔප්පුහිමියන්ට ජීවිත රක්ෂණ ප්‍රසාද දීමනා ලෙස රු. බිලියන 10.49ක මුදලක් ප්‍රකාශයට පත් කළේය.

ජීවිත රක්ෂණ ව්‍යාපාර කෙරෙහි ධනාත්මක සහ සෘණාත්මක සමාජ ආර්ථික පාරිසරික බලපෑම් ඇත. කොවිඩ් 19 වසංගතය විසින් ජීවිත සහ සෞඛ්‍ය රක්ෂණයේ වැදගත්කම පිළිබඳ වැඩි වූ දැනුමකට හේතු වූ අතර, රටේ වයස්ගත ජනතාව තවත් හිතකර සාධකයකි. අනෙක් අතට, වියදම් කළහැකි ආදායම අඩුවීම ජීවිත රක්ෂණ ඔප්පු ලබා ගැනීමේ ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් පහත හෙලන ලදී.

තවද, තැන්පතු මත ඉහළ පොලී අනුපාත ඉපයීමට ඇති අවස්ථාවන් ජීවිත රක්ෂණයෙන් බැහැර වීමට හේතුවක් විය. සාමාන්‍ය රක්ෂණය සම්බන්ධයෙන්, මෝටර් රථ ආනයනය තහනම් කිරීම මෝටර් රථ රක්ෂණය පහත යාමට විශාල හේතුවක් වූ අතර එය රක්ෂකයින් අතර තරඟය වැඩිකර ඇත. එමෙන්ම ගනුදෙනුකරුවන් සම්පූර්ණ ආවරණයේ සිට තෙවන පාර්ශව ඔප්පු දක්වා මාරුවීමේ ප්‍රවනතාවයක් ද ඇත.

සමාගමට දරුණු වාතාවරණයත් සමඟ එහි උපායමාර්ග, නිෂ්පාදන සහ සේවා ගලපා ගැනීමට සිදු විය. මෙම අවස්ථාවේ සිදුකළ යුතුව සහ පවත්නා නිෂ්පාදන පරාශයේ පරතරය අවම කිරීමට නව නිෂ්පාදන කිහිපයක් දියත් කරන ලදී. ඒවාට නිදසුන් ලෙස, ජාත්‍යන්තර සහ පුද්ගලික පාසල්වල සිසුන් සඳහා පාසල් ගාස්තු ආරක්ෂක රක්ෂණය, ජන රැකුම පුද්ගල අනතුරු ආවරණය, Medi 60 ජ්‍යේෂ්ඨ පුරවැසි රක්ෂණ ආවරණය, සහ ජ්‍යේෂ්ඨ පුරවැසියන් සඳහා Motor Plus Drive 60 රක්ෂණ ආවරණය සඳහන් කළ හැකිය. ජීවිත රක්ෂණය අරමුණු කළ අලෙවි කණ්ඩායමක් ඉහළම මට්ටමේ මූලික කාර්යසාධන දර්ශක අත් කරගැනීමට යොදවන ලදී. ඒ සම්බන්ධයෙන් විකල්ප මාර්ග ද ශක්තිමත් කරන ලදී. සාමාන්‍ය රක්ෂණය තුළ, තිරසාර වර්ධනය සමඟ ඉහළින් සිටීමට සහ ඒමගින් රක්ෂණ පිරිවැය සහ ලාභය වර්ධනය කිරීමට අපි උත්සාහ ගත්තේය.

> “අපගේ පුළුල් ආයතනික උපායමාර්ගයට සමගාමීවීම සඳහා මානව සම්පත් ප්‍රතිපත්ති අපි සංවර්ධනය කර ඇත. ආයතනික වටිනාකම අපගේ කාර්යසාධන ඇගයීම්වලට ඇතුළත් කර ඇත. මේවාට විශිෂ්ඨත්වය සඳහා අන්‍යෝන්‍ය විශ්වාසය සහ ගෞරවය, එකමුතුබව, සදාචාර සහ අවංකකම, ව්‍යක්තීමය බැඳීම සහ උත්සාහය ඇතුළත්ය.”

අපි වෙනස්වන ගනුදෙනුකාරවරණයන් සහ හැසිරීම් සමඟ අනුරූපව සිටීමට නව්‍යකරණය කරමු. සූහුරු උපාංග සහ සමාජ මාධ්‍ය භාවිතය වැඩිවීම මෙම වෙනස සඳහා ධාවකයින් බවට පත්ව ඇත. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් (SLIC) ගනුදෙනුකාර පහසුව වැඩි කිරීමට අසමසම වටිනාකම එකතුකළ සේවා ලබාදීමට උත්සාහ කර ඇත.

මේ සම්බන්ධයෙන් පියවරක් වන්නේ SLIC ගනුදෙනුකාර යෙදුම හඳුන්වාදීම වන අතර ඒ තුළින් ගනුදෙනුකරුවන්ට සේවා හා ඔප්පු විස්තර දැනගැනීම, වාරික ගෙවීම් සිදු කිරීම, මෝටර් රථ රක්ෂණ හිමිකම් ආරම්භ කිරීම සහ මාර්ග සහ හදිසි අවස්ථාවක පිවිසීම සිදු කළ හැකිය. එමෙන්ම ගනුදෙනුකරුවන් සඳහා පහසු වාරික ගෙවීම සඳහා SLIC විසින් මොබිටෙල්, ලංකා බැංකුව, මහජන බැංකුව සමඟ හවුල්කාරත්වයන්ට ඇතුළත් විය. එමෙන්ම නව පරිශීලක හිතකාමී අතුරු මුහුණතක් හඳුන්වා දෙමින් ගනුදෙනුකරුවන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය සරල කිරීම වැනි වෙනත් ඩිජිටල් කරණ සංවර්ධනයන් ද සිදුවිය. ගනුදෙනුකරුවන්ට සිය හිමිකම් ලියවිලි ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කිරීමේ හැකියාව ඇති කරන ඩිජිටල් අවකාශයක් හඳුන්වා දෙමින් හිමිකම් ලබා ගැනීමේ ක්‍රියාවලිය තුළද වඩාත් පහසුව ඇති කරන ලදී.

අපගේ පුළුල් ආයතනික උපායමාර්ගයට සමගාමීවීම සඳහා මානව සම්පත් ප්‍රතිපත්ති අපි සංවර්ධනය කර ඇත. ආයතනික වටිනාකම අපගේ කාර්යසාධන ඇගයීම්වලට ඇතුළත් කර ඇත. මේවාට විශිෂ්ඨත්වය සඳහා අන්‍යෝන්‍ය විශ්වාසය සහ ගෞරවය, එකමුතුබව, සදාචාර සහ අවංකකම, ව්‍යක්තීමය බැඳීම සහ උත්සාහය ඇතුළත්ය.

අවසාන වශයෙන්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අඛණ්ඩ සාර්ථකත්වයට දායක වූ අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය, සේවකයින් සහ නියෝජිතයින් ඇතුළු සියලුම දෙනා වෙත මගේ කෘතඥතාවය පළකිරීමට මම කැමැත්තෙමි. ඔවුන් මෙම පීඩන කාලයන් තුළ එකට එක්වී සමාගම සාර්ථකව මෙහෙයවා ඇත. එමෙන්ම සියලුම නෛතික සහ පරිපාලන අවශ්‍යතාවන්ට අනුකූලවීමේදී අපව මෙහෙයවන ලද මුදල් අමාත්‍යාංශය සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව ඇතුළු සියලුම රජයේ ආයතන වෙත මාගේ ස්තුතිය පිරිනමමි. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ රක්ෂකයා ලෙස සිය තත්ත්වය පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෙරෙහි අඛණ්ඩ විශ්වාසය සහ පක්ෂපාතිත්වය තබන ලද අපගේ ගනුදෙනුකරුවන් ද මම අමතක නොකරමි.



රොනල්ඩ් සී පෙරේරා, ජනාධිපති නීතිඥ
සභාපති

2023 මැයි 10

ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය



> “ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ඔරොත්තුදීම, නවෝත්පාදනය සහ තිරසාර අනාගත වර්ධනය කරා බැඳීමක් මගින් සලකුණු කළ පරිවර්තනීය කාලසීමාවක් තුළින් ගමන් කර ඇත.”

මෙම වසර තුළ අප සිදුකර ඇති සැලකියයුතු ප්‍රගතිය සහ ඉටු කිරීම් පිළිබිඹු කරන 2022 වාර්ෂික වාර්තාව සඳහා ප්‍රධාන විධායක නිලධාරී සමාලෝචනය ඉදිරිපත් කිරීමට ලැබීම මට සතුටකි.


ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ඔරොත්තුදීම, නවෝත්පාදනය සහ තිරසාර අනාගත වර්ධනය කරා බැඳීමක් මගින් සලකුණු කළ පරිවර්තනීය කාලසීමාවක් තුළින් ගමන් කර ඇත. මාරක වසංගතයක ප්‍රතිසාධනයෙන් පසු ආර්ථික පහළ වැටීමක් කරා අප ගමන්කළ මෙම වසර තුළ අපි අපගේ ලාභදායිතාව රඳවා ගෙන අපගේ ව්‍යාපාරය සරල කර ඇත. 2022 දී ජාතිය ආර්ථික, සමාජීය සහ දේශපාලනිකව ඇදවැටීම් සමඟ කටයුතු කළේය.

විදේශ විනිමය හිඟය ගෑස්, ඉන්ධන, ඖෂධ, සහ කාර්මික අමු ද්‍රව්‍යවල බරපතල හිඟයක් ඇති කර ලදී. ඩොලරයට සාපේක්ෂව රුපියල 200 සිට 350 දක්වා වේගයෙන් අවප්‍රමාණය විය. උද්ධමනය සහ පොළී අනුපාත ඉහළයාම තවදුරටත් රුපියලේ ද්‍රවශීලතාවය පහත හෙලන ලදී.

ආර්ථික අභියෝග හමුවේ, විශිෂ්ඨත්වය සඳහා අපගේ බැඳීම අපි පවත්වා ගෙන ඇත. කොවිඩ් 19 වසංගතයෙන් ඉගෙන ගත් එක් වැදගත් කරුණක් වූයේ අනපේක්ෂිත අභියෝගවලට මුහුණ දෙන ආකාරයයි. මෙම අත්දැකීම 2022 දී එහි වටිනාකම සනාථ කළේය. අපගේ ශක්තිය මත ප්‍රාග්ධනීයකරණය කරමින් සහ නව අවස්ථා සොයමින් වෙනස්වන වෙළෙඳපොල ගතිකතාවන්ට අපි ඉක්මනින්ම අනුවර්තනය වී ඇත. ගනුදෙනුකාර තෘප්තිය, මෙහෙයුම් කාර්යක්ෂමතාව කෙරෙහි අපගේ ස්ථීර අවධානය පවත්වා ගනිමින් සහ අපගේ ආයෝජන ආරක්ෂා කරමින් අපි අඛණ්ඩව ප්‍රතිඵල ලබා දී ඇත.

මූල්‍යමය කාර්යසාධනය

අහිතකර සමාජ ආර්ථික වාතාවරණය හමුවේ, SLIC ආර්ථිකය පසුබෑමේ සංදර්භය බැලීමේදී ප්‍රසංගනීය මූල්‍ය කාර්යසාධනයක් සමඟ වසර අවසන් කර ඇත. සමාගම රු. බිලියන 10.55ක බදු පෙර ලාභයක් වාර්තා කළ අතර එය 2021 5%ක වැඩි වැඩිවීමකි. එසේ වුවත්, ජනතාව අතර බැහැර කළ හැකි ආදායම අඩුවීමේ අනිවාර්ය සංරෝධක විය. ආදායම සහ දළ ලිඛිත වාරික පිළිවෙලින් රු. බිලියන 63.68ක් සහ රු. බිලියන 41.27ක් වූ අතර 0.5%ක සහ 4.5%ක සෘණාත්මක වර්ධනයකි. ජීවිත රක්ෂණ ව්‍යාපාරය රු. බිලියන 20.93 දක්වා 4.8%ක වාර්ෂික පහත වැටීමක් දළ ලිඛිත වාරිකවල වාර්තා කළේය. SLIC හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය රු. බිලියන 20.34ක දළ ලිඛිත වාරික වාර්තා කළ අතර එය පසුගිය වසරට වඩා 4.3%ක අඩු වීමකි. වෙළෙඳපොල නායකයා ලෙස කටයුතු කරන මෝටර් රථ රක්ෂණ අංශය රු. බිලියන 12.78ක වාරික වටිනාකමක් වාර්තා කළ අතර 19.6% වෙළෙඳපොල කොටස රැකගෙන ඇත. ආයෝජන ආදායම රු. බිලියන 13.8 දක්වා 41%ක පහත වැටීමක් පෙන්වූ අතර පොදු ආර්ථික තත්ත්වය හේතුවෙන් ස්කන්ධ වෙළෙඳපොල වේගයෙන් වෙනස්වීම එයට හේතු විය. සමාගම පසුගිය වසරේ පැවති 13.4%ට සාපේක්ෂව 2022 දී 13.8%ක ස්කන්ධය මත ඉපයීමක් සාක්ෂාත් කරගෙන ඇත. වැදගත්ම ජයග්‍රහනය වූයේ සමාගම ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ අද දක්වා විශාලතම ප්‍රසාද දීමනාව වන රු. බිලියන 10.49 ප්‍රකාශයට පත් කිරීම වන අතර එය පසුගිය විශාලතම ප්‍රසාද දීමනාව වන රු. බිලියන 9.84 වටිනාකම 6.7%කින් ඉක්මවා යයි. සමාගමේ මුළු වත්කම් රු. බිලියන 274 දක්වා වාර්ෂිකව 2.3%කින් වර්ධනය වී ඇත. එමෙන්ම SLIC වත්කම් අනුව ක්ෂේත්‍රයේ විශාලතම තරඟකරු ලෙස ස්ථානය රඳවා ගෙන ඇත.



අලෙවිකරණ වැඩසටහන්

නව නිෂ්පාදන ගණනාවක් වසර තුළ දියත් කළ අතර ඒවායින් සමහරක් විශේෂ වෙළෙඳපොල අංශ ඉලක්ක කරන ලදී. ජෙෂ්ඨ පුරවැසියන්ගේ අවශ්‍යතා සඳහා වැදගත්වන නිෂ්පාදන දෙකක් දියත් කරන ලදී. ඉන් එකක් Medi 60 වන අතර මේ තුළින් ඔවුන් ඉලක්ක කරමින් වටිනාකම එකතුකළ ප්‍රතිලාභ රාශියක් සමඟ ජෙෂ්ඨ පුරවැසියන් සඳහා අත්‍යවශ්‍ය සෞඛ්‍ය ආවරණ ලබා දේ. Motor Plus Drive 60 මගින් වයස අවුරුදු 60 ඉක්වමූ පුද්ගලයින් සඳහා ඉතා ආකර්ෂනීය මෝටර් රථ රක්ෂණ අංග රාශියක් පිරිනමයි. Motor Plus Pinnacle, එහි නාමයෙන් හැඟෙන පරිදි ජීවන රථා සහ ඉහළ අපේක්ෂාවන් සහිත ගනුදෙනුකරුවන්ට යෝග්‍ය වේ. එයට රක්ෂිතය සහ මඟීන් සඳහා හදිසි අනතුරු මරණ ආවරණය, හදිසි පහසුකම් ආවරණය සහ ඉලක්ක කළ අයගේ ජීවන රථාවන්ට ගැලපෙන වෙනත් අගය එකතුකළ ප්‍රතිලාභ වැනි අංග ඇතුළත්ය. අපගේ වෛද්‍ය රක්ෂණ පැකේජය වන Medi Plus, සෞඛ්‍ය රක්ෂණ නිෂ්පාදන රාශියක් සමඟ නැවත සකස් කළ අතර දැන් එය මාර්ගගතව ද ලබා ගත හැකිය.

ජීවිත රක්ෂණ අංශය තුළ වැදගත් වැඩසටහන වූයේ පාසල් ගාස්තු ආරක්ෂක රක්ෂණයයි. මේ මගින් උපයන්නා අහිමිවීම හෝ ආබාධවීම වැනි අවස්ථාවක ළමුන්ට බාධා රහිත අධ්‍යාපනය සඳහා මූල්‍ය සහය සහතික කරයි. සිය දරුවන්ගේ අධ්‍යාපනය සඳහා රාජ්‍ය අධ්‍යාපන පද්ධතියට විකල්ප සොයන දෙමව්පියන්ගෙන් ගණන වැඩිවීමේ සාධකය මත මෙම නිෂ්පාදනය වැදගත් නිෂ්පාදනයකි.

ඉහත වැඩසටහන් මගින් ව්‍යාකූල තත්වයක් තුළ SLIC පීඩාවට පත් කර නොමැති නමුත් ඒ වෙනුවට වර්ධනය සඳහා අවස්ථා සොයා ගෙන ඇති බව පෙන්නුම් කරයි.

> “ජීවිත රක්ෂණ අංශය තුළ වැදගත් වැඩසටහන වූයේ පාසල් ගාස්තු ආරක්ෂක රක්ෂණයයි. මෙමගින් උපයන්නා අහිමිවීම හෝ ආබාධවීම වැනි අවස්ථාවක ළමුන්ට බාධා රහිත අධ්‍යාපනය සඳහා මූල්‍ය සහය සහතික කරයි.”

ගනුදෙනුකාර සම්බන්ධතා

සංකෝචනය වන පරිසරය ගනුදෙනුකරුගේ පහසුව සහ සම්පත්වය ප්‍රමුඛ වන්නේය යන සාධකයට අපි බොහෝසෙයින් අනුකූල වී ඇත. සාමාන්‍ය රක්ෂණ ගනුදෙනුකරුවන් සඳහා, අපගේ ඇමතුම් මධ්‍යස්ථානය පැය විසිහතර පුරා සහය ලබා දේ. එම මධ්‍යස්ථානය විමසීම්වලට පිළිතුරු දීමේදී, ඔප්පු විකල්ප පිළිබඳ මඟ පෙන්වීමේදී සහ හිමිකම් සම්බන්ධ කටයුතු කිරීමේදී කඩිනම් සේවය සලසයි.

ජීවිත රක්ෂණ ගනුදෙනුකරුවන් සඳහා, SLIC Life Loyalty Rewards හඳුන්වා දෙන ලද අතර ඉන් ජීවිත රක්ෂණ ගනුදෙනුකරුවන්ට ඔප්පුවේ කාලසීමාව පුරා අපගේ පක්ෂපාති ගනුදෙනුකරුවන් සඳහා වඩා ඉහළ වටිනාකම ලබා දෙමින් ප්‍රතිලාභ රාශියක් පිරිනමයි. හිමිකම් පිරිසැකසීම සහ ඔප්පුහිමියන්ගේ සේවය සැලසීම ද වර්ධනය කර ඇත.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවාදායක ප්‍රතිපෝෂණ අගය කරන අතර, ගනුදෙනුකරුවන්ට සමාගම සමඟ සෘජුවම අදහස් දක්වීමට සහ සන්නිවේදනය කිරීමට අවකාශ ගණනාවක් ලබා දේ. මේවාට පැය 24 ඇමතුම් මධ්‍යස්ථානය, අපගේ ආයතනික වෙබ් අඩවිය, සහ සමාජ මාධ්‍ය අවකාශ ඇතුළත්ය. නව පරම්පරාවේ ගනුදෙනුකරුවන් සමඟ අනුරූප වීම සඳහා, සන්නිවේදන මාර්ගයක් ලෙස අපි WhatsApp හඳුන්වා දී ඇත.

ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

සියලුම සේවාදායකයින් අපගේ සේවය ප්‍රයෝජනවත් ලෙස දකින අතර, අපගේ සේවය සහ අපගේ ව්‍යාපාර ක්‍රියාවලි වර්ධනය කිරීමට අවස්ථාවක් ලෙස එය අපි දකිමු. අපගේ මනාව පුහුණුව ලත් කාර්ය මණ්ඩලය ගනුදෙනුකාර ප්‍රශ්න ගොනුකර, විමර්ෂණය කර, සහ වඩාත් විශේෂයෙන් කඩිනමින් විසඳන බවට සහතික වේ. අපට ගනුදෙනුකාර පැමිණිලි කළමනාකරණ පද්ධතියක් ඇති අතර එය ආරම්භයේ සිට අවසානය දක්වා මනාව නිශ්චිත ක්‍රියාවලින්ගෙන් සමන්විත වේ. මෙම ක්‍රියාපටිපාටිය ආයතනික වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලබයි.

අපගේ අතරමැදියන්

සාමාන්‍ය රක්ෂණ අංශය තුළ, අතරමැදියන් සඳහා අපගේ පුහුණු වැඩසටහන් පවත්නා තත්ත්වයන් හි වෙළඳපොල අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි නැවත සකස් කරන ලදී. එමෙන්ම එය නව තාක්ෂණය භාවිතා කිරීමට සහය වේ. නියෝජිත බලකාය ඔවුන්ගේ ආදායම් මට්ටම් අනුව වර්ගීකරණය කරන අතර, විශේෂ නියාමන වැඩසටහන් ශාඛා/ප්‍රාදේශීය මට්ටමේදී සිදුකරන ලදී. නියෝජිත බලකාය බඳවා ගැනීම සහ නැවත සක්‍රිය කිරීම ද සමීප අධීක්ෂණය ඇතිව ශාඛා මට්ටමින් සිදු කරන ලදී.

ජීවිත රක්ෂණ අංශය සම්බන්ධයෙන්, "ජීවිත පමණි" අලෙවි බලකායක් ස්ථාපිත කිරීමට පියවර ගන්නා ලදී.

මානව සම්පත්

අපගේ ආයතනික සංස්කෘතිය අවංකකම, විශ්වාසය, සහ වෘත්තීය බැඳීම මත ගොඩ නැගෙන අතර, විශිෂ්ඨත්වය සඳහා උත්සාහ ගැනීම අපගේ සාර්ථකත්වයේ කුළුණක් ලෙස පවතී. සෑම අයෙකුටම ඔවුන්ගේ අසමසම දෘෂ්ටිකෝණ සහ දක්ෂතා දායක කිරීමට දිරි ගන්වන පරිසරයක් අපි නිර්මාණය කර ඇත. විවිධත්වය වැළඳ ගැනීම මගින් අපව ඉදිරියට පොළඹවන නව්‍යකරණය, නිර්මාණශීලිත්වය සහ තරඟකාරී වාසියට අපි ඉඩහැර ඇත. අපගේ පූර්ව ආයතනික සැලැස්ම මගින් රැගෙන ආ කාර්යසාධනය පදනම් සංස්කෘතිය අරමුණ පදනම් සේවා පරිසරයක් විසින් ඉදිරියට මෙහෙයවන සහ විපාක ඇති කරන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා අද දින මාවත විවර කර ඇත. තවද අපි යොදාගෙන ඇති ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අපගේ ව්‍යවහාරයන් හී විනිවිදභාවය සහ අපගේ විනය සඵල කරන බව පෙන්වා දී ඇත.

ඩිජිටල්කරණයෙන් වටිනාකම එකතු කිරීම

සාමාන්‍ය රක්ෂණ අංශය තුළ, ගනුදෙනුකරුවන් ඇතුළත් කර ගැනීම පරිශීලක හිතකාමී අතුරු මුහුණතක් හඳුන්වාදීම මගින් සරල කර ඇති අතර, ඒ තුළින් සේවාදායකයින් ට පහසුවෙන් බාධාවක් නොමැතිව ලියවිලි ඉදිරිපත් කර සම්පූර්ණ කළ හැකිය. ප්‍රාරක්ෂණ ක්‍රියාවලිය ද මාර්ගගත ලියවිලි උඩුගත කිරීම පහසුකරමින් දුෂ්කරතා ඉවත් කර ඇත. ඒ හා සමානව, හිමිකම් පිරිසැකසුම් ද හිමිකම් ලියවිලි මාර්ගගතව ඉදිරිපත් කිරීමට ශක්තිමත් කරමින් සරල කරන ලදී. මෙය හිමිකම් පිරිසැකසුම් කාලය අඩුකර ඇති අතර ගනුදෙනුකාර පහසුව වර්ධනය කර ඇත. අපගේ ගනුදෙනුකරුවන් සමඟ සෘජු සන්නිවේදනයට ගනුදෙනුකරුවන්ට අබණ්ඩව සහභාගි වියහැකි ස්වයංක්‍රීය සන්නිවේදන පද්ධති තුළින් පහසුකම් සලසා ඇත.

ජීවිත රක්ෂණ අංශය සඳහා, WhatsApp chat විසඳුම ගනුදෙනුකාර විමසුම් සඳහා මාර්ගයක් ලෙස හඳුන්වාදෙන ලදී. ප්‍රසාද දීමනා ප්‍රකාශයට පත් කිරීම සම්පූර්ණයෙන්ම ඩිජිටල් කරන ලද අතර එහිදී ගනුදෙනුකරුවන්ට ඩිජිටල් ප්‍රසාද දීමනා සහතික පතක් ලැබේ.

IT යෙදුම් ගණනාවක් ද අපගේ අභ්‍යන්තර ක්‍රියාවලින්හී කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට සකස් කරමින් පවති. මෙයට නිෂ්පාදන කිහිපයක අලෙවි බලකාය සංක්‍රමණය, අලුත් කිරීමේ දැන්වීම්, සහ ඩිජිටල් අවකාශයට ප්‍රසාද දීමනා තොරතුරු ඇතුළත්ය. ඩිජිටල් අවකාශ සම්බන්ධතාවය මහජන බැංකුව, DFCC බැංකුව දක්වා ව්‍යාප්ත කරන ලදී. ලංකා පේ සමඟ ශ්‍රී ලංකාවේ පළමු API පදනම් ඩිජිටල් අත්සන අවකාශය දියත් කළ අතර අපගේ අභ්‍යන්තර ක්‍රියාවලි ස්වයංක්‍රීය ගමන් මගේ කොටසක් ලෙස වැඩ ප්‍රවාහ ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය අපි ආරම්භ කළෙමු.

> "IT යෙදුම් ගණනාවක් ද අපගේ අභ්‍යන්තර ක්‍රියාවලින්හී කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට සකස් කරමින් පවති. මෙයට නිෂ්පාදන කිහිපයක අලෙවි බලකාය සංක්‍රමණය, අලුත් කිරීමේ දැන්වීම්, සහ ඩිජිටල් අවකාශයට ප්‍රසාද දීමනා තොරතුරු ඇතුළත්ය."

අපගේ ප්‍රජාව

වගකීම්සහගත ආයතනික පුරවැසියෙක් ලෙස, අප ක්‍රියාත්මක ප්‍රජාව ධනවත් කර උසස් කිරීමට අපි වටිනාකම එකතු කරන බව අපි සහතික වෙමු. වසරතුළ, අවසාන වශයෙන් ප්‍රජාවට වඩාත් ප්‍රතිඵලදායී වැඩසටහන් රාශියක් තුළ අපි ආයෝජනය කර ඇත. වසර තුළ අපගේ ප්‍රධාන CSR දින දර්ශනයේ සිදුවීමක් ලෙස "සුභ පැතුම් ශිෂ්‍යත්ව වැඩසටහන" දැක්විය හැක. වසර තුළ, 2020/21 වසර තුළ පවත්වන ලද 5 වසර ශිෂ්‍යත්වය, අපොස සාමාන්‍ය පෙළ සහ අපොස උසස් පෙළ විභාගවලදී දක්ෂතා දැක්වූ අපගේ ඔප්පුහිමියන්ගේ සිසුන් 375ක් වෙත රු. මිලියන 50ක් වටිනා ශිෂ්‍යත්ව ප්‍රදානය කර ඇත. තවත් වැඩසටහනක් වන්නේ 2022 ලෝක ළමා දිනය සැමරීමේදී 2022 ඔක්තෝබර 01 දින උපන් සියලුම ළමුන්ගේ දෙමව්පියන් සඳහා නොමිලේ රක්ෂණ ආවරණයක් ලබා දීමයි. මෙම විශේෂ ආවරණයෙන් ළමුන් 1,000ක් ප්‍රතිලාභ ලැබුවේය. තවද, "Call to Donate" – පිළිකා දානුවත් කිරීමේ වැඩසටහන තුළින්, අපේක්ෂා පිළිකා රෝහලේ ළමු වාට්ටුවේ වෙන් වූ ඒකක දෙකක් ඉදිකිරීමට පහසුකම් සැලසූ අතර එම රෝහලට අත්‍යවශ්‍ය ඖෂධ ලබා දෙන ලදී.

අපි සහභාගිවන ප්‍රජා ව්‍යාපෘති මගින් යහපත් හෙට දවසක් සඳහා ප්‍රජාවට වටිනාකම එකතු කිරීමට SLIC හි බැඳීම පෙන්නුම් කරයි.

අනාගත දැක්ම

ඉදිරියේ ඇති අවස්ථා පිළිබඳ අපි සතුටට පත් වෙමු. ක්ෂේත්‍රය හැඩගස්වන ඩිජිටල් පරිනාමය මත ප්‍රාග්ධනය යෙදවීමට අපි මනාව ස්ථාන ගත වී ඇත. අපි අබණ්ඩව මතුවන තාක්ෂණයන් හි ආයෝජනය කර වෘත්තීය විශිෂ්ඨත්වය සඳහා උත්සාහ දරමින් අපගේ හැකියාවන් පුළුල් කරමු.

අපගේ දශක හයක දිගුකාලීන පළපුරුද්ද මත ගොඩ නැගෙමින්, SLIC ප්‍රධාන ගනුදෙනුකාර අංශ කෙරෙහි යොමුවීමට, ඔවුන්ගේ අවශ්‍යතා අවබෝධ කර ගැනීමට සහ ඒ අනුව අපගේ නිෂ්පාදන සහ සේවා සකස් කිරීමට අපි ස්ථානගත වී ඇත. වැඩි වූ ඩිජිටල්කරණය අපගේ කාබන් භාවිතය අවම කිරීමට සහ අපගේ මෙහෙයුම්වල තිරසාර ව්‍යවහාර යොදා ගැනීමට අපව ශක්තිමත් කරයි. එමෙන්ම අපි අපගේ පාර්ශවකරුවන්ට සේවා ලබාදීමේ ඵලදායිත්වය සහ කාර්යක්ෂමතාව තවදුරටත් වැඩි කිරීමට අපගේ බෙදාහැරීමේ මාර්ග ප්‍රශස්ථ කිරීමට අරමුණු කරමු.

අපි ජීවිත රක්ෂණ අවධානිත උපදේශන බලකායක් ගොඩනැගීම ආරම්භ කර ඇති අතර, ඒ තුළින් අලෙවි බලකායේ ව්‍යක්තීයභාවය යාවත් කරනු ඇත. තවද, නව නවෝත්පාදන නිෂ්පාදන සංවර්ධනය කිරීමට අපි අරමුණු කරන අතර, ඒ මගින් සහශ්‍ර පරම්පරාවේ අවශ්‍යතා සපුරාලයි. ජීවිත රක්ෂණ අංශය සඳහා 2023 සහ ඉන් ඉදිරියට අවධානය ව්‍යාපාර පරිනාමය, සේවක පරිනාමනය, තාක්ෂණික පරිනාමනය, සහ ගනුදෙනුකාර කේන්ද්‍රීයතාවය වනු ඇත.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය අංශය වැඩිකළ සේවා මට්ටම් සහ සියලුම පාර්ශවකරුවන්ට දිගුකාලීන වටිනාකම නිර්මාණය සමඟ තිරසාර වර්ධනය අත්කර ගැනීමට ප්‍රමිති තුළින් ගනුදෙනුකරුවන් රඳවා ගැනීම ප්‍රගස්ථ කිරීම කෙරෙහි අවධානය යොමු වනු ඇත.

ඉදිරියේදී කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත සම්ප්‍රදායික ව්‍යවහාරවලින් බැහැරව කාර්යසාධන ලකුණු මත පදනම් වී ප්‍රදාන ලබාදෙනු ලැබේ. ව්‍යාපාර මාර්ග දෙකෙහි යෝජිත වෙන් කිරීමත් සමඟ, එක් එක් ව්‍යාපාර මාර්ගය තුළ වැඩි අවධානයක් යොමු කිරීමට අපි අරමුණු කරමු.

අපි රටේ ප්‍රධාන වකවානුවක සිටින අතර, විශේෂයෙන් රක්ෂණ අංශය, එහි තාක්ෂණික දියුණුව, වෙනස්වන ගනුදෙනුකාර අපේක්ෂාවන්, වෙනස්වන අවදානම්, සහ ප්‍රති රක්ෂණය අභියෝග සහ අවස්ථා මතු කරයි. ආයතනයක් ලෙස ඉදිරියට යමින්, නිෂ්පාදන සහ සේවා සම්බන්ධව සුවිශේෂී අත්දැකීම අපගේ ගනුදෙනුකරුවන්ට ලබාදීමේදී අපගේ බැඳීම ස්ථිරව පවතින බව අපට සහතිකය.

තවද, මෙම වේගයෙන් වෙනස්වන වාතාවරණය තුළ නවෝත්පාදනයේ වැදගත්කම අපි හඳුනා ගනිමු. මතුවන අවදානම් ආමන්ත්‍රණය කරන සහ අපගේ ගනුදෙනුකරුවන්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරාලන නව්‍යකරණ රක්ෂණ විසඳුම් සංවර්ධනය කිරීමට පර්යේෂණ සහ සංවර්ධනය හා දත්ත විශ්ලේෂණය අපි ශක්තිමත් කරන්නෙමු. ක්‍රියාවලි වර්ධනය කර ක්‍රමවත් කිරීමට සහ හිමිකම් කළමනාකරණ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට කෘතීම බුද්ධිය වැනි තාක්ෂණයන් භාවිතය පුළුල් කරනු ලැබේ.

“
අපි ජීවිත රක්ෂණ සම්බන්ධව අවධානය යොමු කරන උපදේශන බලකායක් ගොඩනැගීම ආරම්භ කර ඇති අතර, ඒ තුළින් අලෙවි බලකායේ ව්‍යක්තීයභාවය යාවත් කරනු ඇත. එමෙන්ම, නව නවෝත්පාදන නිෂ්පාදන සංවර්ධනය කිරීමට අපි අරමුණු කරන අතර, ඒ මගින් සහශ්‍ර පරම්පරාවේ අවශ්‍යතා සපුරාලයි.
”

පිළිගැනීම

2022 දී අප සිදුකළ පරිදි එවැනි අභියෝගවලට මුහුණ දීමට අප සමත් වී ඇත යන සාධකය අපගේ කාර්ය මණ්ඩලයේ බැඳීම සහ හැකියාවන් පිළිබඳ දර්ශකයකි. එවැනි නිශ්චිත සහ අභියෝගාත්මක අවස්ථාවන් හී කැපී පෙනෙන සේවය වෙනුවෙන් අපගේ කැප වූ සේවකයින්ට මම ස්තූතිය පුද කරමි.

අපගේ ගනුදෙනුකරුවන්ට අපගේ පොරොන්දුව සහ බෙදාදීම කෙරෙහි ඔවුන්ගේ විශ්වාසයට, ස්ථීර සහය වෙනුවෙන් පාර්ශවකරුවන්ට අතරමැදියන් ඇතුළුව අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්ට සහ ප්‍රතිරක්ෂකයින්ට ඔවුන්ගේ දායකත්වය වෙනුවෙන් මම ස්තුති කිරීමට කැමැත්තෙමි. අවසාන වශයෙන්, සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ ස්ථීර මඟපෙන්වීම සහ සහයෝගයට මම ස්තුතිවන්ත වෙමි. සෞභාග්‍යවත් සහ තිරසාර අනාගතයක් නිර්මාණය කිරීමට අපි එක්ව අඛණ්ඩව වැඩකරමු.



චන්දන එල් අලුත්ගම
ප්‍රධාන විධායක නිලධාරී

2023 මැයි 10

35-36
වාර්තාවේ පැතිකඩ



වාර්තාවේ පැතිකඩ

ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ සභා (IIRC) රාමුවේ ප්‍රධාන මාර්ගෝපදේශ අනුගමනය කරමින් සකස් කළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ (SLIC) 5 වැනි ඒකාබද්ධ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම අපි සතුටු වෙමු. ඒකාබද්ධ වාර්තාකරණ මූලධර්මවලට අනුව, මෙම වාර්තාවෙන් විවිධ ප්‍රේක්ෂකයින් අරමුණු කළ අතර එයට ගනුදෙනුකරුවන්, සේවකයින්, ආයෝජකයින්, සහ ශ්‍රී ලංකාව තුළ නියාමන බලධාරීන් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි බැඳියාවක් ඇති වෙනත් පාර්ශවකරුවන් ඇතුළත් වන අතර ඔවුන් සියලුම දෙනා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සහ ඔවුන් වෙනුවෙන් තිරසාර වටිනාකම් නිර්මාණයේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ශ්‍රී ලංකාවේ රජයට අයත් විශාලතම රක්ෂණ සමාගම වේ. සමාගම අනුරූපව එහි ගනුදෙනුකරුවන්ට නව්‍යකරණ රක්ෂණ විසඳුම් ලබාදෙන අතර දිවයින පුරා විස්තීර්ණ ශාඛා ජාලය සහ සේවා ස්ථාන තුළින් සේවය සලසයි. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අපගේ පසුගිය ඒකාබද්ධ වාර්ෂික වාර්තාව (2011 වසර සඳහා) 2022 දී ප්‍රකාශයට පත් කළ අතර අපගේ සියලුම වාර්ෂික වාර්තා වෙත අපගේ ආයතනික වෙබ් අඩවිය වන e – www.srilankainsurance.com හරහා පිවිසිය හැකිය.

පරාසය හා සීමාවන්

මෙම වාර්තාව 2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය ආවරණය කරන අතර ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ව්‍යාපාරික කටයුතු, මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධනය, අනාගත කටයුතු, පාලනය සහ මෙහෙයුම් පරිසරයේ පසුබිම අනුව අවදානම් කළමනාකරණය ආවරණය කරයි. ඉන් පාර්ශවකරුවන්ට 2022 මූල්‍ය වසර තුළ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි කාර්යසාධනය පිළිබඳ ඇතුළත් පිළිබිඹුවක් ලබා දේ. මෙම වාර්තාවට ඒකාබද්ධ වාර්තාකරණ රාමුවේ සය වැදෑරුම් ප්‍රාග්ධනයන් ආවරණය කරමින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත ඇතුළත් වේ.

වාර්තාකරණ රාමුව

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින් මෙම වාර්තාව සම්පාදනයේදී පහත මාර්ගෝපදේශ සලකා ඇත

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්
- <IR> රාමුව (ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සභාව)
- රජයට අයත් රක්ෂණ සමාගම් සඳහා අදාළ නෛතික රාමුව
- අදාළ ආයතයින පාලන සංග්‍රහ
- GRI සම්මතයන්
- එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු (SDG's)

පරාසය සහ සීමාවන් හි පෙර වාර්තාකරණ කාලයන් හා සැලකිය යුතු වෙනසක් සිදු නොවූ බවත්, පෙර වාර්තාකරණ වර්ෂයේ නිකුත් කළ වාර්ෂික වාර්තාව හා සසඳන විට කිසිදු පූනප්‍රකාශයක් නොමැති බවත් සැලකිල්ලට ගත යුතුය.

ප්‍රමාණාත්මය

ප්‍රමාණාත්මය පිළිබඳ මූලධර්මය – කෙටි, මධ්‍ය සහ දිගුකාලීනව වටිනාකම නිර්මාණය කිරීමට සමාගමට ඇති හැකියාවට සැලකියයුතු ලෙස බලපාන ආර්ථික, පාරිසරික, සහ සමාජීය අංග – මෙම වාර්තාවේ මූල්‍ය නොවන අන්තර්ගතය තීරණය කිරීමට භාවිතා කර ඇත. පාර්ශවකරුවන්ට අදාළවන තිරසාර තොරතුරු (මූල්‍ය නොවන අන්තර්ගතය) ඉදිරිපත් කිරීම සඳහා ගෝලීය වාර්තාකරණ ප්‍රවේශය (GRI) විසින් මෙම සංකල්පය ප්‍රවර්ධනය කෙරේ. ඒ අනුව, මෙම වාර්තාව හරහා, අපගේ ප්‍රමාණාත්මය කාරණා ලෙස අප විසින් සලකනු ලබන දෑ සඳහා සන්දර්භය අපි සපයන්නෙමු. එනම්, කෙටිකාලීන, මධ්‍යම හා දිගු කාලීන වශයෙන් වටිනාකම් නිර්මාණය කිරීමේ අපගේ හැකියාවට බලපෑම් කළ හෝ බලපෑම්කළ හැකි දෑ ඒ යටතට අයත් වේ. ආයතනයට වටිනාකමක් උත්පාදනය කිරීම සහ අපගේ පාර්ශවකරුවන්ට ධනාත්මක ප්‍රතිඵල ලබා දීම සඳහා අපගේ උපාය මාර්ගයන් සකස් කරමින් සහ අපගේ ප්‍රාග්ධනයන් හය හරහා අපගේ සම්පත් යළි ස්ථානගත කරමින් මෙම ප්‍රමාණතා කාරණා පිළිබඳව අප අවධානය යොමු කරන ආකාරය වාර්තාවෙන් සාකච්ඡා කෙරේ.

ප්‍රමාණතා ගැටළු අමාන්ත්‍රණය කිරීමට ප්‍රාග්ධනය තුළින් සම්පත් වෙන් කිරීම

ප්‍රමාණාත්මක ගැටලු	මූල්‍ය	නිෂ්පාදන	බුද්ධිමය	මානව	සමාජ	ස්වභාවික
ආර්ථික කාර්යසාධනය	⊗	⊗	⊗			
වෙළෙඳපොල පැවැත්ම	⊗	⊗		⊗	⊗	
දූෂණ විරෝධී වීම			⊗		⊗	
තරඟ විරෝධී හැසිරීම			⊗		⊗	
රැකියා නියුක්තිය	⊗			⊗		
වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව	⊗			⊗		
පුහුණුව සහ සංවර්ධනය	⊗			⊗		
විවිධත්වය සහ සමාන අවස්ථාව			⊗	⊗		
වෙනස් ලෙස නොසැලකීම			⊗	⊗		
රැස්වීමේ නිදහස සහ සාමුහික කේවල් කිරීම				⊗		
දේශීය ප්‍රජාවන්	⊗				⊗	⊗
ගනුදෙනුකාර සෞඛ්‍යය සහ ආරක්ෂාව					⊗	
අලෙවිකරණය සහ ලේබල් කරණය					⊗	
සමාජ ආර්ථික අනුකූලතාව					⊗	⊗
සාර්ව ආර්ථික සංවර්ධනයන්	⊗		⊗	⊗	⊗	

ඉදිරි දැක්මේ ප්‍රකාශ


මෙම වාර්තාවේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම්වල ප්‍රතිඵල පිළිබඳ ඉදිරි දැක්මේ ප්‍රකාශයන් අඩංගු වේ. එම ප්‍රකාශයන්හි ස්වභාවය අනුව අනාගතයේ සිදුවිය හැකි හෝ නොවිය හැකි සිදුවීම් හෝ තත්වයන් මත ඒවා රඳා පවතින බැවින් ඒ සම්බන්ධයෙන් අවදානමක් සහ අවිනිශ්චිතතාවයන් පවතියි. මෙම ප්‍රකාශයන් සැබෑ ප්‍රතිඵල වලට වඩා ප්‍රධාන වශයෙන් වෙනස් වීමට හේතු විය හැකි සාධක අතරට ජාතික ආර්ථික තත්ත්වයන්, රක්ෂණ රෙගුලාසි සහ තරඟකාරී හා නියාමන සාධක මෙන්ම අනෙකුත් සාධක ද ඇතුළත් වේ. ඒ හේතුවෙන්, වාර්තාවේ සඳහන් ඉදිරි දැක්මේ ප්‍රකාශයන් අදාළ වන්නේ ඒවා ඉදිරිපත් කළ දිනය වන විට පමණක් යැයි සලකනු ලබන අතර, නව තොරතුරු, අනාගත සිදුවීම් හෝ සිදු නොවීම් හේතුවෙන් ඉහත කී ප්‍රකාශයන් කිසිවක් යාවත්කාලීන කිරීමට හෝ සංශෝධනය කිරීමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කිසිදු වගකීමක් නොදරයි.

ප්‍රතිපෝෂණය

අපගේ වාර්ෂික වාර්තාවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට අපට සහාය වීම සඳහා ඔබගේ ගැටළු සහ යෝජනා අප සාදරයෙන් පිළිගන්නා අතර ඒවා යොමු කළ යුත්තේ:

බී ඒ රුවනි ධර්මවර්ධන,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අනුකූලතා සහ අවදානම්/සමාගම් ලේකම්
සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව.
"රක්ෂණ මන්දිරය",
අංක 21, චොක්ෂෝල් වීදිය, කොළඹ 02.
දුරකථන: +94 11 235 7741

37-43
උපායමාර්ගය සහ අවධානය




> 38 ව්‍යාපාර ආකෘතිය

> 40 ප්‍රමාණාත්මක කරුණු


> 41 පාර්ශවකාර සම්බන්ධතා

> 43 උපායමාර්ගික ප්‍රමුඛතා

ව්‍යාපාර ආකෘතිය


පාර්ශවකරුවන් ලබා දෙන යෙදුම්
කොටස්හිමියන්
99.97%
භාණ්ඩාගාර ලේකම්
රක්ෂණ ඔප්පු හිමියන්
1,018,095
ජීවිත රක්ෂණ ඔප්පු හිමියන්
1,242,876
සාමාන්‍ය රක්ෂණ ඔප්පු හිමියන්
සේවකයින්
පිරිමි 55%
කාන්තා 45%
මුළුගණන 2,643
ව්‍යාපාර හවුල්කරුවන්
ප්‍රතිරක්ෂණකරුවන්
නියෝජිතයින්
තැරැව්කරුවන්
බැංකු
නියාමකයින්
IRCSL
DROC
FIU – CBSL
සැපයුම්කරුවන්
ජීවිත සහ සාමාන්‍ය රක්ෂණය
දැක්ම
මෙහෙවර
නුවුන්වත්කම් හා ප්‍රාග්ධන කළමනාකරණය
යෙදවුම්
කොටස්හිමියන්ගේ අරමුදල
ආයෝජන
ජීවිත අරමුදල
සාමාන්‍ය අරමුදල
දේපල, පිරියත හා උපකරණ
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
ආයතනික දැනුම
මනා පරිචයන්
දත්ත විශ්ලේෂණ
සේවා සහ සැපයුම්
සම්බන්ධතා
සහයෝගිතා සහ සන්ධානයන්
සම්මක්ෂණ ප්‍රතිඵල
සහතික කිරීමේ සේවා
උපයෝගිතා
කටයුතු
ප්‍රාරක්ෂණය
සේවා සහ ඔප්පු පරිපාලනය
දාම කළමනාකරණය
ආයෝජන ක්‍රියාකාරකම්
අලෙවිකරණය, විකුණුම් සහ බෙදාහැරීම
පාලන රාමුව
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ නියාමන අධිකාරීවරුන්
මෙහෙයුම් පරිසරය

ව්‍යාපාර ආකෘතිය




ව්‍යාපාරික ආකෘති රූප සටහන මඟින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් තුළ ක්‍රියාකාරකම් සිදුවන ආකාරය සහ අප ක්‍රියාත්මක වන පරිසරය පමණක් නොව අපගේ දැක්ම හා මෙහෙවර ද එයට බලපාන්නේ කෙසේද යන්න පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබා දෙයි. නීති හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක වනවා සේම; අපගේ මෙහෙවර, දැක්ම සහ වටිනාකම් මඟින් අප සපුරා ගැනීමට අපේක්ෂා කරන අරමුණු සහ එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ උපායමාර්ගය සකස් කරන්නේ කෙසේද යන්න නිර්වචනය කරයි. ඒ හා සමානව, අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සෑම ක්‍රියාකාරකමකටම මෙම බාහිර හා අභ්‍යන්තර බලපෑම් බලපානු ලබයි. අනෙක් අතට, අපගේ අරමුණු ද අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම් මඟින් හැඩගස්වා ඇති අතර, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් එය විසින්ම මෙහෙයුම් පරිසරයට අබණ්ඩව අනුවර්තනය වන බව සහතික කරමින් මෙම චක්‍රය අබණ්ඩව ක්‍රියාත්මක වේ.

ප්‍රමාණාත්මතා කරුණු

ප්‍රමාණාත්මතාව

ප්‍රමාණාතාත්මතාව පිළිබඳ සංකල්පය ගෝලීය වාර්තාකරණ ප්‍රවේශ (GRI) ප්‍රමිති මගින් ඇති විය. මූල්‍ය නොවන සාධක ගණනාවක් ඇති අතර ඒවා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි පාර්ශවකරුවන්ට බලපාන අතර ඒ අනුව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි කාර්යසාධනයට බලපායි. මෙවැනි සාධක ප්‍රමාණාත්මක කරුණු ලෙස හඳුන්වන අතර ප්‍රමාණාත්මක විශ්ලේෂණ බලපෑමේ මට්ටම දෙආකාරයකින් අනුරූපනය කරයි. සමාගමේ වර්ධනය හා පාර්ශවකාර වටිනාකම් නිර්මාණය දෙයාකාර ක්‍රියාවලියකි. ආර්ථික, සමාජ, සහ පාරිසරික වටිනාම නිර්මාණයට, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විවිධාකාරයෙන් පාර්ශවකරුවන් සමඟ එලදායීව සහභාගි වේ.

අංකය	මාතෘකාව	SLIC ට ඇති වැදගත්කම	පාර්ශවකරුවන්ට ඇති වැදගත්කම
1.	ආර්ථික කාර්යසාධනය	ඉතා ඉහළයි	ඉතා ඉහළයි
2.	වෙළෙඳපොල පැවැත්ම	ඉතා ඉහළයි	ඉතා ඉහළයි
3.	දූෂණ විරෝධී වීම	ඉහළයි	ඉහළයි
4.	තරඟ විරෝධී හැසිරීම	ඉහළයි	ඉහළයි
5.	රැකියා නියුක්තිය	ඉතා ඉහළයි	ඉතා ඉහළයි
6.	වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව	ඉහළයි	ඉහළයි
7.	පුහුණුව සහ විවිධත්වය	ඉතා ඉහළයි	ඉතා ඉහළයි
8.	විවිධත්වය සහ සමාන අවස්ථාව	ඉතා ඉහළයි	ඉතා ඉහළයි
9.	වෙනස් ලෙස නොසැලකීම	ඉහළයි	ඉහළයි
10.	රැස්වීමේ නිදහස හා සාමුහික කේවල් කිරීම	ඉහළයි	ඉහළයි
11.	දේශීය ප්‍රජාවන්	ඉහළයි	මධ්‍යමයි
12.	ගනුදෙනුකරුවන්ගේ ධනය සහ ආරක්ෂාව	ඉහළයි	ඉහළයි
13.	අලෙවිකරණය සහ ලේබල් කරණය	ඉහළයි	මධ්‍යමයි
14.	සමාජ ආර්ථික අනුකූලතාව	ඉහළයි	ඉහළයි
15.	සාර්ව ආර්ථික සංවර්ධනයන්	ඉතා ඉහළයි	ඉතා ඉහළයි



පාර්ශවකාර සම්බන්ධතා

අපගේ අරමුණ වන්නේ සියලුම ශ්‍රී ලාංකිකයින් වඩාත් විශ්වාස කරන රටේ ප්‍රමුඛතම රක්ෂකයා බවට පත්වීමයි. මෙය අත්කර ගැනීම සඳහා, අපගේ පාර්ශවකරුවන් සමඟ කෙටි, මධ්‍ය සහ දිගුකාලීන සම්බන්ධතා ශක්තිමක් කිරීමට අපි උත්සාහ කරමු. සහභාගිත්වය ශක්තිමත් සම්බන්ධතා සංවර්ධනයේදී අත්‍යවශ්‍ය සහ පූර්ණ කොටසකි.

අපගේ විවිධ පාර්ශවකරුවන්ගේ කණ්ඩායම් අපගේ ව්‍යාපාරයට බලපාන ගැටළු පිළිබඳව විවිධ අදහස් දරන අතර, මෙම විවිධ දෘෂ්ටිකෝණයන් වෙත අවධානය යොමු කිරීම තුළින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි දිගුකාලීන සාර්ථකත්වයට සහ තිරසාරභාවයට සහාය වීම සඳහා සැබෑ අවබෝධයක් සහ වටිනාකමක් ලබා ගත හැකි බව අපි දනිමු. ඉතා විධිමත් පාර්ශවකරුවන් හඳුනා ගැනීමේ ක්‍රියාවලියක සිට අපගේ පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීම සඳහා අප ඉතා ක්‍රමානුකූල ප්‍රවේශයක් අනුගමනය කරමු.

පාර්ශවකරුවන් හඳුනා ගැනීම

පාර්ශවකරුවන් යනු ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ක්‍රියාකාරකම්, නිෂ්පාදන හෝ සේවා සහ සංවිධානාත්මක ක්‍රියාකාරිත්වයට බලපෑම් කළ හැකි සහ/හෝ ඒවායින් බලපෑමට ලක්විය හැකි පුද්ගලයින්, පුද්ගල කණ්ඩායම් හෝ ආයතන වේ. මේ ආකාරයෙන් හඳුනාගෙන ඇති පාර්ශවකරුවන් හට ඔවුන්ගෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත ඇති විය හැකි බලපෑමේ මට්ටම අනුව ප්‍රමුඛතාවය අනුපිළිවෙලින් පෙළගස්වනු ලැබේ.

සහභාගිත්ව ක්‍රම සහ සහභාගිත්ව මූලධර්ම

අපගේ සහභාගිත්ව ක්‍රියාවලීන් පාර්ශවකාර කණ්ඩායම් අනුව වෙනස් වේ. පාර්ශවකාර මාර්ග ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත ඇති පාර්ශවකරුවන්ගේ බලපෑම/ආභාෂය මත සාමාන්‍යයෙන් තීරණය කරනු ලබන අතර, පහත දැක්වෙන මූලධර්ම සියලුම සහභාගිත්ව මාර්ග සඳහා අදාළ වේ.

- උපදේශාත්මක සාකච්ඡාව සඳහා විවෘතබව සහ විනිවිදභාවය
- තොරතුරුවල කාලසීමාව, නිරවද්‍යතාව සහ අදාළත්වය
- ප්‍රතිචාර වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩ හා ඉදිරියට පවත්වාගෙන යන සමාලෝචනය

හිමිකාරත්වය සහ වගවීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි පාර්ශවකාර සහභාගිත්වය විමධ්‍යගත කර ඇති අතර ඒ සම්බන්ධයෙන් වගකියන තනි කණ්ඩායමක් නොමැත. සියළුම සේවකයින් ඔවුන්ගේ වගකීම් ක්ෂේත්‍රයන් තුළ සබඳතා කළමනාකරණය කිරීම සහ අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම සම්බන්ධයෙන් වගකිව යුතු වේ. අභ්‍යන්තර සන්නිවේදන මාර්ග තුළින්, අධ්‍යක්ෂ මණ්ඩලය පාර්ශ්වකරුවන්ගේ සබඳතා සහ පාර්ශවකරුවන්ගේ බැඳීම්, ගැටළු, අවශ්‍යතා, සහ අපේක්ෂාවල වර්තමාන තත්ත්වය පිළිබඳව නිරන්තරයෙන් දැනුවත් කරනු ලබයි. එය ඉහළ මට්ටමේ තීරණ ගැනීම සඳහා වටිනා යෙදවුමක් වනු ඇත.

පාර්ශවකරුවන්ට අදාළ වැදගත් ගැටළු	SLIC ට බලපෑම	සහභාගිත්වය	සහභාගිත්ව වාරගණන
ශ්‍රී ලංකා රජය ආයෝජනය. ව්‍යාපාර සංවර්ධනය, ප්‍රතිලාභ, නව්‍යකරණය, සහ ක්ෂේත්‍රයේ වර්ධනය, අනුකූලතා	ඉහළ	වාර්ෂික වාර්තාව	වාර්ෂික
		පුවත් නිවේදන	අවශ්‍යතාව පරිදි
		අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ රැස්වීම් සහ සාකච්ඡා	අවශ්‍යතාව පරිදි
වෙනත් නියාමකයින් නීති සහ රෙගුලාසි, යහපාලනය, ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය, සදාචාර හැසිරීමට අනුකූලතාව	ඉහළ	නියාමන අධිකාරීන් සමඟ රැස්වීම්	අවශ්‍යතාව පරිදි
		වාර්ෂික වාර්තාව	වාර්ෂික
		කර්මාන්ත සංසද	අවශ්‍යතාව පරිදි
		ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ සහ තත්ත්ව වාර්තා	කාර්තුමය, වාර්ෂික
		පුවත් නිවේදන	අවශ්‍යතාව පරිදි
ගනුදෙනුකරුවන් පාරිභෝගික සම්බන්ධතාවය, රඳවා ගැනීම, අදාළ නිෂ්පාදන, නිෂ්පාදන තොරතුරු, රක්ෂණාවරණ ප්‍රසාද දීමනා, ප්‍රතිපත්ති හිමිකම්, වෙනත් නියාමකයින්	ඉහළ	ඇමතුම් මධ්‍යස්ථානය	නිරන්තර
		ගනුදෙනුකාර තෘප්තිය පිළිබඳ සමීක්ෂණ	අවශ්‍යතාව පරිදි
		මුහුණට මුහුණ අන්තර් ක්‍රියා	නිරන්තර
		වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය	නිරන්තර
		ගනුදෙනුකාර ප්‍රතිපෝෂණ	නිරන්තර
ව්‍යාපාර හවුල්කරුවන්	මධ්‍යම	රැස්වීම්	අවශ්‍යතාව පරිදි
		විද්‍යුත් තැපෑල, දුරකථනය හරහා සනන්නිවේදනය	නිරන්තර

පාර්ශවකරුවන්ට අදාළ වැදගත් ගැටළු	SLIC ට බලපෑම	සහභාගිත්වය	සහභාගිත්ව වාරගණන
සේවකයින් සේවක සුභසාධනය, තෘප්තිය, රඳවා ගැනීම, පුහුණු සහ සංවර්ධනය, පිළිගැනීම සහ ප්‍රතිලාභ, වෘත්තීය ප්‍රගතිය, රැකියා සුරක්ෂිතභාවය	ඉහළ	රැස්වීම්	නිරන්තර
		විද්‍යුත් තැපෑල, දුරකථනය හරහා සනන්නිවේදනය	අවශ්‍යතාව පරිදි
		අවශ්‍යතාව පරිදි අනුප්‍රාප්ත සැලැස්ම	වාර්ෂික/ අවශ්‍යතාව පරිදි
		පුහුණු හා සංවර්ධන කටයුතු	අවශ්‍යතාව පරිදි
		සම්මාන උත්සව	වාර්ෂික
		ප්‍රජා ව්‍යාපෘතිවල සහභාගිත්වය	අවශ්‍යතාව පරිදි
		මැසිවිලි මෙහෙයවීම	අර්ධ වාර්ෂික
		අන්තර්ජාලය හරහා තොරතුරු හුවමාරුවල B-Connect app	නිරන්තර
		පරමාර්ථ/ප්‍රධාන කාර්යසාධන දර්ශක සැකසුම්	වාර්ෂික
		කාර්යසාධන ඇගයීම	අර්ධ වාර්ෂික
ප්‍රජාව සහ පරිසරය ප්‍රජා ආයෝජන, ආයතනික සමාජ වගකීම් (CSR) වැඩසටහන්	මධ්‍යම	ප්‍රජා ව්‍යාපෘති	නිරන්තර
		පුවත් නිවේදන	අවශ්‍යතාව පරිදි
		වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය	නිරන්තර
		උත්සව	අවශ්‍යතාව පරිදි
		CSR ව්‍යාපෘති	නිරන්තර
		තිරසාර වැඩසටහන්	නිරන්තර

උපායමාර්ගික ප්‍රමුඛතා

2022දී, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, රටේ සමස්ථයක් ලෙස ප්‍රායෝගිකව පොදුවේ,අතීශය ව්‍යාකූල වසරකට මුහුණ දෙන ලදී. ජාතික දේශපාලන අස්ථාවරත්වය, උද්ධමනය, ඉහළ පොළී අනුපාත, සහ විදේශ ණය බැඳීම් ඉටු කිරීමට අසමත්වීමකට මුහුණ දුන්හ. ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය යටතේ ප්‍රධාන උපායමාර්ග පහත සාරාංශ කෙරේ. එක් එක් ව්‍යාපාර මාර්ග සහ උපායමාර්ගික සීමාව, උපායමාර්ගික පරමාර්ථ, සහ වෙනත් අදාළ විස්තර පහත දැක්වේ.

ජීවිත රක්ෂණය

ජීවිත රක්ෂණ වර්ගය සඳහා 2023 සඳහා උපායමාර්ගික ප්‍රමුඛතා පහත පරිදි වේ.

2023 සඳහා උපායමාර්ගික ප්‍රමුඛතා

- **ඉහළ මට්ටමේ ව්‍යාපාර මූළික කාර්යසාධන දර්ශක අත්කර ගැනීමට ජීවිත අවධානීත සක්‍රීය අලෙවි කණ්ඩායම් සංවර්ධනය**
- **කාර්යසාධනය මෙහෙයවීමට ප්‍රදාන සහ පිළිගැනීම් යෝජනා ක්‍රම පෙළගැසීම**
- **සේවා සහ තාක්ෂණික පරිනාමනය තුළින් ගනුදෙනුකාර කේන්ද්‍රීය සංස්කෘතියක් ස්ථාපිත කිරීම**
- **විවිධ වෙළෙඳපොල අංශ මත අවධානය යොමු කරමින් නව නිෂ්පාදන හඳුන්වාදීම**
- **කාර්යසාධනය මත පදනම් සංස්කෘතිය ස්ථාපිත කිරීමට සේවක පරිනාමනය**


සාමාන්‍ය රක්ෂණය

සාමාන්‍ය රක්ෂණ වර්ගය සඳහා 2023 සඳහා උපායමාර්ගික ප්‍රමුඛතා පහත පරිදි වේ.

2023 සඳහා උපායමාර්ගික ප්‍රමුඛතා

- **තිරසාර වර්ධනය සමඟ ඉහළ පෙල මෙහෙයවීම**
- **COR වර්ධනය සහ ලාභ ප්‍රශස්ථකරණය**
- **සේවා මට්ටම් සහ ප්‍රමිති වැඩි කිරීම**
- **ගනුදෙනුකාර රඳවාගැනීම ප්‍රශස්ථකරණය**
- **මෝටර් නිෂ්පාදන මුසුව සහ NM පාරිභෝගික කළඹ තුළ උපායමාර්ගික වෙනස්වීම**

44-78
කළමනාකරණ අදහස් දැක්වීම



> 45 මෙහෙයුම් පරිසරය

> 46 මූල්‍ය ප්‍රාග්ධනය

> 50 නිෂ්පාදිත ප්‍රාග්ධනය

> 54 බුද්ධිමය ප්‍රාග්ධනය

> 57 මානව ප්‍රාග්ධනය

> 64 සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

> 77 ස්වභාවික ප්‍රාග්ධනය

මෙහෙයුම් පරිසරය

ශ්‍රී ලංකා ආර්ථිකය

2022 දී, ශ්‍රී ලංකාවේ ආර්ථිකය යුද්ධය ඉතිහාසයෙන් පසු පෙර නොවූවිරූ කැළඹීම්වලට මුහුණ පෑවේය. බොහෝ බාධාවන්ට මුහුණ දුන් අතර එයට දේශපාලන අස්ථාවරත්වය, විදේශ විනිමය හිඟය, ආනයන මත සංරෝධක, ඉහළයන උද්ධමනය, සහ වේගයෙන් ඉහළ ගිය පොළී අනුපාත, ඇතුළත්ය. විදේශ විනිමය හිඟය ආහාර, ඖෂධ සහ අමුද්‍රව්‍යවල පවා හිඟයකට හේතු විය. මෙයට පෙර රට සිය ණය ශ්‍රේණිගතකරණයෙන් පහත හෙලා තිබුණ අතර සිය බාහිර ණය පැහැර හැරීම මෙයට හේතු විය. බදු අඩු කිරීම් විශාල මූල්‍ය අසමතුලිතතාවන් ඇති කළේය. ජීවනෝපායන් අහිමිවීම, සහ මිලදී ගැනීමේ බලය බිඳවැටීම වැනි ප්‍රතිවිපාක අඩු අදායම්ලාභී කණ්ඩායම් පීඩාවට පත් කරන ලදී.

පහත වැටුණු ආර්ථික කටයුතු දේශීය සහ විදේශීය වශයෙන් ව්‍යාපාරික විශ්වාසය සහ ආයෝජනය බරපතල අහිමිවීමකට මඟ පාදන ලදී. 2022 දී, දළ දේශීය නිෂ්පාදිතය 2021 පැවති 3.5%ක වර්ධනයෙන් පසු වාර්ෂික පදනමක් මත 7.8%කින් සංකෝචනය විය. ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශ වන, කෘෂිකර්මය, කර්මාන්ත, සහ සේවා සංකෝචනයකට මුහුණ දුන්නේය. සැපයුම් දාම බිඳවැටීම් සහ අමුද්‍රව්‍ය හිඟය කර්මාන්තවලට බරපතල ලෙස බලපාන ලදී. රසායනික පොහොර සහ වෙනත් රසායනික යෙදවුම් තහනම් කිරීම 2022 දී කෘෂිකර්මය බරපතල පීඩාවකට ලක් කළේය. සේවා අංශය තුළ, ඉහළ පොළී අනුපාත සහ විශ්වාසය අඩුවීම මූල්‍ය සේවා, රක්ෂණය සහ නිශ්චල දේපල අංශවල කටයුතු අඩපන කරන ලදී. කෙසේවෙතත්, 2022 අවසානයේදී සංචාරක කර්මාන්තයේ මධ්‍යස්ථ නැගිටීමක් දක්නට විය.

2022 වසර සඳහා වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන 5.2ක් වූ අතර කෙසේවෙතත් එය 2010 න් පසු වාර්තාකළ අවම අගය වේ. මෙයට වෙළෙඳ භාණ්ඩවල ආනයනය අඩුවීම සහ වෙළෙඳ භාණ්ඩවල අපනයනය වැඩිවීම හේතු විය. ආනයනවල අඩුවීමට විදේශ විනිමය සංරෝධක, ආනයන සීමාකිරීමට ගත් පරිපාලන ක්‍රියාමාර්ග, රුපියල අවප්‍රමාණයවීම, සහ සමුච්චිත ඉල්ලුමෙහි අඩුවීම බලපාන ලදී. ආනයන 2021 දී පැවති ඇමෙරිකානු ඩොලර් බිලියන 20.6 සිට 2022 දී ඇමෙරිකානු ඩොලර් බිලියන 18.3 දක්වා 11.2%කින් පහත වැටුණී. වෙළෙඳ භාණ්ඩවල අපනයන 4.9%ක වර්ධනයක් වාර්තා කළ අතර 2022 දී ඇමෙරිකානු ඩොලර් බිලියන 13.11 දක්වා ලඟාවිය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් රුපියලේ අවප්‍රමාණය හේතු වූ අතර එය අපගේ අපනයන වඩාත් තරඟකාරී කිරීමට, ගෝලීය වෙළෙඳ ද්‍රව්‍යවල මිල ඉහළ යාමකට හේතු වූ අතර විදේශ විනිමය වෙන් කිරීමේදී අපනයන කර්මාන්තවල අවශ්‍යතාවන්ට ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.

මෙම තත්ත්වය පැවතීම තුළ ප්‍රතිසාධනය පිළිබඳ අපේක්ෂාවන් ඇත්තේ විශාල ක්‍රියාමාර්ග ඉල්ලා සිටි අතර ධනාත්මක පියවර කිහිපයක් ගන්නා ලදී. විනිමය අනුපාතය වෙළෙඳපොල තත්ත්වයන්ට අනුව පාවීමට ඉඩ හරින ලදී. මහ බැංකුව දැඩි මූල්‍ය ප්‍රතිපත්ති හඳුන්වාදෙන ලද අතර ඒ තුළින් උද්ධමන පීඩනයක් පාලනය කළේය. එමෙන්ම මහ බැංකුව ලබාගත හැකි සම්පත් ප්‍රශස්ථව වෙන් කිරීම මගින් අත්‍යවශ්‍ය දේ සඳහා පමණක් විදේශ විනිමය ලබා දෙන ලදී.

ශ්‍රී ලාංකීය ආර්ථකයේ ප්‍රධාන ගැටළුවක් වන්නේ දළ දේශීය නිෂ්පාදිත අනුපාතයට ඉතා අඩු බදු අනුපාතය වන අතර බදු අය කිරීම් වැඩි කිරීම තීරණාත්මක අවශ්‍යතාවකි. මූල්‍ය අසමතුලිතතාව අඩු කිරීම සඳහා 2022 මැයි ක්‍රියාමාර්ග ගන්නා ලදී. මේවාට 3%කින් පුද්ගලික ආදායම් බදු වැඩි කිරීම, පුද්ගලික ආදායම් බදු නිදහස් දීමනාව අඩුකිරීම, ආයතනික ආදායම් බදු අනුපාත වැඩි කිරීම, සහ එකතුකළ අගය මත බදු වැඩි කිරීම ඇතුළත්ය. මෙම ක්‍රියාමාර්ග හමුවේ, ආර්ථික බිඳ වැටීම හේතුවෙන් වසරේ පළමු කොටසේදී ආදායම බදු එකතු කිරීම බිඳ වැටීමේ ප්‍රතිවිපාකයක් ලෙස 2022 සඳහා අතුරු අයවැය 8.8%ක පමණක් දළ දේශීය නිෂ්පාදිතයට ඇස්මේන්තු කර ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කල්ගතවෙන සාකච්ඡාවලින් පසු, විස්තීර්ණ ණය පහසුකමක් සඳහා 2022 සැප්තැම්බර් එකඟතාවයකට ලඟා විය. ඉන් පසුව වසර තුනක් පුරා අදියරගත ඇමෙරිකානු ඩොලර් බිලියන 3ක් පමණ වන සහය සඳහා IMF හි විධායක මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත් විය. මේ සමඟ ශ්‍රී ලංකාව තිරසාර වර්ධන මාර්ගයකට නැවත ගෙනයාමට ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ඇතුළත් විය. ශ්‍රී ලාංකීය ආර්ථිකය සැබැවින්ම 2022 දී අතිශය පීඩා සහිත වාතාවරණයන් තුළින් ගමන් කර ඇත. කෙසේවෙතත්, මැතකාලීන සංවර්ධනයන් 2023 වසරේ 4 කාර්තුවේ සිට වර්ධනය කරා ආපසු ගමන් කිරීමක අපේක්ෂාව සඳහා පසුබිම සලසා ඇත.

රක්ෂණ අංශය

ශ්‍රී ලංකාවේ රක්ෂණ අංශය රක්ෂණ සමාගම් 27කින් සමන්විත විය. එනම් දිගුකාලීන රක්ෂණ සමාගම් 14ක්, සාමාන්‍ය රක්ෂණ සමාගම් 11ක් සහ දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවලට සම්බන්ධ සමාගම් 2ක් ඒ අතර විය. දළ දේශීය නිෂ්පාදිතයට මුළු වාරිකවල ප්‍රතිශතයක් ලෙස මනින ලද රක්ෂණ විනිවිදයාම පසුගිය වසරේ පැවති 1.4%ට සාපේක්ෂව 2022 සඳහා 1.0% දක්වා පහත වැටී ඇත. මෙයට දළ ලිඛිත වාරිකයේ අඩු වර්ධනය සහ වෙළෙඳපොල මිලගණන්වලට දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ වර්ධනයේ සංයෝගයක් හේතු විය.

දිගුකාලීන රක්ෂණයේ උප අංශ වල වත්කම් 2022 අවසානයට රු. බිලියන 947.3 දක්වා ලඟා වූ අතර එය පසුගිය වසරට වඩා 5.7%ක වර්ධනයකි. කෙසේ වෙතත්, 2021 හි 12.2%ත් වන අනුරූප සංඛ්‍යාවෙන් අඩුවීමක් විය. ප්‍රධාන උප අංශ දෙකෙහි කොටස තුළ සුළු වෙනසක් තිබුණි. සාමාන්‍ය රක්ෂණය එහි කොටස 28.3% සිට 29.4% දක්වා වැඩි කරගෙන ඇති අතර දිගුකාලීන රක්ෂණ කොටස 71.7% සිට 70.6% දක්වා අඩු වී ඇත. රක්ෂණ අංශයේ දළ ලිඛිත වාරිකය 2022 දී රු.බිලියන 233.5 සිට 257.6 දක්වා 10.3%කින් වර්ධනය විය. දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණයේ උප අංශවල දළ ලිඛිත වාරිකයේ වර්ධනය පිළිවෙලින් 8.5%ක් සහ 12.4%ක් විය. දිගුකාලීන රක්ෂණ උප අංශ මුළු දළ ලිඛිත වාරිකයේ 52.6%ක් සඳහා දායක වෙමින් මුළු අංශය තුළ සිය ප්‍රමුඛතාව රඳවාගෙන ඇත. මුළු රක්ෂණයේ ආයෝජන කළඹ 2022 දී රු. බිලියන 776.6 දක්වා ලඟාවීමට 5.6%කින් වර්ධනය විය. ආයෝජන අඛණ්ඩව රජයේ සුරැකුම්පත්වල ඉහළින් කේන්ද්‍රගත වී ඇත.

රක්ෂණ අංශයේ ලාභදායිතාව බදු පෙර ලාභයෙහි 19.4%ක වර්ධනයක් වාර්තා කළ අතර සාමාන්‍ය රක්ෂණ උප අංශය 41.2%ක ආක්‍රමණශීලී වර්ධනයක් අත්කරගෙන ඇති අතර දිගුකාලීන රක්ෂණ අංශය 1.3%ක වර්ධනයක් සාක්ෂාත් කර ගෙන ඇත. අවසානයට සඳහන් කළ දුර්වල කාර්ය සාධනයට 2022 දී හිමිකම්වල 31.5%ක වැඩිවීම සාපේක්ෂව හේතු වී ඇත. සාමාන්‍ය රක්ෂණ අංශය වත්කම් මත ඉපයීම සහ ස්කන්ධය මත ඉපයීම තුළ වැඩිවීමක් (පිළිවෙලින් 10.1% සහ 20.8% 2021 – 8.0% සහ 16.3%) වාර්තා කර ඇත. අනෙක් අතට, දිගුකාලීන රක්ෂණ අංශය මෙම දෙඅංශයේ පහත වැටීමකට (පිළිවෙලින් 3.6% සහ 17.1%, 2021 – 3.9% සහ 17.7%) මුහුණ දුන්හ.

කාර්යසාධනය පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබා ගැනීමට, අතීශයින් පීඩාවට පත් ආර්ථික වාතාවරණයකට මුහුණ දෙමින් අංශයේ කාර්යසාධනය වඩා යහපත්බව කිව යුතුය.

මූලාශ්‍ර

(1) ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව – 2022

(2) ලෝක බැංකු ශ්‍රී ලංකා සංවර්ධන යාවත් කිරීම්, 2023 අප්‍රේල්

මූල්‍ය ප්‍රාග්ධනය



රට තුළ ආර්ථික අර්බුදය මගින් ඇති කළ අහිතකර ආර්ථික බලපෑම හමුවේ, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් දේශීය රක්ෂණ ක්ෂේත්‍රයේ අද දක්වා මෙතෙක් විශාලතම ප්‍රසාද දීමනාව ප්‍රකාශයට පත් කරමින් ඓතිහාසික සන්ධිස්ථානයක් සාක්ෂාත් කරගෙන ඇත. 2022 මූල්‍ය වසර තුළ ජීවිත සහභාගිත්ව රක්ෂණ හිමියන් වෙත ප්‍රකාශිත මුළු ප්‍රසාද දීමනාව රු. මිලියන 10,494ක් වූ අතර ඒ තුළින් පසුගිය වසරේ ලබාදුන් රු. මිලියන 9,836ක සිය වාර්තාව ඉක්මවනු ලබයි.

මූල්‍ය කාර්යසාධනය

දළ විශ්ලේෂණය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සැමවිටම එහි කොටස්හිමියන්ගේ සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව සහ බැඳියාවන් ප්‍රමුඛ කර ඇත. මෙය ඉටුකරන එක් මාර්ගය වන්නේ ප්‍රාග්ධනය සඳහා හිතකර ප්‍රතිඵල උත්පාදනය කිරීමට සමාග මේ මූල්‍ය ප්‍රාග්ධන සංචිතය පරිස්සමින් කළමනාකරණය කිරීමයි. මූල්‍ය ප්‍රාග්ධන සංචිතයේ තිරසාර වර්ධනය අත්‍යවශ්‍ය අංගයක් වන අතර, එය සමාගමට සිය අවසාන ඉලක්කය අත්කර ගැනීමට සහය වේ. ව්‍යාපාරය ශක්තිමත් කරමින් සහ කොටස්හිමියන්ගේ දායකත්වයන් සුරකිමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සදාචාර හා විචක්ෂණ ආකාරයකින් ධනාත්මක බලපෑමක් කිරීමට උත්සාහ ගනී.


තවද, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සිය මෙහෙයුම් සදාචාර හා විචක්ෂණ ආකාරයකින් පැවැත්වීම අවධාරණය කරයි. මින් අදහස් වන්නේ නෛතික හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවීම, විනිවිදභාවය සහ වගවීම පවත්වා ගැනීම, සහ වගකීම් සහගත මූල්‍ය කළමනාකරණය ක්‍රියාවට නැංවීමයි. මෙම මූලධර්ම නගා සිටුවමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් එහි පාර්ශවකරුවන් අතර විශ්වාසය ගොඩ නැගීමට සහ අවංකකම මත පදනම් වී දිගුකාලීන සම්බන්ධතා පෝෂණය කිරීමට අරමුණු කරයි.


මූල්‍ය ප්‍රතිඵල – ඒකාබද්ධ ව්‍යාපාර කාර්යසාධනය


ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පිළිවෙලින් ආදායම සහ දළ ලිඛිත වාරිකය රු. මිලියන 63,685 සහ රු. මිලියන 41.272ක් අත්කර ගත් අතර ඉන් 2021 වසරට සාපේක්ෂව පිළිවෙලින් වාර්ෂිකව 0.6%ක 4.5%ක සෘණාත්මක වර්ධනයක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ප්‍රධාන ආදායම් මූලාශ්‍රයක් වන මූල්‍ය ආයෝජනයෙන් ආයෝජන ආදායම රු. මිලියන 13,794 (2021 – රු. මිලියන 23,392) දක්වා 41%කින් අඩු විය. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් 2022 වසර තුළ ස්කන්ධ වෙළෙඳපොළේ දුර්වල කාර්යසාධනය හේතු විය.

සමාගමේ මුළු වත්කම් 2022 දෙසැම්බර්වල රු. මිලියන 274,449 (2021 – රු. මිලියන 268,436) දක්වා ලඟාවීමට වාර්ෂිකව 2.2%කින් වර්ධනය විය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින් 2022 මූල්‍ය වසර සඳහා රු. මිලියන 12,476ක බදු පෙර ලාභයක් වාර්තා කළ අතර එය 2021 දී වාර්තා කළ රු. මිලියන 11.725ට 6.4%ක වැඩි වීමකි. එමෙන්ම 2022 මූල්‍ය වසර සඳහා බදු පසු ලාභය රු. මිලියන 10,546ක් (2021 – රු. මිලියන 10,041) වූ අතර එය 5.0%ක වැඩි වීමකි. ස්කන්ධය මත ඉපයීම පසුගිය මූල්‍ය වසරේ පැවති 13.4%ට සාපේක්ෂව 2022 වසරේදී 13.8%ක් විය. බදු ආකාරයෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ශ්‍රී ලංකා රජයට දායකත්වය 2022 වසර සඳහා රු. මිලියන 6,393 ක් විය. (2021 – රු. මිලියන 3,846)

මූල්‍ය ප්‍රාග්ධනය










ජීවිත රක්ෂණ ව්‍යාපාර


රට තුළ ආර්ථික අර්බුදය මගින් ඇති කළ අහිතකර ආර්ථික බලපෑම හමුවේ, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් දේශීය රක්ෂණ ක්ෂේත්‍රයේ අද දක්වා මෙතක් විශාලතම ප්‍රසාද දීමනාව ප්‍රකාශයට පත් කරමින් ඓතිහාසික සන්ධිස්ථානයක් සාක්ෂාත් කරගෙන ඇත. 2022 මූල්‍ය වසර තුළ ජීවිත සහභාගිත්ව රක්ෂණ හිමියන් වෙත ප්‍රකාශිත මුළු ප්‍රසාද දීමනාව රු. මිලියන 10,494ක් වූ අතර ඒ තුළින් පසුගිය වසරේ ලබාදුන් රු. මිලියන 9,836ක සිය වාර්තාව ඉක්මවනු ලබයි.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ජීවිත රක්ෂණ ව්‍යාපාරය 2022 මූල්‍ය වසර සඳහා රු. මිලියන 20,930ක (2021 – රු. මිලියන 21,976) දළ ලිඛිත වාරිකය වාර්තා කළ අතර 4.8%ක වාර්ෂික සෘණාත්මක වර්ධනයක් ඉන් පෙන්නුම් කරයි. එමෙන්ම එය 10.8%ක 5 වසරක CAGR හා අනුකූල වේ. ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ මූල්‍ය ආයෝජනවලින් ආයෝජන ආදායම පසුගිය මූල්‍ය වසරේ පැවති රු. මිලියන 19,988 සිට 2022 මූල්‍ය වසර සඳහා රු. මිලියන 12,050 දක්වා 39.7%කින් අඩුවී ඇත. ජීවිත අරමුදල සමාලෝචිත වසර තුළ 2.7% ක වාර්ෂික වර්ධනයක් සමඟ 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 156,719 දක්වා (2021 – රු. මිලියන 152,585) රු. මිලියන 4,134 කින් වර්ධනය විය. ජීවිත ව්‍යාපාරය 2022 මූල්‍ය වසර සඳහා රු. මිලියන 14,034ක (2021 – රු. මිලියන 23,833) බදු පසු ලාභයක් (ජීවිත අරමුදලට මාරු කිරීමට පෙර) වාර්තා කර ඇති අතර එය 2021 වසරට සාපේක්ෂව 41.11%ක සෘණාත්මක වර්ධනයකි.











සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකය 4.3%ක සෘණාත්මක වර්ධනයක් වාර්තාකළ අතර එය 2021 මූල්‍ය වසරේ පැවති රු. මිලියන 21,255 සිට 2022 මූල්‍ය වසරේ රු. මිලියන 20.341 දක්වා අඩුවීමකි. පසුගිය වසර 5 (2017 – 2022) තුළ, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකය 1.5%ක CAGR අඛණ්ඩව පවත්වා ගෙන ඇත.


සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මූල්‍ය ආයෝජනවලින් ආයෝජන ආදායම රු. මිලියන 1,744ක් (2021 – රු. මිලියන 3,404) වන අතර එය වාර්ෂිකව 48.8%කින් අඩුවී ඇත. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් ස්කන්ධ වෙළෙඳපොලේ දුර්වල කාර්යසාධනය හේතු විය. 2022 මූල්‍ය වසර සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ බදු පසු ලාභය රු. මිලියන 7,529ක් වූ අතර ඉන් 2021 දී වාර්තාකළ රු. මිලියන 5,057 සිට වාර්ෂිකව 48.8%ක වැඩිවීමක් පෙන්නුම් කරයි.


අඛණ්ඩව වසර කිහිපයක් සඳහා මෝටර් රථ රක්ෂණයේ වෙළෙඳපොල නායකයා ලෙස ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පසුගිය මූල්‍ය වසරේ පැවති රු. මිලියන 11,673ට සාපේක්ෂව 2022 මූල්‍ය වසර තුළ රු. මිලියන 12,780ක දළ ලිඛිත වාරිකයක් වාර්තා කළ අතර ඉන් 9.5%ක වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරයි.





මූල්‍ය ප්‍රාග්ධනය





ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ස්ථාවරත්වය

රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ (RII) 26 (1) වගන්තියට අනුව, ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ද්විත්වය සඳහා රක්ෂණකරුවන් විසින් ස්ථීර නුබුන්වත්/අවදානම පාදක ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතික පවත්වාගෙන යා යුතු වේ.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින් එහි අවදානම් පදනම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය අඛණ්ව වසර කිහිපයක් සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා ඉහළින් පවත්වා ගැනීමට සමත් වී ඇත. 2022 දී ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා අවදානම් පදනම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 2021 මූල්‍ය වසරේ පැවති 501%ට සාපේක්ෂව 316%ක් විය. 2022 දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා අවදානම් පදනම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 2021 මූල්‍ය වසරේ පැවති 244%ට සාපේක්ෂව 244%ක් වාර්තා කරන ලදී.

නිෂ්පාදිත ප්‍රාග්ධනය



ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි නිෂ්පාදිත ප්‍රාග්ධනයට එහි කාර්යාල, ශාඛා, පරිගණක සහ උපකරණ, ඩිජිටල් මාර්ග, සහ ජාල යටිතල පහසුකම් ඇතුළත් වේ. අපගේ භෞතික ජාලය ශාඛා 142කින් නියෝජිත ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන (ABDCs) 53කින් සහ එක් කවුළුවකින් (ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී) සමන්විත වේ.

අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය හා එහි වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි නිෂ්පාදිත ප්‍රාග්ධනයට එහි කාර්යාල, ශාඛා, පරිගණක සහ උපකරණ, ඩිජිටල් මාර්ග, සහ ජාල යටිතල පහසුකම් ඇතුළත් වේ. අපගේ භෞතික ජාලය ශාඛා 142කින් නියෝජිත ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන (ABDCs) 53කින් සහ එක් කවුළුවකින් (ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී) සමන්විත වේ. මෙම ජාලය ශ්‍රී ලංකාවේ පළාත් 9 සහ දිස්ත්‍රික් 25 තුළ ව්‍යාප්ත වී ඇත. කාර්යාල මාර්ග සහ මුහුණට මුහුණ ඇමතුම වැදගත්ව පවතින අතරම, අපි තාත්වික සන්නිවේදන මාර්ග ලබාදෙන්නෙමු.

පැය 24 ඇමතුම් මධ්‍යස්ථානය ගනුදෙනුකරුවන්ට සහය සපයන අතර නිෂ්පාදන හා සේවා සම්බන්ධ තොරතුරු සඳහා පිවිසීම අපගේ ආයතනික වෙබ් අඩවියෙන් ද ලබාගත හැකි අතර මෙම සේවා දෙකම 24X7 තුළ ලබාගත හැකිය.

අපගේ භෞතික ගනුදෙනුකාර සේවා මූලාශ්‍ර ජංගම ගෙවීම් විසඳුම්වලින් සහ ගනුදෙනුකාර පහසුව තවදුරටත් වැඩි කරන දෙමුහුන් මාර්ග ශක්තිමත් කර ඇති අතර ඒ තුළින් තරඟකාරී වෙළෙඳපොළක් තුළ අපව වඩාත් ආකර්ශනීය තේරීම බවට පත් කරයි.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

වටිනාකම් නිර්මාණ පරමාර්ථ සපුරාලීම

ශාඛා ව්‍යාප්තිය හා නැවත ස්ථානගත කිරීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශාඛා ව්‍යාප්තිය පිළිබඳ මනාව සකස් කළ උපායමාර්ග යක් ඇත. ශාඛා පුළුල් කිරීම පිළිබඳ තීරණ ගැනීමේදී ව්‍යාපාර විභවතා කෙරෙහි අපි අවධානය යොමු කරමු. එබැවින් වේගයෙන් නාගරීකරණය වන ස්ථානවල මතුවන සුළු හා මධ්‍ය පරිමාණ නගර කෙරෙහි අපි අවධානය යොමු කරමු. ප්‍රශස්ථ ශාඛා ව්‍යාප්ති අනුපාතය සාක්ෂාත් කරගැනීමට ප්‍රමාණවත් ආදායම් මට්ටම් සහිත ප්‍රමාණවත් ජනගහන ඝනත්වයක් ඇති ප්‍රදේශවල නව ශාඛා සහ ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට මෙම ප්‍රවේශය සම්බන්ධ වේ. මෙම උපායමාර්ගය පිරිවැය තුළනය සහ නව ව්‍යාපාර අවස්ථා සඳහා උපකාරී වේ. ශාඛා නැවත ස්ථානගත කිරීමේදී අපි එම උපායමාර්ගය අනුගමනය කරමු. පසුගිය වසර තුළ, මෙම නිර්ණායකය මත පදනම් වී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශාඛාවලින් ශාඛා හතක් නැවත ස්ථානගතකරන ලදී.

ශාඛා කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම

අපගේ ශාඛා ජාලයේ ඵලදායිත්වය වැඩි කිරීමේදී ඒ තුළින් ශාඛා පුළුල් කිරීම පමණක් නොව, ඒ මගින් අපගේ ශාඛාවල කාර්යක්ෂමතාව සහ භෞතික පැවැත්ම ද වර්ධනය කරයි. අපි අපගේ ශාඛා උසස් කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටින අතර, 2022 දී ශාඛා හතරක් නව පෙනුමක් ලබාදී සම්පූර්ණ අලුත්වැඩියාවක් සිදු කරන ලදී.

වසර තුළ, මෙම නිර්ණායකය මත පදනම් වී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශාඛාවලින් ශාඛා හතක් නැවත ස්ථානගතකරන ලදී.

ප්‍රධාන උපායමාර්ගික සිදුවීම්

නව ශාඛා 1 **විවෘත කරන ලදී**

නව ABDC1 **විවෘත කරන ලදී**

ශාඛා 7 **නැවත ස්ථානගත කරන ලදී**

ශාඛා 4 **අලුත්වැඩියා කරන ලදී**

ස්ථාවර වත්කම්වල ආයෝජනය

	මු.ව. 2022 රු. '000	මු.ව. 2021 රු. '000	මු.ව. 2020 රු. '000	මු.ව. 2019 රු. '000	මු.ව. 2018 රු. '000
ස්ථාවර වත්කම්වලට එකතුකිරීම්	515,245	256,147	231,437	311,149	243,209
ස්ථාවර වත්කම්වලට ශුද්ධ ගිණුම් පොත් අගය	12,763,092	12,737,635	10,867,358	11,073,931	11,256,423

ශාඛා ව්‍යාප්තිය හා ජනගහණ ඝනත්වය

පළාත	මු.ව. 2022	මු.ව. 2021	මු.ව. 2020
	ශාඛා ව්‍යාප්තිය (ABDCs, සහ LHC කවුළුව ඇතුළුව ශාඛා ගණන)	ශාඛා ව්‍යාප්තිය (ABDCs ඇතුළුව ශාඛා ගණන)	ශාඛා ව්‍යාප්තිය (CSCs ඇතුළුව ශාඛා ගණන)
බස්නාහිර	69	70	59
දකුණ	32	33	25
මධ්‍යම	17	17	13
උතුරු	10	10	08
උතුරු මැද	12	12	09
නැගෙනහිර	10	10	07
වයඹ	24	24	19
සබරගමුව	13	13	12
ඌව	09	09	07

2022 අවසන්කළ ව්‍යාපෘති/2023 වසර සඳහා සැලැස්ම



2022 නිමකළ ව්‍යාපෘත

- මැදවච්චිය නව ශාඛාව
- පාදුක්ක නව ABDC ශාඛාව
- කොළඹ නගර ශාඛා 7 නැවත ස්ථානගත කරන ලදී
- ශාඛා 4ක් අලුත්වැඩියා කරන ලදී (කිරිබත්ගොඩ, ගලේවෙල, හෝමාගම, සහ නිට්ටඹුව)

ඉදිරි දැක්ම – 2023 සඳහා සැලැස්ම

- නව ශාඛා විවෘත කිරීම – 2
  (කරාපිටිය සහ කඹුරුපිටිය)
- නැවත ස්ථානගත කිරීම් – 5
  (බදුල්ල, බකමූන, කොළඹ නගර කාර්යාලය, කලවාන සහ දෙහිවල)
- අලුත්වැඩියා කිරීම් – 5
  (දිගන, පුත්තලම, රත්නපුර, මීගමුව සහ හලාවත)
- ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්ට අයත් දේපලවල නව ඉදිකිරීමේ ව්‍යාපෘති – 4 (මාරවිල, ගම්පොල, ත්‍රිකුණාමලය සහ යාපනය)
- ABDCs වැඩිකරමින්, SLIC's හි දිවයින පුරා ව්‍යාප්තිය වැඩි කිරීමට විශේෂ ක්‍රම යොදා ගනිමින් හඳුනාගත් ප්‍රදේශවල නව නියෝජිත ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කරමින් අපගේ ජාලය තවදුරටත් පුළුල් කිරීමට අපි සැලසුම් කරමු.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ප්‍රාදේශීය සිතියම – 2022

මධ්‍යම ශාඛාව - 12	දිගන, ගම්පොළ, නුවර නගරය, නුවර ප්‍රධාන, කටුගස්තොට, කැගල්ල, මාතලේ, මාවනැල්ල, මාවතගම, නාවලපිටිය, පිළිමතලාව, රිකිල්ලගස්කඩ
ABDCs - 4	අරණායක, බුලත්කොහුපිටිය, ගලගෙදර, පේරාදෙනිය

නැගෙනහිර ශාඛාව - 5	අක්කරෙයිපත්තු, මඩකලපුව, කල්මුනෙයි, කන්තලේ, ශ්‍රීකුණාමලය
ABDCs - 2	කලවන්චිකුඩි, පොතුවිල්

උතුරු මැද ශාඛාව - 10	අනුරාධපුරය, අරලගන්විල, බකමුණ, දෙහිඅත්තකණ්ඩිය, හිඟුරක්ගොඩ, හොරොව්පතාන, කඳුරුවෙල, කැකිරාව, මැදවච්චිය, පදවි පරාක්‍රමපුර
ABDCs - 3	හබරණ, මහඔය, මැදිරිගිරිය

උතුරු ශාඛාව - 8	චන්කනෙයි, චාවකච්චේරි, යාපනය, කිලිනොච්චි, මන්නාරම්, මුලතිව්, තෙල්ලිඅඩි, වවුනියාව
ABDCs - 2	චුන්නාකම්, මල්ලවි

රත්නපුර ශාඛාව - 10	අවිස්සාවේල්ල සාමාන්‍ය, අවිස්සාවේල්ල පීවිත, බලංගොඩ, ඇහැලියගොඩ, ඇඹිලිපිටිය, කහවත්ත කලවාන, පල්ලේබැද්ද, රත්නපුර, රුවන්වැල්ල
ABDCs - 2	දරණියගල, හංවැල්ල

දකුණ 1 ශාඛාව - 12	අලුත්ගම, අම්බලන්ගොඩ, බද්දේගම, බණ්ඩාරගම, ඇල්පිටිය, ගාල්ල, හොරණ, කලුතර, මතුගම ,පානදුර, තල්ගස්වල, උඩුගම
ABDCs - 6	බදුරලිය, හබරාදුව, කරාපිටිය, පිටිගල, තනිපොල්ගහ, ඌරගහ

දකුණ 2 ශාඛාව - 12	අකුරස්ස, අම්බලන්තොට, බෙලිඅත්ත, දෙනියාය, දික්වැල්ල, හක්මන, හම්බන්තොට, මාතර, තෙලවු, තංගල්ල, තිස්සමහාරාමය, වැලිගම
ABDCs - 9	දෙඩියන්දර, ඉමදුව, කමුරුපිටිය, කැකනදුර, මිද්දෙනිය, මොරවක, සූරියවැව, ඌරුබොක්ක, වලස්මුල්ල


ඉහළ බස්නාහිර ශාඛාව - 11	ගම්පහ, ජා-ඇල, කඳාන, කොච්චිකඩේ, මාරවිල, මිනුවන්ගොඩ, මීගමුව, නිට්ටඹුව, වේයන්ගොඩ, වෙන්නප්පුව, යක්කල
ABDCs - 11	දන්කොටුව, දිවුලපිටිය, ගනේමුල්ල, කිරිල්ලවල, කිරිඳිවැල, මහබාගේ, මීරිගම, පුගොඩ, උඩුගම්පොල, ඌරාපොල, වැලිවේරිය

ඌව ශාඛාව - 10	අම්පාර, බදුල්ල, බණ්ඩාරවෙල, බිබිල, හැටන්, මහියංගණය, මොනරාගල, නුවරඑළිය, වැලිමඩ, වැල්ලවාය
ABDCs - 2	පස්සර, සියඹලාණ්ඩුව

වයඹ 1 ශාඛාව - 10	ගිරිඋල්ල, කුලියාපිටිය, කුරුණෑගල නගරය, කුරුණෑගල ප්‍රධාන, මැල්සිරිපුර, නාරම්මල, පොල්ගහවෙල, රඹුක්කන, රිදීගම, වරකාපොල
ABDCs - 6	අලවිව, හෙට්ටිපොල, ඉබ්බාගමුව, කටුපොත, පන්නල, පොල්පිතිගම

වයඹ 2 ශාඛාව - 10	ආනමඩුව, හලාවත, දඹුල්ල, ගලේවෙල, ගල්ගමුව, මහව, නිකවැරටිය, පුත්තලම, තඹුත්තේගම, වාරියපොල
ABDCs - 1	හිරිපිටිය

බස්නාහිර 1 ශාඛාව - 8	බත්තරමුල්ල, කොළඹ නගර කාර්යාලය, දෙහිවල, කිරුලපොන, මොරටුව, නුගේගොඩ, පිටකෝට්ටේ, රත්මලාන
ABDCs - 1	මොරටුමුල්ල
කවුළුව - 1	ලංකා හොස්පිටල් කවුළුව




බස්නාහිර 2 ශාඛාව - 9	කොළඹ මෙට්රෝ 1, කොළඹ මෙට්රෝ 10, කොළඹ මෙට්රෝ 11, කොළඹ මෙට්රෝ 2, කොළඹ මෙට්රෝ 3, කොළඹ මෙට්රෝ 4, කොළඹ මෙට්රෝ 6, කඩවත, කිරිබත්ගොඩ
ABDCs - 2	දෙල්ගොඩ, කැලණිය

බස්නාහිර 3 ශාඛාව - 8	අතුරුගිරිය, හෝමාගම, ඉංගිරිය, කඩුවෙල, කොට්ටාව, මහරගම, මාලඹේ, පිළියන්දල
ABDCs - 1	පාදුක්ක

බස්නාහිර 4 ශාඛාව - 7	බම්බලපිටිය, බොරැල්ල, කොටහේන, කොට්කාවත්ත, පිටකොටුව, රාගම, වත්තල
ABDCs - 1	වැල්ලවත්ත

බුද්ධිමය ප්‍රාග්ධනය



SLICs හි බුද්ධිමය ප්‍රාග්ධනය දශක ගණනාවක පළපුරුද්ද සහ ඉගෙනුම මත ගොඩ නගා ඇත. අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය තාක්ෂණය, ප්‍රතිපත්ති, පද්ධති සහ ක්‍රියාවලි, සහ සන්නාම හිමිකම වැනි අස්පෘශ්‍ය වත්කම්වලින් සමන්විත වේ. මෙම දැනුම පදනම් සම්පත් SLICs හි වටිනාකම කොටස වැඩි කර, සමාගමට තරඟකාරී වාසිය ලබා දේ.

SDG'S වෙත දායකත්වය

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE

- 2022 දී IT පද්ධති සංවර්ධනය සඳහා ආයෝජය 2021 ට සාපේක්ෂව 28.49%කින් වර්ධනය විය.

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

- වඩාත් වටිනා සාමාන්‍ය රක්ෂණ සන්නාමය
- වඩාත් ආදරණීය රක්ෂණ සන්නාමය

ප්‍රධාන උපායමාර්ගික සිදුවීම්

ආයෝජන	2022 රු.	2021 රු.	වෙනස %
IT පද්ධති සංවර්ධනය	මිලියන 183.1	මිලියන 142.5	28.49%

සන්නාම හිමිකම

ජාතියේ රක්ෂකයා යන නාමය දරමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අහිතකර ආර්ථික හා සමාජ තත්ත්වයන් හමුවේ ජනතාවට විශිෂ්ඨ සේවය ලබාදීම තුළින් 2022 දී එහි සන්නාම වටිනාකම වැඩි කර ගැනීමට සමත් වී ඇත. සාමාන්‍ය රක්ෂණ සන්නාම වටිනාකම සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළම අගය වන රු. බිලියන 4ක් වූ අතර, ජීවිත රක්ෂණ සන්නාම වටිනාකම 2022 වසර සඳහා ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ 2 වැනි විශාලතම අගය වන රු. බිලියන 3.1ක් විය.

තවද, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් එහි වත්කම් පදනම රු. බිලියන 274 දක්වා වැඩිකරගෙන ඇති අතර ජීවිත අරමුදල රු. බිලියන 156.7 දක්වා රට තුළ විශාලතම සහ ශක්තිවන්තම රක්ෂකයා ලෙස ස්ථානය රැක ගනිමින් වැඩිකරගෙන ඇත.

සන්නාම ජයග්‍රාහන

සන්නාමයක් ලෙස, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වඩා ඉහළ මට්ටමට අබණ්ඩව වර්ධනය වී ඇති අතර ප්‍රදාන සහ පිළිගැනීම් ගණනාවක් ලබා ගෙන ඇත. වසර තුළ, Brand Finance විසින් ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ සන්නාම සඳහා අබණ්ඩව 5ස් වැනි වරටත් "වඩාත් ආදරණීය රක්ෂණ සන්නාමය" ලෙස පිළිගෙන ඇත. සාමාන්‍ය රක්ෂණය සඳහාද Brand Finance විසින් අබණ්ඩව 5ස් වැනි වරටත් "වඩාත් වටිනා සාමාන්‍ය රක්ෂණ සන්නාමය" ලෙස පිළිගෙන ඇත. එහි ශක්තිමත් ගමන් වාර්තාව සමඟ, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි පසුගිය වසර පුරා ගොඩනගාගත් සන්නාම ප්‍රතිරූපය, සහ ආයතනික ඉගෙනුම සියලු පාර්ශවකරුවන්ට සන්නාම පොරොන්දුව ලබාදීමට මනාව ස්ථාපිත කර ඇත. අපගේ ප්‍රමාණය, වෙළෙඳපොල, දැනුම, සහ හැකියාවන් අනුව, විවිධ වටිනාකම් යෝජනා තුළින් අපගේ සේවාදායක පදනම පුළුල් කිරීමට අපට හැකිවිය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ට එහි විවිධ සේවාදායක අවශ්‍යතා සපුරාලීමට සහ සුපිරි සේවා ලබාදීම සඳහා පුළුල් නිෂ්පාදන කළඹක් ඇත.


ISO 9001:2015

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින් ISO 9001:2015 සමඟ පෙළගැසුනු ගුණාත්මක ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවා ඇති අතර එය දැඩිව ක්‍රියාත්මක කර ඇත. මෙම ප්‍රතිපත්තිය මගින් "අපකරන සෑම දෙයකදීම ගනුදෙනුකරු ප්‍රමුඛය" යන සමාගමේ අරමුණ නැවත නැවත තහවුරු කරයි. මෙම දර්ශනය සියලුම කණ්ඩායම් විසින් පිළිගනිමින් ක්‍රියාත්මක කර ඇත. මෙම ප්‍රතිපත්තියෙන් අපගේ ව්‍යාපාරයේ සෑම ස්ථානයකදීම එනම් ප්‍රධාන කාර්යාලය සහ ශාඛාවල ක්‍රියාත්මක කරන සෑම අංගයක් සඳහා අවම මෙහෙයුම් ප්‍රමිති පැහැදිලි කරයි. මෙම ප්‍රමිතියෙන් ජීවිත සහ ජීවිත නොවන ප්‍රතිරක්ෂණ, හිමිකම්, නිරවුල් කිරීම් සහ සහය සේවා ආවරණය කරයි.

ICT උපායමාර්ගය හා ප්‍රතිපත්තිය

රක්ෂණ ව්‍යාපාරය යනු තොරතුරු සහ දැනුම තීව්‍ර වේ. අපගේ තාක්ෂණ උපායමාර්ගය තරඟකාරිත්වය වර්ධනය කිරීම සහ විවිධ සහ පුළුල් ගනුදෙනුකාර පදනමේ අපේක්ෂාවන් සපුරාලීමට අපගේ නිෂ්පාදන හා සේවා පිරිනැමීම් විවිධාංගීකරණය කෙරෙහි අවධානය යොමු කරයි. අපගේ ශක්තිය කොවිඩ් 19 වසංගත කාලසීමාව තුළ සේවාදායක සහ සමාගමේ අවශ්‍යතා සපුරාලීමේ ආකාරය මගින් පෙන්වා දී ඇත. වේගයෙන් වෙනස්වන ගනුදෙනුකාර සහ මෙහෙයුම් අවශ්‍යතා මගින් අපගේ ICT කෙරෙහි තබා ඇති ඉල්ලුම සපුරාලීමට අපගේ තාක්ෂණික සම්පත් අපි සංවර්ධනය කර යාවත් කරමින් සිටිමු.

SLIC හි ICT උපායමාර්ගය මූලික අවධාන ක්ෂේත්‍ර හතරක් මත ගොඩ නැගේ




ඩිජිටල්කරණය



SLIC ගනුදෙනුකාර App



SLIC ගනුදෙනුකාර බිහිදොර



සෘජු බැංකු ගෙවීම්



ජීවිත ගෙවීම් සඳහා mCash



ජීවිත ගෙවීම් සඳහා eZ Cash



SLIC PEGI Online (පුද්ගල කණ්ඩායම් රක්ෂණය)



E-Marine

අපගේ දත්ත හා පද්ධති ඩිජිටල්කරණය වෙත විතැන්වීම අබණ්ඩ ක්‍රියාවලියක් වන අතර වසර තුළ, අපගේ ව්‍යාපාර ක්‍රියාවලි සහ සේවාවන්හී වැඩි දියුණු කිරීම් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී, මෙම මුලපිරීම් මගින්, අපි අපගේ ඵලදායිත්ව, කාර්යක්ෂමතාව සහ සේවා ප්‍රමිති ඉහළ නංවා ඇත. එමෙන්ම අපි වඩාත් සහයෝගී සේවා පරිසරයකට ගමන් කර ඇත.

අපගේ ව්‍යාපාර ක්‍රියාවලි සඳහා ඩිජිටල් අත්සන පහසුකමක් ලංකා පේ සමඟ හවුල්කාරත්වයෙන් ක්‍රියාත්මක කරන ලදී. මෙය පිරිවැය අඩුකර, ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වර්ධනය කර ඇත. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අපගේ ව්‍යාපාර ක්‍රියාවලි වැඩි කිරීමට තාක්ෂණය භාවිතා කරමින් සිය අලෙවි බලකාය ස්වයංක්‍රීය අවකාශය යාවත් කරන ලදී. ඩිජිටල් යෙදුම සහ ජංගම උපාංග පදනම් විසඳුම් හඳුන්වාදීම මෙහෙයුම් වෙනසක් පමණක් නොව අලෙවි බලකාය අතර ඩිජිටල්කරණය කරා සංස්කෘතික වෙනසක් සිදු කර ඇත.

තොරතුරු තාක්ෂණයේ සහ ඩිජිටල්කරණයේ අවසාන අන්තය වන්නේ ගනුදෙනුකරුවන්ට වටිනාකම ලබාදීමයි. "ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්"යන ක්ෂේත්‍රයේ ප්‍රථම විස්තීර්ණ ගනුදෙනුකාර කේන්ද්‍රීය ජංගම යෙදුම අපි හඳුන්වා දී ඇත. ජංගම මුදල්, ඩිජිටල් බැංකුකරණය සහ ඉලෙක්ට්‍රොනික් ගෙවීම් විකල්ප වැනි වෙනත් බොහෝ ඩිජිටල් යෙදුම් සමඟ අපි ගනුදෙනුකාර පහසුව වැඩිකර ඇත. අපගේ ගනුදෙනුකාර ඇමතුම් මධ්‍යස්ථානය ඉන් පිරිනමන පහසුකම් වැඩි කර ඇත. මාර්ගගත chat පහසුකම් ද පුළුල් කර ඇති අතර, අපගේ වෙබ් අඩවිය නරඹන ගනුදෙනුකරුවන්ට අපගේ නියෝජිතයින් සමඟ මැදිහත්වීමේ සහ අපගේ නිෂ්පාදන හා සේවා සම්බන්ධ තොරතුරු 24X365 තුළ ලබාගැනීමේ පහසුව ලබාදී ඇත. ගනුදෙනුකරුවාගේ පහසුව සඳහා නවතම QR කේත පදනම් මුදල් රහිත ගෙවීම් පහසුකම හඳුන්වාදීමේදී ශ්‍රී ලංකා රක්ෂණ ක්ෂේත්‍රයේ අපි පුරෝගාමී විය. අපගේ උපායමාර්ගයේ කොටසක් ලෙස, 500+ CDMS සහ ස්වයං සේවා කුටි සමඟ ඒකාබද්ධවීමට මහජන බැංකුව සහ NTB වැනි අපගේ ව්‍යාපාර හවුල්කරුවන් සමඟ අපි හවුල් වී ඇත. දිවයින පුරා 1000+ ස්වයං සේවා කුටි සහ CDM පහසුකම් ඇතුළත් කිරීමට මෙය තවදුරටත් පුළුල් කිරීමට අපි සැලසුම් කරමු.

අපි අපගේ ගනුදෙනුකාර අත්දැකීම වර්ධනය කිරීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කර ඇත. ක්ෂේත්‍රයේ ප්‍රථම විස්තීර්ණ ජංගම යෙදුම වන, "ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්" ගනුදෙනුකාර යෙදුම හඳුන්වාදීම මගින් ගනුදෙනුකරුවන්ගේ මැදිහත්වීම් කෙරෙහි අවධානය යොමු කර අපගේ සේවා දායක පදනමේ අත්දැකීම වැඩි කර ඇත. ජංගම මුදල්, ඩිජිටල් බැංකුකරණය සහ ඉලෙක්ට්‍රොනික් ගෙවීම් විකල්ප වැනි බොහෝ ගනුදෙනුකාර අවධානිත ඩිජිටල් විසඳුම් හඳුන්වාදීම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමඟ මැදිහත්වීමේදී ගනුදෙනුකාර පහසුව නිර්මාණය කර ඇත. අපගේ ගනුදෙනුකාර ඇමතුම් මධ්‍යස්ථානය වැඩිදියුණු කළ පහසුකම් කරා අපි සංක්‍රමණය කර ඇති අතර 24x7x365 මෙහෙයුම් දක්වා මාර්ගගත සාකච්ඡා සේවා පුළුල් කර ඇත. මේ තුළින් අපගේ බොහෝ නිෂ්පාදන සහ සේවා සම්බන්ධ වැඩිදුර තොරතුරු ලබාගැනීමට අපගේ ඇමතුම් මධ්‍යස්ථාන නියෝජිතයින් සමඟ සාකච්ඡා කිරීමට අපගේ වෙබ් අඩවියට පිවිසෙන ගනුදෙනුකරුවන්ට සහ අනාගත ගනුදෙනුකරුවන්ට අවස්ථාව පිරිනමයි. ගනුදෙනුකරුවන් සඳහා නවතම QR කේත පදනම් මුදල් රහිත ගෙවීම් පහසුකම හඳුන්වා දෙන ලද ශ්‍රී ලංකා රක්ෂණ ක්ෂේත්‍රයේ පළමුවැන්නා අපි වෙමු. අපගේ බැංකු හවුල්කාර උපායමාර්ගයේ කොටසක් ලෙස, මහජන බැංකුව සහ NTB වැනි ප්‍රමුඛ බැංකු සමඟ 500+ CDMS සහ ස්වයං සේවා කුටි අපි ඒකාබද්ධ කර ඇත. අපගේ ගනුදෙනුකරුවාගේ පහසුව සඳහා දිවයින පුරා 1000+ ස්වයං සේවා කුටි සහ ෂෑඑ පහසුකම් ඉලක්කය සම්පූර්ණ කිරීමට වෙනත් ප්‍රමුඛ බැංකු කිහිපයක් සමඟ සම්බන්ධ කිරීමට අවශ්‍ය සංවර්ධනයන් සිදුකරමින් පවතී.

ප්‍රමුඛ ඩිජිටල් සෞඛ්‍ය සේවා සපයන්නන් සමඟ හවුල්කාරත්වය තුළ අපගේ ගනුදෙනුකරුවන් සඳහා ඩිජිටල් සෞඛ්‍ය අවකාශයක් අපි දියත් කර ඇත.



ජංගම

- "SLIC" ගනුදෙනුකාර යෙදුම හඳුන්වාදීම
- ජංගම යෙදුම තුළින් අගය එකතුකළ සේවා
- ස්වයං ආරක්ෂක සේවා
- ඩිජිටල් සෞඛ්‍ය සේවා



උසස් ඇමතුම් මධ්‍යස්ථානය

- අපගේ වෙබ්පිටුව හරහා සාකච්ඡා විකල්පය හඳුන්වාදීම
- 24h x 365 ක්ෂණික සහය



ඒකාබද්ධ ගෙවීම් විකල්ප

- සන්නිවේදන හවුල්කරුවන්
- බැංකු (QR, CDM, අන්තර්ජාල සහ ජංගම බැංකුකරණය)
- සුපිරි වෙළෙඳසැල් දාම

අපගේ තොරතුරු තාක්ෂණ යෙදුම පුළුල් කිරීම බොහෝ යටිතලපහසුකම් සංවර්ධනයන් සමඟ සහය වී ඇත. අපගේ දත්ත මධ්‍යස්ථාන අවකාශ සහ වැඩ තොග නවතම IBM පරිසරයන්ට අපි සංක්‍රමණය කර ඇත. මෙය අපගේ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නංවා ඇත. එමෙන්ම අපගේ හැකියාව වැඩි කිරීමට අපි තාත්වික අවකාශ සහ උපස්ථ විසඳුම් යොදා ගෙන ඇත.

තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පෙරමුණ මත, ව්‍යාපාර පුළුල් කිරීමට සහයවීමට අපි වැඩිදියුණු කිරීම් බොහොමයක් අවසන් කර ඇත. අපගේ දත්ත මධ්‍යස්ථාන අවකාශ සහ වැඩ තොග නවතම IBM පරිසරයන්ට අපි උසස් කර ඇත. මෙවැනි වැඩසටහන් අපගේ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේදී දායක වී ඇත. තවද අපි අපගේ හැකියාව, කාර්යක්ෂමතාවන්, සහ ව්‍යාපාරයේ තීරණාත්මක ක්‍රම සඳහා ප්‍රතිසාධන පරමාර්ථ වැඩි කිරීමට අපි තාත්වික අවකාශ සහ උපස්ථ විසඳුම් යොදා ගෙන ඇත. අපගේ දත්ත යටිතල පහසුකම් බාධා රහිත සේවාවක් සඳහා නවීන තාක්ෂණ විසඳුම් සමඟ යාවත් කර ඇත. සමස්ථ ශාඛා ජාලය පුරා මෘදුකාංග නිශ්චිත පුළුල් ක්ෂේත්‍ර ජාලය (SD-WAN) ට සංක්‍රමණය වීමේදී අපි යහපත් ප්‍රගතියක් සිදු කර ඇත.

ව්‍යාපාර යෙදුම් දෘෂ්ටිකෝණයකින්, ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ පද්ධති නවතව ව්‍යාපාර පද්ධති අවකාශ වෙත සංක්‍රමණය කිරීමේ ක්‍රියාවලියක අපි නිරත වී සිටින අතර අනාගත නිෂ්පාදන සංවර්ධනය තුළ අප වඩාත් නම්‍යශීලී කර වෙළෙඳපොල කාලය අඩු කිරීමට අපව ශක්තිමත් කරනු ඇත.

මානව ප්‍රාග්ධනය



ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි මානව ප්‍රාග්ධනය ඉහළම වත්කම වන අතර ආයතනයේ කාර්යසාධනයේ ප්‍රධාන ධාවකයා වේ. අපගේ ඉහළ හැකියාවැති වෘත්තීය කණ්ඩායම ඉහළ තරඟකාරී ක්ෂේත්‍රයක් තුළ අපගේ තරඟකරුවන් සමඟ ඉදිරියෙන් සිටීමට අපව ශක්තිමත් කරයි. අපගේ සේවකයින්ගේ කැපවීම සහ බැඳීම තුළින්, අපගේ නිෂ්පාදන දිවයිනේ සෑම කොටසකම හඳුනාගෙන ඇත.

SDG'S වෙත දායකත්වයන්

3 GOOD HEALTH AND WELL-BEING

- සේවක භෞතික යහපැවැත්ම, විශේෂ සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රතිපත්තිය
- අවසන්කළ සේවක පුහුණු වැඩසටහන්

4 QUALITY EDUCATION

- පැවැත්වූ සේවක පුහුණු වැඩසටහන්

5 GENDER EQUALITY

- ස්ත්‍රීපුරුෂ තුළනය පවත්වා ගැනීම – 55% සිට 45%

8 DECENT WORK AND ECONOMIC GROWTH

- විවිධත්වය සහ ඇතුළත් වර්ධනය

10 REDUCED INEQUALITIES

- සේවක වයස් විවිධත්වය පවත්වා ගැනීම.
- ශ්‍රම බලකාය තුළ ශක්තිමත් ප්‍රාදේශීය නියෝජනය පවත්වා ගැනීම
- බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ විනිවිදභාවය සහ අපක්ෂපාතිත්වය

ප්‍රධාන සංඛ්‍යාලේඛණ වැදගත් සිදුවීම්

පුහුණු වැඩසටහන්

	2022	2021	2020	2019	2018
වැඩසටහන් ගණන	97	70	85	186	163

වර්ගය අනුව කාර්යමණ්ඩලය

	2022	2021	2020	2019	2018
ස්ථිර කාර්ය මණ්ඩලය	2,513	2,535	2,517	2,527	2,511
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය	130	232	109	133	192
එකතුව	2,643	2,767	2,626	2,660	2,703

වයස් විශ්ලේෂණය

වයස් කාණ්ඩය	පිරිමි	කාන්තා	%
18-24	17	8	0.9%
25-29	157	171	12.4%
30-34	212	221	16.4%
35-39	262	156	15.8%
40-44	266	73	12.8%
45-49	208	142	13.2%
50-54	238	291	20.0%
55 සහ ඉහළ	82	139	8.4%
එකතුව	1,442	1,201	–

සේවා විශ්ලේෂණ

SLIC හි සේවය කළ වසර ගණන	පිරිමි	කාන්තා	%
0-5	407	236	24.3%
6-10	193	130	12.2%
11-15	391	227	23.4%
16-20	209	74	10.7%
21 සහ ඉහළ	242	534	29.4%
එකතුව	1,442	1,201	–

ශ්‍රේණිය සහ ස්ත්‍රීපුරුෂභාවය අනුව සේවා නියුක්තිය

	ගණන			සංයුතිය %	
ශ්‍රේණිය	පිරිමි	කාන්තා	එකතුව	පිරිමි	කාන්තා
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ	74	17	91	81%	19%
කළමනාකරණ	254	105	359	71%	29%
සහය කළමනාකරු	84	47	131	64%	36%
විධායක	313	494	807	39%	61%
ලිපිකාර	370	497	867	43%	57%
තාක්ෂණික	167	0	167	100%	0%
ලිපිකාර නොවන	108	15	123	88%	12%
සුළු සේවක	72	26	98	73%	27%
එකතුව	1,442	1,201	2,643	55%	45%

මානව සම්පත්වල මනා පරිචයන්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මූලික මූලධර්ම පිළිබඳ ILO ප්‍රකාශනය සහ එක්සත් ජාතීන්ගේ ගෝලීය බලපෑම්වලට අනුකූලව සාධාරණ රැකියා පරිචයන් ක්‍රියාත්මක කරයි. මෙම සම්මුති දෙක මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මත පදනම් වේ. ඉහත මූලධර්ම අනුගමනය කරමින්, අපගේ සේවකයින් සඳහා අභිප්‍රේරණය කරන සහ ලාභදායී උපකාරී වැඩකරන පරිසරයක් අපි නිර්මාණය කරමු.

මානව ප්‍රාග්ධනය

ඉහත කරුණු අනුව, අපගේ මානව සම්පත් ප්‍රතිපත්ති සහ පරිචයන් පහත මූලධර්මවලින් මෙහෙයවනු ලැබේ.

ප්‍රතිපත්තිය	ක්‍රියාත්මක කිරීම
වෙනස ලෙස නොසැලකීම සහ සමාන රැකියා අවස්ථාව	බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැනීම දක්වා, වෙනස්ව නොසැලකීමේ ආකල්පයක් අපි පවත්වා ගන්නා අතර රැකියා චක්‍රයේ විවිධ අවස්ථාවලදී සමාන අවස්ථාව අපි දිරිගන්වමු.
විවිධත්වය සහ ඇතුළත් කිරීම ප්‍රවර්ධනය	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විවිධත්වය සහ ඇතුළත් සේවා ස්ථානයක් නිර්මාණය කිරීමට අරමුණු කරන අතර එහි දී සියලුම සේවකයින්ට ජාතිය, සමාජ පසුබිම, ස්ත්‍රීපුරුෂභාවය, ආගම, වයස, නොසලකා හෝ වෙනත් නීතියෙන් අරක්ෂිත තත්ත්වයන් අනුව සාධාරණව සහ සමානව සලකනු ලැබේ. අපි හැකි සෑම අවස්ථාවකදීම ආබාධිත පුද්ගලයින් සඳහා වෘත්තීය අවස්ථා ලබාදීමට උත්සාහ ගනිමු.
ළමාශ්‍රමය ඉවත්කිරීමට සහයවීම සහ බලාත්කාර ශ්‍රමය සහ අනිවාර්ය ශ්‍රමය තුරන් කිරීම	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වගකීම්සහගත පුරවැසියෙක් ලෙස ළමාශ්‍රමයල බලාත්කාර ශ්‍රමය හෝ අනිවාර්ය ශ්‍රමයට එරෙහිව දැඩි ප්‍රතිපත්තියක් ඇත.
සේවකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව ප්‍රමුඛකිරීම	අපගේ ක්ෂේත්‍රයේ ස්වභාවය සලකා බැලීමේදී, සේවකයින් යම් ප්‍රධාන සෞඛ්‍ය සහ ආරක්ෂක අවදානම්වලට නිරාවරණයවීම සිදු නොවේ. එසේ වුවත්, අපගේ සේවකයින් ආරක්ෂිත සහ සුරක්ෂික පරිසරයක කටයුතු කරන බව අපි සහතික වෙමු. අභ්‍යන්තර සහ බාහිර බොහෝ පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් අවදානම් තක්සේරු කිරීම් සිදු කෙරේ. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සෞඛ්‍ය සහ ආරක්ෂක අවදානම් නිරන්තරව තක්සේරු කරන අතර අවශ්‍ය පරිදි වැලැක්වීමේ සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. මානව සම්පත් දෙපාර්තමේන්තුව, වෙනත් දෙපාර්තමේන්තු සහ අදාළ බලධාරීන්ගේ සහය ඇතිව සේවකයින් අතර සෞඛ්‍ය සහ ආරක්ෂක දැනුවත්කම වැඩි කිරීමට අවශ්‍ය පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ලබා දේ. අපට විස්තරාත්මක සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකව ඇති අතර ඒ තුළින් සේවා ස්ථාන සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ පරිපාලනය සඳහා විධිමත් රාමුවක් ලබා දේ.
සදාචාරය සහ අවංකකම නගාසිටුවීම	අපගේ සේවකයින් සදාචාර සහ වෘත්තීමයභාවය පිළිබඳ ඉහළම ප්‍රමිති නගා සිටුවමින් ඔවුන්ගේ රාජකාරි ඉටුකරනු ඇතැයි අපි අපේක්ෂා කරමු. අභ්‍යන්තර සහ බාහිර සියලුම පාර්ශවකරුවන් සමඟ කටයුතු කිරීමේදී ඔවුන් මෙය තහවුරු කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු. අපට චර්යා සංග්‍රහයක් ක්‍රියාත්මකව පවතින අතර සියලුම සේවකයින් එය දැනගත යුතු අතර අවබෝධ කර ගත යුතුය. යම් කඩවීම් ඇත්නම්, වරදේ බරපතලකම අනුව අදාළ සේවකයාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ. සියලුම සේවකයින් කිසිදු ව්‍යාතිරේකයක් නොමැතිව ඔවුන්ගේ පත්වීම් ලිපිවල නියමයන් සහ කොන්දේසිවලට අනුකූලවීම අපේක්ෂා කෙරේ.
සේවක මැසිවිලි මෙහෙයවීමට පැහැදිලි ක්‍රියාපටිපාටියක්	සේවක දුක්ගැනවිලි හැකිතාක් දුරට විසඳීම, දිගුකාලීන ආරවුල් හෝ අර්බුදකාරී තත්ත්වයන් මඟහරවා ගැනීම, චිත්ත ධෛර්යය, තෘප්තිය සහ කැපවීම වැඩි කිරීම සහ වඩා හොඳ අවබෝධයක් සමඟ සාමකාමී සේවා යෝජක-සේවක සබඳතා සහතික කිරීම යන අරමුණු ඇතිව, සේවක දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සතුව පැහැදිලි ක්‍රියා පටිපාටියක් ඇත. විස්තරාත්මක මැසිවිලි කළමනාකරණ යාන්ත්‍රණයක් ක්‍රියාවට නංවා ඇති අතර යම් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවකයෙක්ට පලිගැනීම් පිළිබඳ කිසිදු බියක් නොමැතිව යම් සේවයට අදාළ පැමිණිල්ලක් වාර්තා කළ හැකිය. මෙම ප්‍රතිපත්තියට මැසිවිල්ලක් සිදුකරන ආකාරය පිළිබඳ තොරතුරු මෙන්ම සේවකයා සෘජුව හෝ වක්‍රව සඳහන් කළ යුතු මැසිවිල්ල පිළිබඳ තොරතුරු ඇතුළත්ය. නිල මැසිවිල්ලට අමතරව මැසිවිල්ල තුළ පුද්ගලික ඒවාද ඇතුළත් කළ හැකිය. මැසිවිලි නිරාකරණ කමිටුවේ කාර්යයන්, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් අනු කමිටුවේ කාර්යභාරය, මෙන්ම මැසිවිල්ල නිරාකරණය කරන කාලරාමුව ඇතුළුව මැසිවිලි නිරාකරණ ක්‍රමයේ බොහෝ පියවර මෙම ප්‍රතිපත්තියෙන් විස්තර කරයි. පුද්ගලයෙක් හෝ යම් කණ්ඩායමක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, මෙම සම්මත ක්‍රියාපටිපාටිය අපි අනුගමනය කරමු.

බඳවාගැනීම සහ රඳවා ගැනීම

ප්‍රතිපත්තිය	ක්‍රියාත්මක කිරීම
බඳවාගැනීමේ උපායමාර්ගය	බඳවා ගන්නා සියලුම අයට අවශ්‍ය දැනුම, කුසලතා, පළපුරුද්ද, රුචිය සහ ආකල්ප ඇති බව සහතික කිරීමට බඳවාගැනීමේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ක්‍රමවත් කර ඇත.
	අභ්‍යන්තර අයදුම්පත් බඳවා ගැනීමේදී පළමු තෝරාගැනීම ලබා දෙන අතර, අභ්‍යන්තරව සුදුසු අය සොයාගත නොහැකි අවස්ථාවලදී පමණක් බාහිර අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.
	අලුතින් බඳවා ගන්නා අයට සමාගම සඳහා ඔවුන් සුදුසුද යන්න පරීක්ෂා කිරීම සඳහා අභියෝග්‍යතා පරීක්ෂණ මාලාවකට මුහුණ දීමට සිදු වේ.
	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විෂය කරුණ පිළිබඳ ප්‍රවීනයින්ගෙන් හා ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයින්ගෙන් සමන්විත වේ. කෙසේවෙතත්, මණ්ඩලයේ සංයුතිය තනතුර සහ අවශ්‍යතාවය පත පදනම් වී වෙනස් විය හැකිය.
	බඳවාගැනීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය සහ අපක්ෂපාතිත්වය පවත්වා ගැනීම සඳහා, අපගේ බඳවාගැනීමේ ප්‍රතිපත්තිය අනුව සෑම සම්මුඛ පරීක්ෂණයකදීම මානව සම්පත් දෙපාර්තමේන්තුවේ නියෝජනයක් අවශ්‍යම වේ. ඊට අමතරව, සම්මුඛ පරීක්ෂණ පූර්ව නිශ්චිත ඇගයීම් ප්‍රමිති මාලාවක් අනුගමනය කරයි.
	සියලුම නව බඳවා ගැනීම්වලදී ඔවුන් සමාගම සමඟ හුරුවීම සඳහා සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සංස්කෘතිය සමඟ ඒකාබද්ධවීමට සහයවන ප්‍රාරම්භක පුහුණුව සහ මූලික වැඩසටහනක නියුක්තවීම අත්‍යවශ්‍යය.
රඳවාගැනීමේ උපායමාර්ගය	ශ්‍රී ලංකාවේ රක්ෂණ අංශය වඩාත් තරඟකාරී වන බැවින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි තරඟකාරී වාසිය සන්නාම පිළිගැනීම පවත්වා ගැනීමට දක්ෂ පුද්ගලයින් රඳවා ගැනීම වඩාත් තීරණාත්මක බවට පත්ව ඇත.
	දක්ෂ පුද්ගලයින් රඳවා ගැනීම සඳහා අපගේ උපායමාර්ගය ක්‍රමානුකූල අනුප්‍රාප්ත සැලැස්මක් මත පදනම් වන අතර, ඒ මගින් හඳුනාගත් පුද්ගලයින් සමාගමේ අනාගත නායකයින් බවට සංවර්ධනය කිරීමට අරමුණු කරමු.
	අපගේ කාර්යසාධන ඇගයීම් ක්‍රමයේ (PAS) ප්‍රතිඵල මත පදනම් වී "ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් දක්ෂතා සංචිතය" හි ඇතුළත් කිරීම සඳහා විශිෂ්ඨ කාර්යසාධකයින් තෝරා ගනු ලැබේ.
	"ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් දක්ෂතා සංචිතය" හි අරමුණ වන්නේ සමාගම තුළ විස්තරාත්මක අනුප්‍රාප්ත සැලැස්මක් නිර්මාණය කිරීම වන අතර ඒ තුළින්, විශේෂයෙන් ප්‍රධාන තනතුරුවල සිදුවන පුරප්පාඩු පිරවීමට සෑමවිටම සුදුසු පුද්ගලයින් සිටින බව සහතික කරයි.
	"ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් දක්ෂතා සංචිතය" හි අපේක්ෂකයින්ට ඔවුන්ගේ මෘදු සහ තාක්ෂණික දැනුම ශක්තිමත් කර ගැනීමට විවිධ සංවර්ධන වැඩසටහන්වලට සහභාගි වීමට සහ ඔවුන්ගේ නායකත්ව සහ කළමනාකරණ හැකියාවන් වැඩි කරන උපදේශන වැඩසටහන්වල ප්‍රතිලාභ ලබා ගත හැකිය.

සේවක තෘප්තිය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිලාභ

සාධාරණ පාරිශ්‍රමිකය

දක්ෂ සේවකයින් රඳවා ගැනීම සඳහා, වෙළෙඳපොල සමඟ ගැලපෙන පාරිශ්‍රමික සහ වෙනත් ප්‍රතිලාභ සැපයිය යුතුව ඇත. අපගේ සේවකයින්ට අදාළවන සියලුම ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතා අපි අනුගමනය කරමු.

ප්‍රතිලාභ යෝජනා ක්‍රම

තවද, අපගේ සේවකයින්ට පහත සඳහන් ප්‍රතිලාභ භුක්ති විඳීමට සහ "සතුටුදායක සේවකයින් උසස් නිෂ්පාදන හා සේවා ලබා දෙනු ඇත" යන මූලධර්මය මත පදනම් වී ඔවුන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කර ගැනීමට අපි ඉඩ දී ඇත.

වැඩබිමේ ප්‍රතිලාභ	
නම්‍යශීලි වැඩ සූදානම	විශේෂයෙන් රට බලශක්ති අර්බුදවලට මුහුණ දෙන කාලසීමාවල දී අපි නම්‍යශීලී වැඩකරන වේලාවන් හඳුන්වා දුන්නෙමු.
පවුලේ නිවාඩු	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සිය සේවකයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම ආරක්ෂා කිරීමට නීතිවලට අනුකූලව සහ නෛතික අවශ්‍යතා ඉක්මවා යමින් සියලුම කම්කරු නීති දැඩිව අනුගමනය කරයි. මේ සම්බන්ධයෙන්, අපගේ සියලුම කාන්තා සේවිකාවන් ප්‍රසූත නිවාඩු ආඥාපනත යටතේ ප්‍රසූත නිවාඩුවලට හිමිකම් ලබයි. ප්‍රසූත නිවාඩු ආඥාපනතේ නියමයන්ට අමතරව වැටුප් රහිත අමතර මාස දෙකක් සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අවසර ලබා දේ. පීතෘ නිවාඩු සඳහා ඉල්ලීම් ද සලකා බලන අතර එම නිවාඩු ගැනීමට ද අවසර දේ.
ආහාරපාන	අපගේ කාර්ය මණ්ඩලයට අනුග්‍රාහක මිල ගණන්වලට විවිධ ආහාරපාන රාශියක් ආපනශාලාවෙන් ලබා දේ.
සුභසාධනය	අපට ශුභසාධන අලෙවිහලක් ඇති අතර අනෙකුත් සුභසාධන කටයුතු සපයන අතරම විවිධ අඩු පිරිවැය භාණ්ඩ අලෙවි කරයි.

සෞඛ්‍ය සඳහා ප්‍රතිලාභ	
නිරෝගිකම	අපගේ සෞඛ්‍ය පහසුකම්වලට සුදුසුකම් සහිත උපදේශකවරයෙක් සහිත අංග සම්පූර්ණ උපකරණ සහිත ව්‍යායාම් ශාලාවක් ඇතුළත් වන අතර උපදේශක විසින් සේවකයින්ගේ කායික යෝග්‍යතාව පවත්වා ගැනීමට සහය වේ.
	සිය මානසික සහ ආධ්‍යාත්මික යහපැවැත්ම පවත්වා ගැනීමට කැමති අයට සහය වීම සඳහා සතිපතා යෝග පන්ති පවත්වනු ලබයි.
සෞඛ්‍යාරක්ෂාව	සෞඛ්‍ය සහ නිරෝගිකම පිළිබඳ වැඩසටහන් මගින් සෞඛ්‍ය කරුණු පිළිබඳ සේවකයින්ට අධ්‍යාපනය දෙන අතර උපකාරී වැඩ පරිසරයක් නිර්මාණය කරයි.

මූල්‍ය ආරක්ෂාව සඳහා ප්‍රතිලාභ	
වෛද්‍ය ආවරණය	සමාගමේ වෛද්‍ය රක්ෂණය මගින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල් ආවරණය කරයි.
අධ්‍යාපනික දිරිගැන්වීම්	අධ්‍යාපන ගාස්තු මානව සම්පත් ප්‍රතිපත්තිය අනුව ප්‍රතිපූරණය කෙරේ.

ජීවන රටා ප්‍රතිලාභ	
වැඩ ජීවිත සමබරතාව	අපගේ සේවකයින්ට දේශීය ප්‍රබන්ධ මෙන්ම විදේශීය ප්‍රබන්ධ සහිත පොත් 1,800ක පමණ පුස්තකාලයක් ඇත. ප්‍රබන්ධ නොවන අංශයට රක්ෂණය, කළමනාකරණය, මූල්‍ය, අලෙවිකරණය, සහ විකුණුම්වලට අදාළ පොත් ඇතුළත්ය. අපගේ කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් නිවාඩු හිමිකම් ඇති අතර වාර්ෂික හමුවේදී විනෝද විය හැකිය.
සංචාර සහ නවාතැන්	සෑම සේවකයෙකුටම නුවරඑලිය, අනුරාධපුරය සහ කතරගම නිවාඩු නිකේතන භාවිතා කිරීමේ අවස්ථාව ඇති අතර මේ සියල්ල නවීන පහසුකම්වලින් සමන්විත වන අතර මනාව පුහුණු කාර්ය මණ්ඩලයකින් යුක්ත වේ.
සේවකයින්ගේ පවුලේ සාමාජිකයින් සඳහා සහන	සේවකයින්ගේ ළමුන්ට අධ්‍යාපනික සහය ලැබෙන අතර එයට 5 වසර ශිෂ්‍යත්වයට ඉදිරිපත්වන සිසුන් සඳහා සම්මන්ත්‍රණ ඇතුළත්ය.
	සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් මරණ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබයි. තවද, අපි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි තේමාව වන "පියෙකු මෙන් මවක මෙන්" අනුව අවශ්‍ය අවස්ථාවේදී සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙත චිත්තවේගී සහ මානසික සහය ලබා දෙමු.

ශ්‍රමබලකායේ ඵලදායිතාව වැඩි කිරීමට වෘත්තීය සංවර්ධනය

අපගේ පුහුණු සහ සංවර්ධන උපායමාර්ගය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වර්ධනයට සහය වන ආකාරයෙන් සේවකයින්ගේ දක්ෂතා සහ නිපුණතාවයන් වර්ධනය කිරීමට මෙහෙයවනු ලබයි. කාර්යසාධණ ඇගයීම් ක්‍රමය මගින් හඳුනාගත් පුහුණු අවශ්‍යතා ප්‍රමුඛ කිරීමට, අපි මනාව ව්‍යූහගත පුහුණු සහ සංවර්ධන රාමුවක් ක්‍රියාත්මක කර ඇත. පුහුණු ආයෝජනය මගින් අවශ්‍ය දක්ෂතා සහ හැකියාවන් සංවර්ධනය අනුව අපේක්ෂිත ප්‍රතිඵල ලබා දෙන බව සහතික කිරීමට අපි නිරන්තරව සහභාගිත්වය සහ ප්‍රගතිය තක්සේරු කරමු.

පුහුණු සහ සංවර්ධනය තුළ ආයෝජනය

වර්ගය	2022 රු.	2021 රු.	2020 රු.	2019 රු.	2018 රු.
අභ්‍යන්තර පුහුණුව	2,080,506	477,840	302,824	947,986	842,144
බාහිර පුහුණුව	1,602,150	2,769,290	556,229	1,988,299	5,149,425
සම්මන්ත්‍රණ	909,200	365,000	25,500	749,754	1,476,997
විදේශීය පුහුණුව	8,176,832	–	–	15,580,659	8,928,357
රක්ෂණය සහ වෘත්තීය අධ්‍යාපනය	2,019,958	4,182,678	27,134	3,900,245	3,976,954
වෘත්තීය සාමාජිකත්ව	1,642,958	1,981,787	1,583,682	1,670,787	3,912,257

අනුප්‍රාප්ත සැලැස්ම සහ දක්ෂතා සංචිතය කළමනාකරණ සැලැස්මේ කොටසක් ලෙස, එක් එක් දෙපාර්තමේන්තුවෙන් අනාගත නායකයින්ගේ නායකත්ව කුසලතා ඉහළ නැංවීමට විශේෂ පුහුණු මොඩියුලයක් අප සතුය. මෙය ආයතනයේ උපායමාර්ගික ව්‍යාපාර පරමාර්ථවලට දායකවෙන වෙනත් ව්‍යාපෘතියකි.

තමාට අදාළ වැඩ ක්ෂේත්‍රයට අගය එකතුකළ හැකි ආකාරයේ වැඩිදුර අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීමට අපේක්ෂා කරන සේවකයින්ට මූල්‍ය සහය ලබාදීමට වෘත්තීය සංවර්ධන ප්‍රතිපූරණ යෝජනා ක්‍රමයක් අපි හඳුන්වා දී ඇත. මේ මගින් ඔවුන් නිරන්තර පදනමක් මත තම දක්ෂතා උසස් කර ගැනීමට සහ සමාගමට ප්‍රතිලාභ ලබාදීමට ඔවුන්ට අවස්ථාව පිරිනමයි. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අඛණ්ඩ වෘත්තීය වර්ධනය දිරිගැන්වීමට වෘත්තීය ආයතන සාමාජිකත්ව වියදම් ද අපි ප්‍රතිපූරණය කරයි.

විභාග වියදම් ප්‍රතිපූරණය

	2022 රු.	2021 රු.	2020 රු.	2019 රු.	2018 රු.
සේවකයින් මත මුළු ආයෝජනය	5,413,208	3,247,130	3,050,559	3,926,293	2,962,147

පුහුණු වැඩසටහන්

	2022	2021	2020	2019	2018
වැඩසටහන් ගණන	97	70	85	186	163

ප්‍රාරම්භක වැඩසටහන්

	2022	2021	2020	2019	2018
වැඩසටහන් ගණන	2	2	–	3	8

පිළිගැනීම් සහ ප්‍රදාන

ඉහළ තරඟකාරී ක්ෂේත්‍රයක සමාගමක් ලෙස, කාර්යසාධනය මත මෙහෙයවීම අවශ්‍ය වන අතර අපගේ ඇගයීම් සහ ප්‍රදාන ක්‍රමය ඒ අනුව හැඩ ගැසීමද අවශ්‍යය. සාර්ථක කාර්යසාධන ඇගයීම ක්‍රමය (PAS) අරමුණු දෙකක් එනම්, ආයතනික උපායමාර්ගික පරමාර්ථ, මෙන්ම සේවක සංවර්ධනය ප්‍රවර්ධනය අත්කර ගැනීම සඳහා පදනම ලබාදෙන බවත් අපි විශ්වාස කරමු. "විශිෂ්ඨත්වය සඳහා උත්සාහගැනීම" යන දර්ශනය මත ගෙඩ නගන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කාර්යසාධන ඇගයීම ක්‍රමය මගින් අපගේ සේවකයින්ගේ කාර්යසාධනය සාධාරණ, විනිවිද සහ පිළිගතහැකි ආකාරයෙන් ඇගීමට ලක් කරයි. සියලුම ස්ථිර සේවකයින් අර්ධ-වාර්ෂික ස්වයං ඇගයීමක් සම්පූර්ණ කිරීම අවශ්‍ය වන අතර, එහිදී මෙම ක්‍රියාවලියේ කොටසක් ලෙස මූල්‍ය වසර ආරම්භයේ දී නියමිත පූර්ව මූලික කාර්යසාධන දර්ශක අනුව තමාගේ කාර්යසාධනය ශ්‍රේණිගත කෙරේ.

මානව ප්‍රාග්ධනය

මෙයට පසු කාර්යසාධන ඇගයීමේ රැස්වීමක් පවත්වන අතර එහිදී සේවකයින්ට සිය කාර්යසාධනය, පුහුණු අවශ්‍යතා, සහ ඔවුන්ගේ දිගුකාලීන වෘත්තීය අභිලාෂයන් තම කළමනාකරු සමඟ ආමන්ත්‍රණය කිරීමට අවස්ථාව ඇත. කාර්ය සාධන ඇගයීමේ 2ට අඩු ශ්‍රේණිගත කිරීමක් සහිත සේවකයින්ට ඔවුන්ගේ අධීක්ෂකයින් සමඟ සහයෝගයෙන් මානව සම්පත් විසින් ස්ථාපිත ගලපනලද තනිපුද්ගල සංවර්ධන සැලසුම් තුළින් යම් බාධා ජයගැනීමට සහය ලබා දේ.

PAS අපගේ HRIS සමඟ සම්පූර්ණයෙන් සම්බන්ධ කර ඇති අතර, ඒ තුළින් සේවකයින්ට සිය ප්‍රගතිය පසු විපරම් කිරීමට ඉඩදෙන අතර රේඛීය කළමනාකරුවන්ට වසර පුරා තම කණ්ඩායමේ කාර්යසාධනය ඇගයීමට ඉඩ ලබා දෙමින් සියලුම සේවකයින්ට සහ කළමනාකරුවන්ට හවුල් වී විශිෂ්ඨත්වය සඳහා උත්සාහ ගැනීමට දිරි ගන්වයි.

වෙනත් වැදගත් සංඛ්‍යාලේඛණ

කලාපය අනුව සේවකයින්

කලාපය	ගණන
මධ්‍යම	169
නැගෙනහිර	48
උතුරු මැද	75
උතුරු	53
රත්නපුර	89
දකුණු 1	150
දකුණු 2	121
බස්නාහිර ඉහළ	150
ඌව	99
වයඹ 1	118
වයඹ 2	81
බස්නාහිර 1	103
බස්නාහිර 2	61
බස්නාහිර 3	82
බස්නාහිර 4	54
ප්‍රධාන කාර්යාලය	1,190
එකතුව	2,643

සේවකයින් බඳවා ගැනීම

වයස් කාණ්ඩය	පිරිමි	කාන්තා	එකතුව	%
18-24	3	0	3	7%
25-29	13	2	15	33%
30-34	6	1	7	16%
35-39	5	0	5	11%
40-44	11	0	11	24%
45-49	3	1	4	9%
50-54	0	0	0	0%
55 සහ ඉහළ	0	0	0	0%
එකතුව	41	4	45	

සේවක පිරිවැටුම

වයස් කාණ්ඩය	පිරිමි	කාන්තා	එකතුව	%
18-24	9	9	18	14%
25-29	16	13	29	22%
30-34	16	9	25	19%
35-39	10	4	14	11%
40-44	9	3	12	9%
45-49	7	1	8	6%
50-54	0	0	0	0%
55 සහ ඉහළ	5	19	24	18%
එකතුව	72	58	130	

සේවක රඳවා ගැනීමේ අනුපාතය

	2022	2021	2020	2019	2018
සේවක සංඛ්‍යාව	**2,643**	2,767	2,626	2,660	2,703
සේවක රඳවාගැනීමේ අනුපාතය %	**95.4%**	96.2%	98.0%	95.2%	97.3%

අනාගත දැක්ම

- **කාර්යසාධනය මත පදනම් සංස්කෘතිය**

  කාර්යසාධනය පදනම් සංස්කෘතියක් සම්පූර්ණයෙන් ඇති කිරීමට අපි අපේක්ෂා කරන අතර ඒ තුළින් සමස්ථ ආයතනය ආයතනික සාර්ථකත්වය ඉටු කිරීමට සහ අත්කර ගැනීමේ අභිප්‍රේරණයක් මගින් මෙහෙයවනු ලබයි.

- **අනුප්‍රාප්ත සැලැස්මේ ක්‍රියාවලිය උසස් කිරීම**

  ආයතනය තුළ තීරණාත්මක තනතුරු හඳුනා ගනිමින් සහ එම පුරප්පාඩු පිරවීමට පුද්ගලයින් පුහුණු කිරීම මගින් දක්ෂතා සංචිතය සංවර්ධනය කරමින් වැඩිදුර වර්ධනයන් සිදු කිරීමට අපි අපේක්ෂා කරමු.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය



සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනයට විවිධ පාර්ශවකාර කණ්ඩායම් සමඟ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ඇති සම්බන්ධතා සහ ජාල ඇතුළත් වේ. පාර්ශවකරුවන් යන්නට වෙනත් අය අතර ගනුදෙනුකරුවන්, හවුල්කරුවන්, සැපයුම්කරුවන්, නියාමකයින්, ඇතුළත්ය. මෙම පාර්ශවයන් සමඟ අපට ඇති සම්බන්ධතා ආයතනය සහ පාර්ශවකරුවන් සඳහා වටිනාකම නිර්මාණය කරයි. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෙම පාර්ශවකාර කණ්ඩායම් සමඟ ශක්තිමත් සම්බන්ධතා ගොඩ නගන අතර එය අනෝන්‍ය වශයෙන් ප්‍රතිඵලදායී විශ්වාසය මත පදනම් සම්බන්ධතා නිර්මාණය කරයි.

ප්‍රධාන සංඛ්‍යාලේඛණ සිදුවීම්

	2022 %	2021 %	වෙනස
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි වෙළෙඳපොල කොටස (ජීවිත ව්‍යාපාරය)	15.4%	17.6%	-2.3%
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙළෙඳපොල කොටස (ජීවිත නොවන ව්‍යාපාරය)	17.6%	20.7%	-3.1%

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

SDG'S වෙත දායකත්වය

1 NO POVERTY
- විවධාංගීකරණය කළ අවදානම් ආරක්ෂාව සහ ජීවිත ආයෝජන විසඳුම්

3 GOOD HEALTH AND WELL-BEING
- සෞඛ්‍ය අවශ්‍යතා සඳහා සම්පූර්ණ ආවරණය

4 QUALITY EDUCATION
- නියෝජිත වෘත්තීය ගමන්මඟ

8 DECENT WORK AND ECONOMIC GROWTH
- ක්‍රමානුකූලව මෙහෙයුම් නියෝජිත සංවර්ධන ආකෘතිය


9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
- නව්‍යකරණයට ගලපන ලද රක්ෂණ විසඳුම්
- ජංගම සහ වෙනත් ගෙවීම් විසඳුම්
- දෙමුහුන් මාර්ග

10 REDUCED INEQUALITIES
- මිල අධික නොවන විස්තීර්ණ "සැමට රක්ෂණය" සංකල්පය

11 SUSTAINABLE CITIES AND COMMUNITIES
- "Motor Plus Road Safety Heroes"
- ළමුන් සඳහා "මිනිමුතුලන්තය"
- "Rising to New Norm" දැනුවත් කිරීමේ වැඩසටහන

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION
- ශ්‍රී ලංකාව පුරා මිලියන 2.26ක ගනුදෙනුකරුවන්
- ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් – අංක 1 මෝටර් රථ රක්ෂණය
- විශේෂ ගනුදෙනුකාර පැමිණිලි කළමනාකරණ ක්‍රමය

17 PARTNERSHIPS FOR THE GOALS
- මොබිටෙල්, PB, BOCS ලංකා හොස්පිට්ල්ස් සමඟ හවුල්කාරත්වයන් – ගෙවීම් විසඳුම් ශක්තිමත් කිරීම
- SLMA සමඟ උපායමාර්ගික හවුල්කාරත්වයන් – සෞඛ්‍ය සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම
- ඔපුස්හිමියන්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා වෝග් ජුවලර්ස් සමඟ සම්බන්ධය




ගනුදෙනුකාර ප්‍රාග්ධනයට වටිනාකම එකතු කිරීම

වටිනාකම නිර්මාණය කරා ගනුදෙනුකාර ප්‍රාග්ධනය මෙහෙයවීම

වෙළෙඳපලට තවදුරටත් විනිවිද යාම සහ වෙළෙඳපල කොටස වැඩි කිරීම, අපගේ ගනුදෙනුකරුවන් , ඔවුන්ගේ අවශ්‍යතා, වුවමනාවන් සහ මනාපයන් පිළිබඳ අපගේ අවබෝධය මත රඳා පවතී. වෙළෙඳපොලේ තරඟ කිරීමට, අප විසින් සපයනු ලබන ගනුදෙනුකාර අත්දැකීම් තුළ අපි අපගේ තරඟකරුවන් අභිබවා යා යුතුය. අපගේ ආදායම් ප්‍රවාහයන් වැඩි කර ගැනීම සඳහා, අපගේ දැනට සිටින ගනුදෙනුකරුවන් රඳවා ගැනීමට අමතරව නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගත යුතුය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවාදායකයන් සඳහා අපගේ කැපවීම තහවුරු කිරීමට පහත මාර්ගෝපදේශ භාවිතා කරයි.


විවිධ සහ විශේෂිත නිෂ්පාදන කළඹ

අපි පුළුල් පරාසයක අවදානම් ආරක්ෂණ සහ ජීවිත ආයෝජන නිෂ්පාදන පිරිනමන්නෙමු. පුද්ගලයන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ක්ෂුද්‍ර ව්‍යවසායකයින්, රාජ්‍ය ආයතන සහ ප්‍රධාන සමාගම් ඇතුළුව අපගේ ගනුදෙනුකරුවන්ගේ පැතිකඩ සමානව විවිධ වේ. මෙය "පියෙකු මෙන් - මවක මෙන්" යන තේමාව සමඟ සිටීමට ඇති පොරොන්දුවට අනුකූල වේ. අපගේ නිෂ්පාදන සුවිශේෂී වන අතර සෑම එකක්ම සියලුම ශ්‍රී ලාංකිකයන් සඳහා මිල අඩු සහ විස්තීර්ණ රක්ෂණයක් ලබා දෙන රටේ ප්‍රමුඛතම සැපයුම්කරු වීම සඳහා අපගේ සහතික කළ වටිනාකම් කොටස මූර්තිමත් කරයි.


SLIC
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
පියයකු මෙන් මවක මෙන්
ජීවිත
ආරක්ෂක විසඳුම්
ආයෝජන විසඳුම්
සෞඛ්‍ය රක්ෂණ විසඳුම්
අධ්‍යාපනික විසඳුම්
විශ්‍රාම රක්ෂණ විසඳුම්
Sri Lanka Insurance Divi Thilina Protection Plan
Sri Lanka Insurance Janadiri Two year relief plan
Sri Lanka Insurance EarlyCash
Sri Lanka Insurance SPEED INVESTMENT
Sri Lanka Insurance WEALTH PLUS Limited Premium Plan
Sri Lanka Insurance YASAS
SLIC Comprehensive Health Plus
Sri Lanka Insurance Comprehensive The Health and Life Insurance Cover for Diabetics
Sri Lanka Insurance Mini Muthu Children's Plan
Sri Lanka Insurance Mini Muthu Dayada
Sri Lanka Insurance Mini Muthu Parithyaga
Sri Lanka Insurance EarlyCash
SRI LANKA INSURANCE SCHOOL FEE PROTECTOR
Sri Lanka Insurance Freedom RETIREMENT PLAN
Sri Lanka Insurance Freedom LIFESTYLE PLUS RETIREMENT PLAN

ජීවිත කළඹ

නිෂ්පාදන වර්ගය	ඉලක්කගත ගනුදෙනුකරුවන්	විසඳුම්	විස්තරය
ආරක්ෂාව/ ආයෝජනය	සිය ආවරණය තුළින් ආරක්ෂාව සහ ආයෝජන ප්‍රතිලාභ යන දෙකම භුක්තිවිඳීමට කැමති ගනුදෙනුකරුවන්	දිවි තිළිණ ආරක්ෂක සැලැස්ම	මෙම නිෂ්පාදන ක්ෂේත්‍රයේ ඉහළම ප්‍රතිලාභ සමඟ විස්තීර්ණ ආරක්ෂාව සපයන අතර ගනුදෙනුකාර අවශ්‍යතාවන්ට අනුව ගැලපිය හැකිය.
		ස්පීඩ් ආයෝජන සැලැස්ම	
		පූර්ව මුදල් අත්තිකාරම් ප්‍රතිලාභ සැලැස්ම	
		ස්වර්ණ ධජ	
		ජන දිරි – වසර දෙකේ සහන සැලැස්ම	
		වෙල්ත් ප්ලස්	
විශ්‍රාම සැලසුම්	විශ්‍රාම අත්තිකාරම් සඳහා සැලැස්මට කැමති ගනුදෙනුකරුවන්	ෆ්‍රීඩම් විශ්‍රාම සැලැස්ම	මෙම විසඳුම් අතිරේක ප්‍රතිලාභ රාශියක් සමඟ ඔප්පු හිමියාගේ ස්වර්ණමය වයස විනෝදවීමට සහතික කළ විශ්‍රාම අරමුදලක් ගොඩ නැගීමට සහය වේ.
		ෆ්‍රීඩම් තනි වාරික සැලැස්ම	
		ෆ්‍රීඩම් ලයිෆ් ස්ටයිල් ප්ලස්	
අධ්‍යාපනික සැලැස්ම	ළමුන් සිටින ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ උපතේ සිට උසස් අධ්‍යාපනය අවසන්කිරීම දක්වා ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකරයි.	මිනිමුතු දායාද	අධ්‍යාපනික සැලැසුම් ළමයාගේ අනාගත අධ්‍යාපනික සැලැසුම් ආරක්ෂා කිරීමට සහ ළමයාගේ බාදාරහිත අධ්‍යාපනය සහතික කිරීමට විසතීර්ණ ආරක්ෂාවක් සැපයීමට අරමුදල් ගොඩ නැගීමට සහය වේ.
		මිනිමුතු ළමා ඔප්පුව	
		මිනිමුතු පරිත්‍යාග	
		ස්කුල් ෆී ප්‍රොටෙක්ටර්	
සෞඛ්‍යය	බරපතල ශල්‍යකර්මවලදී ආරක්ෂාව සොයන පොදු ජනතාව	ශල්‍යකර්ම සැලැස්ම	පූර්ව නිශ්චිත උපරිම සීමාවක් දක්වා ශල්‍යකර්ම පිරිවැය ආවරණය කරන විස්තීර්ණ ආවරණයක් ඔබට ලබා දේ.
	ප්‍රධාන වශයෙන් පුද්ගලික සෞඛ්‍යාරක්ෂව සඳහා සෞඛ්‍ය වියදම සහිත පොදු ජනතාව	විස්තීර්ණ හෙල්ත් ප්ලස්	අතිරේක ප්‍රතිලාභ රාශියක් සමඟ ශ්‍රී ලංකාවේ සහ ඉන්පිටත දී ශල්‍යකර්ම, වෛද්‍ය, සහ රෝහල්ගත කිරීම ආවරණය කරයි.
	දියවැඩියා සහිත පුද්ගලයින්	විස්තීර්ණ D+ Plan	දියවැඩියා රෝගයෙන් පෙලුනද විශිෂ්ඨ රෝහල් සහ වෛද්‍ය ප්‍රතිකාර වෙත පිවිසීම ලබා දෙමින් ඔප්පු හිමියන්ට මානසික සහය සහ මුදල් ලබා දේ.
	ප්‍රධාන වශයෙන් රජයේ සෞඛ්‍යාරක්ෂව සඳහා සෞඛ්‍ය වියදම සහිත පොදු ජනතාව	රෝහල් මුදල් සැලැස්ම	සැබෑ වියදම නොසලකා ඔබ රෝහලේ සිටින සෑම දිනයක් සඳහාම ස්ථිර මුදල් ආවරණයක් ලබා දේ
රැකියාවට අදාළ	සමාගමේ කාර්ය මණ්ඩලය	කණ්ඩායම් ආරක්ෂණ කාලීන ඔප්පුව	එක් රක්ෂණ ආවරණයක් යටතේ ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලය ආවරණය කරමින් සමාගම ඇතුළත ආරක්ෂාව පිළිබඳ වඩා ඉහළ හැඟීමක් ලබා දේ.
උකස් ආරක්ෂණය	බැංකු/මූල්‍ය ආයතනවලින් ණය ලබා ගන්නා ණය ගැනුම්කරුවන්	උකස් ආරක්ෂණ සැලැස්ම	ඔප්පුවේ කාල සීමාව තුළ ණය ගැනුම්කරුගේ මරණය හෝ සම්පූර්ණ සහ ස්ථිර ආබාධිතභාවය පිළිබඳ අවදානම නිසා නිවාස ණයක් හෝ වෙනත් ණයක් සඳහා ඉටුකළ උකසක් ආරක්ෂා කිරීම සඳහා මෙම සැලැස්ම නිර්මාණය කර ඇත.


SLIC
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
පියෙකු මෙන් මවක මෙන්
සාමාන්‍ය
සෞඛ්‍ය රක්ෂණ විසඳුම්
ව්‍යාපාර රක්ෂණ විසඳුම්
මෝටර් රථ රක්ෂණ විසඳුම්
නිවාස හිමි රක්ෂණ විසඳුම්
සංචාර රක්ෂණ විසඳුම්
පුද්ගල අනතුරු රක්ෂණ විසඳුම්
Sri Lanka Insurance MEDI 60 Senior Citizen Health Insurance Plan
Sri Lanka Insurance MEDI PLUS Health Insurance Plan
Sri Lanka Insurance HEALTH PLUS
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් නාගරාජ්
Sri Lanka Insurance Business Club TRADE INSURANCE POLICY
Sri Lanka Insurance MARINE CARGO
Sri Lanka Insurance HULL INSURANCE
Sri Lanka Insurance WORKMEN'S COMPENSATION INSURANCE
Sri Lanka Insurance TEA FACTORY INSURANCE
Sri Lanka Insurance MOTORPLUS The Best Option
MOTORPLUS PINNACLE
Sri Lanka Insurance MOTORPLUS Ladies Only
Sri Lanka Insurance MOTORPLUS COMMERCIAL
Sri Lanka Insurance MOTORPLUS TUK
Sri Lanka Insurance MOTORPLUS RIDER
MOTORPLUS Drive60 Senior Citizens Comprehensive Motor Insurance
Sri Lanka Insurance HOME PROTECT
Sri Lanka Insurance HOME PROTECT LITE
Sri Lanka Insurance FIRE INSURANCE
Sri Lanka Insurance TRAVEL PROTECT
Sri Lanka Insurance Jana Rekuma Individual Personal Accident Cover
Sri Lanka Insurance PERSONAL ACCIDENT COVER

සාමාන්‍ය කළඹ

නිෂ්පාදන වර්ගය	විසඳුම්	ඉලක්කගත ගනුදෙනුකරුවන්	විස්තරය
වෛද්‍ය රක්ෂණය	මෙඩි 60	ජේෂ්ඨ පුරවැසියන් (වයස අවුරුදු 60-70)	මෙඩි 60 සෞඛ්‍ය රක්ෂණ ඔප්පුවක් වන අතර ඉන් ජේෂ්ඨ පුරවැසියන්ගේ සෞඛ්‍ය රක්ෂණ අවශ්‍යතා ආවරණය කරමින් ඔවුන්ගේ මූල්‍ය ආයෝජනය මත පදනම් වී යෝජනා ක්‍රම තුනෙන් වඩාත් හොඳ වෛද්‍ය සැලැස්ම තෝරා ගැනීමට ඔවුන්ට ඉඩ ලබා දේ.
	මෙඩි ප්ලස්	වයස අවුරුදු 18-59 අතර ශ්‍රී ලංකා පුරවැසියන්	රෝගී සෞඛ්‍ය රක්ෂණ අවශ්‍යතා රාශියක් ආවරණය කරන තනි පුද්ගල රක්ෂණ ආවරණයකි. මෙම ඔප්පුව වාර්ෂිකව අළුත් කළ හැකි අතර සෑම නෝ ක්ලේම් වසරකම ඔප්පුවේ රක්ෂිත වටිනාකම වැඩි කරන විශේෂ නෝ ක්ලේම් බෝනස් ඇතුළත්ය.
මෝටර් රථ	මෝටර් ප්ලස් කාන්තාවන්ට පමණි	පුද්ගලික කාර් එකක් හෝ ද්විත්ව කාර්යය වාහනයක් හිමි කාන්තාවන්	කාර් සහ ද්විත්ව කාර්ය වාහන පදවන කාන්තා ගනුදෙනුකාර අංශයේ විශේෂිත මෝටර් රථ රක්ෂණ අවශ්‍යතා සපුරාලන විශේෂ විශේෂාංග අඩංගු වේ.
	මෝටර් ප්ලස් ට්‍රක්	ට්‍රක් රියදුරන්	ත්‍රිරෝද අංශයේ රක්ෂණ අවශ්‍යතා සැලසීමට සැලසුම්කළ මෝටර් රථ රක්ෂණ ඔප්පුවකි
	මෝටර් ප්ලස් රයිඩර්	ධාවකයින්	මෝටර් බයිසිකල් සඳහා සලසුම්කළ රක්ෂණ ඔප්පුවකි.
	මෝටර් ප්ලස් කොමර්ෂල්	වාණිජ මෝටර් රථ හිමිකරුවන්	වාණිජ වාහන (කුලී කාර්, ද්විත්ව කාර්යය වාහන, පුද්ගලික සහ කුළි ලොරි) සඳහා සම්පූර්ණ මෝටර් රථ රක්ෂණ ආවරණය ලබා දෙන අතර එය ජාතික ආර්ථිකයට දායක වේ.
	මෝටර් ප්ලස් ඩ්‍රයිව් 60	ජේෂ්ඨ පුරවැසියන් සඳහා මෝටර් රථ රක්ෂණ ආවරණය	පහත විශේෂ ප්‍රතිලාභ ඩ්‍රයිව් 60 රක්ෂණ නිෂ්පාදනය යටතේ පිරිනමයි. • රු. 10,000 දක්වා ඇදගෙන යාමේ ආවරණය • රුපියල් මිලියන 5 ට වැඩි රක්ෂණ මුදලකට (පෞද්ගලික කාර් සහ පෞද්ගලික ද්විත්ව කාර්ය වාහන) ඇමතුම් සහ ගෙනයාමේ පහසුකම • ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ලියාපදිංචි ගරාජ වලින් මුදල් රහිත අලුත්වැඩියා පහසුකම • රු. 100,000 ට පහළ හිමිකම් සඳහා බී එක්ස්ප්‍රස් කඩිනම් පියවීමේ පහසුකම • රු. 100,000 ට පහළ හිමිකම් සඳහා අලුත්වැඩියාවෙන් පසු පරීක්ෂාව කපාහැරීම • හිමිකම් සඳහා විශේෂ අලුත්වැඩියා පිරිනැමීම් • රු. 50,000 ට අඩු හිමිකම් සඳහා මුක්තාවශේෂ කොටස් කපාහැරීම • රෝහල් සහ ෆාමසි වලින් වට්ටම් සහිත පැකේජ • 75% දක්වා වට්ටම් (70% NCB සහ 5% MR)
	මෝටර් ප්ලස් පිනකල්	අධිමිල මෝටර් රථ හිමිකාර වෙළෙඳපොල අංශය	• ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් පිනකල් යනු පුළුල් පරාසයක අවදානම්වලට පුළුල් ආවරණයක් සපයන ප්‍රමුඛතම මෝටර් රථ රක්ෂණ නිෂ්පාදනයකි. ඉන් වැඩිදියුණු කළ පුද්ගලික අනතුරු ආවරණයක්, මාර්ග ආධාරක පිරිවැය ප්‍රතිපූරණය, කරදර රහිත හිමිකම් ක්‍රියාවලියක් සහ වාරික ගැලපුම් විකල්ප ද පිරිනමයි. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් පිනකල් සමඟින් ගනුදෙනුකරුවන්ට දේශීය රක්ෂණ ක්ෂේත්‍රයේ නව මිණුම් සලකුණු තබමින් සියලු අපේක්ෂාවන් අභිබවා යන සේවාවක් අපේක්ෂා කළ හැක.

නිෂ්පාදන වර්ගය	විසඳුම්	ඉලක්කගත ගනුදෙනුකරුවන්	විස්තරය
නිවාස	සොරබිය රක්ෂණය	නිවාස හිමියන්	බිඳීම මගින් ඇතිවන දේපල හානි හෝ අලාභවලින් ඔබගේ නිවාසය සහ පවුල ආරක්ෂා කරයි
	පදිංචි නිවාස සඳහා ගිනි රක්ෂණය		ගිනි සහ ගිනි ආශ්‍රිත විවිධ අවදානම් රාශියකින් ඔබගේ නිවස සම්පූර්ණ කර තිබුනද, පදිංචි වී සිටියද හෝ ඉදිකිරීම් මට්ටමේ තිබුනද ඔබගේ නිවස ආරක්ෂා කරයි.
	නිවාස ආරක්ෂණ රක්ෂණය		ආපදා සිදුවීමකින් ඔබගේ නිවාසය, ඔබගේ පවුල සහ ඔබගේ විටිනා භාණ්ඩ සහ ගෘහස්ථ සේවකයින් ආවරණය කරයි.
	නිවාස ආරක්ෂණ ලයිට්		පළමු අලාභ පදනමට පූර්ව ප්‍රාරක්ෂණ ගෘහස්ථ රක්ෂණ ඔප්පුවකි. මෙය කවුළුවෙන් මිලදී ගත හැකිය.
සංචාර	සංචාර ආරක්ෂාව	සියලුම සංචාරකයින්	වෛද්‍ය හදිසි අවස්ථාවක, සංචාර අවලංගුවීම, ගමන් මළු අහිමිවීම, පෙර නොදුටු සංචාරක බිඳවැටීම්වලට ආවරණය ලබා දෙන අතර සංචාරකයින්ට කිසිදු බාධාවක් නොමැතිව සිය සංචාරය විනෝදවීම කෙරෙහි අවධානය සහතික කරයි.
පුද්ගල අනතුරු	ජන රැකුම	ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය	ඕනෑම ස්ථානයක ඕනෑම වේලාවක සිදුවියහැකි අනතුරුවලින් පුද්ගලයින් සඳහා පුළුල් ආවරණය ලබා දේ. (24x7 ලොව පුරා)
ව්‍යාපාරය			
දේපල	ව්‍යාපාර පරිශ්‍ර සඳහා රක්ෂණය	ව්‍යාපාර හිමිකරුවන්	ඔබගේ කර්මාන්ත හෝ වාණිජ දේපල හානි හෝ අලාභ සඳහා ආවරණය ලබා දේ.
	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ව්‍යාපාර, සමාජ වෙළෙන්දන් සම්බන්ධ රක්ෂණ ඔප්පුව	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය	ගිනි හා ආශ්‍රිත උවදුරු, වීදුරු, මුදල්, ඉලෙක්ට්‍රොනික උපකරණ සහ තොග විනාශවීමේ රක්ෂණය සහ වෙනත් අදාළ හානි ඇතුළුව එක් ඔප්පුවකින් පුළුල් සහ සාකල්‍ය විසඳුමක් ලබා දේ.
	තේ කර්මාන්තශාලා රක්ෂණය	ශ්‍රී ලංකාවේ වැවිලි අංශය	තේ වැවිල්ල, කර්මාන්තශාලා සහ ගබඩා මෙන්ම ඒවායේ යන්ත්‍ර, ව්‍යූහ. තොග සහ පවත්නා කටයුතු අවදානම් ඇතුළත්ය.
	හෝටල්හිමියන්ගේ පුළුල් රක්ෂණය	ශ්‍රී ලංකාවේ හෝටල්හිමියන්	පසුගිය කාලයේදී සංචාරක ව්‍යාපාරය අසමසම බාධාවන්ට මුහුණ දුන් බැවින් ශ්‍රී ලංකාවේ හෝටල්හිමියන් සඳහා පුළුල් රක්ෂණ ආවරණයක්
	කොන්ත්‍රාත්කරුවන්ගේ අවදානම් රක්ෂණය	කොන්ත්‍රාත්කරුවන් හාරගත් ඉදිකිරීම් ව්‍යාපෘති	වර්තමානයේ වේගයෙන් ගමන් කරන සහ ඉහළ ඉල්ලුමක් ඇති ඉදිකිරීම් ව්‍යාපාරය සමඟ සම්බන්ධ වන විවිධ අවදානම් ආමන්ත්‍රණය කිරීමට කොන්ත්‍රාත්කරුවන් සඳහා පුළුල් රක්ෂණ ආවරණයක්
	ඉදිකිරීම්වල සියලුම අවදානම් රක්ෂණය	ඉදිකිරීම් ව්‍යාපෘති	යන්ත්‍ර සහ උපකරණ ස්ථාපන ආවරණය කරයි.
	විද්‍යුත් උපකරණ රක්ෂණය	ව්‍යාපාර පරිශ්‍ර සහ කර්මාන්තශාලා	ඔබගේ ඉලෙක්ට්‍රොනික උපකරණ සහ මෙවලම්වලට හානිවියහැකි අවදානම්වලින් සමාගම ආරක්ෂා කරන සුදුසු ආවරණයක්
	යන්ත්‍ර බිඳවැටීමේ රක්ෂණය	ව්‍යාපාර පරිශ්‍ර සහ කර්මාන්තශාලා	බලාපොරොත්තු නොවූ හදිසි අළුත්වැඩියාන් සහ/හෝ ප්‍රතිස්ථාපනයන් සඳහා හදිසි භෞතික හානි හෝ අලාභ සඳහා ආවරණයක්
	කොන්ත්‍රාත්කරුවන්ගේ පිරියත සහ යන්ත්‍ර රක්ෂණය	ඉදිකිරීම් ව්‍යාපෘති	රැකියා භූමියේදී මුහුණදෙන සියලුම වර්ගයේ අවදානම්වලින් කොන්ත්‍රාත්කරුවන්ගේ පිරියත සහ යන්ත්‍ර සඳහා ආරක්ෂාව ලබා දේ.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

නිෂ්පාදන වර්ගය	විසඳුම්	ඉලක්කගත ගනුදෙනුකරුවන්	විස්තරය
	තොග පිරිහීමේ රක්ෂණය	ව්‍යාපාර පරිශ්‍ර සහ කර්මාන්තශාලා	යාන්ත්‍රික ගැටළු හේතුවෙන් ආහාර, ඖෂධ වැනි අයිතම සඳහා ශීත ගබඩාවල සුළු උෂ්ණත්ව වෙනස්වීම්වල මෙන්ම, අනපේක්ෂිත තත්ත්වයන් යටතේ එවැනි භාණ්ඩ ඉක්මනින් පිරිහීම පවා අවදානම ආවරණය කරයි
	යන්ත්‍ර අහිමිවීමේ ලාභ රක්ෂණය	ව්‍යාපාර පරිශ්‍ර සහ කර්මාන්තශාලා	යන්ත්‍ර සූත්‍ර නිසා ඇති වූ බිඳවැටීම් (යම් නිෂ්පාදනයක යන්ත්‍රෝපකරණ ක්‍රියා විරහිත වීම හෝ කාර්මික පහසුකම සාමාන්‍ය මෙහෙයුම්වලට බාධා කරමින් ආදායම් මාර්ගවලට හානි කිරීම) හේතුවෙන් සිදු වූ දළ ලාභයේ සැබෑ පාඩුව ආවරණය කරයි.
මුහුදු	මුහුදු නැව්කඳ සහ යන්ත්‍ර රක්ෂණය	ධීවර බෝට්ටු හිමිකරුවන් සහ යාත්‍රා හිමිකරුවන්	විවිධ වර්ගයේ අවදානම් හේතුවෙන් සිදුවන හානිවලින් සාගරයේ ගමන් කරන සහ ජල මාර්ගවල ක්‍රියාත්මක වන අනෙකුත් බෝට්ටු/යාත්‍රාවල බඳ සහ යන්ත්‍ර සූත්‍ර සඳහා පූර්ණ ආරක්ෂාව සපයයි.
	නැව් බඩු රක්ෂණය	අපනයනකරුවන් සහ ආනයනකරුවන්	අපනයනකරුවන්ගේ සහ ආනයනකරුවන්ගේ නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇත.
රැකියාවට අදාළ	සේවක වන්දි රක්ෂණය	කර්මාන්තශාලා, නිෂ්පාදන සමාගම් සහ කාර්යාල	2005 අංක 10 දරණ මෑතකදී යාවත්කාලීන කරන ලද සේවක වන්දි පනත යටතේ සේවා යෝජකයාගේ වගකීම් ඉස්මතු කරන අතර ඉන් රැකියාවේ යෙදී සිටියදී තුවාල වූ සේවකයින්ට වන්දි ලබා දේ.
	පුද්ගල අනතුරු ආවරණය	කර්මාන්තශාලා, නිෂ්පාදන සමාගම් සහ කාර්යාල	පහරදීම්, හදිසි අනතුරු හෝ වෙනත් බාහිර හා දෘශ්‍ය ක්‍රම නිසා සිදුවන මරණ සහ ශාරීරික තුවාල සඳහා වන්දි ලබා දෙන අතර එවැනි අනපේක්ෂිත සිදුවීම් වලදී රක්ෂණ ඔප්පුහිමියා ආරක්ෂා කරයි.
විශේෂ මෝටර් වර්ගීකරණ	මෝටර් ප්ලීට් විසඳුම්	සමාගම්/පුද්ගලයින්ට අයත් කාර් සමූදාය	ආයතනික සතු මෝටර් රථ ඇණිය සඳහා අනතුරු අවදානම සහ හානි ආවරණය.
	කෘෂිකර්ම වාහන සහ විශේෂ වාහන	සමාගම්/පුද්ගලයින්ට අයත් කෘෂිකර්ම වාහන සහ විශේෂ වාහන	වාහනයේ භාවිතයේ ස්වභාවය සහ වාහන වර්ගය සැලකිල්ලට ගනිමින් අදාළ කාණ්ඩයේ නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා කෘෂිකාර්මික සහ විශේෂ වාහන රක්ෂණ විසඳුම් සැලසුම් කර ඇත.

වෙනත් ඔප්පු

- බැංකුරුවන්ගේ හානි රක්ෂණය
- රබර් කර්මාන්තශාලාව
- වෘත්තිකයන්ගේ හානි රක්ෂණය
- ගුවන්යානා රක්ෂණය
- පොදු වගකීම
- නිෂ්පාදන වගකීම

2022 මූල්‍ය වසරේ වෙළෙඳපොල දියත් කළ නව නිෂ්පාදන

සමාලෝචිත වසර තුළ, අපගේ පිරි නැමීම් අඛණ්ඩව පුළුල් කිරීමේ කොටසක් ලෙස පහත සඳහන් නිෂ්පාදන වෙළෙඳපොල වෙත හඳුන්වා දෙන ලදී:

ස්කූල් ෆී ප්‍රොටෙක්ටර්

ජාත්‍යන්තර සහ පුද්ගලික පාසල් සහ අධ්‍යාපනික ආයතනවල සිසුන්ට සිය දෙමව්පියන් අභිමිවීම හෝ ස්ථාර ආබාධයට පත් වූ අවස්ථාවක ඔවුන්ව ආරක්ෂා කිරීම සඳහා ස්කූල් ෆී ප්‍රොටෙක්ටර් හඳුන්වා දී ඇත. මෙම ආවරණය මගින් අවාසනාවන්ත සිදුවීමේ සිට ඉතිරි පාසල් කාලයේ ගාස්තු සහතික කරයි. ගනුදෙනුකරුවන්ට එක් ඔප්පුවක් යටතේ දෙමව්පියන් දෙදෙනාම ආවරණය කළ හැකි අතර එක් වාරිකයක් ගෙවීමකින් පමණක් ඔප්පුව ලබාගත හැකිය.

සාමාන්‍ය රක්ෂණය

1. ජනරැකුම පුද්ගල අනතුරු රක්ෂණ ආවරණය

ජනරැකුම පුද්ගල අනතුරු රක්ෂණ ආවරණය මගින් ඕනෑම තැනක ඕනෑම වේලාවක සිදුවියහැකි අනතුරු තුවාල සඳහා පුළුල් ආවරණයන් පිරිනමයි. පුද්ගලයින්ට ලබාදෙන දැරියහැකි වාරික සහ විවිධ ප්‍රතිලාභ මෙම ආවරණයේ අසමසම ලක්ෂණ වන අතර එය වෙළෙඳපොලෙන් ලබාගතහැකි සමාන නිෂ්පාදනවලින් වෙනස්ව *ජනරැකුම* ස්ථානගත කරයි.

මෙම ආවරණයට පහත දෑ ඇතුළත්ය

- පුද්ගල අනතුරු ආවරණය
- අනතුර හේතුවෙන් රෝහල්ගතවීම ආවරණය
- අවමංගල වියදම් ආවරණය
- 24x7 ලොවපුරා ආවරණය
- මෝටර් බයිසිකල් ආවරණය (පදින්නා හෝ පසුපස යන්නා)

2. මෙඩි 60 ජ්‍යේෂ්ඨ පුරවැසි රක්ෂණ ආවරණ

ජ්‍යේෂ්ඨ පුරවැසියන් යනු බොහෝ සෙයින් රක්ෂණ ආවරණය අවශ්‍ය සහ ඒ සමඟම මෙම අංශයට සපයන ආවරණය පිරිවැය අධික විය හැකිය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෙඩි 60 සෞඛ්‍ය රක්ෂණ නිෂ්පාදනයක් වන අතර ඒ මගින් ඉහළ දැරියහැකි මිලකට රටේ ජ්‍යේෂ්ඨ පුරවැසියන්ගේ (වයස අවුරුදු 60 සහ ඉහළ) සෞඛ්‍ය රක්ෂණ අවශ්‍යතා රාශියක් ආවරණය කරයි. ඔබගේ මූල්‍ය ආයෝජනය මත පදනම් වී යෝජනා ක්‍රම තුනකින් ඔබට වඩාත් ගැලපෙන වෛද්‍ය සැලැස්ම තෝරා ගත හැකිය.

මෙම ආවරණයට පහත දෑ ඇතුළත්ය

- කාමර ගාස්තු ඇතුළුව රෝහල් සහ සාත්තු නිවාසවල නඩත්තු අයකිරීම්
- උපදේශක සහ විශේෂඥයාගේ ගාස්තු, ශල්‍ය වෛද්‍ය සහ නිර්වින්දන වෛද්‍ය ගාස්තු
- ශල්‍යාගාරය ඇතුළුව වෛද්‍ය සහ ශල්‍යකර්ම වියදම්, හෙද ගාස්තු. රෝහල් ගත කිරීම සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත පරීක්ෂණ සහ විශේෂ ප්‍රතිකාර
- රජයේ රෝහල්වල එක් දින දීමනාව – උපරිම දින 15 කි (**කොවිඩ් 19 හේතුවෙන් රජයේ රෝහල් ගත කිරීම ඉහත රජයේ රෝහල් දීමනා සීමාවා තුළ එක් දිනකට රු. 1,000කි – එක් රාත්‍රියක් එක් දිනයක් ලෙස සලකනු ලබයි.)
- මිලදිගත් ඖෂධ, සිදුකරන පරීක්ෂණ, ස්කෑන්, සහ එක්ස්රේ සඳහා දරන ලද වියදම් සහ රජයේ රෝහලක නොගෙවන වාට්ටුවක රෝගියෙක් වීම (බිල්පත් ඉදිරිපත් කිරීමට යටත්ව)
- දින 135ක දිවා සුරැකුම් ශල්‍ය වියදම් ආවරණය කෙරේ.

3. මෝටර් ප්ලස් ඩ්‍රයිව් 60 රක්ෂණ ආවරණය

මෝටර් ප්ලස් ඩ්‍රයිව් 60 යනු ජ්‍යේෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂයෙන් සැලසුම් කළ මෝටර්රථ රක්ෂණ ආවරණයකි. ඩ්‍රයිව් 60 නිෂ්පාදනය යටතේ පහත පුළුල් විශේෂ ප්‍රතිලාභ පිරි නමනු ලැබේ.

- රු. 10,000 දක්වා ඇදගෙන යාමේ ආවරණය
- රුපියල් මිලියන 5 ට වැඩි රක්ෂණ මුදලකට (පෞද්ගලික කාර් සහ පෞද්ගලික ද්විත්ව කාර්ය වාහන) ඇමතුම් සහ ගෙනයාමේ පහසුකම
- ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ලියාපදිංචි ගරාජ වලින් මුදල් රහිත අලුත්වැඩියා පහසුකම
- රු. 100,000 ට පහළ හිමිකම් සඳහා බී එක්ස්ප්‍රස් කඩිනම් පියවීමේ පහසුකම
- රු. 100,000 ට පහළ හිමිකම් සඳහා අලුත්වැඩියාවෙන් පසු පරීක්ෂාව කපාහැරීම
- හිමිකම් සඳහා විශේෂ අලුත්වැඩියා පිරිනැමීම්
- රු. 50,000 ට අඩු හිමිකම් සඳහා මුක්තාවශේෂ කපාහැරීම
- රෝහල් සහ ෆාමසි වලින් වට්ටම් සහිත පැකේජ
- 75% දක්වා වට්ටම් (70% NCB සහ 5% MR)

4. මෝටර් ප්ලස් පිනකල් රක්ෂණ ආවරණය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් පිනකල් යනු ඔබගේ අපේක්ෂිත ජීවනරටාව සඳහා සම්පූර්ණ මෝටර් රථ රක්ෂණයකි. වටිනාකම රු. මිලියන 15 ඉක්මවන වාහන සඳහා හඳුන්වා දුන් වාරික මෝටර් රථ රක්ෂණ ඔප්පුවකි. පහත අගය එකතුකළ ප්‍රතිලාභ එයට ඇතුළත්ය.

- රක්ෂිතයා නිවසේ සිට කිලෝමීටර 100ක් හෝ ඊට වැඩි දුරක් නම් රු. 50,000 දක්වා හදිසි අනතුරකදී හදිසි නවාතැන් පිරිවැය ප්‍රතිපූරණය කිරීම
- රු. 20,000 දක්වා ඇදගෙන යාමේ ගාස්තු සහ හදිසි බිඳවැටීම් සහය සඳහා ප්‍රතිපූරණය කිරීම
- හදිසි අනතුරු මරණ ආවරණය රක්ෂිතයා සඳහා රු. 1,000,000 සහ මගීන් තිදෙනෙකු සඳහා රු. 500,000
- වාහනය ගැටීමෙන් අලුත්වැඩියාවේ පවතින අතරතුර දිනකට රු. 6,000/= දක්වා කුලී දීමනාව
- වාහන අනතුරක් හේතුවෙන් සොරකම් කරන ලද හෝ හානි වූ ශ්‍රව්‍ය සහ/හෝ දෘශ්‍ය උපකරණ ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ප්‍රතිපූරණය කිරීම
- කැපවූ හිමිකම් සහය කණ්ඩායමක්
- වාහන අනතුරක් හේතුවෙන් යතුරට හානි වූ/විනාශ වූ විට වාහනයේ යතුර ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ප්‍රතිපූරණය කිරීම

ප්‍රාරක්ෂණය සහ හිමිකම් නිරවුල් කිරීමේ විශිෂ්ඨත්වය

වගකීම්සහගත ආයතනික පුරවැසියෙක් ලෙස, අපි තරඟකාරී විරෝධී කාර්යයන්හී යෙදීමෙන් වලකිමු. අපගේ ප්‍රතිරක්ෂණ නිෂ්පාදන මිල කිරීමේදී, අපි වාරික මිල කිරීම සහ හිමිකම් නිරවුල් කිරීමේ අවදානම් අතර සාධාරණ තුලනයක් අත්කර ගැනීමට අරමුණු කරමු. අපගේ මිලකරණ ප්‍රතිපත්තිය එහි ප්‍රවේශය තුළ ක්‍රමානුකූල, අනුරූප, සහ අපගේ ගනුදෙනුකරුවන්ට සාධාරණ වෙළෙඳපොල මිලකට ඉහළම තත්ත්වයේ ප්‍රතිමිලකරණ ලබාගත හැකිය.

මේ අතර, සෑම අවස්ථාකදීම අපගේ හිමිකම් කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව පවත්වා ගැනීම පිණිස, පහත මූලධර්ම මත පදනම් වී ගනුදෙනුකරුවන්ගේ බැඳීම් ප්‍රමුඛ කරන ප්‍රතිමාන, පද්ධති සහ ක්‍රියාපටිපාටි අපි නිර්මාණය කර ඇත:

- හිමිකම් කඩිනම් සහ සාධාරණව කටයුතු කළ යුතුය.
- හිමිකම් කියන්නාට ඔහුගේ හිමිකමේ තත්ත්වය පිළිබඳව සෑම අවස්ථාවකදී දැනුවත් කළ යුතුය. එවිට ඔහු ගෙවීම ලබාගත හැකි කාලය දැනගනී.
- හිමිකමක් අර්ධ වශයෙන් විසඳුවහොත් හෝ ප්‍රතික්ෂෙප කළහොත්, හිමිකම් කියන්නාට ලිඛිත පැහැදිලි කිරීමක් ලබා දිය යුතු අතර එය හිමිකම් කියන්නාගේ මැසිවිලි සහ අභ්‍යාජ්තිය අවම කරනු ඇත.

සියලුම හිමිකම් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි මධ්‍යම හිමිකම් පිරිසැකසුම් ඒකකය විසින් මෙහෙයුවන අතර ආරාවුල් සහ ඉහළ සීමා හිමිකම් විශේෂ හිමිකම් මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලැබේ. නොවිසඳුනු හිමිකම් රටේ රක්ෂණ නීති රාමුවට අනුකූලව විකල්ප ආරාවුල් විසඳීමේ ක්‍රියාපටිපාටියකට යොමු කෙරේ.

ඉහළින් අගය ඇති සහ ප්‍රශස්ථ ගනුදෙනුකාර පහසුව

ස්මාර්ට් උපාංග සහ සමාජ මාධ්‍ය භාවිතය වැඩි වීමත් සමඟ ගනුදෙනුකාර හැසිරීම් අබණ්ඩව පරිණාම වන බැවින් තරඟයට වඩා ඉදිරියෙන් සිටීමට නව්‍යකරණයේ අවශ්‍යතාවය අපි හඳුනා ගනිමු. මෙම පරිසරය තුළ, අපගේ ගනුදෙනුකරුවන්ට හැකි තරම් පහසු වන අද්විතීය අගය එකතු කළ සේවාවන් සැපයීමෙන් අපව වෙන්කර හඳුනා ගැනීමට අපි උත්සාහ කරමු.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ගනුදෙනුකාර App		ඔප්පුවේ සහ සේවා විස්තර බැලීමට ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ඔප්පු යන දෙකටම වාරික ගෙවීමට ඔවුන්ගේ සාමාන්‍ය රක්ෂණ ඔප්පු අන්තර්ජාලය හරහා අලුත් කිරීමට මෝටර් රථ රක්ෂණ හිමිකම් ආරම්භ කිරීමට Google සිතියම් තුළ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශාඛා ස්ථානගත කිරීමට 24/7, මාර්ගයේදී සහ හදිසි ආධාර ලබා ගැනීමට මෝටර් ප්ලස් ලෝයල්ටි රිවෝර්ඩ්ස් සහ ලයිෆ් ලෝයල්ටි රිවෝර්ඩ්ස් සොයා බැලීමට සහ බැලීමට
අපගේ ආයතනික වෙබ් අඩවිය (www.srilankainsurance.com)		විවිධ නිෂ්පාදන හා සේවා කරා පිවිසීමට
ජංගම සහ වෙනත් ගෙවීම් විසඳුම්	මොබිටෙල් සමඟ හවුල්කාරත්වය	m-cash භාවිතයෙන් තම වාරික ගෙවීමට ගනුදෙනුකරුවන් සඳහා බාධා රහිත පහසු මාර්ගයක් ලබාදීමට
	මහජන බැංකුව (PB) සමඟ හවුල්කාරත්වය	ශ්‍රී ලංකාව පුරා මහජන බැංකුවේ ATM's ජාලය සහ ස්වයං බැංකුකරණ මධ්‍යස්ථාන හරහා තම වාරික ගෙවීමට
	ලංකා බැංකුව (BOC) සමඟ හවුල්කාරත්වය	ලංකා බැංකුවේ ස්මාට් පේ භාවිතයෙන් ජීවිත රක්ෂණ වාරික ගෙවීම QR ශක්තිමත් කිරීම
	ලංකා හොස්පිටල්ස් හි සේවා කවුළුව	රක්ෂණ ඔප්පු මිලදීගැනීම, රක්ෂණ සැලසුම් හා වාරික පිළිබඳ තොරතුරු ලබාගැනීමට පහසුකම් සැලසීම

වගකීම් සහගත අලෙවිකරණය සහ විනිවිද සන්නිවේදනය

අපගේ ගනුදෙනුකරුවන් මැදිහත්වීමේ උපායමාර්ගයෙන් අරමුණු කරන්නේ ගනුදෙනුකරුවන්ට පහසුවෙන් සහ ඉක්මණින් තීරණ ගැනීමට ඔවුන්ට හැකි වන සේ පැහැදිලි සහ සංක්ෂිප්ත තොරතුරු ලබාදීමයි. විවිධ විකල්පවලට මුහුණදීමේදී ගනුදෙනුකරුවන්ගේ දුෂ්කරතා අපි අවම කරමු. මේ සම්බන්ධයෙන්, ප්‍රවර්ධන හා අලෙවිකරණ ද්‍රව්‍ය සැලසුම් කිරීමේදී, අපි සියලුම නියාමන අනාවරණ බැඳීම්වලට අනුකූල වෙමු. අපගේ ගනුදෙනුකරුවන්ට අවශ්‍ය සහ අදාළ සියලුම තොරතුරු ලබාදීමෙන් ක්ෂේත්‍රයේ ප්‍රමිති රැකීමට අපි උත්සාහ ගනිමු. ඒ තුලින් ඔවුන් අපත් සමඟ ගනුදෙනු කිරීමේදී විචක්ෂණ තීරණ ගනු ඇත.

අපගේ ගනුදෙනුකරුවන්ට විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ඇතුළුව මාර්ග ගණනාවක් තුළින් අපගේ නිෂ්පාදන හා සේවා පිළිබඳ තොරතුරු ලැබේ. තවද, සියලුම ශාඛා සේවකයින් වෘත්තීය ආකාරයකින් යම් තොරතුරු සම්බන්ධ විමසීම්වලට ප්‍රතිචාර දැක්වීමට, අපගේ නිෂ්පාදන හා සේවා හා බැඳුණු අවදානම් පැහැදිලි කිරීමට සහ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට සුදුසු විසඳුම් පිළිබඳ ගනුදෙනුකරුවන්ට උපදෙස් ලබා දීමට ඔවුන් පුහුණු කෙරේ.

කඩිනම් සහ ඵලදායී ගනුදෙනුකාර පැමිණිලි මෙහෙයවීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවාදායකයින්ගේ ප්‍රතිචාර අගය කරන අතර ගනුදෙනුකරුවන්ට සමාගම සමඟ සෘජුවම සන්නිවේදනය කළහැකි මාර්ග ගණනාවක් ලබා දී ඇත. මේවාට පැය 24 ඇමතුම් මධ්‍යස්ථානය. අපගේ ආයතනික වෙබ් අඩවිය, සහ සමාජ මධ්‍ය කුටි ඇතුළත්ය. නවතම සංවර්ධනයන් සමඟ පෙළ ගැසෙමින්, අපත් සමඟ සම්බන්ධවීමේ පහසු ක්‍රමයක් ලෙස අපි WhatsApp හඳුන්වා දුන්නෙමු.

අපගේ සේවාවල තත්ත්වය පිළිබඳව සියලුම සේවාදායකයින්ගේ ගැටළු අපගේ සේවා ඉහළ නැංවීමට සහ ව්‍යාපාරය කිරීම, පහසුව, විශ්වාසය සහ ප්‍රසාදය වර්ධනය කර ගැනීමට අවස්ථාවක් ලෙස අපි දකිමු. අපගේ මනාව පුහුණුව ලත් සම්පතක් වන කාර්ය මණ්ඩලය ගනුදෙනුකාර ගැටළු ගොනුකර, විමර්ෂණය කර සහ වඩාත් පහසුවෙන් විසඳන බව සහතික කරයි. අප ක්‍රියාවට නංවා ඇති ගනුදෙනුකාර පැමිණිලි කළමනාකරණ ක්‍රමයක් ඇති අතර ගනුදෙනුකාර පැමිණිලික් ලද අවස්ථාවේ සිට එය විසඳන තුරු සහ ක්‍රියාපටිපාටිය සමාගමේ වේබ් අඩවියේ ප්‍රකාශයට පත්කිරීම දක්වා මනාව නිශ්චිත ක්‍රියාවලියකින් එය සමන්විත වේ.

මෝටර් ප්ලස් ලෝයල්ටි රිවෝර්ඩ්සි

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ගනුදෙනුකාර වටිනාකම් පිරිනැමීමට ඔවුන්ගේ පක්ෂපාතිත්වය සඳහා ගනුදෙනුකරුවන්ට ත්‍යාග පිරිනමයි. මෝටර් ප්ලස් ඔප්පු හිමියන්ට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් ලෝයල්ටි රිවෝර්ඩ්ස් වැඩසටහන තුළින් විවිධ තෑගි සහ ප්‍රසාදවල වාසි ලබාගත හැකි අතර එයට අවසන් ත්‍යාග ඇදීම, වෙළෙඳ හවුල්කරුවන්ගෙන් සුවිශේෂී ගනුදෙනු, සහ අගය එකතුකළ සේවාවල වර්ධනීය ලැයිස්තුවක් ඇතුළත්ය. මෝටර් ප්ලස් ලෝයල්ටි රිවෝර්ඩ්ස් වැඩසටහන 2022 දී පුළුල් කරන ලද බැවින් ඔප්පු හිමියන්ට විවිධ ආයතන සමඟ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හවුල්කාරත්වයෙන් වට්ටම් ලබාගත හැකිය.

ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනයට අගය එකතු කිරීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සතුව පුළුල් ව්‍යාපාර හවුල්කාර ජාලයක් ඇති අතර ඔවුන් සිය වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය තුළ අත්‍යවශ්‍යය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි තරඟකාරී වාසිය පවත්වා ගැනීමට ඔවුන් තීරණාත්මක වන අතර සමාගමේ දිගුකාලීන ශක්තිය සහතික කරයි. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ව්‍යාපාරයේ ස්වභාවය රක්ෂණ නියෝජිතයින්, තැරැව්කරුවන්, ප්‍රතිරක්ෂකයින්, මාර්ග හවුල්කරුවන්, පොදු සැපයීම් අලෙවිකරුවන්, සහ වෙනත් සේවා සපයන්නන් ඇතුළුව විවිධ ව්‍යාපාර හවුල්කාර කණ්ඩායම් සමඟ සහයෝගය අවශ්‍යය.

අපගේ වටිනාකම් දාමය තුළ මෙවැනි හවුල්කරුවන්ගේ වැදගත් කාර්යභාරය රඳවා ගැනීමට, හුවමාරු අගය සංකල්පය මත පදනම් වී ශක්තිමත් සහ රඳාපවතින හවුල්කාරත්වයන් ගොඩ නැගීම අපට අවශ්‍යය. එමෙන්ම අපට බාහිර මූලාශ්‍රකරණය පිළිබඳ ක්‍රියාත්මක ප්‍රතිපත්තියක් ඇත.

විශ්වාසය සහ දිගුකාලීන සම්බන්ධතා සංවර්ධනය පිණිස, අපගේ ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය පවත්වා ගැනීමට අපි ඉහළින් ක්‍රමවත් කළ ප්‍රවේශයක් පවත්වා ගනිමු.

ලයිෆ් ලෝයල්ටි රිවෝර්ඩ්ස්

ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් පුළුල් ලෙස දරන මතයක් වන්නේ ප්‍රතිලාභ ලබාගත හැකි වන්නේ කාලසීමාව අවසානයේදී හෝ හිමිකමකදී පමණක් යන්නයි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අපි හිමිකමක් කිරීමේ අවශ්‍යතාව නොමැතිව ඔප්පුවේ කාලසීමාව තුළ ජීවිත රක්ෂණහිමියන්ට අඛණ්ඩ ප්‍රතිලාභ ලබාදීමට බැඳී සිටිමු

මෙය මතකයේ තබා ගනිමින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සියලුම ජීවිත රක්ෂණහිමියන් සඳහා ජීවිත ලෝයල්ටි රිවෝර්ඩ්ස් ක්‍රමය දියත් කර ඇති අතර ඉන් අපගේ වෙළෙඳ හවුල්කරුවන් තුළින් පිරිනැමීම්, වට්ටම් සහ අගය එකතු කිරීම් රාශියක් ඔවුන්ට ලබා ගත හැකි වේ. අපි නව හවුල්කරුවන් එකතු කරමින් ලෝයල්ටි වැඩසටහන් හරහා පිරිනමන ප්‍රතිලාභ සහ හෝටල්, අධ්‍යාපන ආයතන, අවන්හල්, සෞඛ්‍යාරක්ෂාව සහ තවත් බොහෝ අංශ ආවරණය කරන පිරිනැමීම් අඛණ්ඩව වැඩි කරමු.

අපගේ ගනුදෙනුකරුවන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ජංගම යෙදුම තුළින් ලබාගත හැකි ප්‍රතිලාභ දැකබලාගතහැකි අතර අතත්‍ය ලෝයල්ටි කාඩ්පත හරහා ප්‍රතිලාභ ලබා ගත හැකිය.

රක්ෂණ උපදේශකයින්

අපගේ රක්ෂණ නියෝජිතයින් අපගේ සේවදායකයින්ට අපගේ සන්නාම තානාපතිවරුන් වෙති. එමනිසා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සන්නාමය ලෙස සදාචාර සහ අවංකකම පිළිබඳ ඉහළම ප්‍රමිති ඔවුන් පිළිබිඹු කරන බව අපි සහතික කරමු. සියලුම නියෝජිතයින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අලෙවි ගිවිසුම තුළින් බඳවා ගන්නා අතර ඉන් සියලුම උපදේශකයින් අනුගමනය කළ යුතු නියමයන් සහ කොන්දේසි විස්තර කරයි.

අපගේ නියෝජිතයින් අභිප්‍රේරණය කිරීමේ අවශ්‍යතාව අපි මනාව අවබෝධ කර ගෙන ඇත. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි නියෝජිත වෘත්තීය මාර්ග උපදේශකයින්ට ක්‍රමානුකූල දියුණුවක් ලබා දෙන අතර ආයතනය සමඟ වර්ධනය වීම ඔවුන්ට ඉඩ ලබාදේ. අපි අපගේ සියලුම උපදේශකයින්ට අමතර සංවර්ධන අවස්ථා ලබා දෙන්නෙමු. අභිප්‍රේරණයේ එක් මාර්ගයක් වන්නේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අභ්‍යන්තර ප්‍රදාන අවස්ථාවන් වන අතර නියෝජිත වෘත්තීය මාර්ග වැඩසටහන තුළින් හඳුනාගත් ඉහළ කාර්යසාධකයන් පිළිගනී. ඊට අමතරව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ඩිජිටල්කරණ වැඩසටහන් අපගේ නියෝජිත පිරිස් වෙත තවදුරටත් ප්‍රතිලාභ ලබා දෙන බව අපි සහතික කරමු.

වඩා ඵලදායී සහ හිතකර සංවර්ධන මොඩියුලයක් මෙන්ම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි නියෝජිත ගිවිසුම් සමඟ අලෙවි සේවකයින් සඳහා මෙහෙයුම් ව්‍යූහයක් ලබාදීමට නියෝජිත සංවර්ධන ආකෘතිය (ADM) ක්‍රියාත්මක කර ඇත. මෙම ව්‍යූහය මගින් නව බඳවා ගැනීම් සඳහා පැහැදිලි ප්‍රගතියක් ලබා දෙන බැවින් සහ දැනට සිටින කාර්යසාධකයින්ට විධිමත්ව ස්ථානගතවීමට මඟක් ක්‍රමවත් කර ලබා දෙන බැවින් සමාගමේ නියෝජිත බඳවාගැනීමේ ධාවකය සඳහා සහයවන මෙවලමක් වනු ඇත.

නියෝජිත බලකාය

2017 සිට 2022 දක්වා MDRT සාමාජිකයින්

සංඛ්‍යා අත්කරගත් වසර	2022	2021	2020	2019	2018	2017	2016
සාමාජිකත්ව වසර	2023	2022	2021	2020	2019	2018	2017
මුළු සාමාජිකයින්	168	187	93	64	63	52	60

ආයුගණක උපදේශකයින්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි ජීවිත සහ සාමාන්‍ය රක්ෂණය සඳහා ආයුගණක උපදේශකයින් ලෙස විල්ස් ටවර්ස් වොට්සන් ඉන්දියා (පුද්ගලික) සමාගම සහ එන්එම්පී ෆිනැන්සියල් සර්විසස් කන්සල්ටන්ග් කටයුතු කරන අතර ඔවුන් ඔවුන්ගේ ප්‍රවීනත්වය, අවශ්‍ය කරන ගැටළුවලදී අපට සහය වේ.

ප්‍රතිරක්ෂකයින්

ප්‍රතිරක්ෂකයින් වර්ධන අපේක්ෂාවන් අත්කර ගැනීමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ට ඉඩදෙමින් වියහැකි ඉහළින් වටිනා අවදානම් උරා ගැනීමට ආවරණයේ කොටස භාර ගනිමින් අපගේ ව්‍යාපාරයට තීරණාත්මක සහය ලබා දේ. ප්‍රතිරක්ෂකයින්ගේ සුහද වගකීම හේතුවෙන් ඔවුන් සමඟ සම්බන්ධවීමේදී තොරාගත් ප්‍රවේශයක් අපි පවත්වා ගනිමු. රක්ෂණ අවදානම් පැතිරීම සඳහා ඇපවීමට ශ්‍රේණිගත ප්‍රතිරක්ෂකයින් 103ක් සමඟ ගිවිසුම් අපි පවත්වා ගනිමු.

ප්‍රතිරක්ෂණයේ සෘජු ප්‍රතිලාභ හැරුණ විට, රක්ෂණ ක්ෂේත්‍රය, ප්‍රාරක්ෂණයට විනයගත ප්‍රවේශය සහ අපගේ නව්‍යකරණයට සහයවන ප්‍රමුඛ පෙලේ ශ්‍රේණිගත ගෝලීය ප්‍රතිරක්ෂකයින් සමඟ අපගේ දිගුකාලීන සම්බන්ධතා මගින් ලබාදුන් නවතම ගෝලීය ප්‍රවනතා දර්ශනයන් පිළිබඳ ගැඹුරු දැනුමෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ප්‍රතිලාභ ලබා ඇත.

මාර්ග හවුල්කකරුවන්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි වටිනාකම දාමයට විවිධ වර්ගයේ රක්ෂණ නිෂ්පාදන ලබාදෙන විශාල මාර්ග හවුල්කරුවන් ගණනක් ඇතුළත්ය. මෙය අපගේ දිවයින පුරා රක්ෂණ තැරැව්කරුවන්, බැංකුකරණ හවුල්කරුවන් සහ සෞඛ්‍යාරක්ෂණ හවුල්කරුවන්ගේ ජාලයේ සිට මෝටර් රථ නියෝජිතයින්, සේවා වැඩමුළු, සහ ගෙවීම් පහසුකම් ඇති කරන්නන් දක්වා පරාශ ගත වන අතර මේ සියලුම දෙනා වෙළෙඳපොලට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි වටිනාකම් කොටස සංවර්ධනය කිරීමට දායක වේ.

ගිවිසුම්වල නියමයන් සහ කොන්දේසි අවබෝධතා ගිවිසුම්වල දක්වා ඇති අතර, එය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි මෙහෙයුම් ප්‍රමිති සහ සදාචාර සංග්‍රාහය සමඟ හවුල්කරුවන්ට අනුකූලවීමට සහය වේ. මෙවැනි අවබෝධතා ගිවිසුම්වලින් ව්‍යාපාර පරාමිති දිගුකාලීන, අනෝන්‍ය ප්‍රතිලාභී සහයෝගිතාවන් සඳහා පදනම දමන බැවින් සාධාරණව සහ සමානව සලකනු ලැබේ.

අපගේ වෙළෙන්දන් සහ සේවා සපයන්නන්

අපගේ වෙළෙන්දන් සහ සේවා සපයන්නන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව බඳවා ගන්නා අතර, එය සාධාරණ සහ අපක්ෂපාතීව වෙළෙන්දන් සහ සේවා සපයන්නන් තෝරා ගැනීම සහ බඳවා ගැනීම ප්‍රවර්ධනය කරයි.

සාධාරණ සහ සදාචාර ව්‍යවහාරවල ශක්තිමත් සහයකයෙක් ලෙස, තමන් වෙත ඇති ගැටළු සහ යෝජනා ඉදිරිපත් කිරීමට වෙළෙන්දන් සහ සේවා සපයන්නන්ට පැහැදිලි මාර්ගයක් අපි සංවර්ධනය කර ඇත. මේ ආකාරයෙන් ලැබෙන සියලුම පැමිණිලි සහ යෝජනා අපගේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රමිති මෙහෙයුම් ක්‍රියාපටිපාටිවලට අනුකූලව සමාලෝචනය කර විසඳනු ලැබේ.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

අලෙවි වැඩසටහන්

1. ප්‍රසාද දීමනා ප්‍රකාශ කිරීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් එහි ජීවිත රක්ෂණ ඔප්පුහිමියන්ට 2022 වසර සඳහා රු. බිලියන 10.49ක් වන රටේ මෙම ක්ෂේත්‍රය සඳහා මේ දක්වා ඉහළම ජීවිත රක්ෂණ ප්‍රසාද දීමනාව ප්‍රකාශයට පත් කළේය. 2006 සිට මේ දක්වා ඔප්පුහිමියන්ට ප්‍රකාශයට පත් කළ මුළු ජීවිත රක්ෂණ ප්‍රසාද දීමනාව රු. බිලියන 92.8කි.

ප්‍රසාද දීමනා සහතික පත් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ජංගම යෙදුමට භාගත කර ලබාගත හැකි අතර ඉ- ප්‍රසාද දීමනා සහතික පත් ගනුදෙනුකරුවන්ගේ පහසුව සහ රටේ තිරසාර වැඩසටහන්වලට සහයවීම මෙයට එකතුකළ අමතර අංග වෙති.

2. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ලෝක ළමා දිනයේදී නොමිලේ ජීවිත රක්ෂණ ආවරණයක් පිරිනමයි

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ජාතියේ ළමුන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීමට සෑමවිටම අමතර පියවරක් තබා ඇත. 2022 ලෝක ළමා දිනය සැමරීමේදී, 2022 ඔක්තෝබර් 1 දින උපන් සෑම ළමයෙකුගේ දෙමව්පියන් සඳහා නොමිලේ ජීවිත රක්ෂණ ආවරණයක් පිරිනමන ලදී. ළමයා සඳහා අරක්ෂිත අනාගතයක් සහතික කිරීමට එක් වසරක කාලසීමාවක් සඳහා ළමයාගේ දෙමව්පියන්ගෙන් එක් අයෙක් සඳහා රු. මිලියන 1ක ආවරණයක් ලබාදෙන අතර 1,000ට වැඩි ළමුන් මෙම විශේෂ පිරිනැමීම යටතේ ආවරණය විය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි උපදේශකයින් මෙම ආවරණයට සුදුසු ළමුන් සියලුම දෙනා සහතික කිරීමට මෙම දිනය තුළ සියලුම රෝහල් වෙත සංචාරය කළේය.



3. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින් අපේක්ෂා පිලිකා රෝහල වෙත පහසුකම් වැඩි කිරීමට දායක විය.

2015 දී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින් ආරම්භ කළ කෝල් ටු ඩොනේට් වැඩසටහන වසර පුරා අපේක්ෂා පිලිකා රෝහලේ රෝගීන් වෙත මූල්‍ය සහ මූල්‍ය නොවන පරිත්‍යාග ලබාදීමේදී මූලික විය. වසරේ අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් තුළද, මෙම දායකත්වයන් මෙම රෝහලෙන් ප්‍රතිකාර ලබා ගන්නා බොහෝ පුද්ගලයින්ට ජීවන තත්ත්වය වර්ධනය කර ගැනීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය.

මෙම ව්‍යාපෘතිය තුළ තවත් එක් සන්ධිස්ථානයක් සලකුණු කරමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ළමා වාට්ටුවේ වෙන් වූ ඒකක දෙකක් ඉදිකිරීමට පහසුකම් සලසන ලද අතර 2022 දී අපේක්ෂා රෝහල වෙත අත්‍යවශ්‍ය ඖෂධ පරිත්‍යාග කරන ලදී.

4. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින් AIMG සමඟ උපායමාර්ගික හවුල්කාරත්වයකට ඇතුළත් විය.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින් AIMG (ජාත්‍යන්තර අලෙවි උපාධිධාරීන්ගේ සංගමය) සමඟ උපායමාර්ගික හවුල්කාරත්වයකට ඇතුළත් වූ අතර, ශ්‍රී ලංකාවේ ආයතනික ලෝකය වෙනස්කරන්නන් සහ සොලවන්නන් සමඟ කාලීන සහ විවාදිත සැසි ගණනාවකට පහසුකම් සලසන ලදී. මෙම හවුල්කාරත්වයන් ජනතාව ධනවත් කර ශක්තිමත් කිරීමට සහ කැපීපෙනෙන බලකායක් ලෙස අප ජාතියේ තිරසාර සංවර්ධනය මෙහෙයවීමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ට සහය විය.

5. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෙඩි 60

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෙඩි 60 යනු සෞඛ්‍ය රක්ෂණ නිෂ්පාදනයක් වන අතර ඉන් ඉහළ දරියහැකි මිලකට ජෙෂ්ඨ පුරවැසියන්ගේ (වයස අවුරුදු 60 සහ ඉහළ) සෞඛ්‍ය අවදානම් රාශියක් ආවරණය කරයි. ඔබගේ මූල්‍ය ආයෝජනය මත පදනම් වී යෝජනා ක්‍රම 3න් ඔබට වඩාත් ගැලපෙන වෛද්‍ය සැලැස්ම තෝරා ගත හැකිය.

ප්‍රධාන නිෂ්පාදන අංග සහ නිෂ්පාදනයේ ලබාදීම් ප්‍රවර්ධනය කිරීමට අනුව රූපවාහිණිය, ගුවන් විදුලිය, මාධ්‍ය සහ සමාජ මාධ්‍ය වැඩසටහන් 2022 මාර්තු මාසයේ දියත් කරන ලදී.

6. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ලංකා මෝටර් රථ වෙළෙඳ සංගමය සමඟ උපායමාර්ගික ගිවිසුමකට ඇතුළත් විය.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශ්‍රී ලංකා මෝටර් රථ ක්ෂේත්‍රයේ නියෝජිත මණ්ඩලය වන ලංකා මෝටර් රථ වෙළඳ සංගමය (CMTA) සමඟ CMTA සාමාජිකයින් සඳහා සුවිශේෂී මෝටර් රථ රක්ෂණ යොජනා ක්‍රම ලබාදීමට උපායමාර්ගික ගිවිසුමකට ඇතුළත් වී අවබෝධතා ගිවිසුම (MoU) අත්සන් කරන ලදී.

ආයතන දෙක අතර මෙම අවබෝධතා ගිවිසුම මගින් CMTA සාමාජිකයින් සඳහා සිය ගනුදෙනුකරුවන්ට මෙන්ම නිවාස රක්ෂණය සහ ජීවිත රක්ෂණ විසඳුමක පුළුල් ප්‍රතිලාභ ලැබීමට පුළුල් මෝටර් රථ රක්ෂණ විසඳුමක් ලබාදීමට අපේක්ෂා කෙරේ. ප්‍රවර්ධන වැඩසටහනක් සහ අලෙවිකරණ සක්‍රියකිරීම් මාලාවක් හවුල්කාරත්ව ප්‍රතිලාභ ප්‍රවර්ධනය කිරීම පිණිස සිදුකරන ලදී.

7. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ඩ්‍රයිව් 60

මෝටර් ප්ලස් ඩ්‍රයිව් 60 ජෙෂ්ඨ පුරවැසියන් සඳහා අසමසම ප්‍රතිලාභ සමඟ විශේෂයෙන් සැලසුම් කළ මෝටර් රථ රක්ෂණ ඔප්පුවකි. මෙම ඔප්පුව වයස අවුරුදු 60ට වැඩි ඕනෑම අයෙකුට මිලදී ගැනීම හෝ අළුත් කිරීම කළ හැකි අතර ප්‍රතිලාභ සහ විශේෂ පැකේජයකට හිමිකම් කියයි. ප්‍රධාන නිෂ්පාදන අංග සහ නිෂ්පාදනයේ ලබාදීම් ප්‍රවර්ධනය කිරීමට අනුව රූපවාහිණිය, ගුවන් විදුලිය, මාධ්‍ය සහ සමාජ මාධ්‍ය වැඩසටහන් 2022 මාර්තු මාසයේ දියත් කරන ලදී.

8. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් පිනකල්

මෝටර් ප්ලස් පිනකල් යනු ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින් පිරිනමන ප්‍රමුඛ මෝටර් රථ රක්ෂණ නිෂ්පාදනයකි. ඉන් පුළුල් අවදානම් පරාශයකට පුළුල් ආවරණයක් සපයයි. එමෙන්ම ඉන් හදිසි නවාතැන් ආවරණය, මාර්ගයේදී සහය පිරිවැය ප්‍රතිපූරණය, බාධාරහිත හිමිකම් ක්‍රියාවලිය, සහ වාරික ගැලපීම් පාරාශයක් පිරිනමයි. මෙම නිෂ්පාදනය පුළුල් අලෙවිකරණ සන්නිවේදන වැඩසටහනක් සමඟ දියත් කරන ලද අතර විස්තීර්ණ සන්නාම සහභාගිත්ව වැඩසටහන් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට සංවිධානය කරන ලදී.

සමාජීය වැඩසටහන්

1. ජාතික දියවැඩියා දින සක්‍රීයකරණය

ලෝක දියවැඩියා දිනය සෞඛ්‍ය ගැටළුවක් ලෙස සියලුම වයස් කාණ්ඩ සහ සමාජීය පන්තිවලට බලපාන දියවැඩියාව පිළිබඳ දැනුවත්කම වැඩි කිරීමට අවස්ථාව සපයයි. ශ්‍රී ලංකාවේ බෝනොවන රෝග (NCDs) පසුගිය වසර කිහිපය තුළ පෙර නොවූවිරූ තරම් ඉහළ ගොස් ඇත. ලෝක සෞඛ්‍ය සංගමය දියවැඩියා ඖෂධ හා ආරක්ෂාව කරා පිවිසීමේදී අභියෝග සහ විසඳුම් ඉස්මතු කර දැක්වීමට මෙය අවස්ථාව කර ගනී.

දියවැඩියාව සහිත රෝග ලක්ෂණ ඇති ශ්‍රී ලාංකිකයින්ට ආවරණය ලබාදීම කෙරෙහි අවධානය යොමු කරන එකම රක්ෂකයා ලෙස සහ, රක්ෂණ යෝජනා ක්‍රමය අත්සන් කිරීමට දියවැඩියාව සහිත රෝග ලක්ෂණ ඇති ජේෂ්ඨ පුරවැසියන්ට ඉඩදෙන පළමු රක්ෂකයාවීම තුළ, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ සෞඛ්‍ය සහ නිරෝගිකම විසඳුම් සපයන්නා වන ආයුබෝ ලයිෆ් {ඩිජිටල් හෙල්ත්කෙයා සොලූසන්ස් (පුද්ගලික) සමාගම} සමඟ දියවැඩියාව වැලැක්වීම පිළිබඳ දැනුවත්කම වැඩි කිරීමට පියවර ගන්නා ලද අතර මෙම මාරක බෝනොවන රෝගයේ ගොදුරක් බවට පත්ව ඇති ශ්‍රී ලාංකිකයින්ට විශේෂ ප්‍රතිලාභ ලබා දේ.


නොවැම්බර් මාසය තුළ පහත කටයුතු පවත්වන ලදී.

අ ස්ටෙප් චැලේන්ජ්

ආයුබෝ ලයිෆ් හී අවිදින්නන්ගේ සක්‍රීය පදනමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සන්නාමකරණය සමඟ ස්ටෙප් චැලෙන්ජ් පිරිනමන ලදී. පුළුල් සමාජ මාධ්‍ය සමඟ ලෝක දියවැඩියා දිනය දියත් කිරීම සැමරීමට භෞතික උත්සවයක් පවත්වන ලදී.

මාර්ගගත දියවැඩියා තක්සේරුව - ඩිජිටල් ලෙස සිදුකළ ජාතික වැඩසටහන

සන්නාම සක්‍රීය වැඩසටහන තුළ පොදු ජනතාව අතර දියවැඩියා අවදානම තක්සේරු කිරීමට මාර්ගගත දියවැඩියා තක්සේරුව පවත්වන ලදී.



2. මෝටර් ප්ලස් ට්‍රක් හිත මිතුරෝ වැඩසටහන

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් *"ට්‍රක් හිත මිතුරෝ"* අධ්‍යාපනික සහ දැනුම ගොඩ නැගීමේ වැඩසටහන දිවයින පුරා ත්‍රිරෝද රියදුරන් වෙත සිය සේවා ලබාදීමේදී ඔවුන්ගේ වෘත්තීමයභාවය වැඩි කිරීමට ඔවුන්ට භාවිතා කළහැකි සමහර අගය එකතු කිරීම් පිළිබඳ දැනුවත් කිරීම සඳහා දියත් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය ඉංග්‍රීසි භාෂාව, තොරතුරු තාක්ෂණ සන්නිවේදන දැනුම සහ අනතුරකදී ප්‍රථමාධාර පිළිබඳ දැනුවත්කම පිළිබඳ සංවර්ධනය කිරීමට අධ්‍යාපන සහය ලබාදීම ඇතුළත් විය. මෙම වැඩසටහන සම්පූර්ණයෙන් ඩිජිටල් අධ්‍යාපනික මූලපිරීමත් ලෙස දියත් කර ඇති අතර දැනුවත්කම වැඩි කිරීමට මූලික මට්ටමේ සක්‍රීයකරණය දිවයින පුරා පවත්වන ලදී.

අනාගත ගැටළු

- 2023 සඳහා නව නිෂ්පාදන සැලසුම්

ගතික ආයතනයක් ලෙස, අපි අඛණ්ඩව වෙළෙඳපොල තුළ ගනුදෙනුකාර අවශ්‍යතා තක්සේරු කරන අතර, අපගේ ඔප්පු හිමියන්ට විශිෂ්ඨ විසඳුම් සහතික කිරීම සඳහා අපගේ නිෂ්පාදන පිරිනැමීම් ඒ අනුව ගැලපීම් කරමු. වසංගතය සහ ආර්ථික අර්බුදය සමඟ 2021 සහ 2022 තුළ ලද අවබෝධය සමඟ, නවීන ගනුදෙනුකරුට වඩාත් හොඳින් ගැලපෙන නිෂ්පාදන සහ නිෂ්පාදන වර්ධනයන් ගණනාවක් අපි හඳුන්වා දී ඇත.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය සංවර්ධනය තුළ අනාගත සැලසුම් – සාමාන්‍ය රක්ෂණය



ස්වභාවික ප්‍රාග්ධනය



තිරසාර සංවර්ධන ඉලක්ක ස-දහා දායකත්වයන්

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

- නිවාසවලින්
- රාජ්‍ය අංශය තුළින්
- පුද්ගලික අංශය තුළින්

13 CLIMATE ACTION


- ජාතික පාරිසරික ප්‍රතිපත්තියට අනුකූලතාව


ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, සේවා කර්මාන්තයක් වීම තුළ, එහි මෙහෙයුම් තුළින් පරිසරයට ඉහළ බලපෑමක් නොමැත. අපගේ ව්‍යාපාරය අමුද්‍රව්‍ය හෝ බලශක්ති මත පදනම් වීම වෙනුවට තොරතුරු මත වේ. එසේවුවත්, අපගේ කටයුතු අප භාවිතා කරන විදුලිය, ජලය සහ කඩදාසි සහ අප උපදවන අපද්‍රව්‍ය, කඩදාසි සහ ඉ-අපද්‍රව්‍ය මගින් පරිසරයට යම් බලපෑමක් ඇත. මේ සියලුම කටයුතු වෙනුවෙන් සෘජුව හෝ වක්‍රව යම් ස්වභාවික සම්පත් පරිභෝජනය කරයි.


මූලික සංඛ්‍යා ලේඛණ සිදුවීම්

ආයෝජනය	ඒකක	2022	2021	වෙනස %
විදුලි පරිභෝජනය	kWH	4,704,441	4,817,121	(2.3)%
ජල පරිභෝජනය	m^3	45,007	52,047	(13.5)%
කඩදාසි	1000 Kgs.	36	39	(7.6)%

අපගේ මෙහෙයුම් පරිසර හිතකාමී ආකාරයකින් පවත්වන බව සහතික කිරීමට අපි උනන්දු වෙමු. මේ සඳහා අපි කාබන් රහිත පරිසරයක් වෙනුවෙන් අඛණ්ඩව ආයෝජන සිදු කර ඇත්තෙමු. ඩිජිටල්කරණය පිළිබඳ අපගේ අවධානය ද අපගේ පාරිසරික උත්සාහයන්ට දායක වේ. අපගේ පද්ධති සහ ක්‍රියාවලි පරිගණකගත කිරීම සහ ස්වයංක්‍රීයකරණය සඳහා වෙනත් නව්‍යකරණ තුළින් අපගේ කඩදාසි පරිභෝජනය අවම කරයි. අපි අපගේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාව වැඩි කර ඇති අතර ඒ තුළින් අපද්‍රව්‍ය අවම කරයි.







පරිසරය සුරක්ෂිත කිරීමට ගත් ක්‍රියාමාර්ග

1. **පාරිසරික රෙගුලාසි සමඟ අනුකූලතාව**
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, සේවා ආයතනයක් ලෙස, යම් පාරිසරික රෙගුලාසිවලට නීතියෙන් බැඳි නොමැත යන කාරණය හමුවේ, අපගේ මෙහෙයුම් ජාතික පරිසරික ප්‍රතිපත්තිය සමඟ කටයුතු කරන බව අපි ස්වේච්ඡාවෙන් සහතික කරමු. සමාගම විසින් යම් පාරිසරික නීතිවලට අනුකූල නොවූ කිසිදු අවස්ථාවක් නොමැත.

2. **පරිභෝජනය පරීක්ෂාව සහ නියාමනය**
අපි අපගේ විදුලිය, ජලය, සහ කාඩ්දාසි අපද්‍රව්‍ය උත්පාදනයන වී පිළිබඳ පරීක්ෂාකාරී පසුවිපරම් කරමු. මෙම පසුවිපරම සහ නියාමනය අපගේ ස්වභාවික සම්පත් භාවිතය සහ අපගේ කාබන් රහිත පරිසරයක් ඇති කිරීමට අපට හැකියාව ඇති කරයි.

3. **ඩිජිටල්කරණය සහ කඩදාසි රහිත කාර්යාලයක් කරා ගමන් කිරීම**
අපගේ ඩිජිටල් උපායමාර්ගය අපගේ සියලුම මෙහෙයුම් ස්වයංක්‍රියකරණය සහ කඩදාසි භාවිතය අඩු කිරීම වෙත අපව මෙහෙයවා ඇත. අපි හැකිතරම් දුරට කඩදාසි පදනම් ක්‍රියාවලි අඩුකර ඇති අතර, ඩිජිටල්කළ ලියවිලි හුවමාරුව වෙත ගමන් කර ඇත. ඒ මගින් පසුගිය වසර කිහිපය පුරා අපි ක්‍රමයෙන් කඩදාසි පරිභෝජනය අඩු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම් කඩදාසි රහිත බවට පත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ස්වයංක්‍රියකරණ තාක්ෂණය හඳුන්වා දී ඇත.

අනාගත දැක්ම

ව්‍යාපාර ක්‍රියාවලි ඩිජිටල්කරණය

ඩිජිටල්කරණය තුළ තවදුරටත් බොහෝ සංවර්ධන අපි අපේක්ෂා කරමු. අපි දැනටමත් අලෙවි බලකායේ ක්‍රියාවලිය සංවයංක්‍රිය කර ඇත. කාඩ්පත් මත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පාරිභෝගික යෙදුමේ තවදුරටත් වැඩිදියුණු කිරීම්, කළමනාකරණය දියත් කිරීම උපකරණ පුවරු, සහ අභ්‍යන්තර ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වැඩ ප්‍රවාහ කළමනාකරණ විසඳුම ක්‍රියාත්මක කිරීම. ඵලදායී ව්‍යාපාර තීරණ ගැනීම සඳහා ඩිජිටල් වේදිකා ව්‍යාපාර විශ්ලේෂණ සඳහා පහසුකම් සපයනු ඇත. ඉදිරියට එන අනෙකුත් වර්ධනයන් අතරට මෝටර් රථ හිමිකම් ඩිජිටල්කරණය සහ ජීවිත හා සාමාන්‍ය රක්ෂණයේ නව නිෂ්පාදන වර්ධනයන් ඇතුළත් වේ. මේ සියල්ල අපව කඩදාසි රහිත පරිසරයකට සමීප කරවන අතර ස්වභාවික සම්පත් වඩාත් වගකීමෙන් පරිභෝජනය කිරීම කරා ගෙන යනු ඇත.

කාබන් උදාසීන කිරීම තුළ ආයෝජනය


ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි හරිතාගාර වායු තක්සේරු කිරීම ආරම්භ කර ඇති අතර එහි ප්‍රතිඵල තුළින්, අපි කාබන් උදාසීනතාව ක්‍රමානුකූලව හඳුනා ගැනීමට අපි අපේක්ෂා කරමු.

මෙම නියෝගය තුළ අනාගතයේදී ගනු ලබන පියවර පහත දැක්වේ.

- 2021 දී අප දිනාගත් කාබන් පාසටහන් සහතිකය පවත්වා ගැනීමග ISO 14064-1:2018 හි අවශ්‍යතා සමඟ අනුකූල වෙමින් හරිතාගර වායු සත්‍යාපන මතය සහතික කිරීමේ සාධාරණ මට්ටම සමඟ ISO-14064-3:2019 හි පිරිවිතරවලට අනුකූලව සත්‍යාපනය කරන ලදී.
- හරිතාගාර වායු විමෝචනය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමට සේවකයින් සඳහා වැඩසටහන් පැවැත්වීම සහ කාබන් උදාසීනතාව අත්කර ගැනීම අරමුණු කළ පාරිසරික වැඩසටහන්වල ඔවුන්ගේ සහභාගිත්වය ලබා ගන්නා ලදී.

79-106

පාලනය සහ අවදානම් පාලනය



> 80 ආයතනික පාලන වාර්තාව

> 84 විගණන හා අනුකූලතා කමිටු වාර්තාව

> 86 ආයෝජන කමිටු වාර්තාව

> 90 අවදානම් කළමනාකරණ වාර්තාව

> 98 අනුකූලතා වාර්තාව

> 106 අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය

ආයතනික පාලන වාර්තාව

සභාපතිතුමාගේ හැඳින්වීම

සභාපති ලෙස, අපි ආයතනික පාලනය පිළිබඳ මූලධර්ම වෙනුවෙන් කටයුතු කරමින් ඒවා පිළිපදින බව සහතික කිරීමට අප දැනටමත් යොදා ගෙන ඇති ආයතනික පාලන සහ ක්‍රියාමාර්ගවලට අපගේ බැඳීම පිළිබඳ පාර්ශවකරුවන්ට දැනුම්දීම සඳහා මෙය අවස්ථාව කර ගැනීමට මම කැමැත්තෙමි.

රජයට අයත් ව්‍යවසායක් ලෙස, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඉක්මන් සහ කඩිසර තීරණ ගැනීමට පහසුකම් සැලකීමේ අරමුණින් ව්‍යාපාරය තුළ වගවීම, විනිවිදභාවය සහ සදාචාර කළමනාකරණය සහ සාධාරණත්වය මත ඉදිරිපත්කළ යහපත් පාලන ව්‍යවහාර යොදාගෙන ඇති අතර එයට චර්යා ධර්ම සහ ආචාර ධර්ම සංග්‍රහයන්, නිරන්තර අවදානම් තක්සේරු කිරීම් සහ ශක්තිමත් මූල්‍ය පාලනයක් ඇතුළත්ය.

ආයතනික පාලනයේ කුළුණු හතර එනම් වගකීම, වගවීම, විනිවිදභාවය සහ සාධාරණත්වය මත සමාගම ක්‍රියාත්මක කරවීම සඳහා කළමනාකරණය හැඩය සහ නුවමාරු වටිනාකම් නියම කරයි. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කළ 17 නියෝගය පරිදි, "ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය – 2017" හි විධිවිධානවලට අපි අනුකූල වෙමු. ඊට අමතරව, මුදල් අමාත්‍යාංශය 2021 නොවැම්බර් 17 සිට බලාත්මක වන පරිදි "රජයට අයත් ව්‍යවසාය සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සහ මෙහෙයුම් අත්පොත" නිකුත් කර ඇති අතර, එකී සංග්‍රහයේ මූලධර්ම අපි දැනටමත් අනුගමනය කරන අතර එකී සංග්‍රහයට අනුකූලව පාලන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමට අපි කටයුතු කරමු.

ආයතනික පාලන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමේ කොටසක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩලය මෑතදී "අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන්කළ කරුණු පිළිබඳ උපලේඛනය" යොදා ගත් අතර එහි අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය යටතේ පවත්න කරුණු සහ කළමනාකරණයට පැවරිය යුතු කරුණු පැහැදිළිව දක්වන අතර ඉන් වැඩිදුරටත් පාර්ශවකරුවන්ට පැහැදිලිතාව ලබා දෙමින් උපායමාර්ගික කරුණු සහ අවදානම් අඩු කිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කරවයි. කෙටියෙන් නම්, මෙහි දක්වා ඇති පරිදි අපි ආයතනික පාලනය පිළිබඳ ශක්තිමත් රාමුවක් ස්ථාපිත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවලට දක්ෂතාව, පළපුරුද්ද සහ දැනුම පිළිබඳ සංයෝජනයක් සතුවන අතර සමාගමේ ආයතනික පාලනය සඳහා හැඩය නියම කිරීමේදී එය අත්‍යවශ්‍ය වී ඇති බව අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සහතික කරයි. පැහැදිලි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ස්ථාපිත ක්‍රියාත්මක කිරීම, කළමනාකරණය අධීක්ෂණය කිරීම, ස්වාධීන විගණන කමිටු පිහිටුවීම සහ පාර්ශවකරුවන්ට විධිමත් වාර්තාකරණය මගින් පාලන රාමුව තිරසාරාත්මක වේ. අධ්‍යක්ෂ මණ්ඩලය නිරතුරුව මාසයකට වරක් මුණ ගැසෙන අතර විධායක කළමනාකරණයේ කාර්යසාධනය නියාමනය කරයි. විධායක නොවන අධ්‍යක්ෂවරු සහයෝගී ප්‍රතිපෝෂණ ලබා දෙන අතර විශේෂ උපදෙස් පිරිනමයි.

ව්‍යාපාරයේ දිගුකාලීන සාර්ථකත්වය සඳහා ආයතනික පාලනය අත්‍යවශ්‍ය බව අපි දැඩිව විශ්වාස කරමු. මෙම ක්ෂේත්‍රය තුළ විශිෂ්ඨත්වය සඳහා අප අඛණ්ඩව උත්සාහ කරන අතර පහත සඳහන් වාර්තාව අපි කටයුතු කරන ආකාරය පෙන්වා දේ.




රොනල්ඩ් සී පෙරේරා, ජනාධිපත් නීතිඥ
සභාපති

2023 මැයි 10

පාලන රාමුව

සමාගම අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු මගින් විධිමත් ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, මාර්ගෝපදේශ සහ අදාළ කළමනාකරණ වාර්තාකරණය මාර්ග ඇතුළුව සිය මෙහෙයුම්වල සෑම අංශයකම පාලන රාමුවක් යටතේ පවත්වාගෙන යනු ලැබේ.



අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

වාර්තා කරන දිනය වන විට මණ්ඩලය අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත විය. විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ අදාල ක්ෂේත්‍රවල කීර්තිමත් වෘත්තිකයන් වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායී මෙහෙයුම් අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පුළුල් ව්‍යාපාරික අත්දැකීම් මණ්ඩලයේ සංයුතිය මගින් සපයන බව මණ්ඩලයේ අදහස වන අතර එක් එක් අධ්‍යක්ෂවරුන් විවිධ කුසලතා, දැනුම අත්දැකීම් ගෙන එති. රජය සතු ව්‍යවසායයක් වීම මත අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන කොටස් හිමියා ලෙස රජය සහ සමාගම සහ එහි කළමනාකරණය අතර අතරමැදියෙකු ලෙස කටයුතු කරයි. සමස්ථ භාරකාරත්වය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු අතර පාර්ශවකරුවන්ට දිගු කාලීන වටිනාකම් ලබා දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටු හරහා ඍජුව හා වක්‍රව නායකත්වය සපයයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ පාලනය සහ සැලසුම් කිරීමයි. සමාගමේ මූල්‍ය හා වාණිජ කාර්යසාධනය මණ්ඩලය විසින් නිරන්තරයෙන් තක්සේරු කරනු ලැබේ. ඊට අමතරව, සමාගම විසින් නිරාවරණය කළ හැකි සියලු අවදානම් කළමනාකරණය කිරීමේ ප්‍රමාණවත් බව මණ්ඩලය සමාලෝචනය කර තක්සේරු කරයි.

සමාගම් ලේකම්

පාලන රාමුවේ සම්පූර්ණත්වය සහතික කිරීම සඳහා සමාගම් ලේකම් වගකීම දරයි. සමාගම් පනතේ සහ පාලන නීති සංග්‍රහයේ දක්වා ඇති සමාගම් ලේකම්ගේ බැඳීම් සහ වගකීම් සමාගමේ යහපාලනය සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කිරීම අවශ්‍ය වේ. සියලුම අධ්‍යක්ෂකවරුන්හට සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන් ලබාගත හැකි වන අතර, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටීන්ට අනුකූලව අදාල කටයුතු කරන බවට අධ්‍යක්ෂක මණ්ඩලයට සමාගම් ලේකම් වගකිවයුතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ කමිටු ක්‍රියාපටිපාටි

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු පිහිටුවීම මණ්ඩලයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ඉවහල් වන අතර උපාය මාර්ග, විගණන, අනුකූලතා ආයෝජන, මානව සම්පත් සහ අවදානම් කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි මණ්ඩලයට වටිනාකමක් එක් කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය, සැලසුම් කිරීම සහ තීරණ ගැනීමේ කාර්යයන් සඳහා සහාය වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන හා අනුකූලතා කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව, ආයෝජන කමිටුව, උපායමාර්ගික සමාලෝචන කමිටුව, මානව සම්පත් කමිටුව සහ ඩිජිටල් පරිනාමන කමිටුව යන උප කමිටු හයක් පිහිටුවා ඇත. අළුතින් පිහිටවූ ඩිජිටල් පරිනාමන කමිටුව සමාගමේ ඩිජිටල් පරිනාමන ගමන ඉදිරියට ගෙන යාමේදී ඉවහල් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රඥප්ති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සහ වරින් වර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීමෙන් කමිටු පාලනය කරනු ලබයි.

2022 දී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු ගණන සහ මෙම රැස්වීම්වලට සහභාගී වන එක් එක් අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීමේ විස්තර පහත දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් – 2022

සියළුම රාජකාරී ඵලදායී ලෙස ඉටු කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් ලෙස නිතිපතා රැස්වේ. නොවැළැක්විය හැකි තත්ත්වයන් හේතුවෙන්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වීමට නොහැකි නම්, එකී අධ්‍යක්ෂවරයාට න්‍යාය පත්‍රයේ කරුණු පිළිබඳව සභාපතිවරයා, ප්‍රධාන විධායක නිලධාරියා හෝ සමාගම් ලේකම් සමඟ රැස්වීමට පෙර සාකච්ඡා කර අදහස් හුවමාරු කර ගත හැකිය.

2022 දී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් විසි එකක් පැවැත්විණි.

අධ්‍යක්ෂගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
ඉංජිනේරු විජිත හේරත් (2022 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	13
කේ ඒ විමලෙන්තිරරාජා (2022 මාර්තු 14 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	2
අනිල් මීගහගෙදර මහතා (2022 අගෝස්තු 22 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	12
අනිල් කොස්වත්ත මහතා	17
නිශාන්ත දයානන්ද මහතා	20
සුරේඛා අලස් මහත්මිය (2022 අගෝස්තු 22 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	13
සමන්ත උපනන්ද මහතා (2022 සැප්තැම්බර් 30 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	13
ආර් ඒ එල් උදය කුමාර මහතා (2022 මාර්තු 14 පත්කළ අතර 2022 සැප්තැම්බර් 30 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	11
ජනාධිපති නීතිඥ රොන්ල්ඩ් සී පෙරේරා මහතා (2022 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)	7
දුෂ්මන්ත තොටවත්ත මහතා (2022 අගෝස්තු 22 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)	7
ආචාර්ය කිත්සිරි මංචනායක (2022 අගෝස්තු 22 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)	7
නයෝමාල් පෙරේරා මහතා (2022 සැප්තැම්බර් 30 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)	4
රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා (2022 සැප්තැම්බර් 30 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)	5

විගණන හා අනුකූලතා කමිටු රැස්වීම් (ACCM) – 2022

2022 වර්ෂය තුළ දී විගණන හා අනුකූලතා කමිටු රැස්වීම් පහක් පවත්වා ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිතයා කමිටුවේ සභාපති ලෙස කටයුතු කළේය.

අධ්‍යක්ෂගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
සමන්ත උපනන්ද මහතා (කමිටුවේ සභාපති – විධායක නොවන අධ්‍යක්ෂක) (2022 සැප්තැම්බර් 30 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	3
අනිල් මීගහගෙදර මහතා (2022 අගෝස්තු 22 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	3
නිශාන්ත දයානන්ද මහතා	5
දුෂ්මන්ත තොටවත්ත මහතා (කමිටුවේ සභාපති – විධායක නොවන අධ්‍යක්ෂක)	2
රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා	2

සටහන: වර්තාකරන දිනයට පහත සාමාජිකයින් ACC කමිටුවේ සාමාජිකයින් විය.

දුෂ්මන්ත තොටවත්ත මහතා – කමිටුවේ සභාපති
(2022 අගෝස්තු 22 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)

නිශාන්ත දයානන්ද මහතා

රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා
(2022 සැප්තැම්බර් 30 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)

ආයෝජන කමිටු රැස්වීම – 2022

2022 වර්ෂය තුළ දී ආයෝජන කමිටු රැස්වීම් පහලොවක් පවත්වා ඇත.

අධ්‍යක්ෂගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
කේ ඒ විමලෙන්තිරරාජා (කමිටුවේ සභාපති – විධායක නොවන අධ්‍යක්ෂක) (2022 මාර්තු 14 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	2
ඉංජිනේරු විජිත හේරත් (2022 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	4
අනිල් මීගහගෙදර මහතා (2022 අගෝස්තු 22 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	10
සුරේඛා අලස් මහත්මිය (2022 අගෝස්තු 22 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	9
ආර් ඒ එල් උදය කුමාර මහතා (කමිටුවේ සභාපති – විධායක නොවන අධ්‍යක්ෂක) (2022 මාර්තු 14 පත්කළ අතර 2022 සැප්තැම්බර් 30 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	8
ජනාධිපති නීතිඥ රොන්ල්ඩ් සී පෙරේරා මහතා (2022 අගෝස්තු 01 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)	4
ආචාර්ය කීත්සිරි මංචනායක (2022 අගෝස්තු 22 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)	4
දුෂ්මන්ත තොටවත්ත මහතා (2022 අගෝස්තු 22 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)	4
රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා (කමිටුවේ සභාපති – විධායක නොවන අධ්‍යක්ෂක) (2022 සැප්තැම්බර් 30 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)	2

අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම – 2022

2022 වර්ෂය තුළ දී අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් පවත්වා ඇත. කමිටුවට පුළුල් සාමාජිකත්වයක් ඇති අතර ඔවුන් මූල්‍ය, ආයෝජන, ආයුගණක, ප්‍රතිරක්ෂණ, අනුකූලතා, අභ්‍යන්තර විගණන, මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව යන අවදානම් කළමනාකරුවන් විවිධ කණ්ඩායමක් නියෝජනය කරයි. රැස්වීම් විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විසින් මෙහෙයවන ලදී.

අධ්‍යක්ෂගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
සුරේඛා අලස් මහත්මිය (කමිටුවේ සභාපති – විධායක නොවන අධ්‍යක්ෂක) (2022 අගෝස්තු 22 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	2
අනිල් මීගහගෙදර මහතා (2022 අගෝස්තු 22 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	1
සමන්ත උපනන්ද මහතා (2022 සැප්තැම්බර් 30 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	2
නයෝමාල් පෙරේරා මහතා (කමිටුවේ සභාපතs – විධායක නොවන අධ්‍යක්ෂක) (2022 සැප්තැම්බර් 30 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)	1
ආචාර්ය කීත්සිරි මංචනායක (2022 අගෝස්තු 22 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)	1
දුෂ්මන්ත තොටවත්ත මහතා (2022 අගෝස්තු 22 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)	1

මානව සම්පත් කමිටු රැස්වීම් – 2022

2022 වර්ෂය තුළ දී මානව සම්පත් කමිටු රැස්වීම් නවයක් පවත්වා ඇත. රැස්වීම් විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විසින් මෙහෙයවන ලදී.

අධ්‍යක්ෂගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
නිශාන්ත දයානන්ද මහතා (කමිටුවේ සභාපති – විධායක නොවන අධ්‍යක්ෂක)	9
අනිල් කොස්වත්ත මහතා (2022 ජූලි 08 දක්වා සාමාජිකයෙක් ලෙස සේවය කරන ලදී)	5
ඉංජිනේරු විජිත හේරත් (2022 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	3
සුරේඛා අලස් මහත්මිය (2022 අගෝස්තු 22 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	4
ජනාධිපති නීතිඥ රොන්ල්ඩ් සී පෙරේරා මහතා (2022 අගෝස්තු 01 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)	4
ආචාර්ය කීත්සිරි මංචනායක (2022 අගෝස්තු 22 දින බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී)	4

ඩිජිටල් පරිනාමන කමිටුව තොරතුරු ප්‍රවාහය

ඩිජිටල් පරිනාමන කමිටුව සමාගමේ ඩිජිටල් උපායමාර්ගය සහ නව, නව්‍යකරණ තාක්ෂණික විසඳුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය සහ උපදෙස් ලබා දෙන අතර ඔවුන් පුළුල්ව පැතිරුණු යොදා ගැනීම සහ සාර්ථකත්වය සහතික කරමින් සමස්ථ ආයතනය පුරා ඩිජිටල් තාත්ෂණ සහ ක්‍රියාපාටිපාටි එළඳායී ඒකාබද්ධ කිරීමට පහසුකම් සලසයි. කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විසින් මෙහෙයවන අතර ඔහු පිළිගත් තොරතුරු තාක්ෂණ වෘත්තිකයෙකි.

උපායමාර්ගික සමාලෝචන කමිටුව

උපායමාර්ගික කමිටුවේ ප්‍රධාන අරමුණ වන්නේ සමාගමේ උපායමාර්ගික සැලැස්ම සම්බන්ධ අවදානම් නිර්මාණය හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධීක්ෂණ වගකීම් ඉටු කිරීමේදී සහ සමාගමේ උපායමාර්ගික දිශාව, දිගුකාලීන පරමාර්ථ සහ ප්‍රධාන වැඩසටහන් සමාලෝචනය කර තක්සේරු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ සහ මඟපෙන්වීම ලබා දෙමින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවීමයි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණය අතර සහයෝගී සහ අන්තර ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාවලියක් දිරි ගැන්වීමට මෙම කමිටුව ස්ථාපිත කර ඇත.

අපගේ වෙනත් කමිටු

ඉහත සඳහන් මණ්ඩල අනු කමිටුවලට අමතරව ප්‍රධාන විධායක නිලධාරියාට සහාය වීම සඳහා විධායක කමිටුව (EXCO) ප්‍රතිරක්ෂණ කමිටුව, විගණන පසු විපරම් කමිටුව, ශාඛා කළමනාකරණ ඉදිරි දැක්ම කමිටුව, නීති කමිටුව සහ විකුණුම් හා අලෙවිකරණ සමාලෝචන කමිටුව යන මෙහෙයුම් කමිටු පවතී. මේ සියල්ල පාලන ව්‍යුහය තුළ අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. සාමාජිකයින් සමාගම තුළින් සහ ඔවුන්ගේ අදාළ විශේෂඥ ක්ෂේත්‍රයන්ට අනුකූලව තෝරා ගනු ලැබේ. විධායක කමිටුව උපාය මාර්ග, මෙහෙයුම් සැලසුම්, ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ අයවැය ආදිය සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් ව්‍යාපාරයේ එදිනෙදා කටයුතු කළමනාකරණය කරයි. ආයතනික උපායමාර්ග සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විධායක කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධව කටයුතු කරයි. විධායක කමිටුව මාසිකව හා අවශ්‍ය පරිදි රැස්වේ. විධායක කමිටුවේ රැස්වීම් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා වන කමිටුවේ සභාපති විසින් ඕනෑම අවස්ථාවක එහි විමර්ශන කොන්දේසිවලට යටත් වන කරුණු සලකා බලයි.

තොරතුරු ප්‍රවාහය

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අනු කමිටු රැස්වීම් වලදී දැනුවත් තීරණයක් ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකි වන පරිදි අවශ්‍ය තොරතුරු බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සියළුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනු කමිටු රැස්වීම් වලට පෙර සවිස්තරාත්මක ලිපි ලේඛන සපයනු ලැබේ. විධායක කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයින් සහ අනෙකුත් ප්‍රධාන සේවකයින් සහභාගී වන අතර සුදුසු පරිදි රැස්වීම් නියෝජනය කරති. අධ්‍යක්ෂවරුන් වශයෙන් තම රාජකාරී ඉටු කිරීමේදී සමාගමේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට බලය ඇත. ඊට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටීන් නිරීක්ෂණය කිරීම සහතික කිරීම සහ ආයතනික පාලන කාරණා සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් දීම සම්බන්ධයෙන් වගකිව යුතු සමාගම් ලේකම්ගේ සේවාවන්ට සියලුම අධ්‍යක්ෂවරුන්ට ප්‍රවේශය ඇත. සියලුම අධ්‍යක්ෂවරුන්ට ඉලෙක්ට්‍රොනික අවකාශයක් තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අදාළ අනුකමිටු පත්‍රිකා සඳහා ප්‍රවේශය ඇති අතර, ඒ මගින් අධ්‍යක්ෂවරුන්ට තොරතුරු කාලෝචිත සහ ආරක්ෂිතව ලබා දීම සහතික කරන අතරම අධ්‍යක්ෂ මණ්ඩල/කමිටු රැස්වීම්වල පාරිසරික බලපෑම අවම කරයි. සියලුම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම් වාර්තා වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය වාර්තාකරණය

අදාළ නීති හා රෙගුලාසි වලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් වගකිව යුතු වේ.

අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය

මෙම මූල්‍ය ප්‍රකාශන මගින් ආවරණය වන කාල සීමාව තුළ සහ මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රියාත්මක කළ අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායීතාවය සමාලෝචනය කර ඇති බව අධ්‍යක්ෂවරු සනාථ කරති. සමාගමේ අභ්‍යන්තර පාලන රාමුව තුළට ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, ක්‍රියාවලි, කාර්යයන් සහ හැසිරීම් ඇතුළත් වේ. සමාගමට අභ්‍යන්තර විගණන කාර්යයක් ඇති අතර එය මණ්ඩලයේ සභාපතිවරයාට සහ විගණන හා අනුකූලතා කමිටුවේ සභාපතිවරයාට වාර්තා කිරීමේ මාර්ගයක් ඇත. සෑම කමිටු රැස්වීමකදීම විගණන හා අනුකූලතා කමිටුව විසින් මෙම කාර්යය සම්බන්ධයෙන් වාර්තා ලබා ගනී. ඊට අමතරව, GRC – පාලනය, අවදානම් සහ අනුකූලතා රාමුව යටතේ සමාගම ප්‍රධාන අවදානම් හතරකට එනම් උපායමාර්ගික, මූල්‍ය, (වෙළෙඳපොල අවදානම් ඇතුළුව) මෙහෙයුම් (කීර්තිනාම අවදානම් ඇතුළුව) සහ උපදව යන කාරණයන්ට අදාළව ව්‍යවසාය අවදානම් කළමනාකරණය (ERM) පිළිබඳ සාකල්‍යවාදී දැක්මක් අදාළ කර ගනී.

විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව

විගණන සහ අනුකූලතා කමිටුව සමාගමේ මූල්‍ය තත්ත්වය නිවැරදිව පිළිබිඹු කරන බව සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය සමාගම වගකීම්සහගත සහ අනුකූල ආකාරයෙන් ක්‍රියාත්මක කරන බව සහතික කිරීම සඳහා මූලිකව වගකීමට බැඳේ. විගණන සහ අනුකූලතා කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු අතර, සාමාජිකයෙක් ලෙස සේවය කරන ඔහු භාණ්ඩාගාර අධ්‍යක්ෂවරයෙක් වන ජේෂ්ඨ වරලත් ගණකාධිකාරිවරයෙකි. සමාගම් ලේකම්වරයා රැස්වීම්වල ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි. අනුකූලතා කටයුතු සහ විගණන කටයුතු ද්විත්වයම විගණන සහ අනුකූලතා කමිටුව වෙත වාර්තා කරනු ලැබුව ද, මෙහෙයුම් ස්වාධීනත්වය ඒවා වෙන් කිරීම තුළින් පවත්වා ගනී.

කමිටුවට එහි රාජකාරි ඵලදායීව කරගෙන යාමේදී මූල්‍ය, විගණන, නීති සහ රක්ෂණයේ ප්‍රවීනත්වය සහිත ජේෂ්ඨ කාර්ය මණ්ඩලය විසින් සහයවන අතර එයට මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය, අනුකූලතාව සහ බාහිර විගණනය අධීක්ෂණය ඇතුළත්ය.

විෂය නිර්දේශය

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ (SLIC) විගණන සහ අනුකූලතා කමිටුවේ (ACC) විෂය නිර්දේශය ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය මගින් 2017 වර්ෂයේ දී ඒකාබද්ධව නිකුත් කරන ලද "ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය" ඇතුළු විගණන කමිටු පිළිබඳ මාර්ගෝපදේශ, මූලධර්ම සහ මනා පරිචයන් මත පදනම් වන අතර අධ්‍යක්ෂ මණ්ඩල විගණන සහ අනුකූලතා කමිටු (ACC) ප්‍රඥාප්තියේ පැහැදිලිව නිර්වචනය කර තිබේ. සමාගමේ කළමනාකාරීත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ස්ථාපනය කරන ලද මූල්‍ය, ගිණුම්කරණය, ප්‍රසම්පාදනය, නෛතික අනුකූලතාව සහ ආචාර ධර්මවලට අදාළව සමාගමේ අනාවරණය කිරීමේ ක්‍රම සහ පාලන සහ අභ්‍යන්තර පාලන පද්ධති මෙම ප්‍රඥාප්තියේ විෂයපථය මගින් ආවරණය කෙරේ. මෙම කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු අතර එහි ක්‍රියාකාරකම් පිළිබඳව කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට විධිමත්ව වාර්තා කරයි.

කමිටුවේ රැස්වීම්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වසර තුළ, කමිටු රැස්වීම් පහක් පවත්වන ලදී. ප්‍රමාණවත් විස්තර සහිතව කමිටු රැස්වීම්වල වාර්තා ඉදිරිපත් කරනු ලබන අතර එම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ද විධිමත්ව වාර්තා කරයි. ආරාධනය අනුව විගණකාධිපතිවරයාගේ නියෝජිතයින් මෙම රැස්වීමට සහභාගී වේ.

2022 දී කමිටු රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පහත දක්වා ඇත:

2022 වසර තුළ, කමිටු රැස්වීම් පහක් පවත්වන ලදී. භාණ්ඩාගාර නියෝජිතයින් කමිටුවේ සභාපති ලෙස කටයුතු කර ඇත.

අධ්‍යක්ෂගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
සමන්ත උපනන්ද මහතා (කමිටුවේ සභාපති – විධායක නොවන අධ්‍යක්ෂක) (2022 සැප්තැම්බර් 30 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	3
අනිල් මීගහගෙදර මහතා (2022 අගෝස්තු 22 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක ධූරය අවසන් කරන ලදී)	3
නිශාන්ත දයානන්ද මහතා	3
දුෂ්මන්ත තොටවත්ත මහතා (කමිටුවේ සභාපති – විධායක නොවන අධ්‍යක්ෂක)	5
රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා	2

වර්තාකරන දිනයට, පහත විධායක නොවන අධ්‍යක්ෂවරුන් විගණන සහ අනුකූලතා කමිටුවේ සේවය කළේය – දුෂ්මන්ත තොටවත්ත මහතා, නිශාන්ත දයානන්ද මහතා සහ රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා.

අභ්‍යන්තර විගණනය

සමාගම සතුව සුදුසුකම් ලත් වරලත් ගණකාධිකාරිවරයෙක් විසින් මෙහෙයවන අභ්‍යන්තර විගණන අංශයක් ඇත. අභ්‍යන්තර විගණන වැඩසටහන විගණන සහ අනුකූලතා කමිටුවට ඉදිරිපත් කර අනුමත කර ස්වාධීනත්වය සහ ව්‍යක්තිය ආරක්ෂාව සහතික කිරීමට අභ්‍යන්තර විගණන හා පරීක්ෂා කිරීමේ කටයුතු විධිමත්ව සමාලෝචනය කර නියාමනය කරනු ලබයි. දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය බල අධිකාරිය සහ සම්පත් ඇති බවට කමිටුව සැහිමකට පත් වේ. එහි නිරන්තර රැස්වීම්වලදී, අභ්‍යන්තර විගණක සැලැස්මේ සහ ප්‍රධාන සොයාගැනීම්වල ප්‍රගතිය නියාමනය කිරීමට අභ්‍යන්තර විගණන ප්‍රධානියාගෙන් කමිටුව සමාලෝචන ලබා ගනී.

බාහිර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා වශයෙන් පත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) වගන්තිය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වාර්ෂික විගණනයේ දී විගණකාධිපතිවරයාට සහාය ලබා දීම සඳහා සුදුසුකම් ලත් විගණකයකු වශයෙන් මෙසර්ස් BDO පාට්නර්ස් යන සමාගම විගණකාධිපතිවරයා විසින් පත් කරන ලදී. එසේම, බාහිර විගණකගේ සොයා ගැනීම් සහ නිර්දේශයන්ට කළමනාකරණ ලිපිය සහ කළමනාකරණයේ ප්‍රතිචාරය කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබිය

විගණන කමිටුවට තොරතුරු ලැබීම

විගණන සහ අනුකූලතා කමිටුවට කළමනාකාරීත්වයෙන් සහ බාහිර විගණකයන්ගෙන් ප්‍රමාණවත්, විශ්වසනීය සහ කාලෝචිත තොරතුරු ලැබී ඇති බව කමිටුව සහතික වේ. මෙය සියලු වගකීම් ඵලදායීව ඉටුකිරීමට විගණන සහ අනුකූලතා කමිටුවට ශක්තිමත් කරයි.

විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව

වත්කම් සහ වගකීම් තක්සේරු කිරීම සහ හානිකරණය

සාධාරණ අගය ගිණුම්කරණයේ භාවිතය වැඩිවීම සහ එහි පුළුල් වැදගත්කමක් සලකා බලමින්, සාධාරණ අගය ව්‍යුත්පන්න කිරීමේ දී භාවිත කරනු ලබන වැදගත් උපකල්පන අනාවරණය කර ඇති බවත්, ඒ පිළිබඳව සියුම් ලෙස පරීක්ෂා කර ඇති බවත්, එමෙන්ම අවශ්‍ය අවස්ථාවල ඒ සම්බන්ධයෙන් විරුද්ධතාව පවා ප්‍රකාශ කර ඇති බවත් විගණන කමිටුව සහතික කරයි. හානිකරණය සඳහා වන ක්‍රියාවලිය ද ප්‍රමාණවත් වන බව කමිටුවේ අදහසයි.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) අදාළ කර ගැනීම

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අදාල කර ගැනීමේ ප්‍රගතිය කමිටුව විසින් නියාමනය කරන අතර ප්‍රගතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී වරින් වර දැනුවත් කරයි.

ස්වාධීන බාහිර උපදෙස්

විගණන කමිටුවේ ප්‍රඥප්තිය මගින් අවශ්‍ය අවස්ථාවල දී ස්වාධීන බාහිර උපදෙස් ලබා ගැනීම සඳහා අවසර ලබා දෙයි.

අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියාට සහ අනුකූලතා අංශයේ ප්‍රධානියාට විගණන සහ අනුකූලතා කමිටු රැස්වීම්වලට ප්‍රවේශවීමට ඇති හැකියාව

අභ්‍යන්තර විගණන හා අනුකූලතා ප්‍රධානීන්ට විගණන හා අනුකූලතා කමිටුව වෙත සෘජු ප්‍රවේශයක් ඇති අතර, ඒ අනුව කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වගකිව යුතුය.

විගණන නොවන සේවා

අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාව යටතේ මෙය අනාවරණය කර ඇත.

අනුකූලතා කාර්යය

ආයතනික අනුකූලතා කාර්යය අනුකූලතා වැඩසටහන් මෙහෙයුම් හා සහාය ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි කළමනාකරණය සඳහා වගකීමට බැඳී සිටී. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- අනුකූලතා සහ අවදානම් සහ සහකාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් විසින්, එක් එක් දෙපාර්තමේන්තුවේ අනුකූලතා සම්බන්ධීකාරකවරුන්ගේ සහාය ඇතිව අනුකූලතා වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. අනුකූලතා නිලධාරියා සහ විගණන සහ අනුකූලතා කමිටුව අතර වාර්තාකරණ මූල් ලේඛනය මගින් වසර තුළ ඇති විය හැකි සුවිශේෂී ගැටළු සහ අවදානම් අවස්ථා සඳහා විසඳුම් ලබා දෙයි. වගකීම්සහගත නිලධාරීන් ලෙස නම්කළ මෙහෙයුම් අංශවල ප්‍රධානීන් සුවිශේෂී බැඳීම්වලට අනුකූලතාව තහවුරු කිරීම සඳහා වගකිව යුතුය. අභ්‍යන්තර විගණන අංශය මගින් මුදල් විශුද්ධිකරණය වළක්වාලීමේ කර්තව්‍යය වාර්ෂිකව විගණනය කරනු ලබයි.

පිරිවැය කාර්යක්ෂමව කළමනාකරණය සඳහා සමාගම ස්වාධීන ආදර්ශයක් යොදා ගෙන ඇති අතර අනුකූලතා කාර්යයේ ශක්තිමත් ස්වාධීනත්වය සහතික කරයි. එක් එක් අංශයේ අනුකූලතා සම්බන්ධීකාරකයින් ඵලදායී සහභාගිත්වය සහතික කරයි. ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර සඳහා මනා පරිචයන් යොදා ගැනීමට සමාලෝචිත වසර තුළ අනුකූලතා කර්තව්‍යය තවදුරටත් ශක්තිමත් කරනු ලැබීය. අනුකූලතා සංස්කෘතිය ආයතනය පුරා පෝෂණය කරන අතර ඒ තුළින් අනුකූලතා කාර්යය අමතර බරක් ලෙස ගම්‍යමාන නොවනු ඇත.

ආචාර ධර්ම සංග්‍රහය, තොරතුරු දැනුම්දීම සහ වංචා කළමනාකරණය

සමාගම සියලුම සේවකයින්ට අදාළ වන "ආචාර ධර්ම සංග්‍රහය" සහ "තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තියක්" "වංචා කළමනාකරණ ප්‍රතිපත්තියක්" අනුමත කර ඇත. සමාගමේ කිසියම් නුසුදුසු හෝ නීති විරෝධී ක්‍රියාවක් හෝ සදාචාර විරෝධී ක්‍රියාවන් නිරීක්ෂණය කරන යම් සේවකයෙකුට එය තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තියට අනුකූලව තොරතුරු දැනුම් දීමේ නිලධාරියාට වාර්තා කළ හැකිය. එම නිලධාරියා කළමනාකරණය සමඟ එය විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබේ. සමාගම වංචා කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තුළින් සියලු වංචා අවස්ථාවන් වැළැක්වීම, හඳුනා ගැනීම සහ ඒවාට පිළියම් යෙදීමට අපි කැපවී සිටිමු.


අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණ කමිටුව (BRMC) නම් වූ වෙනම අධ්‍යක්ෂක මණ්ඩල අනු කමිටුවකට අවදානම් කළමනාකරණ කාර්යය නියාමනය කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වෙත බලය පවරා ඇත. අභ්‍යන්තර විගණන ප්‍රධානියා අවදානම් කළමනාකරණ කමිටුවේ ද සාමාජිකයෙකු වන අතර, ව්‍යවසාය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව 1998 දී නිකුත්කළ "බැංකුකරණ ආයතනවල අභ්‍යන්තර පාලන පද්ධති සඳහා රාමුව" අනුකූලව සමාගමේ අභ්‍යන්තර පාලන රාමුව සමාලෝචනය කරයි. මෙහි අරමුණ වන්නේ අභ්‍යන්තර පාලන පද්ධතිය අවදානම් කළමනාකරණ රාමුවට ගැලපෙන බව සහ බාසල් රාමුවේ මූලධර්මවලට අනුකූල බව සහතික කිරීම වන අතර එයට කළමනාකරණ අධීක්ෂණය, අවදානම තක්සේරු කිරීම, පාලන කටයුතු, රාජකාරි බෙදීම, තොරතුරු සහ සන්නිවේදනය, නියාමන කටයුතු සහ අධීක්ෂණ බලධාරීන් විසින් අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීම ඇතුළත්ය. BRMC වෙත එම පාලනවල සමාලෝචන ලැබෙන අතර ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි මෙහි ඵලදායිත්වය සහතික කිරීමට ක්‍රියාවට නංවා ඇත.

නිගමනය

පසුගිය වසර තුළ අභ්‍යන්තර විගණන අංශය සහ බාහිර විගණකයින් ඵලදායී අන්දමින් සහ ස්වාධීනව කටයුතු කළ බවට කමිටුව සෑහීමකට පත් වෙයි. එමෙන්ම, ඔවුන් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම අනුමත කරන අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශන විශ්වසනීය බව විශ්වාස කරයි. ඊට අමතරව, බාහිර විගණකයින්ගේ වාර්තාවේ අනාවරණය කළ පරිදි සමාලෝචිත වසර තුළ වාර්තා වූ අනුකූල නොවීම් සඳහා ගනු ලැබූ නිවැරදි කිරීමේ සහ වැලැක්වීමේ ක්‍රියාමාර්ග සමඟ අදාළ වන සියලුම නීති, රීති සහ රෙගුලාසිවලට සහතික කරන සමාගමේ අනුකූලතා රාමුව සම්බන්ධයෙන් ද කමිටුව සෑහීමකට පත් වෙයි.

2023 මැයි මස 10 වන දින මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී



දුෂ්මන්ත තොටවත්ත මහතා
සභාපති – විගණන හා අනුකූලතා කමිටුව

2023 මැයි 10

ආයෝජන කමිටු වාර්තාව

ආයෝජන කමිටුවේ අරමුණු

ආයෝජන කමිටුවට නියාමක සහ සමාගමේ අවදානම් ඉවසුම සහ රුචිය විසින් නියමකළ රාමුව තුළ ආයෝජනය කටයුතුවලින් ප්‍රශස්ථ ප්‍රතිඵල අත්කර ගැනීමට බලය පවරා ඇත. මෙම කමිටුව ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම සහ ඵලදායි බවත්, ආයෝජන ක්‍රියාවලිය සදාචාර සහ නියාමන අනුකූලතාවයට අනුව ක්ෂේත්‍රයේ යහ ක්‍රියාකාරකම් වලට අනුගතව සිදුකරන බවටත් ආයෝජන කමිටුව මගින් තහවුරු කිරීමට උත්සාහ ගනී.

ආයෝජන උපායමාර්ග

රටතුළ සහතික කළ ආර්ථික අර්බුදය හේතුවෙන් 2022 වසර තුළ අභියෝගාත්මක ආයෝජන ගතිකතා හමුවේ, ආයෝජන කමිටුව කෙටි කාලසීමා ආයෝජන කෙරෙහි අවධානය යොමු කරන ලදී. වසර තුළ ආර්ථික වාතාවරණය අතීශයින් අස්ථාවරව පැවති අතර ස්ථාවර ආදායම් සහ ස්කන්ධ වෙළෙඳපොල දිගුකාලීන ආයෝජන සඳහා අනුකම්පා රහිත විය. රට අනපේක්ෂිතව ස්වෛරී ණය පිළිබඳ පැහැර හැරීම නිවේදනය කළ බැවින් 2022 වසර තුළ පොළී අනුපාත වේගයෙන් ඉහළ ගියේය. ආයතන ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයන් වාර්තාකිරීම නොසලකා නිරාවරණ අවම කිරීමට ආන්තික සැපයුම්කරුවන් විසින් ආක්‍රමණික අලෙවිය හේතුවෙන් ස්කන්ධ වෙළෙඳපොල දැඩි පහත වැටීමකට මුහුණ පාන ලදී.

ක්‍රියාත්මක කිරීමට පෙර සිදුකරන සියළුම ආයෝජන තරයේ විශ්ලේෂණය කර, සවිස්තරාත්මකව පරීක්ෂා කරනු ලැබේ. මෙහෙයුම් පරිසරය අබණ්ඩව සැලකියයුතු අභියෝග ඉදිරිපත් කරන බැවින් වෙළෙඳපොල අවදානම, ද්‍රවශීලතා අවදානම, පොලී අනුපාත අවදානම, ණය අවදානම වැනි ආයෝජන අවදානම් සඳහා නිසි අවධානය යොමු කරන ලදී.

2021 වසර තුළ පැවති අඩු පොළී අනුපාත පරිසරය 2022 පළමු කාර්තුවෙන් පසු වඩා ඉහළ පොළී අනුපාත පරිසරයක් සඳහා මඟ පාදන ලදී. ආයෝජන කමිටුව විසින් සිදුකළ ඵලදායී සහ ඉක්මන් තීරණය සැලකියයුතු අලාභ සහ ආයෝජන ප්‍රතිඵලවලට ඇතිවන අලාභය අවම කිරීමට සහය විය.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන් ආයෝජන කමිටුව විවිධ අංශවල පළපුරුදු වෘත්තිකයන් සහ කර්මාන්ත විශේෂඥයින්ගෙන් සමන්විත වේ. ඔවුන් ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලියට විවිධ අත්දැකීම්, විශේෂඥතාවක් සහ පුළුල් විෂය පථයක් ගෙන එයි. ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලිය මගින් ආයෝජන සහක්‍රියාකාරකම් වැඩි දියුණු කරනු ලබයි.

නියාමනය සහ පාලනය

ආයෝජන කාර්යසාධනයන් ස්ථිරව නියාමනය කරන අතර කමිටුව ආයෝජන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අවධානයෙන් සිටී. ඉදිරිපෙල කාර්යාලය, මැදපෙල කාර්යාලය සහ පසුපෙල කාර්යාලය විසින් ආරක්ෂිත සහ සාධාරණ ආකාරයෙන් ආයෝජන ක්‍රියාවලියට පහසුකම් සැපයීමට විචක්ෂණ ක්‍රියාමාර්ග යොදා ගනී.

සමාලෝචනයට යටත් වසර – ආයෝජන කටයුතුවල සාරාංශය


2022 අවසානයේ දී දිගු කාලීන රක්ෂණ අරමුදල් වත්කම රු. බිලියන 180.2ක් වූ අතර සාමාන්‍ය රක්ෂණ අරමුදල රු. බිලියන 59.5ක් විය.

ආයෝජනයේ සුරක්ෂිතබව සහ ස්ථාවරත්වය


ආයෝජන කමිටුව වත්කම්, පන්ති, කල්පිරීම් සහ ඇප අනුව විවිධාංගීකරණය කරමින් ආයෝජනය මත ක්‍රමානුකූල නොවන අවදානම් අවම කරයි. මනා ණය ස්ථාවරත්වයන් සහිත ද්‍රවශීලතා ආයෝජනවල ආයෝජන දැඩිව සීමා කරනු ලබයි.

පහත සඳහන් ප්‍රස්ථාරවලින් දැක්වෙන්නේ 2022 දෙසැම්බර් 31 දිනට දිගු කාලීන රක්ෂණ අරමුදල, සාමාන්‍ය රක්ෂණ අරමුදල සහ මුළු ආයෝජන කළඹේ ආයෝජන වත්කම් වෙන් කිරීමයි (වටිනාකම් වෙළෙඳපොළ වටිනාකම් මත පදනම් වේ).

දිගු-කාලීන රක්ෂණ අරමුදල් වත්කම්



සාමාන්‍ය රක්ෂණ අරමුදල් වත්කම්



ආයෝජන කමිටු වාර්තාව

ආයෝජන ආදායම

වර්ෂය සඳහා මුළු ආයෝජන ආදායම පිළිවෙලින් ජීවිත රක්ෂණය සඳහා රු. බිලියන 12ක් සහ සාමාන්‍ය රක්ෂණය සඳහා රු. බිලියන 1.7කි. වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ ආයෝජන ආදායම සමස්ත සමාගමේ ආදායමෙන් 22%කි. ජීවිත රක්ෂණය සඳහා වන මුළු ආදායමෙන් 34%ක් සහ සාමාන්‍ය රක්ෂණය සඳහා වන මුළු ආදායමෙන් 6.2%ක් උපයා ඇත්තේ ආයෝජන මගිනි

වත්කම් හා වගකීම් කළමනාකරණ සලකාබැලීම් සහ නිෂ්පාදන සංවර්ධනය

වර්ෂය තුළ වත්කම් හා වගකීම් කළමනාකරණය කෙරෙහි දැඩි අවධානයක් යොමු කළේය. සමාලෝචිත වසර තුළ පොළි අනුපාත ඉහළයාමේ ප්‍රවනතාවක් තිබූ බැවින්, කෙටිකාලීන වත්කම්වල ආයෝජනය කිරීමට අයෝජන කමිටුව දැනුවත්ව තීරණය කළේය. ඉදිරියේදී අපි රට ස්ථාවරවීම සහ පොලී අනුපාත පහත වැටීම අපේක්ෂා කරන්නෙමු. කොටස් වෙළෙඳපොල තුළ විශාල විභවතා අපි අපේක්ෂා කරන අතර ඉන් උද්ධමනය අබණ්ඩව සීමා කරනු ඇත.

තනි වාරික ආයෝජන නිෂ්පාදනය සඳහා ඉල්ලුම අබණ්ඩව ශක්තිමත්ව පැවතිණ.

ආර්ථිකය විසින් මුහුණ පෑ සැලකියයුතු තත්ත්වය හමුවේ ආයෝජන කමිටුව 2022 වර්ෂය තුළ ආයෝජන අරමුදල්වල ක්‍රියාකාරිත්වය පිළිබඳව සෑහීමකට පත්වන අතර 2023 කාලය තුළ තවදුරටත් කාර්යසාධනය ඉහළ නැංවීමට උත්සාහ කරනු ඇත.



රවීන්ද්‍ර පත්මප්‍රිය
සභාපති – ආයෝජන කමිටුව

2023 මැයි 10

ආයෝජන පිළිබඳ අමතර සටහන – සමාගම

රු. '000	2022	2021	2020	2019
පිරිවැයට				
ලැයිස්තුගත පරිපාලිත සමාගම්	2,764,196	2,764,196	2,764,196	2,764,196
ලැයිස්තුගත නොකළ පරිපාලිත සමාගම්	20,059,696	20,059,696	18,059,696	18,059,696
ශුද්ධ වටිනාකමට				
ආශ්‍රිත සමාගම	198,673	198,673	164,125	148,509
අලෙවිය සඳහා තබා ඇති				
ලැයිස්තුගත කොටස්	12,688,899	20,373,280	19,215,501	23,765,732
ලැයිස්තුගත නොකළ කොටස්	7,850	7,850	11,267	24,411
ඒකක භාර	1,798,508	1,739,055	1,590,984	2,029,106
ලැයිස්තුගත ණයකර	33,756,794	39,379,579	33,376,199	32,360,621
භාණ්ඩාගාර බිල්පත්	–	–	–	–
භාණ්ඩාගාර බැඳුම්කර	3,261,196	3,929,773	1,226,488	1,776,535
ලාභය හෝ අලාභ තුළින් සාධාරණ අගය				
ලැයිස්තුගත කොටස්	23,031,279	19,198,031	12,454,354	5,643,021
ඒකක භාර	2,732,532	3,661,785	2,892,326	–
කල්පිරෙන තෙක් රඳවාගත්				
භාණ්ඩාගාර බිල්පත්	–	–	–	–
ලැයිස්තුගත ණයකර	2,030,137	–	–	–
භාණ්ඩාගාර බැඳුම්කර	69,802,527	60,916,652	51,885,786	53,113,519
ණය සහ ලැබියයුතු				
ලැයිස්තුගත නොකළ ණයකර	23,371,379	22,343,977	22,310,237	5,623,014
කාලීන තැන්පතු	22,039,325	11,590,662	14,086,589	27,064,616
සංවර්ධන බැඳුම්කර	19,407,639	12,756,662	11,257,602	10,749,452
හානිකරණය සඳහා වෙන් කිරීම	(2,676,149)	–	–	–
භාණ්ඩාගාර බිල්පත්	13,939	2,993,772	–	–
වාණිජ පත්‍රිකා	–	–	–	–
භාර සහතිකපත්	–	–	–	–
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්	5,378,461	12,657,269	14,450,605	2,062,637
එකතුව	239,666,880	234,570,912	207,745,955	185,247,799

ආයෝජන කමිටු වාර්තාව


2018	2017	2016	2015	2014	2013
2,925,567	2,925,567	2,925,567	2,925,567	2,925,567	2,925,567
18,160,338	18,160,338	18,160,338	18,160,338	18,160,338	14,660,337
143,646	143,646	138,448	128,090	122,425	105,727
27,221,446	32,460,737	30,914,016	31,894,169	35,711,339	24,798,653
35,495	48,891	47,972	20,754	20,832	124,480
4,822,078	4,593,369	964,320	1,043,587	1,146,236	1,426,408
23,867,197	21,017,947	19,566,029	15,228,277	11,880,406	7,190,339
–	–	–	–	–	483,700
2,534,387	4,659,451	4,062,844	5,119,315	4,387,187	5,418,642
3,627,702	4,050,081	5,320,605	6,756,655	5,538,348	5,956,726
–	–	–	–	–	–
–	–	–	488,795	487,576	–
–	–	–	–	–	–
54,622,918	55,020,955	49,313,553	38,475,744	25,589,291	19,324,293
500,534	500,534	500,534	541,698	1,367,206	1,890,781
22,113,279	14,708,677	12,336,280	17,309,842	27,945,442	22,864,910
10,456,280	7,539,703	7,158,558	6,815,995	2,428,326	5,254,857
–	–	–	–	–	–
–		–	–	–	–
256,462	–	–	–	–	–
–	–	–	–	–	37,481
1,009,160	1,771,895	1,035,996	2,629,107	5,130,628	12,530,569
172,296,490	167,601,791	152,445,062	147,537,933	142,841,145	124,993,472

අවදානම් කළමනාකරණ වාර්තාව

හැඳින්වීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මූල්‍ය පාලනයෙන් ඉදිරියට ගොස් ඇති අතර ආරක්ෂාව, තොරතුරු තාක්ෂණය, තෙවැනි පාර්ශව සම්බන්ධතා, පාලන අවදානම සහ අනුකූලතාව ඇතුළුව විවිධ ක්ෂේත්‍ර ආවරණය කරන ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කර ඇත. සමාගම උපායමාර්ගික, ව්‍යාපාර සහ මෙහෙයුම් පමාර්ථ අත්කර ගැනීමේදී සහ සැබෑ ව්‍යාපාර වටිනාකම නිර්මාණයේදී ඵලදායී අවදානම් කළමනාකරණය තීරණාත්මක ලෙස දකී. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ISO 31000 අවදානම් රාමුව මත පදනම් වී ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් සංවර්ධනය කර ඇති අතර එය එහි මූලික ව්‍යාපාරය සහ උපායමාර්ගික අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ අවම කිරීම සඳහා සහය වේ.

මෙම රාමුව පහත රූසටහනින් ඉදිරි පත් කර ඇත:



තක්සේරු අදියර තුළ, අවදානමේ විභවතාව සහ බලපෑම සමස්ථ අවදානම් වර්ගය තීරණය කිරීමට තක්සේරු කරනු ලැබේ. අවදානම සිදුවීමේ හැකියාව සහ එහි සමස්ථ මට්ටමට අදාළ බලපෑම පෙන්වන අවදානම් අනුකෘතියක් භාවිතයෙන් මෙය සිදුකළ හැකිය.

අවදානම් පාලනය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සමාගමේ සමස්ත අවදානම් කළමනාකරණය අධීක්ෂණයේදී අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ අනු කමිටුවේ සහය ලැබේ. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ආයතනික උපායමාර්ගයේ අත්‍යවශ්‍ය කොටසක් බව සහතික කිරීමේදී මෙම අනු කමිටුවට තීරණාත්මක කාර්යභාරයක් ඇත. එහි වගකීම්වලට අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි උපායමාර්ගය සහ අවදානම් රුචිය සහ ඉවසීම සමඟ පෙළ ගැසී ඇති බව සහතික කිරීම ඇතුළත්ය. අවදානම් කළමනාකරණ අනු කමිටුවට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලය විගණන සහ අනුකූලතා කමිටුව සහ ආයෝජන කමිටුව ඇතුළුව විශේෂ ක්ෂේත්‍රවල අවදානම් අධීක්ෂණයට සහයවීම සඳහා වෙනත් අනු කමිටු පත් කර ඇත.

පාලන ව්‍යුහය

පහත පරිදි වෙනස සහ පැහැදිලිව හඳුනාගත් ව්‍යාපාර මාර්ග හතරක් පවත්නා අවස්ථාවල අවදානම් කළමනාකරණය ශක්තිමත් අදියරයක පවතී.

A. "සැබෑ අවදානම් හිමිකරුවන් විසින් මෙහෙයුම් කළමනාකරණය" පළමු ආරක්ෂක මාර්ගය ලෙස (අවදානම හිමි සහ කළමනාකරණය කරන)

B. "මූල්‍ය පාලනය, අවදානම් පාලනයන්, සහ අනුකූලතාව" දෙවන ආරක්ෂක මාර්ගය ලෙස (අවදානම අධීක්ෂණය)


C. "අභ්‍යන්තර විගණනය" තෙවන ආරක්ෂක මාර්ගය ලෙස (ස්වාධීන සහතිකය)

D. "බාහිර විගණනකවරු සහ නියාමකයින්" සිව්වන ආරක්ෂක මාර්ගය ලෙස (විධිමත් සන්නිවේදනය)

සිව්වන ආරක්ෂක මාර්ග සම්බන්ධය අභ්‍යන්තර විගණනකවරු, බාහිර විගණනකවරු සහ අධීක්ෂකයින් අතර සමීප මැදිහත්වීමක් ඇති කරයි. රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රධාන නියාමක ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වේ.

විගණන කමිටුවට වාර්තා කිරීම ස්වාධීනත්වය සහතික කරන අතර අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කිරීම මගින් අවදානම් න්‍යාය පත්‍රය විගණන න්‍යාය පත්‍රයට යටත් නොවන බව සහතික කරයි.

අවදානම් කළමනාකරණ වාර්තාව



අභ්‍යන්තර පාලන රාමුවේ අවදානම් තක්සේරුව

සමාගම ඵලදායී අවදානම් කළමනාකරණ ව්‍යවහාර ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව ප්‍රවර්ධනය කර සහය වී ඇත. මෙම අරමුණ අත්කර ගැනීම සඳහා, සමාගම අභ්‍යන්තර පාලන රාමුවක් යොදා ගෙන ඇති අතර එය බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුවේ මූලධර්ම දහතුන අනුගමනය කරයි.

නුබුන්වත් තත්ත්වය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ශක්තිමත් අවදානම් කළමනාකරණ පදනම් 2022 දී අවදානම් කළමනාකරණය සඳහා ශක්තිමත් අවකාශ ලබා දී ඇත. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින් 2022 දී අවශ්‍ය මට්ටමට වඩා ඉහළින් අවදානම් පදනම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය අඛණ්ඩව පවත්වා ගෙන ඇත. ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා අවදානම් පදනම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 2021 මූල්‍ය වසර තුළ පැවති 501%ට සාපේක්ෂව 2022 මූල්‍ය වසරේ 316%ක් වූ අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා අවදානම් පදනම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 2021 මූල්‍ය වසර තුළ පැවති 244%ට සාපේක්ෂව 2022 මූල්‍ය වසරේ 244%ක් විය.

වර්තමාන ආර්ථික අංගවල බලපෑම

සෑම අධ්‍යක්ෂක මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුවකදීම මූලික උද්ධමනය, ආහාර උද්ධමනය, ණය විලම්භනය, මහ බැංකු පනත සංශෝධනය කිරීම සහ දූෂණ විරෝධී නීති රාමුව ඇතුළු නව අපේක්ෂා කරන ශක්තිමත් නීතිමය රාමුව, රජයේ ණය ගැනීම්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර කල්පිරීමෙන් ලැබෙන ආදායම, අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළ ද්‍රවශීලතාව අපනයන ආදායමේ පවාරන අවශ්‍යතා කොටස් වෙළඳපොළට YTD ශුද්ධ විදේශ ගලා ඒම, රුපියලේ අගය ඉහළ යාම සහ ක්ෂය වීම, සංචාරක ගලා ඒම සහ ප්‍රේෂණ ප්‍රවාහ සහ එවැනි වෙනත් විවිධ අංග ඇතුළුව වර්තමාන ආර්ථික අංගවල බලපෑමේ අංග කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සාකච්ඡා කර ඇත. ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ සඳහා සහාය වීම සඳහා SDR බිලියන 2.286 (ඇ.ඩො. බිලියන 3ක් පමණ) විස්තීරණ අරමුදල් පහසුකම (EFF) යටතේ IMF මණ්ඩලය විසින් මාස 48ක දීර්ඝ වැඩපිළිවෙලක් අනුමත කර ඇති බව අධ්‍යක්ෂක මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුවකදී ධනාත්මක සටහනක් මත සලකා බලයි.

ජීවිත රක්ෂණ අවදානම

ජීවිත රක්ෂණය හා සම්බන්ධ බොහෝ අවදානම් ඇත. ඊට පහත දේ ඇතුළත්ය:

අවදානම් වර්ගය	විස්තරය	අවදානම් රුචිය
මර්ත්‍යතා අවදානම	ජීවිත රක්ෂණ ඔප්පු මත අත් දකින සැබෑ ඔප්පු හිමියාගේ මරණ අවදානම අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩිවීම	අඩු අවදානමකි
දීර්ඝායුෂ අවදානම	වාර්ෂිකලාභීන් බලාපොරොත්තු වූවාට වඩා දිගු කාලයක් ජීවත් වීමේ අවදානම	අඩු අවදානමකි
රෝගාබාධ අවදානම	සැබෑ රක්ෂණ ඔප්පුහිමියන්ගේ සෞඛ්‍යය/අහඹු සම්බන්ධ හිමිකම් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩිය	අඩු අවදානමකි
ඔප්පුහිමියන්ගේ හැසිරීමේ අවදානම	දායක මුදල් අත්හිටවීම සහ අඩුකිරීම හෝ ගිවිසුම කල් පිරීමට පෙර ප්‍රතිලාභ ආපසු ගැනීම ඔප්පු හිමියාගේ හැසිරීම අපේක්ෂිත ප්‍රමාණයට වඩා නරක අතට හැරීමේ අවදානම. දුර්වල අනවරත අනුපාත, අනාගත ස්ථාවර ව්‍යදම් දරීමට පොත්වල රක්ෂණ ඔප්පු ඉතා අඩු ප්‍රමාණයක් පැවතීමට සහ ලේඛණගත ව්‍යාපාර වලට විලම්භීත අත්කර ගැනීමේ ව්‍යදම් අයකර ගැනීමට ඇති හැකියාව මත සැබැවින්ම බලපාන එම ව්‍යාපාරවලින් ලැබෙන අනාගත ධනාත්මක මුදල් ප්‍රවාහ අඩු කිරීමට මුල්වය හැකිය	අඩු අවදානමකි
ව්‍යදම් අවදානම	රක්ෂණ ඔප්පු අත්කර ගැනීමේදී සහ පරිපාලනය කිරීමේදී කරනු ලබන ව්‍යදම් අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩිවීමේ අවදානම	අඩු අවදානමකි

නිසි පරිදි පාලනය හා කළමනාකරණය නොකළහොත් සමාගමේ මෙහෙයුම්වලට බලපෑ හැකි ඉහත සඳහන් අවදානම් ඇගයීම සඳහා සමාගම විසින් පරිපාටි සහ ක්‍රියාවලි ස්ථාපනය කරනු ලැබ ඇත. මෙම පරිපාටි නිෂ්පාදන සංවර්ධනයේ සිට ප්‍රතිලාභ පරිපාලනය දක්වා සියලුම තීරණාත්මක පියවර ආවරණය කරමින් සකස් කර ඇත.

ඊට අමතරව, සියලුම ජීවිත මූල්‍ය ප්‍රවාහ සැලසුම් කරනු ලැබ ඇති අතර නිෂ්පාදන සැලසුම සහ මිල නියම කිරීමේ අවදානම අඩු කිරීම සඳහා ආයුගණක විසින් ලාභ පරීක්ෂාවක් සිදුකරනු ලබයි. එමෙන්ම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ලබාගතහැකිනම්, ඇතැම් වගකීම්වලට (ALM) අනුබලදීම සඳහා ගැලපුම් උපකරණ භාවිතා කරනු ලබයි.


ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් අවදානම් පදනම් කරගත් ප්‍රාග්ධන (RBC) රාමුව යටතේ "දළ වාරික තක්සේරුකරණ" යාන්ත්‍රණය (GPV) යොදා ගෙන ඇත. වෙළෙඳපළ ස්ථාවර ආකාරයකින් වගකීම් ගණනය කරනු ලබන වගකීම් තක්සේරුකරණ අරමුණු සඳහා මෙය අවශ්‍ය වේ. මෙයින් අදහස් වන්නේ දළ වාරික තක්සේරුකරණ යාන්ත්‍රණය පදනම් වී ඇත්තේ මරණ, රෝගාබාධ, ව්‍යදම්, ප්‍රමාද දෝෂ යනාදිය සඳහා වන පැහැදිලි ඇස්තමේන්තු මත වන අතර අවදානම් රහිත පොලී අනුපාත ව්‍යුහය මෙහිදී වට්ටම් අරමුණු සඳහා යොදා ගනී. අනාගත අපේක්ෂිත මට්ටමේ ප්‍රසාද දීමනා සඳහා වගකීම් පැහැදිලි ආන්තිකයක් ද දරන අතර එය මූල ප්‍රතිලාභ වගකීම (TBL) ලෙසින් හඳුන්වනු ලබන අතර සුරක්ෂිත කරනු ලබයි. කලින් කලට සිදුකරනු ලබන අභ්‍යන්තර අත්දැකීම් අධ්‍යයන මත පදනම්ව වගකීම ඇගයීම සඳහා හොඳම ඇස්තමේන්තු උපකල්පන සකස් කිරීමෙහි ලා SLICL දිරිමත් කරනු ලැබ ඇත. මෙමගින් SLICL වසර ගණනාවක් පුරා ඔප්පුහිමිකරු වගකීම් ස්ථාවර අකාරයකට කළමනාකරණය කර ගැනීමට අවස්ථාව සලසා ඇත.

මීට අමතරව, TBL ගණනය කිරීම සඳහා සලකා බලනු ලබන හොඳම ඇස්තමේන්තුගත පරාමිතීන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමක කොමිෂන් සභාව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුව අවදානම් ආන්තිකය (RM) යෙදීම ලෙසින් තවදුරටත් අවධාරණය කරනු ලබන අතර TBL හි හොඳම ඇස්තමේන්තු වලින් අහිතකර අපගමනය සඳහා ආන්තිකයක් සමඟ ගණනය කෙරේ. අවදානම් ආන්තිකය භාවිතා කිරීම මගින් ඔප්පු වගකීම්වල සංඛ්‍යාත්මක විශ්වාසය ඉහළ දමනු ලබන අතර එමගින් ඔප්පුහිමියන්ගේ ප්‍රතිලාභ සඳහා සපයන ආරක්ෂාව වැඩි වී ඔප්පු වගකීම් වැඩි වනු ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් භාවිතා කරන අවදානම් කළමනාකරණය අවදානම් පාදක ගණනය කිරීමේ රාමුවෙහි නිශ්චය කර ඇති සාධක සමඟ අනුගතවන වන්නකි. එය වගකීම් ගණනය කිරීම යටතේ පැවතිය හැකි බෙදාහැරීම අවධාරණය කිරීමට 75% ක විශ්වාස අන්තරයක් නියෝජනය කරයි.


එබැවින් ජීවිත රක්ෂණ ගිවිසුමේ වගකීම් නිශ්චය කිරීමේදී යොදා ගනු ලබන ප්‍රධාන උපකල්පන පහත වගු ගත කර ඇත.

උපකල්පනය	විස්තරය
මර්ත්‍යතාව	– හොඳම නිමාන අත්දැකීම් අනුපාතයට ඉඩදීමට වාර්ෂික නොවන ව්‍යාපාර සඳහා වයස 67/70 කාණ්ඩ වලට වෙන්කරන ලදී. – වාර්ෂිකයන්ගේ මර්ත්‍යතාව ආසන්න වශයෙන් 1%කින් වර්ධනය කිරීමට ඉඩදීම සඳහා වයස වසරකින් අවහිර කිරීමෙන් පිරිමියෙකුගේ (90)ක බර තබන ලද සාමාන්‍යය සහ ගැහැණියකගේ (90)ක බර තබන ලද සාමාන්‍යයක් පවතී.
ව්‍යදම	සමාගමේ සහභාගි සහ සහභාගි නොවන ව්‍යාපාරවලට බෙදන ලද 2022 අභ්‍යන්තර ව්‍යදම් අධ්‍යයන සහ ව්‍යදම් මත පදනම් වේ.
අවලංගුවීම්/පවාරණ	අභ්‍යන්තර පළපුරුදු අධ්‍යයන සහ සුදුසු පරිදි ආයුගණක විනිශ්චය ක්‍රියාත්මක කිරීම මත පදනම් වේ. විනිශ්චය ක්‍රියාත්මක කිරීමමේදී, නිදසුනක් ලෙස, එක් සිදුවීමක් සඳහා විශ්වාසී දත්ත ලබාගත නොහැකිනම්, සමාගම පොදු වෙළෙඳපොල අපේක්ෂාවන්ගේ දැනුම සහ පාදක නිෂ්පාදන වර්ගයට අදාළ භාවිතය සහ සුදුසු පරිදි ඉලක්ක වෙළෙඳපොල සැලකිල්ලට ගෙන ඇත.
රෝගාතුරවීම	සමාගමේ අභ්‍යන්තර පළපුරුදු සහ අපේක්ෂිත විශ්ලේෂණය අනුව සැබෑ ගණන මත පදනම් වේ. අපේක්ෂිත අනුපාත ප්‍රතිරක්ෂණ අනුපාත වගුව මත පදනම් වේ.
ප්‍රතිරක්ෂණය	ප්‍රතිරක්ෂණය සම්බන්ධයෙන් සමාගමේ අභ්‍යන්තර පළපුරුදු අධ්‍යයන මත පදනම් වේ
ආයෝජන ප්‍රතිඵල	2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ නියාමක කොමිෂන් සභාව (IRCSL) විසින් යෝජිත අවදානම් රහිත අනුපාත ව්‍යුහය

අවදානම් කළමනාකරණ වාර්තාව



ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් එහි ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා 2022 වර්ෂය පුරා ස්ථාවර සහ ශක්තිමත් නුඹුන්වත් අනුපාතයක් පවත්වාගෙන යන ලද අතර 2022 දෙසැම්බර් 31 දිනට අවදානම් පදනම් ප්‍රාග්ධන අනුපාතය 316% වන අතර එය 2021 දෙසැම්බර් 31 දිනට 501% ක් විය. මෙය අවම නියාමන අවශ්‍යතාවයක් වන 120%ට වඩා ඉහළ අගයක් ගනී.



ජීවිත රක්ෂණ අවදානම සඳහා සංවේදිතා විශ්ලේෂණ

උපකල්පනය	උපකල්පනයේ වෙනස	හොඳම ඇස්තමේන්තු වගකීමේ බලපෑම (රු.)
මර්ත්‍යතාව	+10%	532 Mn.
	-10%	(534) Mn.
වියදම	+10%	1,742 Mn.
පැවැත්ම	+20%	1,535 Mn.
	-20%	(1,626) Mn.
වට්ටම් අනුපාතය	අවදානම පදනම් ප්‍රාග්ධනය යටතේ ඉහළ කම්පන වාතාවරණය	(10,320) Mn.
	අවදානම පදනම් ප්‍රාග්ධනය යටතේ පහළ කම්පන වාතාවරණය	18,346 Mn.

නිෂ්පාදන කාණ්ඩය මත පදනම් වී රක්ෂණ ඔප්පු වගකීම වෙන් කිරීම

2022 දෙසැම්බර් 31 දිනට	රක්ෂණ (ලාභ සහිත) රු. '000	රක්ෂණ වගකීම් (ලාභ සහිත) රු. '000	මුළු ප්‍රතිලාභ වගකීම් රු. '000
පූර්ණ ජීවිත	14,181	2,612	16,793
දායාද රක්ෂණය	71,656,329	4,501,656	76,157,985
කාල රක්ෂණය	–	2,170,962	2,170,962
වාර්ෂික	11,841,459	2,515,694	14,357,153
රයිඩර් ප්‍රතිලාභ	74,309	3,080,047	3,154,356
එකතුව	83,586,278	12,270,970	95,857,248

පහත දැක්වෙන වගුවෙන් සමාගමේ සහභාගිත්ව සහ සහභාගිත්ව නොවන අරමුදල් තත්ත්වය පෙන්නුම් කරයි

	සහභාගික රු. '000	අසහභාගික රු. '000	එකතුව රු. '000
2022	142,112,355	14,606,647	156,719,002
ප්‍රතිශතය	90.68%	9.32%	

සාමාන්‍ය රක්ෂණ අවදානම

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසමේ අනිවාර්ය අවශ්‍යතාවකට අනුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2016 ජනවාරි 01 දින සිට අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන නුඹුන්වත් රාමුවක් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කරන ලද අතර එය අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන ක්‍රමය යටතේ අවශ්‍ය වූවකි.

මේ යටතේ, හිමිකම් වගකීම යන සංරචකය හිමිකම් වගකීමේ මධ්‍යම ඇස්තමේන්තුව සහ අවදානම් අන්තරයෙහි සංයෝජනයක් ලෙස අර්ථ දක්වා ඇත. වාරික හිමිකම යන්න, අවදානම් අන්තරයන් සමඟ කල් නොපිරුණු අවදානම් සංචිතයේ මධ්‍යම ඇස්තමේන්තුව ලෙස අර්ථ දක්වා ඇත.

සංචිත ස්ථාපිත කිරීමේ දී විචක්ෂණභාවය

වාරික වගකීම සහ හිමිකම් වගකීම නමින් සාමාන්‍ය ආයුගණකමය සංචිතයන් හි ප්‍රධාන සංරචකයන් දෙකක් ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 75% ක විශ්වාස මට්ටමක හිමිකම් වගකීමක් (හිඟ හිමිකම් සංචිතය සඳහා හා දරන ලද එහෙත් (ප්‍රමාණවත්ව) වාර්තා නොවූ හිමිකම්) ස්ථාපිත කර ඇති අතර එයට හිමිකම් වගකීමේ මධ්‍යම ඇස්තමේන්තුව, හිමිකම් වල අනාගත නිරවුල් කිරීම් සඳහා සම්බන්ධිත හිමිකම් පරිහරණ වියදම් සහ මධ්‍යම ඇස්තමේන්තු හිමිකමෙහි අහිතකර අපගමනය හා ප්‍රතිපාදන හා හිමිකම් වල අනාගත නිරවුල් කිරීම් සඳහා සම්බන්ධිත හිමිකම් පරිහරණ වියදම් සඳහා ප්‍රතිපාදන අන්තර්ගත වේ. වාරික හිමිකම ද 75% ක විශ්වාස මට්ටමක ස්ථාපිත කර ඇති අතර එය, ගතවූ හදිසි අනතුරු වර්ෂ දෙකක් හෝ තුනක් සඳහා වන මධ්‍යම ඇස්තමේන්තු අවසාන අලාභ අනුපාතයෙහි සාමාන්‍යය ගණනය කිරීම මඟින් තීරණය කරනු ලබන මධ්‍යම ඇස්තමේන්තු කල් නොපිරුනු අවදානම් සංචිතය සහ අනාවරණය වීම ඉදිරියේ දී සිදු වන බැවින් අතිරේක වෙනස්වීම් විදහා දැක්වන පරිදි අහිතකර අපගමනයන් සඳහා වන ප්‍රතිපාදන මත පදනම් ව ගණනය කර ඇත.

හිමිකම් සංවර්ධන තොරතුරු

ප්‍රතිරක්ෂණයන් ශුද්ධ ඓතිහාසික ජීවිත නොවන සංචිතයන් හි වෙනස්කම් පහත වගුවෙහි දක්වා ඇත. අදාල වසරේ සහ ඉකුත් වසර වල දරන ලද අලාභ සඳහා ඇස්තමේන්තුගත අනාගත ගෙවීම් ප්‍රමාණය විදහා දක්වන එක් එක් ශේෂ පත්‍ර දිනය අනුව නොගෙවූ අලාභ සහ අලාභ ගැලපීම් සඳහා වන ඇස්තමේන්තුගත දළ සංචිත වගුවෙහි ඉහළ පෙළෙහි දක්වා ඇත. එක් එක් වසර අවසානයේ දී ස්ථාපිත සංචිත සඳහා එක් එක් පසුව එන වසර වල ගෙවන ලද සමුච්චිත වටිනාකම් වගුවෙහි සමුච්චිත ගෙවීම් කොටසේ දැක්වේ. ඒ ආකාරයෙන්ම, ඉහත ත්‍රිකෝණයේ දක්වා ඇති ගෙවන ලද සමුච්චිත මුදල් ප්‍රමාණය සහ මූල්‍ය වර්ෂය අවසානයේ දී ශුද්ධ හිඟ තත්ත්වය පිළිබඳ තොරතුරු සමුච්චිත වාර්තා ගතවූ අලාභ කොටසෙහි දක්වා ඇත.

රු. මිලියන	2017	2018	2019	2020	2021	**2022**
අලාභ සහ අලාභ යථාවත් කිරීමේ වියදම් සඳහා දළ සංචිත	8,549	8,776	7,311	7,862	9,549	**11,856**
ප්‍රතිරක්ෂණ ආපසු ලබාගැනීම්	(1,451)	(1,590)	(1,061)	(1,395)	(1,888)	**(3,104)**
අලාභ සහ අලාභ යථාවත් කිරීමේ වියදම් සඳහා ශුද්ධ සංචිත	7,098	7,186	6,250	6,466	7,661	**8,751**
දෙසැම්බර් 31 දිනට සමුච්චිත ගෙවීම්:						
වසරකට පසු	6,849	7,590	7,723	5,371	6,995	**6,790**
වසර දෙකකට පසු	9,004	9,632	9,451	7,043	9,312	
වසර තුනකට පසු	9,185	9,772	9,589	7,093		
වසර හතරකට පසු	9,242	9,996	9,666			
වසර පහකට පසු	9,315	10,046				
වසර හයකට පසු	9,356					
දෙසැම්බර් 31 දිනට වාර්තාගත සමුච්චිත ගෙවීම්:						
වසරකට පසු	8,297	9,467	9,153	6,493	8,980	**8,893**
වසර දෙකකට පසු	9,184	9,907	9,718	7,255	10,015	
වසර තුනකට පසු	9,414	10,288	9,852	7,322		
වසර හතරකට පසු	9,526	10,200	9,898			
වසර පහකට පසු	9,479	10,198				
වසර හයකට පසු	9,487					

සාමාන්‍ය රක්ෂණ අවදානම සඳහා සංවේදිතා විශ්ලේෂණය

පහත වගුවෙන් බදු ගෙවීමට පෙර ශුද්ධ අදායමේ සංවේදිතාව සහ සියයට දශම එකකින් පියවීමට ඇති වාර්තාකළ හිමිකම්වල හානිකර වර්ධනයේ ප්‍රතිඵල ලෙස ශුද්ධ වත්කම් වල සංවේදිතාව පෙන්නුම් කරයි. එවැනි වර්ධනයක් රක්ෂිත අවස්ථාවන් වැඩි වාර ගණනක දී සිදු වීමෙන් හෝ ප්‍රතිඵල හිමිකම් වල බරපතලකමේ වර්ධනයකින් හෝ වාර ගණනේ හෝ බරපතලකමේ සංයෝජනයෙන් පැන නැඟිය හැකිය. සංවේදිතාවලින් එවැනි සිදුවීමක සම්භාවිතාවයක් සඳහන් නොකරන අතර ප්‍රතිරක්ෂණයේ කවර හෝ රේඛීය නොවන බලපෑමක් සලකා බැලීමක් නොකරයි.

මෙහිදී මධ්‍යම නිමාන වැය කරන ලද නමුත් (ප්‍රමාණවත් තරම්) වාර්තා නොකළ IBN(E)R වගකීම් වලට නොගෙවූ වගකීම් වටිනාකම් සමඟ සියයට දශම එකකින් බලපෑමක් තිබෙන බව සහ වගකීම් පරිහරණ වියදම් (CHE) කෙරෙහි බලපෑමක් නොමැති බව අපි උපකල්පනය කරන්නෙමු. පහත සඳහන් වගුවේ සංවේදිතා විශ්ලේෂණය ඉදිරිපත් කිරීමේදී යොදාගත් උපකල්පන මත පදනම්ව වාර්තාගත නොවූ වගකීම් වල සෑම අතිරේක සියයට දශම එකක වැඩි වීමක් බදු ගෙවීමට පෙර ශුද්ධ අදායම සහ ශුද්ධ වත්කම් මත රේඛීය බලපෑමක් ඇති කරයි. ඊට අමතරව, සමාගම ප්‍රතිරක්ෂණ ගිවිසුම්වල රේඛීය නොවන බලපෑම් සැලකිල්ලට ගනිමින් ආන්තික වාතාවරණ ඇගයීම තුළින් රක්ෂණ අවදානම් මෙහෙයවයි.

	උපකල්පනවල වෙනස්වීම්	වාර්තාවී තිබෙන ගෙවීමට ඇති දළ හිමිකම් රු.	වාර්තාවී තිබෙන ගෙවීමට ඇති ශුද්ධ හිමිකම් රු.	වාර්තාවී තිබෙන ගෙවීමට ඇති ශුද්ධ හිමිකම් රු.	ශුද්ධ වගකීම් මත බලපෑම රු.	බදුකරණයට පෙර ලාභය මත බලපෑම රු.	කොටස් ප්‍රමාණය මත බලපෑම (බදුකරණයට පසුව) රු.
2022 දෙසැම්බර් 31	+1%	මිලියන 8,899	මිලියන 5,832	මිලියන 112	මිලියන 81	මිලියන (81)	මිලියන (57)

ආයෝජන අවදානම් කළමනාකරණය

2021 වසරට වඩා විශාල පරිමාණයෙන් 2022 දී රටේ ආර්ථික තත්ත්වයන් සැලකියයුතු අභියෝග ඇති කරන ලදී. කෙසේවෙතත්, විශාල අභියෝග සමඟ විශාල අවස්ථා පැමිණේ. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෙම අභියෝග බොහොමයක් ජය ගැනීමට හැකි වූ අතර ආයෝජන මත වඩා සාර්ථක ප්‍රතිඵලවලින් පෙන්වා ඇති පරිදි අවස්ථා භාවිතා කර ඇත.

ආයෝජන කමිටුව ණය සහ කොටස් වෙළෙඳපොල තුළ පහළ වැටීම අවම කිරීම සඳහා අලාභ පාලන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේදී ගතික, සක්‍රීය සහ කාර්යක්ෂම විය. වර්ධනය සඳහා විභවතා ඇති හදිසි ආයෝජන කිරීමට සීමාවෙන් පිටත කල්පනා කිරීම අවශ්‍ය විය.

ලොවපුරා මහ බැංකු දැඩි මූල්‍ය ප්‍රතිපත්ති යොදා ගැනීමත් සමඟ වෙළෙඳපොල පොළී අනුපාත ඉහළට ගමන්කළ බැවින් 2022 වසර තුළ පොළී අනුපාත අවදානම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සඳහා අභියෝග මතු කළේය.

දිගුකාලීන ආයෝජනවල අරමුදල් සිර කර තැබීමට වඩා ද්‍රවශීලතාව අවශ්‍යවෙන්ම ඇතිවන උපායමාර්ගය හේතුවෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ආයෝජන කළඹේ විවිධාංගීකරණය පොළී අනුපාත ඉහළයාමේ සහ කොටස් වෙළෙඳපොල පහළ වැටීමේ ඍණාත්මක බලපෑම් අවම කර ගැනීමට සහය විය. ප්‍රතිඵලවලට අමතරව, නිසි අවධානය ද ද්‍රවශීලතාව සහ ණය අවදානම් කෙරෙහි යොමු කරන ලදී.

ආයෝජන කමිටුව විසින් කාලීන ආයෝජන තීරණ ගැනීම හා නියාමනය ප්‍රශංසනීය ආයෝජන ආදායමක් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ට වාර්තා කිරීමට සහය විය. අවදානම් කළමනාකරණ මූලධර්මවලට සහ අදාළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමක කොමිෂන් සභාව මාර්ගෝපදේශවල දැඩි අනුකූලතාව නියාමන අවදානම් අවම කිරීමට උපකාර විය.

වෙළෙඳපොල අවදානම

පොළී අනුපාත අවදානම

පොළී අනුපාත අවදානම යනු පොළී අනුපාතවල වෙනස්වීම් සහ එලදා වක්‍රයේ හැඩයේ වෙනස්වීම් හේතුවෙන් සිදුවිය හැකි පාඩු අවදානමයි. කෙටිකාලීන ණය උපකරණවල ආයෝජනය කිරීමෙන් මෙම අවදානම කළමනාකරණය කරන අතර වසර තුළ පොළී අනුපාත ඉහළ ගිය බැවින් මෙයින් වාසි ඇති කර ඇත.

ඉදිරියේදී පොළී අනුපාත ඉහළ මට්ටමක රැඳී පවතිනු ඇතැයි අපේක්ෂා කරන බැවින් ප්‍රති ආයෝජන අවදානම යම් ප්‍රමාණයකට අඩු වේයයි අපේක්ෂා කළ හැකිය. ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ පැහැදිලිතාවක් ඇති බැවින් වෙළෙඳ අවස්ථාවන් 2023 දී අපේක්ෂා කළ හැකිය.

විනිමය අනුපාත අවදානම


විනිමය අනුපාතවල අහිතකර වෙනස්වීම් හේතුවෙන් පාඩු සිදුවීමේ හැකියාව විනිමය අනුපාත අවදානම ලෙස හැඳින්වේ. 2020 දී එක්සත් ජනපද ඩොලරය ශ්‍රී ලංකාවේ රුපියලට සාපේක්ෂව මෙතෙක් වූ ඉහළම අගය වාර්තා කළේය. කෙසේ වෙතත්, IMF ඇපවීමේ පැකේජය අවසන්වීමෙන් පසු රුපියලේ පාඩු පියවා ගැනීමට සහ සාධාරණ මට්ටමකට පැමිණෙනු ඇත.


කොටස් අවදානම


කොටස් අවදානම යනු කොටස් වෙළඳපොළ මිලෙහි අස්ථාවරත්වය නිසා ඇතිවන අවදානමයි.


වසර තුළ සමස්ථ කොටස් මිල දර්ශකය සහ වඩා ශ්‍රවශීල S & P SL20 පහත වැටුණි. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි කොටස් ආයෝජන කළඹ ක්‍රමානුකූල අවදානමකට නිරාවරණය වන අතර එය සමස්ත වෙළඳපොළටම ආවේණික වූ අවිනිශ්චිතතාවයකි.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි කොටස් කළඹේ විවිධාංගීකරණය කොටස් වෙළෙඳපොල තුළ අවස්ථාවරයන් හි බලපෑම යම් ප්‍රමාණයකට අවමකර ගැනීමට හේතු විය.









ද්‍රවශීලතා අවදානම

ආයෝජන වත්කම් මිලදී ගැනීමේ සහ විකිණීමේ ක්‍රියාවලිය තුළ දැරීමට සිදුවන අලාභ ද්‍රවශීලතා අවදානම යටතේ වර්ගීකරණය කළ හැක. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් භාණ්ඩාගාර බිල්පත් වැනි ඉහළ ද්‍රවශීල වත්කම්වල එහි අරමුදල්වලින් විශාල කොටසක් ආයෝජනය කිරීම මගින් අරමුදල්වල ද්‍රවශීලතා අවශ්‍යතා විසඳනු ලබයි.

පීවිත රක්ෂණ අරමුදල සහ සාමාන්‍ය රක්ෂණ අරමුදල වෙනස් ද්‍රවශීලතා අවශ්‍යතා සහ ආයෝජක ක්ෂිතිජ ඇත. එබැවින් අදාළ අරමුදල්වල ද්‍රවශීලතා අවශ්‍යතා ගැලපීමට ව්‍යූහගත කල්පිරීමේ පැතිකඩ සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි නිසි අවධානය යොමු කෙරේ. ද්‍රවශීල උපකරණවල ආයෝජන සංකේන්ද්‍රණ සීමා මත අභ්‍යන්තරව සංවර්ධනය කළ දැඩි සීමා ද්‍රවශීලතා අවදානම අවම කිරීමට සහය වේ.

ණය අවදානම

පොලී සහ/හෝ ප්‍රාග්ධනය නිරාකරණය නොකිරීම නිසා ඇතිවිය හැකි පාඩුව ණය අවදානම ලෙස හැඳින්වේ. ආයෝජන විකල්ප අතර තෝරා ගැනීමේදී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින් යොදාගත් දැඩි නිර්ණායක මෙම අවදානම අවම කරනු ලැබේ. විශේෂයෙන් අවිනිශ්චිත අවස්ථාවන්වලදී ඉහළ අවදානම් අංශවලට නිරාවරණය වැලැක්වීමේ අරමුණ ඇතිව ඉහළ ප්‍රමිතිවල ආයෝජන වත්කම්වල තත්ත්වය පවත්වා ගන්නා බව සහතික කිරීම පිණිස ආයෝජනවල ණය අවදානම දැඩිව නියාමනය කර කළමනාකරණය කෙරේ.

අවදානම් කළමනාකරණ වාර්තාව

සංකේන්ද්‍රණ අවදානම

ප්‍රමාණවත් ලෙස බණ්ඩනය වී නොමැති කළඹේ අවදානම අවිනිශ්චිතතාව ඉහළ අවස්ථාවේදී කළඹ සහතික කළ නොහැකි අවදානම්වලට නිරාවරණය කළ හැකිය. කළඹ ඉහළින් සංකේන්ද්‍රණය වන්නේනම්, එම විශේෂ අංශවල අඩු කාර්යසාධනය සමස්ථ කළඹ මත සැලකියයුතු බාධාවක් ඇතිවිය හැකිය. සංකේන්ද්‍රණ අවදානම අවම කිරීම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයෝජන විවිධාංගීකරණය කර ඇත.

මෙහෙයුම් අවදානම

මානව දෝෂ සහ වංචා ඇතුළු මෙහෙයුම් ක්‍රියා පටිපාටිවල අඩුපාඩු හේතුවෙන් මෙහෙයුම් අවදානම පාඩු ලැබීමේ අවදානමට හේතු වේ. මෙහෙයුම් අවදානම අවම කිරීම සඳහා රාජකාරී වෙන් කිරීම, ද්විත්ව පාලනය, දැඩි ප්‍රතිපත්ති සහ අත්පොත් සමඟ නිතිපතා විගණනය සිදු කරනු ලැබේ.

මෙහෙයුම් අවදානම යනු ආයතනයේ මෙහෙයුම් ක්‍රියාපටිපාටිවල අඩුපාඩු හේතුවෙන් මූල්‍ය අලාභ සිදුවීමේ හැකියාව වන අතර එයට මානව දෝෂ සහ වංචාසහගත කටයුතු ඇතුළත්ය. මෙහෙයුම් අවදානම අඩු කිරීම සඳහා, රාජකාරී වෙන් කිරීම, ද්විත්ව පාලනය, දැඩි ප්‍රතිපත්ති සහ අත්පොත් සමඟ නිතිපතා විගණන වැනි ක්‍රියාමාර්ග ආයතනය ක්‍රියාත්මක කරයි.

තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවදානම් කළමනාකරණය

අපගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවදානම් කළමනාකරණය කිරීමේදී බොහෝ වර්ධනයන් මත අපි කටයුතු කරමින් සිටිමු. මෙම වසරේ තොරතුරු ආරක්ෂක තත්ත්වය ඉහළ නැංවීමට සහ ක්ෂේත්‍රයේ මනා පරිචයන් සමඟ පෙළ ගැසීමට සහ ISO27001 තොරතුරු ආරක්ෂක ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම අපි ආරම්භ කළෙමු. තවද, තොරතුරු ආරක්ෂාව සහ වියහැකි සයිබර් ආරක්ෂක තර්ජනවලින් ආරක්ෂාවීමට අපගේ ක්‍රියාවන් වර්ධනය කිරීමට උපායමාර්ගික වැඩසටහන් ලෙස සුරක්ෂිත තොරතුරු හා අවස්ථා කළමනාකරණය සහ ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයේ (SOC) අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය පද්ධති සහ ක්‍රියාවලි වර්ධනයන් අපි සම්පූර්ණ කර ඇත. අපි අඛණ්ඩව ආරක්ෂක තාක්ෂණ වාතාවරණය වර්ධනය කරන අතර, සයිබර් ආරක්ෂාව සහ අනාගත මනා පරිචයන්ගේ වැදගත්කම පිළිබඳ පරිශීලක දැනුම වැඩි කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරමින් සිටිමු. තවද, තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවදානම් සහ අදාළ අවදානම් ලේඛනය ව්‍යවසාය අවදානම් කළමනාකරණය සමඟ තොරතුරු සන්නිවේදන තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිරන්තරව සමාලෝචනය කරයි. මෙවැනි සමාලෝචනවල ප්‍රතිඵල කාලීනව යාවත් කර අවශ්‍ය මඟපෙන්වීම අවදානම් කළමනාකරණ කමිටුව වෙත යොමු කෙරේ.

අභ්‍යන්තර (තොරතුරු තාක්ෂණ ආරක්ෂක කණ්ඩයට) සහ බාහිර පාර්ශවයන් (තොරතුරු පද්ධති විගණකවරු) විසින් සිදුකරන උවදුරු හැකියා තක්සේරුව මගින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවදානම් නිරන්තරව නියාමනය කෙරේ. මෙම උවදුරු හැකියා තක්සේරු වාර්තා ඇති කරන අතර ඒවා වඩාත් ආරක්ෂිත තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවා යොදා ගැනීමට හේතුවන අඩුපාඩු නිවැරදි කර ගැනීමට පසුව භාවිතා කෙරේ.

සයිබර් ආරක්ෂක අවදානම් කළමනාකරණය පිළිබඳ අවදානම් කළමනාකරණය දෘෂ්ටිකෝණයෙන්, ව්‍යාවසාය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව චක්‍රලේඛ අංක 02/17/150/0095/001 අනුව මහ බැංකුවේ විසින් දෙනලද ආකෘතිය අනුග මනය කරමින් කාර්තුමය වශයෙන් ප්‍රධාන තොරතුරු නිලධාරීගෙන් "සයිබර් ආරක්ෂක සිදුවීම් පිළිබඳ වාර්තාව"ක් ලබාගෙන අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ අනු කමිටුවට ඉදිරිපත් කරයි. තවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ තීරණය 17 අනුව අප විසින් අනුකූලවිය යුතු සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හවුලේ නිකුත් කළ 2017 ආයතනික යහපාලන සංග්‍රහයේ උ වගන්තියෙන් අවශ්‍ය පරිදි, වාර්තා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවදානම් කළමනාකරණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කෙරේ.

මානව සම්පත් අවදානම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විවිධ උපායමාර්ග හා ව්‍යවහාර ක්‍රියාත්මක කරමින් මානව සම්පත් අවදානම කළමනාකරණය කර ඇත. ඒවායින් සමහරක් පහත දක්වේ. පසුබිම් පරීක්ෂාවන්, යොමු පරීක්ෂාවන්, සහ නිපුනතා ඇගයීම් ඇතුළත් සම්පූර්ණ නිවාරණ ක්‍රියාවලියක් තුළින් නිවැරදි පුද්ගලයින් බඳවා ගැනීම, මානව සම්පත්වලට අදාළ කටයුතු පාලනය කරන පැහැදිලි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සංවර්ධනය, සේවක චර්යාව, විනය ක්‍රියාපටිපාටි, වෙනස් ලෙස නොසැලකීම, හිරිහැරය, සහ විශ්වාසය, නිරන්තර පුහුණු සහ සංවර්ධනය, නිරන්තර ප්‍රතිපෝෂණ ඇතුළත් ඵලදායී කාර්යසාධන කළමනාකරණ ව්‍යවහාර යොදා ගැනීම, පුහුණු කිරීම සහ අදාළ නීතිවලට අනුකූලතාව සහ සේවකයින් සමඟ නිරන්තර සන්නිවේදනය වැනි ගැටළු විසඳීම ඇතුළත්ය.

වංචා සහ විෂමාචාර කළමනාකරණය

පහත දී ඇති පරිදි විවිධ අදාළ නීති සහ රෙගුලාසි විශාල රාමුවක් අපගේ වංචා සහ විෂමාචාර විරෝධී උත්සාහයන්ට එකතු කර ගැනීමට නිර්ණායක සමූහයක් ලබා දේ.

A. මුදල් විශුද්ධිකරණ විරෝධී සහ ත්‍රස්ත මූල්‍ය විරෝධී රෙගුලාසිය: 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණ වැලැක්වීමේ පනත (PMLA), සංශෝධිත 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තාකරණ පනත (FTRA), 2019 අංක 01 දරන රක්ෂක (ගනුදෙනුකාර නිසි සම්ප්‍රජන්‍ය) නියමය, එක්සත් ජාතීන්ගේ සම්බාධක ලැයිස්තු, මූල්‍ය තොරතුරු ඒකකය විසින් සිදුකළ නියමයන් සහ රෙගුලාසි, සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දෙනලද මාර්ගෝපදේශග ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි, ප්‍රති මුදල් විශුද්ධිකරණ රාමුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රති මුදල් විශුද්ධිකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවන අතර අපි ශක්තිමත් ප්‍රති මුදල් විශුද්ධිකරණ රාමුවක් ක්‍රියාත්මත කර ඇත.

B. 1975 අංක 01 දරන වත්කම් හා වගකීම් ප්‍රකාශන පනත – අදාළ නිලධාරීන් මෙම පනත යටතේ අවශ්‍ය කරන පරිදි වාර්ෂිකව වත්කම් හා වගකීම් ප්‍රකාශ ලබා දී ඇත.

C. 1954 අංක 11 දරන අල්ලස් පනත – පනතේ අධික්ෂණය යටතේ පවත්වනු ලබන පරීක්ෂණ සඳහා අපි අපගේ සම්පූර්ණ සහය ලබා දෙමු.

D. ආයතනික යහපාලන සංග්‍රහ – වංචා වැලැක්වීමේදී එවැනි සංග්‍රහ මගින් අවශ්‍ය වන මූලධර්ම අපි වැළඳගෙන ඇති අතර වංචා කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නංවා ඇත.

දත්ත ආරක්ෂක දත්ත කළමනාකරණ රාමුව

පුද්ගල දත්ත රැස්කිරීම, පිරිසැකසුම, ගබඩා කිරීම සහ බැහැර කිරීම හා අදාළ අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා 2022 අංක 09 දරන දත්ත ආරක්ෂක පනතට අනුකූලව දත්ත ආරක්ෂාව කළමනාකරණය සඳහා අපි ශක්තිමත් රාමුවක් සමාගම ක්‍රියාත්මක කර ඇත. නීතියට අනුකූලතාව සහතික කිරීම සඳහා, සමාගම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියක් සංවර්ධනය කර, දත්ත ආරක්ෂණ නිධාරියෙක් පත්කර, වෙබ් අඩවියේ රහස්‍යතා ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත්කර ඇත. පුද්ගලික දත්ත රඳවාගෙන පිරිසැකසුම් කිරීම සඳහා ඔප්පුහිමියන්ගේ කැමැත්ත ලබා ගැනීමට සමාගම කටයුතු කරමින් සිටී. කාර්ය මණ්ඩලයට මෙම නීතියට අනුකූලවීම සඳහා අදාළ පුහුණු ලබා දී ඇත. ඊට අමතරව, සමාගම "Triple-A" ප්‍රවේශය භාවිතා කරන අතර එයට එහි සමස්ථ දත්ත ආරක්ෂණ අවදානම් කළමනාකරණ රාමුවේ කොටසක් ලෙස සහතික කිරීම, බලය ලබාදීම සහ විගණනය ඇතුළත්ය.

සමාජ මාධ්‍ය අවදානම් කළමනාකරණය

සමාගම ශක්තිමත් සමාජ මාධ්‍ය අවදානම් කළමනාකරණ සැලැස්මක් ක්‍රියාවට නැංවීම ආරම්භ කර ඇති අතර එයට පාර්ශවකරුවන් සමඟ එහි සමාජ මාධ්‍ය සන්නිවේදනය පාලනය සමාගම විසින් නඟා සිටුවන බව සහතික කිරීමට ක්‍රියාවලි රාශියක් ඇතුළත්ය. එය ව්‍යාපාරයට ඇතිකළ හැකි අවදානම් අවම කරනු ඇත. මෙම ක්‍රියාවලියට ගිණුම්වලට පළකිරීම් හෝ පණිවිඩ ප්‍රකාශ කිරීමට ඇති අය දැන ගැනීම සහ සන්නාම වටිනාකම මාර්ගගතව සහතික කිරීම අවශ්‍ය වේ.




නයෝමාල් පෙරේරා
සභාපති – අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව

2023 මැයි 10

අනුකූලතා වාර්තාව

රක්ෂණ ක්ෂේත්‍රය තුළ, නියාමන විධි නියෝග වැඩිවීම සහ ව්‍යාපාර පරිසරය තුළ වෙනස්වීම් හේතුවෙන් අනුකූලතා අවදානම්වල සක්‍රීය කළමනාකරණය සඳහා අවශ්‍යතාව වැඩි වී ඇත. මෙයට ගනුදෙනුකාර දත්ත ආරක්ෂාව සහ රහස්‍යතාව කෙරෙහි අවධානයක්, මෙන්ම වෙනත් නෛතික අවශ්‍යතා ඇතුළත්ය. රක්ෂණ සපයන්නන් අනකූලතා අවශ්‍යතාවන් දැඩිව පිළිපදිමින් විනිවිදභාවය ප්‍රමුඛ කළ යුතුය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි, අපි අපගේ දෛනික ව්‍යාපාර පරිචයන්ට අනුකූලතා අවශ්‍යතා ඇතුළත් කරමු. නියාමන වෙනස්වීම්වල වේගය සහ ප්‍රමාණය රක්ෂකයින් මත අබණ්ඩ අභියෝග මතු කරන අතර නව මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය වන IFRS 17 රක්ෂණ ගිණුම්කරණ අවශ්‍යතාවල සැලකියයුතු වෙනසක් නියෝජනය කරයි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රජය සතු ආයතනයක් වීම මත සීමිත වගකීම් සමාගම්, රක්ෂණ සමාගම් සහ රජය සතු සමාගම් සඳහා අදාළ වන විවිධ නීති, රීති සහ රෙගුලාසිවලට යටත් වේ.

පහත දැක්වෙන ප්‍රස්ථාරයෙන් සමාගමට අදාළ නෛතික රාමුව නිරූපණය කෙරේ:



අදාළ සියලු නීතිවලට අනුකූල වීමට අප සමාගම කැපවී සිටින අතර හඳුනා ගැනීම, නියාමනය කිරීම, වාර්තා කිරීම සහ අනුකූලතාවය සහතික කිරීම සඳහා විධිමත් අනුකූලතා රාමුවක් අපි සකස් කර ඇත. අනුකූලතා විධිනියෝගයට අනුකූලතා ප්‍රධානී විසින් අධීක්ෂණය කරන ආයතනික අනුකූලතා කාර්යයක් ස්ථාපිත කිරීම සඳහා මාර්ගෝපදේශ ඇතුළත්ය. අනුකූලතා ප්‍රධානී විගණන හා අනුකූලතා කමිටුවට, අවදානම් කළමනාකරණ කමිටුවට, සහ අධ්‍යක්ෂක මණ්ඩලයට නිතිපතා වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුකූලතා ප්‍රතිපත්තිය මඟින් සමාගමේ අනුකූලතා පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රධාන මූලධර්ම, අංග සහ ක්‍රියාපටිපාටි දක්වා ඇත. සමාගමේ විධායක කමිටුව ආයතනයේ ඉහළ මට්ටමේ අපේක්ෂාවන් ධනාත්මක සංස්කෘතියකට පරිවර්තනය කරන බව සහතික කිරීම මඟින් අනුකූලතාව ප්‍රවර්ධනය කිරීමේදී කාර්යභාරයක් ඉටු කරයි. සමාගමේ සියලුම දෙනා නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල විය යුතු බව මින් අදහස් කරයි.

"අනුකූලතා අවදානම" යන්නෙන් අදාළ නීති, රෙගුලාසි, අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ මූලධර්මවලට අනුකූල වීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අවංකකමට ඇතිවන හානිය සහ අලාභය අර්ථවත් වේ. අනුකූලතා අවදානම ඵලදායී ලෙස කළමණාකරණය කිරීමට අසමත් වීම මඟින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් දඩ, සිවිල් හා සාපරාධී දඩුවම් යනාදියට නිරාවරණය විය හැකිය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ව්‍යාපාර මූලධර්ම අනුව සෑම මට්ටමකම සියලුම සේවකයින් නීති සහ රෙගුලාසිවලට අනුකූලවීම පමණක් නොව වගවීමෙන් අවංකව කටයුතු කරමින් තම චර්යාව පවත්වා ගැනීම අවශ්‍ය වේ. මනා අනුකූලතා අවදානම් කළමනාකරණය ගනුදෙනුකරුවන්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ලබාදීමේදී වැදගත්වන බව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අවබෝධ කර ගනී.

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය එහි අනුකූලතා අවදානම් රුචිය තීරණය කිරීම සඳහා වගකීම දරයි. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, ඔවුන් ව්‍යාපාර උපායමාර්ගය, පරමාර්ථ, සහ ආයතනික ප්‍රතිපත්ති වැනි අභිමත අවදානම් සමඟ රෙගුලාසි සහ ක්ෂේත්‍රයේ සංග්‍රහ, වැනි අනුගම්‍ය අවශ්‍යතා තුළනය කළ යුතුය. ඵලදායී අනුකූලතා අවදානම් කළමනාකරණය සඳහා අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, නෛතික හා මානව සම්පත් ඇතුළුව ආයතනය තුළ ඇති සියලුම පාලන ක්‍රියාකාරකම් සම්බන්ධ කරන සහයෝගී ක්‍රියාවලියක් අවශ්‍යය.

සමාගමේ අනුකූලතා දෙපාර්තමේන්තුව අදාළ වන නීති, රීති සහ රෙගුලාසි වලට වගකිව යුතු අංශ හඳුනාගෙන ඇති අතර අනුකූලතා අවශ්‍යතා සපුරාලීමේදී සහයෝගී ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරයි. ඉදිරිය දකින පියවරක් ලෙස, අනුකූලතා දෙපාර්තමේන්තුව අනාගතයේ අපේක්ෂිත රෙගුලාසි පිළිබඳව කළමනාකරණයට මඟ පෙන්වයි, එයට හේතුව ක්‍රියාකාරී ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ විසඳුමක් මඟින් නව රෙගුලාසි පිරිවැය ඵලදායී ලෙස විසඳීමට අවශ්‍ය මෙවලම් සමාගමට සැපයීමයි.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ මුදල් විශුද්ධිකරණයට හෝ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා අරමුදල් සැපයීමට පහසුකම් සපයන ඕනෑම ක්‍රියාකාරකමක් තහනම් කිරීම සහ ක්‍රියාශීලීව ඉදිරියට යාම සමාගමේ ප්‍රතිපත්තියයි. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අදාළ නීතිවලට අනුකූලව ප්‍රති මුදල් විශුද්ධිකරණ අනුකූලතාවයට බැඳී සිටින අතර මුදල් විශුද්ධිකරණ අරමුණු සඳහා සිය නිෂ්පාදන හා සේවාවන් භාවිතා කිරීම වැළැක්වීම සඳහා එහි කළමනාකාරිත්වය, කාර්ය මණ්ඩලය සහ පත් කරන ලද නියෝජිතයින් මෙම ප්‍රමිතීන් පිළිපැදීම අවශ්‍යය. මුදල් විශුද්ධිකරණය යනු කුමක්ද, එය සිදු කරන්නේ කෙසේද සහ එය වළක්වා ගැනීමට ගත හැකි පියවර පිළිබඳව කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට ගැඹුරු අවබෝධයක් ලබා දීම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අභ්‍යන්තරව විද්‍යුත් ඉගෙනුම් මොඩියුලයක් නිර්මාණය කර ඇත. ක්‍රියාවලිය අවසානයේදී, සේවකයින්ට විභාගයකට පෙනී සිටිය යුතු අතර කාර්ය සාධන ඇගයීම සඳහා 5% ක ප්‍රතිපාදන වෙන් කළ යුතුය.

අප සතුව තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රතිපත්තියක් ඇති අතර අනුකූලතා නිලධාරියා තොරතුරු අනාවරණය කරන නිලධාරියා වන අතර එම ප්‍රතිපත්තිය සමාගම තුළ ක්‍රියාත්මක වන බව සහතික කරයි. "අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ අනෙකුත් සියලුම සේවකයින් සඳහා වන ව්‍යාපාරික චර්යාධර්ම හා ආචාර ධර්ම සංග්‍රහය" ආයතනයේ සාමාජිකයන් නියම කර ඇති

අනුකූලතා වාර්තාව

මූලධර්ම, රීති, සාරධර්ම, ප්‍රමිතීන්ට මෙන්ම ව්‍යාපාරවල යෙදීමේදී නෛතික අනුකූලතාවයට අනුකූල වන බව සහතික කිරීම සඳහා සැලසුම් කර ඇත.

අනුකූලතා දෙපාර්තමේන්තුව දෙපාර්තමේන්තුමය වශයෙන් පුහුණුවක් ලබා දෙන අතර අභ්‍යන්තර සන්නිවේදන අවකාශ හරහා "අනුකූලතා ඉඟි" මගින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය දැනුවත් කරයි. සමාගම සිය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කරමින් සිටින අතර අනාගතයේදී අනුකූලතා කළමනාකරණය කෙරෙහි වඩාත් කාර්යක්ෂමව අවධානය යොමු කිරීමට නිපුණතා අනුකූලතා ප්‍රාග්ධනය උපයෝගී කර ගැනීම සඳහා පහසුකම් සලසයි. සමාලෝචිත වසර තුළ, අනුකූලතා සංස්කෘතික ප්‍රමුඛතා ආයතනයේ සැකැස්මට ඇතුළත් කිරීමට අනුකූලතා දෙපාර්තමේන්තුව "ඉ-වාණිජ්‍ය නීති සහ සයිබර් ආරක්ෂාව" වැනි මතුවන ක්ෂේත්‍ර පිළිබඳ පුහුණු සැසි පවත්වා ඇති අතර 2022 දී "දත්ත ආරක්ෂාව" වැනි වෙනත් ක්ෂේත්‍ර පිළිබඳවද පුහුණු සැසි පවත්වන ලදී.

අනුකූලතා අවදානම් ක්ෂේත්‍රය තුළ, ආරක්ෂක ආකෘතියේ මාර්ග හතරක් අනුගමනය කරනු ලැබේ: අදාළ දෙපාර්තමේන්තුවල අවදානම් හවුල්කරුවන් ලෙස හඳුනාගෙන ඇති සැබෑ අවදානම් අයිතිකරුවන් ආරක්ෂක අංශයේ පළමු පෙළ ලෙස ක්‍රියා කරයි; අවදානම් කළමනාකරණ කමිටුව සහ විගණන හා අනුකූලතා කමිටුව ආරක්ෂක දෙවන පෙළ ලෙස ක්‍රියා කරයි; අභ්‍යන්තර විගණනය "මුදල් විශුද්ධිකරණය" සඳහා ආරක්ෂක තුන්වන පෙළ ලෙස ක්‍රියා කරයි; නියාමකයා, එනම්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) සහ බාහිර විගණකවරුන් (2010 අගෝස්තු 23 දිනැති චක්‍රලේඛ අංක 29,) සිව්වන ආරක්ෂක වළල්ල ලෙස ක්‍රියා කරයි. අනුකූලතා අවදානම් න්‍යාය පත්‍රය විගණන න්‍යාය පත්‍රයට ද්විතියික නොවන බව සහතික කිරීම සඳහා, අනුකූලතා දෙපාර්තමේන්තුව විගණන හා අනුකූලතා කමිටුවට සහ අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කරයි.

පහත සඳහන් දෑ ක්‍රියාත්මක වන බව සහතික කිරීමෙන් අනුකූලතා අවදානම අවම කර ඇත: අනුකූලතාවය සහ අවදානම් කළමනාකරණය නියාමනය කිරීම ඒකාබද්ධ කිරීම; විවෘත හා විනිවිද පෙනෙන වාර්තාකරණයට සහාය වීම; සහ පාර්ශවකරුවන් සමඟ සබඳතා ගොඩනඟා ගැනීම. ආචාර ධර්ම හා මනා පරිචයන් අනුව අනුකූලතා රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, නිවැරදි කිරීමේ සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අනුකූලතා ගැටළු සහ සිදුවීම් අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනු කමිටු වෙත තීව්‍ර කරනු ලැබේ.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, බාහිර විගණක වාර්තාවේ හෙළිදරව් කිරීම්, මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සහ ආයතනික පාලන වාර්තාවට යටත්ව, පහත වගුවේ දක්වා ඇති සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා, රීති හා රෙගුලාසි වලට සමාගම අනුකූල විය.

නියාමන සහ ව්‍යවස්ථාපිත අනුකූලතාවය - නියාමක/නියාමන අධිකාරීන්ට සදහා ප්‍රතිඵල සහ ගෙවීම් ඉදිරිපත් කිරීම.

2022 ජනවාරි 01 වන දින සිට 2022 දෙසැම්බර් 31 වන දින දක්වා වන කාල පරිච්ඡේදය සදහා අනුකූලතා වාර්තාව

නියාමන/ව්‍යාවස්ථාපිත අවශ්‍යතාව	වාර්තාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ වාරගණන	ඉදිරිපත් කිරීම/ගෙවීම කළ දිනය	සිදුකළ දිනය	අනුකූලතාව සහ විශේෂ කරුණු
කාල පරිච්ඡේදය තුළදී ගෙවීමට නියමිත වන නියාමන/ව්‍යවස්ථාපිත වාර්ථා/ගෙවීම්				
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව				
රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 49 (ආ) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිපත් කළ යුතු වන කාර්තුමය වාර්තා				
2012 අප්‍රේල් 01 වන දින සිට බලපවත්වනු ලබන රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 49 (ආ) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතු ප්‍රතිශෝධිත කාර්තුමය වාර්තා (ආකෘතිය 49)				
නීර්ණය ආකෘති	කාර්තුව අවසන් වී දින 45 ක් ඇතුලත කාර්තු වශයෙන්	4 වන කාර්තුව (21) – පෙබරවාරි 15	2022 පෙබරවාරි 15	
		1 වන කාර්තුව (22) – මැයි 15	2022 මැයි 13	
		2 වන කාර්තුව (22) – අගෝස්තු 15	2022 අගෝස්තු 15	
		3 වන කාර්තුව (22) – නොවැම්බර් 15	2022 නොවැම්බර් 15	
අවදානම් පාදක ප්‍රාග්ධනය (ආකෘති) – සාමාන්‍ය	කාර්තුව අවසන් වී දින 45 ක් ඇතුලත කාර්තු වශයෙන්	4 වන කාර්තුව (21) – පෙබරවාරි 15	2022 පෙබරවාරි 15	
		1 වන කාර්තුව (22) – මැයි 15	2022 මැයි 13	
		2 වන කාර්තුව (22) – අගෝස්තු 15	2022 අගෝස්තු 15	
		3 වන කාර්තුව (22) – නොවැම්බර් 15	2022 නොවැම්බර් 15	
අවදානම් පාදක ප්‍රාග්ධනය (ආකෘති) – ජීවිත	කාර්තුව අවසන් වී දින 45 ක් ඇතුලත කාර්තු වශයෙන්	4 වන කාර්තුව (21) – පෙබරවාරි 15	2022 පෙබරවාරි 15	
		1 වන කාර්තුව (22) – මැයි 15	2022 මැයි 13	
		2 වන කාර්තුව (22) – අගෝස්තු 15	2022 අගෝස්තු 15	
		3 වන කාර්තුව (22) – නොවැම්බර් 15	2022 නොවැම්බර් 15	
ශේෂ පත්‍ර සහ ලාභ ආලාභ ගිණුම (ආකෘති)	කාර්තුව අවසන් වී දින 45 ක් ඇතුලත කාර්තු වශයෙන්	4 වන කාර්තුව (21) – පෙබරවාරි 15	2022 පෙබරවාරි 15	
		1 වන කාර්තුව (22) – මැයි 15	2022 මැයි 13	
		2 වන කාර්තුව (22) – අගෝස්තු 15	2022 අගෝස්තු 15	
		3 වන කාර්තුව (22) – නොවැම්බර් 15	2022 නොවැම්බර් 15	

අනුකූලතා වාර්තාව

නියාමන/ව්‍යාවස්ථාපිත අවශ්‍යතාව	වාර්තාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ වාරගණන	ඉදිරිපත් කිරීම/ගෙවීම කළ දිනය	සිදුකළ දිනය	අනුකූලතාව සහ විශේෂ කරුණු
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කෝමිසන් සභාවේ අංක 12 චක්‍ර ලේඛය යටතේ ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන මූල්‍ය නිලධාරි සහ ප්‍රධාන නිලධාරියා විසින් සිදු කරනු ලබන කාර්තුමය සහතික කිරීම් (අ. සහතික කිරීම)	කාර්තුව අවසන් වී දින 45 ක් ඇතුලත කාර්තු වශයෙන්	4 වන කාර්තුව (21) – පෙබරවාරි 15	2022 පෙබරවාරි 15	
		1 වන කාර්තුව (22) – මැයි 15	2022 මැයි 13	
		2 වන කාර්තුව (22) – අගෝස්තු 15	2022 අගෝස්තු 15	
		3 වන කාර්තුව (22) – නොවැම්බර් 15	2022 නොවැම්බර් 15	
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කෝමිසන් සභාවේ අංක 12 චක්‍ර ලේඛය යටතේ ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන මූල්‍ය නිලධාරි සහ ප්‍රධාන නිලධාරියා විසින් සිදු කරනු ලබන කාර්තුමය සහතික කිරීම් (ආ. සහතික කිරීම)	කාර්තුව අවසන් වී දින 45 ක් ඇතුලත කාර්තු වශයෙන්	4 වන කාර්තුව (21) – පෙබරවාරි 15	2022 පෙබරවාරි 15	
		1 වන කාර්තුව (22) – මැයි 15	2022 මැයි 13	
		2 වන කාර්තුව (22) – අගෝස්තු 15	2022 අගෝස්තු 15	
		3 වන කාර්තුව (22) – නොවැම්බර් 15	2022 නොවැම්බර් 15	
වැඩිදුර වාර්තා				
(1) ප්‍රතිරක්ෂණ ගිවිසුම් ආවරණ සටහන්	වාර්ෂිකව	ඉදිරි වසරේ මාර්තු 15 ට පෙර	15 මාර්තු 2022	
(2) ප්‍රතිරක්ෂණ අවදානම මාරු කිරීමේ වැඩසටහන (2021)	වාර්ෂිකව	ජනවාරි 31 හෝ ඊට පෙර	31 ජනවාරි 2022	
(3) වෛකල්පිත සැලසුම	කාර්තුමය	4 වන කාර්තුව (21) – පෙබරවාරි 15	2022 පෙබරවාරි 15	
		1 වන කාර්තුව (22) – මැයි 15	2022 මැයි 13	
		2 වන කාර්තුව (22) – අගෝස්තු 15	2022 අගෝස්තු 15	
		3 වන කාර්තුව (22) – නොවැම්බර් 15	2022 නොවැම්බර් 15	
2000 අංක 43 දරණ රක්ෂණ කාර්මාන්ත නියාමන පනත යටතේ වාර්ෂික ගොනු කිරීම				
අවදානම් පාදක ප්‍රාග්ධනය (ආකෘති) – සාමාන්‍ය	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
අවදානම් පාදක ප්‍රාග්ධනය (ආකෘති) – ජීවිත	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
නීර්ණය ආකෘති	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
ශේෂ පත්‍ර සහ ලාභ ආලාභ ගිණුම (ආකෘති)	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
ආයු ගණක වාර්තාව සහ සාරාංශය	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	

නියාමන/ව්‍යාවස්ථාපිත අවශ්‍යතාව	වාර්තාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ වාරගණන	ඉදිරිපත් කිරීම/ගෙවීම කළ දිනය	සිදුකළ දිනය	අනුකූලතාව සහ විශේෂ කරුණු
වෙනත් ආකෘති				
1. අවදානම් තක්සේරු වාර්තාව	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
2. අධ්‍යක්ෂක වරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
3. දිර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය- රක්ෂකයා විසින් පනතේ ප්‍රතිපාදනයන්ට අනුකූලතාව දැක්වීම හා සම්බන්ධ සහතික කිරීම්	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
4. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය- රක්ෂකයා විසින් පනතේ ප්‍රතිපාදනයන්ට අනුකූලතාව දැක්වීම හා සම්බන්ධ සහතික කිරීම්	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
5. සමාගමේ වාර්ෂික වාර්තාව	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
6. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ චක්‍ර ලේඛ අංක 29 මත සත්‍ය අනාවරණය කර ගැනීම පිලිබඳ විගණක වරුන්ගේ වාර්තාව	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
7. කළමණාකාරිත්ව ලිපිය	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 මැයි 31	සමූහ විගණනය අවසන් කිරීමේ ප්‍රමාදය හේතු විය
8. අනුකූලතා සහතික කිරීම (අ) - දිර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
අනුකූලතා සහතික කිරීම (අ) - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
9. අනුකූලතා සහතික කිරීම (ආ)	වාර්ෂිකව	2021 වසර අවසානය – 2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
ගෙවීම්				
සෙස් බද්ධ ශුද්ධ වාරිකයෙන් ජීවිත 0.2% සහ සමාන්‍ය 0.4% වශයෙන්	කාර්තුමය	4 වන කාර්තුව (21) – ජනවාරි 31	2022 ජනවාරි 31	IRCSL විසින් යොදාගත් වැඩපිළිවෙල හේතුවෙන් ඔවුන්ගේ උපදෙස් පරිදි පසුදින ඉදිරිපත් කරන ලදී.
		1 වන කාර්තුව (22) – අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
		2 වන කාර්තුව (22) – ජූලි 31	2022 අගෝස්තු 01	
		3 වන කාර්තුව (22) – ඔක්තෝබර් 31	2022 ඔක්තෝබර් 31	
වාර්ෂික ගාස්තුව	වාර්ෂිකව	2022 අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	

නියාමන/ව්‍යාවස්ථාපිත අවශ්‍යතාව	වාර්තාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ වාරගණන	ඉදිරිපත් කිරීම/ගෙවීම කළ දිනය	සිදුකළ දිනය	අනුකූලතාව සහ විශේෂ කරුණු
දේශීය අදායම් දෙපාර්තමේන්තුව				
වාර්තා				
අගය එකතු කළ බදු වාර්තා	කාර්තුමය	4 වන කාර්තුව (21) – ජනවාරි 31	2022 ජනවාරි 31	
		1 වන කාර්තුව (22) – අප්‍රේල් 30	2022 අප්‍රේල් 30	
		2 වන කාර්තුව (22) – ජූලි 31	2022 ජූලි 31	
		3 වන කාර්තුව (22) – ඔක්තෝබර් 31	2022 ඔක්තෝබර් 31	
මුද්දර ගාස්තු	කාර්තුමය	4 වන කාර්තුව (21) – ජනවාරි 31	2022 ජනවාරි 13	
		1 වන කාර්තුව (22) – අප්‍රේල් 30	2022 අප්‍රේල් 12	
		2 වන කාර්තුව (22) – ජූලි 31	2022 ජූලි 15	
		3 වන කාර්තුව (22) – ඔක්තෝබර් 31	2022 ඔක්තෝබර් 14	
උපයන විට ගෙවීමේ බදු වාර්තා	වාර්ෂිකව	2021 අප්‍රේල් 30	2022 අප්‍රේල් 30	
බෝග රක්ෂණ බද්ද	කාර්තුමය	3 වන කාර්තුව (21) – ජනවාරි 30	2022 ජනවාරි 28	
		4 වන කාර්තුව (22) – අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
		1 වන කාර්තුව (22) – ජූලි 30	2022 ජූලි 29	
		අවසන් (21) – සැප්තැම්බර් 30	2022 සැප්තැම්බර් 30	
		2 වන කාර්තුව (22) – ඔක්තෝබර් 30	2022 ඔක්තෝබර් 28	
ගෙවීම්				
අගය එකතු කළ බදු	මාසික	එළඹෙන මාසයේ 20 වන දින	නියමිත දිනට ඉදිරිපත් කරන ලදී	
උපයන විට ගෙවීමේ බදු	මාසික	එළඹෙන මාසයේ 15 වන දින	නියමිත දිනට ඉදිරිපත් කරන ලදී	
අදායම් බදු	කාර්තුමය	පෙබරවාරි 15 දින හෝ ඊට පෙර	2022 පෙබරවාරි 15	
		මැයි 15 දින හෝ ඊට පෙර	2022 මැයි 17	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රටතුළ පැවති තත්ත්වය හේතුවෙන් කාලය දීර්ඝ කරන ලදී
		අගෝස්තු 15 දින හෝ ඊට පෙර	2022 අගෝස්තු 15	
		සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර	2022 සැප්තැම්බර් 30	
		නොවැම්බර් 15 දින හෝ ඊට පෙර	2022 නොවැම්බර් 15	

නියාමන/ව්‍යාවස්ථාපිත අවශ්‍යතාව	වාර්තාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ වාරගණන	ඉදිරිපත් කිරීම/ගෙවීම කළ දිනය	සිදුකළ දිනය	අනුකූලතාව සහ විශේෂ කරුණු
මුද්දර ගාස්තු	කාර්තුමය	4 වන කාර්තුව (21) – ජනවාරි 15	2022 ජනවාරි 13	
		1 වන කාර්තුව (22) – අප්‍රේල් 15	2022 අප්‍රේල් 12	
		2 වන කාර්තුව (22) – ජූලි 15	2022 ජූලි 15	
		3 වන කාර්තුව (22) – ඔක්තෝබර් 15	2022 ඔක්තෝබර් 14	
බෝග රක්ෂණ බද්ද	කාර්තුමය	3 වන කාර්තුව (21) – ජනවාරි 30	2022 ජනවාරි 28	
		4 වන කාර්තුව (21) – අප්‍රේල් 30	2022 අප්‍රේල් 29	
		1 වන කාර්තුව (22) – ජූලි 30	2022 ජූලි 29	
		අවසාන කාර්තුව (21) – සැප්තැම්බර් 30	2022 සැප්තැම්බර් 30	
		3 වන කාර්තුව (22) – ඔක්තෝබර් 30	2022 ඔක්තෝබර් 28	
ශ්‍රී ලංකා මහ බැංකුව				
සේවක අර්ථසාධක අරමුදල් වාර්තා	අර්ධ-වාර්ෂිකව	ජනවාරි 31 සහ ජූලි 31	නියමිත දිනට ඉදිරිපත් කරන ලදී	
මුදල් විශුද්ධිකරණ වාර්තා				
1. මුදල් ගනුදෙනු වාර්තාව	මාසික	එළඹෙන මාසයේ 15 වන දින	නියමිත දිනට ඉදිරිපත් කරන ලදී	
2. සැක කටයුතු ගනුදෙනු වාර්තා	දින දෙකක් තුළ	දින දෙකක් තුළ	අවශ්‍යතාව අනුව කාලීන ඉදිරිපත් කරන ලදී	
සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල	මාසික	එළඹෙන මාසයේ අවසාන වැඩ කරන දිනට දිනකට පෙර	නියමිත දිනට ඉදිරිපත් කරන ලදී	
සේවා නියුක්තිකයන්ගේ චාර අරමුදල් මණ්ඩලය				
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් වාර්තා	අර්ධ-වාර්ෂිකව	ජනවාරි 31 සහ ජූලි 31	නියමිත දිනට ඉදිරිපත් කරන ලදී	
සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල	මාසික	ඊළඟ මාසයේ අවසාන වැඩ කරන දිනට දිනකට පෙර	නියමිත දිනට ඉදිරිපත් කරන ලදී	
මෝටර් රථ වාහන රෙජිස්ට්‍රාර්				
ගෙවීම් – සුඛෝපභෝගී හා අර්ධ සුඛෝපභෝගී බද්ද	මාසික	එළඹෙන මාසයේ 10 වන දින	නියමිත දිනට ඉදිරිපත් කරන ලදී	

අනුකූලතා වාර්තාව

නියාමන/ව්‍යාවස්ථාපිත අවශ්‍යතාව	වාර්තාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ වාරගණන	ඉදිරිපත් කිරීම/ගෙවීම කළ දිනය	සිදුකළ දිනය	අනුකූලතාව සහ විශේෂ කරුණු
සමාගම් රෙජිස්ට්‍රාර්				
මූල්‍ය ප්‍රකාශන ලියා පදිංචි කිරීම	වාර්ෂිකව	සමාගමේ මූල්‍ය ප්‍රකාශන දිනයෙන් පසු, දින 20 ක් ඇතුලත	2022 ජූලි 25	
ප්‍රවාහන අමාත්‍යාංශය				
ගෙවීම – මාර්ග ආරක්ෂක අරමුදල	මාසික	එළබෙන මසයේ 15 වන දින	නියමිත දිනට ඉදිරිපත් කරන ලදී. (2022 ජූලි 18 ඉදිරිපත් කළ ජූනි ගෙවීම හැර)	එම කාලය තුළ රටේ පැවති තත්ත්වය හේතුවෙන් ප්‍රමාද විය
මහනගරසභා/නගරසභා				
ගෙවීම – ගාස්තු සහ බදු	වාර්ෂිකව	වර්තමාන වර්ෂයේ ජනවාරි 31 වන දිනට පෙර (ප්‍රතිධානය සදහා)	නියමිත දිනට ඉදිරිපත් කරන ලදී	
ජාතික රක්ෂණ භාර අරමුදල				
ගෙවීම් – SRCC සහ ත්‍රස්තවාදී අරමුදල	මාසික	මාසය අවසන් වී දින 45 ක් ඇතුලත	නියමිත දිනට ඉදිරිපත් කරන ලදී	
කම්කරු වන්දි කොමසාරිස්				
බලපත්‍රය අලුත් කිරීම – කම්කරු වන්දි රක්ෂණ	වාර්ෂිකව	මැයි 30 වන දිනට පෙර	නියමිත දිනට ඉදිරිපත් කරන ලදී	

අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය

හොඳ අභ්‍යන්තර පාලන පද්ධතියක් පවතින බව සහතික කිරීමට අභ්‍යන්තර පාලන ක්‍රම සහ අවදානම් කළමනාකරණය කිරීම සඳහා මණ්ඩලය විසින් අවසාන අධීක්ෂණය සහ මග පෙන්වීම සපයයි. පාර්ශවකරුවන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීමේදී ඵලදායීතාවය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් සහ පාලන යන ක්ෂේත්‍රවල වර්ධනයන් පිළිබඳව අවධානයෙන් සිටී.

මනා අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ භාවිතයන් සමාගමේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුවේ අනිවාර්ය අංගයක් බව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. අභ්‍යන්තර පාලන ක්‍රමය සැලසුම් කර ඇත්තේ අසාර්ථක වීමේ අවදානම තුරන් කිරීමට වඩා අපේක්ෂිත ප්‍රතිඵල සහ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස අවදානම් සාධාරණ මට්ටමකට කළමනාකරණය කිරීමට ය. මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ප්‍රධාන අධ්‍යක්ෂක මණ්ඩල අනු කමිටු හයක් සහ මනාව නිර්වචනය කරන ලද ආයතනික ව්‍යුහයක් පිහිටුවා ඇති අතර එමඟින් වගවීම සහ බලය පවරන ලද මාර්ග පැහැදිලිව දක්වා ඇත. මණ්ඩල අනු කමිටු හය නම්; විගණන හා අනුකූලතා කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව, මානව සම්පත් කමිටුව, ආයෝජන කමිටුව, ඩිජිටල් පරිනාමන කමිටුව සහ උපායමාර්ගික සමාලෝචන කමිටුව වේ. ප්‍රධාන කමිටු පාලනය කරනු ලබන්නේ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රඥප්ති මඟින් වන අතර ඒවා යහපාලනයේ මූලික මූලධර්මවලට අනුකූලව ක්‍රියා කරයි

මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන පද්ධති, අවදානම් කළමනාකරණ පද්ධති සහ අභ්‍යන්තර හා බාහිර විගණන කාර්යයන් වැනි අංශවල අධීක්ෂණ වගකීම් ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම සඳහා විගණන හා අනුකූලතා කමිටුව උපායමාර්ගික සහාය සපයයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සමඟ මෙහෙයුම් අනුකූල වීම සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය සත්‍යාපනය කරන අතර ඕනෑම අනනුකූලතාවයක් සම්බන්ධයෙන් සැලකිය යුතු සොයාගැනීම් විශේෂ කොට දක්වයි. සියළුම ඒකක සහ ශාඛා පිළිබඳව විගණන සිදු කරනු ලබන අතර, මෙම ඒකකවල සහ ශාඛා වල මෙහෙයුම් හා කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳ ස්වාධීන හා විෂය නිශ්‍රිත වාර්තාවක් සැපයීම සඳහා තක්සේරු කරන ලද අවදානම් මට්ටම අනුව වාර ගණන තීරණය වේ. වාර්ෂික විගණන සැලැස්ම විගණන කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කරනු ලබන අතර විගණනයේ සොයා ගැනීම් වරින් වර රැස්වීම්වලදී සමාලෝචනය සඳහා විගණන කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ. ශාඛා විගණනයේ සොයා ගැනීම් සාකච්ඡා කිරීම සඳහා විශේෂ අනුකමිටුවක් පිහිටුවා ඇත.


මූල්‍ය වාර්තාකරණය පිළිබඳ ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් තිබීම සංවිධානයේ ඵලදායී පාලනය සහතික කිරීමට අත්‍යවශ්‍ය වේ. අභ්‍යන්තර පාලනයට අදාළව විගණන හා අනුකූලතා කමිටුවේ මූලික වගකීම වන්නේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය අධීක්ෂණය කර සමාලෝචනය කිරීමයි. ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම සඳහා කළමනාකරණයේ රාජකාරිය වුවද, සමස්තයක් ලෙස පද්ධතිය නියාමනය කර තක්සේරු කිරීම සඳහා විගණන හා අනුකූලතා කමිටුවෙහි වගකීමට බැඳී සිටී. අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යසාධනය මැනීම සඳහා අඛණ්ඩ නියාමන කටයුතු, අභ්‍යන්තර විගණනයන් සහ වෙනත් ඇගයීම් භාවිතා කෙරේ. පාලනයේ යෝග්‍යතාවය හා ඵලදායීතාවය නියාමනය කිරීමේ ක්‍රියා පටිපාටි ආයතනයේ සාමාන්‍ය මෙහෙයුම් තුළ අන්තර්ගත කෙරේ.

ආයතනයේ සමස්ත අවදානම් කළමනාකරණ උපාය මාර්ගය හා ඒකාත්මික වූ ශක්තිමත් අනුකූලතා කළමනාකරණ පද්ධතියක් ආයතනය ස්ථාපිත කර ඇත. මෙය අනුකූලතා අවදානම් කළමනාකරණ ප්‍රඥාප්තිය තුළ වඩාත් හොඳින් විස්තර කර ඇත. අනුකූලතා වැඩසටහනට සමාගම් පනත යටතේ සීමිත වගකීම් සහිත සමාගමක, රක්ෂණ කර්මාන්ත නියාමන පනත යටතේ රක්ෂණ සමාගමක් සඳහා වන නීතිමය අවශ්‍යතා සහ රජයට අයත් සීමිත වගකීම් සමාගම් සඳහා අදාළ නෛතික රාමුව ඇතුළත්ය. මෙහෙයුම් රාමුවේ අඛණ්ඩතාව සහ ස්ථායිතාව මත ඇති විය හැකි ප්‍රතිවිපාක අවම කිරීම සඳහා, ශක්තිමත් මුදල් විශුද්ධිකරණ රාමුවක් ක්‍රියාත්මක කර ඇත. මෙයට නියම කරන ලද දත්තපදනම භාවිතයෙන් ගනුදෙනුකරුවන් පරීක්ෂා කිරීම, ගනුදෙනුකරුවන්ගේ නිසි සම්ප්‍රජන්‍ය, සේවකයින්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා දායක වන ඉ-ඉගෙනුම් මොඩියුලයක්, වාර්ෂික අභ්‍යන්තර විගණන සහ ප්‍රති මුදල් විශුද්ධිකරණ අවදානම් තක්සේරු කිරීම ඇතුළත්ය.

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් කළමනාකරණ කාර්යය වෙනම අවදානම් කමිටුවකට පවරා ඇති අතර එමඟින් සමාගමේ වඩාත්ම සැලකියයුතු අවදානම් සහ අවදානම් කළමනාකරණ හැකියාවන් කෙරෙහි අවධානය යොමු කෙරේ. සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමාගමේ උපාය මාර්ග හා අවදානම් රුචියට ගැලපෙන බවට සහ සුදුසු අවදානම් දැනුවත් කිරීම් දිරිගන්වන පුළුල් ව්‍යවසාය සංස්කෘතියක් ප්‍රවර්ධනය කරන බවට අධ්‍යක්ෂවරුන් සෑහීමකට පත්වේ. අවදානම් දෙපාර්තමේන්තුව අවදානම් කළමනාකරණ කමිටුව සහ ආයෝජන කමිටුව මෙන්ම විධායක කමිටුව, විගණන පසු විපරම් කමිටුව සහ නිෂ්පාදන සංවර්ධන කමිටුව යනාදිය ඇතුළත් කළමනාකරණ කමිටු වැනි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද අනු කමිටු සමඟ අදහස් හුවමාරු කරගනු ලබයි. ඒ අනුව, ව්‍යවසාය අවදානම් කළමනාකරණ කණ්ඩායම අවදානම් දෘෂ්ටි කෝණයකින් ස්වාධීන මතයක් සපයන අතර එමඟින් අවදානම් බලපෑම සැලකිල්ලට ගනිමින් කළමනාකාරීත්වයට සහ මණ්ඩලයට දැනුවත් තීරණ ගැනීමට හැකියාව ලැබේ.




රොනල්ඩ් සී පෙරේරා, ජනාධිපති නීතීඥ
සභාපති



දුෂ්මන්ත තොටවත්ත
සභාපති – විගණන සහ අනුකූලතා කමිටුව

2023 මැයි 10

107-240
මූල්‍යමය කොරතුරු



108 සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව

111 අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව

112 ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම පිළිබඳ වාර්තාව

113 රක්ෂකයාගේ ආයුගණක සහතිකය

114 වගකීම් ප්‍රමාණාත්මතාවයේ පරීක්ෂණය

115 දරණ ලද එහෙත් ප්‍රමාණවත්ව වාර්තා නොවූ හිමිකම් පිළිබඳ සහතිකය

116 ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

120 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

122 ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

124 හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

130 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

132 ඛණ්ඩමය සමාලෝචනය: මූල්‍ය ත්තත්වය පිළිබඳ ප්‍රකාශය

134 ඛණ්ඩමය සමාලෝචනය: ආදායම් ප්‍රකාශය

136 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සාමාන්‍ය තොරතුරු

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, 2022 දෙසැම්බර් 31න් අවසන්වූ වර්ෂය සඳහා ඔවුන්ගේ වාර්ෂික වාර්තාව, සමඟ සමාගමේ සහ සමූහයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ (සංශෝධිත), 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනතේ (සංශෝධිත), 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ හා එහි සංශෝධන සහ ආයතනික පාලනය පිළිබඳ මනා පරිචයන්හි අවශ්‍යතාවයන් මූල්‍ය ප්‍රකාශන වලින් සපුරා ඇති බවට විගණකාධිපතිගේ වාර්තාව සිය සමාජිකයින්ට සතුටින් ඉදිරිපත් කර සිටියි.

2022 දෙසැම්බර් 31 දිනට, 99.97% ක කොටස් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම් වෙත පවරනු ලැබ ඇත.

සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් (පුද්ගලික) සමාගම, සීමාසහිත කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගම යන සමාගම් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට පූර්ණ අයිතිය ඇති සමාගමේ පරිපාලිත සමාගම් වෙයි. සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමේ කොටස්වලින් 99.94%ක් ද සීමාසහිත ලංකා හොස්පිටල් (පුද්ගලික) සමාගමේ කොටස් වලින් 51.34%ක් ද ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු වෙයි. ඊට අමතරව, සීමාසහිත කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ කොටස් වලින් 52.05% ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හිමියි.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හා, ප්‍රධාන කාර්යාලය කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 21, රක්ෂණ මන්දිරයෙහි පිහිටා ඇත.

මෙම වාර්තාව 2023 මැයි මස 10 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

සමාගමේ සහ සමූහයේ ප්‍රධාන කටයුතු

සමාගම ශ්‍රී ලංකාව තුළ ජීවිත රක්ෂණ සහ ජීවිත නොවන රක්ෂණ (සාමාන්‍ය රක්ෂණ) ප්‍රතිරක්ෂණය කරයි. සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල විශාල වෙනසක්කම් සිදුකර නැත.

සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් (පුද්ගලික) සමාගමේ ප්‍රධාන කාර්යය ද්‍රව පෙට්‍රෝලියම් (LPG) ගබඩා කිරීමේ නිරතවීම වන අතර සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් ආනයනය කිරීම සහ ගෘහමය වශයෙන්, වාණිජ වශයෙන් සහ තොග වශයෙන් බෙදා හැරීම සිදු කරයි. සීමාසහිත ලංකා හොස්පිටල් (පුද්ගලික) සමාගම සෞඛ්‍ය ආරක්ෂණ සේවා සපයයි. සීමාසහිත කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගම පඩිපත් කළමනාකරණ සේවා ලබාදේ. සීමාසහිත කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ මූලික කාර්ය වන්නේ හෝටල් ව්‍යාපෘති කළමනාකරණය/ආයෝජනය කිරීමයි. සීමාසහිත කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම මූලික වශයෙන් දකුණ අධිවේගී මාර්ගයේ වෙළෙඳ කුටිවල අයිතිය ලබාගෙන ඒවායෙහි කළමනාකරණය සිදුකරයි.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සමාගමේ සහ සමූහයේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ පිළිබිඹුවක් නිරූපනය වන පරිදි සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීමට බැඳි සිටී. වංචා හෝ දෝෂ හේතුවෙන් සැලකියයුතු අවප්‍රකාශවලින් තොර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා අදාළ අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වා ගැනීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීම සහ වාතාවරණය තුළ සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තු සිදු කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්වලට ඇතුළත් වෙයි. වාර්ෂික වාර්තාවේ සඳහන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය, මුදල් සටහන්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනත සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව සකස්කර තිබෙන බව අධ්‍යක්ෂවරුන්ගේ අදහස වේ.

මූල්‍ය ප්‍රකාශ හා විගණකගේ වාර්තාව

2022 දෙසැම්බර් 31 න් අවසන්වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මත පදනම්ව සකස් කරනු ලබයි. ප්‍රධාන මූල්‍ය නිලධාරි සහ අධ්‍යක්ෂවරුන් විසින් අත්සන් තබන ලද සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශයන් වාර්ෂික වාර්තාවේ දක්වා ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ සහ සටහන් මගින් 2022 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනයෙන් අවසන් වන වසර සඳහා එහි කාර්ය සාධනයන් පිලිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ඉදිරිපත් කරනු ලබයි.

විගණකගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා බාහිර විගණක වශයෙන් පත්කරනු ලැබ ඇත. 2022 දෙසැම්බර් 31න් අවසන්වූ වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රකාශ වාර්ෂික විගණනයේදී සුදුසුකම් ලත් විගණකවරයෙකු ලෙස විගණකාධිපතිට සහයවීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍ර සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති විසින් වරලත් ගණකාධිකාරී සමාගමක් වන මෙසර්ස් BDO පාට්නර්ස් පත්කරනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවේ එකාබද්ධ කොටසක් වන මූල්‍ය ප්‍රකාශ පිලිබඳ විගණකගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

විගණන හා අනෙකුත් අදාළ සේවා ගාස්තු

සමාලෝචිත වසර තුළ විගණන ගාස්තු ලෙස සහ අනෙකුත් අදාළ සේවා සඳහා ගෙවන ලද ප්‍රමාණ පහත දක්වෙයි. මෙම ඡේදයෙන් අනාවරණය කෙරෙන කරුණු හැර විගණකවරුන්ට සමාගම සමඟ වෙනත් කිසිදු සුහද සම්බන්ධතාවයක් නොමැති බව අධ්‍යක්ෂවරු දැන සිටිති.

	2022 රු. '000	2021 රු. '000
ව්‍යවස්ථාපිත විගණන ගාස්තු	5,198	5,198
විගණන නොවන සේවා	4,315	–

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශ සකස්කිරීම සඳහා යොදාගත් සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධති

සමාගමේ අවදානම් කළමනාකරණ කාර්යය සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම හා පාලනය කිරීම සිදු කරයි.

සමාගම මනා අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියාපරිපාටි ක්‍රියාත්මක කරනු ලැබ තිබෙන අතර එවැනි ප්‍රතිපත්ති හා ක්‍රියාපරිපාටි සමාගමේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබයි. විගණන හා අනුකූලතා කමිටුව විසින් සමාගමේ අභ්‍යන්තර පාලන කාර්යය පාලනය කරනු ලබයි.

සමාලෝචිත වර්ෂයේ දී අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ කාර්යයයේ සඵලත්වය ගැන අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්ව සිටියි.

අඛණ්ඩතා පැවැත්ම

මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය, මුදල් ප්‍රවාහය සහ නියාමක හා ව්‍යුහාත්මක සාධක සැලකිල්ලට ගනිමින් දැකියහැකි අනාගතය සඳහා සිය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට සමාගම සහ සමූහය සතුව ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වේ. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පදනම යොදා ගනී.

පිරිවැටුම/දළ ලිඛිත වාරිකය

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මුළු පිරිවැටුප රු. මිලියන 63,685ක් වූ අතර 2021 වසරේ දී එය රු. මිලියන 64,062ක් විය. 2022 වසර සඳහා මුළු දළ ලිඛිත වාරිකය වන, රු. මිලියන 41,272 සමන්විත වන්නේ රු. මිලියන 20,930ක් වන ජීවිත රක්ෂණවල දළ ලිඛිත වාරිකය සහ රු. මිලියන 20,341ක් වන ජීවිත නොවන රක්ෂණවල දළ ලිඛිත රක්ෂණ වාරිකය මගිනි. 2021 දී මුළු දළ ලිඛිත වාරිකය සඳහා වාර්තාකළ වටිනාකම රු. මිලියන 43,231ක් වූ අතර ඉන් ජීවිත රක්ෂණවල දළ ලිඛිත වාරිකය රු. මිලියන 21,976ක් වූ අතර ජීවිත නොවන රක්ෂණවල දළ ලිඛිත වාරිකය වූ රු. මිලියන 21,255ක් විය. සමාගම විසින් අත්කරගත් මුළු දළ ලිඛිත වාරික පිළිබඳ සවිස්තර විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශවල සඳහන් කර ඇත.

මූල්‍ය ප්‍රතිඵල සහ විසර්ජන

	2021 රු. '000	2021 රු. '000
බදු ගෙවීමට පෙර ලාභය	12,476,150	11,725,434
අදායම් බදු වියදම්	1,930,343	1,684,297
බදු ගෙවීමට පසු ලාභය	10,545,807	10,041,137
අනෙකුත් විස්තීර්ණ ආදායම්	584,149	704,012
ඉදිරියට ගෙන ආ විසර්ජනය නොවන ලාභ	34,775,159	29,913,401
විසර්ජන සඳහා ලබාගත හැකි ලාභ	45,905,115	40,658,550
ගෙවූ ලාභාංශ	1,511,343	899,603
ගෙවූ අධිභාර බද්ද	1,116,579	–
ජීවිත රක්ෂණයෙන් කොටස්හිමියන්ට ආරෝපනය වන අතිරික්තය	3,016,654	4,983,788
ඉදිරියට ගෙනා විසර්ජන නොවන ලාභ	40,260,538	34,775,159

ලාභාංශ

2022 ජුනි 30 වන විට සමාගමේ නිකුත්කළ සහ ගෙවූ සාමාන්‍ය කොටස් හිමියන්ට කොටසකට රු. 1.67ක (එකතුව රු. 1,001,571,144)ක අවසන් ලාභාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කර ඇත.

එකී ප්‍රකාශිත අවසන් ලාභාංශ සඳහා 2017 අංක 07 දරණ සමාගම් පනතේ දරණ 56 වන වගන්තිය යටතේ නුබුන්වත් බව පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය සමාගම විසින් සපුරාලනු ලැබ ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලැබ ඇත. විගණකවරුන්ගෙන් නුබුන්වත් සහතික ලබාගෙන ඇත.

පරිත්‍යාග

2022 වර්ෂය තුළ දී සමාගම විසින් රු. මිලියන 1.04ක මුදලක් පරිත්‍යාග වශයෙන් ගෙවා ඇත.

බදුකරණය සඳහා වෙන් කිරීම

සමාගමේ බදු තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කෙරේ.

සංචිත

වර්ෂය තුළදී සංචිතවල වෙනස්වීම ස්කන්ධය වෙනස්වීම ප්‍රකාශයේ දක්වා ඇත.

රක්ෂණ වගකීම් සහ වෙන්කිරීම

ජීවිත නොවන රක්ෂණ සඳහා වැය කරන ලද නමුත් වාර්තා නොකරන ලද (IBNR) හිමිකම් සහ වැය කරන ලද නමුත් ප්‍රමාණවත් තරම් වාර්තා නොකරන ලද (IBNER) හිමිකම් සඳහා වෙන් කළ ප්‍රතිපාදන ඇතුළත්ව උපයා නොගත් වාරික හා හිඟ හිමිකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කිරීම් තහවුරු කිරීමෙහිලා සියලු සාධාරණ පියවර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබ ඇත. එමෙන්ම, වැය කරන ලද නමුත් වාර්තා නොකරන ලද හිමිකම් (IBNR) සහ වැයකරන ලද නමුත් ප්‍රමාණවත් තරමින් වාර්තා නොකරන ලද හිමිකම් (IBNER) ඇගයීමේ ක්‍රියාවලිය සඳහා ස්වාධීන ආයුගණකවරයෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් ලබා ගෙන ඇති අතර, ඔහුගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ සඳහන් කර ඇත.

එලෙසම, සේවක ප්‍රතිලාභවලට අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 19 ට අනුව අවශ්‍ය වන පරිදි පාරිතෝෂික වගකීම් ස්වාධීන ආයුගණකවරයෙකු මඟින් අගයන ලදී.

මෙම වාර්තාවේ දිනට මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන ලබා නොදුන් බවට දැක්වෙන කිසියම් හෝ අවස්ථාවක් ගැන අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් නැත.

ආයෝජන

2022 දෙසැම්බර් 31 දිනට සමාගම සතු ආයෝජන වල වටිනාකම රු. මිලියන 239,667කි. (20121 දී රු. මිලියන 234,571කි). සමාගම සතුව පවතින ආයෝජනවල සවිස්තර විග්‍රහයක් මූල්‍ය ප්‍රකාශවල සඳහන් කර ඇත.

දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ පිළිබඳ විස්තර විග්‍රහයක් මූල්‍ය ප්‍රකාශවල සඳහන් කර ඇත.

සින්නක්කර දේපලවල වෙළෙඳපොල වටිනාකම

ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳව වාර්තාකිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස සමාගම පිරිවැය ක්‍රමය භාවිතා කරනු ලබයි. වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා සමාගමේ ප්‍රතිපත්තිය වන්නේ සෑම වසර තුනකටම එක් වරකි. ඒ අනුව, මෙසර්ස් ට්‍රස්ට්ස් බිස්නස් සොලූසන්ස් ඇන්ඩ් ඇඩ්වයිසර් සර්විස් (ප්‍රුද්ගලික) සමගම විසින් 2021 මූල්‍ය වසර තුළ ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන ලදී. එම වත්කම් පවත්නා භාවිතයේ පදනම සඳහා විවෘත වෙළඳපොළ වටිනාකමක් මත තක්සේරු කරනු ලැබේ. එම ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵල ඒවා බල පවත්වන දිනය වන 2021 දෙසැම්බර් 31 දින සිට මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කරන ලදී.

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවූ සිදුවීම්

මූල්‍ය ප්‍රකාශවල සටහන් වලින් අනාවරණය කරන ලද සිදුවීම්වලට අමතරව මූල්‍ය ප්‍රකාශවල වෙනස්කම් සිදු කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කිරීමට හෝ අවශ්‍ය වන තරමේ කිසිදු භෞතික සිදුවීමක් වාර්තාකරණ දිනයෙන් පසුව සිදුවී නොමැත.

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී යොදා ගත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 24 අනුව සම්බන්ධිත පාර්ශව ගනුදෙනු, සහ සම්බන්ධිත පාර්ශව අනාවරණ මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

සමාගම් සමඟ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම

ගිවිසුම්වල අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර ඇත. මෙම බැඳියාවන් අධ්‍යක්ෂ රැස්වීම්වලදී ද විධිමත් පරිදි අනාවරණය කරනු ලැබ ඇත. අධ්‍යක්ෂවරු සමාගමේ කිසිදු කොටසක අයිතිකරුවෝ නොවෙති.

අධ්‍යක්ෂවරුන්ගේ වේතන

වසර තුළ දී අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු සහ පාරිශ්‍රමික වශයෙන් රු. මිලියන 3.1ක් ගෙවනු ලැබ ඇති අතර පසුගිය වසරේ (2021) වාර්තා වී ඇති මුදල රු. මිලියන 5.1කි.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව 2022 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 6,000කි. 2020 දෙසැම්බර් 31 දිනට කොටස් වලින් 99.97% ක් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම් වෙත පවරනු ලැබිය.

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂකවරුන්ගේ දැනුවත්භාවයට අනුව විශ්වාස කරන පරිදි රජයට, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට සහ සේවකයින්ට අදාළ ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට ගෙවා ඇති බවට අධ්‍යක්ෂවරු සැහිමකට පත්වෙති.

අස්පෘශ්‍ය වත්කම්

2022 දෙසැම්බර් 31 දිනට අස්පෘශ්‍ය වත්කම් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරනු ලැබේ.

පරිසරය

අදාළ පාරිසරික නීති හා රෙගුලාසි සැලකිල්ලට ගනිමින් සමාගම් මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබන අතර පරිසරයට හානිකර කටයුතුවල නිරත වන්නේ නැත.

නීති හා රෙගුලාසිවලට අනුකූලතාව

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවෙන් අනාවරණය කර ඇති පරිදි මූල්‍ය වර්ෂය තුළ සමාගම අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර ඇත. අනුකූලතා දෙපාර්තමේන්තුව සමාගමේ අනුකූලතා කාර්යය මෙහෙයවන අතර විගණනයට සහ අනුකූලතා කමිටුවට සහ අවදානම් කළමනාකරණ කමිටුවට ඒ පිළිබඳ වාර්තා කරයි. තවද, කලින් කළ අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 අප්‍රේල් 24 දින අනුමත කරන ලදී.

වාර්තා කරන දිනට අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ:

රොනල්ඩ් පෙරේරා මහතා, ජනාධිපති නීතිඥ
අනිල් කොස්වත්ත මහතා
නිශාන්ත දයානන්ද මහතා
දුෂ්මන්ත තොටවත්ත මහතා
ආචාර්ය කිත්සිරි මංචනායක
නයෝමාල් පෙරේරා මහතා
රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා

රොනල්ඩ් පෙරේරා මහතා, ජනාධිපති නීතිඥ 2022 අගෝස්තු 01 දින සිට සභාපති ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. දුෂ්මන්ත තොටවත්ත මහතා සහ ආචාර්ය කිත්සිරි මංචනායක 2022 අගෝස්තු 22 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර නයෝමාල් පෙරේරා මහතා සහ රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා 2022 සැප්තැම්බර් 30 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. තවද, අනිල් කොස්වත්ත මහතා සහ නිශාන්ත දයානන්ද මහතා අධ්‍යක්ෂවරුන් ලෙස තවදුරටත් කටයුතු කරයි. විජිත හේරත් මහතා 2022 අගෝස්තු 01 දින සිට අධ්‍යක්ෂවරයෙක් වීම නවතා දමන ලද අතර අනිල් කුමාර මහතා සහ සුරේඛා අලස් මහත්මිය 2022 අගෝස්තු 22 දින සිට අධ්‍යක්ෂවරයෙක් වීම නවතා දමන ලදී. සමන්ත උපනන්ද මහතා ලක්මිනි උදය කුමාර මහතා 2022 සැප්තැම්බර් 30 දින සිට අධ්‍යක්ෂවරයෙක් වීම නවතා දමන ලදී.

වාර්ෂික මහ සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම සමාගමේ ශ්‍රවණාගාරයේ දී 2023 ජූනි 26 වන දින පස්වරු 2.30ට කොළඹ 02 වොක්ස්හෝල් වීදියේ අංක 21 හි ලියාපදිංචි කාර්යාලයේදී පැවැත්වේ.

වාර්තාවේ අන්තර්ගත කරුණු පිළිගැනීම

2007 අංක 07 දරණ සමාගම් පනතේ 168(1)(ඔ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි මෙම වාර්තාවේ අන්තර්ගත කරුණු අධ්‍යක්ෂක මණ්ඩලය මෙහි ලා පිළිගනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

සමාගම් ලේකම්
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

රොනල්ඩ් සී පෙරේරා මහතා
ජනාධිපති නීතිඥ - අධ්‍යක්ෂ

දුෂ්මන්ත තොටවත්ත
අධ්‍යක්ෂ

2023 මැයි 10

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය

2007 අංක 07 දරණ සමාගම් පනතේ 150, 152 සහ 153 වගන්තිවල දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ රාජකාරි සහ වගකීම් පහත ප්‍රකාශයෙන් විස්තර කරයි. මේ අතර, මූල්‍ය ප්‍රකාශවලට අදාළව විගණකවරුන්ගේ වගකීම් වාර්මික වාර්තාවේ ඇතුළත් විගණකවරුන්ගේ වාර්තාවේ පැහැදිළි කරයි.

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් ශේෂ පත්‍රයේ දිනයට අනුව සහ එම ශේෂ පත්‍රයේ දිනයෙන් අවසන් වන ගිණුම්කරණ කාල සීමාව සඳහා සමාගමේ ලාභය, අලාභය හෝ ආදායම සහ වියදම් ඇතුලත් සමාගමේ තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දීම සහතික කිරීම සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ. එමෙන්ම මූල්‍ය ප්‍රකාශවලින් සමාගමේ සමස්ථ කටයුතුවල තත්ත්වය පිළිබඳව සාධාරණ සහ නිවැරදි ඉදිරිපත් කිරීමක් ලබාදිය යුතුය.

ගිණුම්කරණ ප්‍රමිති (SLFRS සහ LKAS), 2007 අංක 07 දරණ සමාගම් පනත, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන සම්මත පනත සහ 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත නියාමනය කිරීමේ පනත මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇති බවට අධ්‍යක්ෂවරුන් සහතික විය යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරන්තරයෙන් භාවිතා කර ඇති බවත් යහපත් විනිශ්චය සහ ඇස්තමේන්තු ක්‍රියාත්මක කර ඇති බවත් අධ්‍යක්ෂවරු සඳහන් කරති. තවද, දැකියහැකි අනාගතය සඳහා සිය මෙහෙයුම් පවත්වා ගැනීම සඳහා සමාගමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂවරුන් විශ්වාස කරන අතර, එබැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පිළිබඳ පදනම යොදා ගෙන ඇත.

මීට අමතරව, සමාගම් පනතේ 166 (1) සහ 167 (1) වගන්තිවලට අනුව, ඔවුන් මෙම වාර්මික වාර්තාව නියමිත වේලාවට සකස් කර ඇති අතර, වාර්මික වාර්තාවේ දෘඩ පිටපතක් ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති සෑම කොටස් හිමියෙකුටම එහි පිටපතක් නියමිත කාල සීමාව තුළ යවා ඇති බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය බලාපොරොත්තු වේ.

අධ්‍යක්ෂවරු ඔවුන්ගේ උපරිම දැනුම අනුව, සමාගම විසින් ගෙවිය යුතු සියළුම බදු, ගාස්තු හා අයබද සහ සමාගමේ සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම දායක මුදල් හා බදු සහ අනෙකුත් සියලුම දැනුවත් ව්‍යවස්ථාපිත ගාස්තු ශේෂ පත්‍ර දිනට ගෙවා සම්පූර්ණයෙන් ඇති බවට හෝ වෙන් කිරීම් කර ඇති බවට අධ්‍යක්ෂවරු සහතික වෙති.

රක්ෂණ ඔප්පු හිමිකරුවන්ට ගෙවිය යුතු පාරිතෝෂික සහ ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ කොටස්කරුවන්ට ඇති අතිරික්ත තීරණය කරන ලද ආයුගණකවරයාගේ වාර්තාවක් සමාලෝචනය කර අධ්‍යක්ෂවරුන් විසින් සම්මත කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, අධ්‍යක්ෂවරු සිය වගකීම් ඉටුකර ඇති බවට විශ්වාස කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.



සමාගම් ලේකම්

2023 මැයි 10

ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම් ප්‍රකාශය

ඉදිරි පරිච්ඡේදවල දක්වා ඇති ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට ලැබීම මට සතුටකි.

2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය ප්‍රකාශ සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පහත සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කරන ලදී.

i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS/LKASs)

ii) 2007 අංක 07 දරණ සමාගම් පනත

iii) 2000 අංක 43 දරණ රක්ෂණ කාර්මාන්ත පනත

මූල්‍ය ප්‍රකාශ අදාළ නියාමකයන් විසින් නියම කරන ලද ආකෘතීන් සමග අනුකූල වන ආකාරයෙන් සකස් කර ඇති එවා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්හි අනාවරණය කිරීමේ අවශ්‍යතාවන්ට අනුකූල වේ.

අපගේ දැනුම මත පදනම් වී, මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් මූල්‍ය ප්‍රකාශ, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් මූල්‍ය තොරතුරු සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම්වල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහය, නිවැරදිව නියෝජනය කරන බව අපි සහතික කරමු. ඊට අමතරව, සමාගමේ මෙහෙයුම් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සමාගම සතුවන බව අපි තක්සේරු කරන අතර, මෙම මූල්‍ය ප්‍රකාශ සංවර්ධනය කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පදනම යොදා ගෙන තිබෙන බවද සහතික කර සිටිමු.

කළමනාකරණය, සිය මූල්‍ය වාර්තාකරණ වගකීම් සපුරාලනු ලබන බවට සහතික කිරීමේ වගකීමක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇත. ප්‍රධාන මූල්‍ය නිලධාරි ලෙස, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති, ක්‍රියාපාටිපාටි සහ අභ්‍යන්තරව පාලනය ස්ථාපිත කර පවත්වාගෙන යාම මගේ වගකීමකි. මූල්‍ය ප්‍රකාශ සියලුම ආකාරයෙන් සම්පූර්ණ සහ නිවැරදිව බවට සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා කළමනාකරණය අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇත. මූල්‍ය වාර්තා විශ්වාසනීය බවට සහ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමෙහිලා "මනා පදනමක්" සකස් කර දෙන බවට සහ වත්කම් නිසි පරිදි ගණන් බලන බවට සහ ආරක්ෂා කරන බවට සාධාරණ සහතිකයක් අභ්‍යන්තර පාලන වලින් ලබාදෙන බව කළමනාකරණය විශ්වාස කරයි. අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාපටිපාටිවලට ස්ථීර අනුකූලතාව සහතික කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අභ්‍යන්තර විගණකවරු විසින් ද කාලීන සාමාලෝචනයන් සිදු කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විගණන සහ අනුකූලතා කමිටුවක් විසින් පත්කර ඇති අතර ස්වාධීන අධ්‍යක්ෂවරයකු එහි ප්‍රධානියා ලෙස කටයුතු කරයි. විගණන හා අනුකූලතා කමිටුව විසින් අභ්‍යන්තර විගණන කටයුතු, විගණන පසුවිපරම් කමිටු වාර්තා සහ මූල්‍ය ප්‍රකාශ තක්සේරු කර ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව කොටස්හිමියන් වෙනුවෙන් විගණකාධිපති විසින් මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇත. ස්වාධීන විගණකවරයාට කළමනාකරණය සිටියදී හෝ නොසිටියදී හෝ විගණන සහ අනුකූලතා කමිටුව ප්‍රවේශ වීමට සහ එම කමිටුව හැසිරවීමට සම්පූර්ණ නිදහස ඇත.

අපගේ උපරිම දැනුම අනුව,

i. මූල්‍ය ප්‍රකාශ සටහන්වල විස්තර කර ඇති පරිදි සමාගම අදාළ සියළුම නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර ඇති බවට,

ii. මූල්‍ය ප්‍රකාශ සටහන්වල විස්තර කර ඇති පරිදි කිසිදු සැලකියයුතු වෙනස්වීම් නොමැති අතර විගණකාධිපතිවරයා වෙනස් කර නොමැති බවට,

iii. සමාගම විසින් ගෙවිය යුතු සියලුම බදු ගාස්තු හා සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සමාගමේ සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම දායක මුදල් හා බදු වාර්තාකරණ දිනට ගෙවා ඇති බව හෝ අවශ්‍ය වන පරිදි වෙන්කර ඇති බවට,

iv. සංචිතකරණ සහ නුබුන්වත් මාර්ගෝපදේශ අනුගමනය කර ඇති බව සහ පිළිගත හැකි වත්කම් ගැළපීම මඟින් සියලුම සංචිත වලට පිටුබලයක් ඇති බව.

v. අදාළ රෙගුලාසිවලට අනුකූලව ස්කන්ධ ප්‍රාග්ධනය අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලන බවට සහතික කර සිටිමු.

අපගේ මූල්‍ය කාර්යසාධනය සහ අනාගත කටයුතු පිළිබඳ වැඩ විස්තර සහිත විශ්ලේෂණයක් සඳහා, මෙම වාර්ෂික වාර්තාවේ කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ කොටස බලන මෙන් මම ඔබව දිරිගන්වමි. අපගේ සාර්ථකත්වයට දායක වී ඇති සාධක සහ ඉදිරි අභියෝග සහ අවස්ථා සම්බන්ධයෙන් ගැඹුරු අවබෝධයක් ඉන් ලබා දේ.

අවසාන වශයෙන්, අපගේ සමාගම කෙරෙහි අඛණ්ඩ සහය සහ විශ්වාසය තැබීම වෙනුවෙන් අපගේ කොටස් හිමියන්ට මම ස්තුතිය පුදකර සිටීමට කැමැත්තෙමි. අපගේ කොටස්හිමියන්ට වටිනාකම ලබාදීමට සහ අපගේ දිගුකාලීන උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපි කැපවී සිටිමු.



මාලක බණ්ඩාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී

2023 මැයි 10

රක්ෂණකරුගේ ආයුගණකගේ සහතිකය

පුද්ගලිකයි, සහ රහසිගතයි.

2023 අප්‍රේල් 20
අධ්‍යක්ෂ මණ්ඩලය
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
අංක 21, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02 ශ්‍රී ලංකාව

2022 දෙසැම්බර් 31 දිනට දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ආයුගණක ඇගයීම

2019 අප්‍රේල් 26 දිනැති ගිවිසුම් ලිපිය සහ 2021 අගොස්තු 12 දිනැති අතිරේකය අනුව, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ, 2022 දෙසැම්බර් 31 දිනට දිගු කාලීන රක්ෂණ වගකීම් ඇගයීමේ ආයුගණක සමාලෝචනයක් සීමාසහිත විලිස් ටවර්ස් වොට්සන් ඉන්දියා පුද්ගලික සමාගම (විලිස් ටවර්ස් වොට්සන්, අපි, අපගේ හෝ අප) විසින් සිදුකරනු ලැබ ඇත.

අපි පහත දැ මෙයින් සනාථ කරන්නෙමු:

1. දිගු කාලීන රක්ෂණ අරමුදලේ බැඳීම්වල ආයුගණක ඇගයීම සඳහා භාවිතා කරන ලද දත්ත සම්පූර්ණ සහ නිරවද්‍ය බව තහවුරු කිරීමට සමාගම විසින් සාධාරණ පියවර ගෙන තිබෙන බව,

2. දිගු කාලීනව රක්ෂණ අරමුදලට අදාළව සියලුම වගකීම් සඳහා 2022 දෙසැම්බර් 31 දිනට සියලුම පවත්නා සහ අසම්භව්‍ය වගකීම් සැලකිල්ලට ගනිමින්, එදිනට ප්‍රමාණවත් සහ විධිමත් සංචිත ලබාදී තිබෙන බව,

3. බෙදාහැරීමේ පදනම මත ජීවිත අරමුදල පවත්වාගෙන යනු ලබන, මුළු දිගු කාලීන රක්ෂණ ප්‍රතිපාදන ප්‍රමාණය ශ්‍රී ලංකා රු. මිලියන 95,857කි. ජීවිත අරමුදල ඇතුළත පවතින වත්කම්වල වටිනාකම IRCSL පදනම මත ශ්‍රී ලංකා රු. මිලියන 131,841ක් වන SLFRS පදනම මත ශ්‍රී ලංකා රු. මිලියන 159,091කි. 2022 වසර තුලදි ජීවිත අරමුදලින් කොටස් හිමියන්ගේ අරමුදල වෙත මාරු කරන ලද දළ අතිරික්තය ශ්‍රී ලංකා රු. මිලියන 2,548කි. සහභාගි අරමුදලෙන් 2022 වසර තුළදි ඔප්පු හිමියන් වෙත ප්‍රධාන මුදල් ප්‍රකාශය සඳහා වෙන් කරන ලද දළ අතිරික්තය ශ්‍රී ලංකා රු. මිලියන 973කි. කොටස්හිමියන්ට මාරු කිරීම් සහ පසු බදු වලින් අනතුරුව ජීවිත අරමුදල 2022 දෙසැම්බර් 31 වන දිනට IRCSL පදනම මත ශ්‍රී ලංකා රු. මිලියන 129,468ක් වන අතර SLFRS පදනම මත එය ශ්‍රී ලංකා රු. මිලියන 156,719 කි.

කුන්ජ් බිහාරි මහේෂ්වරී, FIA, FIAI
අධ්‍යක්ෂ, ඉන්ෂුවරන්ස් කන්සල්ටිං ඇන්ඩ් ටෙක්නොලොජී, ඉන්දියාව
විලිස් ටවර්ස් වොට්සන් ඉන්දියා පුද්ගලික සමාගම
විද්‍යුත් ලිපිනය: kunj.maheshwari@wtwco.com



අත්සන:

ස්ථානය : ඉන්දියාව
දිනය : 2023 අප්‍රේ 20

විලිස් ටවර්ස් වොට්සන් ඉන්දියා පුද්ගලික සමාගම
ලියාපදිංචි කාර්යාලය:
යුනිටෙක් බිස්නස් පාර්ක්, 2 වන මහල, කුළුණ ආ,
දකුණු නගරය – I, අංශය 41, ගුරුග්‍රෑම් – 122001,
ඉන්දියාව

දුරකථනය 91 124 432 2800
ෆැක්ස් 91 124 432 2801

විද්‍යුත් ලිපිනය TW.Fin.India@wtwco.com
W wtwco.com

පුද්ගලිකයි, සහ රහසිගතයි.

2023 අප්‍රේල් 04
අධ්‍යක්ෂ මණ්ඩලය
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
අංක 21, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02
ශ්‍රී ලංකාව

වගකීම්වල ප්‍රමාණාත්මතාව පරීක්ෂා කිරීම

1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය, ශ්‍රී ලං.මු.වා.ප්‍ර 4, රක්ෂණ ගිවිසුම්, යම් රක්ෂණකරුවකු විසින්ම එහි රක්ෂණ ගිවිසුම යටතේ ඉදිරි මුදල් ප්‍රවාහයේ වර්තමාන තක්සේරු භාවිතයට ගනිමින්, සෑම වාර්තාකරණ කාල සීමාවක් අවසානයේදීම එහි පිළිගත් රක්ෂණ වගකීම් ප්‍රමාණවත්ද, නැද්ද යන්න තක්සේරු කරනු ලැබිය යුතු බවට නියම කරයි. ශ්‍රී ලං.මු.වා.ප්‍ර 4 අදහස් කරන පරිදි සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත අරමුදල තුළ පවත්වාගෙන යනු ලබන දිගුකාලීන රක්ෂණ ප්‍රතිපාදන සඳහා වගකීම්වල ප්‍රමාණවත් බව පරීක්ෂා කිරීමේ පරීක්ෂාවක් විලිස් ටවර්ස් වැට්සන් විසින් සිදු කරනු ලැබ ඇත.

2. වගකීම්වල ප්‍රමාණාත්මතා පරීක්ෂාවක් සිදු කරමින්, ආයුගණක වගකීම් සමඟ විගණනය කරන ලද ගිණුම් අනුව දරන ප්‍රතිපාදන, අප විසින් සන්සන්දනය කරනු ලැබ ඇත. මේ අරමුණ සඳහා, ආයුගණක වගකීම්වල වටිනාකම, ශ්‍රී ලං.ර.නි.කො. (පෙර ශ්‍රී ලං.බැ.ආ) (2015 නුඹුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) රෙගුලාසි අනුව ගණනය කරනු ලබයි. ඒ මඟින් බලාත්මක රක්ෂණ ගිවිසුම්වලට අදාළ වගකීම් පියවීමට අවශ්‍ය වන සහ මුදල් ප්‍රවාහවල මුළු ජීව කාලය ආවරණය කරමින් වට්ටම් කරන ලද මුදල් ප්‍රවේශයක් භාවිතා කරමින් වගකීම් අගයනු ලබයි.

3. 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රක්ෂේපණ සහ අනුප්‍රකාශ බලාත්මක ප්‍රතිපත්ති මත පදනම් වේ.

4. සිදුකරන ලද පරීක්ෂා පදනම් කර ගෙන:

   - ආයුගණක වගකීම් ඇගයීම ජාත්‍යන්තරව පිළිගත් ආයුගණක ක්‍රම මත පදනම් වන බව සහ ශ්‍රී ලං.මු.වා.ප්‍ර 4 යටතේ වන අවශ්‍යතා පිළිපදින බව,
   - එම ඇගයීම සඳහා භාවිතා කළ උපලේඛන පවත්නා අත්විඳි අධ්‍යයන මත පදනම් වූ සහ අහිතකර අපගමන සඳහා සුදුසු අන්තරවලට ඉඩ හැරීමෙන් පසු සැලකිය යුතු තකසේරු වන බව, සහ
   - 2022 දෙසැම්බර් 31 න් අවසන්වූ වර්ෂය සඳහා සමාගමේ විගණනය කරන ලද ගිණුම් අනුව, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත අරමුදල තුළ පවත්වාගෙන යනු ලබන දිගු කාලීන රක්ෂණ ප්‍රතිපාදන ඉහත සඳහන් ආකාරයට ගණනය කරන ලද වගකීම්වලට වඩා වැඩි බව මම සහතික කරමි.

කුන්ජ් බිහාරි මහේෂ්වරී, FIA, FIAI
අධ්‍යක්ෂ, ඉන්ෂුවරන්ස් කන්සල්ටිං ඇන්ඩ් ටෙක්නොලොජි, ඉන්දියාව
WTW

අත්සන:

ස්ථානය : ඉන්දියාව
දිනය : 2023 අප්‍රේ 04

විලිස් ටවර්ස් වොට්සන් ඉන්දියා පුද්ගලික සමාගම
ලියාපදිංචි කාර්යාලය:
යුනිටෙක් බිස්නස් පාර්ක්, 2 වන මහල, කුළුණ ආ,
දකුණු නගරය – I, අංශය 41, ගුරුග්‍රෑම් – 122001,
ඉන්දියාව

දුරකථනය 91 124 432 2800
ෆැක්ස් 91 124 432 2801

විද්‍යුත් ලිපිනය TW.Fin.India@wtwco.com
W wtwco.com

වැයකරන ලද නමුත් (ප්‍රමාණවත් ලෙස) වාර්තා නොකළ හිමිකම් පිළිබඳ සහතිකය

2023 අප්‍රේල් 07

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කොටස්හිමියන් වෙත,

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 2022 දෙසම්බර් 31 ට ශුද්ධ වැය කරන ලද නමුත් වාර්තා නොකළ හිමිකම් සහ වගකීම්වල ප්‍රමාණාත්මක බව පරීක්ෂා කිරීමේ සහතිකය

ශ්‍රී ලංකා රු. 2,919,908,714ක 75% විශ්වාස මට්ටමේ වැය සිදු කරන ලද නමුත් වාර්තා නොකළ ප්‍රතිපාදනය, 2022 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ හිමිකම් වගකීම්වලට එනම් ප්‍රතිරක්ෂණ රක්ෂණාවරණය (වට්ටම් නොකළ) ට අදාළව ප්‍රමාණවත් වන බවට මෙයින් සහතික කරමි. සමාගම විසින් රඳවා ගෙන ඇති සිද්ධි සංචිත සමඟ මෙම වැය සිදු කරන ලද නමුත් වාර්තා නොකළ ප්‍රතිපාදන, 2022 දෙසාම්බර් 31 දිනට සමාගමේ වැයකළ හිමිකම්වල වගකීම්වලට අදාළවද හිමිකම් පරිහරණ වියදම් ද ඇතුළුව, බොහෝ අවස්ථාවල දී නමුත් අනාගතයේ අත් විඳින සියලුම අවස්ථාවල දී නොව අනාගත වගකීම් සපුරා ගැනීමට ප්‍රමාණවත් වන බවට අපේක්ෂා කරනු ලබයි

(සැලකිල්ලට නොගත් 75% විශ්වාසනීය මට්ටමේ IBNR ප්‍රතිපාදනය, CHE සඳහා දීමනාවක් ඇතුළුව ප්‍රතිරක්ෂණයේ දළ වටිනාකම ශ්‍රී ලංකා රු. 2,957,168,336 වේ).

සෑම වාර්තාකරණ කාලසීමාවක අවසානයේදීම, ශ්‍රී ලං.මු.නි.ප්‍ර. 4 හි දක්වෙන පරිදි සමාගම විසින් වගකීම්වල ප්‍රමාණාත්මතා පරීක්ෂාවක් ("LAT") සිදුකිරීමට අවශ්‍යය. උපයා නොගත් සංචිතවල (UPR) ධාරණ අගයේ ප්‍රමාණවත් බව තක්සේරු කිරීම සඳහා වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂාවක් සිදු කරනු ලබයි. සමාගම විසින් සලසනු ලැබ ඇති ශ්‍රී ලංකා රු. 9,313,749,192ක උපයා නොගත් රක්ෂණ වාරික සංචිත ප්‍රතිපාදන එනම් ප්‍රතිරක්ෂණ රක්ෂණාවරණය, බොහෝ අවස්ථාවල දී අත්විඳින, සියලුම අවස්ථාවලදී එසේ නොවන, 2022 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අවසන් නොවූ අවදනම්වලට අදාළව ප්‍රමාණාත්මක බවට මම මෙයින් සහතික වෙමි. එම නිසා සමාගම විසින් රක්ෂණ වාරික ඌණතා හඳුනාගෙන නොමැත.

මෙම ප්‍රතිඵල ජාත්‍යන්තරව පිළිගත් ආයුගණක සිද්ධාන්ත අනුව තීරණය කරනු ලැබ ඇත.

ඉහත සමාගම විසින් ලබා දෙන ලද තොරතුරු සහ දත්ත මත මා රඳා පැවතුණු අතර ලබාදුන් දත්ත, ස්වාධීනව සත්‍යාක්ෂණය නොකළ දත්තවල සාධාරණත්වය පිළිබඳව සැහීමට පත්වීම සඳහා එයින් ඔබ්බට ගොස් නිරවද්‍යතා පරීක්ෂා ද සිදු කළෙමි.

රොබර්ටෝ මලටීයා
ආයුගණක ආයතනය සහ පීඨයේ (FIA) සභාය සාමාජික
NMG මූල්‍ය සේවා උපදේශන වෙනුවෙන්

දිනය: 2023 අප්‍රේල් 07

T: +65 6325 9855 F: +65 6325 4700 E: contact@NMG-Group.com
www.NMG-Group.com
109 North Bridge Road #05 21, Singapore 179097



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය எனது இல. My No. INF/A/06/SLIC/AR/2022 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 27 April 2023

සභාපති

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ (සමාගම) මූල්‍ය ප්‍රකාශන සහ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ සිදු කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සිදු කිරීමේදී රාජ්‍ය විගණනය සිදු කරන වරලත් ගණකාධිකාරී සමාගමක් මා හට සහය විය.

මගේ මතය තුළ, තත්වාගණනයකළ මතය ඉදිරිපත් කළ ඡේද සඳහා පදනම් වූ විස්තර කරන ලද කරුණු වලින් ඇතිවිය හැකි ප්‍රතිවිපාක හැර, මෙම මූල්‍ය ප්‍රකාශවලින් 2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය හා එහි මූල්‍ය කාර්යසාධනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දේ.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

සමාගම

(අ) 2009 ජූනි 4 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද තීන්දුවට අනුව, සමාගමේ බහුතර කොටස්වල හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් දැරීම සඳහා භාණ්ඩාගාර ලේකම් වෙත පවරනු ලැබීය. තවද එකී තීන්දුවට අනුව ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් (පුද්ගලික) සමාගම මෙම සමාගමේ මව් සමාගම ලෙස පැවති කාල සීමාවට අදාළ ඉපයූ ලාභය ගණනය කිරීමට සහ පෙර මව් සමාගම විසින් උපයාගත් සේ සැලකෙන ලාභය පියවීමට භාණ්ඩාගාර ලේකම්ට නියෝග කරනු ලැබුවේය. ඉහත කී උපයාගත් සේ සැලකෙන ලාභය තීරණය කිරීම සඳහා සකස් කරමින් පවතින මූල්‍ය ප්‍රකාශවල වෙනස්කම් සිදුකර නොමැත. කෙසේවෙතත්, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජනාධිපති නීතිඥගේ මතය වූයේ, 2022 මාර්තු 09 දිනැති සිය නීති නියෝජන ලිපියෙහි දක්වා ඇති පරිදි, ඉහත සඳහන් ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත්වල (Sc FR No 117/2007 and SC/FR No 158/2007) කටයුතුවලින් බාහිරව භාණ්ඩාගාර ලේකම්ගේ බැඳීම් මුදාහැරීම සඳහා කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක DMR/02394/19 දරණ නඩුවේදී, දිස්ත්‍රික් උසාවියේ නඩුවේ පැමිණිලිකරුට සමාගමෙන් කිසිදු සහනයකට හිමිකම් කිව නොහැකි බවයි. තවද, 2023 ජනවාරි 18 දින මුදල් අමාත්‍යාංශයේදී පැවති සාකච්ඡාව පරිදි, අමාත්‍යාංශයේ මතය වූයේ, වාර්තාව මත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (ශ්‍රී ල.ර.ස.) ඉහත නඩුවේ පාර්ශ්වකරුවෙක් නොවන බවයි. එබැවින්, සමාගම එකී තත්ත්වයට සහය පිණිස නීතිපතිගෙන් නීතිමය සහතික කිරීමක් ලබා ගැනීමේ ක්‍රියාවලියක නිරත වේ. කෙසේවෙතත්, කොළඹ දිස්ත්‍රික්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

උසාවියේ අංක DMR/02394/19 දරණ ඉහත නඩුවේදී, තීන්දුවක් වාර්තා කරන දිනයට නිවේදනය කර නොමැති අතර මුදල් අමාත්‍යාංශය සමඟ පැවති සාකච්ඡාවෙන් ඉහත සඳහන් නඩුවල වගකීම් නිරවුල් කිරීමට අදාළ විගණන සාක්ෂිය ලබාගැනීමට මට නොහැකි විය. තවද, ශ්‍රී ලං.ර.ස. හි තත්ත්වයට අදාළ නීතිපතිගෙන් එකී සහතික කිරීම වාර්තාකරන දිනය දක්වා ලැබී නොමැත. එබැවින්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සිදුකළ මුල් තීරණය සහ පසු සාකච්ඡාවන් සහ පවත්නා සංවර්ධනය සැලකිල්ලට ගනිමින්, ඉහත සඳහන් ආරෝපිත ලාභය අපේක්ෂිත තීරණයට මූල්‍ය ප්‍රකාශවල කිසිදු ගැලපීමක් සමාගම විසින් සිදුකර නොමැත.

(ආ) ශේෂ තහවුරු කර නොතිබීම නිසා, වාර්තාකරණ ලබන දිනයට, මූල්‍ය ප්‍රකාශවලට සටහන් 16 හි අනාවරණය කරන පරිදි ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් (පුද්ගලික) සමාගමට සමූහයෙන් ලැබීමට තිබෙන රු. 136,479,445ක මුදලේ සම්පූර්ණත්වය, පැවැත්ම සහ නිරවද්‍යතාව පිළිබඳව සෑහීමකට පත්වීමට මා හට නොහැකි විය. ඒ අනුව, ලැබිය යුතු මුදල් ප්‍රමාණයෙහි පරිපූර්ණත්වය, පැවැත්ම සහ නිරවද්‍යතාවය සත්‍යාපනය කිරීමට සහ 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා ගැලපීම් සිදු කළ යුතුද යන්න තීරණය කිරීමට මා හට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

කරුණු අවධාරණය කිරීම

මාගේ මතය තත්ත්වාගණනය නොකර, කරුණු පිළිබඳ පහත අවධාරණයන් කෙරෙහි මම අවධානය යොමු කරමි.

සමාගම

සමාගමේ පරිපාලිත සමාගම්වල ආයෝජන ඉවත්කර ගැනීම සහ සමාගමේ ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙන් කිරීම.

මූල්‍ය ප්‍රකාශවලට සටහන් 46 න් 2023 මාර්තු 17 දිනැතිව තෝරාගත් පරිපාලිතවල ආයෝජන ඉවත් කිරීම සහ සමාගමේ ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙන්කිරීම විස්තර කරයි. මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය 2023 මාර්තු 14 දිනැති අංක 23/0431/604/046 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම් වී SLIC හි ආපසු හැරවීමට අදාළව රජයේ ප්‍රතිපත්තිය දැනුවත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය ඉහත උපදෙස් මත පදනම් වී කටයුතු ආරම්භ කරන ලදී. එබැවින්, සමාගම ලංකා හොස්පිට්ල් පොදු සමාගම, කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම, ලිට්රෝ ගෑස් ලංකා සමාගම සහ ලිට්රෝ ගෑස් ලංකා ටර්මිනල් (පුද්ගලික) සමාගමේ කොටස් හිමිකාරත්වය සහ කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම තුළ ලිට්රෝ ගෑස් ලංකා සමාගම විසින් දරණ කොටස් මහා භාණ්ඩාගාරය වෙත වහාම ක්‍රියාත්මක වන පරිදි මාරුකරන ලෙස සහ එහි ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වෙනම නෛතික ආයතන යටතේ ස්ථාන ගත කරමින් 2011 අංක 03 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන (සංශෝධිත) පනතේ විධිවිධානවලට සම්පූර්ණයෙන් අනුකූලවන මෙන් උපදෙස් ලබා දී ඇත. සටහන 46.2 නි වැඩිදුරටත් විස්තර කරන පරිදි, වෙන් කිරීමේ ව්‍යූහය සහ ආදර්ශය අවසන් කර නොමැති අතර අධ්‍යක්ෂ මණ්ඩලය මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ගන්නා ලද ඉහත කී තීරණය ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ආරම්භ කර ඇත.

සමූහය

කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම සහ එහි පරිපාලිත සමාගම්වල අඛණ්ඩතා පැවැත්මට අදාළ සැලකියයුතු අවිනිශ්චිතතා

මූල්‍ය ප්‍රකාශවලට සටහන් 49 පරිදි, අධ්‍යක්ෂ මණ්ඩලය කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම සහ එහි පරිපාලිත සමාගම්වන, හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම සහ සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමට අදාළව අඛණ්ඩතා පැවැත්ම සඳහා එහි හැකියාව තක්සේරු කර ඇති බවත්, දැකිය හැකි අනාගතය සඳහා ව්‍යාපාරය කරගෙනයාමට අවශ්‍ය සම්පත් ඒවා සතුවන බවටත් සෑහීමට පත්ව ඇති බවත් විස්තර කරයි. තවද, අඛණ්ඩ පැවැත්මක් වශයෙන් අඛණ්ඩව ඉදිරියට යාමට ව්‍යාපාර සමූහයේ ඇති හැකියාව මත සැලකිය යුතු සැකයක් ජනිත කරන කිසිදු අවිනිශ්චිතාවක් පිළිබඳව අධ්‍යක්ෂවරු නොදැන සිටිති. එබැවින්, මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩතා පැවැත්ම පදනම මත සකස් කිරීම ඉදිරියටම කරගෙන යන ලදී. කෙසේවෙතත්, හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2015 වසරේදී හම්බන්තොට හෝටලය ඉදිකිරීම පිණිස වන ව්‍යාපෘතිය නතර කිරීමට තීරණය කර ඇති අතර සමාගමේ කළමනාකරණය මේ සම්බන්ධ රේඛීය අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් අපේක්ෂාවෙන් සිටින බව සටහන් කරන ලදී. එමෙන්ම, අමාත්‍ය මණ්ඩලය විසින් 2020 ජූලි 10 දිනැති අංක 20/1042/204/050 දරණ කැබිනට් පත්‍රිකාවෙන් සිය අනුමැතිය ලබා දී තිබුනද, වාර්තාකරණ කාලසීමාවේදී ග්‍රෑන්ඩ් හයිට් කොළඹ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම විසින් නිර්දේශ කර නොමැත. තවද, 2023 මාර්තු 14 දිනැති අංක 23/0431/604/046 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව දරන කොටස් සහ ලිට්රෝ ගෑස් ලංකා සමාගම විසින් දරන කොටස් මහා භාණ්ඩාගාරයට මාරු කිරීමට කැබිනට් අනුමැතිය ලබාදී ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.3 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු

සමාගමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති තොරතුරුවලින් අනෙකුත් තොරතුරු සමන්විත වේ. නමුත් මූල්‍ය ප්‍රකාශනවල සහ මෙම විගණන වාර්තාවේ දිනයට පසු මා වෙත ලබාගැනීමට සැලැස්වීම අපේක්ෂා කරන තොරතුරු එහි ඇති මාගේ විගණන වාර්තාව තුළ ඇතුළත් නොවේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර එහි අන්තර්ගතය පිළිබඳව කිසිදු සහතික කරන අදහසක් මම ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනය සම්බන්ධයෙන්, මගේ වගකීම වන්නේ අනෙකුත් තොරතුරු ලබාගැනීමට හැකි අවස්ථාවේදී හඳුනාගනු ලබන තොරතුරු කියවීම වන අතර, එසේ කරමින් අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැලකියයුතු ලෙස නොගැලපේද යන්න සහ විගණනය තුළ හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම සැලකියයුතු ලෙස වැරදියට සඳහන් කර ඇති බව පෙන්නුම් කරන්නේද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2022 වාර්ෂික වාර්තාව මම කියවීමේදී. එහි වැදගත් අවප්‍රකාශ ඇති බව මම පවසන්නේනම්, නිවැරදි කිරීම සඳහා පාලනය සඳහා වගකියන පුද්ගලයින්ට එම කරුණු දැනුම් දීම අවශ්‍ය වේ. තවදුරටත් වැදගත් නිවැරදි නොකළ අවප්‍රකාශ පවතිනම්, යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථා තුළ විධිවිධානවලට අනුව මගේ වාර්තාවට ඒවා ඇතුළත් කරනු ලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයයි කළමනාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනයන් සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වා ගෙනයාමේ සමූහයේ හැකියාව තක්සේරු කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම්, හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමූහය විසින් සමාගමේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයක කොටසක් ලෙස, මා විසින් විගණනය තුළ වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කළ අතර වෘත්තීය සැක මුසු බව පවත්වා ගනු ලැබිය. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගෙන හා තක්සේරු කර, එම අවදානම්වලට ප්‍රතිචාරාත්මකව විගණන පටිපාටි සැලසුම් කර ඉටුකරමින් මගේ විගණනය සඳහා පදනමක් ලබා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගනිමි. වංචාවකින් ඇතිවන වැදගත් සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සොයා නොගැනීමේ අවදානම දෝෂයෙන් සිදුවන බලපෑමට වඩා ඉහළ වන අතර, වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, වංචාව දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට සම්බන්ධවන බැවිනි.
- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබගන්නා ලද නමුත්, සමාගමේ හෝ සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරමි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ අදාළ හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගැයීමට ලක් කළෙමු.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මගේ නිගමනයන් මගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගෙන ඇති විගණන සාක්ෂිය මත පදනම් වේ. කෙසේවුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය
- හෙළිදරව් කිරීම් ඇතුළු මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර එයට පාදක වූ සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ඉදිරිපත් කිරීමට සමූහය තුළ ආයතන සහ ව්‍යාපාර කටයුතු පිළිබඳ මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගතිමි. අපි සමූහයේ විගණනය මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්යසාධනය සඳහා වගකීමට බැඳේ. මගේ විගණන මතය සඳහා මම තනිවම වගකීමට බැඳෙමි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 **2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.**

2.1.1 2007 අංක 07 දරණ සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියට සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, මගේ වාර්තාවේ තත්වාගණනයකළ මතය සඳහා පදනම තුළ දක්වා ඇති කරුණුවල බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 සහ 153 වගන්තිවල අවශ්‍යතාවන්ට සමාගමේ මූල්‍ය ප්‍රකාශ අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරණ විගණන පනතෙහි 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම තුළ විස්තර කරන 1.2 (අ) සහ (ආ) හි විගණන කරුණු හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද සියලුම නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 **අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.**


2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව, සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට සමාගම සම්බන්ධ වූ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනෘජුකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව සඳහන් කිරීම;

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව සඳහන් කිරීම.

නීති උපදේශයට යොමුව	විස්තරය
2011 අංක 03 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන (සංශෝධිත) පනතේ 53 වගන්තිය	සමාගම දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙනස් සමාගම් දෙකක් ලෙස පවත්වාගෙන යාමට වෙනස් කර නොමැත. කෙසේවෙතත්, 2023 මාර්තු 14 දිනැති අංක 23/0431/604/046 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, වෙනස් නෛතික ආයතන දෙකක් යටතේ එහි ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ස්ථානගත කරමින් 2011 අංක 03 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන (සංශෝධිත) පනතේ විධිවිධානවලට සම්පූර්ණයෙන් අනුකූලවන මෙන් සමාගමට උපදෙස් ලබා දී ඇත. සටහන 46.2 හි සඳහන් පරිදි, වාර්තාකරන කාලසීමාව තුළ,වෙනස් කිරීමේ ආදර්ශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසන් කර අනුමත කර නොමැති අතර රක්ෂණ නියාමන කොමිෂන් සභාව සාකච්ඡා අදියරේ පසු වෙති.
2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 47 (2) වගන්තිය	පෙර කොටසේ විස්තර කළ ඉහත සඳහන් අනුකූල නොවීම හේතුවෙන්, සමාගමේ ගිණුම්කරණ වාර්තා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කළ නීතියට අවශ්‍ය පරිදි පවත්වාගෙන නොමැත.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව සඳහන් කිරීම.

2.2.4 2018 අංක 19 දරණ විගණන පනතෙහි 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, සමාගමේ සම්පත්, සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව සඳහන් කිරීම.



ඩබ් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 දිනට	සටහන	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	**2021 රු. '000**
වත්කම්					
මූල්‍ය ආයෝජන	5	**218,175,123**	200,747,278	**211,251,915**	195,897,306
පරිපාලිත සමාගම්වල ආයෝජනය	6	**–**	–	**22,823,892**	22,823,892
ආශ්‍රිත සමාගම්වල ආයෝජනය	7	**198,673**	198,673	**198,673**	198,673
දේපළ, පිරියත සහ උපකරණ	8	**75,426,802**	65,391,507	**12,763,092**	12,737,635
වත්කම් භාවිතා කිරීමේ අයිතිය	9	**1,301,274**	1,315,512	**576,789**	558,652
ආයෝජන දේපළ	10	**2,973,640**	2,806,480	**2,083,640**	1,942,600
අස්පර්ශ්‍ය වත්කම්	11	**3,077,882**	3,085,231	**37,588**	36,398
ඔප්පු හිමිකරුවන්ගේ ණය	12	**1,867,624**	1,637,187	**1,867,624**	1,637,187
අය විය යුතු ප්‍රතිරක්ෂණ	13	**4,367,265**	2,901,995	**4,367,265**	2,901,995
අය විය යුතු රක්ෂණ වාරික	14	**6,610,797**	7,977,747	**6,610,797**	7,977,747
විලම්බිත බදු වත්කම්	15	**162,342**	384,691	**–**	–
අනෙකුත් වත්කම්	16	**16,074,026**	11,565,202	**5,026,984**	4,319,691
විලම්බිත වියදම්	17	**520,172**	483,822	**520,172**	483,822
මුදල් සහ මුදලට සමාන දෑ	18	**9,788,484**	27,378,865	**6,320,469**	16,920,370
මුළු වත්කම්		**340,544,104**	325,874,190	**274,448,900**	268,435,968
වගකීම් සහ කොටස්හිමියන්ගේ ස්කන්ධය					
ස්කන්ධය					
ප්‍රකාශිත ප්‍රාග්ධනය	19	**6,000,000**	6,000,000	**6,000,000**	6,000,000
නියාමන සීමා කරන ලද සංචිත		**98,237**	98,237	**98,237**	98,237
ප්‍රත්‍යාගණන සංචිත	20	**22,972,908**	18,414,228	**8,516,289**	9,275,282
විකිණීම සඳහා ඇති සංචිත	21	**(246,970)**	6,008,859	**(246,970)**	6,008,859
ආදායම් සංචිත	22	**73,572,987**	65,716,612	**62,079,011**	53,805,055
සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට අත්කරගත හැකි මුළු සක්න්ධය		**102,397,162**	96,237,936	**76,446,567**	75,187,433
පාලනය නොවන අයිතිය	6.4	**12,897,579**	9,125,663	**–**	–
මුළු ස්කන්ධය		**115,294,741**	105,363,599	**76,446,567**	75,187,433

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 දිනට	සටහන	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	**2021 රු. '000**
වගකීම්					
රක්ෂණ ගිවිසුම් වගකීම් – ජීවිත	23	**159,769,323**	155,788,928	**159,769,323**	155,788,928
රක්ෂණ ගිවිසුම් වගකීම් – ජීවිත නොවන	24	**21,689,853**	20,879,547	**21,689,853**	20,879,547
ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ		**2,354,371**	2,868,291	**2,354,371**	2,868,291
ප්‍රවර්තන බදු වගකීම්	25	**2,372,303**	2,216,343	**1,686,823**	1,684,872
විලම්බිත බදු වගකීම්	15	**6,017,757**	4,483,692	**3,756,899**	3,114,782
වගකීම් භාවිතා කිරීමේ අයිතිය	9	**876,401**	936,686	**492,518**	467,910
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	26	**2,088,250**	2,523,520	**1,530,151**	1,917,741
අනෙකුත් වගකීම්	27	**23,008,938**	27,278,863	**6,159,369**	5,987,181
මූල්‍ය වගකීම්	28	**7,072,167**	3,534,721	**563,026**	539,283
මුළු වගකීම්		**225,249,363**	220,510,591	**198,002,333**	193,248,535
මුළු වගකීම් සහ ස්කන්ධය		**340,544,104**	325,874,190	**274,448,900**	268,435,968

පිටු අංක 136 සිට 240 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.
2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

මාලක බණ්ඩාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී

දුම්මන්ත තොටවත්ත
අධ්‍යක්ෂ

රවීන්ද්‍ර පත්මප්‍රිය
අධ්‍යක්ෂ

කොළඹ
2023 අප්‍රේල් 24

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
ආදායම	29	**156,605,058**	128,007,520	**63,684,756**	64,062,308
දළ ලිඛිත වාරිකය	30	**41,053,602**	43,063,839	**41,271,573**	43,231,011
නොඉපයූ දළ වාරික සඳහා සංචිතයේ වෙනස		**612,519**	(778,671)	**612,519**	(778,671)
දළ ඉපයූ වාරිකය		**41,666,121**	42,285,168	**41,884,092**	42,452,340
ප්‍රතිරක්ෂකයන්ට පවරා දෙන ලද වාරික		**(5,743,770)**	(4,508,761)	**(5,743,770)**	(4,508,761)
දළ නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරිකය සඳහා සංචිතයෙහි සංචලනය		**883,699**	453,247	**883,699**	453,247
ශුද්ධ ඉපයූ වාරිකය	31	**36,806,050**	38,229,653	**37,024,021**	38,396,825
අනෙකුත් මෙහෙයුම් වලින් ලැබූ ආදායම	30.1	**90,620,724**	62,143,038	**–**	–
		127,426,774	100,372,691	**37,024,021**	38,396,825
අනෙකුත් ආදායම්					
ආයෝජන ආදායම්	32	**15,370,280**	24,044,877	**13,793,670**	23,392,497
ගාස්තු සහ කොමිස් ආදායම්	33	**67,211**	76,441	**67,211**	76,441
උපලබ්ධි නොවූ ලැබීම්/ආලාභ	34	**10,177,094**	279,523	**11,857,124**	1,012,991
අනෙකුත් ආදායම්	35	**3,563,699**	3,233,988	**942,730**	1,183,554
		29,178,284	27,634,829	**26,660,735**	25,665,483
ආදායම		**156,605,058**	128,007,520	**63,684,756**	64,062,308
ප්‍රතිලාභ, අලාභ සහ වියදම්					
ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්	36	**(22,131,899)**	(20,185,417)	**(22,131,899)**	(20,185,417)
ප්‍රාරක්ෂණය සහ ශුද්ධ අත්කර ගැනීමේ පිරිවැය	37	**(3,301,835)**	(3,220,308)	**(3,301,835)**	(3,220,308)
ගිවිසුම් වගකීම්වල වෙනස – ජීවිත අරමුදල		**(11,017,756)**	(18,849,187)	**(11,017,756)**	(18,849,187)
අනෙකුත් මෙහෙයුම් සහ පරිපාලන වියදම්		**(26,866,923)**	(16,692,204)	**(14,757,116)**	(10,081,963)
පරිපාලිත සමාගම්වල සේවා වියදම්		**(77,123,398)**	(63,422,161)	**–**	–
ශුද්ධ ප්‍රතිලාභ, අලාභ සහ වියදම්		**(140,441,811)**	(122,369,277)	**(51,208,606)**	(52,336,875)
බදු පෙර ලාභය	38	**16,163,247**	5,638,243	**12,476,150**	11,725,433
ආදායම් බදු වියදම්	39	**(3,579,214)**	942,720	**(1,930,343)**	(1,684,297)
වර්ෂය සඳහා ශුද්ධ ලාභය		**12,584,033**	6,580,963	**10,545,807**	10,041,136
අනෙකුත් විස්තීර්ණ ආදායම්					
ලාභයට හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය නොකරනු ලබන අයිතම					
දේපල, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණන මත ලැබීම්/(අලාභ)		**7,620,440**	3,408,477	**–**	–
දේපල, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණන මත විලම්භිත බදු බලපෑම	39.2	**(125,330)**	(518,333)	**–**	(467,016)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණනික ලැබීම්/(අලාභ)	26	**763,296**	960,358	**641,457**	858,485
ආයුගණනික ලැබීම්/(අලාභ) මත විලම්භිත බදු බලපෑම	39.2	**(84,170)**	(120,281)	**(57,309)**	(107,497)
අනුපාත වෙනස්වීම් හේතුවෙන් විලම්භිත බදු බලපෑම	39.2	**(969,129)**	670,513	**(758,993)**	381,182

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**සටහන**	**2022** රු. '000	**2021** රු. '000	**2022** රු. '000	**2021** රු. '000
ලාභයට හෝ අලාභයට පසුව ප්‍රතිවර්ගීකරණය කරන හෝ කළහැකි අයිතම					
අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ වෙනස්වීම		(12,320,354)	(55,321)	(12,320,354)	(55,321)
අලෙවිය සඳහා තබා ඇති සංචිතවල සාධාරණ අගය මත විලම්බිත බදු බලපෑම	39.2	262,681	77,371	262,681	77,371
අනුපාත වෙනස්වීම් හේතුවෙන් විලම්බිත බදු බලපෑම	39.2	–	4,488	–	4,488
වසර සඳහා අනෙකුත් විස්තීරණ ආදායම බද්දෙන් ශුද්ධ		(4,852,566)	4,427,272	(12,232,518)	691,692
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		7,731,467	11,008,235	(1,686,711)	10,732,828
වසර සඳහා පැවරිය හැකි ආදායම					
සමාගමේ ස්කන්ධ හිමියන්		11,588,573	5,326,971	10,545,807	10,041,136
සුළු කොටස් හිමි අයිතිය		995,460	1,253,992	–	–
වසර සඳහා ශුද්ධ ලාභය		12,584,033	6,580,963	10,545,807	10,041,136
පැවරිය හැකි මුළු විස්තීර්ණ ආදායම					
සමාගමේ ස්කන්ධ හිමියන්		4,945,645	9,218,685	(1,686,711)	10,732,828
සුළු කොටස් හිමි අයිතිය		2,785,823	1,789,550	–	–
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		7,731,467	11,008,235	(1,686,711)	10,732,828
කොටසක මූලික/තනුක ඉපයීම් (රු.)	40	19.32	8.88	17.58	16.74
කොටසක ලභාංශය (රු.)	41	1.67	2.52	1.67	2.52

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි

පිටු අංක 136 සිට 240 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.

කොළඹ
2023 අප්‍රේල් 24

සමූහය	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. '000	ප්‍රත්‍යාගණන සංචිත රු. '000	පොදු සංචිතය රු. '000
2021 ජනවාරි 01 දිනට ශේෂය	6,000,000	13,112,599	643,442
පෙර කාලසීමාවල දෝෂ නිවැරදි කිරීමේ බලපෑම	–	–	–
2021 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය	6,000,000	13,112,599	643,442
වසර සඳහා මුළු විස්තරාත්මක ආදායම			
වසර සඳහා ලාභය	–	–	–
අනෙකුත් විස්තරාත්මක ආදායම බද්දෙන් ශුද්ධ	–	3,091,975	–
වසර සඳහා මුළු විස්තරාත්මක ආදායම	–	3,091,975	–
දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම මත ප්‍රත්‍යාගණන සංචිත මාරු කිරීම	–	(7,070)	–
ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය මත අතිරික්තය මත ක්ෂය කිරීම මාරු කිරීම	–	(26,592)	–
ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම	–	1,955,015	–
ස්කන්ධය තුළ සෘජුව වාර්තාකළ සමාගමේ අයිතිකරුවන් සමඟ ගනුදෙනු			
ජීවිත රක්ෂණයෙන් කොටස්හිමියන්ට ආරෝපනය වන අතිරික්තය	–	–	–
කොටස් හිමිකරුවන් වෙත ආරෝපණය කළ පරිවර්තන වසරේ ලාභ මාරු කිරීම	–	288,302	–
ගෙවූ ලාභාංශ	–	–	–
මාරු කරන ලද විකිණීම සඳහා පවතින සංචිත – ජීවිත අරමුදල	–	–	–
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	6,000,000	18,414,228	643,442

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.

පිටු අංක 136 සිට 240 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.

කොළඹ
2023 අප්‍රේල් 24

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

අලෙවිය සඳහා තබා ඇති සංචිත රු. '000	සීමා නොකළ සංචිත රු. '000	නියමක සීමාකළ සංචිත රු. '000	ජීවිත රක්ෂණයෙන් අතිරික්තය රු. '000	රඳවාගත් ඉපයීම් රු. '000	එකතුව රු. '000	පාලනය නොවන අයිතිය රු. '000	මුළු ස්කන්ධය රු. '000
5,704,652	466,179	98,237	12,936,488	45,268,378	84,229,976	8,985,168	93,215,144
–	–	–	–	(2,338)	(2,338)	–	(2,338)
5,704,652	466,179	98,237	12,936,488	45,266,040	84,227,638	8,985,168	93,212,806
–	–	–	–	5,326,971	5,326,971	1,253,992	6,580,963
26,537	–	–	–	773,201	3,891,713	535,559	4,427,271
26,537	–	–	–	6,100,172	9,218,684	1,789,551	11,008,235
–	–	–	–	7,070	–	–	–
–	–	–	–	26,592	–	–	–
–	–	–	–	–	1,955,015	–	1,955,015
–	–	–	4,983,788	(4,983,788)	–	–	–
–	–	–	–	1,170,231	1,458,533	(1,458,533)	–
–	–	–	–	(899,603)	(899,603)	(190,523)	(1,090,126)
277,670	–	–	–	–	277,670	–	277,670
6,008,859	466,179	98,237	17,920,276	46,686,715	96,237,936	9,125,663	105,363,599

සමූහය	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. '000	ප්‍රත්‍යාගණන සංචිත රු. '000	පොදු සංචිතය රු. '000
2022 ජනවාරි 01 දිනට ශේෂය	6,000,000	18,414,228	643,442
පෙර කාලසීමාවල දෝෂ නිවැරදි කිරීමේ බලපෑම	–	–	–
2022 අංක 14 දරණ අධිභාර බදු පනත යටතේ අයකළ අධිභාර බද්ධ සඳහා ගැලපීම	–	–	–
2022 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය	6,000,000	18,414,228	643,442
වසර සඳහා මුළු විස්තරාත්මක ආදායම			
වසර සඳහා ලාභය	–	–	–
අනෙකුත් විස්තරාත්මක ආදායම බද්දෙන් ශුද්ධ	–	4,757,807	–
වසර සඳහා මුළු විස්තරාත්මක ආදායම	–	4,757,807	–
ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය මත අතිරික්තය මත ක්ෂය කිරීම මාරු කිරීම	–	(26,592)	–
ස්කන්ධය තුළ සෘජුව වාර්තාකළ සමාගමේ අයිතිකරුවන් සමඟ ගනුදෙනු			
ජීවිත රක්ෂණයෙන් කොටස්හිමියන්ට ආරෝපනය වන අතිරික්තය	–	–	–
පාලනය තබාගනිමින් අයිතියෙහි වෙනස්වීම්	–	(172,535)	–
ගෙවූ ලාභාංශ	–	–	–
මාරු කරන ලද විකිණීම සඳහා පවතින සංචිත – ජීවිත අරමුදල	–	–	–
	–	(199,127)	–
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	6,000,000	22,972,908	643,442

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.

කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම

කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම පවත්නා වසරේ ස්කන්ධය තුළ වෙනස්වීම් ප්‍රකාශයේ ආරම්භක ශේෂයට නිවැරදි කිරීමක් සිදු කරන ලදි.

නිවැරදි කිරීම 2022 දී අත්තිකාරම් ගෙවීමක් ලෙස හඳුනාගත් සැපයුම්කරුවන්ට සිදුකළ ගෙවීම් හේතුවෙන් වන නමුත් රු. 373,097ක වියදමක් ලෙස හඳුනාගත යුතුව තිබුණි. මෙම නිවැරදි කිරීමේ බලපෑම පෙර වසරේ ගැලපීමක් ලෙස පවත්නා වසරේ රඳවාගත් ඉපයීම්වල ආරම්භක ශේෂයට ගලපන ලදී.

පිටු අංක 136 සිට 240 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.

කොළඹ
2023 අප්‍රේල් 24

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

අලෙවිය සඳහා තබා ඇති සංචිත රු. '000	සීමා නොකළ සංචිත රු. '000	නියමක සීමාකළ සංචිත රු. '000	ජීවිත රක්ෂණයෙන් අතිරික්තය රු. '000	රඳවාගත් ඉපයීම් රු. '000	එකතුව රු. '000	පාලනය නොවන අයිතිය රු. '000	මුළු ස්කන්ධය රු. '000
6,008,859	466,179	98,237	17,920,276	46,686,715	96,237,936	9,125,663	105,363,599
–	–	–	–	373	373	–	373
–	–	–	(228,077)	(1,536,511)	(1,764,588)	–	(1,764,588)
6,008,859	466,179	98,237	17,692,199	45,150,577	94,473,721	9,125,663	103,599,384
–	–	–	–	11,588,573	11,588,573	995,460	12,584,033
(12,057,673)	–	–	–	656,937	(6,642,929)	1,790,363	(4,852,566)
(12,057,673)	–	–	–	12,245,510	4,945,644	2,785,823	7,731,467
–	–	–	–	26,592	–	–	–
–	–	–	3,016,654	(3,016,654)	–	–	–
–	–	–	–	(1,140,169)	(1,312,704)	1,312,704	–
–	–	–	–	(1,511,343)	(1,511,343)	(326,611)	(1,837,954)
5,801,844	–	–	–	–	5,801,844	–	5,801,844
5,801,844	–	–	3,016,654	(5,641,574)	2,977,797	986,093	3,963,890
(246,970)	466,179	98,237	20,708,853	51,754,513	102,397,162	12,897,579	115,294,741

සමාගම	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිත	පොදු සංචිතය
	රු. '000	රු. '000	රු. '000
2021 ජනවාරි 01 දිනට ශේෂය	6,000,000	7,359,125	643,442
වසර සඳහා මුළු විස්තරාත්මක ආදායම			
වසර සඳහා ලාභය	–	–	–
අනෙකුත් විස්තරාත්මක ආදායම බද්දෙන් ශුද්ධ	–	(38,857)	–
ඉඩම් බැහැර කිරීම මත ප්‍රත්‍යාගණන සංචිතයේ උපලබ්ධිවීම මත විලම්බිත බදු බලපෑම	–	–	–
වසර සඳහා මුළු විස්තරාත්මක ආදායම	–	(38,857)	–
ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම	–	1,955,015	–
ස්කන්ධය තුළ සෘජුව වාර්තාකළ සමාගමේ අයිතිකරුවන් සමඟ ගනුදෙනු			
ජීවිත රක්ෂණයෙන් කොටස්හිමියන්ට ආරෝපනය වන අතිරික්තය	–	–	–
ගෙවූ ලාභාංශ	–	–	–
මාරු කරන ලාභ විකිණීම සඳහා පවතින සංචිත – ජීවිත අරමුදල	–	–	–
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	6,000,000	9,275,282	643,442
2022 ජනවාරි 01 දිනට ශේෂය	6,000,000	9,275,282	643,442
2022 අංක 14 දරණ අධිභාර බදු පනත යටතේ අයකළ අධිභාර බද්ධ සඳහා ගැලපීම	–	–	–
2022 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය	6,000,000	9,275,282	643,442
වසර සඳහා මුළු විස්තරාත්මක ආදායම			
වසර සඳහා ලාභය	–	–	–
අනෙකුත් විස්තරාත්මක ආදායම බද්දෙන් ශුද්ධ	–	(758,993)	–
ඉඩම් බැහැර කිරීම මත ප්‍රත්‍යාගණන සංචිතයේ උපලබ්ධිවීම මත විලම්බිත බදු බලපෑම	–	–	–
වසර සඳහා මුළු විස්තරාත්මක ආදායම	–	(758,993)	–
ස්කන්ධය තුළ සෘජුව වාර්තාකළ සමාගමේ අයිතිකරුවන් සමඟ ගනුදෙනු			
ජීවිත රක්ෂණයෙන් කොටස්හිමියන්ට ආරෝපනය වන අතිරික්තය	–	–	–
ගෙවූ ලාභාංශ	–	–	–
මාරු කරන ලද විකිණීම සඳහා පවතින සංචිත – ජීවිත අරමුදල	–	–	–
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	6,000,000	8,516,289	643,442

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.

පිටු අංක 136 සිට 240 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.

කොළඹ
2023 අප්‍රේල් 24

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

අලෙවිය සඳහා තබා ඇති සංචිත	සීමා නොකළ සංචිත	නියමක සීමාකළ සංචිත	ජීවිත රක්ෂණයෙන් අතිරික්තය	රඳවාගත් ඉපයීම්	මුළු ස්කන්ධය
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
5,704,652	466,179	98,237	12,936,488	29,913,401	63,121,524
–	–	–	–	10,041,136	10,041,136
26,537	–	–	–	704,012	691,691
–	–	–	–	–	–
26,537	–	–	–	10,745,148	10,732,828
–	–	–	–	–	1,955,015
–	–	–	4,983,788	(4,983,788)	–
–	–	–	–	(899,603)	(899,603)
277,670	–	–	–	–	277,670
6,008,859	466,179	98,237	17,920,276	34,775,158	75,187,433
6,008,859	466,179	98,237	17,920,276	34,775,158	75,187,433
–	–	–	(228,077)	(1,116,579)	(1,344,656)
6,008,859	466,179	98,237	17,692,199	33,658,579	73,842,777
–	–	–	–	10,545,807	10,545,807
(12,057,673)	–	–	–	584,148	(12,232,518)
–	–	–	–	–	–
(12,057,673)	–	–	–	11,129,955	(1,686,711)
–	–	–	3,016,654	(3,016,654)	–
–	–	–	–	(1,511,343)	(1,511,343)
5,801,844	–	–	–	–	5,801,844
(246,970)	466,179	98,237	20,708,853	40,260,537	76,446,567

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ					
පාරිභෝගිකයින්ගෙන් ලැබුණු වාරික		42,420,553	41,819,924	42,638,524	41,987,096
ගෙවන ලද ප්‍රතිරක්ෂණ වාරික		(6,257,689)	(3,315,750)	(6,257,689)	(3,315,750)
ගෙවන ලද රක්ෂණ හිමිකම් සහ ප්‍රතිලාභ		(22,952,549)	(19,518,285)	(22,952,549)	(19,518,285)
හිමිකම් සහ ප්‍රතිලාභවලට අදාළ ප්‍රතිරක්ෂණ ලැබීම්		2,005,679	886,747	2,005,679	886,747
ණයගැතියන්ගෙන් ලැබුණු මුදල		93,681,303	63,244,600	1,418,620	806,938
සිලින්ඩර් තැන්පතු මත ලද/(ගෙවූ) මුදල		(4,354)	242,351	–	–
සේවකයින්ට සහ සේවකයින් වෙනුවෙන් ගෙවන ලද මුදල		(11,747,031)	(10,377,784)	(6,973,352)	(6,051,757)
ලැබුණු පොලිය		19,148,662	15,155,562	17,309,371	14,372,560
ලැබුණු ලාභාංශ		1,348,781	1,177,178	1,712,590	1,378,186
අනෙකුත් මෙහෙයුම් මුදල් ගෙවීම්		(100,182,717)	(67,266,578)	(8,197,230)	(7,398,907)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ	A	17,460,638	22,047,965	20,703,964	23,146,828
ගෙවන ලද විශ්‍රාම පාරිතෝෂික	26	(121,086)	(146,952)	(68,732)	(84,287)
ගෙවන ලද පොලී වියදම්		310,308	(32,618)	–	–
ගෙවන ලද ආදායම් බදු	25	(2,582,531)	(2,584,261)	(1,839,896)	(2,222,530)
ගෙවූ අධිභාර බද්ද		(2,846,584)	–	(2,426,625)	–
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල		12,220,745	19,284,134	16,368,711	20,840,011
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ					
මූල්‍ය ආයෝජන අත්පත් කර ගැනීම	5.5	(72,425,369)	(46,166,214)	(70,252,132)	(44,523,237)
මූල්‍ය ආයෝජනවලින් ලද මුදල්		34,772,728	26,479,740	34,672,728	26,479,740
දේපළ, පිරියත සහ උපකරණ බැහැරලීමෙන් ලද මුදල්		34,243	74,409	21,553	216
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම	8	(983,700)	(678,859)	(515,245)	(256,145)
අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීම	11.2	(27,564)	(32,858)	(17,809)	(12,730)
ආයෝජන දේපළ අත්පත් කරගැනීම	10	(3,743)	(1,360)	–	–
පරිපාලිත සමාගම්වල ආයෝජන	6	–	–	–	(2,000,000)
කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ මුදල්		–	(778,608)	–	–
නොනිමි ප්‍රාග්ධනය මත දරන ලද වියදම	8	(727,680)	(3,166,531)	–	–
සේවක ණය මත සමාගමේ දායකත්වය		–	17,375	–	–
දෙනලද සේවක ණය		(1,064,562)	(591,408)	(1,043,000)	(566,222)
සේවක ණය අය කිරීම		254,317	499,923	171,927	407,955
ඔප්පුහිමියන්ට දෙනලද ණය	12	(1,540,297)	(1,470,548)	(1,540,297)	(1,470,548)
ඔප්පුහිමියන් විසින් ණය නිරවුල් කිරීම		1,385,027	1,883,973	1,385,027	1,883,973
ආයෝජන ක්‍රියාකාරකම් වල භාවිතා කළ ශුද්ධ මුදල		(40,326,600)	(23,930,966)	(37,117,248)	(20,056,997)
මූල්‍ය ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහ					
ගෙවන ලද ලාභාංශ	22.2	(1,511,343)	(899,603)	(1,511,343)	(899,603)
සුළු කොටස් හිමියන් වෙත ගෙවන ලද ලාභාංශ		(326,611)	(190,523)	–	–

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
ගෙවන ලද කල්බදු වාරික	9.2	(640,761)	(448,963)	(220,888)	(211,274)
ලබාගත් ණය		1,067,880	693,295	–	–
මූල්‍ය ක්‍රියාකාරකම් වල භාවිතා කළ ශුද්ධ මුදල		(1,410,835)	(845,794)	(1,732,231)	(1,110,877)
මූදල් හා මුදලට සමාන දෑ මත විනිමය අනුපාත වෙනසේ බලපෑම		11,857,124	1,012,991	11,857,124	1,012,991
මූදල් හා මුදලට සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		(17,659,566)	(4,479,635)	(10,623,644)	685,128
වසර ආරම්භයේදී මූදල් හා මුදලට සමාන දෑ		26,357,197	30,836,832	16,381,087	15,695,959
වසර ආරම්භයේදී මූදල් හා මුදලට සමාන දෑ (සටහන අ)	18	8,697,631	26,357,197	5,757,443	16,381,087
සටහන A – මූදල් හා මුදලට සමාන දෑ විශ්ලේෂණය					
බැංකුවේ සහ අතැති මුදල්		3,632,707	1,855,228	928,069	1,269,329
කෙටිකාලීන ආයෝජන		6,155,777	25,523,637	5,392,400	15,651,041
*බැංකු අයිරාව		(1,090,853)	(1,021,668)	(563,026)	(539,283)
		8,697,631	26,357,197	5,757,443	16,381,087

*වාරනාකරණ දිනයට වාර්තාකළ බැංකු අයිරා ශේෂය මූදල් කළමනාකරණ අරමුණ සඳහා භාවිතා කෙරේ. සමාගමට රු. මිලියන 9.3 ක අයිරා පහසුකමක් ඇත.

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.

මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ සමඟ මෙහෙයුම් ලාභය ගැලපීම

	සමාගම	
	2022 රු. '000	2021 රු. '000
මෙහෙයුම්වලින් ලද ලාභය	8,082,483	5,238,687
දිගු කාලීන රක්ෂණ අරමුදලේ වැඩිවීම්	15,411,423	25,335,934
ක්ෂයවීම් ගාස්තු	506,346	354,382
ROU වත්කම් පිරිවැය	227,360	223,695
දේපළ, පිරියත සහ උපකරණ අලෙවිය මත ලාභ	(21,493)	(213)
ආයෝජන ලාභය – උපලබ්ධි නොවූ ලාභය/(අලාභය)	6,718,045	(7,716,838)
පාරිතෝෂික වෙන් කිරීම	322,599	307,025
විනිමය ගනුදෙනු මත ලාභය/(අලාභය)	(11,857,124)	(1,012,991)
ආදායම් ප්‍රකාශයේ වාර්තා කළ සාධාරණ අගය ලාභය	(141,040)	(222,634)
ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කර මත හානිකරණය	2,676,150	–
ණයගැතියන්ගේ වැඩිවීම/(අඩුවීම)	(1,019,839)	(2,116,341)
නොඉපයූ රක්ෂණ වාරිකවල වැඩිවීම/(අඩුවීම)	(1,496,219)	325,424
හිමිකම් ප්‍රතිපාදනවල වැඩිවීම/(අඩුවීම)	2,152,975	1,776,096
ණය හිමියන්ගේ වැඩිවීම/(අඩුවීම)	(867,538)	660,867
ඔප්පුහිමියන්ට අත්තිකාරම් ගෙවීම්වල වැඩිවීම/(අඩුවීම)	9,837	(6,264)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල	20,703,964	23,146,828

පිටු අංක 136 සිට 240 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.

කොළඹ
2023 අප්‍රේල් 24

බණ්ඩමය සමාලෝචනය:
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට

2022

	ජීවිත නොවන රක්ෂණය රු. '000	ජීවිත රක්ෂණය රු. '000	සෞඛ්‍යාරක්ෂාව රු. '000	බලශක්තිය රු. '000	වෙනත් රු. '000	ඉවත්කිරීම් රු. '000	එකතුව රු. '000
වත්කම්							
මූල්‍ය ආයෝජන	36,589,214	174,662,701	6,923,208	–	–	–	218,175,123
පරිපාලිත සමාගම්වල ආයෝජනය	19,634,852	3,296,543	–	5,000,000	20,500,000	(48,431,395)	–
ආශ්‍රිත සමාගම්වල ආයෝජනය	198,673	–	–	–	–	–	198,673
දේපළ, පිරියත සහ උපකරණ	12,667,642	95,450	5,125,086	19,859,549	37,679,078	–	75,426,804
වත්කම් භාවිතා කිරීමේ අයිතිය	168,431	408,358	531,471	170,723	22,290	–	1,301,273
ආයෝජන දේපළ	2,083,640	–	–	–	890,000	–	2,973,640
අස්පර්ශ්‍ය වත්කම්	37,588	–	46,814	–	675	2,992,805	3,077,882
ඔප්පු හිමියන්ට ණය	–	1,867,624	–	–	–	–	1,867,624
අය විය යුතු ප්‍රතිරක්ෂණ	3,359,006	1,008,259	–	–	–	–	4,367,265
අය විය යුතු රක්ෂණ වාරික	5,935,715	675,082	–	–	–	–	6,610,797
විලම්බිත බදු වත්කම්	–	–	–	160,309	2,033	–	162,342
අනෙකුත් වත්කම්	1,209,209	3,840,197	1,995,760	15,146,438	1,730,483	(7,848,062)	16,074,026
විලම්බිත වියදම්	520,172	–	–	–	–	–	520,172
මූදල් හා මුදලට සමාන දෑ	3,418,906	2,901,563	711,591	2,301,902	454,521	–	9,788,483
මුළු වත්කම්	85,823,048	188,755,777	15,333,930	42,638,921	61,279,080	(53,286,652)	340,544,104
වගකීම් සහ ස්කන්ධය							
වගකීම්							
රක්ෂණ ගිවිසුම් වගකීම් – ජීවිත	–	159,769,323	–	–	–	–	159,769,323
රක්ෂණ ගිවිසුම් වගකීම් – ජීවිත නොවන	21,689,853	–	–	–	–	–	21,689,853
භාවිතා කළ හැකි වගකීම්	17,741	474,777	239,031	144,662	190	–	876,401
ගෙවියයුතු ප්‍රතිරක්ෂණය	1,469,919	884,452	–	–	–	–	2,354,371
වර්තන බදු වගකීම්	267,443	1,419,380	353,794	327,935	3,751	–	2,372,303
විලම්භීත බදු වගකීම්	3,756,899	–	1,212,338	926,845	121,675	–	6,017,757
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	759,575	770,576	254,261	145,181	158,657	–	2,088,250
අනෙකුත් වගකීම්	3,260,532	2,921,259	765,627	10,517,248	7,042,320	(1,498,049)	23,008,938
මූල්‍ය වගකීම්	312,304	250,722	527,827	7,351,712	4,979,602	(6,350,000)	7,072,167
මුළු වගකීම්	31,534,266	166,490,489	3,352,878	19,413,583	12,306,195	(7,848,049)	225,249,363
ස්කන්ධය							
ප්‍රාකාශිත ප්‍රාග්ධනය	6,000,000	–	2,671,543	1,947,109	41,870,087	(46,488,739)	6,000,000
එකවරක් පමණක් ලැබෙන අතිරික්කතයන් වෙතින් රෙගුලාසිමය සීමා කරන ලද සංචිතයන්ට	–	98,237	–	–	–	–	98,237
ප්‍රත්‍යාගණන සංචිතය	8,444,617	71,672	1,361,085	5,099,559	12,866,136	(4,870,160)	22,972,908
අලෙවියට තබා ඇති සංචිත	(921,825)	674,855	–	–	–	–	(246,970)
ආදායම් සංචිත	40,765,990	21,420,524	7,948,424	16,178,670	(5,763,338)	(6,977,283)	73,572,987
පාලනය නොවන අයිතිය	–	–	–	–	–	12,897,579	12,897,579
මුළු ස්කන්ධය	54,288,782	22,265,288	11,981,052	23,225,338	48,972,885	(45,438,603)	115,294,741
මුළු වගකීම් සහ ස්කන්ධය	85,823,048	188,755,777	15,333,930	42,638,921	61,279,080	(53,286,652)	340,544,104

බණ්ඩමය සමාලෝචනය: මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2021

ජීවිත නොවන රක්ෂණය රු. '000	ජීවිත රක්ෂණය රු. '000	සෞඛ්‍යාරක්ෂාව රු. '000	බලශක්තිය රු. '000	වෙනත් රු. '000	ඉවත්කිරීම් රු. '000	එකතුව රු. '000
35,343,058	160,554,249	4,749,971	100,000	–	–	200,747,278
19,634,852	3,296,543	–	5,000,000	20,500,000	(48,431,395)	–
198,673	–	–	–	–	–	198,673
12,639,695	97,939	4,718,257	20,835,636	27,099,981	–	65,391,507
170,593	388,059	533,477	200,749	22,634	–	1,315,512
1,942,600	–	–	–	863,880	–	2,806,480
36,398	–	55,276	–	752	2,992,805	3,085,231
–	1,637,187	–	–	–	–	1,637,187
2,090,082	811,913	–	–	–	–	2,901,995
7,470,356	507,391	–	–	–	–	7,977,747
–	–	–	384,485	206	–	384,691
1,044,622	3,539,443	1,488,988	4,725,720	2,040,611	(1,274,182)	11,565,202
483,822	–	–	–	–	–	483,822
3,137,996	13,782,374	453,898	8,860,650	1,143,947	–	27,378,865
84,192,747	184,615,098	11,999,867	40,107,240	51,672,011	(46,712,772)	325,874,190
–	155,788,928	–	–	–	–	155,788,928
20,879,547	–	–	–	–	–	20,879,547
17,602	450,308	248,041	220,545	190	–	936,686
1,773,196	1,095,095	–	–	–	–	2,868,290
427,587	1,257,284	265,224	264,374	1,873	–	2,216,343
3,114,782	–	509,403	769,509	89,998	–	4,483,692
1,000,561	917,180	277,776	166,890	161,112	–	2,523,520
3,170,777	3,080,779	897,957	16,473,942	3,929,309	(273,899)	27,278,863
325,632	213,651	482,385	116,958	3,396,367	(1,000,272)	3,534,721
30,709,684	162,803,225	2,680,786	18,012,218	7,578,849	(1,274,171)	220,510,590
6,000,000	–	2,671,543	1,947,109	41,870,087	(46,488,739)	6,000,000
–	98,237	–	–	–	–	98,237
9,203,609	71,673	1,330,581	5,099,559	5,663,461	(2,954,655)	18,414,228
2,748,526	3,260,333	–	–	–	–	6,008,859
35,530,928	18,381,630	5,316,957	15,048,354	(3,440,386)	(5,120,870)	65,716,612
–	–	–	–	–	9,125,663	9,125,663
53,483,063	21,811,873	9,319,081	22,095,022	44,093,162	(45,438,601)	105,363,599
84,192,747	184,615,098	11,999,867	40,107,240	51,672,011	(46,712,772)	325,874,190

බඳ්ධමය සමාලෝචනය:
ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වූ වසර
සඳහා

	2022						
	ජීවිත නොවන රක්ෂණය රු. '000	ජීවිත රක්ෂණය රු. '000	සෞඛ්‍යාරක්ෂාව රු. '000	බලශක්තිය රු. '000	වෙනත් රු. '000	ඉවත්කිරීම් රු. '000	එකතුව රු. '000
දළ ලිඛිත වාරිකය	20,341,448	20,930,125	–	–	–	(217,971)	41,053,602
නොඉපයූ වාරිකය සඳහා සංචිතවල වෙනස	612,519	–	–	–	–	–	612,519
දළ ඉපයූ වාරිකය	20,953,967	20,930,125	–	–	–	(217,971)	41,666,121
ප්‍රතිරක්ෂකයන්ට පවරා දෙන ලද වාරිකය	(5,180,941)	(562,829)	–	–	–	–	(5,743,770)
නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික සඳහා සංචිතවල වෙනස	883,699	–	–	–	–	–	883,699
ශුද්ධ ඉපයූ වාරිකය	16,656,725	20,367,296	–	–	–	(217,971)	36,806,050
වෙනත් මෙහෙයුම්වලින් ආදායම	–	–	10,697,888	81,426,349	127,623	(1,631,136)	90,620,724
	16,656,725	20,367,296	10,697,888	81,426,349	127,623	(1,849,107)	127,426,774
ප්‍රතිලාභ සහ අලාභ							
ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්	(10,525,781)	(11,606,118)	–	–	–	–	(22,131,899)
ප්‍රතිරක්ෂණය ශුද්ධ අත්කර ගැනීමේ පිරිවැය	(740,074)	(2,561,761)	–	–	–	–	(3,301,835)
ගිවිසුම් වගකීම්වල වෙනස – ජීවිත අරමුදල	–	(11,017,756)	–	–	–	–	(11,017,756)
පරිපාලිතවල සේවා පිරිවැය	–	–	(5,993,026)	(72,544,066)	(30,573)	1,444,267	(77,123,398)
මුළු ප්‍රතිලාභ සහ අලාභ	(11,265,855)	(25,185,635)	(5,993,026)	(72,544,066)	(30,573)	1,444,267	(113,574,888)
වෙනත් ආදායම	1,743,588	12,050,084	927,518	1,341,145	78,633	(770,688)	15,370,280
ගාස්තු සහ කොමිස් ආදායම	–	67,211	–	–	–	–	67,211
ශුද්ධ උපලබ්ධි ලාභ	9,169,180	2,687,944	1,954,853	(3,634,883)	–	–	10,177,094
අනෙකුත් ආදායම්	585,855	589,563	86,061	130,799	2,537,463	(366,042)	3,563,699
	11,498,623	15,394,802	2,968,432	(2,162,939)	2,616,096	(1,136,730)	29,178,284
වියදම්							
වෙනත් මෙහෙයුම්, ආයෝජන ආශ්‍රිත සහ පරිපාලන වියදම්	(8,807,009)	(6,182,795)	(3,612,095)	(4,437,706)	(5,014,714)	1,187,396	(26,866,923)
බදු පෙර ලාභය	8,082,484	4,393,668	4,061,199	2,281,638	(2,301,568)	(354,174)	16,163,247
ආදායම් බදු වියදම	(553,331)	(1,377,013)	(814,341)	(794,989)	(39,540)	–	(3,579,214)
බදු පසු ලාභය/කොටස්හිමි අරමුදලට මාරු කිරීම්	7,529,153	3,016,655	3,246,858	1,486,649	(2,341,108)	(354,174)	12,584,033

2021

ජීවිත නොවන රක්ෂණය රු. '000	ජීවිත රක්ෂණය රු. '000	සෞඛ්‍යාරක්ෂාව රු. '000	බලශක්තිය රු. '000	වෙනත් රු. '000	ඉවත්කිරීම් රු. '000	එකතුව රු. '000
21,255,023	21,975,988	–	–	–	(167,172)	43,063,839
(778,671)	–	–	–	–	–	(778,671)
20,476,352	21,975,988	–	–	–	(167,172)	42,285,168
(4,029,008)	(479,754)	–	–	–	–	(4,508,762)
453,247	–	–	–	–	–	453,247
16,900,591	21,496,234	–	–	–	(167,172)	38,229,653
–	–	10,033,567	53,925,156	112,010	(1,927,695)	62,143,038
16,900,591	21,496,234	10,033,567	53,925,156	112,010	(2,094,867)	100,372,691
(10,206,589)	(9,978,828)	–	–	–	–	(20,185,417)
(653,821)	(2,566,486)	–	–	–	–	(3,220,308)
–	(18,849,187)	–	–	–	–	(18,849,187)
–	–	(5,270,035)	(59,869,936)	(27,701)	1,745,511	(63,422,161)
(10,860,410)	(31,394,501)	(5,270,035)	(59,869,936)	(27,701)	1,745,511	(105,677,072)
3,404,457	19,988,041	252,324	580,484	77,325	(257,753)	24,044,877
–	76,441	–	–	–	–	76,441
733,199	279,792	153,946	(541,584)	(345,830)		279,523
518,162	737,827	137,071	85,019	1,951,764	(195,855)	3,233,988
4,655,818	21,082,101	543,341	123,919	1,683,259	(453,608)	27,634,829
(5,457,312)	(4,697,086)	(3,074,237)	(3,148,447)	(907,544)	592,422	(16,692,204)
5,238,687	6,486,748	2,232,636	(8,969,308)	860,024	(210,542)	5,638,243
(181,339)	(1,502,959)	(21,122)	2,671,765	(23,626)	–	942,720
5,057,348	4,983,789	2,211,514	(6,297,543)	836,398	(210,542)	6,580,963

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. වාර්තාකරණ ආයතනය

1.1 ආයතනික තොරතුරු

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (සමාගම/SLIC) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත හා පවත්වාගෙන යන සීමිත වගකීම් සහිත රාජ්‍ය සමාගමකි. සමූහයේ/සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 21 දරණ රක්ෂණ මන්දිරයේ පිහිටා ඇත.

2022 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන්වන වර්ෂය සඳහා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ, සමාගම සහ එහි පරිපාලිත සමාගම් වලින් ("සමූහය" ලෙසින්ද, තනිව "සමූහයේ ආයතන", ලෙසින් ද හඳුන්වන ලබන) සහ සමූහයේ ආශ්‍රිත සමාගම්වලින් සමන්විත වේ. සමූහයට අයත් සියළුම සමාගම්වල මූල්‍ය ප්‍රකාශ, 2022 දෙසැම්බර් 31 න් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් සඳහා සකස් කර ඇත.

මව් සමාගමේ සාමාන්‍ය කොටස් වලින් 599,568,144ක් (99.97%) භාණ්ඩාගාර ලේකම් සතු වන, අතර ඉතිරි කොටස් සමාගමේ සේවකයින් සහ කලින් සේවය කල සේවකයන් සතුවේ.

1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

1.2.1 සමූහය/සමාගම

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ සියලුම වර්ගයේ රක්ෂණ ව්‍යාපාර පවත්වා ගෙන යාමයි.

1.2.2 පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගමේ නම	ප්‍රධාන කාර්යයන්
සීමාසහිත ලංකා හොස්පිටල් කෝපරේෂන් (පුද්ගලික) සමාගම	සෞඛ්‍යාරක්ෂාව සහ රසායනාගාර සේවා ලබාදීම
ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම	ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් ආනයනය, සැකසීම, ගබඩා කිරීම, බෙදා හැරීම අලෙවිය සහ අනෙකුත් ආනුෂංගික සේවා
සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම	ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සඳහා තොග ගබඩාකරණ පහසුකම් සැලසීම
සීමා සිහිත කැනෝවින් හොටෙලස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම	වාණිජමය කාර්යයන් සදහා කාර්යාලයීය ඉඩ කඩ සැලසීම සහ ආගන්තුක සත්කාර සේවයේ කටයුතු කිරීම
සීමාසහිත කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම	විවේක කාල ක්‍රියාකාරකම් ක්ෂේත්‍රයට අදාළ ආයෝජන ප්‍රවර්ධනය, හිමිකාර සමාගම වශයෙන් පරිපාලිත සමාගම් පාලනය කිරීම සහ මෙහෙයවීම.
මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ සමාගම	ශ්‍රී ලංකා රක්ෂණ සමාගම වෙත පඩිපත් කළමනාකරණ සේවා සැපයීම

2. සකස් කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS/SLFRS) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ හා සංශෝධිත 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා 2023 අප්‍රේල් 24 දින අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අවසර දෙන ලදී.

2.2 මැනීමේ පදනම

සමූහයේ සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශ, විකල්ප පදනමක් මත මනිනු ලබන පහත දක්වෙන ප්‍රමාණාත්මක කරුණු හැර ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ ඇත.

- රක්ෂණ ඔප්පු හිමියන්ගේ වගකීම් ආයුගණකව නිශ්චය කරන අගයන්ට මනිනු ලැබ ඇත.
- නිශ්චිත ප්‍රතිලාභ සඳහා වන වගකීම ආයුගණකව අගයන, අතර නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ වර්තමාන වටිනාකම ලෙස පිළිගනු ලැබේ.
- ඉඩම් හා ගොඩනැගිලි සාධාරණ අගයට මනිනු ලැබේ.
- කල්පිරීම සඳහා වන මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.
- ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම්කළ මූල්‍ය වත්කම් සාධාරණ අගයෙන් මනිනු ලැබේ.
- විකිණීම සඳහා වන මූල්‍ය වත්කම් සාධාරණ අගයට මනිනු ලැබේ.
- ණය සහ ලැබියයුතු මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.

සමූහය/සමාගම එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ද්‍රවශීලතා අනුපිළිවෙලට පුළුල් ලෙස ඉදිරිපත් කරයි.

2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යාවහාර මුදල

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් මුදලින් ඉදිරිපත් කර ඇති අතර ශ්‍රී ලංකා රුපියල් සමූහයේ සහ සමාගමේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල වේ. සියලු වටිනාකම් වෙනත් ආකාරයකින් දක්වා නොමැතිනම් ආසන්නතම රුපියල් දහසට වටයා ඇත.

2.4 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම්, සහ වියදම් යොදා ගැනීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමනාකරණය විසින් සිදු කරනු ලබයි. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක කරගත් උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන ප්‍රතිශෝධනයන් අනාගතයේදි බලාපොරොත්තු විය හැකි පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශවල හඳුනාගන්නා ප්‍රමාණ මත බලපෑම් කරන උපකල්පන කිරීමේ සහ ඇස්තමේන්තු පිළිබඳ තොරතුරු පහත සඳහන් සටහන් යටතේ ඇතුළත් කර ඇත.

සටහන 26 – නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මැනීම: ප්‍රධාන ආයුගණක උපකල්පන

සටහන් 5, 8, 13, 14 සහ 16 – මූල්‍ය නොවන වත්කම් සහ මූල්‍යමය වත්කම් සඳහා හානිකරණ වෙත් කිරීම: ප්‍රධාන උපකල්පනයන්

සටහන 23 – ජීවිත රක්ෂණවල ආයුගණක ඇගයීමත ප්‍රධාන ආයුගණක උපකල්පන

සටහන 24 – වැයකරන ලද නමුත් වාර්තා නොකළ හිමිකම් ආයුගණක උපකල්පන ඇතුළුව ජීවිත නොවන හිමිකම් සඳහා ජීවිත රක්ෂණ IBNR/IBNER සහ නොඉපයූ වාරික සංචිත

සටහන 17 – විලම්බිත අත්කරගැනීම් පිරිවැය මැනීම (DAC)

සටහන 5 – ලැයිස්තුගත නොකළ සාධන පත්‍රවල සාධාරණ අගය මැනීම සහ මූල්‍ය අයෝජනයන් හි ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය මැනීම

සටහන 10 – ආයෝජන දේපලවල සාධාරණ ඇගයීම

සාධාරණ අගයන් මැනීම

සමුහයේ/සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනාවරණ ගණනාවකට මූල්‍ය සහ මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් සඳහා සාධාරණ අගය මැනීම අවශ්‍ය වේ.

වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මැනීමේදී සමුහය/සමාගම හැකි තරම් නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපළ දත්ත භාවිතා කරයි. ඇගයීමේ ශ්‍රේණීය ක්‍රම භාවිතයේදී යෙදවුම් මත පදනම් වන ධුරාවලියක් විවිධ මට්ටම්වලට සාධාරණ අගයන් පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කරනු ලැබේ.

- **අදියර 1** – අනන්‍ය වත්කම් හා වගකීම් සඳහා සක්‍රීය වෙළඳපළෙහි නියම කරන ලද මිල (වෙනස් නොකළ).
- **අදියර 2** – ඉහත මට්ටම් 1 හි ඇතුළත් නියම කරන ලද මිල හැර අනෙකුත් යෙදවුම් සෘජුව හෝ වක්‍රව වත්කම් සහ වගකීම් සඳහා නිරීක්ෂණය කළ හැකිය
- **අදියර 3** – නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපළ දත්ත මත පදනම් නොවන වත්කම් සමඟ වගවීම් සඳහා යෙදවුම් (නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්).

සාධාරණ අගයන් මැනීම සඳහා සිදු කරන ලද උපකල්පන පිළිබඳ වැඩිදුර තොරතුරු මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් තුළ ඇතුළත් කර ඇත.

ආර්ථික අර්බුදයේ බලපෑම

රටතුළ පැවති ආර්ථික අර්බුදයේ බලපෑම හැකි සෑම විටම මූල්‍ය ප්‍රකාශවල අදාළ සටහන් යටතේ වැඩිදුර සාකච්ඡා කර ඇත.

2.5 ප්‍රමාණාත්මකතාව සහ සමාහරණය

සමාන අයිතමවල සෑම ප්‍රමාණවත් වර්ගයක්ම මූල්‍ය ප්‍රකාශවල වෙනම ඉදිරිපත් කරනු ලබයි. LKAS 1 – "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" අවසර දී ඇති පරිදි වැදගත්නම් මිස සමාන ස්වභාවයේ හෝ වර්ගයේ අයිතම වෙනම ඉදිරිපත් කරනු ලබයි.

2.6 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට අනුකූල වීම අවශ්‍ය වන අවස්ථාවලදී නැවත වර්ගීකරණය කර ඇත.

2.7 අඛණ්ඩතා පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් අඛණ්ඩව ඉදිරියට යාමට සමූහය/සමාගමේ හැකියාව ගැන තක්සේරුවක් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සිදු කර තිබෙන අතර දැකියහැකි අනාගතයේදී ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂක මණ්ඩලය සෑහීමට පත්ව සිටියි. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වාගෙන යාමට සමාගමේ ඇති හැකියාව ගැන අවිශ්වාසයක් ඇති කළ හැකියැයි සැලකිය හැකි අවිනිශ්චිතතා පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් නැත. එම නිසා මූල්‍ය ප්‍රකාශ තවදුරටත් අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස් කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී, සමාගම පිළිබඳව කැබිනට් ප්‍රතිකා අනුව රජයේ තීරණය සහ පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම යොදා ගැනීම ඇතුළුව ආර්ථික තත්ත්වයන් හී බලපෑම කළමනාකරණය තක්සේරු කර ඇත. අපේක්ෂිත ආදායම් ප්‍රවාහයන්, ලාභදායිතාව, සමූහය විසින් ක්‍රියාත්මක පිරිවැය කළමනාකරණ පිරිවැය කළමනාකරණ වැඩසටහන්, වැඩි කිරීමේ බාධාවන්, සංචාර සීමාකිරීම්, කාරක ප්‍රාග්ධන කළමනාකරණය, ප්‍රාග්ධන වියදම, මුදල් සංචිත සහ භාවිතා නොකළ පහසුකම් ඇතුළුව ලබාගතහැකි මූලාශ්‍ර වැනි පුළුල් සාධක රාශියක් සලකා බලමින් සිය ව්‍යාපාරයේ ඔරොත්තුදීම සහ පවත්නා ගෝලීය ආර්ථික තත්ත්වයන් යටතේ ව්‍යාපාර ගෙන යාම සමාගම තක්සේරු ඇත.

එම නිසා අඛණ්ඩ පැවැත්ම පදනම මත මූල්‍ය ප්‍රකාශ තවදුරටත් පිළියෙළ කරනු ඇත.

අතිරේක තොරතුරු මූල්‍ය ප්‍රකාශයන්හි සටහන 49 හි අනාවරණය කර ඇත.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශයේ ඉදිරිපත් කරන සියළුම කාලසීමා සඳහා පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සමූහය හා සමාගම විසින් නිත්‍ය වශයෙන් යොදා ගෙන ඇත.

3.1 ඒකාබද්ධකරණ පදනම

3.1.1 ව්‍යාපාර සංයෝජනය

පාලනය සමූහයට පවරා දෙන විට අත්පත්කර ගැනීමේ ක්‍රමය භාවිතා කරමින් ව්‍යාපාර සංයෝජනය සඳහා සමූහය සලකා බලයි. හඳුනාගත හැකි ශුද්ධ වත්කම් අත්කරගන්නා පරිදි අත්පත් කර ගැනීම්වල ප්‍රතිලාභ මාරුකිරීම සාමාන්‍යයෙන් සාධාරණ අගයට මනිනු ලැබේ. ලැබෙන කිසියම් කිර්තිනාමයක් වේ නම් හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ. කේවල්කර මිලදී ගැනීම මත ලැබෙන යම් ප්‍රතිලාභයක් ලාභ හෝ පාඩු වලදී එකෙනෙහිම හඳුනාගනු ලැබේ. ණය සහ සාමාන්‍ය කොටස් සුරකුම්වල ගැටළුවලට අදාළ වන්නේ නම් හැර වියදම් කරනු ලබන හුවමාරු පිරිවැය අලාභයක් දැරීමක් ලෙස සලකනු ලබයි.

පෙර පැවති සම්බන්ධතා පියවීමට අදාළ ප්‍රමාණ මාරුකළ ප්‍රතිඵ්ඨාවට ඇතුළත් නොවේ. එම ප්‍රමාණ සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභය තුළ හඳුනාගනු ලබයි.

3.1.2. පාලනය නොවන අයිතිය

පාලනය නොවන අයිතිය අත්පත්කර ගන්නා දිනට අත්පත්කර ගන්නාගේ හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සමානුපාතික කොටස්වලට මනිනු ලබයි.

පාලනයක් නොමැතිවීමේ ප්‍රතිඵලයක් නොවන, පරිපාලිත සමාගමක් තුළ මව් සමාගමේ අයිතියේ වෙනස්වීම් ස්කන්ධ ගනුදෙනු ලෙස සලකනු ලැබේ.

3.1.3 පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගම් යනු මව් සමාගම මඟින් පාලනය කරනු ලබන ආයතන වෙති. මව් සමාගමට යම් ආයතනයක කටයුතුවලින් ප්‍රතිලාභ ලබා ගැනීමට එහි මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කිරීමේ බලය දරන අවස්ථාවේ පාලනය පවතී.

පාලනය තක්සේරු කිරීමේදී, වර්තමානයේ ක්‍රියාත්මක කළ හැකි විභව ඡන්ද අයිතීන් සැලකිල්ලට ගනු ලැබේ. පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ, සමූහය විසින් ඒවා පාලනය කිරීම ආරම්භ කළ දිනයේ සිට අවසන් කරන දින දක්වා වන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කරනු ලැබේ.

පරිපාලිත සමාගම්වල ආයෝජනයන් සමාගමේ මූල්‍ය ප්‍රකාශයන් හි හානිකිරීම් අඩුකළ පිරිවැයට ඉදිරියට ගෙන යයි.

3.1.4 පාලනය අහිමිවීම

පරිපාලිත සමාගමක පාලනය සමූහය/සමාගමට අහිමි වූ විට එම පරිපාලිත සමාගමේ වත්කම් සහ වගකීම් සහ කිසියම් අදාළ පාලනය නොවන අයිතිය සහ වෙනත් ස්කන්ධයේ සංරචක හඳුනා නොගනී. ඇතිවන ලාභය හෝ අලාභය තුළ හඳුනාගනී. පෙර පරිපාලිත සමාගම තුළ රඳවා ගන්නා ලද යම් අයිතිය පාලනය අහිමි වූ විට සාධාරණ අගයට මනිනු ලැබේ.

3.1.5 ස්කන්ධය තුළ අයිතිය – ගිණුම්ගත ආයෝජකයින්

ආශ්‍රිත සමාගමක් යනු පරිපාලිත සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් නොවන නමුත් සමාගමට එය වෙත සැළකිය යුතු බලපෑමක් ඇති කල හැකි ආයතනයකි.

සමූහය/සමාගම විසින් අයෝජිතයාගේ සමාගමේ ඡන්දය දීමේ බලයෙන් 20% හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරනු ලබන අවස්ථාවේදී සැලකිය යුතු බලපෑමක් සිදු කල හැකි යැයි උපකල්පනය කරන අතර එසේ නොවන්නේ නම් මෙය අදාලත්වය නොවන බව පැහැදිලිව දක්වනු ලැබේ.

ආශ්‍රිත සමාගමේ අයිතිය ස්කන්ධ ක්‍රමය භාවිතයෙන් ගණනය කරනු ලැබේ. ඒවා මූලිකව පිරිවැයට හඳුනාගනු ලබන අතර එයට ගණුදෙනු පිරිවැය ඇතුලත් වේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් හි ලාභය හෝ අලාභයේ සමූහයේ කොටස සහ අයෝජකයන් වෙත ගණනය කරන ලද ස්කන්ධයේ අනෙකුත් විස්තරාත්මක ආදායම සැලකිය යුතු බලපෑමක් හෝ සමූහ පාලනය අවසන් වන දිනය තෙක් ඇතුලත් වේ.

ආශ්‍රිත සමාගම තුළ අයෝජනයන් සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් හි හානිකරණය අඩු කළ පිරිවැයට ගෙනයනු ලැබේ.

3.1.6. ඒකාබද්ධවීම මත අතහරින ගනුදෙනු

අන්තර් සමූහ ගනුදෙනුවලින් ඇතිවන අන්තර් සමූහ ශේෂ හා ගනුදෙනු සහ කිසියම් උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් ඉවත් කරනු ලැබේ. ස්කන්ධ ගිණුම්ගත ආයෝජිතයින් සමඟ කරන ගනුදෙනුවලින් ඇතිවන උපලබ්ධි නොවූ ලැබීම්, ආයෝජකයා කෙරෙහි සමූහයේ බැඳියාවේ ප්‍රමාණයට කරනු ලබන ආයෝජනයට අනුව ඉවත් කරනු ලැබේ. උපලබ්ධි නොවූ අලාභ උපලබ්ධි නොවූ ලැබීම් ආකාරයෙන්ම ඉවත් කරනු ලබන නමුත් හානිකරණය පිළිබඳ සාක්ෂි හමු නොවන තාක් එසේ කරනු ලැබේ.

3.2 විදේශ මුදල් ගනුදෙනු

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු එම ගනුදෙනුවේ දිනවල පවතින විනිමය අනුපාත අනුව සමාගම/සමූහය යොදාගන්නා ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදල්වලට නම්කළ මූල්‍ය වත්කම් හා වගකීම්, වාර්තාකරණ දිනයට පවතින විනිමය අනුපාතයට අනුව ක්‍රියාකාරී මුදල්වලට පරිවර්තනය කරනු ලැබේ

විදේශ ව්‍යවහාර මුදල්වල සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය නොවන වත්කම් හා වගකීම්, සාධාරණ අගය තීරණය කරන විට පැවති විනිමය අනුපාතයට අනුව ක්‍රියාකාරී මුදල්වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදල්වල ඓතිහාසික පිරිවැය මත පදනම්ව මනිනු ලබන මූල්‍ය නොවන අයිතම ගනුදෙනුවේ දිනයට ඇති විනිමය අනුපාතයට අනුව පරිවර්තනය කරනු ලබයි.

විදේශ ව්‍යවහාර මුදල්වල වෙනස්වීම් සාමාන්‍යයෙන් ලාභය සහ අලාභය තුළ හඳුනාගනු ලැබේ.

3.3 රක්ෂණ ගිවිසුම්

නිෂ්පාදන වර්ගීකරණය

මාරුකරන රක්ෂණ අවදානමේ ප්‍රමාණය මත පදනම්ව රක්ෂණකරුවන් විසින් ලියනු ලබන ගිවිසුම් හෝ "රක්ෂණ ගිවිසුම්"හෝ "ආයෝජන ගිවිසුම්" ලෙස වර්ගීකරණය කිරීම ශ්‍රී ලං.මු.නි.ප්‍ර. 4 (SLFRS 4) අනුව අවශ්‍යය.

රක්ෂණ ගිවිසුම යනු, ඔප්පු හිමිකරුවන් නිශ්චිතව සඳහන් කරන ලද අනාගත අවිනිශ්චිත අවස්ථාවලදී (රක්ෂිත සිදුවීමකදී) ඔවුන්ට එල්ලවන අහිතකර බලපෑමක් සඳහා වන්දි ලබාදීමට එකඟ වී සමාගම (රක්ෂකයා) විසින් තවත් පාර්ශවයකින් (ඔප්පුහිමියන්) ඉදිරිපත්වන සුවිශේෂී රක්ෂණ අවදානමක් පිළිගැනීමයි. සාමාන්‍ය මාර්ගෝපදේශයක් ලෙස රක්ෂිත සිදුවීම් සිදුනොවුනහොත් ගෙවන ලද ප්‍රතිලාභය ගෙවිය යුතු ප්‍රතිලාභය සමඟ සංසන්දනය කර එම සිදුවීමෙන් සුවිශේෂී රක්ෂණ අවදානමක් තිබේද යන්න තීරණය කරනු ලැබීම දැක්විය හැකිය. රක්ෂණ ගිවිසුම් මූල්‍ය අවදානමට මාරු කිරීමටද හැකිය.

ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් ලෙස වර්ගීකරණය කළ පසු, සියලුම අයිතිවාසිකම් හා බැඳීම් ශූන්‍ය වී හෝ ඉකුත්වී නැත්නම් එම කාලසීමාව තුළ රක්ෂණ අවදානම සුවිශේෂී ලෙස අඩු වී තිබුණද එය රක්ෂණ ගිවිසුමක් ලෙස ගිවිසුම් ගත කාලය අවසන් වන තුරු පවතියි. එහෙත් ආයෝජන ගිවිසුම් ආරම්භ කිරීමෙන් පසු රක්ෂණ අවදානම සැලකිය යුතු මට්ටමකට පත්වන්නේ නම් එම ගිවිසුම් ද රක්ෂණ ගිවිසුම් ලෙස වර්ගීකරණය කළ හැකිය.

සමාගම විසින් අලෙවිකර ඇති සියලුම නිෂ්පාදන රක්ෂණ ගිවිසුම් වන අතර එහෙයින් ඒවා ශ්‍රී ලං.මු.නි.ප්‍ර. 4 (SLFRS 4), යටතේ රක්ෂණ ගිවිසුම් ලෙස වර්ගීකරණය කරනු ලබයි. එසේම වාර්තා කරන දිනයට සමාගමේ නිෂ්පාදන කළඹ තුළ සමාගමට කිසිදු ආයෝජන ගිවිසුමක් නොමැත.

3.3.1 රක්ෂණ ගිවිසුම් වගකීම්වලින් කොටස්හිමියන්ට මාරුකරන අතිරික්ත ලාභය

එක් එක් වාර්තාකරණ කාල සීමාවෙහිදී කොටස්කරුවන් වෙත පැවරිය හැකි සංචිත භාවිත කරමින් කොටස්කරුවන්ගේ වටිනාකම සමාගම විසින් තක්සේරු කරනු ලැබේ. සංචිතවල ආරම්භක හා අවසන් කිරීමේ ශේෂයන් අතර වෙනස කොටස්කරුවන් වෙත පැවරිය හැකි අතිරික්ත ලාභය ලෙස සළකනු ලබන අතර එය වාර්තාකරණ දිනයට රක්ෂණ ගිවිසුම් වගකීමෙන් අඩු කරනු ලැබේ.

කොටස්හිමියන් වෙත පැවරිය හැකි අතිරික්ත ලාභය පහත දැක්වෙන පරිදි ආකාර දෙකකින් සමන්විත වේ.

- ඔප්පුහිමියන්ගේ අරමුදලෙන් කොටස්කරුවන් වෙත පැවරිය හැකි අතිරික්ත ලාභය
- කොටස්කරුවන්ගේ වත්කම්වලින් ඉපැයූ ලාභය

ඔප්පුහිමියන්ගේ අරමුදලින් කොටස්හිමියන්ට පැවරිය හැකි අතිරික්ත ලාභය

ස්වාධීන උපදේශක ආයුගණකවරයකුගේ නිර්දේශය මත ආයුගණක ඇගයීමකින් අතිරික්තය ලබා ගනු ලැබේ.

කොටස්හිමියන්ගේ වත්කම්වලින් ඉපයූ ලාභය

අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත, අභ්‍යන්තර ආයුගණක දෙපාර්තමේන්තුවේ නිරීක්ෂය මත කොටස්හිමියන්ගේ වත්කම්වලින් ඉපයූ ලාභ පදනම් වේ

3.4 ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තරාත්මක ආදායම

3.4.1 ආදායම හඳුනා ගැනීම

3.4.1.1 දළ ලිඛිත වාරිකය (GWP)

(අ) ජීවිත රක්ෂණ දළ ලිඛිත වාරිකය

ජීවිත රක්ෂණ ගිවිසුම් මත දළ පුනරාවර්ත රක්ෂණ වාරික ඔප්පු හිමියන් විසින් ගෙවනු ලබන විට ආදායමක් ලෙස හඳුනා ගනී. (දින 30 ක සහන කාලය ඇතුළත ඔප්පු අයවීමක් ලෙස සලකනු ලැබේ). නියමිත දිනට කලින් ලැබෙන රක්ෂණ වාරික ආදායමක් ලෙස වාර්තා නොකරන අතර එවැනි රක්ෂණ වාරික ආදායමක් ලෙස පිළිගැනීමට අදාළ ප්‍රතිපත්තිමය කොන්දේසිවලට අනුව අවශ්‍ය නොවන්නේ නම් එම රක්ෂණ වාරික අයවීමක් ලෙස තිබෙන තුරු වගකීමක් ලෙස සටහන් කරනු ලබයි. එම ඔප්පුවල තක්සේරු කළ ජීව කාලය මත ලාභ හඳුනාගැනීම සඳහා එකී ආදායම්වලට අනුව ප්‍රතිලාභ හා වියදම් හඳුනාගනු ලබයි.

තනි රක්ෂණ වාරික ව්‍යාපාර සඳහා, ඔප්පුව ක්‍රියාත්මක වන දින සිට ආදායම හඳුනා ගනී.

(ආ) ජීවිත නොවන රක්ෂණ දළ ලිඛිත වාරිකය

ජීවිත නොවන රක්ෂණවල දළ ලිඛිත වාරිකය ගිණුම්කරණ කාල සීමාවේදී අත්සන් කළ ගිවිසුම්වලින් ලබා දෙන රක්ෂණාවරණයේ සම්පූර්ණ කාල සීමාව සඳහා ලැබිය යුතු මුළු රක්ෂණ වාරිකවලින් සමන්විත වේ. ඒවා ඔප්පුව ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට හඳුනා ගනී. ගිවිසුම් ආරම්භ කිරීම මත, රක්ෂණ වාරික ලිඛිත ලෙස වාර්තා කරනු ලබන අතර අදාළ ඔප්පු ආවරණයේ කාලසීමාව පුරා සමානුපාතික පදනම මත මූලිකව උපයා ගනී.

හිමිකම් නොපෑමේ ප්‍රතිදාන වැනි රක්ෂණ වාරික අනුපාත වල කොටස් වන ප්‍රතිදාන, දළ ලිඛිත වාරික වලින් අඩුකරනු ලැබේ.

නොඉපයූ වාරික සංචිතය (UPR)

නොඉපයූ වාරික යනු වාර්තාකරණ දිනයට පසු අවදානම් කාල සීමාවට අදාළ වර්ෂයකදී ලියනලද රක්ෂණ වාරිකවලට සමානුපාතික රක්ෂණ වාරිකයයි. නොඉපයූ වාරික වසර තුළ ලියන ලද වාරිකයේ කොටස නියෝජනය කරන නමුත් ආවරණයේ කල් නොපිරුණු කාලයට අදාළ වේ.

2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන පනතට අනුව නොඉපයූ වාරික දින 365 පදනම මත ගණනය කෙරේ. කෙසේවෙතත්, ගිවිසුම්ගත කාලයෙන් අවදානම් කාලසීමාව සැලකියයුතු ලෙස වෙනස්වන ගිවිසුම් සඳහා, ලබාදෙන ලද රක්ෂණ ආරක්ෂාවේ ප්‍රමාණයට සමානුපාතිකව අවදානම් කාලසීමාව පුරා වාරිකය උපයා ගනී.

3.4.1.2 ප්‍රතිරක්ෂණ වාරිකය

රක්ෂණ ගිවිසුමක් මත දළ ප්‍රතිරක්ෂණ වාරික, රක්ෂණ වාරික ගෙවනු ලැබිය යුතු දිනයට හෝ රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මක වන දිනයට හෝ පෙර වියදමක් ලෙස හඳුනා ගනී. ප්‍රතිරක්ෂණ වාරික, ප්‍රතිරක්ෂකයින් සමඟ එකඟවූ අනුපාත මත පදනම් වී තීරණය කරනු ලැබේ.

(අ) ජීවිත නොවන රක්ෂණ ප්‍රතිරක්ෂණ වාරිකය

ලියන ලද ප්‍රතිරක්ෂණ වාරික, කාල සීමාව සඳහා අත්සන් කළ ගිවිසුම මඟින් ලබා දෙන සම්පූර්ණ ආවරණය සඳහා ගෙවිය යුතු මුළු රක්ෂණ වාරිකවලින් සමන්විත වන අතර රක්ෂණ ඔප්පුව ආරම්භවන දිනයේදී හඳුනා ගනී.

නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික සංචිතය

නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික යනු, වාර්තාකරණ දිනයට පසු අවදානම් කාලසීමාවට අදාළ වර්ෂයක ලියන ලද රක්ෂණ වාරිකවලට සමානුපාතික රක්ෂණ වාරිකයි. නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික, 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනත අනුව දින 365 පදනම භාවිතා කරමින් අවදානම් බැඳුණු ගිවිසුම් සඳහා පාදක සෘජු රක්ෂණ ඔප්පුවවල කාලය පුරා විලම්භනය කෙරේ. එසේවුවද, අවදානම් කාලසීමාව ගිවිසුම්ගත කාලසීමාවෙන් සැලකිය යුතු තරම් වෙනස්වන ගිවිසුම සඳහා, ලබා දෙන රක්ෂණ ආරක්ෂණයේ ප්‍රචාරණයට සමානුපාතිකව අවදානම් කාලසීමාව පුරා රක්ෂණ වාරික උපයා ගනු ලැබේ.

(අ) ජීවිත රක්ෂණ ප්‍රතිරක්ෂණ වාරිකය

ජීවිත රක්ෂණයේ ප්‍රතිරක්ෂණ වාරික, රක්ෂණ වාරික ගෙවිය යුතු දිනයට හෝ රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මක වන දිනයට හෝ පෙර වියදමක් ලෙස හඳුනා ගනී.

3.4.1.3 ගාස්තු සහ කොමිස් ආදායම

(අ) ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම

බැහැර ප්‍රතිරක්ෂණ ගිවිසුම් මත ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම ලැබෙන අවස්ථාවේ ආදායමක් සේ හඳුනා ගනී. මූලික හඳුනා ගැනීමෙන් පසු, බැහැර ප්‍රතිරක්ෂණ ගිවිසුම් මත ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම අපේක්ෂිත ගෙවිය යුතු රක්ෂණ වාරික කාලය පුරා සරල මාර්ගික පදනමක් මත විලම්භනය කර ක්‍රමක්ෂය කරනු ලැබේ.

(ආ) අනෙකුත් ගාස්තු ආදායම

රක්ෂණ ගිවිසුම් ඔප්පු හිමියන්ගෙන් ඔප්පු පරිපාලන සේවා සඳහා සහ අනෙකුත් ගිවිසුම් ගාස්තු සඳහා අයකරනු ලබයි. මෙම ගාස්තු ලැබීම් මත හෝ හිඟ බවට පත්වන විට ආදායම් ලෙස සලකනු ලබයි.

3.4.1.4. ආයෝජන ආදායම්

ආයෝජන ආදායම ආයෝජනය කළ අරමුදල් වලින් ලැබෙන පොලී ආදායම්, ලාභාංශ ආදායම්, ප්‍රාග්ධන ලැබීම් හෝ අහිමිවීම් සහ විදේශ මුදල් ලැබීම් හෝ අහිමිවීම්වලින් සමන්විත වේ.

(අ) පොලී ආදායම්

සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ලාභය සහ අලාභය තුළ පොලී ආදායම් හඳුනා ගනු ලැබේ. සඵල පොලී අනුපාතය යනු, මූල්‍ය වත්කම්වල ධාරණ අගයට මූල්‍ය වත්කමේ (යෝග්‍ය අවස්ථාවලදී කෙටි කාල සීමාවක්) අපේක්ෂිත ජීව කාල මඟින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ලැබීම් හා ගෙවීම් සත්‍ය වශයෙන්ම වට්ටම් කරන අනුපාතයයි. සඵල පොලී අනුපාතය ගණනය කිරීමේදී, සමූහය/සමාගම මූල්‍ය සාධන පත්‍රවල, සියලුම ගිවිසුම්ගත නියමයන් සැලකිල්ලට ගනිමින් අනාගත ණය අලාභ නොවන, නමුත් අනාගත ණය මූල්‍ය ප්‍රවාහ ඇස්තමේන්තු කරයි.

සඵල පොලී අනුපාත ගණනය කිරීමට සඵල පොලී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන සියලුම ගනුදෙනු පිරිවැය සහ ගාස්තු සහ ගෙවූ සහ ලැබුණු සමායන ඇතුළත් වේ. ගනුදෙනු පිරිවැයට, මූල්‍ය වත්කමක් අත්කර ගැනීමේ දී හෝ නිකුත් කිරීමේදී සෘජුවම ආරෝපනය වන වර්ධනීය පිරිවැය ඇතුළත් වේ.

(ආ) ලාභාංශ ආදායම

ආදායම් ලැබීමේ හිමිකම ස්ථාපිත කරනු ලබන විට ලාභාංශ ආදායම හඳුනාගනු ලබයි.

3.4.1.4 ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ආදායම

අදාල භාණ්ඩ හෝ සේවා හුවමාරු කිරීමට නියමිත යැයි සමූහය අපේක්ෂා කරනු ලබන ප්‍රතිලාභය දක්වන මුදලකට භාණ්ඩ හා සේවා පාලනය පාරිභෝගිකයා වෙත මාරු කරන අවස්ථාවේදී පාරිභෝගිකයා සමග පවතින ගිවිසුම්වලින් ලැබෙන ආදායම හඳුනා ගනී.

3.4.1.5 රෝහල් ආදායම්

සේවය පිළිබඳ පූර්ණ තෘප්තිමත්භාවයේ ප්‍රගතිය මැනීම සඳහා යෙදවුම් ක්‍රමයක් භාවිත කරමින් රෝහල් සේවා මඟින් ලැබෙන ආදායම කාලය පුරාවට සමූහය විසින් හඳුනාගනු ලැබේ. මක්නිසාදයත් සමූහය විසින් සපයන ප්‍රතිලාභයන් පාරිභෝගිකයා විසින් ලබා ගනිමින් පරිභෝජනය කරන බැවිනි.

ආදායමේ කොටසක් නොසාදන සමූහය අභ්‍යන්තර සහ බාහිර උපදේශන වෙනුවෙන් එකතුකළ උපදේශන ගාස්තු ආදායමෙන් ඉවත් කරනු ලැබේ.

3.4.1.6 භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායමද

වත්කම් පාලනය පාරිභෝගිකයාට පැවරෙන මොහොතේදී සාමාන්‍යයෙන් උපකරණ බෙදා හැරීමේදී භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගැනේ. ගනුදෙනු මිලෙන් කොටසක් වෙන් කළ යුතු වෙනම කාර්යසාධන බැඳීම් වන කොන්ත්‍රාත්තුවේ වෙනත් පොරොන්දු තිබේද යන්න සමූහය සලකා බලයි. භාණ්ඩ විකිණීම සඳහා ගනුදෙනු මිල තීරණය කිරීමේදී, සමූහය විචල්‍ය ප්‍රතිඵලයේ බලපෑම සහ සැලකිය යුතු මූල්‍ය සංරචකවල පැවැත්ම තක්සේරු කරයි.

(i) **විචල්‍ය ප්‍රතිඵලය**

ගිවිසුමක ප්‍රතිඵලය තුළ විචල්‍ය ප්‍රමාණයක් ඇතුළත් වන්නේ නම්, භාණ්ඩය පාරිභෝගිකයා වෙත මාරු කිරීම සඳහා හුවමාරුව තුළ සමූහය විසින් සලකා බැලිය යුතු ප්‍රමාණය ඇස්තමේන්තු කරයි. විචල්‍ය ප්‍රතිඵලය ගිවිසුම ආරම්භයේ දී තක්සේරු කරන අතර විචල්‍ය සලකා බැලීම් සමඟ සම්බන්ධිත අවිනිශ්චිතතාව පසුව විසඳන විට හඳුනාගත් සමුච්චිත ආදායම් ප්‍රමාණයෙන් සැලකිය යුතු ආදායම් ආපසු හැරවීමක් සිදු නොවන බවට වැඩි සම්භාවිතාවක් ඇති වන තෙක් එය සීමා කර ඇත. භාණ්ඩ විකිණීම සඳහා වන සමහර ගිවිසුම් මඟින් ගනුදෙනුකරුවන්ට ආපසු ලබා ගැනීමේ අයිතිය ලබාදේ. ආපසු ලබා ගැනීමේ අයිතිවාසිකම් විචල්‍ය ප්‍රතිඵලයට හේතු වේ.

(ii) **ආපසු ලබා ගැනීමේ අයිතිවාසිකම**

සමහර ගිවිසුමක් මඟින් නිශ්චිත කාල සීමාවක් තුළ භාණ්ඩ ආපසු ලබා ගැනීමේ අයිතිය පාරිභෝගිකයාට ලබා දේ. ආපසු ලබා නොදෙන භාණ්ඩ තක්සේරු කිරීම සඳහා සමූහය අපේක්ෂිත වටිනාකම් ක්‍රමය භාවිතා කරයි, එයට හේතුව මෙම ක්‍රමය මඟින් කණ්ඩායමට හිමිවිය යුතු විචල්‍ය සලකා බැලීමේ ප්‍රමාණය මැනවින් පුරෝකථනය කිරීමයි. ගනුදෙනු මිලට ඇතුළත් කළ හැකි විචල්‍ය ප්‍රතිඵලයේ ප්‍රමාණය තීරණය කිරීම සඳහා විචල්‍ය ප්‍රතිඵලයේ සංවරක ඇස්තමේන්තු පිළිබඳ SLFRS 15 හි අවශ්‍යතා ද අදාළ කර ගනී. ආදායම වෙනුවට ආපසු ලබා දීමට අපේක්ෂා කරන භාණ්ඩ සඳහා, සමූහය මුදල් ආපසු ගෙවීමේ වගකීමක් හඳුනා ගනී.

(iii) **සැලකියයුතු මූල්‍ය සංරචකය**

සාමාන්‍යයෙන් සමූහයට තම ගනුදෙනුකරුවන්ගෙන් කෙටි කාලීන අත්තිකාරම් ලැබේ. SLFRS 15 හි ප්‍රායෝගික උපයෝගීතාව භාවිතා කරමින්, ගිවිසුම ආරම්භයේ දී, පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවාව පාරිභෝගිකයාට පැවරීම අතර කාල සීමාව සහ සැලකිය යුතු මූල්‍යකරණ සංරචකයක බලපෑම සඳහා සමූහය පොරොන්දු වූ සලකා බැලීමේ ප්‍රමාණය සකස් නොකරයි. පාරිභෝගිකයා එම භාණ්ඩ හෝ සේවාව සඳහා ගෙවන විට වසරක් හෝ ඊට අඩු වනු ඇත.

3.4.1.7. ආයෝජන දේපලවලින් ලැබෙන කුලී ආදායම

ආයෝජන දේපළවලින් ලැබෙන කුලී ආදායම, බදු කාලය පුරා සරල මාර්ගික පදනම මත ආදායමක් ලෙස හඳුනා ගනී. ලබා දෙන කල්බදු දිරිදීමනා බදු කාලය පුරා මුළු කුලී ආදායමේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස හඳුනා ගනී.

3.4.1.8. දේපල, පිරියන හා උපකරණ බැහැර කිරීම මත ලාභය/අලාභය

දේපළ, පිරියත සහ උපකරණ බැහැරලීම මත ලාභ/අලාභ අලෙවි සිදුවන කාල සීමාවේදී හඳුනා ගන්නා අතර ආදායම් යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

3.4.2 ප්‍රතිලාභ, හිමිකම් සහ වියදම්

3.4.2.1 දළ ප්‍රතිලාභ, සහ හිමිකම්

(අ) ජීවිත රක්ෂණ ව්‍යාපාරය

මරණ හා කල්පිරීම මඟින් ලැබෙන හිමිකම් මරණය හෝ කාල පරිච්ඡේදය ඉකුත්වීමේ දත්වීම මත ආදායම අනුව අයකරනු ලැබේ. අන්තර් ගෙවීම් හා පවාරණ පියවීම් කරන අවස්ථාව සඳහා පමණක් ගණනය කරනු ලැබේ. ජීවිත රක්ෂණය සඳහා වන වියදම්, අත්පත් කර ගැනීමේ වියදම් සහ ජීවිත රක්ෂණ ව්‍යාපාරය නඩත්තු කිරීම සඳහා වන වියදම්, ආයෝජන ආශ්‍රිත වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කෙරෙන ආයෝජන ප්‍රාග්ධන පිරිවැයේ කොටසක් ලෙස නොසලකයි.

ජීවිත රක්ෂණය සඳහා වන වියදම්, අත්පත් කර ගැනීමේ වියදම් සහ ජීවිත රක්ෂණ ව්‍යාපාරය නඩත්තු කිරීම සඳහා වන වියදම්, ආයෝජන ආශ්‍රිත වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කෙරෙන ආයෝජන ප්‍රාග්ධන පිරිවැයේ කොටසක් ලෙස නොසලකයි.

(ආ) ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරය

ජීවිත නොවන රක්ෂණ හිමිකම්වලට හිමිකම් සැකසීම හා පියවීමට සෘජුවම අදාළවන හිමිකම් මෙහෙයුම් පිරිවැය සමඟ වාර්තා කළ හෝ නොකළ වසර තුළ ඇතිවන හිමිකම්, සුන්බුන් අගය හා අනෙකුත් අයකිරීම්වල අඩුකිරීම් සඳහා අඩු කිරීමක් සහ පසුගිය වසරේ නොපියවූ හිමිකම්වල කිසියම් හෝ වෙනස්වීමත් ඇතුළත් වෙයි. නොපියවූ හිමිකම්, පුද්ගල හිමිකම් ගොනු සමාලෝචනය මඟින් සහ පියවමින් තිබෙන හිමිකම්වල අත්‍යන්ත පිරිවැය වෙනස් වීම් තක්සේරු කරගනිමින් තක්සේරු කරනු ලැබේ.

වැය කරන ලද නමුත් වාර්තා නොකළ හිමිකම් (IBNR) සහ වැය කරන ලද නමුත් ප්‍රමාණවත් තරම් වාර්තා නොකළ හිමිකම් (IBNFR) අදාළ ප්‍රතිපාදන, අතීත අත්දැකීම් සහ ප්‍රවනතා මත පදනම්ව අනාගත වගකීම් වඩාත් යථාර්තවාදී ලෙස ඇස්තමේන්තු කිරීම තහවුරු කිරීම සඳහා ආයුගණකව අගයනු ලැබේ. ආයුගණක ඇගයීම් කාර්තුමය පදනම මත සිදුකරනු ලබයි.

හිමිකම් සඳහා ප්‍රතිපාදන වර්තමානයේ පවතින තොරතුරු මත පදනම් වී සාධාරණව දැක්විය යුතු බවට අධ්‍යක්ෂකවරුන් සලකනු ලබන අතර අනතුරුව ලැබෙන තොරතුරු හා සිදුවන සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස අවසාන වගකීම් වෙනස්වනු ඇත. මෙය ලබා දෙන පරිමාණයන් හි ගැලපීම්වලට හේතු වනු ඇත. එම ප්‍රමාණයන් එකී කාලසීමාව සඳහා වන මූල්‍ය ප්‍රකාශවල දක්වනු ලබයි.

හිමිකම් ඇස්තමේන්තු කිරීමට භාවිතා කළ ක්‍රමය සහ සකස් කළ ඇස්තමේන්තු නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.

3.4.2.2. ප්‍රතිරක්ෂණ හිමිකම්

අදාළ ගිවිසුම්වල නියමයන්ට අනුව අදාළ දළ රක්ෂණ හිමිකම් හඳුනාගන්නා අවස්ථාවේදී ප්‍රතිරක්ෂණ හිමිකම් හඳුනාගනු ලැබේ.

3.4.2.3. ශුද්ධ විලම්භිත අත්කර ගැනීමේ වියදම්

අත්පත් කර ගැනීමේ වියදම් ව්‍යාපාරයේ නිෂ්පාදනය සමඟ වෙනස්වන අතර ව්‍යාපාරයේ නිෂ්පාදනවලට සෘජුවම අදාළ වෙයි.

ජීවිත නොවන රක්ෂණ ගිවිසුම්වල අදාළ අත්පත් කරගැනීමේ වියදම් අදාළ ලිඛිත වාරික උපයා ගනු ලබන කාලය තුළදී විලම්භිත කිරීම සහ ක්‍රමක්ෂය කිරීම සිදුකරනු ලබයි. ප්‍රතිරක්ෂණ කොමිස්ද විලම්භිත අත්පත්කර ගැනීමේ පිරිවැය තුළ ඒ ආකාරයෙන්ම හඳුනා ගනු ලැබේ.

3.4.2.4 ජීවිත රක්ෂණ අරමුදලේ ආයුගණක ඇගයීම

ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ සිය වාර්ෂික පරීක්ෂණය අධ්‍යයනය කරමින් ස්වාධීන විශේෂඥ ආයුගණකගේ නිර්දේශය මත වසර අවසානයේදී සමාගම සඳහා දිගු කාලීන රක්ෂණ ප්‍රතිපාදන ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ වී ඇත. ආයුගණක ඇගැයීම සියලුම වගකීම් සැලකිල්ලට ගනු ලැබ ඇති අතර වියදම් ස්වාධීන විශේෂඥ ආයුගණක විසින් නිර්දේශ කරන ලද උපකල්පන මත පදනම් වී ඇත.

3.4.2.5. අනෙකුත් වියදම්

අනෙකුත් වියදම් උපචිත පදනම මත හඳුනා ගනී. ව්‍යාපාරය පවත්වාගෙන යාමට සහ දේපළ, පිරියත හා උපකරණ නඩත්තු කිරීමට වැය කරනු ලබන සියලුම වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශයට අයකරනු ලබයි.

3.4.3 සේවක ප්‍රතිලාභ

(අ) කෙටිකාලීන ප්‍රතිලාභ

අදාළ සේවාව සැපයීම සඳහා කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වැය කරනු ලබයි. සේවකයා විසින් පූර්ව සේවා ලබාදීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රමාණය ගෙවීමට සමූහයට නීතිමය හෝ ගිවිසුම්ගත බැඳීමක් ඇත්නම්, සහ එම බැඳීම් සත්‍ය ලෙසයෙන්ම ඇස්තමේන්තු කළ හැකිනම්, කෙටි කාලීන මුදල් පාරිතෝෂික හෝ ලාභ බෙදා ගැනීමේ සැලැස්මක් යටතේ ගෙවීමට අපේක්ෂා කරනු ලබන ප්‍රමාණයට වගකීමක් හඳුනාගනු ලබයි.

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම පූර්ව සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුමක් වන අතර මේ යටතේ යම් ආයතනයක් වෙනත් ආයතනයකට ස්ථාවර දායකත්ව ගෙවන අතර ඊට වැඩිපුර ප්‍රමාණයක් ගෙවීම සඳහා නීතිමය හෝ ගිවිසුම්ගත බැඳීමක් නොමැත. නිශ්චිත දායකත්ව සැලසුම්වලට දායකත්ව ලබාදීම සඳහා වන බැඳීම්, සේවකයන් විසින් සේවා සපයන කාලසීමාවේ දී ලාභ හෝ අලාභ ප්‍රකාශයේ සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනා ගනු ලබයි.

සේවක අර්ථසාධක අරමුදල

සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ, සීමාසහිත ලිට්‍රෝ ගෑස් සමාගම සහ සීමාසහිත ලිට්‍රෝ ටර්මිනල් (පුද්ගලික) සමාගමේ සේවකයින් විසින් පිළිවෙළින් 15% සහ 10%ක් බැගින් එක් එක් සේවකයින්ගේ වැටුප මත අනුමත අර්ථසාධක අරමුදලට දායක වේ.

සමූහයේ අනෙකුත් ආයතන සහ සමූහයේ අනෙකුත් ආයතනවල සේවකයින් වෙනුවෙන් සෑම කෙනෙකුගේම වැටුපෙන් 12%ක් සහ 8% බැගින් අනුමත අර්ථසාධක අරමුදලට දායක වේ.

සේවා නියුක්තියන්ගේ භාර අරමුදල

සමූහය/සමාගම විසින් සෑම සේවකයකුගේම වැටුපෙන් 3% ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට දායක වේ.

(ඇ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායකත්ව සැලසුමකට වඩා පූර්ව – සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුමකි.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීම්, වාර්තාකරණ දිනට නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය වේ. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් ගණනය කිරීම සුදුසුකම්ලත් ආයුගණකවරයෙකු විසින් LKAS 19 – "සේවක ප්‍රතිලාභ" නිර්දේශ කර ඇති පරිදි ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය (PUC) භාවිතා කරමින් වාර්තාකරණ දිනට වාර්ෂිකව සිදුකරනු ලබයි. ආයුගණක ඇගයීම වට්ටම් අනුපාතය, වැටුප් වර්ධක අනුපාතය සහ සේවකයින්ගේ ඉතිරි සේවා කාලය පිළිබඳ කරනු ලබන උපකල්පනවලින් සමන්විත වේ. සැලසුම්වල දිගු කාලීන ස්වභාවය හේතුවෙන් එවැනි තක්සේරු සැලකියුතු තරම් අවිනිශ්චිතතාවයකට යටත් වේ.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීම මත පමණක් සේවකයකුට මෙම වගකීම හිමි වෙයි. මෙම වගකීමට බාහිර අරමුදල් නොලැබේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමට අදාළ ශුද්ධ පොලී වියදම සහ අනෙකුත් වියදම් ලාභයේදී හෝ අලාභයේදී හඳුනාගනු ලබයි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක පියවීම් පවතින විට එම පියවීම් සිදු කිරීම මත යම් ලැබීම් හෝ අහිමිවීම් සමූහය විසින් හඳුනාගනු ලබයි.

ආයුගණක ලැබීම් සහ අලාභවලින් සමන්විත ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ ප්‍රතිප්‍රමාණනය වෙනත් විස්තීර්ණ ආදායම තුළ එකෙනෙහිම හඳුනාගනු ලබයි.

3.4.4 ආදායම් බදු වියදම

ආදායම් බදු වියදම් ප්‍රවර්තන සහ විලම්බිත බදුවලින් සමන්විත වේ. ප්‍රවර්තන සහ විලම්හිත බදු සක්ත්ධය තුළ හෝ OCI වලදී සෘජුව හඳුනාගනු ලබන අයිතමවලට අදාළවන ප්‍රමාණයට හැර ලාභය හෝ අලාභය තුළ හඳුනාගනු ලබයි.

3.4.4.1 ප්‍රවර්තන බදු

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පරිදි ආදායම් හා වියදම්වල අංගයන් මත පදනම් වී ඇති අතර 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 67 වන වගන්තිය සහ එයට පසුකාලීනව සිදුකළ සංශෝධන ප්‍රකාරව ගණනය කරනු ලැබේ. මෙම වගන්තියට අනුව, බදු ගෙවිය යුතු ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ වාසි සහ ලාභ පහත ඒවායේ එකතුව වේ.

- පළමු මාස නවය සඳහා 24% සහ අවසාන මාස තුන සඳහා 30% අනුපාතයකින් ආයුගණක විසින් සහතික කර ඇති පරිදි ජීවිත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදලෙන් කොටස් හිමියන්ට බෙදා හරින ලද අතිරික්තය.
- පළමු මාස නවය සඳහා 24% සහ අවසාන මාස තුන සඳහා 30% අනුපාතයකින් එවැනි ආදායමක් නිෂ්පාදනය කිරීමේදී දරන ලද වියදම් අඩු කළ කොටස් හිමියන්ගේ අරමුදලේ ආයෝජන ආදායම.
- පළමු මාස නවය සඳහා 24% සහ අවසාන මාස තුන සඳහා 30% අනුපාතයට ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ යෙදී සිටින පුද්ගලයකුගේ ලාභය බෙදා ගන්නා ජීවිත රක්ෂණ රක්ෂණ ඔප්පු හිමියන්ට බෙදා හැරී අතිරික්තය.
- නමුත් ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාර සඳහා අනෙකුත් සියලුම අංශ අදාළ වන අතර එවැනි ව්‍යාපාරයක ඉපයීම් සහ ලාභය පළමු මාස නවය සඳහා 24%ක් සහ අවසන් මාස තුන සඳහා 30%ක් ලෙස බදු අය කෙරේ.
- ප්‍රවර්තන ආදායම් බද්ද යනු වර්ෂය සඳහා බදු ගෙවිය යුතු ආදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු අපේක්ෂිත බද්ද වන අතර පෙර වසරවලට අදාළව ගෙවිය යුතු හෝ ලැබිය යුතු බදු සඳහා යම් ගැලපීම් වේ. වාර්තා කරන දිනයේ පනවන ලද බදු අනුපාත භාවිතා කරමින් එය මනිනු ලබයි.

අදාළ බදු රෙගුලාසි අර්ථ නිරූපණයට යටත් වන අවස්ථා සම්බන්ධයෙන් බදු වාර්තාවල ගනු ලබන ස්ථාන කළමනාකරණය වරින් වර ඇගයීමට ලක් කරන අතර සුදුසු අවස්ථාවලදී ප්‍රතිපාදන ස්ථාපිත කරයි.

3.4.4.2 විලම්හිත බදු

මූල්‍ය වාර්තාකරණ අරමුණ සහ බදු ක්‍රියාවලිය සඳහා භාවිතාකළ ප්‍රමාණ සඳහා වත්කම් සහ වගකීම්වල ධාරණ අගය අතර තාවකාලික වෙනස්වීම් සම්බන්ධයෙන් විලම්හිත බදු හඳුනාගනු ලබයි.

විලම්හිත බදු වත්කම් සහ වගකීම්, සියලුම තාවකාලික වෙනස්වීම්, ඉදිරියට ගෙනා භාවිතා නොකළ බදු බැර, භාවිතා නොකළ බදු අලාභ සඳහා අනාගත බදු අය කළ හැකි ලාභ ඒවා භාවිතා කිරීමට ලබාගත හැකි ප්‍රමාණයට හඳුනා ගනී.

විලම්හිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනකදීම සමාලෝචනය කරනු ලබන අතර අදාළ බදු ප්‍රතිලාභ තවදුරටත් උපලබ්ධි කිරීම කළ නොහැකි ප්‍රමාණයට අඩුකරනු ලැබේ. එම අඩුකිරීම් අනාගත බදු අය කළ හැකි ලාභ ලැබීමේ සම්භාවිතාව වර්ධනය වන විට ප්‍රතිවර්තනය කරනු ලැබේ.

විලම්හිත බදු, වාර්තාකරණ දිනයට පනවනු ලැබ ඇති සහ නිත්‍ය වශයෙන් පනවනු ලැබ ඇති බදු අනුපාත භාවිතා කරමින් තාවකාලික වෙනස්වීම් ප්‍රතිවර්තනය කරන විට ඒවාට අදාළ කරගැනීමට අනපේක්ෂිත බදු අනුපාතවලට මනිනු ලබයි.

හඳුනා නොගත් විලම්හිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකම නැවත තක්සේරු කරනු ලබන අතර ඒවා භාවිතයට ගත හැකි ප්‍රමාණයට අනුව අනාගත බදු අය කළ හැකි ලාභ ලබාගැනීමට හැකිවන ප්‍රමාණයට හඳුනා ගනු ලබයි.

විලම්හිත බදු වත්කම් සහ විලම්හිත බදු වගකීම්, ප්‍රවර්තන බදු වගකීම්වලට අනුව ප්‍රවර්තන බදු වත්කම් හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක අයිතිවාසිකමක් පවතින සහ විලම්හිත බදු එම බදුකළ හැකි ආයතනයට සහ එකම බදුකරණ අධිකාරියකට අදාළ වන විට හිලව් කරනු ලැබේ.

3.4.4.3 බෝග රක්ෂණ අයබදු (CIL)

2013 අංක 12 දරණ මූල්‍ය පනතේ 14 වන වගන්තියේ විධිවිධාන යටතේ බෝග රක්ෂණ අයබදු හඳුන්වනු ලැබ ඇති අතර 2013 අප්‍රේල් 1 දින සිට ක්‍රියාත්මක වේ. එය ජාතික රක්ෂණ භාර අරමුදලට ගෙවිය යුතු අතර 1%ක බදු පසු ලාභයකට බැඳී සිටියි.

3.5 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

3.5.1 දේපල, පිරියත හා උපකරණ

3.5.1.1 මූලික හඳුනා ගැනීම සහ මැනීම

දේපල, පිරියත හා උපකරණ අයිතම, සමුච්චිත ක්ෂය කිරීම සහ සමුච්චිත හානිකරණය අඩුකළ පිරිවැයට මනිනු ලබයි. දේපල, පිරියත හා උපකරණවල පිරිවැය යනු එම වත්කම ඉන් අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකරවීමේ තත්ත්වයට පත්කිරීම දක්වා දරන ලද යම් වියදම් ද සමඟ එම වත්කම් අත්පත්කර ගැනීමට හෝ ඉදිකිරීමට දරන ලද පිරිවැයයි.

වත්කම අත්පත්කර ගැනීමේ දී සෘජුවම ආරෝපිත වන වියදම පිරිවැයට ඇතුළත්ය. ස්වයං ඉදිකිරීම් වත්කම්වල පිරිවැයට පහත සඳහන් පිරිවැයද ඇතුළත් වේ.

- අමුද්‍රව්‍ය හා සෘජු කම්කරු පිරිවැය
- වත්කම ඉන් අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකරවීමේ තත්ත්වයට පත්කිරීම දක්වා සෘජුවම දරන ලද යම් වෙනත් පිරිවැය
- වත්කම ඉවත් කිරීමට හෝ වැඩ බිම ප්‍රතිස්ථාපනය සඳහා සමූහයට බැඳීමක් ඇති අවස්ථාවක දී එම අයිතම කඩා ඉවත් කිරීමේ සහ ඒවා ස්ථාපනය කර තිබූ භූමිය ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය

බැහැරකිරීම මත කිසියම් ලැබීමක් හෝ අලාභයක් ලාභය හෝ අලාභය තුළ වෙනත් මෙහෙයුම් ආදායමෙහි හඳුනා ගනු ලබයි.

3.5.1.2 පසුකාලීන වියදම සහ ප්‍රතිෂ්ඨාපනය

දේපල, පිරියත හා උපකරණ අයිතමවල යම් කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ලැබීමේ සම්භාවිතාවක් ඇතිනම් සහ එහි පිරිවැය විශ්වාසී ලෙස මැනිය හැකි නම් ධාරණ අගය තුළ හඳුනා ගනියි. ප්‍රතිස්ථාපනය කිරීමේදී, ධාරණ අගය තුළ ඇතුළත් කෙරේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ධාරණ අගය හඳුනාගැනීමෙන් බැහැර කෙරේ. දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධ දෛනික සේවාකරණ පිරිවැය දරන ලද අවස්ථාවේදී ලාභ හෝ අලාභ වල හඳුනාගැනේ.

3.5.1.3 ස්ථිර වත්කම් ප්‍රත්‍යාගණනය

සාධාරණ අගය විශ්වාස ලෙස මැනියහැකි වත්කමක්, ඉඩම් හා ගොඩනැගිලි හඳුනා ගැනීමෙන් පසුව පසුකාලීන යම් සමුච්චිත ක්ෂය කිරීම් සහ පසුකාලීන යම් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ ප්‍රත්‍යාගණන දිනයට ප්‍රත්‍යාගණන වටිනාකමට ගෙන ගොස් ඇත. ප්‍රත්‍යාගණන වත්කමක සාධාරණ අගය වාර්තාකරණ දිනයට එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව තහවුරුකිරීම සඳහා තක්සේරු කිරීම් සිදු කරනු ලබයි.

ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම් වෘත්තීමය වශයෙන් සුදුසුකම් ලත් තක්සේරුකරුවන් විසින් අවම වශයෙන් වසර තුනකදී සිදු කරනු ලබන අතර සාධාරණ අගයේ වෙනස්වීම් හේතුවෙන් ඇති වන්නා වූ ලාභ හෝ අලාභ ඒවා ඇති වන වසරේ අනෙකුත් විස්තරාත්මක ආදායම් තුළ ඇතුලත් කෙරේ.

ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් වශයෙන් ධාරණ අගයේ යම් වැඩිවීමක්, අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගනු ලබන අතර ප්‍රත්‍යාගණන සංචිතයේ ශීර්ෂය යටතේ ස්කන්ධය තුළ සමුච්චිත කෙරේ. කෙසේ වුවද, එම වැඩිවීම ලාභ හා අලාභයන් හි කලින් හඳුනාගත් එම වත්කමේම ප්‍රත්‍යාගණනයේ ප්‍රත්‍යාගණන අඩුකිරීමක් ආපසු හරවන ප්‍රමාණයට ලාභය හෝ අලාභය තුළ හඳුනාගනී.

ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් වශයෙන් වන ධාරක අගයේ අඩුවීමක් ලාභය හෝ අලාභය තුළ හඳුනාගනී. කෙසේ වුවද, එම අඩුවීම එම වත්කමට අදාලව ප්‍රත්‍යාගණන අතිරික්තය තුළ පවතින කිසියම් බැර ශේෂයක ප්‍රමාණයට වෙනත් විස්තීර්ණ අදායම තුළ හඳුනාගනී.

ඊට අමතරව, ප්‍රත්‍යාගණන දිනට සමුච්චිත ක්‍ෂයවීම වත්කමේ දළ ධාරණ අගයට අනුව ඉවත් කරනු ලබන අතර ශුද්ධ අගය වත්කමේ ප්‍රත්‍යාගණන අගයට නැවත සඳහන් කරනු ලබයි. බැහැරලීම මත, විකුණනු ලබන කිසියම් විශේෂිත වත්කමකට අදාළ කවර හෝ ප්‍රත්‍යාගණන සංචිතයක් සෘජුවම රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලබයි.

3.5.1.4. ක්ෂය කිරීම

දේපල, පිරියත සහ උපකරණවල තක්සේරු කරන ලද ඵලදායී ජීව කාලය පුරා සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් තක්සේරු කළ සුන්බුන් වටිනාකම අඩු කළ දේපල, පිරියත සහ උපකරණ අයිතමවල පිරිවැය කපා හැරීම සඳහා ක්‍ෂයවීම් ගණනය කරනු ලබන අතර එය සාමාන්‍යයෙන් ලාභය හෝ අලාභය තුළ හඳුනාගනු ලබයි. මෙයින් වත්කමක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව ඉතා හොඳින් පෙන්නුම් කරයි.

වර්තමාන සහ සංසන්දනාත්මක කාල සීමාව සඳහා තක්සේරු කරන ලද ඵලදායී ජීව කාලය පහත දැක්වේ. වසර

• ගොඩනැගිලි	- වසර 20-40
• ලීබඩු හා සවිකිරීම්	- වසර 5-10
• කාර්යාල සහ අනෙකුත් උපකරණ	- වසර 5-10
• විදුලි ජනක යන්ත්‍ර සහ වායු සම්කරණ පිරියත	- වසර 5-10
• මෝටර් රථ	- වසර 4-5
• වෑද්දුම සහ සවිකිරීම්	- වසර 6 2/3
• පිරියත සහ යන්ත්‍ර	- වසර 20
• පරිගණක හා පරිගණක උපාංග	- වසර 4-7
• එල්පී ගෑස් ගබඩා ටැංකි, නළ මාර්ග හා සවිකිරීම්	- වසර 25
• එල්පී ගෑස් සිලින්ඩර්	- වසර 10
• අනෙකුත් ස්ථිර වත්කම්	- වසර 3-12

ක්‍ෂයවීම් ක්‍රම, ඵලදායී ජීව කාල සහ සුන්බුන් අගයන් සෑම වාර්තාකරණ දිනයකදී සමාලෝචනය කරනු ලබන අතර උචිත නම් ගළපනු ලැබේ.

3.5.1.5 හඳුනාගැනීමෙන් බැහැර කිරීම

බැහැර කිරීම්, මත හෝ එහි භාවිතයෙන් හෝ බැහැරලීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කර නොමැති විට දේපල, පිරියත සහ උපකරණවල අයිතමයක ධාරණ අගය හඳුනාගනු නොලබයි. දේපල්, පිරියත සහ උපකරණයක යම් අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලැබීම් හෝ අලාභය අයිතමය හඳුනා නොගන්නා විට ලාභයට හෝ අලාභයට ඇතුළත් කරනු ලබයි.

3.5.1.6 හානිකරණය

ආර්ථික තත්ත්වය හේතුවෙන් ඇතිවිය හැකි බලපෑම සළකා බලා 2022 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණවල ඇතිවිය හැකි හානිකරණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇත. එම තක්සේරුව පදනම් කරගෙන, දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වාර්තාකරණ දිනයට මූල්‍ය ප්‍රකාශවලට කිසිදු හානිකරණ වෙන් කිරීමක් සිදු කිරීමට අවශ්‍යතාවක් නොමැත.

3.5.1.7. කාරක ප්‍රාග්ධනය

කාරක ප්‍රාග්ධනය පිරිවැයට සඳහන් කරනු ලබයි. මෙම වියදම් ප්‍රාග්ධනකරණය අපේක්ෂාවෙන් ගොඩනැගිලි ඉදිකිරීමේදී, සෘජුවම දරන ලද ප්‍රාග්ධනයක ස්වභාවයේ වියදම් වේ.

3.5.2 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒනම් සහ පිරිවැය විශ්වාසදායකව මැනීමට හැකිනම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනී.

3.5.2.1 කීර්තිනාමය

පරිපාලිත සමාගම් අත්කර ගැනීම මත ඇතිවන කීර්තිනාමය සමුච්චිත හානිකරණ අලාභට අඩුකළ පිරිවැයට මනිනු ලබයි.

කීර්තිනාමය හානිකරණය

ව්‍යාපාර සංයෝජනයකින් අත්කර ගන්නා කීර්තිනාමය ධාරණ අගයට හානිවියහැකි බව වාතාවරණයන් පෙන්නුම් කරන විට වාර්ෂික පරීක්ෂා කරනු ලබයි. කීර්තිනාමයට අදාළ වන සෑම මුදල් උපයන ඒකකයකම අයකළහැකි අගය තක්සේරු කිරීම මඟින් කීර්තිනාමය සඳහා හානිකරණය නිශ්චය කරනු ලැබේ. මුදල් උපයන ඒකකයේ අයකළහැකි අගය එහි ධාරණ අගයට වඩා අඩුවන විට හානිකරණ අලාභයක් ලාභයේදී හෝ අලාභයේදී හඳුනා ගනු ලබයි. කීර්තිනාමයක හානිකරණ අලාභය ප්‍රතිවර්තනය කරනු නොලැබේ.

3.5.2.2 මෘදුකාංග

සමුහය විසින් අත්කර ගනු ලබන සහ සීමිත ඵලදායි ජීවිත කාලයක් ඇති අනෙකුත් අස්පෘශ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත හානිකරණ අලාභය අඩුකළ පිරිවැයට මනිනු ලබයි. සීමිත ඵලදායි ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්, එම වත්කම් හානිකරණයට ලක්විය හැකි බවට පෙනෙන්නට ඇති අවස්ථාවක දී හානිකරණය සඳහා ඒවා තක්සේරු කරනු ලබයි. අවිනිශ්චිත ඵලදායි ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් තනි තනිව හෝ මුදල් උපයන ඒකක මට්ටමින් හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලබයි.

සමූහයට වාර්තාකරණ දිනයට අනෙකුත් අස්පෘශ්‍ය වත්කම් වශයෙන් අත්කරගත් මෘදුකාංග ඇත.

පසුකාලීන වියදම්

මෘදුකාංග මත පසුකාලීන වියදම් ඊට අදාළ විශේෂිත වත්කමක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ එම මෘදුකාංගය මඟින් වර්ධනය කරනු ලබන විට පමණක් එය ප්‍රාග්ධනීකරණය කරනු ලබයි. අනෙකුත් සියලුම වියදම් එම වියදම් දරා ඇති පරිදි ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

ක්‍රමක්ෂය

තක්සේරු කළ ඵලදායි ජීව කාලය පුරා සරල මාර්ගික ක්‍රමය භාවිතා කරමින් ඒවායෙහි තක්සේරු කළ සුන්බුන් වටිනාකමට අඩුකළ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය කපාහැරීම සඳහා ක්‍රමක්ෂය ගණනය කරනු ලබන අතර ඒවා ලාභය හෝ අලාභය තුළ හඳුනාගනු ලබයි. මෘදුකාංගවල තක්සේරු කළ ඵලදායි ජීව කාලය වසර පහකි.

ක්‍රමක්ෂය ක්‍රම, ඵලදායි ජීව කාල සහ සුන්බුන් වටිනාකම් සෑම වාර්තාකරණ දිනයකටම සමාලෝචනය කරනු ලබන අතර උචිත අවස්ථාවලදී ගැළපීම කරනු ලබයි.

හඳුනාගැනීමෙන් බැහැර කිරීම

බැහැරකිරීම මත හෝ භාවිතයෙන් හෝ බැහැරකිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කර නොමැති විට අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගනියි. එම අස්පෘශ්‍ය වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලැබීම හෝ අලාභය, එම අයිතමය හඳුනා නොගන්නා අවස්ථාවේදි ලාභයට හෝ අලාභයට ඇතුලත් කරනු ලැබේ.

සමූහය විසින් 2022 දෙසැම්බර් 31 වන දිනට ආර්ථික අර්බුදයෙන් ඇති වූ බලපෑම ඇතුළුව අස්පෘශ්‍ය වත්කම්වලට වියහැකි හානිකරණ දර්ශක තක්සේරු කොට ඇත. එම ඇගයීම මත පදනම්ව, කිසිදු හානිකරණ දර්ශකයක් හඳුනා නොගන්නා ලදී.

3.5.3 භාවිතයට අයිතිය ඇති වත්කම

SLFRS 16 මඟින් LKAS 17 කල්බදු අවලංගු වන අතර, IFRIC 4 මඟින් යම් ගිවිසුමක් තුළ කල්බද්දක් අන්තර්ගත වේ ද යන්නත්, SIC-15 මෙහෙයුම් කල්බදු දිරිගැන්වීම් සහ SIC-27 කල්බද්දක නෛතික ස්වරූපය ගන්නා ගනුදෙනුවල හරය ඇගයීම කිරීම සිදුවේ. මෙම ප්‍රමිතිය මඟින් කල්බදු හඳුනා ගැනීම, නිර්ණය කිරීම, ඉදිරිපත් කිරීම සහ හෙළි කිරීම පිළිබඳ මූලධර්ම දක්වා ඇති අතර, සහ බදුකරුවන්ට සියලූ කල්බදු ගිණුම් තනි ශේෂ පත්‍ර ආකෘතියක් තුළ ගිණුම්ගත කිරීමට කටයුතු සළසයි. සමූහය විසින් 2018 වාර්තාකරණ කාල සීමාව සඳහා ආනුෂංගික නැවත සඳහන් නොකරමින්, එම ප්‍රමිතියේ විශේෂ සංක්‍රාන්තික ප්‍රතිපාදනවල අවසරය යටතේ 2019 ජනවාරි 1 දින සිට අතීතානුයෝගීව SLFRS 16 භාවිතයට යොදාගෙන ඇත.

ගිවිසුමක් ආරම්භ කරන අවස්ථාවේ, සමූහය විසින් යම් ගිවිසුමක් කල්බද්දක්ද හෝ කල්බද්දක් අන්තර්ගතව පවතියිද යන්න නිර්ණය කරයි. ගිවිසුම තුළ ප්‍රතිෂ්ඨාව වෙනුවෙන් යම් කාල සීමාවකට හඳුනාගත් වත්කමේ භාවිතය පිළිබඳ පාලනය ඇතුළත්නම් යම් ගිවිසුමක් කල්බද්දකි නැතිනම් කල්බද්දක් අන්තර්ගතව පවතියි. යම් ගිවිසුමක හඳුනාගත් වත්කමක් පාලනය කිරීමට අයිතිය ලබා දෙන්නේද යන්න නිර්ණය කිරීමට, සමූහය විසින්

- ගිවිසුමට හඳුනාගත් වත්කමක් හවුල් වන්නක් ද යන්න
- සමාගමට එම වත්කම භාවිතා කරන මුළු කාල සීමාව පුරාවටම එහි සියලූ හරයාත්මක ආර්ථිකමය වාසි ලබා ගැනීමට අයිතිය තිබේ ද යන්න සහ
- සමාගමට එම වත්කම භාවිතා කිරීමට ඇති අයිතිය හැසිරවීමට අයිතිය ඇති ද යන්න සලකා බලයි.

සමූහය විසින් භාවිතයට අයිතිය ඇති වත්කම් හා කල්බදු ආරම්භ වන දිනයේ කල්බදු වගකීමක් ද හඳුනා ගනියි. මීට පෙර LKAS 17 යටතේ මෙහෙයුම් කල්බදු ලෙස පැවති සමූහයේ භාවිතයට අයිතිය ඇති වත්කම් හඳුනාගෙන තිබුණි.

මූලික අගය කිරීම

සමූහය විසින් භාවිතයට අයිතිය ඇති වත්කම් හා කල්බදු ආරම්භ වන දිනයේ කල්බදු වගකීමක් ද හඳුනා ගනියි. භාවිතයට අයිතිය ඇති වත්කම් මූලිකව පිරිවැයට හඳුනා ගන්නා අතර එයට ආරම්භක දිනයට හෝ පෙර යම් කල්බදු ගෙවීම් සඳහා ගලපන ලද කල්බදු වගකීමේ මුල් මුදල් ප්‍රමාණය සමඟ දරන ලද යම් මූලික සෘජු පිරිවැය සහ ඊට පාදක වූ වත්කම කොටස් කිරීමට සහ හෝ එය පිහිටි වැඩ භූමියෙන් ඉවත් කිරීමට හෝ පාදක වූ වත්කම ප්‍රතිෂ්ඨාපනය කිරීමට වූ වියදම් ඇස්තමේන්තුවකින් සමන්විත වේ.

කල්බදු වගකීම මූලිකව කල්බද්ද ආරම්භ වූ දිනයේ නොගෙවූ කල්බදු ගෙවීම්වල වර්තමාන අගයට අගය කර, කල්බද්දට ඇතුලත් පොලී අනුපාත භාවිතා කොට වට්ටම් කරන අතර, එම අනුපාතය පහසුවෙන් නියම කළ නොහැකිනම්, සමූහයේ වර්ධනීය ණය ගැනීමේ අනුපාතය භාවිතා කරමින් ගණනය කෙරේ. පොදුවේ සමූහය එහි වර්ධනීය ණය ගැනීමේ අනුපාතය මට්ටම් අනුපාතය ලෙස භාවිතා කරයි.

පරිපාලිත සමාගමකට සමාගම විසින් කුලියට ලබාදුන් දේපලක ප්‍රතිඵලයක් ලෙස සමාගමේ පරිපාලිත සමාගමකට භාවිතයට අයිතිය ඇති වත්කම් හා කල්බදු වගකීමක් ඇති අවස්ථාවක, එකී භාවිතයට අයිතිය ඇති වත්කම හා කල්බදු වගකීම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවලින් ඉවත් කෙරේ.

පසුකාලීන ගණනය කිරීම

භාවිතයට අයිතිය ඇති වත්කම පසුව කල් බද්ද ආරම්භ වූ දිනයේ සිට භාවිතයට අයිතිය ඇති වත්කමේ ඵලදායී ජීව කාල අවසානය හෝ කල් බදු කාල සීමාවේ අවසානය යන දෙදෙනේ කලින් එළඹෙන දිනය දක්වා සරල මාර්ගික ක්‍රමය යොදා ගෙන ක්ෂය කෙරේ. භාවිතයට අයිතිය ඇති වත්කමේ ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය එම දේපළ සහ උපකරණ ගණනය කරන ආකාරයෙන්ම තීරණය කරනු ලැබේ. ඊට අමතරව, භාවිතයට අයිතිය ඇති වත්කම කලින් කලට හානිකරණ අලාභ ඇත්නම් ඒ මගින් අඩු කෙරෙන අතර, කල්බදු වගකීමේ සමහර නැවත මැනීම් මත ගැලපීම් සිදු කෙරේ.

කල්බදු අයිතිය සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ. එය අනාගත කල්බදු ගෙවීම්වල දර්ශකයක් හෝ අනුපාතයක වෙනසක් හේතුවෙන් ඇතිවන වෙනස්කමක් හෝ, තක්සේරු කරන ලද සුන්බුන් වටිනාකම් යටතේ ගෙවිය යුතු මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් සමූහයේ ඇස්තමේන්තු කිරීම වෙනස් වීම හේතුවෙන් හෝ, සමූහය මිලදී ගැනීමක්, දීර්ඝ කිරීමක් හෝ අවසන් කිරීමක් සම්බන්ධයෙන් එහි ඇගයීමක් වෙනස් කළහොත් නැවතත් ගණනය කෙරේ.

භාවිතයට අයිතිය ඇති වත්කම් හානිකරණය කිරීම

වාර්තාකරණ දිනයට, එක් එක් ව්‍යාපාර ඒකකය විසින් හැකිතාක් සමාගම් අවධානම් කළමනාකරණ උපායමාර්ග අනුව ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාමේ සැලසුම් යටතේ රජය විසින් ලබා දී ඇති මාර්ගෝපදේශවලට සහය දෙමින් සහ ඒවාට අනුගත වෙමින් කටයුතු කළ හෙයින් භාවිතයට අයිතිය ඇති වත්කම ආර්ථික අර්බුදය හේතුවෙන් කිසිදු හානිකරණය වීමක් සමූහය විසින් හඳුනා ගෙන නොමැත.

3.5.4 ආයෝජන දේපල

ආයෝජන දේපලක් යනු කුලී ආදායමක් ලැබීමට හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම සඳහා හෝ ඒ දෙක සඳහාම හෝ හිමිකරගත් දේපළකි. ආයෝජන දේපල මූලික වශයෙන් පිරිවැයට අගය කරන අතර පසුව ලාභය හෝ අලාභය තුළ හඳුනා ගන්නා යම් වෙනස්කමක් සමඟ වාර්ෂික පදනම මත සාධාරණ අගයට අගයනු ලබයි.

ආයෝජන දේපළ, ඒවායින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකිරීම හේතුවෙන් බැහැර කරනු ලැබ හෝ ස්ථිරවම භාවිතයෙන් ඉවත් කර ඇතිවිට හඳුනා නොගනියි. ආයෝජන දේපළ බැහැර කිරීම මත යම් ලැබීමක් හෝ අලාභයක් (බැහැරකිරීමෙන් ලද ශුද්ධ මුදල සහ අයිතමයේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරන ලද) ලාභයේදී හෝ අලාභයේදී හඳුනා ගනී. පූර්වයෙන් දේපල, පිරියත සහ උපකරණ ලෙස වර්ගීකරණ කරන ලද ආයෝජන දේපළක් විකුණන ලබන විට, ප්‍රත්‍යාගණන සංචිතයට ඇතුළත් යම් අදාළ ප්‍රමාණයක් ඇත්නම් එය රඳවාගත් ඉපයීම්වලට මාරු කරනු ලබයි.

භාවිතයේ වෙනසක් ඇතිවිට ආයෝජන දේපළවල මාරුකිරීම් සිදු කරනු ලබයි. පරිපාලිත සමාගමක ආයෝජන දේපළවලින් සැළකිය යුතු කොටස් සමූහ සමාගම විසින් බුක්ති විඳිනු ලබන විට, එකී ආයෝජන දේපල දේපළ, පිරියත සහ උපකරණ ලෙස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සලකන අතර, ශ්‍රී ලං.ගි.ප්‍ර. 16 – "දේපල, පිරියත හා උපකරණ" පරිදි ගණනය කෙරේ.

3.5.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තා කරන දිනයකදීම සමූහය විසින් එහි මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගය (ආයෝජන දේපළ, භාණ්ඩ තොග සහ විලම්බිත බදු වත්කම් හැර) එම වත්කම්වලට යම්කිසි හානිකරණයක් සිදුවීමට ඇති බව පෙන්නුම් කරන්නේද යන්න නිශ්චය කර ගැනීම සඳහා සමාලෝචනය කරනු ලබයි. එවැනි යම් සලකුණක් දක්නට ලැබෙන්නේ නම්, එම වත්කමේ අයකර ගත හැකි අගය තක්සේරු කරනු ලබයි. කීර්තිනාමය සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලබයි.

යම් වත්කමක හෝ මුදල් උපයන ඒකකයක (CGU) අයකර ගත හැකි අගය යනු එහි භාවිත අගය සහ එහි විකුණුම් පිරිවැය අඩුකළ සාධාරණ අගය යන දෙකෙන් ඉහළ අගය වේ. භාවිත අගය තක්සේරු කිරීමේදී, මුදලේ කාලීන අගයේ සහ වත්කමට හෝ මුදල් උපයන ඒකකයට ඇති නිශ්චිත අවදානම්වල ප්‍රවර්තන වෙළෙඳපළ තක්සේරු කිරීම් පෙන්නුම් කරන පූර්ව බදු වට්ටම් අනුපාතයක් භාවිතා කරමින් තක්සේරු කළ අනාගත මුදල් ප්‍රවාහ ඒවායෙහි වර්තමාන අගයට වට්ටම් කරනු ලබයි.

වත්කමක හෝ මුදල් උපයන ඒකකයක (CGU) ධාරණ අගය එහි අයකරගත හැකි අගය ඉක්මවන්නේනම් හානිකරණ අලාභයක් හඳුනා ගනු ලබයි. හානිකරණ අලාභ ලාභය හෝ අලාභය තුළ හඳුනාගනී. මුලින්ම මුදල් උපයන ඒකකයට (CGU) වෙන්කළ ඇති කවර හෝ කීර්තිනාමයක ධාරණ අගය අඩු කිරීමටත් සහ ඉන්පසුව සමානුපාතික පදනමක් මත මුදල් උපයන ඒකකය (CGU) අනෙකුත් වත්කම්වල ධාරණ අගය අඩු කිරීමටත් වෙන් කෙරේ.

කීර්තානිමය සම්බන්ධ හානිකරණ අලාභයක් ප්‍රතිවර්තනය නොකෙරේ. අනෙකුත් වත්කම් සඳහා, හානිකරණ අලාභයක් ප්‍රතිවර්තනය කරනු ලබන්නේ, වත්කමේ ධාරණ අගය වත්කම්වල හානිකරණ අලාභයක් හඳුනාගෙන නොතිබුනේ නම් ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය අඩුකරමින් නිශ්චය කරනු ලැබ තිබෙන ධාරණ අගය ඉක්මවා යන ප්‍රමාණය දක්වා පමණකි.

3.5.6 භාණ්ඩ තොග

භාණ්ඩ තොගවලට අඩු පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි අගය යටතේ දක්වනු ලබන පාරිභෝජන භාණ්ඩ ඇතුළත් වේ. තොග පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් පහළ අගය අනුව ප්‍රකාශිත සියලුම පරිභෝජනය කලහැකි අයිතම වලින් සමන්විත වේ.

සමූහය සතු භාණ්ඩ තොගවල ස්වභාවය පරීක්ෂා කිරීමෙන් අනතුරුව, ආර්ථික අර්බුදයෙන් ඇති වූ ගම්‍යාර්ථ හේතුවෙන් භාණ්ඩ තොගවල ශුද්ධ උපලබ්ධි කළ හැකි අගයට කිසියම් බලපෑමක් සිදුවි තිබේද යන්න සමූහය තක්සේරු කර ඇති අතර, භාණ්ඩ තොගවල ධාරණ අගයට ගැලපීමක් සිදු කිරීමට අවශ්‍යද යන්න සමූහය විසින් ඇස්තමේන්තු කර තිබේ. භාණ්ඩ තොගවල ධාරණ අගය අඩු කර ගැලපීමට අවශ්‍ය වන්නා වූ කිසිදු අවස්ථාවක් සමූහය විසින් හඳුනා ගෙන නොමැත.

3.5.7 මූල්‍ය උපකරණ – LKAS 39

සමූහය විසින් ව්‍යුත්පන්න නොකළ වත්කම්, පහත සඳහන් පරිදි වර්ගීකරණය කරනු ලබයි. එනම් විකිණීමට ඇති මූල්‍ය වත්කම්, ණය සහ ලැබීම්. කල්පිරීම් දක්වා තබා ඇති මූල්‍ය වත්කම්, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේ දී මූල්‍ය වත්කම් ලෙස වර්ග කෙරේ.

සමූහය ව්‍යුත්පන්න නොකළ මූල්‍ය වගකීම්, අනෙකුත් මූල්‍ය වගකීම් කාණ්ඩ ලෙසින් වර්ගීකරණය කරයි.

3.5.7.1 ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ

සමාගම විසින් ණය හා ලැබීම් සහ ණය සුරුකුම් පත් ඒවා උත්පාදනය වන ආරම්භක දිනයේ මූලිකව හඳුනා ගනු ලබයි. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභය හෝ අලාභය අතුරින් සාධාරණ අගයේදී නම් කරන ලද වත්කම් ඇතුළුව) එම උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශවයක් බවට සමූහය පත්වන වෙළෙඳ දිනයේ දී මූලිකව හඳුනා ගනී.

මූල්‍ය වත්කමක්, මූලිකවම එහි සාධාරණ අගයට මනින අතර, ලාභ හෝ අලාභය තුළින් සාධාරණ අගයක් නොමැති වත්කමක් සඳහා, එය අත්කර ගැනීමේදී හෝ නිකුත් කිරීමේදී සෘජුව ම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය ද එකතුව අගයනු ලබයි.

මූල්‍ය වත්කමක් එයින් ලැබෙන මුදල් ප්‍රවාහවලට ඇති ගිවිසුම්ගත අයිතියක් අවසන්වන විට හෝ මූල්‍ය වත්කමේ හිමිකාරිත්වයේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සත්‍ය වශයෙන් ම මාරු කරනු ලබන ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබා ගැනීමට ඇති අයිතිය මාරු කරන විට සමූහය විසින් එය හඳුනා නොගනී. සමූහය විසින් නිර්මාණය කළ හෝ රඳවාගනු ලබන මාරුකළ මූල්‍ය වත්කමක පෙළිය වෙනම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගනී.

වටිනාකම හිලව් කිරීමට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධි කිරීමට සහ ඊට සමගාමීව වගකීම පියවීමට නීත්‍යානුකූලව බලාත්මක අයිතියක් සමූහයට පවතින්නේ නම් පමණක් මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශවල ඉදිරිපත් කරනු ලබයි.

පසුකාලීන අගය කිරීම

(අ) විකිණීමට ඇති මූල්‍ය වත්කම් (AFS)

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන යනු වෙළෙඳාම සඳහා රඳවා ගෙන ඇති ලෙස වර්ගීකරණය නොකරන ලද හා ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගයක් නියම කර නොමැති ආයෝජන වේ.

සාධාරණ අගයට මූලික අගැයීමෙන් පසු, විකිණීමට ඇති මූල්‍ය ආයෝජන පසුව සාධාරණ අගයේදී මනිනු ලබන එහි වෙනස්වීම්, අනෙකුත් විස්තීර්ණ ආදායම් වලදි හඳුනාගනු ලබන අතර විකිණීමට ඇති සංචිතයට සමුච්චිත කරනු ලබයි. මෙම වත්කම් හඳුනා නොගන්නා විට ස්කන්ධය තුළ සමුච්චිත වන ලාභය හෝ අලාභය ලාභයට හෝ අලාභය ලෙස නැවත වර්ගීකරණය කරනු ලබයි.

විකිණීමට ඇති මූල්‍ය වත්කම් ආසන්න කාලයේදී අලෙවි කිරීමේ හැකියාව සහ අභිලාශය තවමත් උචිතද යන්න නිශ්චය කර ගැනීමට සමූහය විසින් එහි විකිණීමට ඇති මූල්‍ය වත්කම් ඇගයිමක් සිදු කරනු ලබයි. අක්‍රිය වෙළෙඳපොළ හේතුවෙන් මෙම මූල්‍ය වත්කම් විකිණීමට සමාගමට නොහැකි වන අවස්ථාවලදී සහ දැකිය හැකි අනාගතයේදී එසේ කිරීමට කළමනාකරණයේ අභිප්‍රාය වෙනස්වන අවස්ථාවක, එම වත්කම් දුර්ලබ වාතාවරණයන් හී නැවත වර්ගීකරණය කිරීමට සමාගම තෝරා ගනු ඇත. මූල්‍ය වත්කම් ණය සහ ලැබීම් යන නිර්වචනය සපුරාලන විට සහ මෙම වත්කම් දැකියහැකි අනාගතය සඳහා හෝ කල්පිරෙනතුරු රඳවා ගැනීමේ අභිලාෂයක් සහ හැකියාවක් කළමනාකරණයට තිබෙන විට ණය සහ ලැබීම් නැවත වර්ගීකණයට ඉඩ ලබා දේ. මූල්‍ය වත්කම කල් පිරෙනතුරු රඳවා ගැනීමේ හැකියාව සහ අභිලාෂය ආයතනයට ඇති විට පමණක් කල්පිරෙන තුරු රඳවාගත් ලෙස නැවත වර්ගීකරණය කිරීමට අවසර දෙනු ලබයි.

සමාගමේ විකිණීමට ඇති මූල්‍ය ආයෝජනය, විකිණුම සඳහා රඳවා ගෙන ඇති ලෙස වර්ගීකරණය කර නොමැති සහ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී නම් කර නොමැති ස්කන්ධය සහ ණය සුරුකුම් වලින් සමන්විත වේ.

(ආ) ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් (FVTPL)

මූල්‍ය වත්කමක් ලාභය හෝ අලාභය අතුරින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කමක් ලෙසින් වර්ගීකරණය කරන්නේ එය වෙළඳාම සඳහා රඳවා ගෙන ඇති ලෙස වර්ගීකරණය කර මූලික හඳුනාගැනීමේදී එය එසේ නම් කරනු ලැබ ඇති විටදීය. සෘජුවම අත්කරගත හැකි ගනුදෙනු පිරිවැය ලාභය හෝ අලාභය තුළ දරන ලද වියදමක් ලෙස හඳනාගනු ලබයි. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම්, සාධාරණ අගයට මනින අතර පොළිය හෝ ලාභාංශ ආදායම ඇතුළුව එහි වෙනස්වීම් ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

වත්කම් හා වගකීම් යනු සමාගමේ මූල්‍ය වත්කම් සහ වගකීමක හෝ මේ දෙකෙහි කොටස වන අතර, සමූහයේ උපායමාර්ගයට අනුකූලව ඒවා කළමනාකරණය කර ඒවායේ කාර්යසාධනය සාධාරණ අගය පදනම මත අගයනු ලබයි. සමාගමේ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම්, ලැයිස්තුගත ස්කන්ධ ආයෝජන වලින් සමන්විත වේ.

(ඇ) කල්පිරෙනතුරු රඳවාගන සිටින මූල්‍ය වත්කම් (HTM)

මෙම මූල්‍ය වත්කම් ස්ථාවර සහ නිශ්චය කරනු ලැබිය හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොකළ වත්කම් වන අතර සමූහයට එම වත්කම් කල්පිරෙනතුරු රඳවා ගැනීමේ අභිලාෂය සහ හැකියාව තිබෙන විට ස්ථිර කල්පිරීම්, කල්පිරීම සඳහා රඳවාගත් ලෙස වර්ගීකරණය කරනු ලබයි. මෙම වත්කම් මූලික වශයෙන් සාධාරණ අගය සමඟ කවර හෝ සෘජුව අත්කර ගත හැකි ගනුදෙනු පිරිවැයද එකතුව හඳුනා ගනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසුව, එම වත්කම් ඵලදායි පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට අගයනු ලැබේ.

කල්පිරීම් සඳහා රඳවාගත් මූල්‍ය වත්කම් භාණ්ඩාගාර බිල්පත් වලින් හා සමූහය විසින් කරනු ලැබ ඇති භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනවලින් සමන්විත වේ.

(ඈ) ණය සහ ලැබීම්

ණය සහ ලැබීම් යනු, සක්‍රිය වෙළෙඳපොළ තුළ ලැයිස්තුගත නොකළ ස්ථාවර හෝ නිශ්චය කරනු ලැබිය හැකි මූල්‍ය වත්කම් වේ. මෙම වත්කම් මූලික වශයෙන් සාධාරණ අගය සමඟ කවර හෝ සෘජුව අත්කරගත හැකි ගනුදෙනු පිරිවැය ද එකතුව හඳුනාගනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, ණය සහ ලැබීම් ඵලදායි පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට අගයනු ලැබේ.

ණය සහ ලැබීම්, ලැයිස්තුගත නොකළ ණය, කාලීන තැන්පතු වත්කම් ඇප සුරුකුම්පත්. සංවර්ධන බැඳුම්කර, වාණිජ පත්‍රිකා අනෙකුත් ණය සහ ලැබීම්, මුදල් සහ මුදලට සමාන දෑ වලින් සමන්විත වේ.

- **ලැබිය යුතු ප්‍රතිරක්ෂණ**

සමාගම සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලියේදී ඇතිවන රක්ෂණ අවදානම් හඳුනා ගැනීම විධිමත් ප්‍රතිරක්ෂණ සැලසුම්වලට පවරා දේ.

ප්‍රතිරක්ෂණ වත්කම්වලට, ගෙවූ සහ නොගෙවූ අලාභ සඳහා ප්‍රතිරක්ෂණ සමාගම්වලින් අයවීමට ඇති ශේෂ සහ අලාභ ගැළපීමේ වියදම් ඇතුළත් වේ. ප්‍රතිරක්ෂකයින්ගෙන් අයකර ගැනීමට ඇති ප්‍රමාණ ප්‍රතිරක්ෂකයින්ගේ ඔප්පු හා බැඳුණු හිඟ හිමිකම් වෙන් කිරීම් හෝ නොපියවූ හිමිකම් සමඟ අනුරූපවන ආකාරයකට සහ අදාළ ප්‍රතිරක්ෂණ ගිවිසුමට අනුව ඇස්තමේන්තු කරනු ලබයි.

ප්‍රතිරක්ෂණ හිලව් කිරීමේ හිමිකමක් නොපවතින්නේ නම්, ප්‍රතිරක්ෂණයක් දළ වශයෙන් මූල්‍ය ප්‍රකාශයේ වාර්තා කරනු ලබයි.

ප්‍රතිරක්ෂණ වත්කම්, වාර්තාකරණ වර්ෂය තුළදී හානිකරණය පිළිබඳ හැඟවීමක් මතුවුවහොත් සෑම වාර්තාකරණ දිනයකදීම හෝ නිතර නිතර හානිකරණ සඳහා සමාලෝචන කරනු ලබයි. ප්‍රතිරක්ෂණ වත්කම් මූලික වශයෙන් හඳුනාගැනීමෙන් පසුව සිදුවන සිදුවීමක ප්‍රතිඵල ලෙස, ගිවිසුමේ කොන්දේසි යටතේ අයවීමට ඇති සියලුම නොපියවූ ප්‍රමාණ සමූහයට නොලැබිය හැකි බවට විෂයමූලික සාක්ෂි ඇති විට සහ එම සිදුවීමෙන් ප්‍රතිරක්ෂකගෙන් සමූහයට ලැබීමට ඇති ප්‍රමාණ මත සත්‍ය වශයෙන්ම සැලකිය යුතු බලපෑමක් ඇති විට හානිකරණයක් සිදුවෙයි. කවර හෝ හානිකරණ අලාභයක් ලාභය හෝ අලාභය තුළ වාර්තා කරනු ලබයි.

පවරන ලද ප්‍රතිරක්ෂණ සැලසුම් ඔප්පු හිමියන්ට සමූහයේ ඇති බැඳීම් වලින් සමූහය මුදා හැරීමක් සිදු නොකරයි.

ගිවිසුම්ගත අයිතිවාසිකම් ශූන්‍ය වූ විට හෝ ඉකුත් වූ විට හෝ ගිවිසුම වෙනත් පාර්ශවයකට පවරනු ලැබ ඇති විට ප්‍රතිරක්ෂණ වත්කම් හා වගකීම් හඳුනා නොගනී.

- **ලැබියයුතු වාරික**

  ලැබිය යුතු රක්ෂණ අයවීමට ඇති අවස්ථාවේදී හඳුනා ගන්නා අතර ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයේදී මූලික හඳුනාගැනීම මත අගය කරයි. රක්ෂණ වාරික අයකර ගත හැකි බව අඛණ්ඩ පදනම්න් සමාලෝචනය කරනු ලබයි.

  ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද රක්ෂණ වාරික ගෙවීමේ ප්‍රතිඥා උපදේශයට අනුව, ජීවිත නොවන රක්ෂණ ඔප්පු, රක්ෂණ වාරික ගෙවීමේ ප්‍රතිඥාභාරයන්ට යටතේ නිකුත් කරන අතර රක්ෂණ වාරික නොපියවන්නේනම් දින 60 ක් ඉකුත්වීමෙන් පසු අවලංගු කරනු ලබයි.

  සමාගම විසින් ජීවිත රක්ෂණ, වාරික උපචිත පදනම මත ගිණුම්ගත කරයි. ඒ අනුව, අයවීමට ඇති ජීවිත රක්ෂණ වාරික (දින 30 ක සහන කාලසීමාව තුළ අයවීමට ඇති රක්ෂණ වාරික පමණි) සෑම වාර්තාකරණ දිනයකදීම හඳුනා ගනු ලබන අතර අනතුරුව එළඹෙන මාසයේදී රක්ෂණ වාරික පියවන්නේ නැත්නම් ඒවා ප්‍රතිවර්තනය කරනු ලබන අතර එසේම, සමාගමේ ප්‍රතිපත්ති අනුව එම ඔප්පු අවලංගු වී යයි.

  ආර්ථික අර්බුදයේ ආර්ථික ගම්‍යාර්ථ සළකා බලමින් 2022 දෙසැම්බර් 31 වන දිනට අයවිය යුතු රක්ෂණ වාරිකවල වියහැකි හානිකරණ සමූහය තක්සේරු කර ඇත. එම අගැයීම මත පදනම් ව, වාර්තාකරණ දිනය වන විට අයවිය යුතු රක්ෂණ වාරික සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශවලට කිසිදු හානිකරණ වෙන් කිරීමක් ඇතුලත් කිරීම අවශ්‍ය නොවේ.

- **සම්බන්ධිත පාර්ශවයන්ගෙන් වෙනත් ලැබීම් සහ අයවියයුතු දෑ**

  සම්බන්ධිත පාර්ශවයන්ගෙන් වෙනත් ලැබීම් සහ අයවිය යුතු දෑ හිඟ බොල් සහ අඩමාන ණය සඳහා දීමනාව අඩුකළ පිරිවැයට හඳුනා ගනු ලබයි.

- **මුදල් හා මුදලට සමාන දෑ**

  මුදල් සහ මුදලට සමාන දෑ ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් සහ සාධාරණ අගයේ වෙනස්වීම්වල නොසැලකිය යුතු අවධානමකට යටත්වන අත්කරගත් දිනයේ සිට මාස 03 ක් හෝ ඊට අඩුවෙන් කල් පිරුණු මුදල් ශේෂ සහ ඒක්ෂණ තැන්පතුවලින් සමන්විත වන අතර සමූහය එහි කෙටිකාලීන බැඳීම් කළමනාකරණය කිරීමේදී භාවිතා කරයි.

3.5.7.2 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම්

සමූහය නිකුත් කරන ලද ණය සුරුකුම් සහ ද්විතියික වගකීම් ඒවා ආරම්භ කරන ලද දිනයේදී මූලිකව හඳුනා ගනියි. අනෙකුත් සියලුම වගකීම් වෙළෙඳ දිනයේ දී එනම් උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල සමූහය පාර්ශවකරුවෙකු වන දිනයේ දී හඳුනා ගනී.

අනෙකුත් මූල්‍ය වගකීම් මූලික වශයෙන් සෘජුවම ආරෝපනය වන ගනුදෙනු පිරිවැය අඩුකළ සාධාරණ අගයේදී මනිනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසුව මෙම වගකීම්, ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට අගයනු ලබයි.

සමූහය විසින් මූල්‍ය වගකීමක්, එහි ගිවිසුම්ගත බැඳීම්වලින් නිදහස් කරනු ලබන විට, අවලංගු කරනු ලබන විට හෝ ඉකුත් වූ විට හඳුනා නොගනී.

අනෙකුත් මූල්‍ය වගකීම්, ණය හා ණය ගැණුම්, බැංකු අයිරා සහ වෙළඳ හා අනෙකුත් ගෙවීම්වලින් සමන්විත වේ.

3.5.8 මූල්‍ය වත්කම් හානිකරණය (ව්‍යුත්පන්න නොකළ)

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට වර්ගීකරණය නොකළ මූල්‍ය වත්කම්, හානිකරණය පිළිබඳ විෂය මූලික සාක්ෂියක් සාක්ෂියක් තිබේද, නැද්ද යන්න නිශ්චය කර ගැනීම සඳහා සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරු කරනු ලබයි.

මූල්‍ය වත්කම් හානිකරණය වන බවට විෂය මූලික සාක්ෂිවලට පහත දෑ ඇතුළත්ය:

- ණයගැතියෙකුගේ ණය ගෙවීම පැහැර හැරීම සහ යුතුකම් පැහැර හැරීම
- ණයගැතියෙකු හෝ රක්ෂකයෙකු වස්තු භංගත්වයට පත්වීමේ ලක්ෂණ පෙන්නුම් කිරීම
- ණයගැතියා හෝ රක්ෂකයාගේ ගෙවීමේ තත්ත්වයේ අහිතකර වෙනස්කම්
- මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සුරුකුම් සඳහා සක්‍රිය වෙළෙඳපළ නැතිවී යාම හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක අපේක්ෂිත මුදල් ප්‍රමාණයන් හි මැනිය හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කල හැකි දත්ත පැවතිම.

විකිණීම සඳහා පවතින වශයෙන් වර්ගීකරණය කර ඇති ස්කන්ධ ආයෝජනයන් හිදී, ආයෝජනයක සාධාරණ අගය එහි පිරිවැයට අඩුවෙන් පවතින විට "සැලකිය යුතු" හෝ "දීර්ඝකාලීන" යනුවෙන් ද ඇතුලත් විය හැක. "සැලකිය යුතු" හෝ "දීර්ඝකාලීන" යන්න තීරණය කිරීමේදී විනිශ්චයක් සිදු කිරීම අවශ්‍ය වේ.

3.5.8.1 ක්‍රමක්ෂය පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම්

මෙම වත්කම් සඳහා හානිකරණ සාක්ෂිය තනි තනි මට්ටමේදී සහ සමූහ මට්ටමේදී සලකා බලයි. තනි තනිව සැලකියයුතු සියලුම වත්කම් හානිකරණය සඳහා තනි තනිව තක්සේරු කරනු ලබයි. හානිකරණයට ලක් නොවුණු බවට සොයා ගන්නා ලද සියලුම වත්කම් ඉන් පසුව වැය කරන ලද නමුත් තවම තනිව හඳුනා නොගත් යම් හානිකරණයක් සඳහා සාමූහිකව තක්සේරු කරනු ලබයි. තනි තනිව නොසැලකියයුතු වත්කම් හානිකරණය සඳහා සාමූහිකව තක්සේරු කරනු ලබයි. සාමූහික තක්සේරු කිරීම එකම අවදානම් ලක්ෂණ සහිත වත්කම් සමූහයක් ලෙසට එකට එක් කරමින් සිදු කරනු ලබයි.

හානිකරණ අලාභයක්, වත්කමේ ධාරණ අගය සහ වත්කමේ සැබෑ ඵලදායී පොලී අනුපාතයට වට්ටම් කරන ලද තක්සේරු කළ අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගය අතර වෙනස ලෙසින් ගණනය කරනු ලබයි. අලාභ ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනු ලබන අතර අත්තිකාරම් ගිණුමක පෙන්නුම් කරනු ලබයි. හානිකරණ අලාභයක අගය පසුව අඩුවන්නේ නම් සහ එම අඩුවීම, හානිකරණය සොයාගත් පසු සිදුවූ සිදුවීමකට විෂය මූලික වශයෙන් සම්බන්ධ විය හැකිනම්, එවිට පූර්වයෙන් හඳුනාගත් හානිකරණ අලාභය ලාභය හෝ අලාභය තුළින් ප්‍රතිවර්තනය කරනු ලබයි.

3.5.8.2 විකිණීමට ඇති මූල්‍ය වත්කම් (AFS)

විකිණීමට ඇති මූල්‍ය වත්කම් මත හානිකරණ විකිණීමට තබා ඇති සංචිතයේ සමුච්චිත අලාභ, ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරමින් හඳුනාගනු ලබයි. එම ප්‍රතිවර්ගීකරණය කරන ලද අගය යනු, අත්කර ගැනීමේ පිරිවැය (යම් ප්‍රතිගෙවීමක සහ ක්‍රමක්ෂයවල ශුද්ධ අගය) සහ ලාභය හෝ අලාභය තුළ පූර්වයෙන් හඳුනා ගන්නා යම් හානිකරණ අලාභය අඩුකළ වර්තමාන සාධාරණ අගය අතර වෙනස වේ.

හානිකරණයට ලක්වූ විකිණීමට තබා ඇති ණය සුරුකුම්පතක සාධාරණ අගය පසුව වැඩිවන්නේ නම් සහ එම වැඩිවීම, හානිකරණ අලාභය හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීමකට විෂය මූලිකව සම්බන්ධ විය හැකි නම්, එවිට එම හානිකරණ අලාභය, ලාභය හෝ අලාභය මගින් ප්‍රතිවර්තනය කරනු ලබයි. විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කළ ස්කන්ධ උපකරණයක ආයෝජනයක් සඳහා ලාභය හෝ අලාභය තුළ හඳුනා ගන්නා හානිකරණ අලාභ, ලාභය හෝ අලාභය මගින් ප්‍රතිවර්තනය කරනු නොලබයි.

3.5.9 මූල්‍ය උපකරණ – SLFRS 9

SLFRS 9 මූල්‍ය වත්කම්, මූල්‍ය වගකීම් සහ මූල්‍ය නොවන භාණ්ඩ මිලදී ගැනීම හෝ විකිණීම සඳහා වන සමහර ගිවිසුම් හඳුනා ගැනීම සහ මැනීම සඳහා අවශ්‍යතා දක්වා ඇත. මෙම ප්‍රමිතියෙන් LKAS 39 මූල්‍ය උපකරණ: හඳුනාගැනීම සහ අගය කිරීම ප්‍රතිස්ථාපනය කර ඇත. මීට අමතරව, සමූහය විසින් SLFRS 07 මූල්‍ය උපකරණ: අනාවරණ සඳහා ආනුෂංගික සංශෝධන සමූහය යොදා ගෙන ඇත. මෙය 2018 පිළිබඳ අනාවරණයන් සඳහා අදාළ වන නමුත් සංසන්දනාත්මක තොරතුරු සඳහා පොදුවේ අදාල කර ගෙන නොමැත.

SLFRS 9 හි ක්‍රමක්ෂය පිරිවැයට මැනීම, FVOCI සහ FVTPL යනුවෙන් මූල්‍ය වත්කම් සඳහා ප්‍රධාන වර්ගීකරණ කාණ්ඩ තුනක් අඩංගු වේ. SLFRS 9 යටතේ මූල්‍ය වත්කම් වර්ගීකරණයට සාමාන්‍යයෙන් පදනම් වන්නේ මූල්‍ය වත්කමක් කළමනාකරණය කරන ව්‍යාපාරික ආකෘතිය සහ එහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ මත ය. කල් පිරීම සඳහා පැවති, ණය සහ සහ ලැබීම් සහ විකිනීම් සඳහා පවතින යන කලින් පැවති LKAS 39 කාණ්ඩයන් SLFRS 9 මගින් ඉවත් කර ඇත.

LKAS 39 යටතේ කලින් ණය සහ ලැබීම් ලෙස වර්ගීකරණය කර තිබුණු වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දේ, මුදල් හා මුදලට සමාන දෑ සහ අදාළ පාර්ශවවල ලැබීම් SLFRS 9 යටතේ ක්‍රමක්ෂය පිරිවැය ලෙස වර්ගීකරණය කර ඇත.

මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ මැනීම සඳහා LKAS 39 හි දැනට පවතින අවශ්‍යතාවන් SLFRS 9 මගින් විශාල වශයෙන් රඳවා ගෙන ඇති අතර එම ප්‍රමිතිය යොදා ගැනීම මගින් සමාගමේ මූල්‍ය වගකීම් සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට හැර සමූහය වෙත සැලකිය යුතු බලපෑමක් කර නැත.

3.5.10 විලම්භිත වියදම්

විලම්භිත අත්කර ගැනීමේ පිරිවැය (DAC)

විලම්භිත අත්කරගැනීමේ පිරිවැය ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් සඳහා පමණක් අදාළ කරගත හැකිය. අත්කර ගැනීමේ පිරිවැය උපයාගත් ආදායම අනුව දරනු ලබන බැවින් ජීවිත රක්ෂණ ගිවිසුම් සඳහා විලම්භිත අත්කර ගැනීමේ පිරිවැය ගණනය කිරීම සිදු නොකරයි.

රක්ෂණ ගිවිසුම් ලේඛනගත කිරීමෙන් හෝ අලුත් කිරීමෙන් ඇතිවන මූල්‍ය කාලසීමාවේ දී දරනු ලබන සෘජු හෝ වක්‍ර පිරිවැය අදාළ ආදායම් උපයනු ලබන කාලසීමාවේදී, විලම්භිත කිරීම හෝ හිලව් කිරීම සිදුකරනු ලබයි. අනෙකුත් සියලුම අත්කර ගැනීම් පිරිවැය ඒවා දරනු ලබන අවස්ථාවේදී වියදමක් ලෙස හඳුනා ගනු ලබයි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව නිකුත් කරනු ලැබ ඇති නියාමන මාර්ගෝපදේශ අනුව යමින් විලම්භිත අත්කර ගැනීමේ පිරිවැය දින 365 පදනම මත පදනම්ව ගණනය කරනු ලබයි.

අදාළ ගිවිසුම පියවනු ලැබ ඇති විට හෝ ඉවත් කරනු ලැබ ඇතිවිට විලම්භිත අත්කර ගැනීම් පිරිවැය හඳුනා ගනු නොලබයි.

3.5.11 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් ස්කන්ධය ලෙස වර්ගීකරණය කරනු ලබයි. සාමාන්‍ය කොටස් නිකුත් කිරීමෙන් සෘජුවම අත්කර ගත හැකි වර්ධනීය පිරිවැය යම් බදු බලපෑම්වල ශුද්ධ ස්කන්ධයේ අඩුකිරීමක් ලෙස හඳුනා ගනු ලබයි.

3.5.12 වගකීම් සහ වෙන් කිරීම්

3.5.12.1 රක්ෂණ ගිවිසුම් බැඳීම්

රක්ෂණ වෙන් කිරීම – ජීවිත රක්ෂණය

ජීවිත රක්ෂණ වගකීම් ගිවිසුම්වලට ඇතුළත් වී වාරික අයකරන අවස්ථාවේදී හඳුනා ගනී. මෙම වගකීම් ශුද්ධ වාරික ක්‍රමය භාවිතයෙන් මනිනු ලබයි. භාවිතා කරන ලද ඇගයීම් උපකල්පන මත පදනම්ව අනාගත මුදල් ප්‍රවාහවල අවශ්‍යතා සපුරාලිය යුතු අනාගත රක්ෂණ වාරිකවල වට්ටම් කළ වටිනාකමට වඩා අඩු අනාගතයේදී අපේක්ෂිත රක්ෂණ වාරික ප්‍රතිලාභ වල වට්ටම් කළ වටිනාකමේ එකතුව ලෙසින් වගකීම නිශ්චය කරනු ලබයි.

මුදල් ප්‍රවාහ කාර්තුමය පදනමක් සහ වාර්ෂික පදනමක් මත IRCSL විසින් ලබාදුන් අනුපාත මත පදනම් වී වට්ටම් කෙරේ. ඇගයීම් උපකල්පන අහිතකර අපගමනවලට ඉඩ සලසන නියම කරන ලද ආන්තික අවදානමක් සහිත හොඳම තක්සේරු අත්දැකීම මත පදනම්ව ඇගැයීම් උපකල්පන ව්‍යුත්පන්න කරනු ලබයි. සහභාගි නොවන වගකීම් අවදානම් රහිත ඉපයීම් භාවිතා කරමින් වට්ටම් කෙරේ.

සහභාගි රක්ෂණ ඔප්පු වගකීම්වල අගය, සහභාගි රක්ෂණ අරමුදල මට්ටමේදී ව්‍යුත්පන්න කරන ලද සහතික කළ ප්‍රතිලාභ වගකීමේ සහ මුළු ප්‍රතිලාභ වගකීමේ වටිනාකමට වඩා වැඩිය. සහතික කළ ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී සහතික කළ ප්‍රතිලාභ පමණක් සැලකිල්ලට ගනු ලබන අතර අවදානම් රහිත පොලී අනුපාත ඵලදායී චක්‍රය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ වට්ටම් කරනු ලබයි. මුළු ප්‍රතිලාභ වගකීමට, සහතික කළ සහ සහතික නොකළ ප්‍රතිලාභ ඇතුළත්වන අතර සහභාගි රක්ෂණ අරමුදලේ ඵලදාව මත පදනම් අරමුදල භාවිතා කරමින් මුදල් ප්‍රවාහ වට්ටම් කරනු ලබයි.

තවද, වර්තමානයේ ඉකුත් වී ගොස් ඇති ගිවිසුම් අනාගතයේදී සමාලෝචනය කිරීමේදී පැන නැගිය හැකි සුදුසු වගකීම් ග්‍රහණය කර ගැනීම සඳහා ගැළපීම් සිදු කරනු ලබයි.

ශ්‍රී ලං.මූ.නි.ප්‍ර. 4 (SLFRS 4) "රක්ෂණ ගිවිසුම්" අනුව අවශ්‍ය කරන පරිදි බාහිර ආයුගණකවරයෙකුගේ සහය ඇතිව ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම්වලට අදාළව වගකීමේ ප්‍රමාණවත් බව පරීක්ෂාවක් සමාගම විසින් සිදුකර ඇත. මෙම වගකීමේ ප්‍රමාණවත් බව පරීක්ෂාව සිදුකිරීමේදී හිමිකම් පරිහරණය හා රක්ෂණ ඔප්පු පරිපාලන වියදම්, රක්ෂණ ඔප්පුහිමි විකල්ප හා ඇප මෙන්ම එවැනි වගකීම්වල ආදේශක වත්කම්වලින් ලැබෙන ආයෝජන ආදායම් ඇතුළත් අනාගත ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහවල වර්තමාන ප්‍රශස්ථ ඇස්තමේන්තු භාවිතා කරනු ලබයි.

රක්ෂණ වෙන් කිරීම – ජීවිත නොවන රක්ෂණය

ජීවිත නොවන රක්ෂණවල වගකීම්වලට, වැය කරන ලද නමුත් වාර්තා නොකළ (IBNR) සහ වැය කරන ලද නමුත් ප්‍රමාණවත් තරම් වාර්තා නොකළ (IBNER), ඇතුළු නොපියවූ වගකීම් ප්‍රතිපාදන, නොඉපයූ රක්ෂණ වාරික සඳහා ප්‍රතිපාදන සහ රක්ෂණ වාරික ඌනතා සඳහා ප්‍රතිපාදන ඇතුළත් වේ.

නොඉපයූ වාරික සංචිත ඇගයීම, 2000 අංක 43 දරණ රක්ෂණ නියාමන පනතේ (එනම් දින 365 පදනම, පදනම් කරගෙන) මාර්ගෝපදේශ අනුව අගයනු ලබයි. එසේ වුවද, අවදානම් කාල සීමාව ගිවිසුම් කාල සීමාවෙන් සැළකිය යුතු තරම් වෙනස්වන ගිවිසුම් සඳහා, රක්ෂණ වාරික ලබා දී ඇති රක්ෂණ අගයට සමානුපාතිකව අවදානම් කාල සීමාවේදී වාරික උපයා ගනු ලබයි. වැය කරන ලද නමුත් වාර්තා නොකළ (IBNR) සහ වැය කරන ලද නමුත් ප්‍රමාණවත් තරම් වාර්තා නොකළ (IBNER) වගකීම් සංචිතය ආයුගණකව ගණනය කරනු ලැබේ.

සමථකරණය හෝ විපත්තිකර සංචිත සඳහා ප්‍රතිපාදන හඳුනා නොගනී. හිමිකමකට ගෙවීමට ඇති බැඳීම ඉක්ම වී යන විට, නිදහස් කරනු ලබන විට හෝ අවලංගු කරනු ලබන විට වගකීම් හඳුනා ගන්නේ නැත.

ශ්‍රී ලං.මූ.නි.ප්‍ර. 4 (SLFRS 4) – රක්ෂණ ගිවිසුම්වලට අවශ්‍ය පරිදි, අවශ්‍ය කරන පරිදි බාහිර ආයුගණකවරයෙකුගේ සහය ඇතිව ජීවිත නොවන රක්ෂණ වගකීම්වලට අදාළව වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂාවක් සමාගම විසින් සිදුකරනු ලබයි.

සටහන 44.1.2 හි අනාවරණය කරන පරිදි රක්ෂණ ගිවිසුම් වට්ටම් අනුපාතය සහ ක්‍රමවේදයට යටත් නොවන බැවින් 2022 දෙසැම්බර් 31 දිනට ආර්ථික අර්බුදය හේතුවෙන් රක්ෂණ ගිවිසුම් වගකීම්වලට කිසිදු සැලකියයුතු බලපෑමක් ඇති වී නොමැත.

3.5.12.2 ඉඩම් හිමිකම් රක්ෂණ සංචිත

ඉඩම් හිමිකම් රක්ෂණ ඔප්පුවලින් ඇතිවන විභව හිමිකම් සඳහා ගෙවීම් සිදුකිරීමට සමාගම විසින් ඉඩම් හිමිකම් රක්ෂණ සංචිතය පවත්වාගෙන යනු ලබයි. සාමාන්‍යයෙන් ඉඩම් හිමිකම් රක්ෂණ ඔප්පු වසර පහ හෝ ඊට වැඩි දිගු කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලබයි. පළමු වසරේ සිදුවන හිමිකම්වල විභවතාව ඉහළ වුවත් ඔප්පුවේ පළමු වසර තුළ කිසිදු ලාභයක් හඳුනා නොගනී. දෙවැනි වසරේ සිට ඉදිරියට, ලද වාරික ක්‍රමක්ෂය කරමින් ලාභය හඳුනා ගන්නා අතර සරල මාර්ගික ක්‍රමය භාවිතා කරමින් ඔප්පුවේ ඉතිරි කාලසීමාව පුරා බෙදාහරිනු ලැබේ. පළමු වසර සඳහා ලාභය දෙවැනි වසරේදී පමණක් හඳුනා ගන්නා අතර ඉන්පසුව නිරන්තරයෙන් හඳුනා ගනී.

නිකුත්කළ ඉඩම් හිමිකම් රක්ෂණ ඔප්පුවක අනුරූප ණය කල්පිරීමට පෙර නිරවුල් කළහොත්, එකී ණය නිරවුල් කළ දිනයට ඉතිරිව ඇති එකී ඔප්පුවල සම්පූර්ණ වාරිකය අදාළ බැංකුව විසින් එය තහවුරු කිරීම මත ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

3.5.12.3 වෙන් කිරීම් (රක්ෂණ ගිවිසුම් හැර)

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයට/සමාගමට නෛතික හෝ ප්‍රයෝජනවත් බැඳීමක් ඇති විට සහ වගකීම පියවා ගැනීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා යාම අවශ්‍ය වන සහ එය විශ්වාසදායක ලෙස මැනිය හැකිනම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වෙන් කිරීම් හඳුනාගනී. රක්ෂණ ගිවිසුම් හැරුණු විට මුදල්වල කාල වටිනාකමේ වර්තමාන වෙලෙඳපොල තක්සේරුව සහ එම වගකීමට විශේෂිත අවදානම් පිළිබිඹු කරන පූර්ව බදු අනුපාතයකට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් වෙන් කිරීම් තීරණය කරනු ලබයි.

3.6 බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් යනු අනාගත බැඳීම් වන අතර ඒවාවේ පැවැත්ම සම්පූර්ණයෙන් ම සමූහයේ/සමාගමේ පාලනය තුළ නොවන අවිනිශ්චිත සිදුවීමක් සිදුවීමෙන් හෝ සිදුනොවීමෙන් පමණක් හෝ ආර්ථික ප්‍රතිලාභ මාරුකළ නොහැකි හෝ පහසුවෙන් මැනිය නොහැකි වර්තමාන බැඳීම්වලින් තහවුරු කරනු ඇත.

සමූහයේ/සමාගමේ ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්වල දී අනාවරණය කරනු ලබයි.

3.7 බණ්ඩමය වාර්තාකරණය

මෙහෙයුම් බණ්ඩයක් යනු ව්‍යාපාර කටයුතුවල නිරතවන සමූහයේ එක් සංරචකයක් වන අතර එයින්, සමූහයේ අනෙකුත් කිසියම් සංරචකයක් සමඟ සිදු කරනු ලබන ගනුදෙනුවලට අදාළ ආදායම් සහ වියදම් ඇතුළුව ආදායම් ඉපයීම සහ වියදම් දැරීම සිදු කරයි. බණ්ඩවලට වෙන්කළ යුතු සම්පත් සම්බන්ධයෙන් තීරණ ගැනීමට සහ එහි කාර්ය සාධනය තක්සේරු කිරීමට සහ ප්‍රශස්ථ මූල්‍ය තොරතුරු ලබාගැනීමට සැලැස්වීම සඳහා ප්‍රධාන විධායක නිලධාරි (CEO) විසින් සියලුම මෙහෙයුම් ප්‍රතිඵල නිතිපතා සමාලෝචනය කරනු ලබයි.

ප්‍රධාන විධායක නිලධාරිට වාර්තා කරනු ලබන බණ්ඩ ප්‍රතිඵලවලට බණ්ඩයකට සෘජුවම අත්කරගත හැකි අයිතම මෙන්ම සාධාරණීය පදනම මත වෙන් කරනු ලැබිය හැකි අයිතම ඇතුළත් වෙයි. ඒ අනුව, සමූහයේ බණ්ඩමය තොරතුරු වලින් ජීවිත නොවන රක්ෂණ, ජීවිත රක්ෂණය, සෞඛ්‍ය ආරක්ෂාව, බලශක්ති සහ අනෙකුත් බණ්ඩ පිළිබිඹු කරයි. බණ්ඩ අතර මාරුකිරීම් සාධාරණ වෙළෙඳපළ මිළ ගණන් මත පදනම් වේ.

3.8 කොටසක ඉපයීම (EPS)

සමූහය එහි සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට කොටසකට මූලික සහ තනුක ඉපයීම් පිළිබඳ දත්ත ඉදිරිපත් කරයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 33 (LKAS 33) අනුව තීරණය කළ බරතබන ලද සාමාන්‍ය කොටස් ගණනේ සාමාන්‍ය මගින් සමූහයේ සාමාන්‍ය කොටස් හිමියන්ට හිමිවිය යුතු ලාභය හෝ අලාභය බෙදමින් කොටසකට මූලික ඉපැයීම් ගණනය කරනු ලබයි.

3.9 යෝජිත ලාභාංශ

වාර්තාකරණ දිනට පසුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කරනු ලබන ලාභාංශ වගකීමක් ලෙස හඳුනා නොගන්නා අතර මූල්‍ය ප්‍රකාශවලට සටහනක් ලෙස පමණක් අනාවරණය කරනු ලබයි. ලාභාංශය සඳහා වෙන් කිරීම් වාර්ෂික මහ සභා රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කරනු ලැබ ඇති ලාභාංශය කොටස් හිමිකරුවන් විසින් අනුමත කළ කාල සීමාවේදී පමණක් හඳුනා ගනු ලබයි.

3.10 වාර්තා කරන දිනයෙන් පසු සිදුවීම්

වාර්තාකරණ කාල සීමාවෙන් පසු සිදුවීම් යනු හිතකර සහ අහිතකර සිද්ධීන් වුවද, එම සිද්ධීන් වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා බලය දෙන දිනය දක්වා කාල සීමාව තුළ ඇතිවන සිද්ධීන්ය. වාර්තාකරණ දිනයට පසුව සිදුවන සියලුම වැදගත් සිද්ධි සලකා බලනු ලැබ තිබෙන අතර අවශ්‍ය අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයේ අදාළ සටහන්වල ගැළපීම් හෝ අනාවරණ සිදු කරනු ලැබ ඇත. වැඩිදුර තොරතුරු සටහන 46හි ඇතුලත් වේ.

3.11 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 (LKAS-7), "මූදල් ප්‍රවාහ ප්‍රකාශනය" අනුකූලව මූදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීමේ වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මූදල් ප්‍රකාශ සකස් කරනු ලැබ ඇත.

මූදල් ප්‍රවාහ අරමුණ සඳහා, මුදල් හා මුදලට සමාන දෑ බැංකු අයිරා අඩුකර ඉදිරිපත් කරනු ලබයි.

4. නිකුත් කරන ලද නමුත් වාර්තාකරණ දිනයට බලාත්මක නොවූ ගිණුම්කරණ ප්‍රමිති

4.1. නිකුත් කරන ලද නමුත් බලපෑමක් ඇතිවිය හැකි බලාත්මක නොවූ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරී ආයතනය පහත දක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ නව ප්‍රමිති නිකුත් කරනු ලැබ ඇති අතර මෙම ප්‍රමිති 2019 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව හෝ ඊට පසු වෙනත් දිනයකින් ආරම්භවන මූල්‍ය කාලසීමාවක් සඳහා ඒවා අදාළ වේ.

නිකුත් කරන ලද නමුත් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන දිනයට බලාත්මක නොවූ නව සහ සංශෝධිත ප්‍රමිති පහත දැක්වේ.

- SLFRS 9, LKAS 39, SLFRS 7, SLFRS 4 සංශෝධන
- SLFRS 17 – රක්ෂණ ගිවිසුම්
- SLFRS 1 – පරිපාලිත සමාගම පළමුවර යොදා ගැනීම
- SLFRS 3 – සංකල්පීය රාමුවට යාවත්කළ යොමුව

නව හෝ සංශෝධිත මතය ප්‍රකාශ කිරීම් මගින් සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට සැලකියයුතු බලපෑමක් ඇතිවේයයි අපේක්ෂා නොකෙරේ.

SLFRS 9 න් තාවකාලික බැහැරවීම

SLFRS 9 – "මූල්‍ය උපකරණ",

මෙම ප්‍රමිතියෙන් LKAS 39 – මූල්‍ය උපකරණ හඳුනා ගැනීම සහ මැනීම ප්‍රතිස්ථාපනය කරයි. SLFRS 9 මූල්‍ය උපකරණ වර්ගීකරණය හා මැනීම පිළිබඳ සංශෝධිත මග පෙන්වීමක්, මූල්‍ය වත්කම්වල හානිකරණය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය අලාභ ආකෘතියක් සහ නව සාමාන්‍ය ඉදිරි රැකුම් ගිණුම්කරණ අවශ්‍යතා ඇතුළත් වේ. SLFRS 9, 2018 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා බලපැවැත්වෙන අතර, කලින් අදාළ කර ගැනීමට අවසර ඇත.

සමාගම (SLIC) ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ SLFRS 4 "රක්ෂණ ගිවිසුම්" සඳහා යෝජිත සංශෝධන මත ය. රක්ෂණ ගිවිසුම් නිකුත් කිරීම සිය ප්‍රධාන ක්‍රියාකාරකම් වන ආයතනවලට SLFRS 9 පූර්ණ වශයෙන් අදාළ කර ගැනීම කල් දැමීමට 2025 දී ආරම්භ කිරීමට අපේක්ෂා කරන සංශෝධිත SLFRS 4 සම්මත කර ගන්නා තෙක් අවසර ඇත. 2021 ජනවාරි සිට 2025 ජනවාරි දක්වා බලපැවැත්වෙන පරිදි IFRS 17 – රක්ෂණ ගිවිසුම් ගෝලීය වශයෙන් කල්දැමීමේ ප්‍රතිඵලයක් ලෙස සමාගම විසින් 2024 ජනවාරි දක්වා තාවකාලික නිදහස් කිරීම කල් දැමීමට බලාපොරොත්තු වේ.

රක්ෂණකරුවෙකුට SLFRS 9 වෙතින් තාවකාලික නිදහස් කිරීම අයදුම් කළ හැක්කේ පහත තත්ත්වයන් මත පමණි

(අ) ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම් කර ඇති මූල්‍ය වගකීම්වල ලැබීම් සහ අලාභ ඉදිරිපත් කිරීම සඳහා වන අවශ්‍යතා හැරුණු විට එය මීට පෙර SLFRS 9 හි කිසිදු සංස්කරණයක් භාවිතා කර නොමැති වීම.

(ආ) 2016 අප්‍රේල් 1 වන දිනට පෙර වාර්ෂික වාර්තාකරණ දිනයේදී හෝ පසු වාර්ෂික වාර්තාකරණ දිනයකදී එහි ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ ඒවා වීම.

SLFRS 4 – රක්ෂණ ගිවිසුමට කරන ලද සංශෝධනවලට අනුකූලව රක්ෂණකරුවෙකුගේ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වන්නේ නම්, සහ පමණක් නම්:

(ඇ) රක්ෂණ ගිවිසුම්වලින් වෙන් කරන ලද ඕනෑම තැන්පතු සංරචකහෝ අන්තර්ගත කළ ව්‍යුත්පන්නයන් ඇතුළත් වන මෙම SLFRS හි විෂය පථය තුළ ඇති ගිවිසුම් වලින් පැනනගින එහි වගකීම්වල ධාරණ අගය, එහි සියළු වගකීම්වල මුළු ධාරණ අගය සමඟ සංසන්දනය කිරීමේ දී වැදගත් වේ.

(ආ) සියළුම වගකීම්වල මුළු ධාරණ අගය ප්‍රමාණයට සාපේක්ෂව රක්ෂණය හා සම්බන්ධිත එහි වගකීම්වල මුළු ධාරණ අගය ප්‍රමාණයෙහි ප්‍රතිශතය

I. 90% ට වඩා වැඩි හෝ

II. 90% ට වඩා අඩු හෝ සමාන නමුත් 80% ට වඩා වැඩි වන අතර රක්ෂකයා රක්ෂණයට සම්බන්ධ නොවන සැලකිය යුතු ක්‍රියාකාරකමක නිරත නොවේ.

SLFRS 9 වෙතින් තාවකාලිකව නිදහස් කිරීම, එහි ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වී ඇත්දැයි පසුකාලීන වාර්ෂික වාර්තාකරණ දිනයක දී නැවත තක්සේරු කරනු ලබන්නේ එම දිනයේ අවසන් වන වාර්ෂික කාල සීමාව තුලදී ආයතනයේ ක්‍රියාකාරකම්වල වෙනසක් වී තිබුණි නම් පමණි.

සංශෝධිත SLFRS 4 සම්මත කර ගන්නා කාලයට ආසන්නව SLFRS 9 යටතේ සිය ආයෝජන සුදුසු පරිදි වර්ගීකරණය කිරීම පිළිබඳව සමාගම තීරණය කරනු ඇති අතර, ඒ අනුව වාර්තා කරන දිනට SLFRS 9 සිය මූල්‍ය ප්‍රකාශන සඳහා යොදා ගැනීමේ බලපෑම සම්පූර්ණයෙන් ගණනය කළ නොහැක. කෙසේ වෙතත් එමඟින් සමාගමේ මුළු සක්න්ධය සැලකිය යුතු ලෙස වෙනස් නොකරනු ඇති බවට අපේක්ෂා කරයි.

SLFRS 15 – "ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ලැබෙන ආදායම්"

SLFRS 4 – "රක්ෂණ ගිවිසුම්" මෙම ප්‍රමිතියෙන් ඉවත් කර ඇත. එබැවින්, සමාගමට මෙම ප්‍රමිතියෙන් රක්ෂණ ගනුදෙනු කෙරෙහි සැලකිය යුතු බලපෑමක් නොවනු ඇත. කෙසේ වෙතත්, මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ වෙනත් ආදායම් ගනුදෙනු සඳහා බලපෑමක් ඇති කළ හැකිය. මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීමෙන් මූල්‍ය ප්‍රකාශන කෙරෙහි ඇති විය හැකි බලපෑම සමාගම තක්සේරු කරමින් සිටී.

SLFRS 17 – "රක්ෂණ ගිවිසුම්"

SLFRS 17 2025 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේදයන් සඳහා බලපැවැත්වේ. SLFRS 9 සහ SLFRS 15 යොදා ගැනීමත් සමඟ කලින් යොදා ගැනීම සඳහා අවසර දෙනු ලැබේ. SLFRS 17 මඟින්, SLFRS 4 "රක්ෂණ ගිවිසුම්" අභිභවනය කරනු ලබයි. නව ප්‍රමිතිය අනිවාර්යෙන් බලපැවැත්වෙන දිනයේදී යොදා ගැනීමට සමාගම අදහස් කරයි.

2005 ජනවාරි මාසයට පෙර තම නීතිමය බල අධිකාරයේ පැවති රක්ෂණ වත්කම් සහ වගකීම් සඳහා ගිණුම්කරණයේ ව්‍යවස්ථාපිත පදනම දිගටම භාවිතා කිරීමට SLFRS 4 රක්ෂණකරුවන්ට අවසර දී ඇත. සියලු රක්ෂණ ගිවිසුම් සඳහා වන නව මිනුම් ආකෘතිය මඟින් SLFRS 17 ප්‍රතිස්ථාපනය කරයි.

SLFRS 17 සඳහා, රක්ෂණ ගිවිසුම් සඳහා වන වගකීම් අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම ලෙස පිළිගැනීම, වර්තමාන තත්ත්වයන් පිළිබිඹු කිරීමට එක් එක් වාර්තා කරන දිනයේදී යාවත්කාලීන කරනු ලබන පැහැදිලි අවදානම් ගැලපුමක් ඇතුළත් කිරීම සහ මූලික පිළිගැනීම මත පැන නගින ඕනෑම දිනක එක් ලැබීමක් සඳහා සමාන සහ ප්‍රතිවිරුද්ධ ගිවිසුම් සේවා ආන්තිකයක් අවශ්‍ය වේ. අලාභ ආදායම් ප්‍රකාශයට සෘජුවම හඳුනා ගැනේ. මිනුම් කාර්යයන් සඳහා, සමාන අවදානම් ලාභදායිතා පැතිකඩක් සහ නිකුත් කරන වර්ෂය මත වෙන වෙනම කළමනාකරණය කරනු ලබන ගිවිසුම් සඳහා තවදුරටත් බෙදීම් සමඟ ගිවිසුම් කාණ්ඩගත කර කරනු ලබයි.

SLFRS 17 යටතේ රක්ෂණ සම්බන්ධතා සඳහා වන ලාභය නිරූපණය කරනු ලබන්නේ, අදාල කාල සීමාව තුළ රක්ෂණ ඔප්පුහිමියන්ට ලබා දී ඇති සේවාව පිළිගැනීම (CSM මුදා හැරීම), ආර්ථික නොවන අවදානමෙන් මුදාහැරීම (අවදානම ගැලපීම් මුදාහැරීම) සහ ආයෝජන ලාභය මගිනි.

රක්ෂණ ඔප්පුහිමියාට ලබා දුන් සේවා පිඹිබිඹු කරමින් රක්ෂණ ගිවිසුමේ ආවරණ කාල සීමාව තුළ ලාභය ලෙස ගිවිසුම් සේවා ආන්තිකයක් මුදා හරිනු ලැබේ. සහභාගී අංගයන් සහිත ඇතැම් ගිවිසුම් සඳහා (අදාළ ආයෝජනවල සාධාරණ වටිනාකමෙන් සැලකිය යුතු කොටසක් සහ අනෙකුත් පාදක කර ගත් අයිතම රක්ෂණ ඔප්පු හිමියන්ට ගෙවනු ලබන අවස්ථාව) කොටස් හිමියන්ට ගෙවන විචල්‍ය ගාස්තුව ගිවිසුම් සේවා ආන්තිකය මඟින් පිළිබිඹු කරයි. මෙම ගිවිසුම් සඳහා, ආර්ථික අත්දැකීම් සහ උපකල්පනවල වෙනස්කම් පිළිබිඹු වන පරිදි ගිවිසුම් සේවා ආන්තිකය ගලපනු ලබයි.

අනෙකුත් සියලුම ගිවිසුම් සඳහා ගිවිසුම් සේවා ආන්තිකය ගලපනු ලබන්නේ ආර්ථික නොවන උපකල්පන සඳහා පමණි. රක්ෂණ ආදායම පිළිබඳ නව මිනුමක් SLFRS 17 විසින් හඳුන්වා දී ඇති අතර එය රක්ෂණ ඔප්පු හිමියන්ට සේවා සැපයීම සහ රක්ෂණ ඔප්පුවල ආයෝජන අංගවලට අදාළ ඕනෑම වාරිකයක් ඇතුලත් නොවීම මත පදනම් වී ඇත. ඒවා දැනට ආදායම් ප්‍රකාශයේ වාර්තා වී තිබෙන දැනට පවතින වාරික ආදායම් පියවරයන්ට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වනු ඇත. SLFRS 17 වෙත මාරුවීම සඳහා, සංක්‍රාන්ති දිනයේ දී ගිවිසුම් සේවා ආන්තිකය වන විලම්බිත ලාභ ප්‍රමාණය තීරණය කිරීම සිදු කළ යුතුය.

SLFRS 17 මගින් ප්‍රමිතීන් අතීතානුයෝගීව යොදා ගෙන ඇති පරිදි ගිවිසුම් සේවා ආන්තිකය ගණනය කිරීම අවශ්‍ය වේ. මෙය ප්‍රායෝගික නොවේ නම්, සංක්‍රාන්ති දිනයේදී වගකීම්වල සාධාරණ වටිනාකම සඳහන් කරමින් සරල කළ අතීතානුයෝගී ප්‍රවේශයක් තෝරා ගැනීමට හෝ ගිවිසුම් සේවා ආන්තිකය තීරණය කිරීම ආයතනයකට අවශ්‍ය වේ. ගිවිසුම් සේවා ආන්තිකය තීරණය කිරීමේ ප්‍රවේශයට කොටස් හිමියන්ගේ ස්කන්ධය සහ අනාගත වාර්තාකරණ කාල පරිච්ඡේදයන් තුළ බලපවත්වන ව්‍යාපාරයට ලැබෙන ලාභයේ ප්‍රමාණයට යන දෙකටම සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇත.

නව ප්‍රමිතියේ අවශ්‍යතා සංකීර්ණ වන බැවින් සහ රක්ෂණ ගිවිසුම් සඳහා ගිණුම්කරණයේ මූලික වෙනසක් මෙන්ම සැලකිය යුතු විනිශ්චයක් සහ නව තක්සේරුකරණ ක්‍රමවේදයන් භාවිතා කිරීම අවශ්‍ය වන බැවින්, SLFRS 17 මගින් මූල්‍ය ප්‍රකාශන සහ අනාවරණයන් ඉදිරිපත් කිරීමේදී සැලකිය යුතු වෙනසක් අපේක්ෂා කරයි. මෙම ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අවශ්‍ය වෙනස්කම් වල බලපෑම දැනට අවිනිශ්චිත නමුත් මෙම වෙනස්කම් අනෙකුත් කරුණු අතර ලාභ හඳුනාගැනීමේ කාලය වෙනස් කරනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

SLFRS 17 ක්‍රියාත්මක කිරීමත් සමඟ, රක්ෂණ ආශ්‍රිත වත්කම් හා වගකීම් සඳහා ඡායා ගිණුම්කරණය අදාළ නොවනු ඇත.

SLFRS 17 ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනක් සමාගම සතු වේ. ගිණුම්කරණ ප්‍රතිපත්ති සැකසීම සහ අදාළ කර ගැනීමේ ක්‍රමවේදයන් සැකසීම, යෝග්‍ය ක්‍රියාවලි සහ පාලනයන් ස්ථාපිත කිරීම, සුදුසු දිනයක් නිශ්චය කිරීම සහ ආයුගණන හා මූල්‍ය පද්ධති වෙනස්කම් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහන වගකීම දරයි.

5. මූල්‍යමය ආයෝජන

දෙසැම්බර් 31 දිනට		සමූහය				සමාගම			
		2022		2021		2022		2021	
	සටහන	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
මූල්‍ය ආයෝජන									
කල්පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් (HTM)	5.1	71,832,664	43,232,680	60,916,652	59,364,484	71,832,664	43,232,680	60,916,652	59,364,484
ණය හා ලැබීම් (L & R)	5.2	69,065,402	69,065,402	51,541,273	51,541,273	62,142,194	62,142,194	46,691,301	46,691,301
විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් (AFS)	5.3	51,513,246	51,513,246	65,429,537	65,429,537	51,513,246	51,513,246	65,429,537	65,429,537
ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් (FVTPL)	5.4	25,763,811	25,763,811	22,859,816	22,859,816	25,763,811	25,763,811	22,859,816	22,859,816
මුළු මූල්‍ය ආයෝජන		218,175,123	189,575,139	200,747,278	199,195,110	211,251,915	182,651,931	195,897,306	194,345,138

5.1 කල්පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් (HTM)

දෙසැම්බර් 31 දිනට		සමූහය				සමාගම			
		2022		2021		2022		2021	
	සටහන	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
භාණ්ඩාගාර බැඳුම්කර		69,802,527	41,202,543	60,916,652	59,364,484	69,802,527	41,202,543	60,916,652	59,364,484
ලැයිස්තුගත ණයකර		2,030,137	2,030,137	–	–	2,030,137	2,030,137	–	–
		71,832,664	43,232,680	60,916,652	59,364,484	71,832,664	43,232,680	60,916,652	59,364,484

5.2 ණය හා ලැබීම් (L & R)

දෙසැම්බර් 31 දිනට		සමූහය				සමාගම			
		2022		2021		2022		2021	
	සටහන	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
ලැයිස්තුගත නොකළ ණයකර		23,371,379	23,371,379	22,343,977	22,343,977	23,371,379	23,371,379	22,343,977	22,343,977
කාලීන තැන්පතු		28,962,533	28,962,533	16,440,634	16,440,634	22,039,325	22,039,325	11,590,662	11,590,662
සංවර්ධන බැඳුම්කර		19,407,639	16,731,490	12,756,662	12,756,662	19,407,639	16,731,490	12,756,662	12,756,662
(-) හානිකරණය සඳහා වෙන් කිරීම	5.2.1	(2,676,149)	–	–	–	(2,676,149)	–	–	–
		69,065,402	69,065,402	51,541,273	51,541,273	62,142,194	62,142,194	46,691,301	46,691,301

5.2.1 හානිකරණය සඳහා වෙන් කිරීම

සමාගම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මත රු. බිලියන 2.7 ක් හානිකරණ වෙන්කිරීමන් සිදු කර ඇත. මෙම තීරණය දේශීය රජයේ ණය ප්‍රතිවූහගතකරණය පිළිබඳ ප්‍රතිපත්ති සහ ප්‍රකාරතාව පිළිබඳ අවිනිශ්චිතතාව හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ලැබිය යුතු ප්‍රමාණයේ වටපිටාව පුරෝකථනය කළ නොහැකිවීමේ පදනම මත වී ව්‍යුත්පන්න වී ඇත.

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම ඉඩම භාවිතය සඳහා හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝර්ට් ගෘප් (පුද්ගලික) සමාගම සමඟ කල්බදු ගිවිසුමකට ඇතුළත් වී ඇත. (යොමු සටහන 9.4). ගිවිසුමට අනුව, සමාගම කල්බදු ඉඩම භාවිතය සඳහා බැංකු ඇපයක් ලබාදීම අවශ්‍යය. ඒ අනුව, බැංකු ඇපය ලබාගැනීම සඳහා, සමාගම මහජන බැංකුවේ තැන්පත් කළ රු. මිලියන 100ක් වන කාලීන තැන්පතුව කැපකර ඇත.

5.3 විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් (AFS)

	සමූහය				සමාගම			
දෙසැම්බර් 31 දිනට	2022		2021		2022		2021	
සමාගම/සමූහය	**ධාරණ අගය රු. '000**	**සාධාරණ අගය රු. '000**	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	**ධාරණ අගය රු. '000**	**සාධාරණ අගය රු. '000**	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
ලැයිස්තුගත කොටස්	12,688,898	12,688,898	20,373,280	20,373,280	12,688,898	12,688,898	20,373,280	20,373,280
ලැයිස්තුගත නොකළ කොටස්	7,850	7,850	7,850	7,850	7,850	7,850	7,850	7,850
ඒකක භාර	1,798,508	1,798,508	1,739,055	1,739,055	1,798,508	1,798,508	1,739,055	1,739,055
ලැයිස්තුගත ණයකර	33,756,794	33,756,794	39,379,579	39,379,579	33,756,794	33,756,794	39,379,579	39,379,579
භාණ්ඩාගාර බැඳුම්කර	3,261,196	3,261,196	3,929,773	3,929,773	3,261,196	3,261,196	3,929,773	3,929,773
	51,513,246	51,513,246	65,429,537	65,429,537	51,513,246	51,513,246	65,429,537	65,429,537

5.4 ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් (FVTPL)

	සමූහය				සමාගම			
දෙසැම්බර් 31 දිනට	2022		2021		2022		2021	
	ධාරණ අගය රු. '000	**සාධාරණ අගය රු. '000**	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	**ධාරණ අගය රු. '000**	**සාධාරණ අගය රු. '000**	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
ලැයිස්තුගත කොටස්	23,031,279	23,031,279	19,198,031	19,198,031	23,031,279	23,031,279	19,198,031	19,198,031
ඒකක භාර	2,732,532	2,732,532	3,661,785	3,661,785	2,732,532	2,732,532	3,661,785	3,661,785
	25,763,811	25,763,811	22,859,816	22,859,816	25,763,811	25,763,811	22,859,816	22,859,816

ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගය මත ආයෝජනය සහ විකිණීම සඳහා පවතින ආයෝජනයන් සාධාරණ අගය මත මිනුම් කර ඇත. කල් පිරීම සඳහා පවතින ආයෝජන සහ ණය හා ලැබිය හැකි මුදල් ක්‍රමක්ෂය පිරිවැය මත මිනුම් කර ඇත.

5. මූල්‍ය ආයෝජන (ඉතිරි කොටස...)

5.5 මූල්‍ය ආයෝජනවල ධාරණ අගයන් හී වෙනස්වීම

සමාගම	අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් රු. '000	ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය වත්කම් රු. '000	කල් පිරීම සඳහා පවතින මූල්‍ය වත්කම් රු. '000	ණය හා ලැබීම් රු. '000	එකතුව රු. '000
2022 ජනවාරි 01 දිනට	65,429,537	22,859,816	60,916,652	46,691,301	195,897,306
මිලදී ගැනීම්	–	12,586,624	12,025,744	45,639,763	70,252,131
කල්පිරීම්	(2,529,000)	(1,823,316)	(1,150,000)	(39,316,080)	(44,818,396)
බැහැර කිරීම්	(131,973)	(1,341,816)	–	–	(1,473,789)
වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තාකළ සාධාරණ අගයේ ලාභය	(9,206,870)	133,189	–	–	(9,073,681)
උපලබ්ධිත ප්‍රාග්ධන ලාභ/(අලාභ)	66,437	(6,917,712)	–	–	(6,851,275)
උපලබ්ධිත/උපලබ්ධිත නොවූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	–	–	6,325	–	6,325
වසර තුළ වත්කම් හානිකරණය	–	–	–	(2,676,149)	(2,676,149)
පොලී ක්‍රමක්ෂය	(3,192,627)	267,026	–	10,415,306	7,489,705
විදේශ මුදල් පරිවර්තන සැසඳුම්	805,080	–	–	–	805,080
පොලී ආදායම	4,443,909	–	7,541,262	5,897,343	17,882,514
පොලිය/කුපන් ලැබීම්	(4,171,247)	–	(7,507,319)	(4,509,290)	(16,187,856)
2022 දෙසැම්බර් 31 දිනට	51,513,246	25,763,811	71,832,664	62,142,194	211,251,915
2021 ජනවාරි 01 දිනට	55,420,405	15,346,680	51,885,785	47,654,464	170,307,334
මිලදී ගැනීම්	12,400,028	7,695,735	12,405,237	12,022,237	44,523,237
කල්පිරීම්	(2,950,243)	–	(3,651,700)	(13,230,065)	(19,832,008)
බැහැර කිරීම්	(57,000)	(7,729,791)	–	–	(7,786,791)
වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තාකළ සාධාරණ අගයේ ලාභය	5,248	7,684,338	(34,795)	–	7,654,791
උපලබ්ධිත ප්‍රාග්ධන ලාභ/(අලාභ)	(27,868)	–	–	–	(27,868)
උපලබ්ධිත/උපලබ්ධිත නොවූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	–	(167,020)	–	–	(167,020)
පොලී ක්‍රමක්ෂය	196,925	–	2,906	–	199,831
විදේශ මුදල් පරිවර්තන සැසඳුම්	81,185	29,874	–	845,184	956,243
පොලී ආදායම	4,148,386	–	5,755,061	3,848,681	13,752,128
පොලිය/කුපන් ලැබීම්	(3,787,529)	–	(5,445,842)	(4,449,200)	(13,682,571)
2021 දෙසැම්බර් 31 දිනට	65,429,537	22,859,816	60,916,652	46,691,301	195,897,306

සමූහය	අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම්	ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගය මූල්‍ය වත්කම්	කල් පිරීම සඳහා පවතින මූල්‍ය වත්කම්	ණය හා ලැබීම්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
2022 ජනවාරි 01 දිනට	65,429,536	22,859,818	60,916,654	51,541,271	200,747,278
මිලදී ගැනීම්	–	12,586,624	12,025,744	47,813,002	72,425,370
කල්පිරීම්	(2,529,000)	(1,823,316)	(1,150,000)	(39,416,080)	(44,918,396)
බැහැර කිරීම්	(131,973)	(1,341,816)	–	–	(1,473,789)
වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තාකළ සාධාරණ අගයේ ලාභය	(9,206,870)	133,188	–	–	(9,073,682)
උපලබ්ධිත ප්‍රාග්ධන ලාභ/(අලාභ)	66,437	(6,917,712)	–	–	(6,851,275)
උපලබ්ධිත/උපලබ්ධිත නොවූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	–	–	6,325	–	6,325
වසර තුළ වත්කම් හානිකරණය	–	–	–	(2,676,149)	(2,676,149)
පොලී ක්‍රමක්ෂය	(3,192,627)	267,025	–	10,415,306	7,489,704
විදේශ මුදල් පරිවර්තන සැසඳුම්	805,081	–	–	–	805,081
පොලී ආදායම	4,443,909	–	7,541,262	5,897,343	17,882,514
පොලිය/කුපන් ලැබීම්	(4,171,247)	–	(7,507,320)	(4,509,290)	(16,187,857)
2022 දෙසැම්බර් 31 දිනට	51,513,246	25,763,811	71,832,664	69,065,402	218,175,123
2021 ජනවාරි 01 දිනට	55,420,439	15,346,682	51,885,787	50,861,422	173,514,330
මිලදී ගැනීම්	12,400,028	7,695,735	12,405,237	13,665,213	46,166,213
කල්පිරීම්	(2,950,243)	–	(3,651,700)	(13,230,065)	(19,832,008)
බැහැර කිරීම්	(57,000)	(7,729,791)	–	–	(7,786,791)
වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තාකළ සාධාරණ අගයේ ලාභය	5,248	7,684,338	(34,795)	–	7,654,791
උපලබ්ධිත ප්‍රාග්ධන ලාභ/(අලාභ)	(27,868)	–	–	–	(27,868)
උපලබ්ධිත/උපලබ්ධිත නොවූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	–	(167,020)	–	–	(167,020)
පොලී ක්‍රමක්ෂය	196,925	–	2,906	–	199,831
විදේශ මුදල් පරිවර්තන සැසඳුම්	81,150	29,874	–	845,220	956,243
පොලී ආදායම	4,148,386	–	5,755,061	3,848,681	13,752,128
පොලිය/කුපන් ලැබීම්	(3,787,529)	–	(5,445,842)	(4,449,200)	(13,682,571)
2021 දෙසැම්බර් 31 දිනට	65,429,536	22,859,818	60,916,654	51,541,271	200,747,278

6. පරිපාලිත සමාගම්වල ආයෝජන

		සමාගම	
දෙසැම්බර් 31 වන විට	අනු සටහන	**2022 රු. '000**	2021 රු. '000
පිරිවැයට			
ලැයිස්තුගත පරිපාලිත සමාගම්	6.1	**2,764,196**	2,764,196
ලැයිස්තුගත නොකළ පරිපාලිත සමාගම්	6.2	**20,059,696**	20,059,696
		22,823,892	22,823,892

6.1 ලැයිස්තුගත පරිපාලිත

	2022				2021			
	කොටස් ගණන	**අයිතිය %**	**පිරිවැය රු. '000**	**සාධාරණ අගය රු. '000**	කොටස් ගණන	අයිතිය %	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000
ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පොදු සමාගම	**114,861,951**	**51.34%**	**2,764,196**	**11,405,792**	114,861,951	51.34%	2,764,196	6,409,297
			2,764,196	**11,405,792**			2,764,196	6,409,297

6.2 ලැයිස්තුගත නොකළ පරිපාලිත සමාගම්

දෙසැම්බර් 31 දිනට	2022			2021		
	කොටස් ගණන	**SLIC අයිතිය %**	**ධාරණ අගය රු. '000**	කොටස් ගණන	SLIC අයිතිය %	ධාරණ අගය රු. '000
ලිට්රෝ ගෑස් ලංකා සමාගම	**35,976,853**	**99.94%**	**3,510,063**	35,976,853	99.94%	3,510,063
ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම	**158,710,945**	**100.00%**	**5,280,188**	158,710,945	100%	5,280,188
මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම	**5**	**100.00%**	**–**	5	100%	–
කැන්විල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම	**1,085,294,117**	**52.05%**	**10,399,358**	1,085,294,117	52.05%	10,399,358
කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම	**87,008,686**	**100.00%**	**870,087**	87,008,686	100%	870,087
			20,059,696			20,059,696

2021 මූල්‍ය වසර තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව කැන්විල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගමේ රු. බිලියන 2 ක අමතර ආයෝජනයක් සිදුකර ඇති අතර කැන්විල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගමේ කොටස් හිමිකාරත්වය 45.95% සිට 52.05% දක්වා වැඩි වී ඇත.

කැන්විල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

		සමාගම	
දෙසැම්බර් 31 වන විට	හිමිකාර ප්‍රතිශතය	**2022 රු. '000**	2021 රු. '000
සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම	100%	**19,999,999,995**	19,999,999,995
හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම	100%	**500,000,000**	500,000,000
නිල්යාන් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම	100%	**10**	10
		20,500,000,005	20,500,000,005
හානිකරණය සඳහා වෙන් කිරීම		**(10)**	(10)
		20,499,999,995	20,499,999,995

නිල්යාන් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම ව්‍යාපාර කටයුතු ඉදිරියට නොකරන බැවින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යන ලේඛනයෙන් සමාගමේ නම කපා හැරීමට තීරණය කර ඇත. ඒ අනුව 2017 වසරේදී නිල්යාන් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම යටතේ රු. 10/- ක ආයෝජනයේ වටිනාකම සඳහා වෙන් කිරීම් සිදුකර ඇත.

6.3 ප්‍රධාන පරිපාලිත සමාගම්වල සමූහයේ අයිතිය

NCI විසින් දරනු ලබන සමූහයේ සංයුතිය සහ හිමිකාරිත්වයේ ප්‍රමාණය පහත දැක්වෙන අනාවරණයන් ගෙන් අනාවරණය වේ.

සමාගම	ප්‍රධාන කටයුතු	කොටස් පන්තිය	සමූහ හිමිකම		පාලනය නොවන අයිතිය	
			2022 %	2021 %	**2022 %**	2021 %
ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පොදු සමාගම	සෞඛ්‍යාරක්ෂාව සහ රසායනාගාර සේවා	සාමාන්‍ය	**51.34%**	51.34%	**48.66%**	48.66%
ලංකා හොස්පිටල්ස් ඩයනොස්ටික්ස් සමාගම	සෞඛ්‍යාරක්ෂාව සහ රසායනාගාර සේවා	සාමාන්‍ය	**51.34%**	51.34%	**48.66%**	48.66%
ලිට්රෝ ගෑස් ලංකා සමාගම	ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් ආනයනය, සැකසීම, ගබඩා කිරීම, බෙදා හැරීම, විකිණීම සහ වෙනත් ආනුෂාංගික සේවා සැපයීම	සාමාන්‍ය	**99.94%**	99.94%	**0.06%**	0.06%
ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම	ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සඳහා තොග ගබඩා පහසුකම් සැපයීම	සාමාන්‍ය	**100.00%**	100.00%	**0.00%**	0.00%
කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම	හෝටල් ව්‍යාපාර	සාමාන්‍ය	**100.00%**	100.00%	**0.00%**	0.00%
කැන්විල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම	විනෝදාස්වාද අංශය සම්බන්ධ ආයෝජන ප්‍රවර්ධනය	සාමාන්‍ය	**76.01%**	79.06%	**23.99%**	20.94%
සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම	හෝටල් ව්‍යාපාර	සාමාන්‍ය	**76.01%**	79.06%	**23.99%**	20.94%
හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම	හෝටල් ව්‍යාපාර	සාමාන්‍ය	**76.01%**	79.06%	**23.99%**	20.94%
මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම	කළමනාකරණ සේවා	සාමාන්‍ය	**100.00%**	100.00%	**0.00%**	0.00%

6. පරිපාලිත සමාගම්වල ආයෝජනය (ඉතිරි කොටස...)

6.4 පාලනය නොවන අයිතිය (NCI)

6.4.1 වැදගත් පාලනය නොවන අයිතිය සමඟ පරිපාලිත සමාගම්

පහත වගුවෙන් සමූහයට වැදගත් පාලනය නොවන අයිතියක් ඇති සමූහයේ පරිපාලිත සමාගම්වලට අදාළ තොරතුරු සාරාංශ කෙරේ.

ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පදනමින් ව්‍යාපාර සමූහයට අදාල කිසියම් පාලනය නොවන අයිතියක් සමූහය විසින් හඳුනාගෙන නොමැත.

පරිපාලිත සමාගමේ නම	ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පොදු සමාගම	ලිට්රෝ ගෑස් ලංකා සමාගම	කැන්විල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම
NCI හිමිකාර අයිතිය	රු. '000	රු. '000	රු. '000
	48.66%	0.06%	23.99%
සාරාංශකළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය			
ජංගම නොවන වත්කම්	5,703,371	19,194,405	20,502,034
වර්තන වත්කම්	9,630,559	9,584,554	378,518
ජංගම නොවන වගකීම්	(1,618,575)	(15,495,518)	(570)
වර්තන වගකීම්	(1,734,304)	(2,284,028)	(16,458)
ශුද්ධ වත්කම්	11,981,051	10,999,413	20,863,524
NCI ට ආරෝපනය වන ශුද්ධ වත්කම් (යම් අන්තර සමූහ ඉවත්කිරීම්වලට පෙර)	5,830,094	7,072	5,005,754
සාරාංශකළ විස්තරාත්මක ආදායම් ප්‍රකාශය			
ආදායම	10,697,888	79,982,082	–
වසර සඳහා ලාභය	3,246,857	904,548	(4,300)
අනෙකුත් විස්තරාත්මක ආදායම්/(වියදම්)	128,315	15,576	(53)
මුළු විස්තරාත්මක ආදායම්	3,375,172	920,124	(4,353)
NCI ට වෙන් කළ ලාභය	1,579,952	582	(1,032)
NCI ට වෙන්කළ වෙනත් විස්තරාත්මක ආදායම්	62,439	10	(13)
සාරාංශකළ මුදල් ප්‍රවාහ ප්‍රකාශය			
මෙහෙයුම් කාර්යයන්ගේ (භාවිතාකළ) මුදල් ප්‍රවාහ	804,158	(7,891,936)	(5,588)
ආයෝජන කාර්යයන්ගේ (භාවිතාකළ) මුදල් ප්‍රවාහ	171,058	(14,531)	1,627
මූල්‍ය කාර්යයන්ගේ (භාවිතාකළ) මුදල් ප්‍රවාහ	(762,965)	3,676,298	–
මුදල් හා මුදලට සමාන දෑ හී ශුද්ධ වැඩිවීම	212,251	(4,230,169)	(3,961)

6.4.2 පාලනය නොවන අයිතියේ වෙනස්වීම

සමූහය

	2022 රු. '000	2021 රු. '000
වසර ආරම්භයේදී ශේෂය	9,125,663	8,985,168
වසර සඳහා ලාභය	995,460	1,253,992
අනෙකුත් විස්තරාත්මක ආදායම් බද්දෙන් ශුද්ධ	1,790,363	535,559
වසර සඳහා NCI ට ගෙවූ ලාභාංශ	(326,611)	(190,523)
පාලනයේ වෙනසක් නොමැතිව NCI අත්කර ගැනීම	–	(1,458,533)
පරිපාලිත සමාගම්වල දරන ප්‍රතිශතයේ වෙනස්වීමේ බලපෑම	1,312,704	–
වසර අවසානයේදී ශේෂය	12,897,579	9,125,663

7. ආශ්‍රිත සමාගම්වල ආයෝජන

සමූහය/සමාගම	2022				2021			
	කොටස් ගණන	අයිතිය %	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000	කොටස් ගණන	අයිතිය %	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000
සීබැන්ක් ඇසට් මැනේජ්මන්ට් සමාගම	759,998	26.57%	191,295	191,295	759,998	26.57%	191,295	191,295
සිලෝන් ඇසට් මැනේජ්මන්ට් කම්පැනි සමාගම	1,250,000	18.95%	7,378	7,378	1,250,000	18.95%	7,378	7,378
			198,673	198,673			198,673	198,673

**ඉහත ආයෝජනයන් ආයෝජකයාගේ ශුද්ධ වත්කම් අගයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කොටස මැන (මූල්‍ය ප්‍රකාශයන් මත පදනම්ව) ඇති අතර වටිනාකම්වල වෙනස්කම් මූල්‍ය ප්‍රකාශයන්හි පිළිගෙන ඇත. ඉහත හවුල්කරුවන්ගේ ප්‍රධාන ක්‍රියාකාරකම් අරමුදල් කලමනාකරණය වන අතර බදුකරණයෙන් පසුව සමූහයේ හෝ කොටස්වල ලාභය මත හෝ මුදල් මත ප්‍රමාණවත් බලපෑමක් නොමැත.*

8. දේපල, පිරියත හා උපකරණ

8.1 සමූහය

දෙසැම්බර් 31 දිනට	සටහන	2022 රු. '000	2021 රු. '000
ධාරණ අගය		44,866,415	44,936,097
නොනිමි වැඩ	8.1.3	30,560,387	20,455,410
		75,426,802	65,391,507

දෙසැම්බර් 31 දිනට	ඉඩම්	සිත්නක්කර ඉඩම් මත ගොඩනැගිලි	කල්බදු ඉඩම් මත ගොඩනැගිලි	උපකරණ	ලීබඩු හා සවිකිරීම්	මෝටර් රථ
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය/ඇගයීම						
සින්නක්කර						
2022 ජනවාරි 01 දිනට ශේෂය	16,098,999	2,929,962	7,848,638	5,591,474	902,827	1,061,261
වසර තුළ එකතු කිරීම්	226,200	45,022	28,833	426,180	99,451	4,810
ප්‍රත්‍යාගණනය	186,880	–	487,014	–	–	–
පිරිවැයට සමුච්චිත ක්ෂයකිරීමට මාරු කිරීම	–	–	–	–	–	–
ප්‍රත්‍යාගණන සංචිතයට පිරිවැය මාරු කිරීම්	–	–	–	–	–	–
බැහැර කිරීම්	–	–	–	(41,507)	(1,022)	(4,491)
පිරිවැයට ගැලපීම්	–	3,867	(133,438)	(188,971)	(7,379)	31,820
ආයෝජන දේපලෙන් මාරු කිරීම්	–	–	–	–	–	–
වැඩකිරීමේ ප්‍රගතියෙන් මාරු කිරීම්	–	–	32,224	607	–	–
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	16,512,079	2,978,851	8,263,271	5,787,783	993,877	1,093,400
සමුච්චිත ක්ෂය කිරීම						
සින්නක්කර						
2022 ජනවාරි 01 දිනට ශේෂය	12,763	60,860	260,716	3,315,013	524,516	84,887
වසර තුළ ක්ෂයකිරීමේ ගාස්තුව	1,741	155,233	173,029	396,271	85,581	311,839
සමුච්චිත ක්ෂයකිරීමට පිරිවැය මාරු කිරීම	–	–	–	–	–	–
ප්‍රත්‍යාගණන සංචිතයට ක්ෂය කිරීම් මාරු කිරීම්	–	–	–	–	–	–
බැහැර කිරීම්	–	–	–	(30,567)	(657)	(4,431)
සමුච්චිත ක්ෂයකිරීමට ගැලපීම	–	3,865	(133,438)	(193,597)	(7,379)	31,821
ප්‍රත්‍යාගණනය	–	–	(284,263)	–	–	–
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	14,504	219,958	16,044	3,487,120	602,061	424,116
ශුද්ධ පොත් අගය						
2021 දෙසැම්බර් 31 දිනට	16,086,236	2,869,102	7,587,922	2,276,461	378,311	976,374
2022 දෙසැම්බර් 31 දිනට	16,497,575	2,758,893	8,247,227	2,300,663	391,816	669,284

විදුලිජනක යන්ත්‍ර මගී සෝපාන	වෑද්දුම් සහ සවිකිරීම්	වායු සමීකරණ යන්ත්‍ර	පිරියත හා යන්ත්‍ර	ගබඩා, ටැංකි, පොම්ප කල, නළ මාර්ග සහ පොම්පාගාර	එල්පී ගෑස් සිලින්ඩර්	වෙනත්	**එකතුව 2022**	එකතුව 2021
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
58,953	5,283	145,828	1,531,240	5,494,388	17,987,272	387,851	**60,043,976**	54,471,811
32,564	56	14,823	31,984	–	–	73,969	**983,892**	682,717
–	–	–	–	–	–	–	**673,894**	3,402,340
–	–	–	–	–	–	–	**–**	(526,689)
–	–	–	–	–	–	–	**–**	1,283,910
(4,524)	–	–	–	–	–	(9,480)	**(61,024)**	(76,626)
–	–	–	(110,537)	(1,685,003)	–	–	**(2,089,641)**	–
–	–	–	–	–	–	–	**–**	709
–	9,518	–	54,736	2,954	21,957	–	**121,996**	805,804
86,993	14,857	160,651	1,507,423	3,812,339	18,009,229	452,340	**59,673,093**	60,043,976
12,865	23,855	31,107	533,189	2,274,464	7,678,543	295,101	**15,107,879**	14,459,727
17,210	(18,632)	15,246	74,382	222,901	650,195	41,878	**2,126,874**	1,917,441
–	–	–	–	–	–	–	**–**	(526,689)
–	–	–	–	–	–	–	**–**	(671,104)
(4,524)	–	–	–	–	–	(9,363)	**(49,542)**	(71,496)
–	–	–	(110,538)	(1,685,004)	–	–	**(2,094,270)**	–
–	–	–	–	–	–	–	**(284,263)**	–
25,551	5,223	46,353	497,033	812,361	8,328,738	327,616	**14,806,678**	15,107,879
46,088	(18,572)	114,721	998,051	3,219,924	10,308,729	92,750		44,936,097
61,442	9,634	114,298	1,010,390	2,999,978	9,680,491	124,724	**44,866,415**	

8. දේපල, පිරියත හා උපකරණ (ඉතිරි කොටස...)

8.1 සමූහය (ඉතිරි කොටස...)

8.1.1 ඉඩම්

සින්නක්කර ඉඩම්

ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පොදු සමාගම – ප්‍රත්‍යගණන අගයට ගෙන යන ලදී

ස්ථානය	ප්‍රමාණය (පර්චස්)	තක්සේරු කළ ක්‍රමය	දේපල තක්සේරුකරු	තක්සේරුව බලාත්මක දිනය	නිරීක්ෂණය කළ නොහැකි වැදගත් යෙදවුම්	**2022 දෙසැම්බර් 31 දිනට ධාරණ අගය රු.**	ප්‍රත්‍යාගණන අතිරික්තය රු.	පිරිවැයට ධාරණ අගය රු.
හත්බෝධිය, කිරුල පාර, නාරාහේන්පිට, කොළඹ 05	10.35	විවෘත වෙළඳපොළ ඇගයීම් ක්‍රමය	ඒ. ඒ. එම්. ෆාතිහු මහතා (FIV) වරලත් තක්සේරුකරු	2022 දෙසැම්බර් 31 වන දිනට	පර්චසයක තක්සේරු මිල රු. 4,226,044.25	**43,739,559**	37,271,112	6,468,447
හත්බෝධිය, කිරුල පාර, නාරාහේන්පිට, කොළඹ 05	10.00	විවෘත වෙළඳපොළ ඇගයීම් ක්‍රමය	ඒ. ඒ. එම්. ෆාතිහු මහතා (FIV) වරලත් තක්සේරුකරු	2022 දෙසැම්බර් 31 වන දිනට	පර්චසයක තක්සේරු මිල රු 4,226,044.25	**42,260,443**	36,010,737	6,249,706
						86,000,002	73,281,849	12,718,153

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම ගොඩනැගිලිද සමඟ 2014 වර්ෂයේදී ඉඩම් කැබලි තුනක් නියාමන අවශ්‍යතාවලට අනුකූලව මිලදී ගත් අතර එම ගොඩනැගිලි කඩා ඉවත් කර උත්සව ශාලාව තවදුරටත් පුළුල් කිරීම, රථවාහන නැවතුම්පළට පහසුකම් සැලසීම, රථ වාහන සංසරණය ප්‍රතිසංවිධානය කිරීම පහසුකම් සැලසීම එහි අරමුණ විය. 2013 වර්ෂයේ දී මිලදී ගත් එම දේපළවල මුළු පිරිවැය රු. 1,139,357,179/- ක් විය. එම මුළු පිරිවැය සින්නක්කර ඉඩම සහ ක්‍රියාත්මක ප්‍රාග්ධන කාර්යය අතර වෙන්කරනු ලබයි. සින්නක්කර ඉඩමට වෙන් කරන ලද පිරිවැය, පර්චස් එකකට රු මිලියන 7 ක් ලෙස රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තීරණය කරන ලද තක්සේරුව මත පදනම්ව තීරණය කරනු ලැබ ඇත.

එමගින් රු. 716,734,184 ක් සින්නක්කර ඉඩම මිලදී ගැනීමේ පිරිවැය ලෙස වෙන් කරනු ලබයි. ඉඩම් කැබලි තුනේ වපසරිය තක්සේරු අංක 112 - පර් 62.77, තක්සේරු අංක 108 - පර් 15 සහ තක්සේරු අංක 134 - පර් 20.10 කි.

ඉහත සින්නක්කර ඉඩමට අමතරව සමාගම, සී/ස සෙලින්කෝ හෝම්ස් ඉන්ටනැෂනල් සමාගමට අයත්ව තිබූ ඉඩමේ ආසන්න වශයෙන් පර්චස් 22.56 ක ප්‍රමාණයක පදිංචිව සිටින අතර එයට අදාළ නෛතික ප්‍රතිවිපාක පහත දක්වේ.

අංක DLM/43/18 දරණ නඩුව සිනෝ ලංකා හෝටල් සහ ස්පා (පුද්ගලික) සමාගමට එරෙහිව සෙලින්කෝ හෝම්ස් ඉන්ටර්නැෂනල් සමාගම විසින් කොළඹ දිසා අධිකරණයේ ගොනු කරනු ලැබූ අතර ඔවුන් අදාල දේපලෙහි නීත්‍යානුකූල දේපල හිමිකරු බවට අධිකරණයෙන් ප්‍රකාශයක් නිකුත් කරන ලෙසත්, වර්තමාන පදිංචිකරු නෙරපා හරින ලෙසත් දේපලෙහි අලාභ අයකර ගැනීමට සහ දේපලෙහි වැඩිදුර ඉදිකිරීම් සිදුකිරීමෙන් හා සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම වැලැක්වීම සඳහා ස්ථිර තහනම් නියෝගයක් නිකුත් කරන ලෙසත් ඉල්ලා සිටින ලදී. පසුව මෙම නඩුව කොළඹ දිසා විනිසුරු විසින් 2018 ජූලි 24 දිනැති නියෝගය මගින් ප්‍රතික්ෂේප කරන ලදී.

පසුව, පැමිණිලිකරුගේ නීතීඥයින් විසින් ප්‍රශ්නගත දේපල නැවත මැනීම සඳහා අධිකරණයෙන් අවසර ඉල්ලා සිටි අතර, එසේ නැවත මනින ලද සැලැස්ම බලයලත් මිනින්දෝරුවරයා විසින් 2019 අගෝස්තු 07 වන දින අධිකරණයට ඉදිරිපත් කරන ලදී. සෙලින්කෝ හෝම්ස් ඉන්ටර්නැෂනල් සමාගම විසින් එම දේපලටම සම්බන්ධයෙන් සීනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමට එරෙහිව අභියාචනාධිකරණයේ පවරා ඇති සීඒ (රිට්) අංක 219/18 දරණ අයදුම්පත සම්බන්ධයෙන් තීරණයක් ලැබෙන තෙක් අධිකරණය විසින් නඩු විභාගය කල් දමන ලදී.

සීඒ (රිට්) අංක 219/18 දරණ අයදුම්පත-ඉඩමේ සත්තකය ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් කඩිනමින් ලබා ගැනීම පිණිස 2018 අප්‍රේල් 04 දිනැති අංක 2065/24 දරණ අති විශේෂ ගැසට් පත්‍රය ඔස්සේ රේඛීය අමාත්‍යාංශය (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය) විසින් මෙම ඉඩමේ අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. කෙසේ වෙතත්, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38 (අ) වන වගන්තියේ විධිවිධාන යටතේ ලබා දී ඇති නියෝගය අවලංගු කරමින් සර්ටියෝරාරි රිට් නියෝගයක් නිකුත් කිරීම සඳහා සෙලින්කෝ හෝම්ස් ඉන්ටර්නැෂනල් සමාගම විසින් ඉඩම් අමාත්‍යාංශය, අත්පත්කර ගැනීමේ නිළධාරී, නාගරික සංවර්ධන අධිකාරිය සහ සීනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමට එරෙහිව සීඒ (රිට්) අයදුම්පත් අංක 219/18 2018 ජූලි මස 02 වන දින අභියාචනාධිකරණයට ඉදිරිපත් කර ඇත. අභියාචනාධිකරණය, වාර්තා කරන දිනය වන විටත් මෙම නඩුව පවත්වාගෙන යමින් පවතී.

කල්බදු ඉඩම

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම 2012 ජූලි 16 දිනැතිව නාගරික සංවර්ධන අධිකාරිය (UDA) (මෙහි මින් මතු කල්බදු දීමනාකරු ලෙස හඳුන්වනු ලබන) සමඟ ගිවිසුමකට එළඹුණු අතර එමඟින් සමාගමට සුඛෝපභෝගී හෝටල් සංකීර්ණයක් ඉදිකර පවත්වාගෙන යාම සඳහා කොටසක් ඉදිකරන ලද ගොඩනැගිල්ලක් ද සමඟ හෙක්ටයාර 0.6057 ක වපසරියෙන් යුත් අංක. 116, ගාලුපාර, කොළඹ 03 යන තක්සේරු අංකය දරන ඉඩමේ කැබැල්ලක් කල්බදු දීමනාකරු විසින් සමාගමට (මෙහි මින් මතු බදු ගැනුම්කරු ලෙස හඳුන්වනු ලබන) 99 අවුරුදු බද්දට, වාර්ෂිකව රු. 10,000 ක නාමික වාර්ෂික බදු මුදලකට පවරා දෙන ලදී. 99 අවුරුදු කාල සීමාව සඳහා නාමික වාර්ෂික බදු මුදල රු. 990,000/- එක වාරිකයකින් පියවීම සඳහා ගිවිසුමෙන් වැඩිදුරටත් ඉඩ සලසා දෙන ලදී.

කාලයත් සමඟින් බදු කාලසීමාව අවසන් වන විට නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම හෝ එහි අනුප්‍රාප්තිකයන්ට තවත් වසර 99ක් සඳහා හෝ නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සහ සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම අතර අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වන කාල සීමාවක් සඳහා අලුත් කිරීමට අවස්ථාව ලබා දෙනු ඇත.

අවස්ථාවෝචිත පරිදි එකී ගිවිසුම් කාල සීමාව අවසානයේ දී කල්බද්ද අවසන් කරන හෝ තීරණය කරන අවස්ථාවක දී හෝ කල්බදු දීමනාකරුට අයත් සියලුම ගොඩනැගිලි සමඟ සියලුම ගෘහභාණ්ඩ, සවිකිරීම් හා එහි ඇති සියලුම දේත් සමඟ එකී පවරන ලද පරිශ්‍රය බදු ගැනුම්කරු විසින් පවරනු ලැබීම මත බදු ගැනුම්කරු විසින් එසේ පවරා දෙනු ලබන කාල සීමාවේදී පවත්නා වෙළෙඳපළ වටිනාකමට ගොඩනැගිලි සහ එහි ඇති සියලුම දේත් මිලදී ගනු ඇත.

ඉහත කී බදු ගිවිසුමට අමතරව, කොළඹ 03 ගාලුපාරේ අංක 116 හි පිහිටි ඉහත කී ඉඩම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ ලේකම් වෙත සම්පූර්ණ සහ අවසන් මුදල් වශයෙන් සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම විසින් රු. බිලියන 5.0ක් ගෙවිය යුතු බව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කොට තිරණය කර ඇත. රු. බිලියන 1228ක වටිනාකමකින් යුත් සුඛෝපභෝගී හොටෙල් සංකීර්ණයක් ඉදිකොට පවත්වාගෙන යාම සඳහා 99 අවුරුදු බදු පදනම මත හෙක්ටයාර 0.6057ක වපසරියකින් යුත් ඉඩමට වටිනාකම ආරෝපණය කල හැකි බව තක්සේරු දෙපාර්තුමේන්තුව වැඩිදුරටත් තිරණය කර ඇත. ඉතිරි වටිනාකම දැනට කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ සඳහා ඇතුළත් කර ඇත. ඉහත සඳහන් රු. බිලියන 5.0න් රු. බිලියන 4.8ක් භාණ්ඩාගාරයේ ලේකම් වෙත මේ දක්වා ගෙවා ඇත. 2016 මූල්‍ය වසර තුළදී, භාණ්ඩාගාරයේ ලේකම් වෙත ගෙවිය හැකි ලෙස කලින් හඳුනාගෙන තිබූ රු. බිලියන 200 ක් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගෙන තිබූ තීරණයක් මත, පදනම්ව නැවත, සිදුකරමින් පැවති ප්‍රාග්ධන වැඩ නැවත පොත්වලට ඇතුළත් කරන ලදී.

SLFRS 16 – කල්බදු හඳුන්වා දීමත් සමඟ බදුකර ඉඩම වත්කම් භාවිත කිරීමේ අයිතිය ලෙස නැවත 2019 ජනවාරි 01 දින සිට නැවත වර්ගීකරණය කරන ලදී. කල්බදු මත භාවිතා කිරීමේ අයිතිය ඇති ඉඩම අත්පත් කරගැනීම සඳහා කලින් ගෙවන ලද මූලික පෙර ගෙවීම සහ කුලී ගෙවීම ප්‍රාග්ධනය සිදු කළ අතර ඉන් අනතුරුව ලබා දෙන ප්‍රතිලාභවල ස්වභාවයට අනුව බදු කාල සීමාව පුරා ක්‍රමක්ෂය කරයි.

හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම 2014 සැප්තැම්බර් 01 දිනැතිව නාගරික සංවර්ධන අධිකාරිය (මෙහි මින් මතු කල්බදු දීමනාකරු ලෙස හඳුන්වනු ලබන) සමඟ ගිවිසුමකට එළඹුණු අතර එමඟින් සුඛෝපභෝගී හෝටල් සංකීර්ණයක් ඉදිකර පවත්වාගෙන යාම සඳහා හෙක්ටයාර 3.812ක වපසරියෙන් යුත් හම්බන්තොට ලේවාය පාරේ පිහිටි ඉඩමේ කැබැල්ලක් කල්බදු දීමනාකරු විසින් සී/ස හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමට (මෙහි මින් මතු බදු ගැනුම්කරු ලෙස හඳුන්වනු ලබන) රු. 149,601,875/- ක මුදලකට 99 අවුරුදු බද්දට, පවරා දෙන ලදී. 99 අවුරුදු කාල සීමාව සඳහා නාමික වාර්ෂික බදු මුදල රු. 4,950,000/- ක එකවර ගෙවන වාරිකයකින් පියවීම සඳහා ගිවිසුමෙන් වැඩිදුරටත් ඉඩ සලසා දෙන ලදී. SLFRS 16 – "කල්බදු" යොදා ගැනීමත් සමඟ 2019 ජනවාරි 01 දින සිට කල්බදු ඉඩම භාවිතයට අයිතිය ඇති වත්කම් ලෙස නැවත වර්ගීකරණය කරන ලදී. කල්බදු මත භාවිතා කිරීමේ අයිතිය ඇති ඉඩම අත්පත් කරගැනීම සඳහා කලින් ගෙවන ලද මූලික පෙර ගෙවීම සහ කුලී ගෙවීම ප්‍රාග්ධනය සිදු කළ අතර ඉන් අනතුරුව ලබා දෙන ප්‍රතිලාභවල ස්වභාවයට අනුව බදු කාල සීමාව පුරා ක්‍රමක්ෂය කරයි.

8.1.2 කල්බදු ඉඩම මත ගොඩනැගිලි

දේපල, පිරියත හා උපකරණවල වටිනාකම පිළිබඳ විස්තර

ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පොදු සමාගම

සමාගමේ කල්බදු ඉඩම මත ඉදිකළ ගොඩනැගිල්ල වර්තමාන ප්‍රතිෂ්ඨාපන පිරිවැය පදනම මත 2022 දෙසැම්බර් අදාළ ස්ථානයේදී දේපල තක්සේරුව පිළිබඳ සුදුසු පළපුරුද්ද සහිත ස්වාධීන වරලත් තක්සේරුකරුවෙක් වන ඒ. ඒ. එම්. ෆාතිහු මහතා (MRICS) විසින් තක්සේරු කරන ලදී.

සමාගමේ සින්නක්කර ඉඩම වර්තමාන වෙළෙඳපොල වටිනාකම පදනම මත 2022 දෙසැම්බර් වරලත් තක්සේරුකරුවෙක් වන ඒ. ඒ. එම්. ෆාතිහු මහතා (MRICS) විසින් තක්සේරු කරන ලදී.

ස්ථානය	දේපල වර්ගය	තක්සේරු කළ ක්‍රමය	තක්සේරුවේ බලාත්මක දිනය	දේපල තක්සේරුකරු	නිරීක්ෂණය කළ නොහැකි වැදගත් යෙදවුම්	2022 දෙසැම්බර් 31 දිනට ධාරණ අගය රු.	වත්කම පිරිවැයට ගෙන ගියේනම් සමුච්චිත ක්ෂයකිරීම රු.	ශුද්ධ ධාරණ අගය රු.
අංක 578, ඇල්විටිගල මාවත, කොළඹ 05	ගොඩනැගිල්ල	වර්තමාන ප්‍රතිස්ථාපන පිරිවැය පදනම	2022 දෙසැම්බර් 31	වරලත් තක්සේරුකරු, ඒ. ඒ. එම්. ෆාතිහු මහතා (FIV),	වර්ග අඩියට ඇස්තමේන්තු වටිනාකම රු. 7,500 – 17,500	1,811,812,101	447,016,940	1,364,795,161

8. දේපල, පිරියත හා උපකරණ (ඉතිරි කොටස...)

8.1 සමූහය(ඉතිරි කොටස...)

8.1.3. නොනිමි ප්‍රාග්ධනය

	සමූහය		සමාගම	
වසර අවසානයේදී	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
වසර ආරම්භයේදී	20,455,410	16,740,141	–	–
වසර තුළදී දරන ලද පිරිවැය	1,877,813	3,346,943	–	–
වසර තුළදී ප්‍රාග්ධනීකරණය කරන ලද මුදල	(126,624)	(805,805)	–	–
වත්කම් ප්‍රත්‍යාගණනය	8,353,788	1,174,131	–	–
වසර අවසානයේදී	30,560,387	20,455,410	–	–

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

වාර්තාකරන දිනයට ඉදිකරමින් පැවති ග්‍රෑන්ඩ් හයාට් කලම්බෝ හි 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණන අගයට අංක 116, ගාලු පාර, කොළඹ 03 හි දේපලෙහි ඉදිකිරීමේ වටිනාකම නොනිමි ප්‍රාග්ධනය පිළිබිඹු කරයි.

2020 ජූලි 08 වන දින කැබිනට් ඇමති මණ්ඩල රැස්වීමේදී ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, 2020 වසර තුළ ග්‍රෑන්ඩ් හයාට් කලම්බෝ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කරන ලදී. නමුත් 2020 මැයි, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ග්‍රෑන්ඩ් හයාට් ව්‍යාපෘතිය අත්හිටුවීමට යෝජනා සම්මත කරන ලදී. ඊට අමතරව, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නවත්වා ඇති බැවින් ග්‍රෑන්ඩ් හයාට් ව්‍යාපෘතියට අදාළ කාර්ය මණ්ඩල වැටුප් සහ වෙනත් නඩත්තු වියදම් පරිපාලන වියදම් ලෙස හඳුනා ගැනීමට තීරණය කරන ලදී.

වසර තුළ, සමාගම මෙම ව්‍යාපෘතිය තුළ රු. මිලියන 1,708 (2021 – රු. මිලියන 2,108) වියදම් කර ඇත.

8.1.4. දේපල, පිරියත හා උපකරණ හානිකරණය

හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 16 දේපල පිරියත හා උපකරණ ට අනුකූලව, හම්බන්තොට හයාට් හෝටෙල් ඉදිකිරීම ආරම්භ කිරීම සඳහා දරන ලද මූලික පිරිවැය ප්‍රාග්ධනීයකරණය කරන ලදි. සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් හෝටලය ඉදිකිරීම නතර කිරීමට යෝජනා සම්මත කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යාපෘතිය සඳහා ඒ දක්වා දරන ලද පිරිවැය, එම පිරිවැය සමග සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභයන් සමාගම තුළට ගලා ඒමේ සම්භාවිතාවයක් නොමැති ඇති බැවින් හානිකරණය වී ඇති බවට සලකා ඇත. එබැවින්, රු. 111,103,548/- ක නොනිමි ප්‍රාග්ධනයේ හානිකරණය සඳහා වෙන් කිරීමක් 2015 වසරේ මූල්‍ය ප්‍රකාශයන් හි වාර්තාකරනු ලැබ ඇත.

හම්බන්තොට හෝටලය වසර 99 ක් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් ලබාගත් කල්බදු ඉඩමක ඉදිකිරීමට නියමිතව තිබුණි.

ඉඩමේ අයිතිය භාවිත කිරීම් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත අදාල බදු සමග ගෙවන ලද මුදල සහ ගෙවන ලද වෙනත් ගාස්තු 2014 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශයන්හි කල්බදු ඉඩම සහ දේපළ වශයෙන් හඳුනාගන්නා ලදී. හොටෙල් ව්‍යාපෘතිය නවතා දැමීමට සමාගම තීරණය කොට තිබූ බැවින් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සමාගම සතුව ඇති විකල්පයන් සොයා බලන ලදි. 2022 දෙසැම්බර් 31 වන දිනට රු. 157,814,563/- ක් වන ක්‍රමක්ෂය නොවූ කල්බදු ඉඩමේ වටිනාකම, එම දේපල බැහැර කිරීම මගින් නැවත අයකර ගත හැකි බව අධ්‍යක්ෂක මණ්ඩලයේ අදහස විය, එබැවින් දේපල සම්බන්ධයෙන් හානිකරණ වෙන්කිරීමක් සලකා බැලීම අවශ්‍ය නොවිය.

8.1.5. පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම්

ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පොදු සමාගම

2021 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 2.1ක (2021 රු. බිලියන 1.96) ක දළ ධාරණ අගයක් (පිරිවැය) සහිත පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම් දේපල, පිරියත සහ උපකරණ වලට ඇතුළත් විය.

ලිට්රෝ ගෑස් ලංකා සමාගම

2022 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත සහ උපකරණවල රු. 1,954,295,880ක (2021 – රු. 1,939,112,245) වන පිරිවැයක් සහිත පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම් ඇතුළත් විය.

කර්මාන්ත පරිවය සහ ඵලදායී ජීව කාලය පිළිබඳව අතීත අත්දැකීම් මත පදනම් ව 2020 වසර තුළ ජීව වායු ගෑස් සිලින්ඩරවල අපේක්ෂිත ආයු කාලය වසර 10 සිට වසර 20 දක්වා වෙනස් කරන ලදී.

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම

2022 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත සහ උපකරණවල පූර්ණ වශයෙන් ක්ෂය වූ, දැනටත් භාවිතා කරන වත්කම් ඇතුළත් විය. 2022 දෙසැම්බර් 31 දිනට මේවායේ පිරිවැය රු. 8,566,712 (2021 – රු. 5,906,765) කි.

රු. 315,976,666 (2021 – රු. 214,817,613) සහ රු. 32,261,051 (2021 – රු. 24,736,681) ක ක්ෂයකිරීමේ වියදම් පිළිවෙලින් විකුණුම් පිරිවැය සහ පරිපාලන වියදම්වල අය කරනු ලැබ ඇත.

8.1.6 වත්කම් ප්‍රතියෝග්‍යතාකරණය

ලිට්රෝ ගෑස් ලංකා සමාගම

ගබඩා ටැංකි, නලමාර්ග, පොම්පාගාර, උපකාරක උපකරණ, බව්සර් ටැංකි හා පිරියත සහ යන්ත්‍රෝපකරණ වැනි ඇතැම් වර්ගවල වත්කම් ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) කර්මාන්තයේ දී භාවිතා කිරීම සඳහා එකී වත්කම් අවශ්‍ය අපේක්ෂිත ප්‍රමිති සපුරා තිබේද යන්න තහවුරු කිරීමෙහිලා කලින් කල පරීක්ෂා කිරීම, ඇගයීම සහ ප්‍රතියෝග්‍යතාකරණය අවශ්‍යය. එවැනි වත්කමක් භාවිතා කිරීම සඳහා ප්‍රතියෝග්‍යතාකරණය කරනු ලැබීමේදී, වත්කමට අදාලව පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම හඳුනා නොගනියි. ප්‍රතියෝග්‍යතාකරණයෙන් අනතුරුව, වත්කමේ පෙර ලේඛනගත වටිනාකම සහ වත්කම ප්‍රතියෝග්‍ය කිරීමට දරන ලද අමතර පිරිවැය, වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට අනාගතයේදී ගලා එන බව අපේක්ෂා කරනු ලබන හෙයින් ප්‍රාග්ධනීකරණය කරනු ලබයි.

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම

ගබඩා ටැංකි, නළමාර්ග, පොම්පාගාර, උපකාරක උපකරණ, බව්සර් ටැංකි හා පිරියත සහ යන්ත්‍රෝපකරණ වැනි ඇතැම් වර්ගවල වත්කම් ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) කර්මාන්තයේ දී භාවිතා කිරීම සඳහා එකී වත්කම් අවශ්‍ය ආරක්ෂක ප්‍රමිති සපුරා තිබේද යන්න තහවුරු කිරීමෙහිලා කලින් කල පරීක්ෂා කිරීම, ඇගයීම සහ ප්‍රතියෝග්‍යතාකරණය අවශ්‍යය. එවැනි වත්කමක් භාවිතා කිරීම සඳහා ප්‍රතියෝග්‍යතාකරණය කරනු ලබන විට වත්කමට අදාලව පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම හඳුනා නොගනියි. ප්‍රතියෝග්‍යතාකරණයෙන් අනතුරුව වත්කමේ පෙර ලේඛනගත වටිනාකම සහ වත්කම ප්‍රතියෝග්‍ය කිරීමට දරන ලද අමතර පිරිවැය, වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට අනාගතයේදී ගලා එන බව අපේක්ෂා කරනු ලබන හෙයින් ප්‍රාග්ධනීකරණය කරනු ලබයි.

8.1.7 ප්‍රත්‍යාගණන ලාභ/(හානිකරණය)

ලිට්රෝ ගෑස් ලංකා සමාගම

ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් වශයෙන් වත්කමේ ධාරණ අගය වැඩිවීම, වෙනත් විස්තරාත්මත ආදායම් වලදී හඳුනාගෙන ප්‍රත්‍යාගණන අතිරික්තයන් යන ශීර්ෂය යටතේ ස්කන්ධය තුළ සමුච්චිත කර ඇත. අදාල වත්කම හා සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයේ පවතින කිසියම් හර ශේෂයක ප්‍රමාණයට යම් අඩු කිරීමක් වෙනත් විස්තරාත්මත ආදායම තුළ හඳුනා ගනී. කෙසේ වුවද, වත්කමක ධාරණ අගය හා සම්බන්ධ කිසියම් අමතර ප්‍රත්‍යාගණන අඩුවීමක් ඇත්නම් එය ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

ඉඩම්, ගොඩනැගිල්ල සහ මෝටර් රථ හැර දේපල, පිරියත සහ උපකරණ යටතේ වන සියලු වත්කම් 2015 වසර තුළ ප්‍රත්‍යාගණනය කර ඇත. දේපළ, පිරියත හා උපකරණයන් හි සාධාරණ අගය, වත්කම් වර්ග ප්‍රත්‍යාගණනය කිරීමේ පලපුරුද්ද සහිත බාහිර, ස්වාධීන වරළත් තක්සේරු සම්ක්ෂකයකු වන සුනිල් ප්‍රනාන්දු ඇන්ඩ් ඇසෝසියේට්ස් (පුද්ගලික) සමාගම විසින් තීරණය කරන ලදි.

ඉඩම්, ගොඩනැගිල්ල සහ මෝටර් රථ 2021 දෙසැම්බර් 31 දිනට, වත්කම් වර්ග ප්‍රත්‍යාගණනය කිරීමේ පලපුරුද්ද සහිත බාහිර, ස්වාධීන වරළත් තක්සේරු සම්ක්ෂකයකු වන IJVR කන්සල්ටන්සි (පුද්ගලික) සමාගම විසින් තීරණය කරන ලදි.

ශුද්ධ වාරික තක්සේරුකරණයෙ සිට දළ වාරික තක්සේරුකරණය (සහභාගීත්ව) දක්වා තක්සේරු කිරීමේ ක්‍රමවේදය වෙනස් කිරීම හේතුවෙන් නිර්මාණය කරන ලද අතිරික්තය" යටතේ සහභාගී වීමේ අරමුදලට අදාළ එකෝචිත අතිරික්තය ජීවිත අරමුදලේ පවතිනු ඇත. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම විසින් දෙන ලද උපදෙස් වලට අනුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් සහභාගී නොවන අරමුදලෙන් පැන නගින එකෝචිත අතිරික්තයක් කොටස් හිමියන්ගේ අරමුදලට මාරු කර ඇති අතර, "සීමිත නියාමන සංචිතය" නමින් නව රේඛීය අයිතමයක් යටතේ, 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ගණනය කරන ලදී. "සීමිත නියාමන සංචිතය" යනු කොටස්හිමියන්ගේ සක්න්ධයේ කොටසක් නමුත් එය කොටස් හිමියන්ට ලාභාංශ ලෙස බෙදා හැරීම IRCSL විසින් නියම කර ඇති පාලන අවශ්‍යතා සපුරාලීමට යටත් වන අතර එය නිදහස් කළ හැක්කේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම වෙතින් අනුමැතිය ලැබීමෙන් පසුව පමණි. 2020 දෙසැම්බර් 31 දිනට සහභාගීත්ව අරමුදල සහ කොටස් හිමියන්ගේ අරමුදලේ සීමිත නියාමන සංචිතය එකෝචිත අතිරික්තයක් ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් පවත්වා ගෙන යනු ලැබේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසමෙහි මඟ පෙන්වීම අනුව කොටස්හිමියන්ගේ අරමුදලේ එකෝචිත අතිරික්තය කොමර්ෂල් බැන්ක් පොදු සමාගම (ෆිච් ශ්‍රේණිගත කිරීම ඒ) හි ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත.

	රු. මිලියන
එකෝචිත අතිරික්තය රහිත දිගුකාලීන රක්ෂණ අරමුදල	150,438
NPV සිට GPV තක්සේරු ක්‍රමවේදය වෙනස් කිරීම හේතුවෙන් නිර්මාණය කරන ලද අතිරික්තය	6,281
2022 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණ අරමුදල	156,719

	රු. මිලියන
සීමාකල නියාමන සංචිතය (එකෝචිත අතිරික්ත සහභාගි නොවන අරමුදල)	98

2022 දෙසැම්බර් 31 දිනට ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ රක්ෂණ වෙන් කිරීම් ඇගයීම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙනුවෙන් විල්ස් ටවර්ස් වොට්සන්ස් හි Actuaries UK පීඨයේ සභය සාමාජික කුන්ජ් බෙහාරි මහේෂ්වරි විසින් සිදු කරන ලදි. උපදේශකවරයාගේ ආයුගණක වාර්තාවට අනුව, ඔප්පුහිමියන්ගේ ප්‍රසාද මුදල් සම්බන්ධයෙන් වන වගකීම වශයෙන් රු. මිලියන 972 ක (2021 දී රු. මිලියන 2,143) ප්‍රතිපාදනයක් ඇතුළත් කර ඇත. ආයුගණක උපදේශකවරයාගේ මතය වූයේ 2022 දෙසැම්බර් 31 වන දින ජීවිත රක්ෂණ අරමුදලේ පිළිගත හැකි වත්කම්, 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතේ 26 වගන්තිය යටතේ දක්වා ඇති අරමුදලේ වගකීම් සහ නුඹුන්වත් අන්තර අවශ්‍යතාව ආවරණය කිරීමට ප්‍රමාණවත් බවයි. අනාගත වර්ධනයන් සඳහා මෙන් ම ඇගයීමේ දක්වා ඇති අනුමානවල අහිතකර අපගමනයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා ද අතිරික්තය ජීවිත අරමුදල විසින් ඉදිරියට ගෙන යන ලදී.

2022 දෙසැම්බර් 31 වන දිනට ඔප්පුහිමියන්ගේ මාරුකිරීම් ද ඇතුළත්ව ජීවිත රක්ෂණ අරමුදල් වත්කම රු. මිලියන 159,736 කි (2021 – රු. මිලියන 157,569) ජීවිත රක්ෂණයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. මිලියන 3,017 ක් (2021 රු. මිලියන 4,984)ක් ඔප්පුහිමියන්ගේ අරමුදලට මාරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී. මෙම මාරුකිරීමට පසුව, ජීවිත රක්ෂණ අරමුදල රු. මිලියන 156,719 කි (2021 රු. මිලියන 152,585)

වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණය (LAT)

ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම් සඳහා බැරකම් ප්‍රමාණවත් බව සෙවීමේ පරීක්ෂණයක් SLFRS4 – රක්ෂණ ගිවිසුම් මගින් අවශ්‍ය කර ඇති පරිදි 2022 දෙසැම්බර් 31 වන දිනට විල්ස් ටවර් වොට්සන් හි Actuaries UK පීඨයේ සභය සාමාජික කුන්ජ් බෙහාරි මහේෂ්වරි විසින් සිදු කරන ලදි. එම පරීක්ෂණය සිදු කිරීමේදී, සමාගම විසින් විගණනය කරන ලද ගිණුම් අනුව පැවති ප්‍රතිපාදනයන් ආයු ගණක වගකීම සමග සසඳන ලදි. මෙම කාර්යය සඳහා, ආයු ගණක වගකීමේ අගය IRCSL විසින් දක්වා ඇති අවදානම් පාදක ප්‍රාග්ධන රාමුව තුළ සඳහන් කර ඇති මූලධර්ම අනුගමනය කරමින් ගණනය කරනු ලබන අතර එහිදි බලාත්මකව පවත්නා ජීවිත රක්ෂණ ගිවිසුම් හා සම්බන්ධ බැඳීම් නිරවුල් කිරීමට අවශ්‍ය සියලු මුදල් ලැබීම් සහ ගෙවීම් ප්‍රවාහයන්හි සම්පූර්ණ ආයුකාලය ආවරණය කරමින් වට්ටම් ලබාදෙන ලද මුදල් ප්‍රවාහ ප්‍රවේශය භාවිත කරමින් වගකීම් අගයනු ලැබේ. ප්‍රක්ෂේපනයන් 2022 දෙසැම්බර් 31 වන දිනට බලාත්මක ඔප්පු සහ අතිරේක කොන්දේසි මත පදනම්ව ඇත

2022 ආයුගණක වාර්තාවට අනුව, වට්ටම්කල මුදල් ප්‍රවාහ සංචිතයන් සමග සැසඳීමේදි සහ 2022 දෙසැම්බර් 31 වන දිනට සංචිතවලට වෙනසට අනුව වත්කම් අවශ්‍ය තරම් ප්‍රමාණවත් වේ. 2022 දෙසැම්බර් 31 වන දිනට වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂාව අනුව අතිරේක ප්‍රතිපාදනයක් අවශ්‍ය නොවේ.

24. රක්ෂණ ගිවිසුම් වගකීම් – ජීවිත නොවන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති පරිදි ජීවිත නොවන රක්ෂණ සංචිතයන් පහත තත්ත්වයන් නියෝජනය කරයි:

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 වන විට	සටහන	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ශුද්ධ නොඉපයූ වාරික සඳහා සංචිත	24.1	**9,188,361**	10,697,760	**9,188,361**	10,697,760
ඉඩම් හිමිකම් රක්ෂණය සඳහා සංචිතය සහ කල් නොපිරූ අවදානම් සංචිතය	24.2	**645,561**	632,379	**645,561**	632,379
දළ හිඟ හිමිකම් සඳහා සංචිත	24.3	**11,855,931**	9,549,408	**11,855,931**	9,549,408
		21,689,853	20,879,547	**21,689,853**	20,879,547

24.1 ශුද්ධ නොඉපයූ වරික සඳහා සංචිතය

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 වන විට	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
නොඉපයූ වාරික සඳහා සංචිතය				
ජනවාරි 01 දිනට ශේෂය	**12,229,437**	11,569,401	**12,229,437**	11,569,401
වසර තුළ මාරු කිරීම	**(625,700)**	660,036	**(625,700)**	660,036
දෙසැම්බර් 31 දිනට ශේෂය	**11,603,737**	12,229,437	**11,603,737**	12,229,437
නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික සඳහා සංචිතය				
ජනවාරි 01 දිනට ශේෂය	**(1,531,677)**	(1,078,430)	**(1,531,677)**	(1,078,430)
වසර තුළ මාරු කිරීම	**(883,699)**	(453,247)	**(883,699)**	(453,247)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**(2,415,376)**	(1,531,677)	**(2,415,376)**	(1,531,677)
ශුද්ධ නොඉපයූ වාරික සඳහා මුළු සංචිතය	**9,188,361**	10,697,760	**9,188,361**	10,697,760

24.2 හිමිකම් රක්ෂණය සඳහා සංචිතය හා නොඉපයූ අවදානම් සංචිතය

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 වන විට	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ඉඩම් හිමිකම් රක්ෂණය සඳහා සංචිතය				
ජනවාරි 01 දිනට ශේෂය	**632,380**	513,745	**632,380**	513,745
වසර තුළ මාරු කිරීම	**13,181**	118,634	**13,181**	118,634
දෙසැම්බර් 31 දිනට ශේෂය	**645,561**	632,379	**645,561**	632,379
ඉඩම් හිමිකම් රක්ෂණය සහ නොඉපයූ අවදානම් සංචිතය සඳහා මුළු සංචිතය	**645,561**	632,379	**645,561**	632,379

24.3 දළ හිඟ හිමිකම් සඳහා සංචිත

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 වන විට	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ජනවාරි 01 දිනට ශේෂය	6,677,738	5,630,195	6,677,738	5,630,195
වසර තුළ දරන ලද හිමිකම්	13,047,591	10,428,769	13,047,591	10,428,769
වසර තුළ ගෙවූ හිමිකම්	(10,826,566)	(9,381,226)	(10,826,566)	(9,381,226)
දෙසැම්බර් 31 දිනට ශේෂය	8,898,763	6,677,738	8,898,763	6,677,738
ජනවාරි 01 දිනට IBNR/IBNER ශේෂය	2,871,670	2,231,491	2,871,670	2,231,491
IBNR/IBNER හි වැඩිවීම/ අඩුවීම	85,498	640,179	85,498	640,179
දෙසැම්බර් 31 දිනට IBNR/IBNER ශේෂය	2,957,168	2,871,670	2,957,168	2,871,670
දළ හිඟ හිමිකම් සඳහා මුළු සංචිතය	11,855,931	9,549,408	11,855,931	9,549,408

හිමිකම් පෑම් දැනුම් දීමේදි සැළකිය යුතු ප්‍රමාදයන් සිදුවන අතර වාර්තා කරන දිනයට ස්ථිරව දැනගත නොහැකි හිඟ වගකීම් සහ අවසන් පිරිවැය තක්සේරු කිරීමේදි සැළකිය යුතු පලපුරුද්දක් සහ විනිශ්චයක් මැදිහත් වේ. දැනට පවතින තොරතුරු මත පදනම් ව සංචිතයන් තිරණය කරනු ලැබේ. කෙසේ වුවද, පසුව පසුකාලීන සංවර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් අවසන් වගකීම වෙනස්වීම ව්‍යාපාරයේ ස්වභාවයට ආවේනිකය.

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 වන විට	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
රක්ෂණ ගිවිසුම් බැඳීම් – ජීවිත නොවන සහ තාක්ෂණික සංචිත අතර සැසැඳීම				
රක්ෂණ ගිවිසුම් බැඳීම් – ජීවිත නොවන	21,689,852	20,879,547	21,689,852	20,879,547
ශුද්ධ විලම්භිත අත්කර ගැනීම් වියදම්වල සංචිතය	(520,172)	(483,822)	(520,172)	(483,822)
හිමිකම් සංචිත මත ප්‍රතිරක්ෂණය	(3,104,431)	(1,888,143)	(3,104,431)	(1,888,143)
තාක්ෂණික සංචිතය	18,065,249	18,507,582	18,065,249	18,507,582

24.4 හිමිකම් සංවර්ධන තොරතුරු

පහත වගුව මගින් ඓතිහාසික ජීවිත නොවන සංචිත, ශුද්ධ ප්‍රතිරක්ෂණයන්හි වෙනස්කම් පෙන්නුම් කරයි. වගුවේ මුල් පේළිය මගින් එම වසරේ සහ ඊට පෙර වසරවල අලාභ සඳහා ඇස්තමේන්තුගත අනාගත ගෙවීම් ප්‍රමාණ නියෝජනය කරන එක් එක් ශේෂ පත්‍ර දිනයට නොගෙවන ලද අලාභ සහ අලාභ ගැලපීම් වියදම් සඳහා ඇස්තමේන්තුගත දළ සංචිත පෙන්නුම් කරයි. වගුවේ සමුච්චිත ගෙවූ කොටස මගින් එක් එක් වසර අවසානයේ ස්ථාපිත සංචිතවලට අදාළ එක් එක් පසුකාලීන වසරවල ගෙවන ලද සමුච්චිත මුදල් ප්‍රමාණය දක්වයි. ඊට සමානව, වාර්තා වූ සමුච්චිත අලාභ කොටස මගින් ඉහත ත්‍රිකෝණයේ දක්වා ඇති ගෙවූ සමුච්චිත මුදල් සහ මූල්‍ය වසර අවසානයේ ශුද්ධ හිඟ තත්ත්වය විස්තරාත්මකව දක්වයි.

24. රක්ෂණ ගිවිසුම් වගකීම් – ජීවිත නොවන (ඉතිරි කොටස...)

24.4 හිමිකම් සංවර්ධන තොරතුරු (ඉතිරි කොටස...)

දෙසැම්බර් 31 වන විට	2017 රු. '000	2018 රු. '000	2019 රු. '000	2020 රු. '000	2021 රු. '000	**2022 රු. '000**
අලාභ සහ අලාභ ගැලපීම් වියදම් සඳහා දළ සංචිතය	8,548,958	8,776,040	7,310,845	7,861,686	9,549,407	**11,855,930**
අයකළයුතු ප්‍රතිරක්ෂණ	(1,451,271)	(1,589,981)	(1,060,735)	(1,395,321)	(1,888,143)	**(3,104,431)**
අලාභ සහ අලාභ ගැලපීම් වියදම් සඳහා ශුද්ධ සංචිතය	7,097,687	7,186,059	6,250,110	6,466,366	7,661,264	**8,751,500**
ගෙවූ සමුච්චිත						
වසරකට පසු	6,848,916	7,589,783	7,723,147	5,370,767	6,994,929	**6,790,213**
වසරක දෙකකට පසු	9,003,830	9,631,805	9,451,250	7,043,437	9,312,011	**–**
වසරක තුනකට පසු	9,185,266	9,772,476	9,589,406	7,092,891	–	**–**
වසරක හතරකට පසු	9,241,762	9,996,134	9,666,070	–	–	**–**
වසරක පහකට පසු	9,314,871	10,045,912	–	–	–	**–**
වසරක හයකට පසු	9,355,728	–	–	–	–	**–**
වාර්තා වූ සමුච්චිත						
වසරකට පසු	8,296,549	9,466,947	9,152,921	6,492,661	8,980,052	**8,892,648**
වසරක දෙකකට පසු	9,183,846	9,907,086	9,718,009	7,255,303	10,014,973	**–**
වසරක තුනකට පසු	9,414,493	10,288,268	9,851,857	7,321,827	–	**–**
වසරක හතරකට පසු	9,526,153	10,199,725	9,898,280	–	–	**–**
වසරක පහකට පසු	9,479,377	10,198,488	–	–	–	**–**
වසරක හයකට පසු	9,486,927	–	–	–	–	**–**

25. ප්‍රවර්තන බදු වගකීම්

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 වන විට	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ජනවාරි 01 දිනට ශේෂය	**2,216,343**	2,305,626	**1,684,872**	2,033,053
වසර සඳහා ආදායම් බදු අයකිරීම	**2,695,824**	2,528,132	**1,841,847**	1,874,350
වසර තුළ සිදුකළ ආදායම් බදු නිරවුල් කිරීම	**(2,582,531)**	(2,584,260)	**(1,839,896)**	(2,222,531)
පෙර වසර සම්බන්ධයෙන් අඩුවෙන්/(වැඩිපුර) වෙන් කිරීම	**42,667**	(33,155)	**–**	–
දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,372,303**	2,216,343	**1,686,823**	1,684,872

26. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 වන විට	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ජනවාරි 01 දිනට ශේෂය	**2,523,520**	3,216,945	**1,917,741**	2,553,490
ලාභ අලාභ ප්‍රකාශය තුළ හඳුනාගත්				
ප්‍රවර්තන සේවා පිරිවැය	**171,886**	159,777	**111,648**	102,746
පොළී පිරිවැය	**277,226**	255,601	**210,951**	204,278
අනෙකුත් විස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත්				
ආයුගණක (ලාභය)/ අලාභය	**(763,296)**	(960,358)	**(641,457)**	(858,485)
	2,209,336	2,671,965	**1,598,883**	2,002,029
සැලැස්ම මගින් ගෙවූ ප්‍රතිලාභ	**(121,086)**	(146,952)	**(68,732)**	(84,288)
වසර තුළ ඉවත් වූ අය සඳහා ගෙවියයුතු ප්‍රතිලාභ/වෙනත් ගෙවියයුතු වෙත මාරුකිරීම	**–**	(1,493)	**–**	–
දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,088,250**	2,523,520	**1,530,151**	1,917,741

26.1 භාවිත කළ තක්සේරු ක්‍රමය පිළිබඳ විස්තරය සහ තක්සේරුකරු පිළිබඳ තොරතුරු

LKAS 19 "සේවක ප්‍රතිලාභ" සඳහා වර්තමාන හා පෙර කාල පරිච්ඡේදයන් තුළ සේවකයින් විසින් ඔවුන්ගේ සේවය සඳහා උපයාගෙන ඇති විශ්‍රාම ප්‍රතිලාභ ප්‍රමාණය සහ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම සහ වර්තමාන සේවා පිරිවැය තීරණය කිරීම සඳහා ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතයෙන් ප්‍රතිලාභ ලබන මට්ටම පිළිබඳ විශ්වසනීය තක්සේරුවක් කිරීම සඳහා ආයුගණක ශිල්පීය ක්‍රම භාවිතා කිරීම අවශ්‍ය වේ. වර්තමාන හා පෙර කාල පරිච්ඡේදයන් සඳහා කොපමණ ප්‍රතිලාභයක් ආරෝපණය කළ යුතුද යන්න තීරණය කිරීම සහ ප්‍රතිලාභයේ පිරිවැයට බලපාන ප්‍රජා විද්‍යාත්මක හා මූල්‍ය විචල්‍යයන් පිළිබඳ ඇස්තමේන්තු කිරීම මේ මගින් ආයතනයකට අවශ්‍ය වේ. ඉහත සංඛ්‍යාවට පැමිණීමේදී පහත සඳහන් ප්‍රධාන උපකල්පන සිදු කරන ලදී.

2022 දෙසැම්බර් 31 වන දිනට, රු. මිලියන 1,530.15 ක් සඳහා ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය යටතේ පාරිතෝෂික වගකීම කොළඹ 03, ආර්.ඒ.ඩී. ද මැල් මාවතේ අංක 434 හි පළමු මහලේ පිහිටි මෙසර්ස් ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම විසින් ආයුගණකව අගය කරන ලදී. ආයුගණක තක්සේරුව වාර්ෂිකව සිදු කරනු ලැබේ. ප්‍රධාන ආයුගණක උපකල්පන භාවිතා කරන ලදී.

ලිට්රෝ ගෑස් ලංකා සමාගම

වර්ෂය සඳහා විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා වන ප්‍රතිපාදන 2022 දෙසැම්බර් 31 දිනට වෘත්තීය සුදුසුකම් ලත් ආයුගණකවරුන් වන ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම විසින් සිදුකරන ලද ආයුගණක තක්සේරුව මත පදනම් වේ. 2022 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ප්‍රතිලාභයන්හි වර්තමාන අගය රු. 128,363,882 කි. වගකීම සඳහා බාහිරව අරමුදල් සපයන්නේ නැත.

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම

වර්ෂය සඳහා විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා වන ප්‍රතිපාදන 2022 දෙසැම්බර් 31 දිනට වෘත්තීය සුදුසුකම් ලත් ආයුගණකවරුන් වන ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම විසින් සිදුකරන ලද ආයුගණක තක්සේරුව මත පදනම් වේ. 2022 දෙසැම්බර් 31 දිනට පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභයන්හි වර්තමාන ආයුගණක අගය රු. 16,817,100කි. වගකීම සඳහා බාහිරව අරමුදල් සපයන්නේ නැත.

කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම

වර්ෂය සඳහා විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා වන ප්‍රතිපාදන 2022 දෙසැම්බර් 31 දිනට වෘත්තීය සුදුසුකම් ලත් ආයුගණකවරුන් වන ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම විසින් සිදුකරන ලද ආයුගණක තක්සේරුව මත පදනම් වේ. 2022 දෙසැම්බර් 31 දිනට පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභයන්හි වර්තමාන ආයුගණක අගය රු. 3,951,257 කි. වගකීම සඳහා බාහිරව අරමුදල් සපයන්නේ නැත.

සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

වර්ෂය සඳහා විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා වන ප්‍රතිපාදන 2022 දෙසැම්බර් 31 දිනට වෘත්තීය සුදුසුකම් ලත් ආයුගණකවරුන් වන ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම විසින් සිදුකරන ලද ආයුගණක තක්සේරුව මත පදනම් වේ. 2022 දෙසැම්බර් 31 දිනට පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභයන්හි වර්තමාන ආයුගණක අගය රු. 3,380,824 කි. වගකීම සඳහා බාහිරව අරමුදල් සපයන්නේ නැත.

26. සේවක ප්‍රතිලාභ (ඉතිරි කොටස...)

26.1 භාවිත කළ තක්සේරු ක්‍රමය පිළිබඳ විස්තරය සහ තක්සේරුකරු පිළිබඳ තොරතුරු(ඉතිරි කොටස...)

කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම

වර්ෂය සඳහා විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා වන ප්‍රතිපාදන 2022 දෙසැම්බර් 31 දිනට වෘත්තීය සුදුසුකම් ලත් ආයුගණකවරුන් විසින් සිදුකරන ලද ආයුගණක තක්සේරුව මත පදනම් වේ. 2022 දෙසැම්බර් 31 දිනට පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභයන්හි වර්තමාන ආයුගණක අගය රු. 3,420,001 කි. වගකීම සඳහා බාහිරව අරමුදල් සපයන්නේ නැත.

ලංකා හොස්පිට්ල් කෝර්පරේෂන් පොදු සමාගම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායකත්ව සැලසුමක් නොවන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුන්ගන්නා වගකීම වාර්තාකරන දිනයට නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය වේ.

වර්ෂය සඳහා විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා වන ප්‍රතිපාදන 2022 දෙසැම්බර් 31 දිනට වෘත්තීය සුදුසුකම් ලත් ආයුගණකවරුන් වන ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම විසින් සිදුකරන ලද ආයුගණක තක්සේරුව මත පදනම් වේ. වගකීම සඳහා බාහිරව අරමුදල් සපයන්නේ නැත.

ලංකා හොස්පිට්ල් ඩයග්නොස්ටික්ස් (පුද්ගලික) සමාගම

වර්ෂය සඳහා විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා වන ප්‍රතිපාදන 2022 දෙසැම්බර් 31 දිනට වෘත්තීය සුදුසුකම් ලත් ආයුගණකවරුන් වන ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම විසින් සිදුකරන ලද ආයුගණක තක්සේරුව මත පදනම් වේ. 2022 දෙසැම්බර් 31 දිනට පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභයන්හි වර්තමාන ආයුගණක අගය රු. 35,925,179කි. වගකීම සඳහා බාහිරව අරමුදල් සපයන්නේ නැත.

26.2 භාවිතාකළ මූලික ආයුගණක උපකල්පන

	සමූහය		සමාගම	
	2022	2021	**2022**	2021
වට්ටම් අනුපාතය	**16%-20%**	10.5%-11.8%	**16%**	11.0%
වැටුප් වර්ධක අනුපාතය	**6%-14%**	1%-15%	**10.0%**	15.0%
සේවක පිරිවැටුම් සාධකය	**5%-36%**	0%-18%	**0%-4%**	0%-18%
විශ්‍රාම වයස; පිරිමි	**60 Years**	60 years	**60 years**	60 years
විශ්‍රාම වයස; කාන්තා	**60 Years**	60 years	**60 years**	60 years
විශ්‍රාම වයස; කණිෂ්ඨ කාර්ය මණ්ඩලය	**57 years**	57 years	**57 years**	57 years

සමූහයේ පාරිතෝෂික වගකීම බාහිර අරමුදල් ලබා නොගනී.

26.3 සංවේදිතා විශ්ලේෂණ

අදාල ආයුගණක උපකල්පනවලින් එකක් වාර්තා කරන දිනයට සාධාරණය වියහැකි වෙනස්වීම්, අනෙකුත් උපකල්පන නියතිවලට පහත දැක්වෙන ප්‍රමාණයන් මගින් නිශ්චිත බැඳීම්වලට බලපා ඇත

	2022		2021	
සමූහය	වැඩිවීම රු. '000	අඩුවීම රු. '000	වැඩිවීම රු. '000	අඩුවීම රු. '000
වට්ටම් අනුපාතය 1%	1,424,699	1,633,189	1,746,144	2,138,183
අනාගත වැටුප් වර්ධනය 1%	1,649,139	1,408,723	2,149,487	1,733,407

	2022		2021	
සමාගම	වැඩිවීම රු. '000	අඩුවීම රු. '000	වැඩිවීම රු. '000	අඩුවීම රු. '000
වට්ටම් අනුපාතය 1%	1,440,194	1,609,078	1,751,388	2,089,532
අනාගත වැටුප් වර්ධනය 1%	1,620,268	1,429,042	2,098,149	1,741,450

27. අනෙකුත් වගකීම්

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 වන විට	සටහන	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ඔප්පුහිමියන්ට අත්තිකාරම් ගෙවීම්		**606,495**	524,537	**606,495**	524,537
ගෙවිය යුතු					
ගෙවිය යුතු නියෝජිත කොමිස්		**1,135,166**	1,111,999	**1,135,166**	1,111,999
උපචිත වියදම් ඇතුළුව වෙනත්	27.1	**11,251,802**	8,694,469	**4,417,708**	4,350,645
ගෙවිය යුතු වෙළෙඳ		**464,611**	7,341,341	**–**	–
ගෙවිය යුතු අගය එකතුකළ බදු		**20,887**	15,262	**–**	–
ගෙවිය යුතු වෙනත්		**402,312**	452,910	**–**	–
ලද අත්තිකාරම්		**86,894**	93,730	**–**	–
ගෙවිය යුතු ගනුදෙනුකාර තැන්පතු	27.2	**9,040,498**	9,041,968	**–**	–
ගෙවිය යුතු වෘත්තීය ගාස්තු		**273**	2,647	**–**	–
මුළු අනෙකුත් වගකීම්		**23,008,938**	27,278,863	**6,159,369**	5,987,181

27.1 සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

ටෙන්ඩර් ක්‍රියාවලිය සහ සාකච්ඡා කාලසීමාවෙන් පසු, ඉන්ටර්නා කන්ට්‍රැක්ට් ස්පා (මෙහි මින්මතු ඉන්ටර්නා ලෙස හඳුන්වන) වෙත සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම (මෙහි මින්මතු සිනෝලංකා ලෙසින් හඳුන්වන) ග්‍රෑන්ඩ් හයාට් කොළඹ ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර සැකසුම් සහ ගෘහභාණ්ඩ සැපයීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී. ඉන්පසුව, සිනොලංකා කරුණු කිහිපයක් මත ඉන්ටර්නා හි කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. ඒ අනුව, ඉන්ටර්නා විසින් සිනෝලංකා සමඟ ආරාවුල බේරුම්කරණය සඳහා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය වෙත යොමු කරන ලදී.

බේරුම්කරණ ප්‍රදානය ඉන්ටර්නාට පක්ෂ වූ අතර 2015 අගෝස්තු 14 සිට සම්පූර්ණ ගෙවීම දක්වා වසරකට 2%ක සරල පොළියක් සමඟ යුරෝ 7,432,062.79 ක් අලාභ ලෙස, ප්‍රදානය කළ දිනයේ සිට සම්පූර්ණ ගෙවීම දක්වා වසරකට 2% ක සරල පොළියක් සමඟ ඇමෙරිකානු ඩොලර් 483,500.00 ක් ICC උසාවිය විසින් නියමකළ බේරුම්කරණ පිරිවැය ලෙස සහ ප්‍රදානය කළ දිනයේ සිට සම්පූර්ණ ගෙවීම දක්වා වසරකට 2%ක සරල පොළියක් සමඟ යුරෝ 516,597.16 ක් අමතර බේරුම්කරණ පිරිවැය ලෙස ගෙවීමට සිනෝලංකාට වෙත නියම කරන ලදී.

සිනොලංකා විසින් සිංගප්පූරු මහාධිකරණයට ජාත්‍යන්තර බේරුම්කරණ පනතේ 10 වැනි වගන්තිය යටතේ බේරුම්කරණ අධිකරණයක අධිකරණ බලය පිළිබඳ තීන්දුවක් සඳහාත්, විකල්පයක් ලෙස UNCITRAL ආදර්ශ නීතියේ 34 වැනි වගන්තිය යටතේත් අවසාන ප්‍රදානය ඉවත් කිරීමේ නියෝගයක් සඳහා ඉල්ලුම් කළේය. ආරවුල ඇසීමට අධිකරණ බලයක් නොතිබුණි. සිනෝලංකා ආයතනය කළ ඉල්ලීම මහාධිකරණය ප්‍රතික්ෂේප කළේය. ඉන් අනතුරුව, සිංගප්පූරුවේදී සිදු කරන ලද බේරුම්කරණ තීන්දුව බලාත්මක කරන ලෙස ඉන්ටර්නා විසින් ශ්‍රී ලංකාවේ වාණිජ මහාධිකරණය හමුවේ නඩුවක් ගොනු කර ඇත. වාණිජ මහාධිකරණ තීන්දුව ඉන්ටර්නාට පක්ෂව විය.

කෙසේවෙතත්, 2020 පෙබරවාරි 18 සිනොලංකා විසින් ශ්‍රී ලංකාවේ මහාධිකරණයේ තීන්දුවට එරෙහිව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, වාර්තාකර දිනයට එම නඩුව අසමින් පැවතුණි. මූල්‍ය වසර තුළ හා 2019 දෙසැම්බර් 31 දිනට රු. 1,848,102,857ක වෙන් කිරීම් හඳුනා ගෙන ඇති අතර වාර්තාකරන දිනයට සමාගමට හිතකරවන යුරෝ මිලියන 7.2 සඳහා සුභදව සම්පූර්ණ හා අවසන් නිරවුල් කිරීම සඳහා එම කරුණ සාකච්ඡාවේ පවතින බැවින් මූල්‍ය වසර තුළ සහ 2021 දෙසැම්බර් 31 දිනට කිසිදු වියදමක් හඳුනාගෙන නැත. ඊලඟ නඩු දිනය 2022 මාර්තු 23ට නියම කරන ලදී. වාර්තාකළ වගකීම 2022 දෙසැම්බර් 31 දිනට විනිමය උච්චාවචනය සමඟ නැවත තක්සේරු කර ඇත.

27.2 ලිට්රෝ ගෑස් (පුද්ගලික) සමාගම

ආපසු ගෙවිය යුතු තැන්පතුව පොදු නීතිය පරිදි තැන්පතු වවුචරය (සමාගම විසින් නිකුත්කළ තැන්පතු තුණ්ඩුව) හෝ දිවුරුම් ප්‍රකාශයක් සමඟ ගිවිසුම අවසන් කිරීමට සිලින්ඩරයේ අභිතිකරු විසින් ඉල්ලීමක් කරන අවස්ථාවේදී ආපසු ගෙවීමේ ගිවිසුමක් සමඟ රැස්කල වගකීමකි. කිග්‍රෑ. 37.5, කිග්‍රෑ. 12.5, කිග්‍රෑ. 5 සහ කිග්‍රෑ. 2.3 සඳහා ගෙවිය යුතු තැන්පතුව පිළිවෙලින්, සිලින්ඩරය ආපසු ලබා දෙන අවස්ථාවේදී අවම වශයෙන් රු. 2,476, රු. 1,500, රු. 700, සහ රු. 550 කි.

28. මූල්‍ය වගකීම්

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 වන විට	සටහන	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
බැංකු අයිරාව	18	**1,090,853**	1,021,668	**563,026**	539,283
ඇමෙරිකානු ඩොලර් අතුරු ණය පහසුකම – මහජන බැංකුව		**4,979,602**	2,513,053	**–**	–
කාලීන ණය – ලංකා බැංකුව		**1,001,712**	–	**–**	–
මුළු මූල්‍ය වගකීම්		**7,072,167**	3,534,721	**563,026**	539,283

වාර්තාකරණ දිනයට වාර්තාකළ බැංකු අයිරා ශේෂය මුදල් කළමනාකරණ අරමුණ සඳහා භාවිතා කෙරේ. සමාගමට රු. මිලියන 9.3ක බැංකු අයිරා පහසුකමක් ඇත.

කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම – සමූහය

ග්‍රෑන්ඩ් හයාට් කලම්බෝ ව්‍යාපෘතියේ හිමිකරු වන සිනෝලංකා හෝටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම 2018 ජනවාරි සිට දිගින් දිගටම ද්‍රවශීලතාවයේ හිඟයක් අත් විඳිමින් සිටියි. මීට ප්‍රධාන වශයෙන් යෝජිත ණය වැඩසටහනේ සහ 2017 අගෝස්තු කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘති නැවත පැවරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම හේතු වී ඇත.

ඒ අනුව, 2018 ජනවාරිවලදී හෙලන්කෝ හෝටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම විසින් සිනෝලංකා හෝටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම වෙත රු. මිලියන 400 ක කෙටිකාලීන අරමුදල් පහසුකමක් ලබා දෙන ලදී. මෙය සමාගමේ පැවති අක්‍රිය අරමුදල්වලින් වෙන් කරන ලද අතර වසරකට 8.79%ක පොලී අනුපාතයකට ලබා දෙන ලදී. 2020 දෙසැම්බර් 31න් අවසන් වන වසරට අය කළ පොලිය වසරට 4.75%ක් විය.

ඉහත සඳහන් කළ දෑට අමතරව, නැවත පවරන තුරු ග්‍රෑන්ඩ් හයාට් කලම්බෝ ව්‍යාපෘතිය ඉදි කිරීමට අර්ධ වශයෙන් මුදල් සැපයීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 12ක ණය පහසුකමක් අනුමත වූ අතර 2019 වර්ෂයේදී එම මුදලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 8.25ක් බෙදාහැර ඇත. මෙම ණය පහසුකම සඳහා අදාළ වන පොලිය වන්නේ මාස 6 LIBOR+ 5%කි. පහසුකමේ මුල් වලංගු කාලසීමාව වුයේ ලබාගෙන වසරක කාලසීමාවක් වන අතර එය 2020 අප්‍රේල් 18 දින සම්පූර්ණ වීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, නියමිත දිනයට හෝ ඊට පෙර ණය ගෙවා අවසන් කිරීමට සමාගමට හැකියාවක් නොතිබූ හෙයින්, 2023 ජනවාරි 25 වන දින දක්වා තවදුරටත් ණය පහසුකමේ කාලය දීර්ඝ කරන ලදී. දීර්ඝ කළ කාලසීමාව සඳහා අදාළ වන පොලී අනුපාතය වන්නේ 2022 ජූනි 18 දින සිට මාස 3 LIBOR+ 7% ක් වන අතර එය ත්‍රෛමාසික සමාලෝචනයට යටත්ව, ණය පැහැර හැරීමේදී කල් ඉකුත් වූ කාල සීමාව තුළ හිඟ මුදල් සඳහා වසරකට LIBOR + 9% සහ ණය නීතිපතා ආපසු ගෙවීමේදී වාර්ෂිකව 12% හි අනුපාතයට යටත් වේ.

එකී ණය පහසුකම සඳහා ඇපකරයක් ලෙස එම පහසුකමේ සම්පූර්ණ මුදල සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ඉල්ලුම් ඇපකරයක් ලබා දී ඇති අතර ශ්‍රී ලංකා රජය විසින් මහා භාණ්ඩාගාරය හරහා ප්‍රති ඇපකරයක් නිකුත් කර ඇත.

29. ආදායම්

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
දළ ලිඛිත වාරිකය	30	**41,053,602**	43,063,839	**41,271,573**	43,231,011
නොඉපයූ වාරිකය සඳහා සංචිතවල ශුද්ධ වෙනස	31.2	**612,519**	(778,671)	**612,519**	(778,671)
දළ නොඉපයූ වාරිකය		**41,666,121**	42,285,168	**41,884,092**	42,452,340
ප්‍රතිරක්ෂකයින්ට පවරා දුන් වාරිකය	31.3	**(5,743,770)**	(4,508,761)	**(5,743,770)**	(4,508,761)
නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරිකය සංචිතවල ශුද්ධ වෙනස	31.4	**883,699**	453,247	**883,699**	453,247
ශුද්ධ ඉපයූ වාරිකය	31.1	**36,806,050**	38,229,653	**37,024,021**	38,396,825
වෙනත් මෙහෙයුම්වලින් ආදායම	30.1	**90,620,724**	62,143,038	**–**	–
ආයෝජන ආදායම	32	**15,370,280**	24,044,877	**13,793,670**	23,392,497
අනෙකුත් ආදායම	33, 34, 35	**13,808,004**	3,589,952	**12,867,065**	2,272,986
		156,605,058	128,007,520	**63,684,756**	64,062,308

30. දළ ලිඛිත වාරිකය

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ජීවිත රක්ෂණය				
සමූහය හා සමූහ නොවන	**18,461,618**	17,122,742	**18,679,589**	17,289,914
සමූහ කාලසීමා ජීවිත රක්ෂණ	**2,250,536**	4,686,074	**2,250,536**	4,686,074
දළ ලිඛිත වාරිකය – ජීවිත රක්ෂණය	**20,712,154**	21,808,816	**20,930,125**	21,975,988
ජීවිත නොවන රක්ෂණය				
ගිනි හා ඉංජිනේරු අවදානම	**3,123,352**	2,338,650	**3,123,352**	2,338,650
මෝටර් රථ	**12,780,151**	11,672,493	**12,780,151**	11,672,493
නාවික	**943,001**	613,047	**943,001**	613,047
පොදු අනතුරු	**3,494,944**	6,630,833	**3,494,944**	6,630,833
දළ ලිඛිත වාරිකය – ජීවිත නොවන රක්ෂණය	**20,341,448**	21,255,023	**20,341,448**	21,255,023
මුළු දළ ලිඛිත වාරිකය	**41,053,602**	43,063,839	**41,271,573**	43,231,011

30.1 අනෙකුත් මෙහෙයුම්වලින් ආදායම

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
රෝහල් ආදායම	**7,781,288**	6,537,999	**–**	–
රසායනාගාර ආදායම	**2,729,731**	3,313,384	**–**	–
කාමර කුලී හා සේවා ගාස්තු	**127,623**	(17,287)	**–**	–
ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) කටයුතුවලින් ආදායම	**79,982,082**	52,308,942	**–**	–
අනෙකුත් මෙහෙයුම්වලින් මුළු ආදායම	**90,620,724**	62,143,038	**–**	–

30. දළ ලිඛිත වාරිකය (ඉතිරි කොටස...)

30.1 අනෙකුත් මෙහෙයුම්වලින් ආදායම(ඉතිරි කොටස...)

ලිට්රෝ ගෑස් ලංකා සමාගම

ලිට්‍රෝ ගෑස් ශ්‍රී ලංකාවේ විශාලතම එල්පී ගෑස් ආනයනය කරන්නා සහ සපයන්නා වේ. සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වනුයේ, ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) ආනයනය, සැකසීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ විකිණීම මෙන්ම වෙනත් ආනුෂංගික සේවා සැපයීමයි.

(අ) 2021 දී මුහුණ පෑ දළ අලාභ තත්ත්වය ජය ගනිමින් 2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා සමාගම දළ ලාභයක් පෙන්වන ලදී. දළ ලාභ තත්ත්වය ජය ගැනීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ දැඩි මිලකරණ සූත්‍රය වෙනස් කිරීමයි. ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල් ඉහළ උච්චාවචනය සහ පහළ යාම හේතුවෙන් රු. මිලියන 3.6ක (2021 රු. බිලියන 11.4)ක හුවමාරු අලාභ සමාගම අවශෝෂනය කර ගෙන ඇත. තවද, විදේශ සංචිත ආවරණය පාලනය කිරීමෙන් ආනයන සීමාසිරීමට හේතු වූ අතර එය වසර පුරා තොග නොමැති තත්ත්වයක් ඇති කළේය.

(ආ) සමාගමේ ඇතුලත්වීමේ හා පරිහරණය කිරීමේ ගාස්තුවලට නව සිලින්ඩර් නිකුත් කරන අවස්ථාවේදී අය කරන ගාස්තු අයත්ය.

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම

ප්‍රතිදාන ගාස්තු:

(අ) ලිට්රෝ ගෑස් ලංකා සමාගමට ප්‍රතිදාන ගාස්තුව ඉන්වොයිසියක් යැවීම ආදායම තුළ සමන්විත වේ. 2022 වසර සඳහා, පළමු මාස හය සඳහා ඇමෙරිකානු ඩොලරයට ශ්‍රී ලංකා රුපියල් 196.00ක සහ ඉතිරි මාස හයට ඇමෙරිකානු ඩොලරයට ශ්‍රී ලංකා රුපියල් 370.00ක විනිමය අනුපාතයකට ගෘහස්ත සිලින්ඩර් සහ තොග වශයෙන් විකිණීම යන දෙවර්ගයටම මෙට්‍රික් ටොන් එකකට ඩොලර් 20ක මුදලක් අය කර ඇත.

(ආ) 2021 වර්ෂයේ පළමු මාස දෙක සඳහා ප්‍රතිදාන ගාස්තුව ගණනය කිරීමට ශ්‍රී ලංකා මහබැංකුවේ මාසික සාමාන්‍ය තැන් විනිමය අනුපාතිකය භාවිතා කරන ලදී. ඉන්පසු විනිමට අනුපාතය වසර පුරා රු. 196.00ට ස්ථාවර කරන ලදී. 2021 ජූලි සිටි ඉදිරියට, ප්‍රතිදාන ගාස්තුව මෙට්‍රික් ටොන් එකකට ඩොලර් 20ට වෙනස් කරන ලදී.

කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම

සමාගමේ ප්‍රධාන ආදායම වන්නේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ සේවා සපයන කොටසේ කුලීකරුවන්ගෙන් ලැබෙන බිම් කුලී ආදායමයි.

කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම

2022 මෙම සමාගම සිනොලංකා හෝටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම සහ හෙලන්කෝ හෝටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම යන ද්විත්වයේ මවු සමාගම වේ. සිනොලංකා හෝටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම කොළඹ ග්‍රෑන්ඩ් හයාට් හෝටලයේ ඉදිකිරීම් ක්‍රියාවලියේ නිරතව සිටින අතර 2022 වසර මුළුල්ලේ වාණිජ මෙහෙයම්වල නිරත වී නොමැත.

31. ශුද්ධ ඉපයූ වාරිකය

31.1 ශුද්ධ ඉපයූ වාරිකය

දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	2022			2021		
සමාගම	ජීවිත නොවන රු. '000	ජීවිත රු. '000	එකතුව රු. '000	ජීවිත නොවන රු. '000	ජීවිත රු. '000	එකතුව රු. '000
දළ ලිඛිත වාරිකය	20,341,448	20,930,125	41,271,573	21,255,023	21,975,988	43,231,011
නොඉපයූ වාරිකය සඳහා සංචිතවල වෙනස	625,700	–	625,700	(660,036)	–	(660,036)
දළ ඉපයූ වාරිකය	20,967,148	20,930,125	41,897,273	20,594,987	21,975,988	42,570,975
ප්‍රතිරක්ෂකයින්ට පවරා දුන් වාරිකය	(5,180,941)	(562,829)	(5,743,770)	(4,029,008)	(479,754)	(4,508,762)
නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරිකය සඳහා සංචිතවල වෙනස	883,699	–	883,699	453,247	–	453,247
දළ ප්‍රතිරක්ෂණ වාරිකය	(4,297,242)	(562,829)	(4,860,071)	(3,575,761)	(479,754)	(4,055,515)
ඉඩම් හිමිකම් රක්ෂණ සංචිතයට මාරු කිරීම්	(13,181)	–	(13,181)	(118,634)	–	(118,634)
	(4,310,423)	(562,829)	(4,873,252)	(3,694,395)	(479,754)	(4,174,148)
ශුද්ධ ඉපයූ වාරිකය	16,656,725	20,367,296	37,024,021	16,900,591	21,496,234	38,396,825

31.2 නොඉපයූ වාරිකය සඳහා සංචිතවල ශුද්ධ වෙනස

දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	සමූහය		සමාගම	
		2022 රු. '000	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ජීවිත නොවන රක්ෂණය					
නොඉපයූ වාරිකය සඳහා සංචිතවල වෙනස	24.1	625,700	(660,036)	625,700	(660,036)
ඉඩම් හිමිකම් රක්ෂණ සංචිතයට මාරු කිරීම්	24.2	(13,181)	(118,634)	(13,181)	(118,634)
		612,519	(778,671)	612,519	(778,671)

31.3 ප්‍රතිරක්ෂකයින්ට පවරා දුන් වාරිකය

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ජීවිත රක්ෂණය	562,829	479,753	562,829	479,753
	562,829	479,753	562,829	479,753
ජීවිත නොවන රක්ෂණය				
ගිනි	2,776,846	2,069,081	2,776,846	2,069,081
මෝටර් රථ	360,296	302,032	360,296	302,032
නාවික	735,644	442,303	735,644	442,303
විවිධ	1,308,155	1,215,592	1,308,155	1,215,592
	5,180,941	4,029,008	5,180,941	4,029,008
ප්‍රතිරක්ෂකයින්ට පවරා දුන් මුළු වාරිකය	5,743,770	4,508,761	5,743,770	4,508,761

31.4 නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරිකය සඳහා සංචිතවල ශුද්ධ වෙනස

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ජීවිත නොවන රක්ෂණය					
නොඉපයූ වාරිකය සඳහා සංචිතවල වෙනස	24.1	**883,699**	453,247	**883,699**	453,247
		883,699	453,247	**883,699**	453,247

32. ආයෝජන ආදායම

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ආයෝජන ආදායම	32.1	20,739,544	15,318,568	18,799,125	14,455,545
ලාභාංශ ආදායම	32.2	**1,348,781**	1,167,543	**1,712,590**	1,378,186
ප්‍රාග්ධන ලාභය/(අලාභය)	32.3	**(6,718,045)**	7,558,766	**(6,718,045)**	7,558,766
		15,370,280	24,044,877	**13,793,670**	23,392,497

32. ආයෝජන ආදායම් (ඉතිරි කොටස...)

32.1 පොළී ආදායම

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
කල්පිරෙනතුරු තබාගන්නා මූල්‍ය ආයෝජන (HTM)				
භාණ්ඩාගාර බැඳුම්කර	7,511,125	5,421,302	7,511,125	5,421,302
භාණ්ඩාගාර බිල්පත්	30,137	–	30,137	–
ණය හා ලැබීම්වලට මූල්‍ය ආයෝජන (L&R)				
සංවර්ධන බැඳුම්කර	1,217,259	669,613	1,217,259	669,613
ලැයිස්තුගත ණයකර	2,331,088	2,277,155	2,331,088	2,277,155
කාලීන තැන්පතු	3,414,515	1,425,980	2,348,996	902,052
විකිණීමට තබා ඇති මූල්‍ය ආයෝජන (AFS)				
භාණ්ඩාගාර බැඳුම්කර	294,595	185,670	294,595	185,670
භාණ්ඩාගාර බිල්පත්	6,545	87,467	6,545	87,467
ලැයිස්තුගත ආයතනික ණය	4,142,769	4,120,792	4,142,769	4,120,792
මුදල් හා මුදලට සමාන දෑ				
ප්‍රති මිලදීගැනීමේ ප්‍රතිවර්තන ගිවිසුම්	903,866	808,363	889,499	762,636
කැදවුම් හා ඉතුරුම් ගිණුම්	36,646	23,010	26,313	17,109
කෙටි කාලීන තැන්පතු – පොළී ආදායම	850,200	287,467	–	–
අනෙකුත් ගාස්තු පදනම් ආදායම				
ආයෝජන මත කොමිස්	800	11,751	800	11,751
මුළු පොළී ආදායම	20,739,544	15,318,568	18,799,125	14,455,545

32.2 ලාභාංශ ආදායම

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
පිරිවැයට මූල්‍ය ආයෝජන				
ලැයිස්තුගත පරිපාලිත සමාගම්	–	–	363,809	201,008
NAV **මූල්‍ය ආයෝජන**				
ආශ්‍රිත සමාගම්	5,700	11,400	5,700	11,400
විකිණීමට තබා ඇති මූල්‍ය ආයෝජන (AFS)				
ලැයිස්තුගත කොටස්	1,338,875	648,411	1,338,875	648,411
ලැයිස්තුගත නොකළ කොටස්	4,206	910	4,206	10,545
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය ආයෝජන (FVTPL)				
ලැයිස්තුගත කොටස්	–	506,822	–	506,822
මුළු ලාභාංශ ආදායම	1,348,781	1,167,543	1,712,590	1,378,186

32.3 ප්‍රාග්ධන ලාභ/(අලාභ)

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
විකිණීමට තබා ඇති මූල්‍ය ආයෝජන (AFS)				
ඒකක භාර	78,387	58,082	78,387	58,082
භාණ්ඩාගාර බැඳුම්කර	43	106	43	106
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය ආයෝජන (FVTPL)				
ලැයිස්තුගත කොටස්	(6,930,062)	7,328,946	(6,930,062)	7,328,946
ඒකක භාර	133,587	171,632	133,587	171,632
මුළු ප්‍රාග්ධන ලාභ/(අලාභ)	(6,718,045)	7,558,766	(6,718,045)	7,558,766

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
උපලබ්ධි ලාභ/(අලාභ)				
ඒකක භාර	78,387	58,082	78,387	58,082
භාණ්ඩාගාර බැඳුම්කර	43	106	43	106
ලැයිස්තුගත කොටස්	315,997	(189,978)	315,997	(189,978)
	394,427	(131,790)	394,427	(131,790)
උපලබ්ධි නොවූ ලාභ/(අලාභ)				
ලැයිස්තුගත කොටස්	(7,246,060)	7,518,924	(7,246,060)	7,518,924
ඒකක භාර	133,588	171,632	133,588	171,632
	(7,112,472)	7,690,556	(7,112,472)	7,690,556
මුළු ප්‍රාග්ධන ලාභ/(අලාභ)	(6,718,045)	7,558,766	(6,718,045)	7,558,766

33. ගාස්තු හා කොමිස් ආදායම

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ප්‍රතිරක්ෂණ කොමිස්	67,211	76,441	67,211	76,441
	67,211	76,441	67,211	76,441

34. ශුද්ධ උපලබ්ධි/උපලබ්ධි නොවූ ලාභ

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා		**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
විදේශ විනිමය ලාභ/(අලාභ)		**10,177,094**	279,523	**11,857,124**	1,012,991
		10,177,094	279,523	**11,857,124**	1,012,991

35. අනෙකුත් ආදායම

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
කුලී ආදායම		**21,353**	142,341	**141,321**	128,603
ඔප්පුභිමියන් සහ වෙනත් ණය මත පොළිය		**434,256**	634,260	**434,256**	634,260
විවිධ ආදායම		**1,247,354**	1,014,878	**226,113**	198,057
ආයෝජන දේපලේ සාධාරණ අගය තුළ වෙනසින් ශුද්ධ ලාභය		**163,417**	231,249	**141,040**	222,634
දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම මත ලාභ/(අලාභ)		**1,268**	34,959	**–**	–
CWIP මත ප්‍රත්‍යාගණන ලාභය		**1,691,504**	1,174,131	**–**	–
අනෙකුත් ආදායම		**–**	1,276	**–**	–
භාවිතයට අයිතය ඇති වත්කම් බැහැර කිරීම මත ලාභ/(අලාභ)	35.1	**4,547**	894	**–**	–
		3,563,699	3,233,988	**942,730**	1,183,554

35.1 භාවිත හිමිකම් වත්කම් බැහැර කිරීම මත ලාභය

ලංකා හොස්පිට්ල් කෝර්පරේෂන් පොදු සමාගම

ලංකා හොස්පිට්ල් කෝර්පරේෂන් පොදු සමාගම කරාපිටිය, මහියංගණය සහ පානදුර පිහිටි රසායනාගාර සඳහා කල්බදු වැඩපිළිවෙල නැවත සකස් කර ඇති අතර ඒවා එයට සම්පූර්ණයෙන් අයත් පරිපාලිත සමාගම වන, ලංකා හොස්පිට්ල් ඩයග්නොස්ටික් (පුද්ගලික) සමාගම විසින් පාලනය කරයි. භාවිතයට අයිතිය ඇති වත්කම් හඳුනා නොගැනීමෙන් රු. මිලියන 4,547ක ලාභයකට මෙය හේතු විය.

36. ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම්

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
(අ) ගෙවූ දළ ප්‍රතිලාභ හා හිමිකම්				
ජීවිත නොවන රක්ෂණය				
ගිනි	(1,442,970)	(633,523)	(1,442,970)	(633,523)
මෝටර් රථ	(7,508,104)	(4,924,900)	(7,508,104)	(4,924,900)
නාවික	(797,580)	(426,818)	(797,580)	(426,818)
විවිධ	(3,298,937)	(4,443,528)	(3,298,937)	(4,443,528)
එකතුව	(13,047,591)	(10,428,769)	(13,047,591)	(10,428,769)
ජීවිත රක්ෂණය				
මරණ හිමිකම්	(1,901,334)	(1,562,495)	(1,901,334)	(1,562,495)
ඔප්පු කල්පිරීම	(6,003,093)	(6,311,463)	(6,003,093)	(6,311,463)
පවාරණ	(2,065,321)	(1,327,787)	(2,065,321)	(1,327,787)
ආබාධිතතාව, කරුණා සහගත, වාර්ෂික, රෝහල්ගත කිරීම් හා උකස් ආරක්ෂණය	(2,002,686)	(1,023,688)	(2,002,686)	(1,023,688)
එකතුව	(11,972,434)	(10,225,433)	(11,972,434)	(10,225,433)
ගෙවූ මුළු දළ ප්‍රතිලාභ හා හිමිකම්	(25,020,025)	(20,654,202)	(25,020,025)	(20,654,202)
(ආ) ප්‍රතිරක්ෂකයින්ට පවරා දුන් හිමිකම්				
ප්‍රතිරක්ෂකයින්ගෙන් අයකරගත් හිමිකම්	1,757,337	616,142	1,757,337	616,142
ප්‍රතිරක්ෂකයින්ට පවරා දුන් මුළු හිමිකම්	1,757,337	616,142	1,757,337	616,142
(ඇ) ගිවිසුම් වගකීම්වල දළ වෙනස				
සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් හිඟ හිමිකම්පෑම් ප්‍රතිපාදනයෙහි වෙනස්වීම්	(85,499)	(640,179)	(85,499)	(640,179)
ගිවිසුම් වගකීම්වල මුළු දළ වෙනස	(85,499)	(640,179)	(85,499)	(640,179)
(ඈ) ප්‍රතිරක්ෂකයින්ට පවරා දුන් ගිවිසුම් වගකීම්වල වෙනස				
ජීවිත නොවන රක්ෂණ ගිවිසුම්වල ප්‍රතිරක්ෂණ හිඟ හිමිකම් වෙන්කිරීම තුළ වෙනස	1,216,288	492,822	1,216,288	492,822
ප්‍රතිරක්ෂකයින්ට පවරා දුන් ගිවිසුම් වගකීම්වල මුළු වෙනස	1,216,288	492,822	1,216,288	492,822
මුළු ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම්	(22,131,899)	(20,185,417)	(22,131,899)	(20,185,417)

37. ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත් කරගැනීමේ පිරිවැය (ප්‍රතිරක්ෂණය ඇතුළුව)

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
අත්පත් කරගැනීමේ පිරිවැය	**3,768,299**	3,648,317	**3,768,299**	3,648,317
විලම්බිත අත්පත් කරගැනීමේ පිරිවැය (DAC) සඳහා සංචිතයේ ශුද්ධ වෙනස්වීම	**(56,226)**	(9,435)	**(56,226)**	(9,435)
	3,712,073	3,638,882	**3,712,073**	3,638,882
ලද ප්‍රතිරක්ෂණ කොමිස්	**430,114**	422,350	**430,114**	422,350
නොඉපයූ කොමිස් සඳහා සංචිතවල ශුද්ධ වෙනස (UCR)	**(19,876)**	(3,776)	**(19,876)**	(3,776)
	410,238	418,574	**410,238**	418,574
	3,301,835	3,220,308	**3,301,835**	3,220,308

38. බදු පෙර ලාභය

බදු පෙර ලාභය පහත දෑ ඇතුළුව සියලුම වියදම් අයකිරීමෙන් පසු සඳහන් කරයි.

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
විගණන පාරිශ්‍රමික					
පවරන ලද විගණනකවරුන් සඳහා ගාස්තු		**4,520**	4,520	**4,520**	4,520
විගණකාධිපති සඳහා ගාස්තු		**5,406**	5,824	**678**	678
විගණන නොවන සේවා		**4,315**	–	**4,315**	–
දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරීම	8	**2,126,874**	1,917,441	**489,728**	340,878
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	11.2	**34,914**	34,943	**16,619**	13,504
භාවිතයට අයිතිය ඇති වත්කම් ක්‍රමක්ෂය	9.1	**506,785**	404,930	**167,971**	171,207
කල්බදු ඉඩම සඳහා ක්‍රමක්ෂය		**2,162**	2,162	**2,162**	2,162
වෙළෙඳ ලැබීම්වල හානිකරණ අලාභය	16.3	**16,847**	847	**–**	–
භාණ්ඩ තොගවල හානිකරණ අලාභය		**(19,113)**	(3,788)	**–**	–
නීති වියදම්		**(1,000)**	14,648	**–**	–
කාර්ය මණ්ඩල ප්‍රතිලාභ		**9,992,646**	10,567,324	**6,981,056**	6,190,736
අලෙවිකරණ සහ ව්‍යාපාර ප්‍රවර්ධන වියදම්		**643,135**	708,059	**543,543**	512,766

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම

පොදු පිරිවැය හුවමාරුව

2017 වසර තුළ, මූල්‍ය කාර්ය සාධනයන් හි සාධාරණ දැක්මක් පෙන්නුම් කිරීම සඳහා එක් එක් සමාගම විසින් දරන ලද පොදු පිරිවැය හුවමාරුව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලිට්රෝ ගෑස් සමාගම සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදි. අවබෝධතා ගිවිසුම යටතේ ලිට්රෝ ගෑස් සමාගම වෙතින් මාරු කරන ලද පොදු පිරිවැය ඇතුලත්ව 2021 සහ 2022 වර්ෂ සඳහා පරිපාලන වියදම පිලිවෙලින් රු. මිලියන 68.1 සහ රු. මිලියන 77.5 ක් වේ.

39. ආදායම් බදු වියදම්

39.1 ලාභය හෝ අලාභය තුල හඳුනාගත් ප්‍රමාණ

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ප්‍රවර්තන බදු වියදම්					
ප්‍රවර්තන බදු වසර		2,699,101	2,564,137	1,841,847	1,874,349
පසුගිය වසරේ අඩුවෙන්/(වැඩිපුර) වෙන්කිරීම		39,390	(69,161)	–	–
		2,738,491	2,494,976	1,841,847	1,874,349
විලම්බිත බදු වියදම්					
තාවකාලික වෙනස්වීම් ඇතිවීම/(ආපසු හැරවීම)	15.1.1	840,723	(3,369,210)	88,496	(121,566)
ලාභය හෝ අලාභය තුළ හඳුනාගත් බදු අනුපාත වෙනස හේතුවෙන් බලපෑම	15.1.1	–	(68,486)	–	(68,486)
		840,723	(3,437,696)	88,496	(190,052)
ආදායම් ප්‍රකාශය තුළ වාර්තා වූ ආදායම් බදු වියදම		3,579,214	(942,720)	1,930,343	1,684,297

39.2 වෙනත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් අගයයන්

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
නිශ්චිත ප්‍රතිලාභ වගකීම නැවත මැනීම	15.1.1	(84,170)	(120,281)	(57,309)	(107,497)
දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය	15.1.1	(125,330)	(518,333)	–	(467,016)
විකිණීමට තබා ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ වෙනස්වීම්	15.1.1	262,681	77,371	262,681	77,371
බදු අනුපාත වෙනස හේතුවෙන් විලම්භිත බදු මත බලපෑම	15.1.1	(969,129)	675,001	(758,993)	385,670
		(915,948)	113,757	(553,621)	(111,473)

39.3 ඉදිරියට ගෙනා බදු අලාභ විශ්ලේෂණය

	සමූහය		සමාගම	
	2022 රු. '000	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ජනවාරි 01 දිනට ශේෂය	12,244,541	1,386,337	–	–
වසර තුළ දරන ලද බදු අලාභ	4,156,518	10,920,136	–	–
වසර තුළ හිමිකම් පෑ බදු අලාභ	(1,050,990)	(61,932)	–	–
දෙසැම්බර් 31 දිනට ශේෂය	15,350,069	12,244,541	–	–

39. ආදායම් බදු වියදම (ඉතිරි කොටස...)

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ එයට සිදුකළ සංශෝධන ප්‍රකාරව පළමු මාස නවය සඳහා 24%ක සහ අවසාන මාස තුන සඳහා 30%ක අදායම් බදු බැඳියාවක් සමාගමට ඇත. මෙම වර්ෂයේ බදු වියදම සාමාන්‍ය රක්ෂණය සහ ජීවිත රක්ෂණයේ අතිරික්තය මත ආදායම් බදු අයකිරීම්වලින් සමන්විතය.

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම

සමාගමට පළමු මාස හය සඳහා 24%ක සහ අවසාන මාස හය සඳහා 30%ක ආදායම් බදු බැඳියාවක් ඇත.

සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

2008 අංක 14 දරණ උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ,සමාගම ආදායම් බද්දට අදාළ දේශීය ආදායම් පනතේ විධිවිධානයන් සමාගමේ ව්‍යාපාරයන්ගෙන් ලැබෙන ලාභයන්ට වසර 10 ක කාලසීමාවක් සඳහා අදාල නොවේ. බදු සහන කාලය සමාගම බදු අයකල හැකි ලාභ ලැබ පළමු වසරේ සිට හෝ වාණිජමය මෙහෙයුම් ආරම්භ කිරීමෙන් වසර 03කට පසුව යන දෙකෙන් පළමුව එලඹෙන අවස්ථාවේ සිට ආරම්භ වේ.

බදු නිදහස් කාලය ඉකුත් වීමත් සමග, සමාගමේ ලාභය සහ ආදායම හෝටල් කර්මාන්තය සඳහා අදාළ කාලයේ පවතින බදු ප්‍රතිශතයෙන් 6% හෝ 50% යන දෙකෙන් අඩු ප්‍රතිශතය යටතේ අයකෙරේ. මෙම බදු ප්‍රතිශතයන් බදු නිදහස් කාලය අවසන් වූ වහාම වසර 15 ක කාල පරිච්ඡේදයක් සඳහා බලපවත්වනු ඇත

ඉහත කාල පරිච්ඡේදය ඉකුත් වීමෙන් අනතුරුව සමාගම් ලාභය සහ ආදායම සඳහා දේශීය ආදායම් පනතේ එම කාලයට බලපවත්වන විධිවිධානයන්ට අනුව බදු අයකරනු ලැබේ

කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම සහ හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

සමාගම සහ හෙලන්කෝ හෝටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම සඳහා වන ආදායම් බදු වියදම 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට සහ එහි සංශෝධනයන්ට අනුව 30% ක ඔවුන්ගේ ගලපන ලද ලාභය මත ගණනය කර ඇත.

ලිට්රෝ ගෑස් ලංකා සමාගම

සමාගම 30% (2021-24%) ක අනුපාතයට ආදායම බදු සඳහා වගකීමට බැඳී සිටී.

අධිභාර බද්ද

2022 අප්‍රේල් 8 දින සහතික කළ 2022 අංක 14 දරණ අධිභාර බදු පනත අනුව, සමාගම සහ සමූහය එකතුකළ බදුකළහැකි ආදායම රු. බිලියන 2 සීමාව ඉක්මවා ඇති බැවින් අධිභාර බද්දට යටත් වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද විකල්ප ප්‍රතිකාර ප්‍රකාශයේ (SoAT) අතිරේකයට අනුව කොටස් සහ ජීවිත අරමුදලේ වෙනස්වීම් ප්‍රකාශයේ රඳවාගත් ඉපැයීම් 2022 ජනවාරි 01 සඳහා ආරම්භක ගැලපීමක් ලෙස රු. 2,853.98 සහ රු. 2,426.62 ක මුළු අධිභාර බදු වගකීම පිළිවෙලින් සමාගම සහ සමූහය සඳහා හඳුනාගෙන ඇත.

සමාගමේ නම	අධිභාර බදු සඳහා බදුකළහැකි ආදායම් වගකීම (රු.)	අධිභාර බදු වගකීම (රු.)
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	9,706,499,829	2,426,624,957
ලංකා හොස්පිට්ල් කෝර්පරේෂන් පොදු සමාගම	139,393,515	35,095,284
ලංකා හොස්පිට්ල් ඩයග්නොස්ටික් (පුද්ගලික) සමාගම	27,643,800	6,910,950
ලිට්රෝ ගෑස් ලංකා සමාගම	–	–
ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම	1,493,999,108	373,499,777
කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම	–	–
සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම	–	–
හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම	17,705,734	4,426,434
කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම	–	–
කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගම	29,695,329	7,423,832
	11,414,937,315	2,853,981,189

ලංකා හොස්පිට්ල් කෝර්පරේෂන් පොදු සමාගම

2022 අප්‍රේල් 8 දින සහතික කළ 2022 අංක 14 දරණ අධිභාර බදු පනත අනුව, ද ලංකා හොස්පිට්ල් කෝර්පරේෂන් පොදු සමාගමේ මව් සමාගම වන ශ්‍රී ලංකා රක්ෂණ සමාගම සහ SLIC සමූහය එකතුකළ බදුකළහැකි ආදායම රු. බිලියන 2 සීමාව ඉක්මවා ඇති බැවින් සමාගම සහ සමූහය අධිභාර බද්දට යටත් වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද විකල්ප ප්‍රතිකාර ප්‍රකාශයේ (SoAT) අතිරේකයට අනුව කොටස් සහ ජීවිත අරමුදලේ වෙනස්වීම් ප්‍රකාශයේ රඳවාගත් ඉපැයීම් 2022 ජනවාරි 01 සඳහා ආරම්භක ගැලපීමක් ලෙස. රු. 42,006,234 සහ රු. 35,095,284 ක මුළු අධිභාර බදු වගකීම පිළිවෙලින් සමාගම සහ සමූහය සඳහා හඳුනාගෙන ඇත.

2022 අප්‍රේල් 19 දින, සමාගම සහ සමූහය අධිභාර බදු වගකීමේ පළමු වාරිකය සඳහා පිළිවෙලින් රු. 21,003,117 සහ රු. 17,547,642 ගෙවන ලදී. 2022 ජූනි 30 දින ආදායම් බදු වගකීම යටතේ වාර්තාකළ ගෙවියයුතු අධිභාර බදුවල අවසන් වාරිකය 2022 ජූලි 14 දින ගෙවා ඇත.

තුළනාත්මක වසර මත අධිභාර බද්ද යටතේ අධිභාර බද්දේ බලපෑම පහත දක්වා ඇත.:

	2020 රු. '000
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා බදු පසු ලාභය	384,993
අධිභාර බදු වගකීම	(42,006)
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ගලපන ලද තුළනාත්මක ලාභය	342,987

වත්කම උපලබ්ධිකරන සහ වගකීම නිරවුල්කරන කාලසීමාව සඳහා අදාළ කර ගැනීමට අපේක්ෂා කරන අනුපාතයට විලම්භිත බදු වත්කම් හා වගකීම් මැන ඇත.

40. කොටසක මූලික/තනුක ඉපයීම්

කොටසක මූලික ඉපයීම් වසර තුළ හිඟ සාමාන්‍ය බරතබන ලද සාමාන්‍ය කොටස් ගණනින් සාමාන්‍ය කොටස්හිමියන්ට ආරෝපනය සඳහා ශුද්ධ ලාභය බෙදීමෙන් ගණනය කෙරේ. වසර තුළ යම් අවස්ථාවක පවතින විභව තනුක කොටස් නොමැත. එමනිසා, කොටසක තනුක ඉපයීම් කොටසක මූලික ඉපයීම්වලට සමාන වේ.

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2022**	2021	**2022**	2021
ලවය ලෙස භාවිතාකළ ප්‍රමාණ				
සාමාන්‍ය කොටස්හිමියන්ට ආරෝපනය වන ශුද්ධ ලාභය (රු. '000)	**11,588,574**	5,326,971	**10,545,807**	10,041,136
හරය ලෙස භාවිතාකළ සාමාන්‍ය කොටස් ගණන				
නිකුතුව තුළ සාමාන්‍ය කොටස්වල බරතබන ලද සාමාන්‍ය ගණන (රු. '000)	**599,743**	599,743	**599,743**	599,743
කොටසක මූලික/තනුක ඉපයීම් (රු.)	**19.32**	8.88	**17.58**	16.74

41. ගෙවූ සහ යෝජිත ලාභාංශ

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2022**	2021	**2022**	2021
ගෙවූ/යෝජිත ලාභාංශය (රු. '000)	**1,001,571**	1,511,353	**1,001,571**	1,511,353
නිකුතුව තුළ සාමාන්‍ය කොටස්වල බරතබන ලද සාමාන්‍ය ගණන (රු. '000)	**599,743**	599,743	**599,743**	599,743
කොටසක ලාභාංශය (රු.)	**1.67**	2.52	**1.67**	2.52

වසර තුළ, සමාගම රු. බිලියන 1ක්වන ලාභාංශයක් ප්‍රකාශ කර ඇති අතර එය රු. බිලියන 3.6ක උපලබ්ධි ලාභයෙන් 27%කි.

42. මූල්‍ය වත්කම් සහ වගකීම්

42.1 ගිණුම්කරණ වර්ගීකරණ සහ සාධාරණ අගයන්

මූල්‍ය වත්කම්වල සහ මූල්‍ය වගකීම්වල ධාරණ අගයන් සහ සාධාරණ අගයන් පහත වගුවේ දැක්වේ. ධාරණ අගය සාධාරණ අගයට සාධාරණ ලෙස ආසන්න නම් සාධාරණ අගයට මිනුම් කර නොමැති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා සාධාරණ අගය පිළිබඳ තොරතුරු එයට අයත් නොවේ.

දෙසැම්බර් 31 දිනට		2022					
සමූහය	සටහන	ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය රු. '000	විකිණීමට තබා ඇති රු. '000	කල්පිරෙන තෙක් රඳවා ගන්නා රු. '000	ණය සහ ලැබීම් රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්							
ලැයිස්තුගත කොටස්	5	23,031,279	12,688,898	–	–	35,720,177	35,720,177
ලැයිස්තුගත නොකළ කොටස්	5	–	7,850	–	–	7,850	7,850
ඒකක භාර	5	2,732,532	1,798,508	–	–	4,531,040	4,531,040
ලැයිස්තුගත ණයකර	5	–	33,756,794	–	–	33,756,794	33,756,794
භාණ්ඩාගාර බැඳුම්කර	5	–	3,261,196	–	–	3,261,196	3,261,196
සාධාරණ අගයට මැන නොමැති මූල්‍ය වත්කම්							
භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර	5	–	–	69,802,527	–	69,802,527	41,202,543
ලැයිස්තුගත ණයකර	5	–	–	2,030,137	–	2,030,137	2,030,137
ලැයිස්තුගත නොකළ ණයකර	5	–	–	–	23,371,379	23,371,379	23,371,379
කාලීන තැන්පතු	5	–	–	–	28,962,533	28,962,533	28,962,533
සංවර්ධන බැඳුම්කර	5	–	–	–	16,731,490	16,731,490	16,731,490
ජීවිත ඔප්පුහිමියන්ට ණය	12	–	–	–	1,867,624	1,867,624	1,867,624
ලැබියයුතු ප්‍රතිරක්ෂණ	13	–	–	–	4,367,265	4,367,265	4,367,265
ලැබියයුතු වාරික	14	–	–	–	6,610,797	6,610,797	6,610,797
වෙනත් ලැබියයුතු	16	–	–	–	11,177,687	11,177,687	11,177,687
මුදල් හා මුදලට සමාන දෑ	18	–	–	–	9,788,484	9,788,484	9,788,484
මුළු මූල්‍ය වත්කම්		25,763,811	51,513,246	71,832,664	102,877,259	251,986,980	223,386,996
සාධාරණ අගයට මැන නොමැති මූල්‍ය වගකීම්							
ගෙවියයුතු ප්‍රතිරක්ෂණ		–	–	–	2,354,371	2,354,371	2,354,371
බැංකු අයිරාව	28	–	–	–	1,090,853	1,090,853	1,090,853
මුළු මූල්‍ය වගකීම්		–	–	–	3,445,224	3,445,224	3,445,224

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට

		2021					
සමූහය	සටහන	ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය රු. '000	විකිණීමට තබා ඇති රු. '000	කල්පිරෙන තෙක් රඳවා ගන්නා රු. '000	ණය සහ ලැබීම් රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්							
ලැයිස්තුගත කොටස්	5	19,198,031	20,373,280	–	–	39,571,311	39,571,311
ලැයිස්තුගත නොකළ කොටස්	5	–	7,850	–	–	7,850	7,850
ඒකක භාර	5	3,661,785	1,739,055	–	–	5,400,840	5,400,840
ලැයිස්තුගත ණයකර	5	–	39,379,579	–	–	39,379,579	39,379,579
භාණ්ඩාගාර බැඳුම්කර	5	–	3,929,773	–	–	3,929,773	3,929,773
සාධාරණ අගයට මැන නොමැති මූල්‍ය වත්කම්							
භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර	5	–	–	60,916,652	–	60,916,652	59,364,484
ලැයිස්තුගත නොකළ ණයකර	5	–	–	–	22,343,977	22,343,977	22,343,977
කාලීන තැන්පතු	5	–	–	–	16,440,634	16,440,634	16,440,634
සංවර්ධන බැඳුම්කර	5	–	–	–	12,756,662	12,756,662	12,756,662
ජීවිත ඔප්පුහිමියන්ට ණය	12	–	–	–	1,637,187	1,637,187	1,637,187
ලැබියයුතු ප්‍රතිරක්ෂණ	13	–	–	–	2,901,995	2,901,995	2,901,995
ලැබියයුතු වාරික	14	–	–	–	7,977,747	7,977,747	7,977,747
වෙනත් ලැබියයුතු	16	–	–	–	8,077,714	8,077,714	8,077,714
මුදල් හා මුදලට සමාන දෑ	18	–	–	–	27,378,865	27,378,865	27,378,865
මුළු මූල්‍ය වත්කම්		22,859,816	65,429,537	60,916,652	99,514,781	248,720,786	247,168,618
සාධාරණ අගයට මැන නොමැති මූල්‍ය වගකීම්							
ගෙවියයුතු ප්‍රතිරක්ෂණ		–	–	–	2,868,291	2,868,291	2,868,291
බැංකු අයිරාව	28	–	–	–	1,021,668	1,021,668	1,021,668
මුළු මූල්‍ය වගකීම්		–	–	–	3,889,959	3,889,959	3,889,959

42. මූල්‍ය වත්කම් සහ වගකීම් (ඉතිරි කොටස...)

42.1 ගිණුම්කරණ වර්ගීකරණ සහ සාධාරණ අගයන් (ඉතිරි කොටස...)

දෙසැම්බර් 31 දිනට

		2022					
සමාගම	සටහන	ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය රු. '000	විකිණීමට තබා ඇති රු. '000	කල්පිරෙන තෙක් රඳවා ගන්නා රු. '000	ණය සහ ලැබීම් රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්							
ලැයිස්තුගත කොටස්		23,031,279	12,688,898	–	–	35,720,177	35,720,177
ලැයිස්තුගත නොකළ කොටස්	5	–	7,850	–	–	7,850	7,850
ඒකක භාර	5	2,732,532	1,798,508	–	–	4,531,040	4,531,040
ලැයිස්තුගත ණයකර	5	–	33,756,794	–	–	33,756,794	33,756,794
භාණ්ඩාගාර බැඳුම්කර	5	–	3,261,196	–	–	3,261,196	3,261,196
සාධාරණ අගයට මැන නොමැති මූල්‍ය වත්කම්							
භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර	5	–	–	69,802,527	–	69,802,527	41,202,543
ලැයිස්තුගත ණයකර	5	–	–	2,030,137	–	2,030,137	2,030,137
ලැයිස්තුගත නොකළ ණයකර	5	–	–	–	23,371,379	23,371,379	23,371,379
කාලීන තැන්පතු	5	–	–	–	22,039,325	22,039,325	22,039,325
සංවර්ධන බැඳුම්කර	5	–	–	–	16,731,490	16,731,490	16,731,490
ජීවිත ඔප්පුහිමියන්ට ණය	12	–	–	–	1,867,624	1,867,624	1,867,624
ලැබියයුතු ප්‍රතිරක්ෂණ	13	–	–	–	4,367,265	4,367,265	4,367,265
ලැබියයුතු වාරික	14	–	–	–	6,610,797	6,610,797	6,610,797
වෙනත් ලැබියයුතු	16	–	–	–	4,025,894	4,025,894	4,025,894
මුදල් හා මුදලට සමාන දෑ	18	–	–	–	6,320,469	6,320,469	6,320,469
මුළු මූල්‍ය වත්කම්		25,763,811	51,513,246	71,832,664	85,334,243	234,443,964	205,843,980
සාධාරණ අගයට මැන නොමැති මූල්‍ය වගකීම්							
ගෙවියයුතු ප්‍රතිරක්ෂණ		–	–	–	2,354,371	2,354,371	2,354,371
බැංකු අයිරාව	28	–	–	–	563,026	563,026	563,026
මුළු මූල්‍ය වගකීම්		–	–	–	2,917,397	2,917,397	2,917,397

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට

		2021					
සමාගම	සටහන	ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය රු. '000	විකිණීමට තබා ඇති රු. '000	කල්පිරෙන තෙක් රඳවා ගන්නා රු. '000	ණය සහ ලැබීම් රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්							
ලැයිස්තුගත කොටස්	5	19,198,031	20,373,280	–	–	39,571,311	39,571,311
ලැයිස්තුගත නොකළ කොටස්	5	–	7,850	–	–	7,850	7,850
ඒකක භාර	5	3,661,785	1,739,055	–	–	5,400,840	5,400,840
ලැයිස්තුගත ණයකර	5	–	39,379,579	–	–	39,379,579	39,379,579
භාණ්ඩාගාර බැඳුම්කර	5	–	3,929,773	–	–	3,929,773	3,929,773
සාධාරණ අගයට මැන නොමැති මූල්‍ය වත්කම්							
භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර	5					–	
ලැයිස්තුගත නොකළ ණයකර	5	–	–	60,916,652	–	60,916,652	59,364,484
කාලීන තැන්පතු	5	–	–	–	22,343,977	22,343,977	22,343,977
සංවර්ධන බැඳුම්කර	5	–	–	–	11,590,662	11,590,662	11,590,662
වාණිජමය පත්‍රිකා	5	–	–	–	12,756,662	12,756,662	12,756,662
ජීවිත ඔප්පුහිමියන්ට ණය	12	–	–	–	1,637,187	1,637,187	1,637,187
ලැබියයුතු ප්‍රතිරක්ෂණ	13	–	–	–	2,901,995	2,901,995	2,901,995
ලැබියයුතු වාරික	14	–	–	–	7,977,747	7,977,747	7,977,747
වෙනත් ලැබියයුතු	16	–	–	–	3,577,420	3,577,420	3,577,420
මුදල් හා මුදලට සමාන දෑ	18	–	–	–	16,920,370	16,920,370	16,920,370
මුළු මූල්‍ය වත්කම්		22,859,816	65,429,537	60,916,652	79,706,020	228,912,025	227,359,847
සාධාරණ අගයට මැන නොමැති මූල්‍ය වගකීම්**							
ගෙවියයුතු ප්‍රතිරක්ෂණ		–	–	–	2,868,291	2,868,291	2,868,291
බැංකු අයිරාව	28	–	–	–	539,283	539,283	539,283
මුළු මූල්‍ය වගකීම්		–	–	–	3,407,574	3,407,574	3,407,574

42.2 සාධාරණ අගයට ගෙනයන ලද වත්කම් සඳහා සාධාරණ අගයේ ධූරාවලිය

මූල්‍යමය සාධන පත්‍රයන් හි සාධාරණ අගය තිරණය කිරීමේදී හා අනාවරණය කිරීමේදී සමූහය විසින් සාධාරණ අගය අනුපිළිවෙල භාවිතා කරනු ලැබේ. සාධාරණ අගයේ ධූරාවලියේ මට්ටම මගින් සාධාරණ අගයට වාර්තාකර ඇති මූල්‍ය ආයෝජන විශ්ලේෂණයන් පහත සටහනේ හි දැක්වේ.

මට්ටම	සාධාරණ අගය මැනීමේ ක්‍රමය
මට්ටම 1	සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළෙඳපොල තුළ ලැයිස්තුගත (ලැයිස්තුගත නොකළ) මිලගණන්
මට්ටම 2	වාර්තාගත සාධාරණ අගය මත සැළකිය යුතු බලපෑමක් ඇති සියලු යෙදවුම් සඳහා වන තාක්ෂණයන් සෘජු ලෙස හෝ වක්‍ර ලෙස නිරීක්ෂණය කල හැකිය
මට්ටම 3	වාර්තාගත සාධාරණ අගය මත සැළකිය යුතු බලපෑමක් ඇති යෙදවුම් භාවිත කරන තාක්ෂණයන් නිරීක්ෂණය කල හැකි වෙළෙඳපොල දත්ත මත පදනම් නොවේ

	සමූහය				සමාගම			
දෙසැම්බර් 31 දිනට 2022	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	මුළු සාධාරණ වටිනාකම රු. '000	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	මුළු සාධාරණ වටිනාකම රු. '000
විකිණීමට තබා ඇති මූල්‍ය වත්කම් (AFS)								
ලැයිස්තුගත කොටස්	12,688,898	–	–	12,688,898	12,688,898	–	–	12,688,898
ලැයිස්තුගත නොකළ කොටස්	–	–	7,850	7,850	–	–	7,850	7,850
ඒකක භාර	1,798,508	–	–	1,798,508	1,798,508	–	–	1,798,508
ලැයිස්තුගත ණයකර	13,485,905	20,270,890	–	33,756,795	13,485,905	20,270,890	–	33,756,795
භාණ්ඩාගාර බැඳුම්කර	3,261,196	–	–	3,261,196	3,261,196	–	–	3,261,196
එකතුව	31,234,507	20,270,890	7,850	51,513,247	31,234,507	20,270,890	7,850	51,513,247
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් (FVTPL)								
ලැයිස්තුගත කොටස්	23,031,279	–	–	23,031,279	23,031,279	–	–	23,031,279
ඒකක භාර	2,732,532	–	–	2,732,532	2,732,532	–	–	2,732,532
එකතුව	25,763,811	–	–	25,763,811	25,763,811	–	–	25,763,811
කල්පිරෙන තුරු තබා ඇති මූල්‍ය වත්කම් (HTM)								
භාණ්ඩාගාර බිල්පත්	–	–	–	–	–	–	–	–
භාණ්ඩාගාර බැඳුම්කර	41,202,543	–	–	41,202,543	41,202,543	–	–	41,202,543
ලැයිස්තුගත ණයකර	2,030,137	–	–	2,030,137	2,030,137	–	–	2,030,137
එකතුව	43,232,680	–	–	43,232,680	43,232,680	–	–	43,232,680
ණය හා ලැබීම් මූල්‍ය වත්කම් (L & R)								
ලැයිස්තුගත නොකළ ණයකර	–	23,371,379	–	23,371,379	–	23,371,379	–	23,371,379
වාණිජමය පත්‍රිකා	–	–	–	–	–	–	–	–
කාලීන තැන්පතු	–	28,962,533	–	28,962,533	–	22,039,325	–	22,039,325
සංවර්ධන බැඳුම්කර	–	16,731,490	–	16,731,490	–	16,731,490	–	16,731,490
එකතුව	–	69,065,402	–	69,065,402	–	62,142,194	–	62,142,194
මුළු මූල්‍ය වත්කම්	100,230,998	89,336,292	7,850	189,575,140	100,230,998	82,413,084	7,850	182,651,932

	සමූහය				සමාගම			
දෙසැම්බර් 31 දිනට 2021	අදියර 1	අදියර 2	අදියර 3	මුළු සාධාරණ වටිනාකම	අදියර 1	අදියර 2	අදියර 3	මුළු සාධාරණ වටිනාකම
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
විකිණීමට තබා ඇති මූල්‍ය වත්කම් (AFS)								
ලැයිස්තුගත කොටස්	20,373,280	–	–	20,373,280	20,373,280	–	–	20,373,280
ලැයිස්තුගත නොකළ කොටස්	–	–	7,850	7,850	–	–	7,850	7,850
ඒකක භාර	1,739,055	–	–	1,739,055	1,739,055	–	–	1,739,055
ලැයිස්තුගත ණයකර	12,515,899	26,863,680	–	39,379,579	12,515,899	26,863,680	–	39,379,579
භාණ්ඩාගාර බැඳුම්කර	3,929,773	–	–	3,929,773	3,929,773	–	–	3,929,773
එකතුව	38,558,007	26,863,680	7,850	65,429,537	38,558,007	26,863,680	7,850	65,429,537
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් (FVTPL)								
ලැයිස්තුගත කොටස්	19,198,031	–	–	19,198,031	19,198,031	–	–	19,198,031
ඒකක භාර	3,661,785			3,661,785	3,661,785			3,661,785
එකතුව	22,859,816	–	–	22,859,816	22,859,816	–	–	22,859,816
කල්පිරෙන තුරු තබා ඇති මූල්‍ය වත්කම් (HTM)								
භාණ්ඩාගාර බිල්පත්	59,364,484	–	–	59,364,484	59,364,484	–	–	59,364,484
එකතුව	59,364,484	–	–	59,364,484	59,364,484	–	–	59,364,484
ණය හා ලැබීම් මූල්‍ය වත්කම් (L & R)								
ලැයිස්තුගත නොකළ ණයකර	–	22,343,977	–	22,343,977	–	22,343,977	–	22,343,977
කාලීන තැන්පතු	–	16,440,634	–	16,440,634	–	11,590,662	–	11,590,662
සංවර්ධන බැඳුම්කර	–	12,756,662	–	12,756,662	–	12,756,662	–	12,756,662
භාණ්ඩාගාර බිල්පත්		–	–	–	–	2,993,772	–	2,993,772
එකතුව	–	51,541,273	–	51,541,273	–	49,685,073	–	49,685,073
මුළු මූල්‍ය වත්කම්	120,782,307	78,404,953	7,850	199,195,110	120,782,307	76,548,753	7,850	197,338,910

42.3 සාධාරණ අගය තීරණය කිරීමේදී භාවිතාකළ තක්සේරු ශිල්ප

1. ලැයිස්තුගත තොග, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල සාධාරණ අගය, ඒවා සක්‍රිය වෙළඳපොලෙහි වෙළෙඳාම් කරන බැවින් ඒවායේ වෙළෙඳපොල මිලගණන් මත පදනම් වේ.
2. ලැයිස්තුගත නොකළ පාවෙන අනුපාතික ණයකර සහ සංවර්ධන බැඳුම්කරවල සාධාරණ අගයන් ඒවායේ ක්‍රමක්ෂය වූ පිරිවැයට සමාන වනු ඇතැයි ඇස්තමේන්තු කෙරේ.
3. කාලීන තැන්පතුවල සාධාරණ අගයන් ඒවායේ ක්‍රමක්ෂය වූ පිරිවැයට සමාන වනු ඇතැයි ඇස්තමේන්තු කරනුයේ කල් පිරිම් එක් අවුරුද්දක් නොඉක්මවන බැවිනි.
4. ලැයිස්තුගත නොකළ ස්ථිර අනුපාත ණයකරවල සාධාරණ අගයන් සමාන කල්පිරිම් හා ණය ශ්‍රේණිගත කිරීම් දරන අලුතින් නිකුත් කරන ලද සංස්ථාපිත ණය සාධන පත්‍ර සමඟ අනාගත මුදල් ප්‍රමාණයන් හි වට්ටම් ලබා දිය හැකිය.
5. සක්‍රිය වෙළෙඳපොලෙහි වෙළෙඳාම් කරන ලැයිස්තුගත ණයකරවල සාධාරණ අගයන් එවායේ වෙලෙඳපොළ මිල මත පදනම් වී ඇත.
6. සක්‍රිය වෙළඳපොලෙහි ගනුදෙනු නොකරන ලැයිස්තුගත ණයකරවල සාධාරණ අගයන් සමාන කල්පිරිම් සහ ණය ශ්‍රේණිගත කිරීම් දරන අලුතින් නිකුත් කරන ලද සංස්ථාපිත ණය සාධන පත්‍ර සමඟ අනාගත මුදල් ප්‍රවාහයන් හි වට්ටම් ලබාදිය හැකිය.
7. ඒකක භාරයන්හි සාධාරණ අගය ඒකකභාර කළමනාකරණ සමාගම් විසින් දක්වන ලද පරිදි ඒවායේ ලංසු මිල මත පදනම් වී ඇත.
8. සමාගම විසින් නිතිපතා ලාභාංශ ගෙවනු ලබන ලැයිස්තුගත නොකළ කොටස්වල සාධාරණ අගය වට්ටම් දෙන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිත කරමින් සකස්කොට ඇත. එසේම සාධාරණ අගය ශුද්ධ වත්කම් වටිනාකම මත පදනම් වනු ඇත.

42.4 සාධාරණ අගයට මනින ලද 3 මට්ටමේ මූල්‍ය උපකරණවල වෙනස්වීම සැසඳීම

	2021 දෙසැම්බර් 31 දිනට	ආදායම් ප්‍රකාශයේ මුළු ලාභ/(අලාභය)	අනෙකුත් විස්තරාත්මත ආදායම් ප්‍රකාශයේ මුළු ලාභ/(අලාභය)	මිලදී ගැනීම්	විකුණුම්	1 මට්ටම සිට 2 මට්ටම දක්වා මාරු කිරීම	2022 දෙසැම්බර් 31 දිනට	2022 දෙසැම්බර් 31 දිනට දරන වත්කම් සඳහා ලාභය හෝ අලාභය තුළ ඇතුළත් කාලසීමාව සඳහා ලාභය/ (අලාභය)
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
විකිණීමට තබා ඇති මූල්‍ය වත්කම් (AFS)								
ලැයිස්තුගත නොකළ කොටස්	7,850	4,206	–	–	–	–	7,850	4,206

	2020 දෙසැම්බර් 31 දිනට	ආදායම් ප්‍රකාශයේ මුළු ලාභ/(අලාභය)	අනෙකුත් විස්තරාත්මත ආදායම් ප්‍රකාශයේ මුළු ලාභ/(අලාභය)	මිලදී ගැනීම්	විකුණුම්	1 මට්ටම සිට 2 මට්ටම දක්වා මාරු කිරීම	2021 දෙසැම්බර් 31 දිනට	2021 දෙසැම්බර් 31 දිනට දරන වත්කම් සඳහා ලාභය හෝ අලාභය තුළ ඇතුළත් කාලසීමාව සඳහා ලාභය/ (අලාභය)
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
විකිණීමට තබා ඇති මූල්‍ය වත්කම් (AFS)								
ලැයිස්තුගත නොකළ කොටස්	11,267	10,545	(3417)	–	–	–	7,850	7,133

මෙම වාර්ෂික වාර්තාව පරිශීලකයින්ට වැදගත් වන රාජ්‍ය ආයතන සමග පවතින සියලු හිඟ ශේෂයන් පහත ලැයිස්තුගත කර ඇත.

2022 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂ

ගනුදෙනුවේ ස්වභාවය/සමාගම /ආයතනයේ නම	ලංකා බැංකුව	මහජන බැංකුව	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	පීපල්ස් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් පොදු සමාගම	ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සමාගම	HDFC බැංකුව	ඇසෝසියේටිස් නිවුස්පේපර් ඔෆ් සිලෝන් සමාගම	ලංකා විදුලිබල මණ්ඩලය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
ප්‍රතිවර්ත්‍ය ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම්	1,947,973	–	1,052,130	–	–	–	–	–
ලැයිස්තුගත ණයකර	71,885	–	–	3,014,497	2,445,499	163,906	–	4,763,514
ලැයිස්තුගත නොකළ ණයකර	1,001,589	10,482,437	2,860,756	–	–	–	–	–
ස්ථිර තැන්පතු	6,755,266	2,289,328	5,088,687	1,524,590	–	–	–	–
ලැයිස්තුගත නොකළ කොටස්	–	–	–	–	–	–	3,615	–
ලැයිස්තුගත කොටස්	–	–	–	185,504	778,358	–	–	–
	9,776,713	12,771,765	9,001,574	4,724,591	3,223,857	163,906	3,615	4,763,514

2021 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂ

ගනුදෙනුවේ ස්වභාවය/සමාගම /ආයතනයේ නම	ලංකා බැංකුව රු. '000	මහජන බැංකුව රු. '000	ජාතික ඉතිරි කිරීමේ බැංකුව රු. '000	පීපල්ස් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් පොදු සමාගම රු. '000	ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සමාගම රු. '000	HDFC බැංකුව රු. '000	ඇසෝසියේට්ඩ් නිවුස්පේපර් ඔෆ් සිලෝන් සමාගම රු. '000	ලංකා විදුලිබල මණ්ඩලය රු. '000
ප්‍රතිවර්ත්‍ය ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම්	–	–	1,515,654	–	–	–	–	–
ලැයිස්තුගත ණයකර	74,970	–	–	2,859,556	2,476,699	152,071	–	4,266,411
ලැයිස්තුගත නොකළ ණයකර	–	9,858,542	2,058,767	–	–	–	–	–
ස්ථිර තැන්පතු	56,918	2,710,252	3,115,110	5,110,637	–	–	–	–
ලැයිස්තුගත නොකළ කොටස්	–	–	–	–	–	–	3,615	–
ලැයිස්තුගත කොටස්	–	–	–	343,652	778,358	–	–	–
	131,888	12,568,794	6,689,531	8,313,845	3,255,057	152,071	3,615	4,266,411

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඡන්දය දීමේ අයිතියෙන් 99.97% ක සෘජු අයිතියක් භාණ්ඩාගාරයේ ලේකම් සතුවන අතර ඉතිරිය සේවකයන් සහ කළින් සිටි සේවකයන් සතුය. ඒ බැවින්, සමාගමේ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්තින් සම්බන්ධයෙන් වන පාලන බලය භාණ්ඩාගාරයේ ලේකම් සතුවේ.

LKAS 24 – "ආශ්‍රිත පාර්ශව හෙළිදරව් කිරීම්" අනුව භාණ්ඩාගාරයේ ලේකම් සහ ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරනු ලබන ඒකාබද්ධව පාලනය කරන ලද හෝ සැලකිය යුතු ලෙස බලපානු ලබන ආයතන වෙනත් ආයතන (රජය හා සම්බන්ධ ආයතන) සමාගම විසින් අදාළ පාර්ශවයන් ලෙස සලකනු ලැබේ.

LKAS 24 – "ආශ්‍රිත පාර්ශව හෙළිදරව් කිරීම්" වලට අනුකූලව, රක්ෂණ වාරික සහ හිමිකම් සම්බන්ධ ගනුදෙනු අනාවරණය නොවන්නේ ඒවා හසුකර ගැනීමේ හා අනාවරණය කිරීමේ ඇති ප්‍රායෝගික නොවන තත්ත්වය නිසාය.

43. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

43.1 ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව 24 (LKAS) – "සම්බන්ධිත පාර්ශව ගණුදෙනු", අනුව ආයතනයේ කටයුතු සැලසුම්කරණය, මෙහෙයවීම, සහ පාලනය කිරීමේ අධිකාරීත්වය සහ වගකීම ඇත්තේ ප්‍රධාන කලමනාකරණ මණ්ඩල පිරිස් සඳහාය. ඒ අනුව, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය සමූහයේ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස වර්ගීකරණය කර ඇත.

පහත දක්වා ඇති අධ්‍යක්ෂවරු සම්බන්ධිත ආයතනයන්හි අධ්‍යක්ෂවරු වෙති.

අධ්‍යක්ෂ	සම්බන්ධිත ආයතනයන්හි අධ්‍යක්ෂධූරය
රොනල්ඩ් සී පෙරේරා මහතා	ලංකා බැංකුව
අනිල් කොස්වත්ත මහතා	නැත
සිංහලගේ අරුණ නිශාන්ත දයානන්ද මහතා	නැත
දුෂ්මන්ත තොටවත්ත මහතා	මහජන බැංකුව
	LCB ෆිනෑන්ස් පොදු සමාගම
ආචාර්ය සුදසිං මංචනායක අප්පුහාමිලාගේ කිත්සිරි මංචනායක	ජාතික ලොතරැයි මණ්ඩලය
නයොමාල් මයිකල් පැල්පොල මහතා	නැත
රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා	නාගරික සංවර්ධන අධිකාරිය

43.1.1 ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා ගෙවීම්

ප්‍රධාන කලමනාකරණ මණ්ඩල සඳහා ගෙවීම් පහත පරිදි වේ:

	සමූහය		සමාගම	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
වැටුප් හා කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	130,943	79,277	3,126	5,099
ණය ආපසු ගෙවීම	–	18,396	–	–
අධ්‍යක්ෂ ගාස්තු හා දීමනා	16,358	15,805	–	–
පැමිණීමේ ගාස්තු	1,050	1,475	–	–

උපචිත වූ පශ්චාත් සේවක ප්‍රතිලාභ ආයුගණක ඇගයීම් හේතුකොට ගෙන වෙන වෙනම හඳුනාගත නොහැකි බැවින් එවා ඉහත ඇතුළත් කර නොමැත.

43.2 පරිපාලිත සමාගම, උප පරිපාලිත සමාගම සහ ආශ්‍රිත සමාගම් සමඟ ගනුදෙනු

		SLIC සමඟ ගනුදෙනු		සමූහ සමාගම් සමඟ ගනුදෙනු	
සමාගමේ නම	ගනුදෙනුවේ ස්වභාවය	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගම	ලබාදෙන ලද ණය	40,829	16,115	**40,829**	16,115
	පාරිශ්‍රමික ගෙවීම්	783,149	749,094	**783,149**	749,094
ලංකා හොස්පිට්ල් කෝර්පරේෂන් පොදු සමාගම	රක්ෂණ වාරිකය	**60,245**	56,265	**60,245**	56,265
	ගෙවන ලද ප්‍රමාණ	**(60,245)**	(51,496)	**1,627,295**	(51,496)
	ලද ලාභාංශය	**344,586**	201,008	**344,586**	201,008
	සේවා	**(156,071)**	(169,011)	**(1,584,655)**	(169,011)
	සේවාවලින් ලද ප්‍රමාණ	**146,755**	184,096	**170,331**	184,096
	වෙනත් වෛද්‍ය සේවා	**(20,063)**	(13,173)	**(20,063)**	(13,173)
	ගෙවූ වෙනත් වෛද්‍ය සේවා	**18,464**	15,085	**18,464**	15,085
ලිට්රෝ ගෑස් ලංකා සමාගම	අයකළ කුලිය	**133,339**	123,405	**129,531**	123,405
	රක්ෂණ වාරිකය	**136,448**	78,682	**136,448**	78,682
	මුදල් පියවීම	**(274,891)**	(202,367)	**(269,210)**	(201,618)
	ප්‍රතිදාන ගාස්තුව	**–**	–	**(1,636,648)**	1,745,511
	වියදම් ප්‍රතිපූරුණය	**–**	–	**133,502**	(49,684)
	සේවා සඳහා නැවත ගෙවීම	**–**	–	**(1,611,298)**	(1,805,873)
	කාලීන ණය	**–**	–	**(2,750,000)**	(3,600,000)
	දිගුකාලීන ණය සඳහා පොළිය	**–**	–	**(240,317)**	28,110
	භාණ්ඩ/සේවා අලෙවිය	**–**	–	**–**	5,596
	භාණ්ඩ/සේවා මිලදී ගැනීම	**–**	–	**6,865**	(866)
	මුදල් ලැබීම්	**–**	–	**–**	(5,916)
	ලද ගෙවීම	**–**	–	**(9,138)**	(31,708)
ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම	රක්ෂණ වාරිකය	**6**	21,861	**6**	21,861
	ප්‍රතිදාන ගාස්තුව	**–**	–	**1,636,648**	(1,745,511)
	වියදම් ප්‍රතිපූරුණය	**–**	–	**(2,133,502)**	49,684
	සේවා සඳහා නැවත ගෙවීම	**–**	–	**(1,290,485)**	1,805,873
	වියදම් සඳහා නැවත ගෙවීම	**–**	–	**–**	(31,708)
	දිගුකාලීන ණය සඳහා පොළිය	**–**	–	**28,110**	(28,110)
	ගෙවීම්	**(2,989)**	(3,103)	**(28,339)**	(3,103)
කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම	රක්ෂණ වාරිකය	**5,603**	6,991	**5,603**	6,991
	ලැබීම්	**–**	9,510	**–**	9,510
	ගෙවූ හිමිකම්	**–**	(2,579)	**–**	(2,579)
	පරිපාලිත සමාගම්වල ආයෝජන	**–**	2,000,000	**–**	2,000,000
	සේවක වැටුප් හා දීමනා	**–**	–	**(5,739)**	2,467
	රක්ෂණ සේවා පිරිවැය	**–**	–	**6,631**	5,563
	මුදල් පියවීම	**(4,169)**	–	**(4,169)**	(341)
	වියදම් ප්‍රතිපූරුණය	**–**	–	**65**	–

43. සම්බන්ධිත පාර්ශව අනාවරණ (ඉතිරි කොටස...)

43.2 පරිපාලිත සමාගම, උප පරිපාලිත සමාගම සහ ආශ්‍රිත සමාගම් සමඟ ගනුදෙනු (ඉතිරි කොටස...)

		SLIC සමඟ ගනුදෙනු		සමූහ සමාගම් සමඟ ගනුදෙනු	
සමාගමේ නම	ගනුදෙනුවේ ස්වභාවය	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
	ගෙවූ වියදම්	–	–	–	(1,062)
	සේවක පිරිවැය	–	–	–	(673)
	පියවීමට වෙන් කිරීම	–	–	(1,079)	1,555
	වෙනත් වියදම්	–	–	(41)	(1,518)
කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම	රක්ෂණ වාරිකය	3,037	2,823	3,037	2,823
	ගෙවූ හිමිකම්	–	(1,242)	–	(1,242)
	භාණ්ඩ/සේවා මිලදී ගැනීම	–	–	(8,664)	–
	භාණ්ඩ/සේවා අලෙවිය	15	15	5,893	15
	මුදල් ලැබීම්	–	–	(5,410)	–
	මුදල් පියවීම	(3,063)	(1,993)	5,698	(1,993)
	ලැබියයුතු දෑ ආපසු හැරවීම	–	–	–	(6)
	ප්‍රතිපූරුණය	–	–	–	(170)
	උපයෝගිතා වියදම්	–	–	–	(1,622)
	ඉන්ධන සැපයීම	–	–	–	757
	ඉන්ධන පිරවුම්හල් කුලිය	–	–	–	(4,125)
	ලද ගෙවීම	–	–	(170)	(762)
	ගෙවීම්	–	–	511	5,751
	ලද ලාභාංශය	19,223	–	19,223	
සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම	රක්ෂණ වාරිකය	12,632	550	12,632	550
	විදේශ විනිමය ගනුදෙනු	813	70	813	70
	අරමුදල් මාරු කිරීමෙන් මුදල් පියවීම	–	–	6,042	–
	සේවක අදාළ පිරිවැය	–	–	6,609	(2,467)
	රක්ෂණ සේවා පිරිවැය	–	–	(6,631)	(5,563)
	වෙනත් වියදම්	–	–	41	1,518
	ගෙවූ වියදම්	–	–	2,213	(7)
	දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම	–	–	–	2,189
	ගෙවියයුතු පොළිය	–	–	(19,000)	19,000
	මුදල් පියවීම	(663)	(550)	(2,876)	(471)
හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම	ගෙවූ වියදම්	–	–	(2,213)	1,070
	සේවක පිරිවැය වෙන් කිරීම	–	–	(870)	673
	පියවීම	–	–	2,886	(1,476)
	ලැබියයුතු පොළිය	–	–	19,000	(19,000)

43. සම්බන්ධිත පාර්ශව අනාවරණ (ඉතිරි කොටස...)

43.2 පරිපාලිත සමාගම, උප පරිපාලිත සමාගම සහ ආශ්‍රිත සමාගම් සමඟ ගනුදෙනු (ඉතිරි කොටස...)

		SLIC සමඟ ගනුදෙනු		සමූහ සමාගම් සමඟ ගනුදෙනු	
සමාගමේ නම	ගනුදෙනුවේ ස්වභාවය	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ලංකා හොස්පිට්ල් ඩයග්නොස්ටික්/(පුද්ගලික) සමාගම	වියදම් ප්‍රතිපූරණය ලද කුලී ආදායම	–	–	(163,581)	102,270
	ලද ප්‍රමාණ	–	–	(1,587,540)	–
	ලබාදෙන ලද රසායනාගාර සේවා	(10,735)	(7,128)	1,317,849	(997,152)
	ගෙවූ ප්‍රමාණ	8,307	4,963	148,312	639,963
සීබැන්ක් ඇසට් මැනේජ්මන්ට් සමාගම	ලද රක්ෂණ වාරිකය	1,110	983	1,110	983
	ලද ලාභාංශය	5,700	6,479	5,700	6,479
සිලෝන් ඇසට් මැනේජ්මන්ට් කම්පැනි සමාගම	ඒකක භාර අලෙවිය	131,973	533,536	131,973	533,536
	ඒකක භාර මිලදී ගැනීම	–	1,416,850	–	1,416,850
	ලද ලාභාංශය	–	4,921	–	4,921

43.3 වෙනත් සම්බන්ධිත සමාගම් සමඟ ගනුදෙනු

		SLIC සමඟ ගනුදෙනු		සමූහ සමාගම් සමඟ ගනුදෙනු	
සමාගමේ නම	ගනුදෙනුවේ ස්වභාවය	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
කැපිටල් අලියාන්ස් ඉන්වෙස්ට්මන්ට් සමාගම	ලද ලාභාංශ	4,206	10,544	4,206	10,544

43.4 පරිපාලිත සමාගම්වලින් ලැබිය යුතු ප්‍රමාණ

	SLIC සමඟ ගනුදෙනු		සමූහ සමාගම් සමඟ ගනුදෙනු	
සම්බන්ධිත පාර්ශවයන්ගෙන් හිඟ ප්‍රමාණ	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගම	–	–	–	–
ලංකා හොස්පිට්ල් කොර්පරේෂන් පොදු සමාගම	–	–	–	–
ලංකා හොස්පිට්ල් ඩයග්නොස්ටික් (පුද්ගලික) සමාගම	–	–	–	–
ලිට්රෝ ගෑස් ලංකා සමාගම	17,146	22,249	34,581	39,780
ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම	–	2,989	539,120	91,727
කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම	1,442	7	358,192	357,089
කැනොව්න් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම	606	616	1,799	1,409
සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම	13,784	1,002	15,973	3,191
හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම	–	–	526,076	507,076
	32,978	26,863	1,475,741	1,000,272

43. සම්බන්ධිත පාර්ශව අනාවරණ (ඉතිරි කොටස...)

43.5 සම්බන්ධිත පාර්ශවවලට ගෙවියයුතු ප්‍රමාණ

	SLIC සමඟ ශේෂ		සමූහ සමාගම් සමඟ ශේෂ	
සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු ප්‍රමාණ	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ලංකා හොස්පිට්ල් කෝර්පරේෂන් පොදු සමාගම	–	1,834	–	1,834
ලිට්රෝ ගෑස් ලංකා සමාගම	–	–	13,754	13,754
ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම	–	–	539,445	88,644
කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම	224	224	356,974	357,136
කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම	–	–	1,983	1,185
සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම	–	–	2,222	2,222
හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම	–	–	526,076	507,076
	224	2,058	1,440,454	971,852

වර්ෂය තුළ ගෙවන ලද රක්ෂණ හිමිකම් සහ සාමාන්‍ය ව්‍යාපාර මාර්ගයන් තුළින් පැනනැගෙන්නාවූ වාර්තාකරණ දිනයට නොගෙවන ලද හිමිකම්, තනි පුද්ගල සමාගම්වල දෘෂ්ඨිකෝණයෙන් තක්සේරු කරන ලද සහ රක්ෂකයා විසින් තීරණය කරන ලද වෙන් කිරීම් නොවන හිමිකම් සහ හිමිකම් හිඟ ඇස්තමේන්තුවලට ආරෝපනය කළ හැකි ප්‍රතිරක්ෂණ සංරචකවලින් ඇතිවන වෙනස්වීම් හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඉවත් කර ඇත.

44. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය

දළ විශ්ලේෂණය

රක්ෂණ ව්‍යාපාරය සහ මූල්‍ය උපකරණ තුලින් පැනනගින පහත දැක්වෙන අවදානම් සහ කණ්ඩායම සඳහා සමූහය නිරාවරණය වේ.

- රක්ෂණ අවදානම
- වෙළෙඳපොල අවදානම
- ණය අවදානම
- ද්‍රවශීලතා අවදානම

මෙම සටහන මගින් ඉහත දක්වා ඇති අවදානම් සඳහා, සමූහයේ නිරාවරණය වීම පිළිබඳව ද සමූහයේ අරමුණු, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 04 සහ 07 ප්‍රතිපත්තීන් මගින් සහ එයට අදාළ ප්‍රමාණාත්මක අනාවරණයන් මගින් අවශ්‍යයයි දක්වා ඇති අවදානම් මැනීම සහ කළමනාකරණයේ ක්‍රමවේදයන් පිළිබඳවද තොරතුරු ඉදිරිපත් කරයි.

අවදානම් කළමනාකරණ රාමුව

සමූහයේ අවදානම් කළමනාකරණ රාමුව පිහිටුවීම සහ අධීක්ෂණය සඳහා සමස්ථ වගකීම සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඇත. සමූහයේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් සමූහය විසින් මුහුණපාන්නාවූ අවදානම් හඳුනාගැනීම් සහ විශ්ලේෂණය කිරීම සඳහා, උචිත අවදානම් සීමාවන් සහ පාලනයන් ඇතිකිරීම සහ අවදානම නියාමනය කිරීම සඳහා සහ සීමාවන් පිළිපැදීම සඳහා ස්ථාපනය කර ඇත. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ පද්ධතීන් වෙළෙඳපොළ තත්ත්වයන් සහ සමූහයේ කටයුතුවල වෙනස්වීම් පිළිබිඹු කිරීමට නිරන්තරව සමාලෝචනය කරනු ලබයි.

44.1 රක්ෂණ අවදානම

රක්ෂණ අවදානම යනු රක්ෂකයාට හිමිකම් ගෙවීමට අවශ්‍යතාවය ඇතිකරමින් රක්ෂණය කරන සිදුවීම ඇතිවීමට ඇති ඉඩකඩයි. මෙම අවදානම් ප්‍රතිරක්ෂණ ක්‍රියාවලිය තුළින් සමාගම වෙත හුවමාරු කෙරේ. රක්ෂණ ගිවිසුම් යටතේ සමාගම් විසින් මුහුණ දෙන්නාවූ මූලික අවදානම වන්නේ සැබෑ හිමිකම් සහ ප්‍රතිලාභී ගෙවීම් හෝ එහි කාලය අපේක්ෂාවන්ගෙන් වෙනස්වීමයි. මෙය හිමිකම්පැම්වල වාරගණන, හිමිකම්පෑමේ බරපතලකම, සැබෑලෙස ගෙවන ලද ප්‍රතිලාභ සහ දීර්ඝකාලීන හිමිකම්පැම්වල පසුකාලීන සංවර්ධනය මගින් බලපෑමට ලක්වී ඇත. එමනිසා සමූහයේ අභිමතාර්ථය වන්නේ මෙම වගකීම් ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් සංචිතයන් ඇති බවට සහතික කිරීමයි.

44.1.1 ජීවිත රක්ෂණ ගිවිසුම්

පහත දක්වා ඇති ඡේදය මගින් ගිවිසුමේ ස්වභාවය අනුව ජීවිත රක්ෂණයේ සංකේන්ද්‍රණය විස්තර කරයි.

රක්ෂණ අවදානම් සංකේන්ද්‍රණය

සංකේන්ද්‍රණ අවදානම යනු වත්කම් හෝ බැඳීම්වල ප්‍රමාණවත් නොවන විවිධාකාර කළඹ හා බැඳුණු වැඩිවී ඇති ආලාභයන් සඳහා නිරාවරණය වීමේ අවදානමයි. ජීවිත රක්ෂකයෙකු සඳහා සංකේන්ද්‍රණ අවදානම භූගෝලීය කලාපයක, ආර්ථික අංශයක, හෝ තනිපුද්ගල රක්ෂකයෙකුගේ ආයෝජන සම්බන්ධයෙන් හෝ භූගෝලීය කලාපයක, ඔප්පු වර්ගයක හෝ ආවරණය කරන පාදක අවදානම්වල ව්‍යාපාර භූගෝලීය කලාපයක් තුළින් පැනනැගිය හැකිය.

1. වෙළෙඳපොළ අවදානම පිළිබඳ දෘෂ්ඨිකෝණයෙන් බලන කළ, අප සැලකියයුතු ලෙස මූල්‍ය අංශය තුළ මුදල් ආයෝජනය කර තිබුණද, අපගේ කළඹ විවිධාංගිකරණය කරන අතර විශාල ආන්තික තුළින් සමන්විත වේ.
2. රක්ෂණ අවදානම පිළිබඳ දෘෂ්ඨිකෝණයෙන් බලන කළ, සංකේන්ද්‍රණ අවදානම බලාපන ප්‍රධාන සාධකවලට මර්ත්‍යතා අවදානම, රෝගාතුර අවදානම, දීර්ඝායුෂ අවදානම, ඔප්පු හිමියාගේ හැසිරීම් අවදානම (අවභාවිත වීම, ප්‍රති වරණය) සහ වියදම් අවදානම යන කරුණු අන්තර්ගත වේ. භූගෝලීය ප්‍රදේශ, ව්‍යාපාර මාර්ග මෙන්ම රක්ෂණ අවදානමෙහි සුවිශේෂී සංකේන්ද්‍රණ සඳහා SLIC අනාවරණය නොවීම වැනි විවිධ රක්ෂණ අවදානම් සාධක තුළ විවිධාංගීකරණයක් ඇත.

44. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

44.1 රක්ෂණ අවදානම (ඉතිරි කොටස...)

44.1.1 ජීවිත රක්ෂණ ගිවිසුම් (ඉතිරි කොටස)

ජීවිත රක්ෂණය ආශ්‍රිත අවදානම් සඳහා පහත දැ ඇතුළත් වේ:

- මර්ත්‍යතා අවදානම යනු ජීවිත රක්ෂණ ඔප්පුවල සැබෑ ඔප්පු හිමියන්ගේ මරණ සංඛ්‍යාව මත අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩිවීමේ අවදානමයි.
- දීර්ඝායුෂ අවදානම යනු වාර්ෂික ලාභීන් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ජීවත්වීමේ අවදානමයිග
- රෝගාතුරවීමේ අවදානම යනු ඔප්පු හිමියන්ගේ සෞඛ්‍ය සම්බන්ධ හිමිකම්පෑම් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩිවීමේ අවදානමයි.
- ඔප්පු හිමියන්ගේ හැසිරීම් පිළිබඳ අවදානම යනු ඔප්පු හිමියන්ගේ දායකත්වය අඩුවීම සහ අත්හිටුවීම හෝ ගිවිසුම කල්පිරීමට පෙර ප්‍රතිලාභ ඉවත්කරගැනීම පිළිබඳ ඔප්පු හිමියන්ගේ හැසිරීම අපේක්ෂිත පරිමාවට වඩා දරුණු වීමේ අවදානමයි. අනාගත ස්ථාවර වියදම් පියවීම සඳහා සහ ලිඛිත ව්‍යාපාර තුළින් අනාගත ධනාත්මක මූල්‍ය ගලා ඒම අඩුකිරීම සඳහා පොත් තුළ ඉතිරිවී ඇති ඔප්පු වෙත යොමුකිරීමක් දුර්වල ස්ථාවර අනුපාතයක් මගින් සිදුකළ හැක. එය ප්‍රමාදවූ වියදම් අත්පත්කර ගැනීමක් ආපසු ලබාගැනීමට ඇති හැකියාවට විභව ලෙස බලපෑම් කරයි.
- වියදම් අවදානම යනු ඔප්පු අත්පත් කරගැනීමේදී සහ පරිපාලනය කිරීමේදී දරන්නාවූ වියදම් අපේක්ෂිත ප්‍රමාණය ඉක්මවීමේ අවදානමයි.
- වෙළෙඳපොළ අවදානම යනු අවදානම් සමාලෝචනයේ "වෙළෙඳපොළ අවදානම්" යන කොටස තුළ විශ්ලේෂණය කරන මූල්‍ය වෙළෙඳපොළ මත වටිනාකම හෝ මුදල් ප්‍රවාහ රදා රදාපවතින්නාවූ සමාගමේ ශේෂ පත්‍රයේ තත්ත්වය හා බැඳී පවතින්නාවූ අවදානමයි.
- ණය අවදානම යනු අවදානම් සමාලෝචනයේ "ණය අවදානම" යන කොටස තුළ විශ්ලේෂණය කරන ප්‍රතිපාර්ශවයන්ට ඔවුන්ගේ මූල්‍යමය බැදියාවන් ඉටුකිරීමට නොහැකිවීම හෝ නොහැකිවීමට ඇති විභවය පිළිබඳ අවදානමයි.

සමූහයේ මෙහෙයුම් සඳහා නිසිලෙස පාලනය සහ කළමනාකරණය නොකොළහොත් බලපෑම් කළ හැකි ඉහත අවදානම් ඇගයීම සඳහා සමූහය විසින් ක්‍රියාපටිපාටීන් සහ ක්‍රියාවලි ස්ථාපනය කොට ඇත. නිෂ්පාදනය වර්ධනයේ සිට ප්‍රතිලාභ පරිපාලනය දක්වා වූ සියලු තීරණාත්මක අදියරයන් ආවරණය කිරීම සඳහා මෙම ක්‍රියාපටිපාටීන් ක්‍රියාවට නංවා ඇත. මෙයට අමතරව, සියලුම ජීවිත මූල්‍ය ප්‍රවාහ නවීකරණය කරන අතර ලාභ පරීක්ෂණය ආයුගණකයා විසින් නිෂ්පාදන සැලැස්ම සහ මිලකරණයේ අවදානම අඩුකරමින්, ලාභ පරීක්ෂණය නිර්මාණය කර ඇත. තවද සමූහය විසින් ඉඩපවතින්නේ නම් වගකීම් සඳහා ආධාර කිරීම සඳහා (ALM) ගැලපුම් උපකරණ භාවිතා කරයි.

අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන රාමුවට යටතේ, SLIC විසින් "ශුද්ධ වාරික අගය කිරීමේ" ක්‍රමවේදයක් යොදාගෙන ඇත. නුඹුන්වත්කම් අවශ්‍යතාවයන් සඳහා වෙළෙඳපොළ අනුරූප ආකාරයෙන් වගකීම් ගණනය කරන්නාවූ වගකීම් ගණනය කිරීමේ අරමුණු සඳහා මෙය අවශ්‍ය වේ. අවම නියාමක පදනමට සාපේක්ෂව අතිරික්තය ගණනය සඳහා වඩාත් විචක්ෂණ ඇගයීම් පදනමක් SLIC විසින් යොදාගෙන ඇත.

ජීවිත රක්ෂණ අවදානම සඳහා සංවේදීතා විශ්ලේෂණය

ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම තීරණය කිරීමේ ප්‍රධාන උපකල්පනයන් පහත වගුවේ දක්වා ඇත.

උපකල්පනය	විස්තරය
මර්ත්‍යතාව	– මර්ත්‍යතාව ආසන්න වශයෙන් 1%කින් වර්ධනය කිරීමට ඉඩදීම සඳහා වසරක වයස් පසුබෑමක් සමග (90)m සහ (90)f හි හොඳම ඇස්තමේන්තු අත්දැකීම් අනුපාතය බරතබනලද සාමාන්‍යයට ඉඩදීමට වාර්ෂික නොවන ව්‍යාපාර සඳහා A67/70 සාධකගත කර ඇත. – වාර්ෂිකයන්ගේ මර්ත්‍යතාව ආසන්න වශයෙන් 1%කින් වර්ධනය කිරීමට ඉඩදීම
වියදම	සමාගමේ 2022 අභ්‍යන්තර වියදම් අධ්‍යයන සහ සහභාගි හා සහභාගී නොවන ව්‍යාපාරවලට බෙදන ලද වියදම් මත පදනම් වේ.
අවලංගුවීම්/පවාරණ	අභ්‍යන්තර පළපුරුදු අධ්‍යයන සහ සුදුසු පරිදි ආයුගණක විනිශ්චය ක්‍රියාත්මක කිරීම මත පදනම් වේ. විනිශ්චය ක්‍රියාත්මක කිරීමේදී, නිදසුනක් ලෙස, එක් සිදුවීමක් සඳහා විශ්වාසී දත්ත ලබාගත නොහැකිනම්, සමාගම පොදු වෙළෙඳපොල අපේක්ෂාවන්ගේ දැනුම සහ පාදක නිෂ්පාදන වර්ගයට අදාළ භාවිතය සහ සුදුසු පරිදි ඉලක්ක වෙළෙඳපොල සැලකිල්ලට ගෙන ඇත.
රෝගාතුරවීම	සමාගමේ අභ්‍යන්තර පළපුරුදු සහ අපේක්ෂිත විශ්ලේෂණය අනුව සැබෑ ගණන මත පදනම් වේ. අපේක්ෂිත අනුපාත ප්‍රතිරක්ෂණ අනුපාත වගුව මත පදනම් වේ.
ප්‍රතිරක්ෂණය	ප්‍රතිරක්ෂණය සම්බන්ධයෙන් සමාගමේ අභ්‍යන්තර පළපුරුදු අධ්‍යයන මත පදනම් වේ.
ආයෝජන ප්‍රතිඵල	2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ නියාමක කොමිෂන් සභාව (IRCSL) විසින් යෝජිත අවදානම් රහිත අනුපාත ව්‍යුහය

SLIC විසින් 2022 වර්ෂය පුරාවට අවල සහ ශක්තිමත් නුඹුන්වත් අනුපාතයක් ඔවුන්ගේ ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා පවත්වාගෙන ගොස් ඇති අතර, 2022 දෙසැම්බර් 31 දින දක්වා අවදානම් පදනම් ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය, 316% කි. එය 2022 දෙසැම්බර් 31 දිනට 501% ක් විය. මෙය අවම නියාමන අවශ්‍යතාවය වන 120% වඩා වඩාත් ඉදිරියෙන් ඇති අගයකි.

44. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

44.1 රක්ෂණ අවදානම (ඉතිරි කොටස...)

44.1.1 ජීවිත රක්ෂණ ගිවිසුම් (ඉතිරි කොටස...)

අරමුදල් අනුව ආයෝජන ආදායම - ජීවිත රක්ෂණ ව්‍යාපාරය

උපකල්පනය	උපකල්පනවල වෙනස	වගකීම් මත බලපෑම
මර්ත්‍යතාව	10%	මිලියන 532
	-10%	මිලියන (534)
වියදම	+10%	මිලියන 1,742
පැවැත්ම	+20%	මිලියන 1,535
	-20%	මිලියන (1,626)
වට්ටම් අනුපාතය	අවදානම් පදනම් ප්‍රාග්ධනය යටතේ ඉහළ කම්පන අවස්ථාව	මිලියන (10,320)
	අවදානම් පදනම් ප්‍රාග්ධනය යටතේ පහළ කම්පන අවස්ථාව	මිලියන 18,346

ජීවිත

අවදානම් පදනම් ප්‍රාග්ධනය නීතීන් වලට අනුව, දීර්ඝකාලීන රක්ෂණ ගිවිසුම් සඳහා සෘණාත්මක ඔප්පු වගකීම පිළිගත හැකි ලෙස සැළකිය හැකි අතර සෘණාත්මක ඔප්පු වගකීම සහිත තනි පුද්ගල ගිවිසුම් සම්බන්ධ වගකීම්වල වටිනාකම ශූන්‍ය දකවා අඩුවී නොමැත. කෙසේවෙතත් බෙදාහැරීමේ පදනම මත වූ වගකීම්වල අරමුණු සඳහා (එනම් SLFRS හි අරමුණු සඳහා) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වඩාත් විචක්ෂණ ප්‍රවේශයක් යොදාගෙන ඇති අතර සෘණාත්මක වගකීම් ඔප්පු මට්ටමේදී බිංදුව දක්වා අඩුකොට ඇත.

ජීවිත නොවන

අවදානම් පදනම් ප්‍රාග්ධනය නීතීන් වලට අනුව, වට්ටම් කළ ඔප්පු වගකීම SLFRS වාර්තාකරණය කිරීමේ අරමුණු සඳහා බලපැවැත්විය හැක. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වට්ටම් රහිත වගකීම් බලපැවැත්වන්නාවූ සහ වට්ටම් රහිත වගකීම් වට්ටම් සහිත වගකීම් වලට වඩා වැඩිවන්නාවූ අවස්ථාවල වඩාත් විචක්ෂණ ප්‍රවේශයක් යොදාගෙන ඇත.

නිෂ්පාදන වර්ගය මත පදනම් වී ඔප්පු වගකීම වෙන්කිරීම

දෙසැම්බර් 31	2022			2021		
	රක්ෂණ වගකීම් (ලාභ සහිත) රු. '000	රක්ෂණ වගකීම් (ලාභ රහිත) රු. '000	මුළු දළ රක්ෂණ වගකීම් රු. '000	රක්ෂණ වගකීම් (ලාභ සහිත) රු. '000	රක්ෂණ වගකීම් (ලාභ රහිත) රු. '000	මුළු දළ රක්ෂණ වගකීම් රු. '000
සම්පූර්ණ ජීවිත	14,181	2,612	16,793	18,698	4,052	22,750
දායාද රක්ෂණය	71,656,329	4,501,657	76,157,986	60,885,389	4,297,782	65,183,170
කාල සහතිකය	–	2,170,962	2,170,962	–	3,905,620	3,905,620
වාර්ෂිකය	11,841,459	2,515,694	14,357,153	10,868,079	4,340,973	15,209,052
රයිඩර් ප්‍රතිලාභ	74,309	3,080,047	3,154,356	93,286	3,381,027	3,474,313
එකතුව	83,586,278	12,270,972	95,857,250	71,865,452	15,929,454	87,794,906

පහත වගුව මඟින් සමාගමේ සහභාගී සහ සහභාගී නොවන අරමුදල් තත්ත්වය පෙන්නුම් කරයි:

සහභාගී නොවන අරමුදල් අනුව සහභාගී අරමුදල්	සහභාගිත්ව රු. '000	සහභාගී නොවන රු. '000	එකතුව රු. '000
2022	142,112,355	14,606,647	156,719,002
ප්‍රතිශතය	90.68%	9.32%	
2021	136,647,210	15,937,849	152,585,059
ප්‍රතිශතය	89.55%	10.45%	

44.1.2 ජීවිත නොවන රක්ෂණ ගිවිසුම්

සාමාන්‍ය රක්ෂණ අවදානම

සාමාන්‍ය රක්ෂණ අවදානමට රක්ෂිත සිදුවීම් සිදුවීමේ වාර ගණන අවිනිශ්චිතවීම හේතුවෙන් සැලකියයුතු අලාභවල සාධාරණ සම්භාවිතාව මෙන්ම හිමිකම් ඇතිවීමේ බරපතලකම ඇතුළත් වේ.

පහතින් සමූහයේ ප්‍රධාන ව්‍යාපාර මාර්ග පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයයි:

- මෝටර් රථයට වන භෞතික හානිය, රක්ෂිත වාහනයට වන අලාභය සහ මෝටර් රථයේ තෙවන පාර්ශවීය වගකීම් රක්ෂණය මෝටර් රථවලට ඇතුළත් වේ.
- දේපළවලට ගින්නෙන් වන අවදානම් (උදාහරණ ලෙස ගිනි ගැනීම්, පිපිරීම් සහ ව්‍යාපාර බාධා කිරීම්), ස්වභාවික උපද්‍රව (උදාහරණ ලෙස භූමිකම්පා, සුළි කුණාටු සහ ගංවතුර), ඉංජිනේරුමය මාර්ග (උදාහරණ ලෙස බොයිලේරු පිපිරීම, යන්ත්‍රෝපකරණ බිඳවැටීම සහ ඉදිකිරීම්) සහ මුහුදු (නැව් භාණ්ඩ හා නැව් බඳ) ඇතුළත් වේ.
- වගකීම්වලට සාමාන්‍ය/පොදු සහ නිෂ්පාදන වගකීම්, අතිරික්ත සහ රැකවරණ වගකීම්, වෛද්‍ය අක්‍රමිකතාද ඇතුළත්ව වෘත්තීමය වගකීම් සහ දෝෂ සහ වගකීම් පැහැරහැරීම් ඇතුළත් වේ.
- විශේෂ මාධ්‍යවලට අධ්‍යක්ෂවරුන් සහ නිලධාරීන්, ණය සහ ඇප, අපරාධ සහ විශ්වසනීයත්වය, හදිසි අනතුරු සහ සෞඛ්‍යය, සහ බෝග ඇතුළත් වේ
- සේවකයන්ට වන තුවාලවීම්වලට සේවක වන්දි සහ සේවා යෝජකයන්ගේ වගකීම් ඇතුළත් වේ.

සමාගමේ ප්‍රාරක්ෂණ උපායමාර්ගය වන්නේ සමාගම ක්‍රියාත්මක වන කර්මාන්ත සහ භූගෝලීය කලාප හරහා සාමාන්‍ය රක්ෂණ අවදානම් විවිධාංගීකරණය කිරීමෙන් ප්‍රයෝජන ගැනීමයි. ස්කන්ධ ඉලක්ක මත මධ්‍ය කාලීන ප්‍රතිලාභ අත්කර ගැනීමෙන් කොටස් හිමියන්ගේ වටිනාකම ප්‍රශස්ත කිරීමට සමාගම උත්සාහ කරයි. එසේ කිරීම සඳහා බාධාකාරී අස්ථාවරත්වය සමඟ අවදානම් වළක්වා ගන්නා අතරතුර එහි තරඟකාරී ශක්තීන්ගෙන් ප්‍රයෝජන ගැනීමට ඉලක්ක කරන විචක්ෂණශීලී, ස්ථාවර ප්‍රතිරක්ෂණ දර්ශනයක් අවශ්‍ය වේ. සමාගමේ ප්‍රතිරක්ෂණයේ හරය වන්නේ ශක්තිමත් පාලන ක්‍රියාවලියකි.

පහත වගුව මඟින් පෙන්නුම් කරන්නේ ප්‍රතිරක්ෂණයට පෙර සහ ප්‍රතිරක්ෂණයෙන් පසු ඍජු ලිඛිත වාරික මත පදනම් වූ ව්‍යාපාර මාර්ග අනුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ සමූහයේ අවදානමේ සංකේන්ද්‍රණයයි.

2022 පන්තිය	ද.ලි.වාරිකය රු. '000	ප්‍රතිරක්ෂණය රු. '000	ශු.ලි.වාරිකය රු. '000	%
මෝටර් රථ	12,780,151	360,296	12,419,855	81.92%
ගිනි	3,123,352	2,776,846	346,505	2.29%
මුහුදු	943,001	735,644	207,357	1.37%
වෙනත්	3,494,944	1,308,155	2,186,789	14.42%
	20,341,448	5,180,941	15,160,506	100.00%

2021 පන්තිය	ද.ලි.වාරිකය රු. '000	ප්‍රතිරක්ෂණය රු. '000	ශු.ලි.වාරිකය රු. '000	%
මෝටර් රථ	11,672,493	302,032	11,370,461	66.01%
ගිනි	2,338,650	2,069,082	269,568	1.56%
මුහුදු	613,047	442,303	170,744	0.99%
වෙනත්	6,630,833	1,215,592	5,415,242	31.44%
	21,255,023	4,029,008	17,226,015	100.00%

ප්‍රතිරක්ෂණ අවදානම

සමූහය සිය අවදානම් අවම කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස ප්‍රතිරක්ෂණය මිලදී ගනී. පවාරණ ප්‍රති රක්ෂණය ලබා දී ඇත්තේ සමානුපාතික හා සමානුපාතික නොවන පදනම මතය. සමානුපාතික ප්‍රතිරක්ෂණ විධිවිධානයට කෝටා කොටස් සහ අතිරික්ත ගිවිසුම් වැඩසටහන් ඇතුළත් වන අතර සමහර ව්‍යාපාර පන්තිවලට සමාගමේ සමස්ත නිරාවරණය අවම කිරීම ගනී. මූලික වශයෙන් පාඩු ප්‍රතිරක්ෂණ විධිවිධාන ඉක්මවා ඇති සමානුපාතික නොවන ප්‍රතිරක්ෂණ වැඩසටහන්, විශාල තනි හා විනාශකාරී අලාභ මඟින් සමූහ ශුද්ධ නිරාවරණය අවම කිරීම සඳහා නිර්මාණය කර ඇත. අලාභ ප්‍රතිරක්ෂණ වැඩසටහන් වැඩිවීමෙහි රඳවා ගැනීමේ සීමාවන් නිෂ්පාදන මාර්ගය අනුව වෙනස් වේ.

44. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

44.1 රක්ෂණ අවදානම (ඉතිරි කොටස...)

ප්‍රතිරක්ෂණ අවදානම

44.1.2 ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් (ඉතිරි කොටස...)

සමූහයට එකඟතා ඇති ප්‍රතිරක්ෂණ සමාගම්වල ණය ශ්‍රේණිගත කිරීම් පහත වගුව මගින් දැක්වේ.

සමාගමේ නම	ණය ශ්‍රේණිගත කිරීම්	මූල්‍ය ශක්තිය ශ්‍රේණිගතකිරීම	ශ්‍රේණිගතකරන ආයතනයේ නම
ඒ එෆ් බීස්ලේ ඇන්ඩ් අදර්ස්	a+	A	A.M.Best
අබුදාබි නැෂනල් ඉන්ෂුරන්ස්	a	A	A.M.Best
ඒඅයිපී මෙයා සමාගම	a	A	A.M.Best
අලියාන්ස් ග්ලෝබල් කෝපරේට් ඇන්ඩ් ස්පෙසිලිටි එස්ඊ	aa	A+	A.M.Best
අන්ටෙරස් මැනේජින්ග් ඒජන්සි සමාගම	a+	A	A.M.Best
ඇඔන් අන්ඩර්රයිටින් මැනේජර්ස්	a+	A	A.M.Best
ඇපලෝ සින්ඩිකේට් මැනේජ්මන්ට් සමාගම	a+	A	A.M.Best
ආර්චි සින්ඩිකේට් 1955	a+	A	A.M.Best
ආර්චි ඉන්ෂුරන්ස් (එක්සත් රාජධානිය) සමාගම	aa-	A+	A.M.Best
ආර්චි මැනේජින්ග් ඒජන්සි සමාගම	a+	A	A.M.Best
ආර්ගෝ මැනේජින්ග් ඒජන්සි සමාගම	a+	A	A.M.Best
ඇසිකුරේසියෝනි ජෙනිරාලි එස් පී ඒ	a+	A	A.M.Best
ඒ එක්ස් ඒ එක්ස් එල් ඉන්ෂුරන්ස් කම්පැනි එස්ඊ, සිංගප්පූරුව	aa-	A+	A.M.Best
ඇක්සිස් ස්පෙසිලිටි සමාගම	a+	A	A.M.Best
බීස්ලේ ෆර්ලෝන්ග් සමාගම	a+	A	A.M.Best
බර්ක්ෂයර් හතවේ ස්පෙසිලිටි ඉන්ෂුරන්ස් කම්පැනි	aaa	A++	A.M.Best
බෙස්ට් මෙරිඩන් ඉන්ටර්නැෂනල් ඉන්ෂුරන්ස් කම්පැනි	a-	A-	A.M.Best
BE බ්‍රිටිස් මැරීන්/කිව්බීඊ ඉන්ෂුරන්ස් ගෘප්	a+	A	A.M.Best
කැනොපියස් මැනේජින්ග් ඒජන්සි සමාගම	a+	A	A.M.Best
කාසල් අන්ඩර්රයිටින් ඒජන්සි සමාගම	a+	A	A.M.Best
සීසීආර් රේ	a	A	A.M.Best
චවුසර් සින්ඩිකේට් සමාගම	a+	A	A.M.Best
චයිනා පැසිපික් ප්‍රොපර්ටි ඉන්ෂුරන්ස් කම්පැනි සමාගම, ෂෙන්සෙන් ශාඛාව (CPIC)	A	A	S & P
චයිනා රිඉන්ෂුරන්ස් (ගෘප්) කෝපරේෂන්	a	A	A.M.Best
ජුබ් යුරෝපියන් ගෘප් එස්ඊ	aa+	A++	A.M.Best
කොන්වෙක්ස් ඉන්ෂුරන්ස් එක්සත් රාජධානිය සමාගම, ලන්ඩන්, එංගලන්තය	a-	A-	A.M.Best
අර්ගෝ වර්සිචෙරන්ග් ඒපී	AA-	AA-	S & P
ගාර්ඩ මැරීන් ඇන්ඩ් එබර්පි සමාගම, සිංගප්පූරුව ශාඛාව	A+	A+	S & P
ගාර්ඩ මැරීන් ඇන්ඩ් එබර්පි සමාගම	A+	A+	S & P
ජෙනරල් ඉන්ෂුරන්ස් කෝපරේෂන් ඔෆ් ඉන්දියා, ඉන්දියාව	bbb+	B++	A.M.Best
හැනෝවර් රේ, සිංගප්පූරුව	aa	A+	A.M.Best
හැනෝවර් රුක් එස්ඊ	aa	A+	A.M.Best
හාර්ඩි (අන්ඩර්රයිටින් ඒජන්සීස්) සමාගම	a+	A	A.M.Best
එච්ඩීඅයි ග්ලෝබල් ස්පෙසිලිටි එස්ඊ, ස්ටොක්හෝල්ම්, ස්වීඩනය	aa-	A+	A.M.Best
හුවාටෙයි ප්‍රොපර්ටි ඇන්ඩ් කැෂුවලිටි ඉන්ෂුරන්ස් කම්පැනි සමාගම	A	A	Fitch
ඉන්දියා ඉන්ටර්නැෂනල් ඉන්ෂුරන්ස් පුද්ගලික සමාගම, සිංගප්පූරුව	A-	A-	S & P
ඉන්ටර්නැෂනල් ජෙනරල් ඉන්ෂුරන්ස් කම්පැනි (එක්සත් රාජධානිය) සමාගම	a	A	A.M.Best

සමාගමේ නම	ණය ශ්‍රේණිගත කිරීම්	මූල්‍ය ශක්තිය ශ්‍රේණිගතකිරීම	ශ්‍රේණිගතකරන ආයතනයේ නම
අයිකිව්යූ ඩබ්ලිව් සින්ඩිකේට් මැනේජ්මන්ට් සමාගම	a+	A	A.M.Best
කොරියන් රිඉන්ෂුරන්ස් කම්පැනි	a	A	A.M.Best
ලබුආන් රිඉන්ෂුරන්ස් (එල්) සමාගම	a-	A-	A.M.Best
ලිබර්ටි ස්පෙසිලිටි මාර්කට්	A	A	S & P
මැපෆ්‍රේ රේ කම්පැනියා ද රිඇසෙගුරොස් එස්ඒ, මැඩ්රිඩ්, ස්පාඤ්ඤය	a+	A	A.M.Best
මාර්කට් ඉන්ටර්නැෂනල් ඉන්ෂුරන්ස් කම්පැනි සමාගම, ලන්ඩන්	a+	A	A.M.Best
මාර්කල් සින්ඩිකේට් මැනේජ්මන්ට් සමාගම	a+	A	A.M.Best
මේනා රේ අන්ඩර්රයිටින් සමාගම	A-	A-	S & P
සීමාසහිත අම්ලින් අන්ඩර්රයිටින් සමාගම	a+	A	A.M.Best
සීමාසහිත ෆර්ස්ට් කැපිටල් ඉන්ෂුරන්ස් සමාගම	a+	A	A.M.Best
මූනිච් රේ සින්ඩිකේට් සමාගම	a+	A	A.M.Best
මූනිච් රේ සින්ඩිකේට් සිංගප්පූරුව පුද්ගලික සමාගම	a+	A	A.M.Best
නෙව්ගේටර්ස් අන්ඩර්රයිටින් ඒජන්සි සමාගම	a+	A	A.M.Best
නව්යුම් මැරින් සමාගම/ෆිඩෙලිස් අන්ඩර්රයිටින් සමාගම	a	A	A.M.Best
නෙක්සස් අන්ඩර්රයිටින් සමාගම, ලන්ඩන් ඇක්ක්‍රෙඩිටඩ් ඉන්ෂුරන්ස් (යුරෝපය) සමාගම	a-	A-	A.M.Best
ඕෂන් ඉන්ටර්නැෂනල් රිඉන්ෂුරන්ස් කම්පැනි සමාගම	a-	A-	A.M.Best
ඕමාන් ඉන්ෂුරන්ස් කම්පැනි, සීඑස්සී, එක්සත් අරාබි ඒමීර් රාජ්‍ය	a	A	A.M.Best
ඔප්ටියෝ අන් සමාගම/ඔප්ටියෝ යුරෝප් සමාගම	a+	A	A.M.Best
ඔරියන්ට් ඉන්ෂුරන්ස් පිජේඑස්සී	a+	A	A.M.Best
පීඅයිසීසි ප්‍රොපර්ටි ඇන්ඩ් කැෂුවල්ටි කම්පැනි සමාගම	A-	A-	S & P
පින් ඇන් ප්‍රොපර්ටි ඇන්ඩ් කැෂුවල්ටි ඉන්ෂුරන්ස් කම්පැනි ඔෆ් චයිනා	A-	A-	S & P
කිව්බීඊ යුරෝප් එස්ඒ/එන්වී ට්‍රේඩින් ඇස් බ්‍රිටිස් මැරින්	a+	A	A.M.Best
රොක්ස්ටෝන් අන්ඩර්රයිටින් මැනේජර්ස්	a+	A	A.M.Best
රෝයල් සුන් අලියාන්ස් ඉන්ෂුරන්ස් පොදු සමාගම	a+	A	A.M.Best
නිව් රිඉන්ෂුරන්ස් කම්පැනි සමාගම	aa	A+	A.M.Best
සිංගප්පූරුව රිඉන්ෂුරන්ස් කෝපරේෂන් සමාගම	a	A	A.M.Best
සිනොපෙක් ඉන්ෂුරන්ස් සමාගම	A+	A+	S & P
සිරියස් පොයින්ට් ඉන්ටර්නැෂනල් ඉන්ෂුරන්ස් කෝපරේෂන්	a-	A-	A.M.Best
ස්ටාර් ඉන්ටර්නැෂනල් (යුරෝපය) සමාගම	a+	A	A.M.Best
ස්ටාර් ප්‍රොපර්ටි ඇන්ඩ් කැෂුවල්ටි ඉන්ෂුරන්ස් (චීනය) කම්පැනි සමාගම	a	A	A.M.Best
ස්ටිම්සිප් මියුචුවල් අන්ඩර්රයිටින් ඇසෝසියේෂන් සමාගම	A	A	S &P
ස්විස් රේ ආසියා පුද්ගලික සමාගම	aa	A+	A.M.Best
ස්විස් රේ ඉන්ටර්නැෂනල් එස්ඊ – සිංගප්පූරුව ශාඛාව	aa	A+	A.M.Best
ටයිපින්ග් රිඉන්ෂුරන්ස් කම්පැනි සමාගම	a	A	A.M.Best
ටෝල්බොට් රිස්ක් සර්විසස් පුද්ගලික සමාගම	a+	A	A.M.Best
ද සිප්ඕනර්ස් මියුචුවල් ප්‍රොටෙක්සන් ඇනඩ් ඉන්ඩෙම්නිටි ඇසෝසියේෂන්	A	A	S & P
ටෝකියෝ මැරින් ඇන්ඩ් නිච්ඩෝ ෆයර් ඉන්ෂුරන්ස් කම්පැනි සමාගම	aa+	A++	A.M.Best
ටෝකියෝ මැරින් කම්බයින්ඩ් සින්ඩිකේට් 510	a+	A	A.M.Best
ටෝකියෝ මැරින් කිල්න් සින්ඩිකේට් අංක 1880 (ටීඑම්කේ)	a+	A	A.M.Best
ට්‍රැවලර්ස් සින්ඩිකේට් මැනේජ්මන්ට් සමාගම	a+	A	A.M.Best
ට්‍රිග්ලෙව් රේ රිඉන්ෂුරන්ස් කම්පැනි සමාගම	A	A	S & P
වෙයිනර් ස්ටේඩ්ටිෂ් වර්සික්චෙරන්ග් ඒ ඩී වියානා ඉන්ෂුරන්ස් කම්පැනි	A+	A+	S & P
එක්ස්එල් කැට්ලින් ඉන්ෂුරන්ස් කම්පැනි එක්සත් රාජධානිය සමාගම	aa-	A+	A.M.Best
සූරිච් ඉන්ෂුරන්ස් කම්පැනි	aa-	A+	A.M.Best

44. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

44.1 රක්ෂණ අවදානම (ඉතිරි කොටස...)

ප්‍රතිරක්ෂණ අවදානම

44.1.2 ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් (ඉතිරි කොටස...)

දළ විශ්ලේෂණය

සමාගම ප්‍රධාන වශයෙන් මූල්‍ය අවදානම්, රක්ෂණ අවදානම් සහ නියාමන අවදානම්වලට නිරාවරණය වේ. එම අවදානම් මැනීම, අවම කිරීම සහ නියාමනය සඳහා සමාගමේ ප්‍රතිපත්ති සහ ක්‍රියපටිපාටි මෙම සටහනේ දැක්වේ. සමාගම අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කර ඇති අතර සමාගමේ අවදානම් කළමනාකරණ කාර්යය ස්ථාපිත කිරීම සහ පාලනය සඳහා සමස්ථ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

මූල්‍ය අවධානම

සමාගමේ ආයෝජන කටයුතු මූල්‍ය අවදානමට නිරාවරණය වන අතර එයට ණය අවදානම්, ද්‍රවශීලතා අවදානම් සහ වෙළෙඳපොල අවදානම් ඇතුළත් වේ. අවදානම් අවම කිරීම සහ ආයෝජන ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීම සඳහා ආයෝජන කමිටුව වගකිව යුතුය.

ආයෝජන අවදානම් කළමනාකරණය වත්කම් ප්‍රතිඵලවල ඉහළ අස්ථාවරත්වය, වෙළෙපොල මතය සහ අදහස්වල ඉහළ සම්බන්ධතාව සහ පුළුල් විසිරීම හේතුවෙන් අඩුකළ විවිධ ප්‍රතිලාභ මගින් ඇති වූ පවත්නා ව්‍යවුල් වෙළෙඳපොල තුළ ඉතා වැදගත්ය.

ආයෝජන අවදානම් කළමනාකරණයේ පරමාර්ථය වන්නේ ආයෝජන අරමුණු සාක්ෂාත් කර ගැනීමට බලපාන අවදානම් වහාම හඳුනා ගැනීම, මැනීම, කළමනාකරණය, වාර්තා කිරීම සහ අධීක්ෂණය කිරීමයි. අදාළ (ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම) රක්ෂණ රෙගුලාසිවල සන්දර්භය තුළ දූරදර්ශී අවදානම් කළමනාකරණ මූලධර්ම මත පදනම්ව, වත්කම් වර්ධනය සහ අරමුදලේ බැඳීම් සපුරාලීම සඳහා ආදායම අතර සුදුසු ශේෂයක් පවත්වා ගැනීමට අවදානම ගැනීම, වළක්වා ගැනීම, අවම කිරීම සහ සකස් කිරීම මෙයට ඇතුළත් වේ.

44.2 වෙළෙඳපොල අවදානම

වෙළෙඳපොල අවදානම යනු විදේශ විනිමය අනුපාත සහ පොළී අනුපාත වැනි වෙළෙඳපොල මිලෙහි වෙනස් වීමේ අවදානම වන අතර එය සමූහයේ ආදායමට හෝ එහි මූල්‍ය උපකරණවල දරාසිටීමේ වටිනාකම කෙරෙහි බලපායි. වෙළෙඳපොල අවදානම් කළමනාකරණයේ පරමාර්ථය වන්නේ ප්‍රතිලාභ ප්‍රශස්ත කරන අතරම පිළිගත හැකි පරාමිතීන් තුළ වෙළෙඳපොල අවදානම් නිරාවරණ කළමනාකරණය කිරීම සහ පාලනය කිරීමයි.

ආයෝජන කළඹ කළමනාකරණය කිරීමේදී ස්කන්ධය සඳහා උපරිම නිරාවරණ සීමාව සමූහය විසින් පවත්වාගෙන යනු ලැබේ. තවද, ක්‍රමානුකූල නොවන අවදානම් අවම කිරීම සඳහා සමූහය විසින් ආයෝජන කළඹ විවිධ අංශවලට විවිධාංගීකරණය කර ඇත.

ස්කන්ධ වෙළෙඳපොල සංවේදීතාව

සමාගම	වෙළෙඳපොල පිබිදීම		වෙළෙඳපොල බිඳවැටීම	
	ලාභයට ඇති බලපෑම රු. '000	OCI ඇති බලපෑම රු. '000	ලාභයට ඇති බලපෑම රු. '000	OCI ඇති බලපෑම රු. '000
2022 දෙසැම්බර් 31 දිනට				
කම්පන මට්ටම:				
5%	1,151,564	634,445	(1,151,564)	(634,445)
10%	2,303,128	1,268,890	(2,303,128)	(1,268,890)
	3,454,692	1,903,335	(3,454,692)	(1,903,335)
2021 දෙසැම්බර් 31 දිනට				
කම්පන මට්ටම:				
5%	959,902	1,018,664	(959,902)	(1,018,664)
10%	1,919,803	2,037,328	(1,919,803)	(2,037,328)
	2,879,705	3,055,992	(2,879,705)	(3,055,992)

44.2.1 පොළී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු ණය පැතිරීමේ අවදානම විස්තර කරන අතරතුර වත්කම් හා වගකීම්වල අගයන්හි සංවේදීතාව, මට්ටමේ වෙනස්වීම් හෝ ණය රහිත අස්ථාවරත්වය අවදානම් රහිත පොලී අනුපාත ප්‍රතිලාභ වක්‍රය පුරා පැහිරීම නිසා සිදුවන ප්‍රතිලාභ වක්‍රයේ හැඩයේ වෙනස්වීම් ඇතුළුව, පොලී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් සිදුවන පොලී අවදානමයි.

අවදානම් සීමාවන් සමඟ සමස්ථ තත්ත්වයට එකඟවීමෙන් පොලී අනුපාත අවදානම එක් එක් ප්‍රධාන කල්පිරීම් රාමුව හරහා කළමනාකරණය කෙරේ. ආයෝජන කමිටුව ස්ථාවර ආදායම් කළඹ සක්‍රියව කළමනාකරණය කළ අතර එහිදී අඩු ප්‍රතිලාභයක් සහිත ආයෝජන වලින් සාපේක්ෂව ඉහළ ප්‍රතිලාභයක් සහිත ආයෝජන වෙත උපායමාර්ගිකව මාරුවීම, නොගැලපීම් කාලසීමාව සමීපව නිරීක්ෂණය කිරීමෙන් පොලී ආදායම මත වන පීඩනය අවම කිරීම සිදුකර ඇත.

පොලී අනුපාත අවදානම අවම කිරීම සඳහා සමූහය විසින් පහත සඳහන් ප්‍රතිපත්ති අනුගමනය කර ඇත.

1. ආයෝජන වලින් සැලකිය යුතු කොටසක් අවදානම් රහිත ආයෝජන පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම විසින් නිකුත් කළ නීති හා රෙගුලාසි පිළිපදිමින් රජයේ සුරැකුම්පත්වල අවදානම් රහිත ආයෝජනවල සිදු කිරීම.
2. ආයෝජන කළඹේ ප්‍රධාන කොටස ශ්‍රේණිගත මූල්‍ය ආයතනවල හෝ ශ්‍රේණිගත උපකරණවල සිදු කිරීම.
3. ආයෝජන කමිටුව ආයෝජන තීරණ ගන්නා අතර අවශ්‍ය ඕනෑම තැනක අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.

පොළී අනුපාත අවදානමට නිරාවරණය

සමූහයේ කළමනාකාරිත්වයට වාර්තා කර ඇති පරිදි සමූහයේ පොලී අනුපාත දරන මූල්‍ය උපකරණවල පොලී අනුපාත විස්තර පහත පරිදි වේ.

දෙසැම්බර් 31 සමාගම	**2022** **රු. '000**	2021 රු. '000
ස්ථාවර අනුපාත උපකරණ		
කල්පිරීම සඳහා පවතින (HTM)		
භාණ්ඩාගාර බිල්පත්	69,802,527	60,916,652
ණය සහ ලැබීම් (L&R)		
ලැයිස්තුගත නොකළ ණයකර	15,870,218	14,933,560
කාලීන තැන්පතු	22,039,325	11,590,662
සංවර්ධන බැඳුම්කර	14,679,930	8,637,546
විකිණීම සඳහා තබා ඇති (AFS)		
ලැයිස්තුගත ණයකර	33,756,794	39,379,579
භාණ්ඩාගාර බැඳුම්කර	3,261,196	3,929,773
	159,409,991	139,387,772
පාවෙන අනුපාත උපකරණ		
ණය සහ ලැබීම් (L & R)		
සංවර්ධන බැඳුම්කර	4,727,709	4,119,116
ලැයිස්තුගත නොකළ ණයකර	7,501,161	7,410,416
	12,228,870	11,529,532
	171,638,861	150,917,304

සංවේදිතා විශ්ලේෂණ

වාර්තා කරන දිනට පොලී අනුපාතවල පදනම් අංක 100 ක වියහැකි වෙනස පහත දක්වා ඇති ගණන් වලින් සක්‍රීයය සහ පොලී ආදායම ඉහළ නංවනු (පහළ හෙළනු) ඇත.

44. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

44.2 වෙළෙඳපොල අවදානම (ඉතිරි කොටස...)

පොළී අනුපාත අවදානමට නිරාවරණය

44.2.1 පොළී අනුපාත අවදානම (ඉතිරි කොටස...)

2022 දෙසැම්බර් 31	එලදා වක්‍රයේ ඉහළට 100bps සාමාන්තර විස්තාපනය		එලදා වක්‍රයේ පහළට 100bps සාමාන්තර විස්තාපනය	
සමාගම	පොළී ආදායම කෙරෙහි බලපෑම රු. '000	ස්කන්ධය කෙරෙහි බලපෑම රු. '000	පොළී ආදායම කෙරෙහි බලපෑම රු. '000	ස්කන්ධය කෙරෙහි බලපෑම රු. '000
මූල්‍ය ආයෝජන				
ණය සහ ලැබීම් (L&R)	753,063	–	(753,063)	–
විකිණීමට තබා ඇති (AFS)	–	35,815,129	–	37,413,811
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට (FVTPL)	–	–	–	–
	753,063	35,815,129	(753,063)	37,413,811

2021 දෙසැම්බර් 31	එලදා වක්‍රයේ ඉහළට 100bps සාමාන්තර විස්තාපනය		එලදා වක්‍රයේ පහළට 100bps සාමාන්තර විස්තාපනය	
සමාගම	පොළී ආදායම කෙරෙහි බලපෑම රු. '000	ස්කන්ධය කෙරෙහි බලපෑම රු. '000	පොළී ආදායම කෙරෙහි බලපෑම රු. '000	ස්කන්ධය කෙරෙහි බලපෑම රු. '000
මූල්‍ය ආයෝජන				
ණය සහ ලැබීම් (L&R)	767,620	–	(767,620)	–
විකිණීමට තබා ඇති (AFS)	–	38,215,582	–	39,397,702
	767,620	38,215,582	(767,620)	39,397,702

*** එලදා වක්‍රයේ වෙනස්වීමක් වූ විටෙක පහත තත්ත්වයක් ඇතිවිය හැකිය:**

පොළී ආදායමේ හෝ HTM හා L&R යටතේ වර්ගීකරණය කර ඇති ස්ථිර අනුපාත ණය උපකරණ සඳහා ස්කන්ධයට කිසිදු බලපෑමක් ඇති වී නැත.

HTM හා L&R යටතේ වර්ගීකරණය කර ඇති පාවෙන අනුපාත ණය උපකරණ සඳහා වූ ස්කන්ධයට කිසිදු බලපෑමක් නොවී පොළී ආදායමට බලපෑමක් ඇති වී ඇත.

පොළී ආදායමට කිසිදු බලපෑමක් නොවුවද AFS යටතේ වර්ගකර ඇති ස්ථිර අනුපාත ණය උපකරණ සඳහා වූ ස්කන්ධයට බලපෑමක් ඇති වී ඇත.

පොළී ආදායමට බලපෑමක් වුවද AFS යටතේ වර්ගකර ඇති පාවෙන අනුපාත ණය උපකරණ සඳහා වූ ස්කන්ධයට කිසිදු බලපෑමක් එල්ල වී නැත.

44.2.2 විදේශ විනිමය අවදානම

ශ්‍රී ලංකා රුපියල හැර වෙනත් මුදල් ඒකකයකින් නම්කරන මුල්‍ය වත්කම් හි ආයෝජනය මත සමූහය විනිමය අවදානමට අනාවරණය වේ. මෙම ගණුදෙණු මූලික වශයෙන් නම් කරන විදේශ විනිමය වන්නේ ඇමෙරිකන් ඩොලර්, යුරෝ, ඔස්ට්‍රේලියානු ඩොලර් සහ ස්ටර්ලින් පවුම් වේ.

විනිමය අවදානමට නිරාවරණය

විදේශ මුදල් අවදානම සඳහා සමූහයේ අනාවරණය විම කාල්පනික අගයන් මත පහත පරිදි වේ.

	ධාරණ අගය	
සමාගම	**2022 රු. '000**	2021 රු. '000
සංවර්ධන බැඳුම්කර:		
ඇමෙරිකන් ඩොලර්	19,407,639	12,756,662
ස්ථිර තැන්පතු:		
ඇමෙරිකන් ඩොලර්	2,368,012	56,918
	21,775,651	12,813,579

පහත සඳහන් සැලකියයුතු හුවමාරු අනුපාත වසර තුළ අදාළ විය.

	සාමාන්‍ය අනුපාතය		වාර්තාකරණ දිනට පවතින අනුපාතය	
	2022 රු. '000	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
ඇමරිකන් ඩොලර්	280.11	191.50	361.71	198.50
මහ බ්‍රිතාන්‍ය පවුම්	350.08	258.60	433.49	266.67
ඕස්ට්‍රේලියානු ඩොලර්	192.28	136.83	242.26	142.31
යුරෝ	305.57	218.42	385.79	225.36

සංවේදිතා විශ්ලේෂණ

2022 දෙසැම්බර් 31 වන දිනට ඇමෙරිකානු ඩොලර්, මහා බ්‍රිතාන්‍ය පවුම්, යුරෝ සහ ඕස්ට්‍රේලියානු ඩොලර්වලට අනුව පහත සඳහන් පරිදි ශ්‍රී ලංකා රුපියලේ ශක්තිමත් වීමක් විදේශ මුදල් ලාභ/ආලාභ සහ පොළී අදායම පහත දැක්වෙන අගයන්ගෙන් වැඩි වී/(අඩු වී) ඇත. අනෙකුත් සියලුම විචල්‍යතා විශේෂයෙන් පොළී අනුපාත නොවෙනස්ව පවතින බව මෙම විශ්ලේෂණයෙන් පිළිගනී.

2022 දෙසැම්බර් 31	විනිමය අනුපාත කම්පන මට්ටම		
සමාගම	**1.0% රු. '000**	**1.5% රු. '000**	**2.0% රු. '000**
විදේශ විනිමය ලාභ/අලාභ මත බලපෑම			
පාවෙන අනුපාත උපකරණ			
ඇමෙරිකන් ඩොලර්	194,076	291,115	388,153
ස්ථිර අනුපාත උපකරණ			
ඇමෙරිකන් ඩොලර්	23,680	35,520	47,360
	217,757	326,635	435,513

2022 දෙසැම්බර් 31	විනිමය අනුපාත කම්පන මට්ටම		
සමාගම	**1.0% රු. '000**	**1.5% රු. '000**	**2.0% රු. '000**
පොළී ආදායම මත බලපෑම			
පාවෙන අනුපාත උපකරණ			
ඇමෙරිකන් ඩොලර්	12,173	18,259	24,345
ස්ථිර අනුපාත උපකරණ			
ඇමෙරිකන් ඩොලර්	–	–	–
	12,173	18,259	24,345

2021 දෙසැම්බර් 31	විනිමය අනුපාත කම්පන මට්ටම		
සමාගම	**1.0% රු. '000**	**1.5% රු. '000**	**2.0% රු. '000**
විදේශ විනිමය ලාභ/අලාභ මත බලපෑම			
පාවෙන අනුපාත උපකරණ			
ඇමෙරිකන් ඩොලර්	127,567	191,350	255,133
ස්ථිර අනුපාත උපකරණ			
ඇමෙරිකන් ඩොලර්	569	854	1,138
	128,136	192,204	256,272

2021 දෙසැම්බර් 31	විනිමය අනුපාත කම්පන මට්ටම		
සමාගම	**1.0% රු. '000**	**1.5% රු. '000**	**2.0% රු. '000**
පොළී ආදායම මත බලපෑම			
පාවෙන අනුපාත උපකරණ			
ඇමෙරිකන් ඩොලර්	6,696	10,044	13,392
ස්ථිර අනුපාත උපකරණ			
ඇමෙරිකන් ඩොලර්	–	–	–
	6,696	10,044	13,392

44. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

44.2 වෙළෙඳපොල අවදානම (ඉතිරි කොටස...)

44.2.3 වෙළෙඳපොල අනුපාත අවදානම

ආයෝජන කළඹ කළමනාකරණය කිරීමේ දී ස්කන්ධ සඳහා උපරිම අනාවරණ සීමාව සමාගම විසින් පවත්වාගෙන යයි. තවද, අක්‍රමවත් අවදානම් අවම කිරීම සඳහා සමාගම ආයෝජන කළඹ විවිධ අංශවලට විවිධාංගීකරණයට ලක් කර ඇත.

ස්කන්ධ අවදානම් කළඹ විවිධාංගීකරණය

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව -ජීවිත රක්ෂණ ව්‍යාපාරය

		2022		2021	
අංශය	කර්මාන්ත සමූහය	වෙළඳපොල වටිනාකම රු. '000	%	වෙළඳපොල වටිනාකම රු. '000	%
මූල්‍ය	බැංකු	8,467,724	31.54%	13,588,432	46.90%
	විවිධාංගීකරණය කළ මූල්‍ය	1,507,512	5.62%	1,530,696	5.28%
මූල්‍ය		9,975,236	37.16%	15,119,128	52.19%
ගනුදෙනුකාර අභිමතිය	ගනුදෙනුකාර සේවා	1,747,775	6.51%	1,692,833	5.84%
	ගනුදෙනුකාර පාරිභෝගික ද්‍රව්‍ය සහ ඇඟලුම්	–	0.00%	–	0.00%
	සිල්ලර	26,308	0.10%	56,165	0.19%
	රථවාහන හා උපාංග	–	0.00%	–	0.00%
ගනුදෙනුකාර අභිමතිය		1,774,083	6.61%	1,748,998	6.04%
කර්මාන්ත	ප්‍රාග්ධන භාණ්ඩ	9,411,952	35.06%	8,265,137	28.53%
සෞඛ්‍යාරක්ෂාව*	සෞඛ්‍යාරක්ෂාව සහ උපකරණ හා සේවා	204,147	0.76%	1,552,512	5.36%
විදුලි සංදේශ සේවා	විදුලි සංදේශ සේවා	1,202,763	4.48%	697,921	2.41%
අමුද්‍රව්‍ය	අමුද්‍රව්‍ය	1,688,554	6.29%	776,696	2.68%
පාරිභෝගික ද්‍රව්‍ය	ආහාර සහ ප්‍රධාන සිල්ලර ද්‍රව්‍ය	–	0.00%	–	0.00%
	ආහාරපාන සහ දුම්කොල	1,417,031	5.28%	321,780	1.11%
නිශ්චල දේපල	නිශ්චල දේපල	69,273	0.26%	89,265	0.31%
බලශක්තිය	බලශක්තිය	919,772	3.43%	149,795	0.52%
තොරතුරු තාක්ෂණය	උපයෝගිතා	182,664	0.68%	249,350	0.86%
එකතුව		26,845,475	100%	28,970,583	100.00%

** ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන ලංකා හෝස්පිටල්ස් කෝපරේෂන් පොදු සමාගම ද ඇතුලත්ය.*

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

		2022		2021	
අංශය	කර්මාන්ත සමූහය	වෙළඳපොල වටිනාකම රු. '000	%	වෙළඳපොල වටිනාකම රු. '000	%
මූල්‍ය	බැංකු	5,542,689	62.45%	8,746,720	64.92%
	විවිධාංගීකරණය කළ මූල්‍ය	827,888	9.33%	501,855	3.73%
මූල්‍ය		6,370,578	71.78%	9,248,574	68.65%
ගනුදෙනුකාර අභිමතිය	ගනුදෙනුකාර පාරිභෝගික ද්‍රව්‍ය සහ ඇඟලුම්	36,577	0.41%	9,239	0.07%
	සිල්ලර	–	0.00%	–	0.00%
ගනුදෙනුකාර අභිමතිය		36,577	0.41%	9,239	0.07%
ගනුදෙනුකාර ප්‍රධාන සිල්ලර	ආහාරපාන සහ දුම්කොල	–	0.00%	–	0.00%
සෞඛ්‍යාරක්ෂාව*	සෞඛ්‍යාරක්ෂාව සහ උපකරණ හා සේවා	72,993	0.82%	1,666,678	12.37%
කර්මාන්ත	ප්‍රාග්ධන භාණ්ඩ	1,392,271	15.69%	1,566,065	11.62%
අමුද්‍රව්‍ය	අමුද්‍රව්‍ය	350,049	3.94%	63,432	0.47%
උපයෝගිතා	උපයෝගිතා	166,635	1.88%	741,970	5.51%
නිශ්චල දේපල	නිශ්චල දේපල	–	0.00%	–	0.0%
විදුලි සංදේශ සේවා	විදුලි සංදේශ සේවා	138,620	1.56%	80,437	0.60%
බලශක්තිය	බලශක්තිය	346,980	3.91%	96,032	0.71%
එකතුව		8,874,703	100%	13,472,428	100%

** ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන ලංකා හෝස්පිටල්ස් කෝපරේෂන් පොදු සමාගම ද ඇතුලත්ය.*

44. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

44.3 ණය අවදානම

ණය අවදානම් යනු ආයෝජක සමාගම්, ප්‍රතිරක්ෂකයින් සහ වෙනත් ණයගැතියන් එහි ගිවිසුම්ගත බැඳීම් සපුරාලීම පැහැරහැරීමේ අවදානමයි. ඒ අනුව, ඉන් ණයගැතියෙක් බැඳි ඇති ගෙවීම් සිදුකිරීමට අසමත්වීම තුලින් යම් වර්ගයක ණය ගෙවීම පැහැර හැරීමේ අවදානම ඉන් සඳහන් කරයි. මෙම අවදානම් මූලිකවම ණයගැතියාගෙන් සිදුවන අතර මූලිකවම අහිමි වූ මුල් මුදල සහ පොලිය, මුදල් ප්‍රවාහ බිඳවැටීම සහ එකතු කිරීමේ පිරිවැය වැඩි වීම ඇතුළත් වේ.

සමූහය විසින් තනි රක්ෂණයෙකු සහ සමහර වත්කම් පන්ති වලින් සිදුකරන ආයෝජනයන්ගේ සංකේන්ද්‍රණය මත එයටම අයත් සීමාවන් ස්ථාපිත කර ඇති අතර ද්‍රවශීල උපකරණවල ආයෝජන සිමාවන් ද නියමය කරයි.

බලපත්‍රලාභී වාණිජමය බැංකු හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් තුළ වාර තැන්පතුවල හැර කිසිදු ආයෝජනයක් සිදුකර නොමැත.

පිළිගත් ණය ශ්‍රේණිගතකරන ආයතනයන් විසින් ආයතනය සහ උපකරණය සඳහා අයෝජන පන්ති ණය ශ්‍රේණිගතකරණය ණයකර සහ වාණිජ පත්‍රිකා ඇතුළත් සියලුම ආයෝජන සඳහා අපේක්ෂා කෙරේ.

කිසිදු ණය උපකරණයක් අදාළ සමාගම් කිසිවක් සමඟ සිදුකර නොමැත.

ණය සුරැකුමක් තුළ යම් ආයොජනයක් සිදුකිරීමට පෙර විස්තරාත්මක ණය විශ්ලේෂණයක් අභ්‍යන්තර වශයෙන් සිදුකරනු ලැබේ.

ණය අවදානමට උපරිම නිරාවරණය

මූල්‍ය වත්කම්වල ධාරණ අගය උපරිම ණය නිරාවරණය නියෝජනය කරයි. වර්තාකරන දිනට ණය අවදානම සඳහා උපරිම නිරාවරණය පහත පරිදි වේ.

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31	සටහන	**2022 රු. '000**	2021 රු. '000	**2022 රු. '000**	2021 රු. '000
කල්පිරීම සඳහා තබා ඇති (HTM)	5	**71,832,664**	60,916,652	**71,832,664**	60,916,652
ණය හා ලැබීම් (L&R)	5	**42,779,018**	35,100,639	**42,779,018**	35,100,639
විකිණීම සඳහා තබා ඇති (AFS)	5	**14,487,406**	43,309,352	**14,487,406**	43,309,352
ඔප්පුහිමියන්ට ණය	12	**1,867,624**	1,637,187	**1,867,624**	1,637,187
ප්‍රතිරක්ෂණ ණය	13	**4,367,265**	2,901,995	**4,367,265**	2,901,995
ලැබියයුතු වාරික	14	**6,610,797**	7,977,747	**6,610,797**	7,977,747
වෙනත් වත්කම්	16	**11,903,651**	8,695,391	**4,740,789**	8,695,391
මුදල් හා මුදලට සමාන දෑ	18	**9,788,484**	27,378,865	**6,320,469**	16,920,370
		163,636,909	187,917,828	**153,006,032**	177,459,333

රජයේ සුරැකුම්පත්

රජයේ සුරැකුම්පත් ස්වභාවය අනුව අවදානම් රහිත උපකරණ වශයෙන් හඳුන්වන භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, සංවර්ධන බැඳුම්කර සහ ප්‍රති මිලදි ගැනීමේ ගිවිසුම් වල ආයෝජනවලින් සමන්විත වේ.

ආයතනික ණය සුරැකුම්පත්

ආයතනික ණය සුරැකුම්පත් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කරන සහ දේශීය හා විදේශීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය විසින් සහතික කරන ආයතනික ණයකරවලින් සමන්විත වේ. ණය සුරැකුම්පත් නිකුත් කරන්නන්ගේ ණය ශ්‍රේණිගත කිරීම පිළිබඳ විශ්ලේෂණයක් මෙම සටහනේ දක්වා ඇත.

ඔප්පුහිමියන්ට ණය

ඔප්පු හිමියන්ට දෙන ලද ණයවලට අදාළ ණය අවදානම යනු ඔප්පුහිමියන් විසින් ණය නිරවුල් නොකිරීම හේතුකොට ගෙන පැන නැගිය හැකි මූල්‍ය ආලාභයන්ය.

ඔප්පුවේ පාවාරන අගය ඇප ලෙස සලකා බලමින් ඔප්පු හිමියන්ට සමූහය විසින් ණය නිකුත් කර ඇත. වාර්තාකරන දිනට, ලබා දී ඇති ඔප්පු ණයවල ධාරණ අගය රු. මිලියන 1,868 (2021 – රු. මිලියන 1,637) වන අතර එයට අදාල පාවාරණ අගය රු. මිලියන 2,966 (2021 – රු. මිලියන 2,648) කි.

ලැබියයුතු ප්‍රතිරක්ෂණ

මෙය ප්‍රතිරක්ෂකයන් විසින් සමූහය වෙත ඇති ඔවුන්ගේ මූල්‍ය බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වීමේ අවදානමයි.

ප්‍රතිරක්ෂකයන්ගෙ ණය යෝග්‍යතාව කලමණාකාරිත්වය විසින් වරින්වර තක්සේරු කරන අතර ප්‍රතිරක්ෂිත වත්කම්වල හානිකරණය සඳහා සුදුසු දීමනා නිශ්චය කරයි.

ප්‍රතිරක්ෂණ ලැබීම් සම්බන්ධයෙන් වාර්තා කරන දිනයට මූල්‍ය ප්‍රකාශයන් හි ප්‍රතිරක්ෂණ ලැබීම්වල වියහැකි හානිකරණ අලාභය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇත.

ලැබියයුතු වාරිකය

හිඟ මුදල් නිරවුල් නොකිරීම හෝ එවා නිරවුල් කිරීමට සැහෙන කාලයක් ගත කිරීම හේතුකොටගෙන මූල්‍ය ආලාභ අවදානම ඇති කරනු ලබන ඔප්පුහිමියන් සහ අතර මැදියන්ගෙන් ලැබිය හැකි වාරික මෙයට අයත්වේ.

ජීවිත රක්ෂණයෙදි ඔප්පුව නිකුත් කිරීමට පෙර වාරික නිකුත් කරන බැවින් ණය අවදානම අවම වේ. සමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේදි වාරිකය දින 60ක් ඇතුලත නිරවුල් නොකල හොත් හිමිකම ගෙවිය නොහැකි බව දැක්වෙන වාරික වගකීම් වගන්තිය මගින් ණය අවදානම බොහෝ දුරට අඩුකර ඇත.

වාර්තාකරන දිනට ලැබියයුතු වාරික මත වියහැකි හානිකරණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරුකර ඇති අතර මූල්‍ය ප්‍රකාශයන් හි ප්‍රමාණවත් වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශයන් හී සිදුකර ඇත.

වෙනත් ලැබියයුතු

සමූහයේ ණය අවදානමට නිරාවරණය ප්‍රධාන වශයෙන් එක් එක් පාරිභෝගිකයාගේ තනි පුද්ගල ගතිලක්ෂණයන් මගින් ඇතිවේ. වෙළෙඳ සහ වෙනත් ලැබීම් හා සම්බන්ධව දරණ ලද අලාභ ඇස්තමේන්තු නියෝජනය කරන හානිකරණය සඳහා සමූහය විසින් දීමනාවක් ස්ථාපිත කර ඇත.

මුදල් හා මුදලට සමාන දෑ

වාර්තාකරන දිනට ඇති කෙටිකාලීන ආයෝජන, බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් වලින් මෙය සමන්විත වේ. කෙටිකාලීන තැන්පතුවලට බැංකු සහ මූල්‍ය ආයතනයන් හි පවත්නා ස්ථාවර තැන්පතු සහ කැදවුම් තැන්පතු අයත් වේ. තවද, බැංකුවල ඇති මුදල්වලට ප්‍රධාන වශයෙන් පුද්ගලික සහ රජයේ වාණිජ බැංකුවල හිතකර ශේෂයන් පවතින ඉතිරි කිරීමේ හා ජංගම ගිණුම් අයත් වේ.

ශ්‍රේණිගත කිරීමේ අයතනයන් හි ණය ශ්‍රේණිගත කිරීම් සහ ගනුදෙනු සිදු කිරීමේ කාර්යක්ෂමතාව සළකා බැලීම මගින් සමූහය විසින් එහි බැංකුකරුවන් තෝරාගෙන ඇත. 2022 දෙසැම්බර් 31 වන දිනට රු. මිලියන 9,788 ක් මුදල් සහ මුදලට සමාන දෑ සමූහය සතුව පැවති (2021 දෙසැම්බර් 31 වන දිනට රු. මිලියන 27,379) අතර ඉන් මෙම වත්කම් මත උපරිම ණය නිරාවරණය නියෝජනය කරයි.

ණය අවදානම් නිරාවරණය – ජීවිත රක්ෂණ ව්‍යාපාරය

දෙසැම්බර් 31 වන විට	2022 රු. '000	වෙන්කළ ප්‍රතිශතය %	2021 රු. '000	වෙන්කළ ප්‍රතිශතය %
මූල්‍ය ආයෝජන				
ණය උපකරණ – ණය සහ ලැබීම්	39,067,063	56%	28,160,410	44%
ණය උපකරණ – විකිණීමට තබා ඇති	31,058,539	44%	35,907,929	56%
	70,125,601	100%	64,068,339	100%

ණය අවදානම් නිරාවරණය – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

දෙසැම්බර් 31 වන විට	2022 රු. '000	වෙන්කළ ප්‍රතිශතය %	2021 රු. '000	වෙන්කළ ප්‍රතිශතය %
මූල්‍ය ආයෝජන				
ණය උපකරණ – ණය සහ ලැබීම්	6,343,641	69%	5,774,228	62%
ණය උපකරණ – විකිණීමට තබා ඇති	2,799,165	31%	3,573,594	38%
	9,142,807	100%	9,347,822	100%

44. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

44.3 ණය අවදානම (ඉතිරි කොටස...)

ණය ශ්‍රේණිගතකරණයට අනුව ණය සුරැකුම්පත් වෙන් කිරීම

ජීවිත රක්ෂණ ව්‍යාපාරය

දෙසැම්බර් 31 වන විට	2022		2021	
ශ්‍රේණිගතකරණය	රු. මිලියන	මුළු මුදලින් ප්‍රතිශතයක් ලෙස %	රු. මිලියන	මුළු මුදලින් ප්‍රතිශතයක් ලෙස %
AAA	15,208	31%	3,797	9%
AA+	2,186	4%	1,831	4%
AA	72	0%	75	0%
AA-	12,120	24%	15,793	36%
A+	10,262	21%	10,276	24%
A	6,459	13%	7,442	17%
A-	2,395	5%	2,419	6%
BBB+	841	2%	1,932	4%
BBB	164	0%	152	0%
BBB-	–	0%	–	0%
BB+	–	0%	–	0%
BB-	–	0%	–	0%
අනුපාත නොකළ	–	0%	–	0%
එකතුව	49,707	100%	43,717	100%

** ස්ථිර තැන්පත් මත ණය අවදානම බැංකුවෙහි ණය අවදානම මත පදනම් වේ.*

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

දෙසැම්බර් 31 වන විට	2022		2021	
ශ්‍රේණිගතකරණය	රු. මිලියන	මුළු මුදලින් ප්‍රතිශතයක් ලෙස %	රු. මිලියන	මුළු මුදලින් ප්‍රතිශතයක් ලෙස %
AAA	1,824	22%	1,795	25%
AA+	2,256	28%	57	1%
AA	–	0%	23	0%
AA-	2,582	32%	1,627	22%
A+	104	1%	2,276	31%
A	25	0%	–	0%
A-	1,321	16%	1,343	19%
BBB+	–	0%	132	2%
BBB-	–	0%	–	0%
වෙනත්	8,112	100%	7,253	100%

** ස්ථිර තැන්පත් මත ණය අවදානම බැංකුවෙහි ණය අවදානම මත පදනම් වේ.*

44.4 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අනුපාතය යනු මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් ලබාදීමෙන් නිරවුල් කරන මූල්‍ය වගකීම් හා බැඳී පවතින්නාවූ බැඳියාවන් සපුරාලීමට සමූහයට මුහුණදීමට සිදුවන දුෂ්කරතාවයයි.

කල්පිරීම් විශ්ලේෂණ

ගෙවීමට ඇති පොලිය සහ ලැබීමට ඇති පොලිය ඇතුලත්ව ඉතිරිව ඇති වට්ටම් රහිත ගිවිසුම් බැඳියාවන් මත පදනම් කරගත් ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම් සහ මූල්‍ය වගකීම්වල කල්පිරීමේ පැතිකඩ පහත වගුවෙන් සාරාංශය කරයි.

2022 දෙසැම්බර් 31 දිනට සමාගම	ධරණ වටිනාකම රු. '000	ස්ථිර කාල ගණන රු. '000	වසර 1 දක්වා රු. '000	වසර 1 - 2 දක්වා රු. '000	වසර 2 - 5 දක්වා රු. '000	වසර 5 10 දක්වා රු. '000	වසර 10ට වැඩි රු. '000	එකතුව රු. '000
මූල්‍ය වත්කම්								
කල්පිරීමට තබා ඇති (HTM)	71,832,664	–	15,770,000	4,800,000	10,178,707	18,300,000	16,250,000	65,298,707
ණය හා ලැබීම් (L & R)	62,142,195	–	37,182,413	4,102,315	20,767,714	–	–	62,052,442
විකිණීමට තබා ඇති (AFS)	51,513,251	14,495,262	8,211,108	8,204,439	18,680,110	5,804,520	–	55,395,439
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය (FVTPL)	25,763,811	25,763,811	–	–	–	–	–	25,763,811
ඔප්පුහිමියන්ට ණය	1,867,624	–	1,867,624	–	–	–	–	1,867,624
ලැබියයුතු ප්‍රතිරක්ෂණ	4,367,265	–	2,475,563	1,373,917	281,084	189,872	46,830	4,367,265
ලැබියයුතු වාරික	6,610,797	–	6,610,797	–	–	–	–	6,610,797
වෙනත් වත්කම්	5,026,983	–	5,026,983	–	–	–	–	5,026,983
මුදල් හා මුදලට සමාන දෑ	6,320,469	–	6,320,469	–	–	–	–	6,320,469
	235,445,059	40,259,073	83,464,956	18,480,671	49,907,614	24,294,392	16,296,830	232,703,537
මූල්‍ය වගකීම්								
ගෙවියයුතු ප්‍රතිරක්ෂණය	2,354,371	–	2,255,144	59,486	38,715	1,026	–	2,354,371
වර්තන බදු වගකීම්	1,686,823	–	1,686,823	–	–	–	–	1,686,823
වෙනත් වගකීම්	6,159,369	–	6,159,369	–	–	–	–	6,159,369
මූල්‍ය වගකීම්	563,026	–	563,026	–	–	–	–	563,026
	10,763,589	–	10,664,362	59,486	38,715	1,026	–	10,763,589

44. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

44.4 ද්‍රවශීලතා අවදානම (ඉතිරි කොටස...)

කල්පිරීම් විශ්ලේෂණය (ඉතිරි කොටස...)

2022 දෙසැම්බර් 31 දිනට සමාගම	ධරණ වටිනාකම රු. '000	ස්ථීර කාල ගණන රු. '000	වසර 1 දක්වා රු. '000	වසර 1 - 2 දක්වා රු. '000	වසර 2 - 5 දක්වා රු. '000	වසර 5 10 දක්වා රු. '000	වසර 10ට වැඩි රු. '000	එකතුව රු. '000
මූල්‍ය වත්කම්								
කල්පිරීමට තබා ඇති (HTM)	60,916,652	–	1,150,000	15,770,000	11,050,000	12,407,717	17,500,000	57,877,717
ණය හා ලැබීම් (L & R)	49,685,073	–	14,392,840	14,513,750	13,344,175	3,000,000	–	45,250,765
විකිණීමට තබා ඇති (AFS)	65,429,542	22,120,190	1,625,000	9,115,108	21,270,024	5,449,520	2,519,525	62,099,368
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය (FVTPL)	22,859,816	22,859,816	–	–	–	–	–	22,859,816
ඔප්පුහිමියන්ට ණය	1,637,187	–	1,637,187	–	–	–	–	1,637,187
ලැබියයුතු ප්‍රතිරක්ෂණ	2,901,995	–	1,896,152	168,993	55,037	60,009	787	2,180,978
ලැබියයුතු වාරික	7,977,747	–	7,977,747	–	–	–	–	7,977,747
වෙනත් වත්කම්	4,319,689	–	4,319,689	–	–	–	–	4,319,689
මුදල් හා මුදලට සමාන දෑ	16,920,370	–	16,920,370	–	–	–	–	16,920,370
	232,648,071	44,980,006	49,918,986	39,567,851	45,719,236	20,917,246	20,020,312	221,123,637
වගකීම්								
ගෙවියයුතු ප්‍රතිරක්ෂණ	2,868,291	–	2,716,590	109,414	41,335	952	–	2,868,291
වර්තන බදු වගකීම්	1,684,872	–	1,684,872	–	–	–	–	1,684,872
වෙනත් වගකීම්	5,987,182	–	5,987,182	–	–	–	–	5,987,182
මූල්‍ය වගකීම්	539,283	–	539,283	–	–	–	–	539,283
	11,079,628	–	10,927,927	109,414	41,335	952	–	11,079,628

45. බැඳීම්, අසම්භාව්‍යතා සහ ඇපකර

45.1 බැඳීම්

පහත විස්තර කර ඇති දෙයට වඩා වාර්තාකරණ දිනයට සැළකිය යුතු ප්‍රාග්ධන බැඳීම් සමූහය සතුව නොමැත.

ලංකා හොස්පිට්ල් කෝර්පරේෂන් පොදු සමාගම

මූල්‍ය වසර අවසානයට සහ 2022 දෙසැම්බර් 31 දිනට දැනට ක්‍රියාත්මක වෙමින් පවතින නමුත් වියදම් කර නොමැති ව්‍යාපෘති සම්බන්ධයෙන් ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පොදු සමාගමේ ප්‍රාග්ධන බැඳීම් රු. මිලියන 87.3කි. (2021: රු. මිලියන 43කි).

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නමුත් 2022 දෙසැම්බර් 31 දිනට ගිවිසුම්ගත නොවූ ප්‍රාග්ධන වියදම රු. මිලියන 80 කි. (2021 – රු. මිලියන 17.9කි).

ලිට්රෝ ගෑස් ලංකා සමාගම

2022 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රාග්ධන වියදම අනුමත කර නොමැත. (2021 – රු. මිලියන 104).

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම සහ හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

2022 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රාග්ධන වියදම සඳහා පහත බැඳීම පරිපාලිත සමාගම් වන, සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම සහ හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම හි මූල්‍ය ප්‍රකාශන වල වෙන්කර නැත.

	2022 රු. '000	2021 රු. '000
ගිවිසුම්ගත නමුත් වියදම් කර නොමැති ආසන්න මුදල	**30,771,790**	14,285,779

කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම

කුලිකරුවෙක් වූ ගිල්ස් ෆූඩ්ස් ප්‍රොඩක්ට්ස් (පුද්ගලික) සමාගම වෙතින් වාර්තාකරණ දිනයට සැලකියයුතු බැඳීමක් තිබුණි. මෙම නඩුව (SPL 05/19) 2023 දී ගොණු කරන ලදී. ස්වාධීන නීති උපදේශකයෙක් සමඟ සාකච්ඡාවකින් පසු, අවලංගු කිරීමට ලියවිලි ගොනුකළද, ප්‍රථීන තීන්දුවක් දැනටමත් ලබා දී ඇති බැවින් එය අහිතකර වී ඇත.

45.2 අසම්භාව්‍ය වගකීම් සහ ඇපකර

පහත විස්තර කරන දෑට වඩා මූල්‍ය ප්‍රකාශණයන් හි සැසඳීම් කිරීම හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන සැලකියයුතු සම්භාව්‍ය බැඳීම් සහ ඇපකර නොමැති අතර වාර්තාකරණ දිනට වෙන් කිරීම් ගිණුම්වල ඇතුළත් කර නොමැති හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොමැති නමුත් ගිවිසුම්ගත නොවූ සැළකිය යුතු අසම්භාව්‍ය වගකීම් සහ ඇපකර නොමැත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලකතුකළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු තක්සේරු කිරීම.

සාමාන්‍ය රක්ෂණය සඳහා විදේශීය ප්‍රතිරක්ෂණ සමාගම්වලින් ලබා ගන්නා ලද ප්‍රතිරක්ෂණ හිමිකම් ඉල්ලීම් එකතුකළ අගය මත බද්දට යටත් වන බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අදහසයි. ඒ අනුව, 2004/2005 සහ 2005/2006 තක්සේරු වර්ෂ සඳහා අනුපිළිවෙළින් රු. 318,099,913/- ක් සහ රු. 26,903,739/- ක් වන ප්‍රතිරක්ෂණ හිමිකම් ඉල්ලීම් සඳහා එකතුකළ අගය මත බදු (VAT) තක්සේරුවක් සමාගමට ලැබී තිබුණි.

මෙය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නිරතව සිටින බහුතර රක්ෂණ සමාගම් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන පොදු තක්සේරුවකි. කෙසේ වුවද, සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ නිරත වූ සමාගම්වල අදහස වන්නේ ප්‍රතිරක්ෂණ හිමිකම් ඉල්ලීම් මත ඔවුන් එකතුකළ අගය මත බදු ගෙවීමට යටත් නොවන බවයි.

සමාගම විසින් බදු උපදේශකයන්ගේ උපදෙස්වලට අනුකූලව, මෙම තක්සේරු කිරීම්වලට එරෙහිව වලංගු අභියාචනා ගොනු කරන ලදී. සමාලෝචන කමිටුව 2010 ජූලි 21 දිනැති ලිපිය මගින් තක්සේරු කිරීම් වලංගු බව නිර්ණය කරන ලදී. සමාගම මගින් සමාලෝචන කමිටුවේ තීරණය අභියෝග යට ලක් කරමින් අභියාචනාධිකරණයට ඇප අයදුම්පතක් යොමු කරන ලදී. අභියාචනාධිකරණයේ තීරණය අපේක්ෂාවෙන් සමාගම රු. මිලියන 345 ක් වෙන් කර ඇත.

2002 අංක 14 දරණ වැට් බදු පනතේ 25 ඇ වගන්තිය මත පදනම්ව මූල්‍ය සේවය සඳහා අගය එකතු කළ බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා සමාගම බැඳී සිටින බව පවසමින් සමාගමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිල දැණුම් දීමක් ලැබී ඇත.

ඒ අනුව 2010, 2011, 2012, 2013, 2014, 2015, 2016, 2017, 2018 සහ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාල සීමා සඳහා සමාගමට මූල්‍ය සේවය සඳහා වූ වැට් බද්ද සහ මූල්‍ය සේවය පිළිබඳ ජාතිය ගොඩනැගීමේ බද්ද පිළිබඳ තක්සේරුවක් ලැබුණු අතර අදාල මුදල් ප්‍රමාණ පිළිවෙලින් රු. මිලියන 2,364, රු. මිලියන 374, රු. මිලියන 192 ක් සහ රු. මිලියන 232, රු. මිලියන 208, රු. මිලියන 247, රු. මිලියන 834, රු. මිලියන 509, රු. මිලියන 564 සහ රු. මිලියන 665කි.

45. බැඳීම්, අසම්භාව්‍යතා සහ ඇපකර (ඉතිරි කොටස...)

45.2 අසම්භාව්‍ය වගකීම් සහ ඇපකර (ඉතිරි කොටස...)

සමාගම බදු උපදේශකයින්ගේ උපදෙස් ඇතිව මෙම ඇගයීම්වලට එරෙහිව නිසි ලෙස අභියාචනයක් ඉදිරිපත් කර ඇත. 2010, 2011 2012 සහ 2013 කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය සේවා සඳහා වැට බදු සඳහා නිකුත් කරන ලද තක්සේරුව පිළිවෙලින් 2019 ජූලි 01, 2019 ජුනි 26, 2020 අගෝස්තු 27 සහ 2023 ජනවාරි27 වන දින සිට වලංගු බව බදු අභියාචනා කොමිසම තීරණය කර ඇත. අභියාචනාධිකරණයේ එම තීන්දුවලට එරෙහිව සමාගම අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, බැංකු ඇපකරය මුදල් කිරීම සඳහා වන බදු අභියාචනා කොමිෂන් සභාවේ තීරණය නතර කිරීම සඳහා සමාගම විසින් අභියාචනාධිකරණයෙන් රිට් නියෝගයක් ඉල්ලා සිටී. එකී රිට් අයදුම්පත්වල තීරණ ද ලැබීමට නියමිතව පවතී. එක් එක් සිද්ධියේ තත්ත්වයන් සහ ඇගයීම් පහත පරිදි වේ.

තක්සේරු වසර	තක්සේරුවේ තත්ත්වය	අසම්භාව්‍ය වගකීමේ ස්වභාවය	සමාගමට සිදුවන අසම්භාව්‍ය වගකීම මැනීම
2010/2011	අභියාචනාධිකරණයේ තීන්දුව විභාග වෙමින් පවතී	මූල්‍ය සේවා මත වැට බද්ද	රු. මිලියන 2,364 ක අතිරේක බදු වගකීමක්
2011/2012	අභියාචනාධිකරණයේ තීන්දුව විභාග වෙමින් පවතී	මූල්‍ය සේවා මත වැට බද්ද	රු. මිලියන 374 ක අතිරේක බදු වගකීමක්
2012/2013	අභියාචනාධිකරණයේ තීන්දුව විභාග වෙමින් පවතී	මූල්‍ය සේවා මත වැට බද්ද	රු. මිලියන 192 ක අතිරේක බදු වගකීමක්
2013/2014	අභියාචනාධිකරණයේ තීන්දුව විභාග වෙමින් පවතී	මූල්‍ය සේවා මත වැට බද්ද	රු. මිලියන 232 ක අතිරේක බදු වගකීමක්
2014/2015	බදු අභියාචනා කොමිෂන් සභාවේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	මූල්‍ය සේවා මත වැට බද්ද	රු. මිලියන 208 ක අතිරේක බදු වගකීමක්
2015/2016	බදු අභියාචනා කොමිෂන් සභාවේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	මූල්‍ය සේවා මත වැට බද්ද සහ ජාතිය ගොඩ නැගීමේ බද්ද	රු. මිලියන 247 ක අතිරේක බදු වගකීමක්
2016/2017	බදු අභියාචනා කොමිෂන් සභාවේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	මූල්‍ය සේවා මත වැට බද්ද සහ ජාතිය ගොඩ නැගීමේ බද්ද	රු. මිලියන 834 ක අතිරේක බදු වගකීමක්
2017/2018	බදු අභියාචනා කොමිෂන් සභාවේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	මූල්‍ය සේවා මත වැට බද්ද	රු. මිලියන 509 ක අතිරේක බදු වගකීමක්
2018රැ2019	කොමසාරිස් ජනරාල්ගේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	මූල්‍ය සේවා මත වැට බද්ද	රු. මිලියන 564 ක අතිරේක බදු වගකීමක්
2019රැ2020	කොමසාරිස් ජනරාල්ගේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	මූල්‍ය සේවා මත වැට බද්ද	රු. මිලියන 665ක අතිරේක බදු වගකීමක්

කෙසේ වෙතත්, ක්ෂේත්‍රයේ රක්ෂණ සමාගම් සහ සමාගමේ බදු උපදේශකයින්ගේ අදහස වන්නේ, සමාගම මූල්‍ය සේවා ව්‍යාපාරයේ නිරත නොවන බැවින් රක්ෂණ සමාගම් මූල්‍ය සේවා සඳහා වැට සහ එන්බීටී සඳහා බැඳී නොසිටින බවයි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල අතිරේක ප්‍රතිපාදන වෙන් කර නොමැත.

ආදායම් බදු

ජීවිත රක්ෂණ බදුකරණයට අදාළව 2011/2012 සිට 2018/2019 දක්වා තක්සේරු වර්ෂය සඳහා සමාගමට ආදායම් බදු තක්සේරුව ලැබී ඇති අතර එම කාලපරිච්ඡේදවල තක්සේරු කිරීම් පහත වගුවේ දක්වා ඇත. මෙම තක්සේරුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2016 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 92 වන වගන්තියට පටහැනිව නිකුත් කරන ලදී. තවද මෙය දේශීය රක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රක්ෂණ ක්ෂේත්‍රයේ තිබෙන ජීවිත රක්ෂණ සමාගම් සඳහා නිකුත් කර ඇති පොදු ආදායම් බදු තක්සේරුවකි. ක්ෂේත්‍රය, සමාගම සහ සමාගමේ බදු උපදේශකයින්ගේ මතය වන්නේ එම තක්සේරුව ක්‍රියාත්මක නොවනු ඇති බවයි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල අතිරේක ප්‍රතිපාදන වෙන් කර නොමැත.

සමාගමේ බදු උපදේශකයින්ගේ උපදෙස් ඇතිව සමාගම මෙම ඇගයීම්වලට එරෙහිව නිසි ලෙස අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර 2011/12, 2012/2013 සහ 2013/2014 කාල සීමාව සඳහා ආදායම් බදු සඳහා නිකුත් කරන ලද තක්සේරුව වලංගු බව 2020 අගෝස්තු 18, 2021 දෙසැම්බර් 14, සහ 2023 ජනවාරි 27 දිනැති ලිපිවලින් බදු අභියාචනා කොමිෂන් සභාව තීරණය කර ඇත. අභියාචනාධිකරණයේ තීන්දුව නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලා සමාගම අභියාචනා කර ඇති අතර තවදුරටත් සමාගම බදු අභියාචනා කොමිෂන් සභාවේ තීරණය නිෂ්ප්‍රභා කර බැංකු ඇපකරය ලබා ගැනීම සඳහාත් අභියාචනාධිකරණයෙන් රිට් නියෝගයක් ඉල්ලා ඇත.

එක් එක් තක්සේරුවේ තත්ත්වය පහත වගුවේ දක්වා ඇත.

තක්සේරු වසර	තක්සේරුවේ තත්ත්වය	අසම්භාව්‍ය වගකීමේ ස්වභාවය	සමාගමට සිදුවන අසම්භාව්‍ය වගකීම මැනීම
2011/2012	බදු අභියාචනා කොමිෂන් සභාවේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	ආදායම් බදු	රු. මිලියන 524 ක අතිරේක බදු වගකීමක්
2012/2013	අභියාචනාධිකරණයේ තීන්දුව විභාග වෙමින් පවතී	ආදායම් බදු	රු. මිලියන 296 ක අතිරේක බදු වගකීමක්
2013/2014	අභියාචනාධිකරණයේ තීන්දුව විභාග වෙමින් පවතී	ආදායම් බදු	රු. මිලියන 768 ක අතිරේක බදු වගකීමක්
2014/2015	බදු අභියාචනා කොමිෂන් සභාවේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	ආදායම් බදු	රු. මිලියන 1,036 ක අතිරේක බදු වගකීමක්
2015/2016	බදු අභියාචනා කොමිෂන් සභාවේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	ආදායම් බදු	රු. මිලියන 1,374 ක අතිරේක බදු වගකීමක්
2016/2017	බදු අභියාචනා කොමිෂන් සභාවේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	ආදායම් බදු	රු. මිලියන 1,823 ක අතිරේක බදු වගකීමක්
2017/2018	කොමසාරිස් ජනරාල්ගේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	ආදායම් බදු	රු. මිලියන 2,170 ක අතිරේක බදු වගකීමක්
2018/2019	කොමසාරිස් ජනරාල්ගේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	ආදායම් බදු	රු. මිලියන 1,900 ක අතිරේක බදු වගකීමක්

ලංකා හොස්පිට්ල් කෝර්පරේෂන් පොදු සමාගම

වගකීම්

ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පොදු සමාගමට එරෙහිව නඩු පැවරීම සඳහා උපරිම වගකීම වාර්තා කරන දිනට අනුව මිලියන 106 ක් ව පවතී. දැනට පවතින තොරතුරු මත පදනම්ව සමාගමට එහි නීති කවුන්සිලය විසින් උපදෙස් දී ඇත්තේ එවැනි නීතිමය ක්‍රියා පටිපාටිවල අවසාන විසඳුම සමාගමේ මෙහෙයුම්, මූල්‍ය තත්ත්වය හෝ ද්‍රවශීලතාවයේ ප්‍රතිඵල කෙරෙහි ප්‍රමාණාත්මක අහිතකර බලපෑමක් ඇති නොකරනු ඇති බවයි. ඒ අනුව, මේ සම්බන්ධයෙන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කිසිදු වගකීමක් සඳහා වෙන් කිරීම් සිදුකර නොමැත.

වත්කම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය වන ප්‍රමාණාත්මක අසම්භාව්‍ය වත්කම් වාර්තාකරණ දිනට නොමැත.

කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම

මුදල් අමාත්‍යාංශයේ එකඟතාවයට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණයට අනුව කැන්විල් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ ඩී. ආර්.පී. අබේසිංහ මහතා 2019 ජූලි 23 දින සමාගමේ අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් කරන ලදී. තවද, 2019 අගෝස්තු 06 දින පැවැත්වූ අතිරේක මහා සභා රැස්වීමේදී 2007 අංක 7 දරණ සමාගම් පනතේ 206 වන වගන්තිය සමඟ කියවියයුතු සාංගමික ව්‍යවස්ථාවලියේ 25 (4) වගන්තිය ප්‍රකාරව කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ධූරයට අදාළ කාර්යාලයෙන් ඉවත් කරන ලදී.

ඒ අනුව අබේසිංහ මහතා සේවයෙන් පහ කිරීම නීති විරෝධී යැයි පවසමින් සමාගමට එරෙහිව කම්කරු විනිශ්චය සභාවේ (නඩු අංක LT 2/907/2019) නඩුවක් පවරා ඇත. තවද, අනෙක් පැමිණිලි කම්කරු දෙපාර්තමේන්තුවට සහ සේවක භාර අරමුදල් මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. LT2/907/2019 යන ඉහත නඩුවේදී 2021 ජනවාරි 20 දින කම්කරු විනිශ්චය සභාවේ සභාපතිවරයා විසින් දෙන ලද තීරණයට අනුව අයදුම්කරුට පක්ෂව තීන්දුව ලබා දී ඇති අතර රු. 1,600,000/- ක් වන කොළඹ නැගෙනහිර සහකාර කම්කරු කොමසාරිස් විසින් ඉහත අයදුම්කරුට වන්දි ගෙවන ලෙස සමාගමට නියෝග කර තිබේ. අනතුරුව, නඩුව සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා ගත් කළමනාකාරිත්වය, 2021 පෙබරවාරි 19 දින කොළඹ බස්නාහිර පළාත්බද මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරන ලදී. 2022 ජූනි 22 දින,ඉහළ උසාවිය වගඋත්තරකාර – අභියාචකගේ (කැන්විල්) අභියාචනයට ඉඩ දෙමින්, කොළඹ 8 කම්කරු විනිශ්චය සභාවේ සභාපතිවරයාගේ 2021 ජනවාරි 20 දිනැති තීරණය ප්‍රතික්ෂේප කරන ලදී. 2022 ජූනි 22 දින කොළඹ පැවති ඉහළ උසාවියේ තීරණයට එරෙහිව 2022 අගෝස්තු 04 දින ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දැන්වීමක් ලැබුණු කළමනාකරණය, මෙම කාරණය සඳහා රුවන්ත කුරේ මහතා මගින් මේරියන් චෙම්බර්ස් මහත්මිය නම්කර පත් කරන ලද අතර, 2022 අගෝස්තු 17 දින පෙරකලාසිය සහ කේචියට් ගොනු කරන ලදී. මෙම නඩුව 2023 පෙබරවාරි 03 දින ඇසීමට නියමිතය.

තවද, ඩී.ආර්.පී. අබේසිංහ මහතා කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදලේ ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ සඳහා රු. 8,064,999.75 ඉල්ලා සිටිමින් 2019 අගෝස්තු 15 දින පැමිණිල්ලක් ගොණු කර ඇත. මෙම කාරණයේදී සමාගමේ නීතිඥයින් නියෝජනය කළ අතර, 2022 මාර්තු 08 දින හෝ ඊට පෙර මුදල නිරවුල් කිරීමට දක්වමින් ලද ඉල්ලීම සහ ලිපිය හාර නොගන්නා බවට කම්කරු කොමසාරිස් විසින් 2022 ජනවාරි ලිඛිත ඉදිරිපත් කිරීම් සිදු කිරීමට ඉල්ලා ඇත. සමාගම 2022 මාර්තු 07 දින දැන්වීමට එරෙහිව ලිඛිත අභියාචනයක් සිදු කරන ලදී.

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

ග්‍රෑන්ඩ් හයාට් ව්‍යාපෘතියේ භූ දර්ශන (මෘදුකාංග) වැඩ සහ නඩත්තු කොන්ත්‍රාත්කරු ලෙස කටයුතු කළ සීමාසහිත ග්‍රීනරි (පුද්ගලික) සමාගම එම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමේදී ඔවුන්ගේ ගිවිසුම්ගත බැඳීම් උල්ලංඝණය කර තිබේ. ඒ අනුව, ඔවුන් ඉදිරිපත් කළ කාර්යසාධන බැඳුම්කරයේ සම්පූර්ණ වටිනාකම වන රු. 3,629,274/74 ක මුදල SHSL විසින් ඉල්ලීමට අදහස් කරන ලදී. කෙසේ වෙතත්, සීමාසහිත ග්‍රීනරි (පුද්ගලික) සමාගම විසින් කාර්යසාධන බැඳුම්කරය වැළැක්වීම සඳහා SHSL ට එරෙහිව නියෝගයක් සහ අතුරු තහනමක් ලබා ගැනීම සඳහා නඩුවක් පවරා ඇත. ප්‍රථමයෙන් අධිකරණය විසින් සීමාසහිත ග්‍රීනරි (පුද්ගලික) සමාගම විසින් ඉල්ලා සිටින ලද නියෝගය ලබා දී තිබුණි. එම බැඳුම්කරයේ වලංගුභාවය 2019 ජූලි 19 දිනෙන් කල් ඉකුත්වීමට ආසන්න බැවින් විත්තිකරු වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා එම නියෝගයට විරෝධය පළ කරන ලදී. එබැවින්, ග්‍රීනරි සමාගම විසින් 2019 ජූලි 22 වන දින සිට මාස 3 ක කාලයක් සඳහා සමාන කාර්යසාධන බැඳුම්කරයක් ක්‍රියාත්මක කිරීමෙන් එම කාලය දීර්ඝ කිරීමට එකඟ විය.

දෙපාර්ශවය විසින්ම ලිඛිත කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සීමාසහිත ග්‍රීනරි (පුද්ගලික) සමාගම විසින් ඉල්ලා සිටි අතුරු තහනම් නියෝගය ප්‍රතික්ෂේප කරමින් අධිකරණය නියෝගයක් නිකුත් කළ අතර, හිමිකම්පාන්නා විසින් 2022 ඔක්තෝබර් 20 දින උසාවියෙන් මෙම නඩුව ඉල්ලා අස්කරගෙන ඇත.

46. වාර්තාකරන දිනයට පසු සිදුවීම්

පහත අනාවරණය කර ඇති දේ හැර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය වන වාර්තා කිරීමේ දිනයට පසුව සැලකිය යුතු සිදුවීම් කිසිවක් නොතිබුණි.

46.1 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ පරිපාලිත සමාගම් වෙන් කිරීම

2023 මාර්තු 17 දිනැති ලිපිය අනුව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2023 පෙබරවාරි 27 දිනැති අංක MF/018/CM/2023/055 දරණ කැබිනට් සංදේශය සම්බන්ධයෙන් 2023 මාර්තු 14 දිනැති අංක 23/0431/604/046 දරණ කැබිනට් තීරණය මත පදනම් වී SLIC සහ සමූහය වෙන් කිරීම රජයේ ප්‍රතිපත්තිට දැනුම් දෙන ලදී. ඒ අනුව, කැබිනට් මණ්ඩලය රජයට අයත් ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකයක් මගින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වෙන් කිරීම සඳහා මූලධර්මය තුළ එහි අනුමැතිය ලබාදෙන ලදී. ඊට අමතරව, වෙන් කිරීමේ ක්‍රියාවලිය ඇති කිරීම සඳහා, SLIC හි ප්‍රධාන පරිපාලිත සමාගම් {එනම් ලංකා හොස්පිටල් කෝර්පරේෂන් පොදු සමාගම, ලිට්රෝ ගෑස් ලංකා සමාගම, ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම, සහ කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම} වල හිමිකාරත්වය භාණ්ඩාගරයේ ලේකම් වෙත මාරු කිරීම කළ යුතුය. දැනට අධ්‍යක්ෂ මණ්ඩලය මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ගනු ලබන තීරණය ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර සමාගම දැනට මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සමඟ එකී මාරු කිරීමේ ක්‍රමවේදය සහ කාලය පිළිබඳව සාකච්ඡාවක නිරතව සිටී. ඊට අමතරව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සුළුතර කොටස්හිමියන් විසින් දරන කොටස් භාණ්ඩාගාරය විසින් අත්කර ගැනීමට පහසුකම් සපසන මෙන් SLIC වෙතින් ඉල්ලා ඇති අතර සමාගම ඒ සම්බන්ධව කටයුතු කරමින් සිටී.

46.2 ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙන් කිරීම

2011 අංක 03 දරණ රක්ෂණ පනතට සංශෝධනවල දක්වා ඇති පරිදි, සංයුක්ත රක්ෂණ සමාගම් විසින් පවත්වාගෙන යන්නාවූ දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර එකිනෙකට වෙන්ව ස්ථාපිත වූ සමාගම් දෙකක් ලෙස වෙන් කිරීම සිදුකල යුතුය. පනතේ මූලධර්මයන්ට අනුකූල වීම සඳහා, සමාගම ABC පිරිවැයකරණය සහ වෙනත් මෙහෙයුම් අංග යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශ දෙකක් තබා ගනිමින් මෙහෙයුම් වෙන් කිරීම් සඳහා එකඟ වී ඇත. කෙසේවෙතත්, බොහෝ පාර්ශවයන් නෛතික වෙන් කිරීම හා සම්බන්ධවන රජයට අයත් සමාගමක් වීම මූලික සාධක හේතුවෙන් බලපෑමක් සිදු කර නොමැත. පසුකාලීනව, පසුකාලීනව, 2023 මාර්තු 17 දිනැති ලිපිය පරිදි, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2023 මාර්තු 14 දිනැති අංක 23/0431/604/046 දරණ කැබිනට් තීරණය මත පදනම් වී SLIC ආපසු පැවරීමට අදාළව රජයේ ප්‍රතිපත්තිය දැනුම් දී ඇති අතර, ඒ අනුව එහි ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙනස් නෛතික ආයතන යටතේ ස්ථාපිත කරමින් 2011 අංක 03 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන (සංශෝධිත) පනතේ විධිවිධානවලට සම්පූර්ණයෙන් අනුකූලවීමට සමාගමට උපදෙස් ලබා දී ඇත.

වර්තමානයේ 2023 අගෝස්තු 31 වන විට මෙම ක්‍රියාවලිය සාක්ෂාත් කර ගැනීම සඳහා SLIC හි කළමනාකරණය විසින් බෙදීමේ ආදර්ශය, නියාමන අවශ්‍යතා පිළිබඳව නියාමක සමඟද, නෛතික කරුණු නීති උපදේශකයින් සහ නීතිපති දෙපාර්තමේන්තුව සමඟද, බදු කරුණු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සමඟද, කාර්ය මණ්ඩල වෙන් කිරීම සහ වෙනත් සම්පත් වෙන් කිරීම සම්බන්ධව අදාළ අංශ ප්‍රධානීන් සමඟද සාකච්ඡා කරමින් සිටී.

47. සමූහයේ සහ සමාගමේ මෙහෙයුම් කෙරෙහි වර්තමාන ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ඇතිවන බලපෑම

2022 දෙසැම්බර් 31 දිනට උද්ධමනය 57.2%ක් විය. කෙසේවෙතත්, එය 2023 මාර්තු 31 දිනට 49.2 දක්වා පහත වැටුණි. හුවමාරු අනුපාතය ද ශේෂ පත්‍ර දිනයෙන් පසු සැලකියයුතු උච්චාවචනයක් පෙන්නුම් කළ අතර ලාභය/(අලාභය)ට ඇතිකරන තත්ත්වයන් 2022 දෙසැම්බර් 31 දක්වා නොපවතින බැවින් වර්තමාන වසරේ මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් සිදුකර නොමැත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) මූල්‍ය මණ්ඩලය ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාතය (SDFR) සහ ස්ථාවර ණයදීමේ පහසුකම් අනුපාතය (SLFR) වැඩි කිරීමට තීරණය කර ඇත. විදේශ සංචිතවල අඩුවීම ආනයන මත සීමා ඇති කළ අතර එය සැපයුම් කෙරෙහි බලපා ඇත.

සමාගම සහ සමූහය අඛණ්ඩතා පදනමක් ලෙස එහි මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යන බව සහතික කිරීමට පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී.

සමාගමේ මෙහෙයුම් සඳහා ගම්‍යතාව

ජීවිත රක්ෂණ ව්‍යාපාරය

රටතුළ වර්තමාන ආර්ථික අර්බුදය හේතුවෙන් ජීවිත රක්ෂණ ව්‍යාපාරය මත සැලකියයුතු බලපෑමක් ඇති අතර එය අලුත්කළ වාරික රැස්කිරීම සහ නව ජීවිත රක්ෂණ ඔප්පු ලබාගැනීම දුෂ්කර කාර්යයක් බවට පත් කර ඇත. ඒ සමඟම, මෙහෙයුම් වියදම් සැලකියයුතු ලෙස වැඩි වෙමින් පවතී. තවද, ප්‍රතිරක්ෂණ වාරික ගෙවීම ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය නොමැති වීම හේතුවෙන් විශාල ලෙස බලපා ඇත.

අනෙක් අතට, පවත්නා විදුලිය කැපීම සහ ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් ජීවිත රක්ෂණ ව්‍යාපාරය තුළ මෙහෙයුම් දුෂ්කරතා ද විය. වසංගතය සහ ආර්ථික සහ බලශක්ති අර්බුදය මගින් ඇතිකළ තර්ජනවලට ප්‍රතිචාරාත්මකව, දුරස්ථව වැඩ කිරීමට සහ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධවීමට තාක්ෂණයේ වාසිය ලබා ගැනීමට SLIC සමත් විය.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ, බැහැර කළ හැකි ආදායම අඩුවීම හේතුවෙන් පුද්ගලික රක්ෂණය සඳහා ඉල්ලුම අඩු වන බවත් මෝටර් රථ රක්ෂණය අලුත් නොකිරීම සහ තෙවන පාර්ශව රක්ෂණයට මාරු වීම සැලකියයුතු ලෙස ඉහළ යන බවත් කළමනාකරණය විසින් හඳුනා ගන්නා ලදී. මෝටර් රථ ආනයනය සීමා කිරීම හේතුවෙන් මෝටර් රථ රක්ෂණයේ වර්ධනයට බලපාන ලදී. රටේ ආර්ථික තත්ත්වය හේතුවෙන්, සමාගමේ වාරික ආදායම අඩු වී ඇත.

අමතර කොටස් ලබාගත නොහැකිවීම, සහ අමතර කොටස්වල මිල ඉහළ යාම මෝටර් රථ සහ මෝටර් රථ නොවන රක්ෂණවල සාමාන්‍ය හිමිකම් පිරිවැය ඉහළ ගොස් ඇති අතර වියදම් අනුපාත COR වැඩි කර ඇති අතර එය ප්‍රාරක්ෂණ ලාභ අඩු කිරීමට හේතු වී ඇත.

ඒ හරුණු විට, මූල්‍ය අර්බුදය සහ විනිමය මුහුණපාන ගැටළු හේතුවෙන් දේශීය අවදානම් ප්‍රතිරක්ෂණය කිරීමට ප්‍රතිරක්ෂකයිනගේ කැමැත්ත අඩු විය. 100% මෝටර් රථ SRCC/TC වාරිකය පවාරණය කිරීමට NITF ඉල්ලීම මෝටර් රථ රක්ෂණ ලාභදායිතාවයට දැඩි බලපෑමක් ඇති කරනු ඇති අතර ප්‍රතිරක්ෂණකරුවන් විසින් NITF ප්‍රතිසාධනය අත්හිටුවීම සමස්ත සාමාන්‍ය රක්ෂණයට බරපතල ප්‍රශ්නයක් වනු ඇත. මේ වන විට අපි මේ සඳහා විසඳුමක් ලබා ගැනීමට NITF සමඟ සාකච්ඡා කරමින් සිටිමු. ඊට අමතරව, රක්ෂණ ක්ෂේත්‍රයේ සමාගම් සාමූහිකව මෙම කාරණයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව සොයමින් සිටී.

තවද, මූල්‍ය අර්බුදය හේතුවෙන් පළපුරුදු සහ සුදුසුකම්ලත් වෘත්තිකයින්ගේ ඉල්ලා අස්වීම් සමාගම කෙරෙහි සුවිශාල බලපෑමක් කරනු ඇත. රටේ ඉහත කී ආර්ථික තත්ත්වය හේතුවෙන්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හී වාරික ආදායම අඩු වී ඇත.

ආයෝජනය සඳහා ගම්‍යතාර්ථ

ශ්‍රී ලංකාවේ පවත්නා ආර්ථික අර්බුදය ආයෝජනය සඳහා ගම්‍යතාර්ථ කිහිපයක් ඇති කරයි. ආර්ථික අර්බුදය හේතුවෙන් ඇමෙරිකන් ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වී ඇත. මෙය විදේශ ව්‍යවහාර මුදලින් නම්කළ වත්කම් සඳහා සැලකියයුතු හුවමාරු ලාභයකට හේතු වේ.

ආර්ථික අර්බුදය සහ 2022 පළමු අර්ධය තුළ පැවති දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් කොළඹ කොටස් හුවමාරුව දැඩි පහත වැටීමකට මුහුණ පාන ලදී. ආර්ථික අර්බුදය සහ ඉහළ යන පොළී අනුපාත හේතුවෙන් ආන්තික වෙළෙඳ ගිණුම් බලාත්කාර විකිණීම මෙම පහත වැටීමට ප්‍රධාන ලෙස හේතු විය. කෙසේවෙතත්, ලාභ ඇගයීම් හේතුවෙන් ස්කන්ධ වෙළෙඳපොල තුළ ශක්තිමත් නැවත නැගිටීමක් අපට දැකගත හැකි විය.

ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික අර්බුදයට ප්‍රතිචාරාත්මකව පොළී අනුපාත ඉහළ දමූ අතර එය බැඳුම්කර වැනි ස්ථාවර ආදායම් ආයෝජන කෙරෙහි සෘණාත්මකව බලපෑ ලදී. කෙසේවෙතත්, SLIC මුදල් බවට පත් කිරීම තුළ රැඳී සිටී අතර, ඉහළයන පොළී අනුපාත මත ප්‍රාග්ධනනීයකරණය කිරීමට සමත් විය.

ශ්‍රී ලංකාව විදේශ මුදලින් නම්කළ ණය ගෙවීම් පැහැර හැරීම් නිවේදනය කිරීම මගින් විදේශ විනිමය ද්‍රවශීලතාව කෙරෙහි බලපෑමක් ඇති විය. කෙසේ වෙතත්, IMF ණය ලැබීමත් සමඟ මෙය නිරවුල් වනු ඇති බවට අපේක්ෂා කෙරේ.

සමස්ථයක් ලෙස, ආයෝජන සඳහා ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික අර්බුදයේ ගම්‍යතාර්ථ විවිධ සාධක මත රඳා පවතින අතර එයට අර්බුදයේ බරපතලකම, සහ කාලසීමාව, විශේෂ වත්කම් පත්ති සහ සම්බන්ධ කර්මාන්ත, සහ ආයෝජකයාගේ අවදානම් ඉවසීම සහ ආයෝජනයේ පරමාර්ථ ඇතුළත්ය. SLIC ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ විභව අවදානම් සහ ප්‍රදාන අඛණ්ඩව පරීක්ෂා කිරීමට සලකා බලයි.

ආයතනයේ කළමනාකාරිත්වය ව්‍යාපාරයේ අඛණ්ඩතාව කෙරෙහි වියහැකි බලපෑම අඛණ්ඩව නියාමනය කරයි. ඒ අනුව, සාර්ව ආර්ථික විචල්‍යතා ඇගයීමට ලක්කරන අතර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී උපකල්පන හා විනිශ්චයන් සිදු කරයි.

තවද, එකී කරුණු ව්‍යාපාර අඛණ්ඩතා මෙහෙයුම් කමිටුවේදී විසඳනු ලබන අතර මූල්‍යමය බලපෑම සහ යෝජිත උපායමාර්ග සතිපතා විධායක සාමාජිකයින් විසින් පසු විපරම් කෙරේ.

සමාගමේ ණය ශ්‍රේණිගතකරණය

ෆිච් රෙටින්ග් විසින් මෑතකාලීන ස්වෛරී පහත වැටීමෙන් සහ ශ්‍රී ලංකා ජාතික ශ්‍රේණිගතකරන පරිමාවේ නැවත ක්‍රමාංකණය කිරීමෙන් පසු ශ්‍රී ලංකාවේ රක්ෂකයින් හතක් ජාතික රක්ෂක මූල්‍ය ශක්තිය (IFS) ශ්‍රේණිගත කිරීම පහළට ශ්‍රේණිගත කරන ලදී.

2022 දෙසැම්බර් 01 දින සිට "CC" from "CCC" දක්වා ශ්‍රී ලංකාවේ දිගුකාලීන දේශීය මුදල් නිකුත් කරන්නාගේ පැහැර හැරීම් අනුපාතය ෆිච් රේටින් විසින් පහළට ශ්‍රේණිගත කිරීමෙන් පසු ශ්‍රී ලංකා රක්ෂකයින් අතර සාපේක්ෂ ණය සුදුසුකම තුළ වෙනස පිළිබිඹු කිරීම ක්‍රමාංකණයෙන් සිදු විය.

ශ්‍රී ලංකා රක්ෂකයින් පිළිබඳ ජාතික IFS ශ්‍රේණිගත කිරීම තුළ රටේ වෙනත් නිකුත් කරන්නන්ට අදාළ ණය සුදුසුකම පිළිබඳ සලකා බලන ලදී. ශ්‍රී ලංකා ජාතික ශ්‍රේණිගත කිරීමේ පරිමාවේ ක්‍රමාංකනය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ජාතික IFS ශ්‍රේණිගත කිරීම තුළ "AA(lka)"/RWN සිට "A(lka)"/RWN දක්වා පහළට ශ්‍රේණිගත කිරීමට හේතු විය.

රජයේ සුරැකුම්පත්වල ආයෝජනය මත වෙන් කිරීම

රජයේ ණය ප්‍රතිව්‍යුහගතකිරීමේ විභවතාව හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළව අවිනිශ්චිතතාව මත පදනම් වී රු. බිලියන 2.7ක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මත හානිකරණ වෙන් කිරීමක් සමාගම සිදුකර ඇත.

48. පර්යන්ත පහසුකම භාවිතා කිරීම

ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම

මෙම සමාගම විසින් එල්පී ගෑස් සඳහා ඒවා ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම වෙත බෙදාහැරීමේදී තොග ගබඩා පහසුකම් සපයයි. මෙම කාර්යය ඉටු කිරීමේදී, සමාගම විසින් එයට අයත් ගබඩාකිරීමේ ටැංකි, නළ මාර්ග සහ පොම්පාගාර භාවිතා කරන අතර ලබාදෙන පහසුකම් සඳහා ඔවුන් විසින් ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සඳහා "ප්‍රතිදාන ගාස්තුව" අයකර ගනී. මෙම ඵලදායී වැඩ පිළිවෙල සැලසුම තුළ IFRIC 4 යටතේ හඳුනාගත් කල්බදු සැලසුමක් අන්තර්ගතව ඇති අතර ගිවිසුම්ගත නියමයන්ට අනුව මූල්‍ය කල්බදු සැකැස්මක් අන්තර්ගතව ඇත. කෙසේ නමුත් වෙනත් ආයාතකරුවන් සඳහා ලබාගතහැකි පර්යන්තයන්හි ගබඩාකරණ පහසුකම් මෙන්ම එල්පී ගෑස් ගබඩා කිරීම සඳහා වෙනත් ආයාතකරුවන් සමග ගිවිසුම්වලට එළැඹීමට කළමනාකාරිත්වයේ අභිප්‍රාය අනුව, එකී ගබඩා පහසුකම් සමාගමේ ගිණුම් පොත්වල හඳුනා ගෙන නොමැත. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂය තුළ, අනාගත ආයාතකරුවන්ගෙන් වඩා යෝග්‍යය යෝජනාවලියක් නොමැතිවීම හේතුවෙන් පහසුකම් බදුදීම සඳහා වන කිසිදු එකඟතාවයකට සමාගම ඇතුළත් වී නොමැත.

ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම

මෙම සමාගම විසින් ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම තුළින් එල්පී ගෑස් සඳහා විශාල ගබඩා පහසුකම් ලබාගනී. මෙම පහසුකම් ලබාගැනීමෙන් සමාගම විසින් පසුව සඳහන් කළ ආයතනයේ ගබඩාකිරීමේ ටැංකි, නළ මාර්ග සහ පොම්ප කිරීමේ මධ්‍යස්ථාන භාවිතා කරන අතර ඒ සඳහා ඔවුන් විසින් ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම සඳහා "ප්‍රතිදාන ගාස්තුව" සිදුකරයි. මෙම ඵලදායී වැඩපිළිවෙල තුළ IFRIC 4 යටතේ හඳුනාගත් කල්බදු සැලසුමක් අන්තර්ගතව ඇති අතර ඒ තුළ ගිවිසුම්ගත නියමයන්ට අනුව සැකසුණු මූල්‍ය කල්බදු සැකැස්මක් අන්තර්ගතව ඇත. කෙසේ නමුත් වෙනත් ආයාතකරුවන් සඳහා ලබාගතහැකි පර්යන්තයන්හි ගබඩාකරණ පහසුකම් මෙන්ම එල්පී ගෑස් ගබඩා කිරීම සඳහා වෙනත් ආයාතකරුවන් සමග ගිවිසුම්වලට එළැඹීමට අභිප්‍රාය අනුව, එකී ගබඩා පහසුකම් සමාගමේ ගිණුම් පොත්වල හඳුනා ගෙන නොමැත. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂය තුළ, අනාගත ආයාතකරුවන්ගෙන් වඩා යෝග්‍යය යෝජනාවලියක් නොමැතිවීම හේතුවෙන් පහසුකම් බදුදීම සඳහා වන කිසිදු එකඟතාවයකට ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම ඇතුළත් වී නොමැත.

49. අඛණ්ඩතා පැවැත්ම

අඛණ්ඩතා පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමූහයට ඇති හැකියාව පිළිබඳ තක්සේරුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකර ඇති අතර දැකියහැකි අනාගතය සඳහා එහි ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගැනීමට අවශ්‍ය සම්පත් ඇති බවට සෑහීමට පත්ව ඇත. තවද, අඛණ්ඩතා පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමූහයට ඇති හැකියාව මත සැළකිය යුතු සැකයක් ඇතිකරන්නාවූ සැලකියයුතු අවිනිශ්චිතතාවයන් පිළිබඳ අධ්‍යක්ෂවරු දනුවත් නැත. එමනිසා, මූල්‍ය ප්‍රකාශ තවදුරටත් අඛණ්ඩතා පැවැත්ම පදනම මත පිළියෙල කරනු ලැබේ.

49.1 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, කළමනාකරණය ආර්ථික තත්ත්වයන් හී පවත්නා බලපෑම, දැනට ක්‍රියාත්මකව පවතින පීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ඉවත් කිරීම සහ වෙන් කිරීම සහ පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පදනම භාවිතා කිරීම තක්සේරු කර ඇත. සමාගම වර්තමාන දේශීය සහ ගෝලීය ආර්ථික තත්ත්වයන් යටතේ ව්‍යාපාරය අඛණ්ඩව කරගෙන යාමට හැකි වීම පිණිස ලාභදායිතාව, ආදායම ප්‍රවාහ, කාරක ප්‍රාග්ධන කළමනාකරණය, ප්‍රාග්ධන වියදම, මුදල් සංචිත, සංචාර සිමා කිරීම්, සහ සමාගම විසින් ක්‍රියාත්මක කරන පිරිවැය කළමනාකරණ වැඩසටහන් වැනි සාධක රාශියක් සැලකිල්ලට ගනිමින් සිය ව්‍යාපාරයේ ඔරොත්තුදීම තක්සේරු කරමින් සිටී. ලබාගත හැකි තොරතුරු මත පදනම් විශ්ලේෂණය සහ අනාගත දැක්ම මත පදනම් වී, අඛණ්ඩතා පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමූහයට ඇති හැකියාව මත සැළකිය යුතු සැකයක් ඇතිකරන්නාවූ සැලකියයුතු අවිනිශ්චිතතාවයන් පිළිබඳ අධ්‍යක්ෂවරු දනුවත් නැත. එමනිසා, මූල්‍ය ප්‍රකාශ තවදුරටත් අඛණ්ඩතා පැවැත්ම පදනම මත පිළියෙල කරයි.

49.2 ලංකා හොස්පිට්ල් කෝර්පරේෂන් පොදු සමාගම

අඛණ්ඩතා පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමාගමට/සමූහයට ඇති හැකියාව පිළිබඳ තක්සේරුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකර ඇති අතර දැකියහැකි අනාගතය සඳහා එහි ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමට අවශ්‍ය සම්පත් ඇති බවට සෑහීමට පත්ව ඇත. එය ක්‍රියාත්මක පරිසරයේ අනාගත ආර්ථික කොන්දේසි සඳහා ප්‍රක්ෂේපන සිදු කිරීම පිණිස පවත්නා ආර්ථික සංවර්ධනයන් තක්සේරුව සැලකිල්ලට ගෙන ඇත. මෙම මූලධර්මය යොදා ගැනීම සම්බන්ධයෙන් අවිනිශ්චිතතා ඇති කරන ප්‍රධාන සාධක රටේ අස්ථාවර ආර්ථික වාතාවරණයට, කොවිඩ් 19 වසංගතයේ පවතින සහ අනාගත අඛණ්ඩ ගමන්මාර්ගවලට, ව්‍යාපාර මෙහෙයුම් මත අවිනිශ්චිත අස්ථාවර සාර්ව ආර්ථික කොන්දේසි, ව්‍යාපාරයේ කාර්යසාධන සහ ආර්ථිකයේ ප්‍රතිසාධනයට සහයවීම සඳහා රජය විසින් යොදාගත් ක්‍රියාමාර්ගවලට අදාළ වේ. ඉහත කරුණු මත පදනම්ව සහ සමාගමේ ප්‍රාග්ධන කළමනාකරණය සහ ද්‍රවශීලතා යාන්ත්‍රණ කරා පිවිසීමට සමාගමට ඇති හැකියාව සැලකිල්ලට ගනිමින්, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා අඛණ්ඩතා පැවැත්ම මූලධර්මය යොදා ගැනීම සඳහා කොන්දේසි සපුරා ඇති බව සමූහය තක්සේරු කරයි. අඛණ්ඩතා පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමාගමට/සමූහයට ඇති හැකියාව මත සැළකිය යුතු සැකයක් ඇතිකරන්නාවූ සැලකියයුතු අවිනිශ්චිතතාවයන් පිළිබඳ අධ්‍යක්ෂවරු දනුවත් නැත. එමනිසා, මූල්‍ය ප්‍රකාශ තවදුරටත් අඛණ්ඩතා පැවැත්ම පදනම මත පිළියෙල කරයි.

49.3 කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම

අඛණ්ඩතා පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමාගමට සහ එහි පරිපාලිත සමාගම්වලට ඇති හැකියාව පිළිබඳ තක්සේරුවක් සමාගමේ කළමනාකරණය විසින් සිදුකර ඇති අතර දැකියහැකි අනාගතය සඳහා එහි ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගැනීමට අවශ්‍ය සම්පත් ඇති බවට සෑහීමට පත්ව ඇත. තවද, 2023 මාර්තු 14 දිනැති අංක 23/0431/604/046 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව දරන කොටස් සහ ලිට්රෝ ගෑස් ලංකා සමාගම විසින් දරන කොටස් වහාම ක්‍රියාත්මක වන පරිදි මහා භාණ්ඩාගාරයට මාරු කරන මෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

කෙසේවෙතත්, අඛණ්ඩතා පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමාගමට/සමූහයට ඇති හැකියාව මත සැළකිය යුතු සැකයක් ඇතිකරන්නාවූ සැලකියයුතු අවිනිශ්චිතතාවයන් පිළිබඳ කළමනාකරණය දනුවත් නැත. එමනිසා, මූල්‍ය ප්‍රකාශ තවදුරටත් අඛණ්ඩතා පැවැත්ම පදනම මත පිළියෙල කරයි.

49.4 හෙලන්කෝ හොටේල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

හෙලන්කෝ හොටේල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම හී අධ්‍යක්ෂ මණ්ඩලය 2015 වසරේදී හම්බන්තොට ඉදිකිරීමට නියමික ව්‍යාපෘතිය නතර කිරීමට යෝජනා සම්මත කරගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතියේ හෝටල් ඉදිකිරීමේ කටයුතු අවසානයකට පැමිණියේය තවද, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් 2017 අගෝස්තු 01 දිනැති අංක 17/1613/733/029 අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කැන්විල් හෝල්ඩින්ග් (පුද්ගලික) සමාගම (මව් සමාගම) හි හිමිකාරත්වයෙහි සාමාගමේ කොටස මාරු කරන මෙන් උපදෙස් ලබා දී ඇත. මෙම වැඩසටහන වාර්තාකරණ දින දක්වා ක්‍රියාවට නංවා නොමැත. දැකියහැකි අනාගතය තුළ සමාගම ඈවර කිරීමට සමාගම යෝජනා සම්මත කර නොමැති අතර සමාගමේ කළමනාකරණය ඉදිරි ගමන්මඟ සම්බන්ධයෙන් රේඛිය අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් ඉල්ලා ඇත. 2023 ජනවාරි 17 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, හෙලන්කෝ හොටේල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම හී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෙලන්කෝ හොටේල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම හී මූල්‍ය ප්‍රකාශ තවදුරටත් අඛණ්ඩතා පැවැත්ම පදනම මත පිළියෙල කරන බවට යෝජනා සම්මත කරගෙන ඇත.

49.5 සිනෝලංකා හොටේල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

අඛණ්ඩතා පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමාගමට ඇති හැකියාව පිළිබඳ තක්සේරුවක් සමාගමේ කළමනාකරණය විසින් සිදුකර ඇති අතර දැකියහැකි අනාගතය සඳහා එහි ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගැනීමට අවශ්‍ය සම්පත් ඇති බවට සෑහීමට පත්ව ඇත. තවද, අඛණ්ඩතා පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමාගමට ඇති හැකියාව මත සැළකිය යුතු සැකයක් ඇතිකරන්නාවූ සැලකියයුතු අවිනිශ්චිතතාවයන් පිළිබඳ කළමනාකරණය දනුවත් නැත. ඊට අමතරව, අමාත්‍ය මණ්ඩලය 2020 ජූලි 08 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ග්‍රෑන්ඩ් හයාට් කොළඹ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට සිය අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2020 වසර තුළ නැවත ආරම්භ කරන ලදී.

තවද, 2022 අප්‍රේල් 12 දින මහ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ පූර්ව ණය පැහැර හැරීමේ තත්ත්වය නිවේදනය කිරීම හේතුවෙන් ඇති වූ ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම සහ සැලසුම් කළ පරිදි ඇමෙරිකානු ඩොලර් 175ක අක්වෙරළ ණය/ස්කන්ධ මූල්‍යකරණය වැඩපිළිවෙල ක්‍රියාත්මක කළ නොහැකි වීම මත ආනයන කිරීමට නොහැකිවීමත් සමඟ ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාමට බාහිර පරිසරය උපකාරී නොවීම හේතුවෙන් ග්‍රෑන්ඩ් හයාට් ව්‍යාපෘතිය අත්හිටුවීමට 2022 මැයි මස, අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනා සම්මත කරගෙන ඇති අතර එබැවින් ග්‍රෑන්ඩ් හයාට් ව්‍යාපෘතිය අත්හිටුවන ලදී.

2022 සැප්තැම්බර් 26 දින, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් මුදල් අමාත්‍යාංශයේදී රැස්වීමක් පවත්වන ලද අතර, එහිදී රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකිරීමේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළුව සියලුම පාර්ශවකරුවන් සහභාගි විය. මෙම රැස්වීමේදී, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකිරීම සඳහා නව ඒකකයක් ස්ථාපිත කර ඇති බවත්, එම ඒකකය රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකිරීමේ ඒකකයේ අධ්‍යක්ෂ ජනරාල්, සුරේෂ් ෂා විසින් මෙහෙයවන බවත්, සහ අලුතින් ස්ථාපිත රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකිරීම් ඒකකය මුදල්, ආර්ථික ස්ථායිකරණ අමාත්‍යාංශය යටතට අයත්වන බවත් සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකිරීම එම ඒකකය කරගෙන යන බවත් භාණ්ඩාගාරයේ ලේකම් විසින් අනාවරණය කරන ලදී. එමෙන්ම එම රැස්වීමේදී, ග්‍රෑන්ඩ් හයාට් ව්‍යාපෘතිය වහම වෙනස් කිරීම සඳහා හඳුනාගෙන ලැයිස්තු කර ඇති වෙනත් රජයට අයත් ආයතන සමඟ ලැයිස්තු ගත කර ඇති බව ද සඳහන් කරන ලදී. 2022 සැප්තැම්බර් 27 දිනැති අංක PED/S/SLIC/SINO/6/11(Vol1.IV) දරණ ලිපිය යටතේ, සැප්තැම්බර් 28 දින පසු විපරම් රැස්වීමක් කැඳවා තිබුණ අතර වහාම වෙන් කිරීම සඳහා ගන්නා ලද තීරණය සම්බන්ධයෙන් ග්‍රෑන්ඩ් හයාට් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සාකච්ඡා කරන ලදී.

තවද, 2022 ඔක්තෝබර් 20 දින, සිනොලංකා හොටේල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම හී අධ්‍යක්ෂ මණ්ඩලය නියාමන ක්‍රියාවලිය අනුගමනය කරමින් 100%ක වෙන් කිරීම කරගෙන යාමට යෝජනා සම්මත කරගෙන ඇත. ශේෂ පත්‍රයේ දිනයට, ග්‍රෑන්ඩ් හයාට් ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් බෙදා හැරීම සඳහ රජයට අයත් ව්‍යවසාය ප්‍රතිසංස්කරණ ඒකකයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ උපදෙස් අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂාවෙන් සිටී.

241-268
අතිරේක තොරතුරු



> 242 ජීවිත රක්ෂණයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

> 243 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ජීවිත රක්ෂණ අරමුදල

> 248 ආදායම් ප්‍රකාශය පිළිබඳ දස වසරක සාරාංශය

> 250 ශේෂ පත්‍රය පිළිබඳ දස වසරක සාරාංශය - සමූහය

> 252 ශේෂ පත්‍රය පිළිබඳ දස වසරක සාරාංශය - සමාගම

> 256 ශාඛා ජාලය

> 265 ආයතනික තොරතුරු

> 266 වාර්ෂික මහ සභා රැස්වීමේ නිවේදනය

ජීවිත රක්ෂණයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	2022 රු. '000	2021 රු. '000
වත්කම්			
මූල්‍ය ආයෝජන	අ	174,662,702	160,554,249
පරිපාලිත සමාගම්වල ආයෝජන	ආ	3,296,543	3,296,543
දේපල, පිරියත හා උපකරණ	ඉ	95,451	97,939
භාවිතයට අයිතිය ඇති වත්කම්		408,358	388,059
ඔප්පුහිමියන්ට ණය	ඇ	1,867,624	1,637,187
ලැබියයුතු ප්‍රතිරක්ෂණ		1,008,259	811,913
ඔප්පුහිමියන්ගෙන් ලැබියයුතු වාරිකය		675,082	507,391
වෙනත් වත්කම්	ඈ	3,840,195	3,539,443
මුදල් හා මුදලට සමාන දෑ		2,901,563	13,782,374
මුළු වත්කම්		188,755,777	184,615,098
ස්කන්ධය			
විකිණීමට තබා ඇති සංචිත	ඊ	674,855	3,260,333
ආදායම් සංචිත	උ	21,420,524	18,381,630
සීමාකළ නියාමන සංචිත		98,237	98,237
ප්‍රත්‍යාගණන සංචිත		71,673	71,673
සමාගමේ ස්කන්ධ හිමියන්ට ආරෝපනය කළහැකි මුළු ස්කන්ධය		22,265,289	21,811,873
වගකීම්			
රක්ෂණ ගිවිසුම් වගකීම් (වෙන් කිරීම) – ජීවිත	ඌ	159,769,324	155,788,928
භාවිතයට අයිතිය ඇති වගකීම්		474,777	450,308
ප්‍රතිරක්ෂණ ණයහිමියන්		884,452	1,095,095
බදු වගකීම්		1,419,380	1,257,284
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම		770,576	917,180
වෙනත් වගකීම්	එ	2,921,259	3,080,779
මූල්‍ය වගකීම් (බැංකු අයිරාව)		250,722	213,651
මුළු වගකීම්		166,490,488	162,803,225
මුළු ස්කන්ධය හා වගකීම්		188,755,777	184,615,098

මූල්‍ය ප්‍රකාශවලට සටහන් – ජීවිත රක්ෂණ අරමුදල

අ. මූල්‍ය ආයෝජන

දෙසැම්බර් 31 දිනට		2022		2021	
	සටහන	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
කල්පිරීමට තබා ඇති (HTM)	අ.1	69,332,871	41,093,784	60,399,783	58,824,840
ණය හා ලැබීම් (L & R)	අ.2	43,326,871	43,326,871	31,897,236	31,897,236
විකිණීමට තබා ඇති (AFS)	අ.3	40,611,027	40,611,027	50,606,618	50,606,618
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය (FVTPL)	අ.4	21,391,932	21,391,932	17,650,612	17,650,612
		174,662,702	146,423,614	160,554,249	158,979,306

අ.1 කල්පිරීමට තබා ඇති (HTM)

දෙසැම්බර් 31 වන විට	2022		2021	
	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
ලැයිස්තුගත ණයකර	1,014,795	1,014,795	–	–
භාණ්ඩාගාර බැඳුම්කර	68,318,076	40,078,990	60,399,783	58,824,840
	69,332,871	41,093,784	60,399,783	58,824,840

අ.2 ණය හා ලැබීම් (L & R)

දෙසැම්බර් 31 වන විට	2022		2021	
	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
ලැයිස්තුගත නොකළ ණයකර	21,308,612	21,308,612	20,248,744	20,248,744
ස්ථිර තැන්පතු	17,758,451	17,758,451	7,911,667	7,911,667
භාණ්ඩාගාර බැඳුම්කර	4,259,808	4,259,808	3,736,825	3,736,825
	43,326,871	43,326,871	31,897,236	31,897,236

අ.3 විකිණීමට තබා ඇති (AFS)

දෙසැම්බර් 31 වන විට	2022		2021	
	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
ලැයිස්තුගත කොටස්	7,212,380	7,212,380	11,813,255	11,813,255
ඒකක භාර	886,205	886,205	967,235	967,235
ලැයිස්තුගත ණයකර	30,941,800	30,941,800	35,805,985	35,805,985
භාණ්ඩාගාර බැඳුම්කර	1,570,642	1,570,642	2,020,143	2,020,143
	40,611,027	40,611,027	50,606,618	50,606,618

අ.4 ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය (FVTPL)

දෙසැම්බර් 31 වන විට	2022		2021	
	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
ලැයිස්තුගත කොටස්	19,633,095	19,633,095	15,860,785	15,860,785
ඒකක භාර	1,758,838	1,758,838	1,789,827	1,789,827
	21,391,932	21,391,932	17,650,612	17,650,612

FVTPL ආයෝජන සහ AFS ආයෝජන සාධාරණ අගයට අගය කෙරේ. HTM සහ L & R ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට අගය කෙරේ.

ආ. පරිපාලිත සමාගම්වල ආයෝජන

දෙසැම්බර් 31 වන විට		2022		2021	
	සටහන	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
පිරිවැයට					
ලැයිස්තුගත පරිපාලිත සමාගම්	ආ.1	1,296,543	5,836,984	1,296,543	3,279,997
ලැයිස්තුගත නොකළ පරිපාලිත සමාගම්	ආ.2	2,000,000	–	2,000,000	–
		3,296,543	5,836,984	3,296,543	3,279,997

ආ.1 ලැයිස්තුගත පරිපාලිත සමාගම්

දෙසැම්බර් 31 වන විට	2022			2021		
	කොටස් ගණන රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	කොටස් ගණන රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
ද ලංකා හොස්පිට්ල් කෝර්පරේෂන් පීඑල්සී	58,781,308	1,296,543	5,836,984	58,781,308	1,296,543	3,279,997
	58,781,308	1,296,543	5,836,984	58,781,308	1,296,543	3,279,997

ආ.2 ලැයිස්තුගත නොකළ පරිපාලිත සමාගම්

දෙසැම්බර් 31 වන විට	2022		2021	
	කොටස් ගණන රු. '000	ධාරණ අගය රු. '000	කොටස් ගණන රු. '000	ධාරණ අගය රු. '000
කැන්විල් හෝල්ඩින්ග් (පුද්ගලික) සමාගම	235,294,117	2,000,000	235,294,117	2,000,000
	235,294,117	2,000,000	235,294,117	2,000,000

ඇ. ජීවිත ඔප්පුහිමියන්ට ණය

දෙසැම්බර් 31 වන විට	2022 රු. '000	2021 රු. '000
ඔප්පුහිමියන්ට ණය	1,867,624	1,637,187
	1,867,624	1,637,187

ඈ. අනෙකුත් වත්කම්

දෙසැම්බර් 31 වන විට		2022 රු. '000	2021 රු. '000
භාණ්ඩ තොග		95,312	97,275
අනෙකුත් ණයගැතියන් සහ ලැබීම්		255,177	176,693
අනෙකුත් ණය		2,790,822	2,506,115
සාමාන්‍ය රක්ෂණ අංශයෙන් හිඟ මුදල්		3,064	263,713
ණය මත කලින් ගෙවූ ප්‍රතිලාභ		695,822	495,647
		3,840,195	3,539,443

ඉ. දේපල, පිරියත හා උපකරණ

	ඉඩම් රු. '000	ගොඩනැගිලි රු. '000	එකතුව රු. '000
සින්නක්කර			
පිරිවැය			
2022 ජනවාරි 01 දිනට ශේෂය	48,168	49,772	97,940
එකතු කිරීම්	–	–	–
ප්‍රත්‍යාගණනය	–	–	–
ප්‍රත්‍යාගණන සංචිතයට මාරුකළ සමුච්චිත ක්ෂය කිරීම	–	–	–
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	48,168	49,772	97,940
සමුච්චිත ක්ෂය කිරීම			
2022 ජනවාරි 01 දිනට ශේෂය	–	–	–
කාලසීමාව සඳහා ක්ෂය කිරීම් අයකිරීම	–	2,489	2,489
ප්‍රත්‍යාගණන සංචිතයට මාරුකිරීම	–	–	–
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	–	2,489	2,489
ධාරණ අගය			
2022 දෙසැම්බර් 31 දිනට	48,168	47,283	95,451

ඊ. විකිණීමට තබා ඇති සංචිත

පිළිවෙලින් ජීවිත ඔප්පුහිමියන් රු. මිලියන (1,217) කට හිමිකම් ලබන අතර කොටස් හිමියන් රු. මිලිය 675කට හිමිකම් ලබයි.

උ. ආදායම් සංචිත

දෙසැම්බර් 31 වන විට	සටහන්	2022 රු. '000	2021 රු. '000
පොදු සංචිතය		42,100	42,100
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභ/(අලාභ) මත සංචිතය		203,393	(46,924)
ජීවිත රක්ෂණයෙන් අතිරික්තය	උ.1	21,175,031	18,386,454
		21,420,524	18,381,630

ඇ.1 ජීවිත රක්ෂණයෙන් අතිරික්තය

දෙසැම්බර් 31 වන විට	2022 රු. '000	2021 රු. '000
ජනවාරි 01 දිනට ශේෂය	18,386,454	13,402,666
ජීවිත රක්ෂණයෙන් කොටස්හිමියන්ට ආරෝපනය වන අතිරික්තය	3,016,654	4,983,788
පසුගිය වසරේ AFS සංචිත කොටස්හිමියන්ට මාරු කිරීමේ බලපෑම	(228,077)	–
දෙසැම්බර් 31 දිනට ශේෂය	21,175,031	18,386,454

ඇ. රක්ෂණ ගිවිසුම් වගකීම් – ජීවිත

දෙසැම්බර් 31 වන විට	2022 රු. '000	2021 රු. '000
ජීවිත රක්ෂණ අරමුදල	148,000,670	129,151,483
අරමුදලේ වෙනස්වීම	14,034,410	23,832,975
දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙන් අතිරික්තය මාරු කිරීම	(3,016,654)	(4,983,788)
අධිභාර බද්ද – ජීවිත අරමුදල	(1,081,969)	–
	157,936,458	148,000,670
AFS **සංචිත**		
AFS සංචිත – ජීවිත අරමුදල	(1,217,455)	4,584,389
ඔප්පුහිමියන්ගේ හිඟව පවතින හිමිකම්	3,050,321	3,203,869
	159,769,324	155,788,928

ඇ. අනෙකුත් වගකීම්

දෙසැම්බර් 31 වන විට	2022 රු. '000	2021 රු. '000
කලින් ලද වාරිකය	297,423	287,586
වෙළෙඳ ණයහිමියන් සහ උපචිත වියදම්	2,623,836	2,793,193
	2,921,259	3,080,779

අරමුදල අනුව ආයෝජන ආදායම – ජීවිත රක්ෂණ ව්‍යාපාරය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	2022				2021			
	සහභාගි අරමුදල රු. '000	සහභාගි නොවූ අරමුදල රු. '000	කොටස් හිමියන්ගේ අරමුදල රු. '000	එකතුව රු. '000	සහභාගි අරමුදල රු. '000	සහභාගි නොවූ අරමුදල රු. '000	කොටස් හිමියන්ගේ අරමුදල රු. '000	එකතුව රු. '000
ලාභාංශ	580,104	48,190	489,670	1,117,963	460,939	48,970	378,858	888,767
ලැයිස්තුගත කොටස් – උපලබ්ධි/උපලබ්ධි නොවූ ලාභ/(අලාභ)	(3,904,070)	(706,047)	(975,064)	(5,585,181)	4,496,333	990,546	695,374	6,182,253
ඒකක භාර විකිණීමේ ලාභය	6,640	116,764	174,748	298,152	4,602	54,151	66,915	125,667
භාණ්ඩාගාර බිල්පත් මත පොළිය	6,545	–	–	6,545	87,467	–	–	87,467
භාණ්ඩාගාර බැඳුම්කර මත පොළිය	6,677,732	794,145	48,911	7,520,787	5,191,012	249,183	48,901	5,489,096
ස්ථිර තැන්පතු මත පොළිය	288,375	571,404	1,015,384	1,875,163	32,897	377,668	217,528	628,093
කැදවුම් තැන්පතු මත පොළිය	14,501	1,727	–	16,227	4,994	729	–	5,724
